මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා
http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# සංයුත්ත නිකාය

# 5

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

පින්වත්තේ සද්ධර්මාකර පරිවෙණාධිපති ශ්‍රී විසුද්ධාචාර්ය ධර්මකීර්ති ශ්‍රී පෝහද්දරමුල්ලේ ඤාණානන්දාභිධාන අමරපුර සිරි සද්ධම්මවංස නිකායේ මහා නායක ස්ථවිරයන්වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රත්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රත්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

රත්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්‍ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විසුධාලොක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්‍ය්‍ය ආර්‍ය්‍යරත්න රේරුකාන මහතා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංයුත්ත නිකාය

## 5

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**

**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1955
දෙවැනි මුද්‍රණය - 2013

**ත්‍රිපිටකය**

**සංයුත්ත නිකාය 5**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඥාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මඟ පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඥාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2013 අප්‍රේල්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ දහතුන් වෙනිවූ මේ පොතට සංයුත්ත නිකායේ සළායතන වර්ගයේ වේදනා සංයුත්තය අන්තර්ගත කළෙමි. මහ සඟි පහ අතුරෙන් මෙම නිකාය එක සඟියකි. පළමුවෙනි සඞ්ගායනාවේදී සංයුත්ත නිකාය භාරකරන ලද්දේ මහා කාශ්‍යප ශ්‍රාවක තෙරුන්වහන්සේට වේ. මේ නිකාය සගාථ වර්ගය, නිදාන වර්ගය, ඛන්ධක වර්ගය, සළායතන වර්ගය, මහා වර්ගයයි කොටස් පහකට බෙදා තිබේ. එහි ඇති සංයුත්ත පනස් හතරෙහි සූත්‍ර 7762 ක් වෙත්.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයඹරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඹරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, පින්කන්දේ පණ්ඩිත පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද,තල්පාවිල රත්නසිරි ස්ථවිරයන් වහන්සේද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

17 - 2 - 55

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.                                    http://pitaka.lk

# සූත්‍ර ගැන දැනගත යුතු කරුණු ස්වල්පයක්

**බණවර** - ‘අකුරු’ අටක් එක පදයක් වේ. පද සතරක් ග්‍රන්ථයක් වේ. එනම් අකුරු තිස්දෙකක් ග්‍රන්ථයක් වේ. අකුරු 32 කින් යුත් ග්‍රන්ථ දෙසිය පණහක් බණ වරෙක් වේ. එබැවින් බණ වරක අකුරු අටදහසක් ඇත්තේය.

**නිදානය** - ඒ ඒ සූත්‍රවල උත්පත්ති ස්ථානයයි - සැවැත් නුවර, රජගහ නුවර ආදි ස්ථානයි.

**පුද්ගල තෙම** - ඒ ඒ සූත්‍ර ධර්මයන් දේශනා කිරීමට කාරණ වූ පුද්ගලයායි.

**උද්දේශය** - තේරුම්කර සිහිකරවන කරුණ - හෝ සූත්‍රයේ මාතෘකාව.

**නිර්දේශය** - විස්තර සහිත තේරුම් කිරීම.

**සූත්‍රනාමය** - සූත්‍රනාම නොයෙක් ආකාරයෙන් යෙදී තිබෙන බව පෙනේ - (1) මාතෘකාව අනුව යෙදෙන නාම - මහාසතිපට්ඨාන සූත්‍රය,

(2) දෙශනා කරනු ලැබූ පුද්ගලයා අනුව දෙන නාම - සිගාලෝවාද සූත්‍රය.

(3) සිදුවූ කරුණක් අනුව දෙන නාමය - මහාපරිනිබ්බාණ සූත්‍රය.

(4) බුදුරජාණන් වහන්සේ විසින් අනුමත කරන නාමය අනුව ලැබෙන නාමය - සීහනාද සූත්‍රය

(5) බුදුරජාණන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නවලට උත්තර වශයෙන් දෙශනා කරන ලද සූත්‍ර - සක්කපඤ්හ සූත්‍රය.

(6) ඒ ඒ කරුණු මාතෘකා කරගෙන විස්තර කර දීමට දෙශනා කරනලද සූත්‍රවලට දී තිබෙන නාම - සාමඤ්ඤඵල සූත්‍රය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත click කරන්න, නැතිනම් වම් පස bookmarks තීරුව භාවිතා කරන්න.

# පටුන


පිට

4. සළායතන වර්ගය

1. වේදනා සංයුත්තය 1825

1 වෙනි පණ්ණාසකය 1825

(1) අනිච්ච වර්ගය 1825

(2) යමක වර්ගය 1838

(3) සබ්බ වර්ගය 1860

(4) ජාතිධම්ම වර්ගය 1895

(5) අනිච්ච වර්ගය 1900

2 වෙනි පණ්ණාසකය 1905

(1) අවිජ්ජා වර්ගය 1905

(2) මිගජාල වර්ගය 1936

(3) ගිලාන වර්ගය 1965

(4) ඡන්න වර්ගය 1994

(5) ඡළ වර්ගය 2047

3 වෙනි පණ්ණාසකය 2075

(1) යෝගක්ඛෙමි වර්ගය 2075

(2) ලෝක කාමගුණ වර්ගය 2096

(3) ගෘහපති වර්ගය 2129

(4) දේවදහ වර්ගය 2156

(5) නව පුරාණ වර්ගය 2173

4 වෙනි පණ්ණාසකය 2194

(1) නන්දික්ඛය වර්ගය 2194

(2) සට්ඨි පෙයයාලො වර්ගය 2215

(3) සමුද්ද වර්ගය 2225

(4) ආසිවිස වර්ගය 2255

1 වෙනි සගාථ වර්ගය 2302

(2) රහොගත වර්ගය 2317

(3) අට්ඨසත පරියාය වර්ගය 2332

# සංයුත්ත නිකාය

## 4. සළායතන වර්ගය

## 1. වෙදනා සංයුත්තය

### පළමුවෙනි පණ්ණාසකය.

(නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස)

## 1. අනිච්ච වර්ගය

### 1. (අධ්‍යාත්මායතන) අනිත්‍ය සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, ඇස, අනිත්‍යය. යමක් අනිත්‍යය නම් එය දුක්වේ. යමක් දුක නම් එය අනාත්මවේ යමක් අනාත්ම නම් එය, 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි මෙය මාගේ ආත්මය නොවේයයි මෙසේ මේ තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය.

"කණ අනිත්‍යය. යමක් අනිත්‍යද එය දුක්වේ. යමක් දුකද එය අනාත්මවේ. යමක් අනාත්මද එය 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේය"යි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි.

"නාසය අනිත්‍යය. යමක් අනිත්‍යද එය දුක්වේ යමක් දුකද එය අනාත්මවේ. යමක් අනාත්මද එය 'මෙය මාගේ නොවෙයි.

මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේය"යි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි.

"දිව අනිත්‍යය. යමක් අනිත්‍යද එය දුක්වේ. යමක් දුකද එය අනාත්මවේ. යමක් අනාත්මද එය 'මෙය මාගේ නොවේ. මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේය"යි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය.

"කය අනිත්‍යය. යමක් අනිත්‍යද එය දුක්වේ. යමක් දුකද එය අනාත්මවේ. යමක් අනාත්මද 'එය මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේය'යි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි"

"සිත අනිත්‍යය, යමක් අනිත්‍යද එය දුක්වේ. යමක් දුකද එය අනාත්මවේ. යමක් අනාත්මද එය 'මෙය මාගේ නොවේ, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේය"යි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි."

3. "මහණෙනි, මෙසේ දකින්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ ඇස කෙරෙහිද කලකිරෙයි, කණ කෙරෙහිද කලකිරෙයි, නාසය කෙරෙහිද කලකිරෙයි, දිව කෙරෙහිද කලකිරෙයි, කය කෙරෙහිද කලකිරෙයි, සිත කෙරෙහිද කලකිරෙයි, කලකිරෙන්නේ නොඇලෙයි. නොඇල්මෙන් මිදෙයි. මිදුණුකල්හි මිදුණේය යන දැනීමවේ. ජාතිය (ඉපදීම) ක්ෂයවිය. මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවනලදී.

කළයුතු දෙය කරන ලදී. මේ ආත්මභාවය පිණිස කළ යුතු අනිකක් නැතැයි දැනගණීයයි" (වදාළසේක.)

---

## 2. (අධ්‍යාත්මායතන) දුක්ඛ සූත්‍රය. (2)

1. (මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, ඇස දුකය, යමක් දුකද, එය අනාත්මවේ යමක් අනාත්මවේද, 'එය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි

මෙය මාගේ ආත්මය නොවේය'යි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්කයුතුයි."

"කණ දුකය, නාසය දුකය, දිව දුකය, කය දුකය, සිත දුකය, යමක් දුකද, එය අනාත්මවේ.

"යමක් අනාත්මද එය 'මෙය මාගේ නොවේ, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේය"යි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි.

3. "මහණෙනි, මෙසේ දක්නාවූ ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍යශ්‍රාවකතෙම ඇස කෙරෙහිද කලකිරෙයි. කණ කෙරෙහිද කලකිරෙයි. නාසය කෙරෙහිද කලකිරෙයි. දිව කෙරෙහිද කලකිරෙයි. කය කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇල්මෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුණේය යන දැනීමවේ. ජාතිය (ඉපදීම) ක්ෂයවිය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. කටයුතු දෙය කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැන ගණීයයි" (වදාළසේක.)

---

## 3. (අධ්‍යාත්මායතන) අනාත්ම සූත්‍රය.

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයෙහිදී දේශනා කරන ලදී)

2. "මහණෙනි, ඇස අනාත්මය. යමක් අනාත්මද, එය 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි.

"කණ අනාත්මය, නාසය අනාත්මය, දිව අනාත්මය, කය අනාත්මය, සිත අනාත්මය, යමක් අනාත්මවේද, එය 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි.

"මෙසේ දක්නාවූ ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍යශ්‍රාවක තෙම ඇස කෙරෙහිද කලකිරෙයි, කණ කෙරෙහිද කලකිරෙයි, නාසය කෙරෙහිද කලකිරෙයි, දිව කෙරෙහිද කලකිරෙයි, කය කෙරෙහිද කලකිරෙයි. සිත කෙරෙහිද කලකිරෙයි, කලකිරෙන්නේ නොඇලෙයි, නොඇල්මෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුනේය යන දැනීමවේ. ජාතිය (ඉපදීම) ක්ෂය විය. මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. කළයුතු දෙය කරන ලදී මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගණීයයි" (වදාළසේක)

---

## 4. (බාහිරායතන) අනිත්‍ය සූත්‍රය

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, රූපයෝ අනිත්‍යයහ. යමක් අනිත්‍යද, එය දුකය, යමක් දුකද, එය අනාත්මවේ. යමක් අනාත්ම වේද, එය 'මෙය මාගේ නොවෙයි, 'මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි.

"ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, සහ ධර්මයෝ අනිත්‍යයෝ වෙත්. යමක් අනිත්‍යවේද, එය දුක්වේ යමක් දුක්වේද, එය අනාත්මවේ. යමක් අනාත්මවේද, එය 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි.

3. "මහණෙනි මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම රූපයන් කෙරෙහිද කලකිරෙයි, ශබ්දයන් කෙරෙහිද කලකිරෙයි, ගන්ධයන් කෙරෙහිද කලකිරෙයි, රසයන් කෙරෙහිද කලකිරෙයි, ස්පර්ශයන් කෙරෙහිද කලකිරෙයි, ධර්මයන් කෙරෙහිද කලකිරෙයි, කලකිරෙනුයේ නොඇලෙයි, නොඇල්මෙන් මිදෙයි, මිදුනු කල්හි මිදුනේය යන දැනීමවේ උත්පත්තිය ක්ෂයවිය.

බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. කළයුතු දෙය කරන ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගණියයි” (වදාළසේක.)

---

## 5. (බාහිරායතන) දුක්ඛ සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2 “මහණෙනි, රූපයෝ දුකයහ. යමක් දුක්වේද, එය අනාත්මවේ. යමක් අනාත්ම වේද, එය ‘මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි’ මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි.”

“ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, සහ ධර්මයෝ, දුකයහ. යමක් දුක් වේද, එය අනාත්ම වේ. යමක් අනාත්ම වේද, එය ‘මෙය මාගේ නොවෙයි මෙය මම නොවෙමියි මෙය මාගේ ආත්මය නොවේයයි’ මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි.

3. “මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම රූපයන් කෙරෙහිද කලකිරෙයි. ශබ්දයන් කෙරෙහිද කලකිරෙයි. ගන්ධයන් කෙරෙහිද කලකිරෙයි. රසයන් කෙරෙහිද කලකිරෙයි. ස්පර්ශයන් කෙරෙහිද කලකිරෙයි. ධර්මයන් කෙරෙහිද කලකිරෙයි. කලකිරෙනුයේ නොඇලෙයි. නොඇල්මෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම වේ. උත්පත්තිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. කළයුතු දෙය කරන ලදී. මේ ආත්මය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනීයයි” (වදාළසේක)

---

## 6. (බාහිරායතන) අනාත්ම සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමු වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරනලදී.)

2 "මහණෙනි, රූපයෝ අනාත්මයහ. යමක් අනාත්මද, එය 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යපහත් නුවණින් දැක්ක යුතුයි."

"ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ සහ ධර්මයෝ අනාත්මයහ. යමක් අනාත්මද, එය 'මෙය මාගේ නොවෙයි මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි,' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි.

3. "මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම රූපයන් කෙරෙහිද කලකිරෙයි. ශබ්දයන් කෙරෙහිද කලකිරෙයි. ගන්ධයන් කෙරෙහිද කලකිරෙයි. රසයන් කෙරෙහිද කලකිරෙයි. ස්පර්ශයන් කෙරෙහිද කළකිරෙයි. ධර්මයන් කෙරෙහිද කලකිරෙයි. කලකිරෙනුයේ නොඇලෙයි. නොඇල්මෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම වේ. උත්පත්තිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. කළයුතු දෙය කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනීයයි" (වදාළ සේක.)

---

## 7 අනිත්‍ය සූත්‍රය

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරන ලදී.)

2. "මහණෙනි, අතීතවූද අනාගතවූද ඇස, අනිත්‍යවේ.

දැන් පවත්නා ඇස ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අතීත වූ ඇසෙහිද අපෙක්ෂා රහිතවේ. අනාගත ඇසටද ආශා නොකරයි. දැන් පවත්නා ඇස සම්බන්ධව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.

"අතීතවූද අනාගතවූද කණ අනිත්‍ය වේ. දැන් පවත්නා කණ ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අතීතවූ කණෙහිද අපෙක්ෂා රහිත

වේ. අනාගත කණටද ආශා නොකරයි දැන් පවත්නා කණ සම්බන්ධව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.

"අතීතවූද අනාගතවූද නාසය අනිත්‍යවේ. දැන් පවත්නා නාසය ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අතීතවූ නාසයෙහිද අපෙක්ෂා රහිත වේ. අනාගත නාසයටද ආශා නොකරයි. දැන් පවත්නා නාසය සම්බන්ධව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.

"අතීතවූද අනාගතවූද දිව අනිත්‍යවේ. දැන් පවත්නාවූ දිව ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අතීතවූ දිවෙහිද අපෙක්ෂා රහිතවේ. අනාගත දිවටද ආශා නොකරයි. දැන් පවත්නා දිව සම්බන්ධව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි.

"අතීතවූද අනාගතවූද ශරීරය අනිත්‍යවේ. දැන් පවත්නා ශරීරය ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අතීතවූ ශරීරයෙහිද අපෙක්ෂා රහිතවේ. අනාගත ශරීරයටද ආශා නොකරයි. දැන් පවත්නා ශරීරය සම්බන්ධව කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.

අතීතවූද අනාගතවූද සිත අනිත්‍ය වේ. දැන් පවත්නාවූ සිත ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ සිතෙහිද අපෙක්ෂා රහිත වේ. අනාගත සිතටද ආශා නොකරයි. දැන් පවත්නා සිත සම්බන්ධව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි."

---

## 8. දුක්ඛ සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරනා ලදී.)

2. "මහණෙනි, අතීතවූද අනාගතවූද ඇස දුක්වේ. දැන් පවත්නාවූ ඇස ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අතීතවූ ඇස කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ ඇසට ආශා නොකරයි. දැන් පවත්නාවූ ඇස පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ.

"අතීතවූද අනාගතවූද කණ දුක් වේ. දැන් පවත්නාවූ කණගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අතීතවූ කණ කෙරෙහි අපෙක්ෂා රහිතවේ. අනාගතවූ කණට ආශා නොකරයි. දැන් පවත්නාවූ කණ පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ'

"අතීතවූද අනාගතවූද නාසය දුක් වේ. දැන් පවත්නාවූ නාසය ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම අතීතවූ නාසය කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ නාසයට ආශා නොකරයි. දැන් පවත්නාවූ නාසය පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ."

"අතීතවූද අනාගතවූද දිව දුක් වේ. දැන් පවත්නාවූ දිව ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම අතීතවූ දිව කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ දිවට ආශා නොකරයි. දැන් පවත්නාවූ දිව පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ."

"අතීතවූද අනාගතවූද ශරීරය දුක් වේ. දැන් පවතනාවූ ශරීරය ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ ශරීරය කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ ශරීරයට ආශා නොකරයි දැන් පවත්නාවූ ශරීරය පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ."

"අතීතවූද අනාගතවූද සිත දුක් වේ. දැන් පවත්නාවූ සිත ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අතීතවූ සිත කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ සිතට ආශා නොකරයි දැන් පවත්නාවූ සිත පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ යයි, (වදාළ සේක.)

---

## 9. අනාත්ම සූත්‍රය

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

'මහණෙනි, අතීතවූද අනාගතවූද ඇස අනාත්ම වේ. දැන් පවත්නාවූ ඇස ගැන කියනුම කවරේද, මහණෙනි මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අතීත ඇස කෙරෙහි අපෙක්ෂා රහිත වේ අනාගත ඇසටද ආශා නොකරයි. දැන් පවත්නාවූ ඇස පිළිබඳව කළකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ"

"අතීතවූද අනාගතවූද කණ අනාත්ම වේ. දැන් පවත්නාවූ කණ ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අතීත කණ කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගත කණටද ආශා නොකරයි. දැන් පවත්නාවූ කණ පිළිබඳව කළකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ"

"අතීතවූද අනාගතවූද නාසය අනාත්ම වේ. දැන් පවත්නාවූ නාසය ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීත නාසය කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගත නාසයටද ආශා නොකරයි. දැන් පවත්නාවූ නාසය පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ"

"අතීතවූද අනාගතවූද දිව අනාත්ම වේ. දැන් පවත්නාවූ දිව ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීත දිව කෙරෙහි අපෙක්ෂා රහිතවේ. අනාගත දිවටද ආශා නොකරයි. දැන් පවත්නාවූ දිව පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ"

"අතීතවූද අනාගතවූද ශරීරය අනාත්ම වේ. දැන් පවත්නාවූ ශරීරය ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම අතීත ශරීරය කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගත ශරීරයටද ආශා නොකරයි. දැන් පවත්නාවූ ශරීරය පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ"

"අතීතවූද අනාගතවූද සිත අනාත්ම වේ. දැන් පවත්නාවූ සිත ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීත සිත කෙරෙහි අපෙක්ෂා රහිතවේ. අනාගත සිතටද ආශා නොකරයි. දැන් පවත්නාවූ සිත පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේයය" (වදාළ සේක)

---

## 10. අනිත්‍ය සූත්‍රය (2)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

"මහණෙනි, අතීතවූද අනාගතවූද රූපයෝ අනිත්‍යහ. දැන් පවත්නාවූ රූපයන් ගැන කියනුම කවරේද? මහණෙනි මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ රූපයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ අනාගතවූ රූපයන්ටද ආශා නොකෙරෙයි. දැන් පවත්නාවූ රූපයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ.

"අතීතවූද අනාගතවූද ශබ්දයෝ අනිත්‍යයහ. දැන් පවත්නාවූ ශබ්දයන් ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ

ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ ශබ්දයන් කෙරෙහි අපෙක්ෂා රහිතවේ. අනාගතවූ ශබ්දයන්ටද ආශා නොකරයි. දැන් පවත්නාවූ ශබ්දයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.”

“අතීතවූද අනාගතවූද ගන්ධයෝ අනිත්‍යයහ. දැන් පවත්නාවූ ගන්ධයන් ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ ගන්ධයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ ගන්ධයන්ටද ආශානොකරයි. දැන් පවත්නාවූ ගන්ධයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.

“අතීතවූද අනාගතවූද රසයන් අනිත්‍යයහ. දැන් පවත්නා රසයන් ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ රසයන් කෙරෙහි අපෙක්ෂා රහිතවේ. අනාගතවූ රසයන්ටද ආශා නොකරයි. දැන් පවත්නාවූ රසයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.”

“අතීතවූද අනාගතවූද ස්පර්ශයෝ අනිත්‍යයහ. දැන් පවත්නාවූ ස්පර්ශයන් ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ ස්පර්ශයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ ස්පර්ශයන්ටද ආශා නොකරයි. දැන් පවත්නාවූ ස්පර්ශයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.

‘අතීතවූද අනාගතවූද ධර්මයෝ අනිත්‍යයහ. දැන් පවත්නාවූ ධර්මයන් ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම අතීත ධර්මයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ ධර්මයන්ට ආශා නොකරයි. දැන් පවත්නාවූ ධර්මයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේවේයයි (වදාළ සේක).

---

## 11. දුක්ඛ සූත්‍රය (3)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමු වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරනලදී.)

2. "මහණෙනි, අතීතවූද අනාගතවූද රූපයෝ දුකයහ. දැන් පවත්නාවූ රූපයන් ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍යශ්‍රාවකතෙම අතීතවූ රූපයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ රූපයන්ටද ආශා නොකරයි. දැන් පවත්නාවූ රූපයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි."

"අතීතවූද අනාගතවූද ශබ්දයෝ දුකයහ. දැන් පවත්නාවූ ශබ්දයන් ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍යශ්‍රාවකතෙම අතීතවූ ශබ්දයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ ශබ්දයන්ටද ආශා නොකරයි. දැන් පවත්නාවූ ශබ්දයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි."

"අතීතවූද අනාගතවූද ගන්ධයෝ දුකයහ. දැන් පවත්නාවූ ගන්ධයන් ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අතීතවූ ගන්ධයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ ගන්ධයන්ටද ආශා නොකරයි. දැන් පවත්නාවූ ගන්ධයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි."

"අතීතවූද අනාගතවූද, රසයෝ දුකයහ. දැන් පවත්නාවූ රසයන් ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ රසයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ රසයන්ටද ආශා නොකරයි. දැන් පවත්නාවූ රසයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි."

"අතීතවූද අනාගතවූද ස්පර්ශයෝ දුකයහ. දැන් පවත්නාවූ ස්පර්ශයන් ගැන කියනුම කවරේද? මහණෙනි, මෙසේ දක්නාවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ ස්පර්ශයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ ස්පර්ශයන්ටද ආශා නොකරයි. දැන් පවත්නාවූ ස්පර්ශයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි."

"අතීතවූද අනාගතවූද ධර්මයෝ දුක් වෙත්. දැන් පවත්නාවූ ධර්මයන් ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ ධර්මයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ ධර්මයන්ට ආශා නොකරයි. දැන් පවත්නාවූ ධර්මයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේයයි" (වදාළසේක.)

---

## 12. අනාත්ම සූත්‍රය (2)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමු වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරන ලදී)

2. "මහණෙනි, අතීතවූද අනාගතවූද රූපයෝ අනාත්ම වෙත්. දැන් පවත්නා රූපයන් පිළිබඳව කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම අතීතවූ රූපයන් කෙරෙහි අපෙක්ෂා රහිතවේ. අනාගතවූ රූපයන්ට ආශා නොකරයි. දැන් පවත්නාවූ රූපයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි."

"අතීතවූද අනාගතවූද ශබ්දයෝ අනාත්ම වෙත්. දැන් පවත්නා ශබ්දයන් පිළිබඳව කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම අතීතවූ ශබ්දයන් කෙරෙහි අපෙක්ෂා රහිතවේ. අනාගතවූ ශබ්දයන්ට ආශා නොකරයි. දැන් පවත්නාවූ ශබ්දයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි."

"අතීතවූද අනාගතවූද ගන්ධයෝ අනාත්ම වෙත්. දැන් පවත්නා ගන්ධයන් පිළිබඳව කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍යශ්‍රාවකතෙම අතීතවූ ගන්ධයන්

කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ ගන්ධයන්ට ආශා නොකරයි. දැන් පවත්නාවූ ගන්ධයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.”

“අතීතවූද අනාගතවූද රසයෝ අනාත්ම වෙත්. දැන් පවත්නා රසයන් පිළිබඳව කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ රසයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ රසයන්ට ආශා නොකරයි. දැන් පවත්නාවූ රසයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ.”

“අතීතවූද අනාගතවූද ස්පර්ශයෝ අනාත්ම වෙත්. දැන් පවත්නා ස්පර්ශයන් පිළිබඳව කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ ස්පර්ශයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ ස්පර්ශයන්ට ආශා නොකරයි. දැන් පවත්නාවූ ස්පර්ශයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.”

“අතීතවූද අනාගතවූද ධර්මයෝ අනාත්ම වෙත්. දැන් පවත්නාවූ ධර්මයන් ගැන කියනුම කවරේද, මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත්වූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අතීතවූ ධර්මයන් කෙරෙහි අපෙක්ෂා රහිත වේ. අනාගතවූ ධර්මයන්ට ආශා නොකරයි. දැන් පවත්නාවූ ධර්මයන් පිළිබඳව කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස පිළිපන්නේවේය”යි (වදාළසේක.)

**(පළමුවෙනි අනිත්‍ය වර්ගය නිමි)**

---

## 2. යමක වර්ගය

### 1. සම්බොධ සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී

භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, සම්බොධියෙන් පෙරම සම්‍යක් සම්බුද්ධ නොවූ බොධිසත්ව වූම මට මෙබඳු අදහසක් විය. 'චක්ෂුසයාගේ (ඇසෙහි) ආශ්වාදය කවරේද, ආදීනවය (දොෂය) කවරේද? නිස්සරණ බැහැරවීම කුමක්ද? ශ්‍රොතයාගේ (කණේ) ආශ්වාදය කවරේද? ආදීනවය (දොෂය) කවරේද? නිස්සරණ කවරේද? ඝ්‍රාණයාගේ (නාසයෙන්) ආශ්වාදය කවරේද, ආදීනවය (දෝෂය) කවරේද, නිස්සරණ කවරේද? දිවෙහි ආශ්වාදය කවරේද, ආදීනවය කවරේද, නිස්සරණය කවරේද? කයේ ආශ්වාදය කවරේද, ආදීනවය (දෝෂය) කවරේද, නිස්සරණ කවරේද? චිත්තයාගේ ආශ්වාදය කවරේද, ආදීනවය කවරේද, නිස්සරණය කවරේද කියායි

3. "මහණෙනි, ඒ මට මෙසේ අදහස් විය. 'ඇස නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ ඇසේ ආශ්වාදයවේ.' යම් ඇසක් අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, මේ ඇසේ ආදීනවය වේ. ඇසෙහි යම් ඡන්දරාගය දුරුකිරීමක්, ඡන්දරාගය පහකිරීමක් වේද, මෙය ඇසේ නිස්සරණයයි. "කණ නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ කණේ ආශ්වාදයවේ' යම් කණක් අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, මේ කණේ ආදීනවය වේ. කණෙහි යම් ඡන්දරාගය දුරු කිරීමක් ඡන්දරාගය පහකිරීමක් වේද, මෙය කණේ නිස්සරණයයි." "නාසය නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ නාසයේ ආශ්වාදයවේ. යම් නාසයක් අනිත්‍යයද, දුකද වෙනස්වන ස්වභාවය ඇත්තේද, මේ නාසයේ ආදීනවය වේ. නාසයෙහි යම් ඡන්දරාගය දුරුකිරීමක් ඡන්දරාගය පහකිරීමක් වේද, මෙය නාසයේ නිස්සරණයයි." "දිව නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ දිව පිළිබඳ ආශ්වාදය වේ. යම් දිවක් අනිත්‍යද, දුකද වෙනස්වන ස්වභාව ඇත්තේද, මේ දිව පිළිබඳ

ආදීනවයයි. දිව පිළිබඳ යම් ඡන්දරාගය දුරුකිරීමක්, ඡන්දරාගය පහකිරීමක් වේද, මේ දිව පිළිබඳ නිස්සරණයයි” “කය නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ කයේ ආශ්වාදයයවේ. යම් කයක් අනිත්‍යද, දුකද වෙනස්වන ස්වභාව ඇත්තේද, මේ කයේ ආදීනවයවේ. කයේ යම් ඡන්දරාගය දුරුකිරීමක් ඡන්දරාගය පහකිරීමක් වේද, මෙය කයේ නිස්සරණයයි.” “සිත නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ සිත පිළිබඳ ආශ්වාදයයි. යම් සිතක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාව ඇත්තේද, මේ සිත පිළිබඳ ආදීනවයයි සිතෙහි යම් ඡන්දරාගය දුරුකිරීමක් ඡන්දරාගය පහකිරීමක් වේද, මේ සිත පිළිබඳ නිස්සරණයවේ”

4. “මහණෙනි, මම යම්තාක් මේ සවැදෑරුම්වූ අධ්‍යාත්මිකවූ ආයතනයන්ගේ මෙසේ ආශ්වාදය ආශ්වාද වශයෙන්ද, ආදීනවය ආදීනව වශයෙන්ද, නිස්සරණය නිස්සරණ වශයෙන්ද තත්වූ පරිද්දෙන් මනාව දැන නොගත්තෙම්ද? මහණෙනි, ඒතාක්ම මම දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝකයෙහි මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ සත්වප්‍රජාවෙහි නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළේ වෙමියි ප්‍රකාශ නොකෙළෙමි.

5 “මහණෙනි, යම් කලක පටන් මම මේ සවැදෑරුම්වූ අධ්‍යාත්මිකවූ ආයතනයන්ගේ මෙසේ ආශ්වාදය ආශ්වාද වශයෙන්ද, ආදීනවය ආදීනව වශයෙන්ද, නිස්සරණය නිස්සරණ වශයෙන්ද, තත්වූ පරිද්දෙන් මනාකොට දැන ගත්තෙම්ද, මහණෙනි, එකල්හි මම දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝකයෙහි මහණ බමුණන් සහිතවූ දෙව්මිනිසුන් සහිතවූ ප්‍රජාවෙහි නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළේ වෙමියි, ප්‍රකාශකෙළෙමි. මට වනාහි මාගේ අර්හත්ඵල සමාධිය විනාශ නොවන්නීය මේ අන්තිම ජාතිය වේ. දැන් නැවත ඉපදීමක් නැත්තේය. ඥාන දර්ශනය පහළවිය.”

## 2. සම්බොධ සූත්‍රය (2)

1. (යමක වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, සම්බොධියෙන් පෙරම සම්‍යක් සම්බුද්ධ නොවූ බොධිසත්වවූම මට මෙබඳු අදහසක් විය. 'රූපයන්ගේ ආශ්වාදය කවරේද, ආදීනවය කවරේද, නිස්සරණය කවරේද? ශබ්දයන්ගේ ආශ්වාදය කවරේද, ආදීනවය කවරේද, නිස්සරණය කවරේද, ගන්ධයන්ගේ ආශ්වාදය කවරේද, ආදීනවය කවරේද, නිස්සරණය කවරේද? රසයන්ගේ ආශ්වාදය කවරේද, ආදීනවය කවරේද, නිස්සරණය කවරේද? ස්පර්ශයන්ගේ ආශ්වාදය කවරේද, ආදීනවය කවරේද? නිස්සරණය කවරේද? ධර්මයන්ගේ ආශ්වාදය කවරේද, ආදීනවය කවරේද? නිස්සරණය කවරේද කියායි

3. "මහණෙනි, ඒ මට මෙසේ අදහසක් විය. රූපයන් නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ රූපයන්ගේ ආශ්වාදය වේ. යම් රූප කෙනෙක් අනිත්‍යවෙත්ද, දුක්වෙත්ද, වෙනස්වන ස්වභාව ඇත්තාහුද, මේ රූපයන්ගේ ආදීනවය වේ. රූපයන් කෙරෙහි යම් ඡන්දරාගය දුරුකිරීමක් ඡන්දරාගය පහකිරීමක් වේද, මේ රූපයන්ගේ නිස්සරණයවේ.

"ශබ්දයන් නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ ශබ්දයන්ගේ ආශ්වාදය වේ. යම් ශබ්ද කෙනෙක් අනිත්‍යවෙත්ද, දුක්වෙත්ද, වෙනස්වන ස්වභාව ඇත්තාහුද, මේ ශබ්දයන්ගේ ආදීනවය වේ. ශබ්දයන් කෙරෙහි යම් ඡන්දරාගය දුරු කිරීමක්, ඡන්දරාගය පහකිරීමක් වේද, මේ ශබ්දයන්ගේ නිස්සරණයවේ

"ගන්ධයන් නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ ගන්ධයන්ගේ ආශ්වාදයවේ. යම් ගන්ධ කෙනෙක් අනිත්‍ය වෙත්ද, දුක්වෙත්ද, වෙනස්වන ස්වභාව ඇත්තාහුද, මේ ගන්ධයන්ගේ ආදීනවයවේ. ගන්ධයන් කෙරෙහි යම් ඡන්දරාගය දුරුකිරීමක් ඡන්දරාගය පහකිරීමක් වේද, මේ ගන්ධයන්ගේ නිස්සරණයවේ.

"රසයන් නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ රසයන්ගේ ආශ්වාදයවේ. යම් රස කෙනෙක් අනිත්‍යවෙත්ද, දුක්වෙත්ද, වෙනස්වන ස්වභාව ඇත්තාහුද, මේ රසයන්ගේ ආදීනවය වේ රසයන් කෙරෙහි යම් ඡන්දරාගය දුරුකිරීමක් ඡන්දරාගය පහකිරීමක් වේද, මේ රසයන්ගේ නිස්සරණයවේ.

"ස්පර්ශයන් නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ ස්පර්ශන්ගේ ආශ්වාදයවේ. යම් ස්පර්ශ කෙනෙක් අනිත්‍යවෙත්ද, දුක්වෙත්ද, වෙනස්වන ස්වභාව ඇත්තාහුද, මේ ස්පර්ශයන්ගේ ආදීනවය වේ. ස්පර්ශයන් කෙරෙහි යම් ඡන්දරාගය දුරුකිරීමක් ඡන්දරාගය පහකිරීමක් වේද, මේ ස්පර්ශයන්ගේ නිස්සරණයවේ

"ධර්මයන් නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ ධර්මයන්ගේ ආශ්වාදයවේ. යම් ධර්ම කෙනෙක් අනිත්‍යද දුක්ද, පෙරලෙන ස්වභාව ඇත්තාහුද, මේ ධර්මයන්ගේ ආදීනවය වේ. ධර්මයන් කෙරෙහි යම් ඡන්දරාගය දුරු කිරීමක් ඡන්දරාගයාගේ පහකිරීමක් වේද මේ ධර්මයන්ගේ නිස්සරණයවේ.

4. 'මහණෙනි, යම්තාක් මම මේ සවැදෑරුම්වූ බාහිර ආයතනයන්ගේ මෙසේ ආශ්වාදය ආශ්වාද වශයෙන්ද, ආදීනවය ආදීනව වශයෙන්ද, නිස්සරණය නිස්සරණ වශයෙන්ද තත්වූ පරිද්දෙන් මනාව දැන නොගත්තෙම්ද මහණෙනි, ඒතාක්ම මම දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝකයෙහි මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ සත්වප්‍රජාවෙහි නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළේ වෙමියි, ප්‍රකාශ නොකෙළෙමි.

5. "මහණෙනි, යම් කලක පටන් මම මේ සවැදෑරුම්වූ අධ්‍යාත්මිකවූ ආයතනයන්ගේ මෙසේ ආශ්වාදය ආශ්වාද වශයෙන්ද, ආදීනවය ආදීනව වශයෙන්ද, නිස්සරණය නිස්සරණ වශයෙන්ද තත්වූ පරිද්දෙන් මනාකොට දැනගත්තෙම්ද මහණෙනි, එකල්හි මම දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝකයෙහි මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ සත්වප්‍රජාවෙහි නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය

අවබොධ කෙළේ වෙමියි, ප්‍රකාශ කෙළෙමි. මට වනාහි මාගේ අර්හත්ඵල සමාධිය විනාශ නොවන්නීය. මේ අන්තිම ජාතිය වේ. දැන් නැවත ඉපදීමක් නැත්තේය. ඥාන දර්ශනය පහළවිය."

---

## 3. ආශ්වාද සූත්‍රය (1)

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2 "මහණෙනි, මම ඇස පිළිබඳ ආශ්වාදය සෙවීමෙහි හැසුරුණෙමි. ඇස පිළිබඳ යම් ආශ්වාදයක් වේද, එය අවබොධ කෙළෙමි. ඇස පිළිබඳ යම්තාක් ආශ්වාදයක් වේද, එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නා ලදී. මහණෙනි, මම ඇස පිළිබඳ ආදීනවය සෙවීමෙහි හැසුරුනෙමි. ඇස පිළිබඳ යම් ආදීනවයක් වේද, එය අවබොධ කෙළෙමි. ඇස පිළිබඳව යම්තාක් ආදීනවය වේද, මා විසින් එය ප්‍රඥාවෙන් මනාව දක්නා ලදී. මහණෙනි, මම ඇස පිළිබඳ නිස්සරණය සෙවීමෙහි හැසුරුනෙමි ඇස පිළිබඳ යම් නිස්සරණයක් වේද, එය අවබොධ කෙළෙමි. ඇස පිළිබඳ යම්තාක් නිස්සරණයක් වේද එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නාලදී.

3. "මහණෙනි, මම කණ පිළිබඳව ආශ්වාදය සෙවීමෙහි හැසුරුනෙමි. කණ පිළිබඳ යම් ආශ්වාදයක් වේද, එය අවබොධ කෙළෙමි. කණ පිළිබඳ යම්තාක් ආශ්වාදයක් වේද, එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නාලදී. මහණෙනි, මම කණ පිළිබඳ ආදීනවය සෙවීමෙහි හැසුරුනෙමි. කණ පිළිබඳ යම් ආදීනවයක් වේද, එය අවබොධ කෙළෙමි. කණ පිළිබඳව යම්තාක් ආදීනවය වේද, මා විසින් එය ප්‍රඥාවෙන් මනාව දක්නාලදී. මහණෙනි, මම කණ පිළිබඳ නිස්සරණය සෙවීමෙහි හැසුරුනෙමි. කණ පිළිබඳ යම් නිස්සරණයක් වේද, එය අවබොධ කෙළෙමි. කණ පිළිබඳ යම්තාක් නිස්සරණයක් වේද, එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නා ලදී."

4. "මහණෙනි, මම නාසය පිළිබඳව ආශ්වාදය සෙවීමෙහි හැසුරුනෙමි. නාසය පිළිබඳ යම් ආශ්වාදයක් වේද, එය අවබොධ කෙළෙමි නාසය පිළිබඳ යම්තාක් ආශ්වාදයක් වේද, එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නා ලදී. මහණෙනි, මම නාසය පිළිබඳ ආදීනවය සෙවීමෙහි හැසුරුණෙමි. නාසය පිළිබඳ යම් ආදීනවයක් වේද, එය අවබෝධ කෙළෙමි. නාසය පිළිබඳව යම්තාක් ආදීනවයක් වේද, මා විසින් එය ප්‍රඥාවෙන් මනාව දක්නා ලදී. මහණෙනි, මම නාසය පිළිබඳ නිස්සරණය සෙවීමෙහි හැසුරුණෙමි. නාසය පිළිබඳ යම් නිස්සරණයක් වේද, එය අවබොධ කෙළෙමි. නාසය පිළිබඳ යම්තාක් නිස්සරණයක්වේද, එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නාලදී."

5. 'මහණෙනි, මම දිව පිළිබඳව ආශ්වාදය සෙවීමෙහි හැසුරුනෙමි. දිව පිළිබඳ යම් ආශ්වාදයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් දිව පිළිබඳ ආශ්වාදයක් වේද, එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නා ලදී මහණෙනි, මම දිව පිළිබඳ ආදීනවය සෙවීමෙහි හැසුරුනෙමි දිව පිළිබඳ යම් ආදීනවයක්වේද, එය අවබොධ කෙළෙමි. දිව පිළිබඳ යම්තාක් ආදීනවයක් වේද, එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නා ලදී. මහණෙනි, මම දිව පිළිබඳ නිස්සරණය සෙවීමෙහි හැසුරුනෙමි දිව පිළිබඳ යම් නිස්සරණයක් වේද, එය අවබොධ කෙළෙමි. දිව පිළිබඳ යම්තාක් නිස්සරණයක් වේද, මා විසින් එය ප්‍රඥාවෙන් මනාව දක්නාලදී.

6. "මහණෙනි, මම කය පිළිබඳව ආශ්වාදය සෙවීමෙහි හැසුරුනෙමි. කය පිළිබඳ යම් ආශ්වාදයක් වේද, එය අවබොධ කෙළෙමි. කය පිළිබඳ යම්තාක් ආශ්වාදයක් වේද, එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නාලදී. මහණෙනි මම කය පිළිබඳ ආදීනවය සෙවීමෙහි හැසුරුණෙමි. කය පිළිබඳ යම් ආදීනවයක් වේද, එය අවබොධ කෙළෙමි. කය පිළිබඳව යම්තාක් ආදීනවයක් වේද, මා විසින් එය ප්‍රඥාවෙන් මනාව දක්නා ලදී. මහණෙනි, මම කය පිළිබඳ නිස්සරණය සෙවීමෙහි හැසුරුනෙමි. කය පිළිබඳ යම් නිස්සරණයක් වේද, එය අවබොධ කෙළෙමි. කය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පිළිබඳ යම්තාක් නිස්සරණයක් වේද, එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නාලදී.”

7. “මහණෙනි, මම සිත පිළිබඳ ආශ්වාදය සෙවීමෙහි හැසුරුනෙමි. සිත පිළිබඳ යම් ආශ්වාදයක් වේද, එය අවබොධ කෙළෙමි. සිත පිළිබඳ යම්තාක් ආශ්වාදයක් වේද, එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නාලදී. මහණෙනි, මම සිත පිළිබඳ ආදීනව සෙවීමෙහි හැසුරුනෙමි. සිත පිළිබඳ යම් ආදීනවයක් වේද, එය අවබොධ කෙළෙමි. සිත පිළිබඳ යම්තාක් ආදීනවයක් වේද, එය මා විසින් ප්‍රඥාවෙන් මනාව දක්නාලදී. මහණෙනි, මම යම්තාක් මේ සවැදෑරුම් වූ අධ්‍යාත්මික ආයතනයන්ගේ ආශ්වාදය, ආශ්වාද වශයෙනුත් ආදීනවය, ආදීනව වශයෙනුත් නිස්සරණය නිස්සරණ වශයෙනුත් තත්වූ පරිද්දෙන් මනාව දැන නොගත්තෙම්ද, මහණෙනි, ඒතාක්ම මම දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලොකයෙහි මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ සත්වප්‍රජාවෙහි නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළේ වෙමියි, ප්‍රකාශ නොකෙළෙමි.

8. “මහණෙනි, යම්කලක පටන් මම මේ සවැදෑරුම්වූ අධ්‍යාත්මිකවූ ආයතනයන්ගේ මෙසේ ආශ්වාදය, ආශ්වාද වශයෙන්ද ආදීනවය ආදීනව වශයෙන්ද නිස්සරණය, නිස්සරණ වශයෙන්ද තත්වූ පරිද්දෙන් මනාකොට දැනගත්තෙම්ද, මහණෙනි, එකල්හි මම දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලොකයෙහි, මහණ බමුණන් සහිතවූ දෙව්මිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාවෙහි නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළේ වෙමියි, ප්‍රකාශ කෙළෙමි. මට වනාහි මාගේ අර්හත්ඵල සමාධිය විනාශ නොවන්නීය. මේ අන්තිම ජාතිය වේ දැන් නැවත ඉපදීමක් නැත්තේය. ඥාන දර්ශනය පහළ විය.”

---

## 4. ආශ්වාද සූත්‍රය. (2)

1. (මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, මම රූපයන්ගේ ආශ්වාදය සෙවීමෙහි හැසුරුනෙමි. රූපයන්ගේ යම් ආශ්වාදයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් රූපයන්ගේ ආශ්වාදයක් වේද, මා විසින් එය ප්‍රඥාවෙන් මනාව දක්නාලදී. මහණෙනි, මම රූපයන්ගේ ආදීනව සෙවීමෙහි හැසුරුනෙමි. රූපයන්ගේ යම් ආදීනවයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් රූපයන්ගේ ආදීනවයක් වේද, ප්‍රඥාවෙන් මා විසින් මෙය මනාව දක්නා ලදී මහණෙනි, මම රූපයන්ගේ නිස්සරණය සෙවීමෙහි හැසුරුනෙමි. රූපයන්ගේ යම් නිස්සරණයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් රූපයන්ගේ නිස්සරණය වේද, මා විසින් මෙය ප්‍රඥාවෙන් මනාකොට දක්නා ලදී.

3. "මහණෙනි, මම ශබ්දයන්ගේ ආශ්වාදය සෙවීමෙහි හැසුරුනෙමි ශබ්දයන්ගේ යම් ආශ්වාදයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ශබ්දයන්ගේ ආශ්වාදයක් වේද, මා විසින් එය ප්‍රඥාවෙන් මනාව දක්නාලදී. මහණෙනි, මම ශබ්දයන්ගේ ආදීනව සෙවීමෙහි හැසුරුනෙමි. ශබ්දයන්ගේ යම් ආදීනවයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ශබ්දයන්ගේ ආදීනවයක් වේද, ප්‍රඥාවෙන් මා විසින් මෙය මනාව දක්නා ලදී. මහණෙනි, මම ශබ්දයන්ගේ නිස්සරණය සෙවීමෙහි හැසුරුණෙමි. ශබ්දයන්ගේ යම් නිස්සරණය වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ශබ්දයන්ගේ නිස්සරණය වේද, මා විසින් මෙය ප්‍රඥාවෙන් මනාකොට දක්නා ලදී.

4. "මහණෙනි, මම ගන්ධයන්ගේ ආශ්වාදය සෙවීමෙහි හැසුරුනෙමි. ගන්ධයන්ගේ යම් ආශ්වාදයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ගන්ධයන්ගේ ආශ්වාදයක් වේද, මා විසින් එය ප්‍රඥාවෙන් මනාව දක්නාලදී. මහණෙනි, මම ගන්ධයන්ගේ ආදීනව සෙවීමෙහි හැසුරුනෙමි. ගන්ධයන්ගේ යම් ආදීනවයක්

වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ගන්ධයන්ගේ ආදීනවයක් වේද, ප්‍රඥාවෙන් මා විසින් මෙය මනාව දක්නා ලදී. මහණෙනි, මම ගන්ධයන්ගේ නිස්සරණය සෙවීමෙහි හැසුරුනෙමි. ගන්ධයන්ගේ යම් නිස්සරණයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ගන්ධයන්ගේ නිස්සරණයක් වේද, මා විසින් මෙය ප්‍රඥාවෙන් මනාකොට දක්නා ලදී.

**5.** ‘මහණෙනි, මම රසයන්ගේ ආශ්වාදය සෙවීමෙහි හැසුරුනෙමි. යම් රසයන්ගේ ආශ්වාදයක් වේද, එය අවබෝධ කෙළෙමි. යම්තාක් රසයන්ගේ ආශ්වාදයක් වේද, මා විසින් එය ප්‍රඥාවෙන් මනාව දක්නා ලදී. මහණෙනි, මම රසයන්ගේ ආදීනව සෙවීමෙහි හැසුරුනෙමි, රසයන්ගේ යම් ආදීනවයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් රසයන්ගේ ආදීනවයක් වේද, ප්‍රඥාවෙන් මා විසින් මෙය මනාව දක්නා ලදී. මහණෙනි, මම රසයන්ගේ නිස්සරණය සෙවීමෙහි හැසුරුනෙමි. රසයන්ගේ යම් නිස්සරණයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් රසයන්ගේ නිස්සරණය වේද, මා විසින් මෙය ප්‍රඥාවෙන් මනාකොට දක්නා ලදී.

**6.** “මහණෙනි, මම ස්පර්ශයන්ගේ ආශ්වාදය සෙවීමෙහි හැසුරුනෙමි ස්පර්ශයන්ගේ යම් ආශ්වාදයක් වේද එය අවබොධ කෙළෙමි. යම්තාක් ස්පර්ශයන්ගේ ආශ්වාදයක් වේද, මා විසින් එය ප්‍රඥාවෙන් මනාව දක්නාලදී. මහණෙනි, මම ස්පර්ශයන්ගේ ආදීනව සෙවීමෙහි හැසුරුනෙමි. ස්පර්ශයන්ගේ යම් ආදීනවයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ස්පර්ශයන්ගේ ආදීනවයක් වේද, ප්‍රඥාවෙන් මා විසින් මෙය මනාව දක්නා ලදී. මහණෙනි, මම ස්පර්ශයන්ගේ නිස්සරණය සෙවීමෙහි හැසුරුනෙමි. ස්පර්ශයන්ගේ යම් නිස්සරණයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ස්පර්ශයන්ගේ නිස්සරණය වේද, මා විසින් මෙය ප්‍රඥාවෙන් මනාකොට දක්නා ලදී.

**7.** “මහණෙනි, මම ධර්මයන්ගේ ආශ්වාදය සෙවීමෙහි හැසුරුනෙමි. ධර්මයන්ගේ යම් ආශ්වාදයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ධර්මයන්ගේ ආශ්වාදයක් වේද, මා විසින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එය ප්‍රඥාවෙන් මනාව දක්නා ලදී. මහණෙනි, මම ධර්මයන්ගේ ආදීනව සෙවීමෙහි හැසුරුනෙමි. ධර්මයන්ගේ යම් ආදීනවයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ධර්මයන්ගේ ආදීනවයක් වේද, මා විසින් මෙය ප්‍රඥාවෙන් මනාව දක්නා ලදී. මහණෙනි, මම ධර්මයන්ගේ නිස්සරණය සෙවීමෙහි හැසුරුනෙමි. ධර්මයන්ගේ යම් නිස්සරණයක් වේද, එය අවබොධ කෙළෙමි. යම්තාක් ධර්මයන්ගේ නිස්සරණයක්වේද, මා විසින් මෙය ප්‍රඥාවෙන් දක්නා ලදී.

8. "මහණෙනි, මම යම්තාක් මේ සවැදෑරුම්වූ, බාහිරවූ ආයතනයන්ගේ ආශ්වාදය ආශ්වාදය වශයෙන්ද, ආදීනවය ආදීනව වශයෙන්ද, නිස්සරණය නිස්සරණ වශයෙන් ද තත්වූ පරිද්දෙන් දැන නොගත්තෙම්ද, මහණෙනි, ඒතාක්ම මම දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝකයෙහි මහණ බමුණන් සහිතවූ දෙවි මිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාවෙහි නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළේ වෙමියි ප්‍රකාශ නොකෙළෙමි.

9. "මහණෙනි, යම් කලක පටන් මම මේ සවැදෑරුම්වූ ආධ්‍යාත්මිකවූ ආයතනයන්ගේ මෙසේ ආශ්වාදය ආශ්වාද වශයෙන්ද, ආදීනවය ආදීනව වශයෙන්ද, නිස්සරණය නිස්සරණ වශයෙන්ද, තත්වූ පරිද්දෙන් මනාකොට දැනගත්තෙම්ද, මහණෙනි, එකල්හි මම දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝකයෙහි මහණ බමුණන් සහිතවූ දෙවි මිනිසුන් සහිතවූ සත්වප්‍රජාවෙහි නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළේ වෙමියි, ප්‍රකාශ කෙළෙමි. මට වනාහි මාගේ අර්හත්ඵල සමාධිය විනාශ නොවන්නීය. මේ අන්තිම ජාතියවේ. දැන් නැවත ඉපදීමක් නැත්තේය. ඥාන දර්ශනය පහළවිය."

---

## 5. නොව ආශ්වාද සූත්‍රය. (1)

(මේ සූත්‍රය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, ඇස පිළිබඳ ඉදින් මේ ආශ්වාදය නැත්තේ නම් සත්වයෝ මේ ඇස කෙරෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි ඇස පිළිබඳ ආශ්වාදයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ඇස කෙරෙහි ඇලෙත්. මහණෙනි, ඉදින් ඇස පිළිබඳ මේ ආදීනවය නැත්තේ නම්, සත්වයෝ මේ ඇස කෙරෙහි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම් හෙයකිනුත් ඇස පිළිබඳ ආදීනවයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ඇස කෙරෙහි කලකිරෙත්. මහණෙනි, ඉදින් ඇස පිළිබඳ මේ නිස්සරණයක් නැත්තේ නම්, සත්වයෝ මේ ඇස කෙරෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, යම් හෙයකිනුත් ඇස පිළිබඳ නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ඇස කෙරෙන් මිදෙන්නාහුය.

3 "මහණෙනි, කණ පිළිබඳ ඉදින් මේ ආශ්වාදය නැත්තේ නම්, සත්වයෝ මේ කණ කෙරෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් වනාහි කණ පිළිබඳ ආශ්වාදයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ කණ කෙරෙහි ඇලෙත්. මහණෙනි, ඉදින් කණ පිළිබඳ මේ ආදීනවය නැත්තේ නම්, සත්වයෝ මේ කණ කෙරෙහි නොකලකිරෙන්නාහුය. මහණෙනි යම් හෙයකිනුත් කණ පිළිබඳ ආදීනවයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ කණ කෙරෙහි කලකිරෙත්. මහණෙනි, ඉදින් කණ පිළිබඳ මේ නිස්සරණයක් නැත්තේ නම්, සත්වයෝ මේ කණ කෙරෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, යම් හෙයකිනුත් කණ පිළිබඳ නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ කණ කෙරෙන් මිදෙන්නාහුය.

4. "මහණෙනි, නාසය පිළිබඳ ඉදින් මේ ආශ්වාදය නැත්තේ නම්, සත්වයෝ මේ නාසය කෙරෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් වනාහි නාසය පිළිබඳ ආශ්වාදයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ නාසය කෙරෙහි ඇලෙත්. මහණෙනි, ඉදින් නාසය පිළිබඳ මේ ආදීනවය නැත්තේ නම්, සත්වයෝ මේ නාසය කෙරෙහි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම් හෙයකිනුත් නාසය පිළිබඳ ආදීනවයක් ඇත්තේද,

එහෙයින් සත්වයෝ නාසය කෙරෙහි කලකිරෙත්. මහණෙනි, ඉදින් නාසය පිළිබඳ මේ නිස්සරණයක් නැත්තේ නම්, සත්වයෝ මේ නාසය කෙරෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, යම්හෙයකිනුත් නාසය පිළිබඳ නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ නාසය කෙරෙන් මිදෙන්නාහුය.

5 "මහණෙනි, දිව පිළිබඳ ඉදින් මේ ආශ්වාදයක් නැත්තේ නම්, සත්වයෝ මේ දිව කෙරෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් දිව කෙරෙහි ආශ්වාදය ඇත්තේද, එහෙයින් සත්වයෝ දිව කෙරෙහි ඇලෙත්. මහණෙනි, ඉදින් මේ දිව කෙරෙහි ආදීනවයක් නැත්තේ නම්, සත්වයෝ මේ දිව කෙරෙහි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් දිව කෙරෙහි ආදීනවයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ දිව කෙරෙහි කලකිරෙත්. මහණෙනි, ඉදින් දිව පිළිබඳ මේ නිස්සරණයක් නැත්තේ නම්, සත්වයෝ මේ දිව කෙරෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, යම් හෙයකින් දිව පිළිබඳ නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ දිව කෙරෙන් මිදෙන්නාහුය.

6. "මහණෙනි, කය පිළිබඳ ඉදින් මේ ආශ්වාදය නැත්තේ නම්, සත්වයෝ මේ කය කෙරෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් වනාහි කය පිළිබඳ ආශ්වාදයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ කය කෙරෙහි ඇලෙත්. මහණෙනි, ඉදින් කය පිළිබඳ මේ ආදීනවය නැත්තේ නම්, සත්වයෝ මේ කය කෙරෙහි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම්හෙයකිනුත් කය පිළිබඳ ආදීනවයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ කය කෙරෙහි කලකිරෙත්. මහණෙනි, ඉදින් කය පිළිබඳ මේ නිස්සරණයක් නැත්තේ නම්, සත්වයෝ මේ කය කෙරෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, යම්හෙයකිනුත් කය පිළිබඳ නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ කය කෙරෙන් මිදෙන්නාහුය.

7 "මහණෙනි, ඉදින් මේ සිත සම්බන්ධ ආශ්වාදයක් නැත්තේ නම් සත්වයෝ මේ සිතෙහි නොඇලෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් සිත පිළිබඳ ආශ්වාදයක් ඇත්තේද,

එහෙයින් සත්වයෝ සිත කෙරෙහි ඇලෙත්. මහණෙනි, ඉදින් මේ චිත්තයාගේ ආදීනවයක් නැත්තේ නම්, සත්වයෝ මේ සිතෙහි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් චිත්තයාගේ ආදීනවය ඇත්තේද, එහෙයින් සත්වයෝ සිත කෙරෙහි කලකිරෙත්. මහණෙනි, ඉදින් මේ චිත්තයාගේ නිස්සරණයක් නැත්තේ නම්, සත්වයෝ මේ සිත කෙරෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් චිත්තයාගේ නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ සිත කෙරෙන් මිදෙන්නාහුය.

8. "මහණෙනි, යම්තාක්කල් සත්වයෝ මේ සවැදෑරුම්වූ අධ්‍යාත්මිකවූ ආයතනයන්ගේ ආශ්වාදය ආශ්වාද වශයෙන්ද ආදීනවය ආදීනව වශයෙන්ද නිස්සරණය නිස්සරණ වශයෙන්ද තත්වූ පරිද්දෙන් නොදැනගත්තාහුද, මහණෙනි, ඒතාක්ම සත්වයෝ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝකයෙන් මහණ බමුණන් සහිතවූ දෙවිමිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාවෙන් නික්මුණාහු වෙන්වූනාහු මිදුනාහු ලෝක සීමාව ඉක්මවූ සිතින් යුක්තව වාසය නොකළාහුය. මහණෙනි යම් කලක පටන් සත්වයෝ මේ සවැදෑරුම්වූ ආධ්‍යාත්මිකවූ ආයතනයන්ගේ ආශ්වාදය ආශ්වාද වශයෙන්ද, ආදීනවය ආදීනව වශයෙන්ද, නිස්සරණය නිස්සරණ වශයෙන්ද, තත්වූ පරිද්දෙන් දැනගත්තාහුද, මහණෙනි, එකල්හි සත්වයෝ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝකයෙන් මහණ බමුණන් සහිතවූ දෙවිමිනිසුන් සහිතවූ සත්වප්‍රජාවෙන් නික්මුණාහු, වෙන්වූනාහු, මිදුනාහු, ලෝක සීමාව ඉක්මවූ සිතින් යුක්තව වාසය කෙරෙත්යයි" වදාළසේක.

---

## 6 නොච ආශ්වාද සූත්‍රය. (2)

(මේ සූත්‍රය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. 'මහණෙනි, ඉදින් මේ රූපයන්ගේ ආශ්වාදයක් නැත්තේ නම්, සත්වයෝ මේ රූපයන්හි නොඇලෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් රූපයන්ගේ ආශ්වාදයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ රූපයන්හි ඇලෙත්. මහණෙනි, ඉදින් මේ රූපයන්ගේ ආදීනවයක් නැත්තේ නම්, සත්වයෝ මේ රූපයන්හි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් රූපයන්ගේ ආදීනවයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ රූපයන්හි කලකිරෙත්. මහණෙනි, ඉදින් මේ රූපයන්ගේ නිස්සරණයක් නැත්තේ නම්, සත්වයෝ මේ රූපයන්ගෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් රූපයන්ගේ නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ රූපයන් කෙරෙන් මිදෙන්නාහුය.

3. 'මහණෙනි, ඉදින් මේ ශබ්දයන්ගේ ආශ්වාදයක් නැත්තේ නම්, සත්වයෝ මේ ශබ්දයන්හි නොඇලෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් ශබ්දයන්ගේ ආශ්වාදයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ශබ්දයන්හි ඇලෙත්. මහණෙනි, ඉදින් මේ ශබ්දයන්ගේ ආදීනවයක් නැත්තේ නම්, සත්වයෝ මේ ශබ්දයන්හි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් ශබ්දයන්ගේ ආදීනවයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ශබ්දයන්හි කලකිරෙත්. මහණෙනි, ඉදින් මේ ශබ්දයන්ගේ නිස්සරණයක් නැත්තේ නම්, සත්වයෝ මේ ශබ්දයන්ගෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් ශබ්දයන්ගේ නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ශබ්දයන් කෙරෙන් මිදෙන්නාහුය

4. "මහණෙනි, ඉදින් මේ ගන්ධයන්ගේ ආශ්වාදයක් නැත්තේ නම්, සත්වයෝ මේ ගන්ධයන්හි නොඇලෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් ගන්ධයන්ගේ ආශ්වාදයෙක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ගන්ධයන්හි ඇලෙත්. මහණෙනි, ඉදින් මේ ගන්ධයන්ගේ ආදීනවයක් නැත්තේ නම්, සත්වයෝ මේ ගන්ධයන්හි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් ගන්ධයන්ගේ ආදීනවයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ගන්ධයන්හි කලකිරෙත්. මහණෙනි, ඉදින් මේ ගන්ධයන්ගේ නිස්සරණයක් නැත්තේ නම්, සත්වයෝ මේ ගන්ධයන්ගෙන්

නොමිදෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් ගන්ධයන්ගේ නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ගන්ධයන් කෙරෙන් මිදෙන්නාහුය.

5. "මහණෙනි, ඉදින් මේ රසයන්ගේ ආශ්වාදයක් නැත්තේ නම්, සත්වයෝ මේ රසයන්හි නොඇලෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් රසයන්ගේ ආශ්වාදයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ රසයන්හි ඇලෙත්. මහණෙනි, ඉදින් මේ රසයන්ගේ ආදීනවයක් නැත්තේ නම්, සත්වයෝ මේ රසයන්හි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් රසයන්ගේ ආදීනවයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ රසයන්හි කලකිරෙත්. මහණෙනි, ඉදින් මේ රසයන්ගේ නිස්සරණයක් නැත්තේ නම්, සත්වයෝ මේ රසයන්ගෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් රසයන්ගේ නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ රසයන් කෙරෙන් මිදෙන්නාහුය.

6. "මහණෙනි, ඉදින් මේ ස්පර්ශයන්ගේ ආශ්වාදයක් නැත්තේ නම්, සත්වයෝ මේ ස්පර්ශයන්හි නොඇලෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් ස්පර්ශයන්ගේ ආශ්වාදයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ස්පර්ශයන්හි ඇලෙත්. මහණෙනි, ඉදින් මේ ස්පර්ශයන්ගේ ආදීනවයක් නැත්තේ නම්, සත්වයෝ මේ ස්පර්ශයන්හි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් ස්පර්ශයන්ගේ ආදීනවයක් ඇත්තේද එහෙයින් සත්වයෝ ස්පර්ශයන්හි කලකිරෙත්. මහණෙනි, ඉදින් මේ ස්පර්ශයන්ගේ නිස්සරණයක් නැත්තේ නම්, සත්වයෝ මේ ස්පර්ශයන්ගෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් ස්පර්ශයන්ගේ නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ස්පර්ශයන් කෙරෙන් මිදෙන්නාහුය.

7. "මහණෙනි, ඉදින් මේ ධර්මයන්ගේ ආශ්වාදයෙක් නැත්තේ නම්, සත්වයෝ මේ ධර්මයන්හි නොඇලෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් ධර්මයන්ගේ ආශ්වාදයෙක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ධර්මයන්හි ඇලෙත්. මහණෙනි, ඉදින් මේ ධර්මයන්ගේ ආදීනවයෙක් නැත්තේ නම්, සත්වයෝ මේ

ධර්මයන්හි නොකලකිරෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් ධර්මයන්ගේ ආදීනවයෙක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ධර්මයන්හි කලකිරෙත්. මහණෙනි, ඉදින් මේ ධර්මයන්ගේ නිස්සරණයක් නැත්තේ නම්, සත්වයෝ මේ ධර්මයන් කෙරෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, යම්හෙයකින් ධර්මයන්ගේ නිස්සරණයක් ඇත්තේද, එහෙයින් සත්වයෝ ධර්මයන් කෙරෙන් මිදෙන්නාහුය.

8. "මහණෙනි, යම්තාක් කල් සත්වයෝ මේ සවැදෑරුම්වූ බාහිරවූ ආයතනයන්ගේ ආශ්වාදය ආශ්වාද වශයෙන්ද, ආදීනවය ආදීනව වශයෙන්ද, නිස්සරණය නිස්සරණ වශයෙන්ද, තත්වූ පරිද්දෙන් නොදැන ගත්තාහුද, මහණෙනි, ඒතාක්ම සත්වයෝ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝකය කෙරෙන් මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ ප්‍රජාව කෙරෙන් නික්මුණාහු වෙන්වූවාහු මිදුනාහු, ලෝකසීමාව ඉක්මවූ සිතින් යුක්තව වාසය නොකළාහුය. මහණෙනි, යම්කලක පටන් සත්වයෝ මේ සවැදෑරුම්වූ බාහිරවූ ආයතනයන්ගේ ආශ්වාදය ආශ්වාද වශයෙන්ද, ආදීනවය ආදීනව වශයෙන්ද, නිස්සරණය නිස්සරණ වශයෙන්ද, තත්වූපරිද්දෙන් දැනගත්තාහුද, මහණෙනි, එකල්හි සත්වයෝ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝකයෙන් මහණ බමුණන් සහිතවූ දෙව්මිනිසුන් සහිතවූ ප්‍රජාවෙන් නික්මුණාහු වෙන්වූවාහු මිදුනාහු ලෝක සීමාව ඉක්මවූ සිතින් යුක්තව වාසය කෙරෙත්යයි" වදාළේය.

---

## 7. අභිනන්දන සූත්‍රය. (1)

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, යමෙක් ඇසට කැමතිවෙයිද, හෙතෙම දුකට කැමතිවෙයි. යමෙක් දුකට කැමතිවේද, හෙතෙම දුකෙන් නොමිදුනේයයි කියමි.

"යමෙක් කණට කැමතිවෙයිද, හෙතෙම දුකට කැමතිවෙයි. යමෙක් දුකට කැමතිවේද, හෙතෙම දුකෙන් නොමිදුනේයයි කියමි.

"යමෙක් නාසයට කැමතිවෙයිද, හෙතෙම දුකට කැමතිවෙයි. යමෙක් දුකට කැමතිවේද, හෙතෙම දුකෙන් නොමිදුනේයයි කියමි.

"යමෙක් දිවට කැමතිවෙයිද, හෙතෙම දුකට කැමතිවෙයි. යමෙක් දුකට කැමතිවේද, හෙතෙම දුකෙන් නොමිදුනේයයි කියමි.

"යමෙක් කයට කැමතිවෙයිද, හෙතෙම දුකට කැමතිවෙයි. යමෙක් දුකට කැමතිවේද, හෙතෙම දුකෙන් නොමිදුනේයයි කියමි.

"යමෙක් සිතට කැමතිවෙයිද, හෙතෙම දුකට කැමතිවෙයි. යමෙක් දුකට කැමතිවේද, හෙතෙම දුකෙන් නොමිදුනේයයි කියමි."

3. "මහණෙනි, යමෙක් වනාහි ඇසට කැමති නොවේද, හෙතෙම දුකට කැමති නොවෙයි. යමෙක් දුකට කැමති නොවේද, හෙතෙම දුකින් මිදුනේයයි කියමි.

"යමෙක් වනාහි කණට කැමති නොවේද, හෙතෙම දුකට කැමති නොවෙයි. යමෙක් දුකට කැමති නොවේද, හෙතෙම දුකින් මිදුනේයයි කියමි.

"යමෙක් වනාහි නාසයට කැමති නොවේද, හෙතෙම දුකට කැමති නොවෙයි. යමෙක් දුකට කැමති නොවේද, හෙතෙම දුකින් මිදුනේයයි කියමි.

"යමෙක් දිවට කැමති නොවේද, හෙතෙම දුකට කැමති නොවෙයි. යමෙක් දුකට කැමති නොවේද, හෙතෙම දුකින් මිදුනේයයි කියමි.

"යමෙක් වනාහි කයට කැමති නොවේද, හෙතෙම දුකට කැමති නොවෙයි. යමෙක් දුකට කැමති නොවේද, හෙතෙම දුකින් මිදුනේයයි කියමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යමෙක් සිතට කැමති නොවේද, හෙතෙම දුකට කැමති නොවෙයි. යමෙක් දුකට කැමති නොවේද, හෙතෙම දුකින් මිදුනේයයි කියමියි," (වදාළේය.)

---

## 8. අභිනන්දන සූත්‍රය. (2)

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2 "මහණෙනි, යමෙක් රූපයන්ට කැමතිවේද, හෙතෙම දුකට කැමති වෙයි. යමෙක් දුකට කැමති වේද, හෙතෙම දුකින් නොමිදුනේයයි කියමි.

"යමෙක් ශබ්දයන්ට කැමති වේද, හෙතෙම දුකට කැමතිවෙයි. යමෙක් දුකට කැමතිවේද, හෙතෙම දුකින් නොමිදුනේයයි කියමි.

'යමෙක් ගන්ධයන්ට කැමති වේද, හෙතෙම දුකට කැමති වෙයි. යමෙක් දුකට කැමති වේද, හෙතෙම දුකින් නොමිදුනේයයි කියමි.

"යමෙක් රසයන්ට කැමතිවේද, හෙතෙම දුකට කැමති වෙයි. යමෙක් දුකට කැමති වේද, හෙතෙම දුකින් නොමිදුනේයයි කියමි.

"යමෙක් ස්පර්ශයන්ට කැමති වේද, හෙතෙම දුකට කැමති වෙයි යමෙක් දුකට කැමති වේද, හෙතෙම දුකින් නොමිදුනේයයි කියමි.

යමෙක් ධර්මයන්ට කැමති වේද, හෙතෙම දුකට කැමති වෙයි. යමෙක් දුකට කැමති වේද, හෙතෙම දුකින් නොමිදුනේයයි කියමි."

3. "මහණෙනි, යමෙක් වනාහි, රූපයන්ට කැමති නොවේද, හෙතෙම දුකට කැමති නොවේ. යමෙක් දුකට කැමති නොවේද, හෙතෙම දුකෙන් මිදුනේයයි කියමි.

"යමෙක් ශබ්දයන්ට කැමති නොවේද, හෙතෙම දුකට කැමති නොවේ. යමෙක් දුකට කැමති නොවේද, හෙතෙම දුකෙන් මිදුනේයයි කියමි.

"යමෙක් ගන්ධයන්ට කැමති නොවේද, හෙතෙම දුකට කැමති නොවේ. යමෙක් දුකට කැමති නොවේද, හෙතෙම දුකෙන් මිදුනේයයි කියමි.

"යමෙක් රසයන්ට කැමති නොවේද, හෙතෙම දුකට කැමති නොවේ. යමෙක් දුකට කැමති නොවේද, හෙතෙම දුකෙන් මිදුනේයයි කියමි.

"යමෙක් ස්පර්ශයන්ට කැමති නොවේද, හෙතෙම දුකට කැමති නොවේ. යමෙක් දුකට කැමති නොවේද, හෙතෙම දුකෙන් මිදුනේයයි කියමි.

"යමෙක් ධර්මයන්ට කැමති නොවේද, හෙතෙම දුකට කැමති නොවේ. යමෙක් දුකට කැමති නොවේද, හෙතෙම දුකෙන් මිදුනේයයි කියමියි," (වදාළේය)

---

## 9. උප්පාද සූත්‍රය. (1)

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** "මහණෙනි, "ඇසේ යම් ඉපදීමක්, පැවතීමක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම රෝගයන්ගේ පැවැත්ම ජරාමරණයන්ගේ පහළවීම වේ.

"කණේ යම් ඉපදීමක්, පැවතීමක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම, ජරාමරණයන්ගේ පහළවීම වේ.

"නාසයේ යම් ඉපදීමක්, පැවතීමක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම, ජරාමරණයන්ගේ පහළවීමවේ.

"දිවේ යම් ඉපදීමක්, පැවතීමක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම, ජරාමරණයන්ගේ පහළවීම වේ.

"කයේ යම් ඉපදීමක්, පැවතීමක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම, ජරාමරණයන්ගේ පහළවීම වේ.

"සිතේ යම් ඉපදීමක්, පැවතීමක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම, ජරාමරණයන්ගේ පහළවීම වේ."

3. "මහණෙනි, ඇසේ යම් නිරුද්ධවීමක්, සංසිඳීමක්, විනාශවීමක් වේද, එය දුක්ඛයාගේ නිරුද්ධවීම, රෝගයන්ගේ සංසිඳීම, ජරාමරණයන්ගේ විනාශවීම වේ. කණේ යම් නිරුද්ධවීමක්, සංසිඳීමක්, විනාශවීමක් වේද, එය දුක්ඛයාගේ නිරුද්ධ වීම, රෝගයන්ගේ සංසිඳීම, ජරාමරණයන්ගේ විනාශවීම වේ. නාසයේ යම් නිරුද්ධවීමක්, සංසිඳීමක්, විනාශවීමක් වේද, එය දුක්ඛයාගේ නිරුද්ධවීම, රෝගයන්ගේ සංසිඳීම, ජරාමරණයන් ගේ විනාශවීම වේ. දිවේ යම් නිරුද්ධවීමක්, සංසිඳීමක්, විනාශ වීමක් වේද, එය දුක්ඛයාගේ නිරුද්ධවීම, රෝගයන්ගේ සංසිඳීම ජරාමරණයන්ගේ විනාශවීමවේ. කයේ යම් නිරුද්ධවීමක්, සංසිඳීමක්, විනාශවීමක් වේද, එය දුක්ඛයාගේ නිරුද්ධවීම, රෝගයන්ගේ සංසිඳීම, ජරාමරණයන්ගේ විනාශවීම වේ. සිතේ යම් නිරෝධයක්, සංසිඳීමක්, විනාශයක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය, රෝගයන්ගේ සංසිඳීම, ජරාමරණයන් ගේ විනාශය වේයයි," (වදාළසේක.)

---

## 10. උප්පාද සූත්‍රය. (2)

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, රූපයන්ගේ යම් උත්පාදයක්, පැවැත්මක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ උත්පත්තිය, රෝගයන්ගේ පැවැත්ම, ජරාමරණයන්ගේ පහළවීම වේ. "ශබ්දයන්ගේ යම් උත්පාදයක්, පැවැත්මක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ උත්පත්තිය, රෝගයන්ගේ පැවැත්ම, ජරාමරණයන්ගේ පහළවීම වේ. "ගන්ධයන්ගේ යම් උත්පාදයක්, පැවැත්මක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ උත්පත්තිය, රෝගයන්ගේ පැවැත්ම, ජරාමරණයන්ගේ පහළවීම වේ. "රසයන්ගේ යම් උත්පාදයක්, පැවැත්මක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ උත්පත්තිය, රෝගයන්ගේ පැවැත්ම, ජරා මරණයන්ගේ පහළවීම වේ. "ස්පර්ශයන්ගේ යම් උත්පාදයක්, පැවැත්මක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ උත්පත්තිය, රෝගයන්ගේ පැවැත්ම, ජරාමරණයන්ගේ පහළවීම වේ. "ධර්මයන්ගේ යම් ඉපදීමක්, පැවතීමක්, පහළවීමක් වේද, එය දුක්ඛයාගේ ඉපදීම, රෝගයන්ගේ පැවැත්ම, ජරා මරණයන්ගේ පහළවීම වේ."

3. 'මහණෙනි, රූපයන්ගේ යම් නිරෝධයක්, සංසිඳීමක්, විනාශයක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය, රෝගයන්ගේ සංසිඳීම, ජරාමරණයන්ගේ විනාශය වේ. "ශබ්දයන්ගේ යම් නිරෝධයක්, සංසිඳීමක්, විනාශයක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය, රෝගයන්ගේ සංසිඳීම, ජරාමරණයන්ගේ විනාශය වේ. "ගන්ධයන්ගේ යම් නිරෝධයක්, සංසිඳීමක්, විනාශයක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය, රෝගයන්ගේ සංසිඳීම, ජරාමරණයන්ගේ විනාශය වේ. "රසයන්ගේ යම් නිරෝධයක්, සංසිඳීමක්, විනාසයක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය, රෝගයන්ගේ සංසිඳීම, ජරාමරණයන්ගේ විනාශය වේ. "ස්පර්ශයන්ගේ යම් නිරෝධයක්, සංසිඳීමක්, විනාශයක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය, රෝගයන්ගේ සංසිඳීම, ජරාමරණයන්ගේ විනාශය වේ. "ධර්මයන්ගේ යම් නිරෝධයක්, සංසිඳීමක්, විනාශයක් වේද, එය දුක්ඛයාගේ නිරෝධය, රෝගයන්ගේ සංසිඳීම, ජරා මරණ දෙදෙනාගේ විනාශය වේයයි," (වදාළසේක.)

**(දෙවෙනි යමක වර්ගය නිමි.)**

---

# 3. සබ්බ වර්ගය.

## 1. සබ්බ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2 "මහණෙනි, නුඹලාට සියල්ල දේශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, සියල්ල කවරේදයත්? ඇසද, රූපයෝද, කණද, ශබ්දයෝද, ඝ්‍රාණයද, ගන්ධයෝද, දිවද, රසයෝද, කයද, ස්පර්ශයෝද, සිතද, ධර්මයෝද, මහණෙනි, මේ සියල්ල යයි කියනු ලැබේ

3 'මහණෙනි, යමෙක් 'මම සියල්ල හැර අන්‍යවූ සියල්ලක් පණවන්නෙමියි මෙසේ කියන්නේද ඔහුගේ ඒ කීම වචන මාත්‍රයක්ම වන්නේය. අනික් සියල්ලක් ඇද්දැයි විචාරණ ලද්දේ මෙනම් සියල්ලයයි වචනයෙන් පැමිණීමට නොහැකි වන්නේය. වඩාත් වෙහෙසට පැමිණෙන්නේය, ඊට හේතුකවරේද? මහණෙනි, විෂය නොවූවෙක්හි යම්සේද එසේ විෂය නොවන හෙයිනියි." (වදාළේය.)

---

## 2. පහාණ සූත්‍රය.

1. (මේ වර්ගයේ මේ සූත්‍රයද පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදි දේශනා කරන ලදී)

2. "මහණෙනි, සියල්ල පහකිරීම පිණිස තොපට ධර්ම දේශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, සියල්ල පහකිරීම පිණිසවූ ධර්මය කවරේද?

"මහණෙනි, ඇස දුරුකට යුතුයි. රූපයෝ දුරුකට යුත්තාහ. චක්ඛු විඤ්ඤාණය දුරුකට යුතුයි. චක්ඛු සම්ඵස්සය දුරුකට යුතුයි. චක්ඛු සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ සැපද නොවූ දුක්ද නොවූ වේදනාවක් හෝ උපදීද, එයද දුරුකට යුතුයි.

'මහණෙනි, කණ දුරුකට යුතුයි. ශබ්දයෝ දුරුකට යුත්තාහ. සොත විඤ්ඤාණය දුරුකට යුතුයි. සොතසම්ඵස්සය දුරුකට යුතුයි. සොතසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ සැපද නොවූ දුක්ද නොවූ වේදනාවක් හෝ උපදීද, එයද දුරුකටයුතුයි.

"මහණෙනි, නාසය දුරුකටයුතුයි, ගන්ධයෝ දුරුකට යුත්තාහ. ඝාණ විඤ්ඤාණය දුරුකට යුතුයි. ඝාණසම්ඵස්සය දුරුකට යුතුයි. ඝාණසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ සැපද නොවූ දුක්ද නොවූ වේදනාවක් හෝ උපදීද, එයද දුරුකටයුතුයි.

"මහණෙනි, දිව දුරුකට යුතුයි. රසයෝ දුරුකට යුත්තාහ. ජිව්හා විඤ්ඤාණය දුරුකටයුතුයි. ජිව්හා සම්ඵස්සය දුරුකට යුතුයි. ජිව්හා සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ සැප නොවූ දුක්ද නොවූ වේදනාවක් හෝ උපදීද, එයද දුරුකට යුතුයි.

"මහණෙනි, කය දුරුකට යුත්තාහ. ස්පර්ශයෝ දුරුකට යුත්තාහ. කාය විඤ්ඤාණය දුරුකට යුතුයි. කාය සම්ඵස්සය දුරුකට යුතුයි. කාය සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ සැපද නොවූ දුක්ද නොවූ වේදනාවක් උපදීද, එයද දුරු කටයුතුයි.

"මහණෙනි, සිත දුරුකට යුතුයි. ධර්මයෝ දුරුකට යුත්තාහ. මනොවිඤ්ඤාණය දුරුකට යුතුයි. මනොසම්ඵස්සය දුරුකට යුතුයි. මනොසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ සැපද නොවූ දුක්ද නොවූ වේදනාවක් හෝ

උපදීද, එයද දුරුකට යුතුයි. මහණෙනි, මේ වනාහි සියල්ල දුරුකිරීම පිණිසවූ ධර්මය වේයයි," (වදාළේය.)

---

## 3. පහාණ සූත්‍රය (2)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමු වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, සියල්ල විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකිරීම පිණිස තොපට ධර්මය දේශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, සියල්ල විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කිරීම පිණිස (පවත්නා) ධර්මය කවරේද?

"මහණෙනි, ඇස විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුතුයි. රූපයෝ විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුත්තාහ. චක්ඛු විඤ්ඤාණය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකට යුතුය. චක්ඛු සම්ඵස්සය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුතුයි. චක්ඛු සම්ඵස්සය නිසා යම් සුඛ වේදනාවක් හෝ දුක්ඛ වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද එයද විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකටයුතුයි.

"මහණෙනි, කණ විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකටයුතුයි. ශබ්දයෝ විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුත්තාහ. සොත විඤ්ඤාණය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකට යුතුය. සොත සම්ඵස්සය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුතුයි. සොත සම්ඵස්සය නිසා යම් සුඛ වේදනාවක් හෝ දුක්ඛ වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද එයද විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකටයුතුයි.

"මහණෙනි, නාසය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුතුයි. ගන්ධයෝ විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුත්තාහ. ඝාණ විඤ්ඤාණය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකට යුතුය. ඝාණසම්ඵස්සය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුතුය. ඝාණසම්ඵස්සය නිසා යම් සුඛ වේදනාවක් හෝ

දුක්ඛ වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකට යුතුයි.

"මහණෙනි, දිව විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුත්තීය. රසයෝ විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුත්තාහ. ජිව්හා විඤ්ඤාණය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුතුය. ජිව්හා සම්ඵස්සය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුතුයි. ජිව්හා සම්ඵස්සය නිසා යම් සුඛ වේදනාවක් හෝ දුක්ඛ වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකට යුතුයි.

"මහණෙනි, කය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුතුයි. ස්පර්ශයෝ විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකට යුත්තාහ. කාය විඤ්ඤාණය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකට යුතුය. කාය සම්ඵස්සය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකට යුතුයි. කාය සම්ඵස්සය නිසා යම් සුඛ වේදනාවක් හෝ දුක්ඛ වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද විශෙෂයෙන් පිරිසිඳ දැන දුරුකට යුතුයි."

"මහණෙනි, ඇස මඩනා ලද්දේ වෙයි. රූපයෝ මඩනා ලද්දාහ. චක්ෂුර්විඥානය මඩනාලද්දේ වෙයි. චක්ඛුසම්ඵස්සය මඩනා ලද්දේ වෙයි. චක්ඛුසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද මඩනා ලද්දේ වෙයි. කුමකින් මඩනා ලද්දේද ජාතියෙන් ජරාමරණයෙන් මඩනාලදී. ශෝකයෙන් හැඬීමෙන් වැළපීමෙන් දුකින් දොම්නසින් දැඩි වෙහෙසින් මඩනා ලද්දේ වෙයි."

සිත විශේෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකට යුතුයි. ධර්මයෝ විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකට යුත්තාහ. මනොවිඤ්ඤාණය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකට යුතුයි. මනොසම්ඵස්සය විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරු කටයුතුයි. මනොසම්ඵස්සය නිසා යම් සුඛ වේදනාවක් හෝ දුක්ඛ වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද

විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකටයුතුයි. මහණෙනි, මෙය වනාහි සියල්ල විශෙෂයෙන් දැන පිරිසිඳ දැන දුරුකිරීම පිණිස (පවත්නාවූ) ධර්මය වේයයි,” (වදාළේය.)

---

## 4. පරිජාන සූත්‍රය. (1)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. “මහණෙනි, සියල්ල විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහ නොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැතිකිරීමට සුදුසු නොවේ. මහණෙනි, කවර නම් සියල්ලක් විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැති කිරීම නුසුදුසු වේද?”

3. “මහණෙනි, ඇස විශෙෂයෙන් නොදක්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහ නොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැති කිරීමට සුදුසු නොවේ. රූපයන් විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහ නොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැති කිරීමට නුසුදුසු වේ. චක්ඛු විඤ්ඤාණය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. චක්ඛුසම්ඵස්සය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. චක්ඛුසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද එයද විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහ නොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ

“මහණෙනි, කණ විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ

දුක් නැති කිරීමට සුදුසු නොවේ. ශබ්දයන් විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැතිකිරීමට නුසුදුසුවේ. සෝත විඤ්ඤාණය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. සෝතසම්ඵස්සය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහ නොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. සොතසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද එයද විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහ නොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ,

"මහණෙනි, නාසය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැති කිරීමට සුදුසු නොවේ. ගන්ධයෝ විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහ නොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැතිකිරීමට නුසුදුසු වේ. ඝාණ විඤ්ඤාණය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහ නොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. ඝාණසම්ඵස්සය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. ඝාණසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද එය විශෙෂයෙන් නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ."

"දිව විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. රසයන් විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගලතෙම දුක් නැසීමට සුදුසු නොවේ. ජිව්හා විඤ්ඤාණය විශෙෂයෙන්

නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැසීමට නුසුදුසුවේ. ජිව්හා සම්ඵස්සය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගලතෙම දුක් නැසීමට සුදුසු නොවේ. ජිව්හා සම්ඵස්සය නිසා යම් මේ සැප වේදනාවක් දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට නුසුදුසුවේ."

"මහණෙනි, කය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. කය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැති කිරීමට නුසුදුසු වේ. කායවිඤ්ඤාණය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. කාය සම්ඵස්සය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. කාය සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද එයද විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ"

"සිත විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහ නොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. මනොවිඤ්ඤාණය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. මනොසම්ඵස්සය විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහ නොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු නොවේ. මනොසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැසීමට සුදුසු නොවේ."

"මහණෙනි, මේ වනාහි සියල්ල විශෙෂයෙන් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැසීමට සුදුසු නොවේ.

4. "මහණෙනි, සියල්ලද වනාහි විශෙෂයෙන් දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැසීමට සුදුසුවේ. මහණෙනි, කවරනම් සියල්ලක් මනාව පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු වේද?"

"මහණෙනි, ඇස මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ තැනැත්තේ දුක් නැසීමට සුදුසුවේ. රූපයන් මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැසීමට සුදුසු වේ. චක්ෂුර්විඥානය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ. චක්ඛු සම්ඵස්සය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ. චක්ඛු සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ."

"මහණෙනි, කණ මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ තැනැත්තේ දුක් නැසීමට සුදුසුවේ. ශබ්දයන් මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු වේ. සොත විඤ්ඤාණය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ. සොතසම්ඵස්සය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ. සොත සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛම සුඛ වේදනාවක් හෝ උපදීද, එයද මනාව දන්නාවූ

පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ.

"මහණෙනි, නාසය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ තැනැත්තේ දුක් නැසීමට සුදුසුවේ. ගන්ධයන් මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ. ඝාණවිඥ්ඤාණය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ. ඝාණ සම්ඵස්සය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ. ඝාණ සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපදීද එයද මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහ කරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ.

"මහණෙනි, දිව මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැසීමට සුදුසුවේ. රසයන් මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු වේ. ජිව්හා විඥ්ඤාණය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ. ජිව්හා සම්ඵස්සය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ. ජිව්හා සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැසීමට සුදුසුවේ."

"මහණෙනි, කය විශෙෂයෙන් දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහ කරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැති කිරීමට සුදුසුවේ. ස්පර්ශයන් මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැති කිරීමට සුදුසු වේ. චක්ඛුවිඥ්ඤාණය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැසීමට සුදුසුවේ.

කායසම්ඵස්සය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු වේ. චක්ඛුසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද එයද මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැසීමට සුදුසුවේ."

"මහණෙනි, සිත මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැසීමට සුදුසුවේ. ධර්මයන් මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගලතෙමේ දුක්නැසීමට සුදුසුවේ. මනොවිඤ්ඤාණය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ. මනොසම්ඵස්සය මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහකරන්නාවූ පුද්ගලතෙමේ දුක් නැසීමට සුදුසු වේ. මනොසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද මනාව දන්නාවූ පිරිසිඳ දන්නාවූ මාර්ගයෙන් පහ කරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසුවේ. මහණෙනි, මේ සියල්ල වනාහි මනාව දන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට සුදුසු වේය"යි (වදාළේය.)

---

## 5. පරිජාන සූත්‍රය. (2)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරණ ලදී.)

2. "මහණෙනි, සියල්ල මනාව නොදන්නාවූ, පිරිසිඳ නොදන්නාවූ, මාර්ගයෙන් පහනොකරන්නාවූ පුද්ගල තෙමේ දුක් නැසීමට නුසුදුසු වේ. මහණෙනි, කවරනම් සියල්ලක් මනාව නොදන්නේ, පිරිසිඳ නොදන්නේ, මාර්ගයෙන් පහ නොකරන්නේ දුක් නැසීමට නුසුදුසුවේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, යම් ඇසකුත් වේද, යම් රූපයෝත් වෙත්ද, යම් චක්ඛු විඥ්ඥාණයකුත් වේද, යම් චක්ඛු විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයෝත් වෙත්ද, යම් කණකුත් වේද, යම් ශබ්දයෝත් වෙත්ද, යම් සෝත විඥ්ඥාණයකුත් වේද, යම් සෝත විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයෝත් වෙත්ද, යම් නාසයකුත් වේද, යම් ගන්ධයෝත් වෙත්ද, යම් ඝාණ විඥ්ඥාණයකුත් වේද, යම් ඝාණ විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයෝත් වෙත්ද, යම් දිවකුත් වේද, යම් රසයෝත් වෙත්ද, යම් ජිව්හා විඥ්ඥාණයකුත් වේද, යම් ජිව්හා විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයෝත් වෙත්ද, යම් කයකුත් වේද, යම් ස්පර්ශයෝත් වෙත්ද, යම් කාය විඥ්ඥාණයකුත් වේද, යම් කාය විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයෝත් වෙත්ද, යම් සිතකුත් වේද, යම් ධර්මයෝත් වෙත්ද, යම් මනොවිඥානයකුත් වේද, යම් මනොවිඥානයෙන් දතයුතු ධර්මයෝත් වෙත්ද, මහණෙනි, මේ සියල්ල වනාහි මනාව නොදන්නේ, පිරිසිඳ නොදන්නේ, මාර්ගයෙන් පහනොකරන්නේ දුක් නැසීමට නුසුදුසු වේ.

"මහණෙනි, සියල්ල වනාහි මනාව දන්නේ, පිරිසිඳ දන්නේ, මාර්ගයෙන් පහකරන්නේ දුක් නැසීමට සුදුසු වේ. මහණෙනි, කවර නම් සියල්ලක් මනාව දන්නේ, පිරිසිඳ දන්නේ, මාර්ගයෙන් පහනොකරන්නේ දුක් නැසීමට සුදුසු වේද, මහණෙනි, යම් ඇසකුත් වේද, යම් රූපයෝත් වෙත්ද, යම් චක්ඛු විඥ්ඥාණයකුත් වේද, යම් චක්ඛු විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයෝත් වෙත්ද, යම් කණකුත් වේද, යම් ශබ්දයෝත් වෙත්ද, යම් සෝත විඥ්ඥාණයකුත් වේද, යම් සෝත විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයෝත් වෙත්ද, යම් නාසයකුත් වේද, යම් ගන්ධයෝත් වෙත්ද, යම් ඝාණ විඥ්ඥාණයකුත් වේද, යම් ඝාණ විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයෝත් වෙත්ද, යම් දිවකුත් වේද, යම් රසයෝත් වෙත්ද, යම් ජිව්හා විඥ්ඥාණයකුත් වේද, යම් ජිව්හා විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයෝත් වෙත්ද, යම් කයකුත් වේද, යම් ස්පර්ශයෝත් වෙත්ද, යම් කාය විඥ්ඥාණයක් වේද, යම් කාය විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයෝත් වෙත්ද, යම් සිතකුත් වේද, යම් ධර්මයෝත් වෙත්ද, යම් මනොවිඥානයකුත්

වේද, යම් මනොවිඥානයෙන් දතයුතු ධර්මයෝත් වෙත්ද, මහණෙනි, මේ සියල්ල වනාහි මනාව දන්නේ, පිරිසිඳ දන්නේ, මාර්ගයෙන් පහකරන්නේ දුක නැසීමට සුදුසු වේයයි,” (වදාළේය.)

---

## 6. ආදිත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ගයා ශීර්ෂයෙහි භික්ෂූන් දහසක් හා සමග වාසය කරණ සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. “මහණෙනි, සියල්ල ඇවිලගන්නා ලද්දේ වෙයි. මහණෙනි, කවරනම් සියල්ලක් ඇවිලගන්නා ලද්දේ වේද?

2. “මහණෙනි, ඇස ඇවිලගන්නා ලද්දේවෙයි රූපයෝ ඇවිලගන්නා ලද්දාහ. චක්ඛු විඤ්ඤාණය ඇවිලගන්නා ලද්දේ වෙයි. චක්ඛුසම්ඵස්සය ඇවිලගන්නා ලද්දේ වෙයි. චක්ඛු සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද ඇවිලගන්නා ලද්දේ වෙයි. කුමකින් ඇවිලගන්නා ලදද යත්? රාග ගින්නෙන්, ද්වෙෂ ගින්නෙන්, මෝහ ගින්නෙන් ඇවිල ගන්නා ලදී. ජාතියෙන් ජරා මරණයෙන් ඇවිලගන්නා ලදී. ශෝකයෙන් හැඬීමෙන් දුකින් දොම්නසින් දැඩිවූ වෙහෙසින් ඇවිලගන්නා ලද්දේයයි කියමි.

“මහණෙනි, කණ ඇවිලගන්නා ලද්දේවෙයි. ශබ්දයෝ ඇවිලගන්නා ලද්දාහ. සෝත විඤ්ඤාණය ඇවිලගන්නා ලද්දේ වෙයි. සෝතසම්ඵස්සය ඇවිලගන්නා ලද්දේවෙයි. සෝත සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද ඇවිලගන්නා ලද්දේවෙයි. කුමකින් ඇවිලගන්නා ලදදයත්? රාග ගින්නෙන්, ද්වෙෂ ගින්නෙන්, මෝහ ගින්නෙන් ඇවිලගන්නා ලදී. ජාතියෙන් ජරා මරණයෙන් ඇවිලගන්නා ලදී. ශෝකයෙන් හැඬීමෙන්

දුකින් දොම්නසින් දැඩිවූ වෙහෙසින් ඇවිලගන්නා ලද්දේයයි කියමි.

"මහණෙනි, නාසය ඇවිලගන්නා ලදී. ගන්ධයෝ ඇවිලගන්නා ලද්දාහ. ඝාණවිඤ්ඤාණය ඇවිලගන්නා ලද්දේවෙයි. ඝාණසම්ඵස්සය ඇවිලගන්නා ලද්දේවෙයි. ඝාණසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද ඇවිලගන්නා ලද්දේවෙයි. කුමකින් ඇවිලගන්නා ලදදයත්? රාග ගින්නෙන්, ද්වෙෂ ගින්නෙන්, මෝහ ගින්නෙන් ඇවිලගන්නා ලදී. ජාතියෙන් ජරා මරණයෙන් ඇවිලගන්නා ලදී. ශෝකයෙන් හැඬීමෙන් දුකින් දොම්නසින් දැඩිවූ වෙහෙසින් ඇවිලගන්නා ලද්දේයයි කියමි.

"මහණෙනි, දිව ඇවිලගන්නා ලදී. රසයෝ ඇවිලගන්නා ලද්දාහ. ජිව්හා විඤ්ඤාණය ඇවිලගන්නා ලදී. ජිව්හා සම්ඵස්සය ඇවිලගන්නා ලද්දේය. ජිව්හා සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද ඇවිලගන්නා ලදී. කුමකින් ඇවිලගන්නා ලද්දේද? රාග ගින්නෙන්, ද්වෙෂ ගින්නෙන්, මෝහ ගින්නෙන් ඇවිලගන්නා ලදී. ජාතියෙන්, ජරා මරණයෙන් ඇවිලගන්නා ලදී. ශෝකයෙන් හැඬීමෙන් දුකින් දොම්නසින් දැඩිවූ වෙහෙසින් ඇවිලගන්නා ලද්දේයයි කියමි.

"මහණෙනි, කය ඇවිලගන්නා ලද්දේ වෙයි. ස්පර්ශයෝ ඇවිලගන්නා ලද්දාහ. කායවිඤ්ඤාණය ඇවිලගන්නා ලද්දේ වෙයි කාය සම්ඵස්සය ඇවිලගන්නා ලද්දේ වෙයි. කාය සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද ඇවිලගන්නා ලද්දේ වෙයි. කුමකින් ඇවිලගන්නා ලදදයත්? රාග ගින්නෙන්, ද්වෙෂ ගින්නෙන්, මෝහ ගින්නෙන් ඇවිලගන්නා ලදී. ජාතියෙන් ජරා මරණයෙන් ඇවිලගන්නා ලදී. ශෝකයෙන් හැඬීමෙන් දුකින් දොම්නසින් දැඩිවූ වෙහෙසින් ඇවිලගන්නා ලද්දේයයි කියමි.

"මහණෙනි, සිත ඇවිලගන්නා ලද්දේවේ. ධර්මයෝ ඇවිලගන්නා ලද්දාහ. මනොවිඥානය ඇවිලගන්නා ලද්දේ වේ. මනෝ සම්ඵස්සය ඇවිලගන්නා ලද්දේවේ. මනෝ සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ වේදනාවක් හෝ උපදීද, එයද ඇවිලගන්නා ලද්දේවේ. කුමකින් ඇවිලගන්නා ලද්දේද? රාග ගින්නෙන්, ද්වෙෂ ගින්නෙන්, මෝහ ගින්නෙන් ඇවිලගන්නා ලදී. ජාතියෙන්, ජරා මරණයෙන් ඇවිලගන්නා ලදී. ශෝකයෙන් හැඬීමෙන් දුකින් දොම්නසින් දැඩි වෙහෙසින් ඇවිලගන්නා ලද්දේයයි කියමි.

"මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආයර්‍ය්‍යශ්‍රාවකතෙම ඇසකෙරෙහිද කලකිරෙයි. රූපයකෙරෙහිද කලකිරෙයි. චක්ඛු විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. චක්ඛුසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. චක්ඛුසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

"මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආයර්‍ය්‍යශ්‍රාවකතෙම කණ කෙරෙහිද කලකිරෙයි. ශබ්දය කෙරෙහිද කලකිරෙයි. සෝතවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. සෝත සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. සෝත සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

"මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආයර්‍ය්‍යශ්‍රාවකතෙම නාසය කෙරෙහිද කලකිරෙයි. ගන්ධය කෙරෙහිද කලකිරෙයි. ඝාණවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. ඝාණ සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. ඝාණසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

"දිව කෙරෙහිද කලකිරෙයි. රස කෙරෙහිද කලකිරෙයි. ජිව්හා විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා සම්ඵස්සය නිසා යම් සැප

වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

"මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම කය කෙරෙහිද කලකිරෙයි. ස්පර්ශය කෙරෙහිද කලකිරෙයි. කායවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. කායසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. කායසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

"සිත කෙරෙහිද කලකිරෙයි. ධර්මය කෙරෙහිද කලකිරෙයි. මනොවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. මනොසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. මනොසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම වේ. "ජාතිය ක්ෂයවිය බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වැස නිමවන ලද්දේය. කළයුතු දෙය කරණලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගණීයයි" (වදාළේය.)

"භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුය. මේ ප්‍රකාශය දේශනා කරණු ලබන කල්හි, ඒ දහසක් භික්ෂූන්ගේ සිත් උපාදාන රහිතව ආශ්‍රවයන් කෙරෙන් මිදුනාහුය.

---

## 7. අන්ධභූත සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "මහණෙනි සියල්ල මඬනාලද්දේ වෙයි. මහණෙනි, කවරනම් සියල්ලක් මඬනාලද්දේ වේද?

2. "මහණෙනි, ඇස මඩනා ලද්දේ වෙයි රූපයෝ මඩනා ලද්දාහ. චක්ඛු විඤ්ඤාණය මඩනා ලද්දේ වෙයි. චක්ඛුසම්ඵස්සය මඩනා ලද්දේ වෙයි. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද එයද මඩනා ලද්දේ වෙයි. කුමකින් මඩනා ලද්දේද? ජාතියෙන් ජරාමරණයෙන් මඩනා ලදී. ශොකයෙන් හැඬීමෙන් වැළපීමෙන් දුකින් දොම්නසින් දැඩි වෙහෙසින් මඩනාලද්දේයයි කියමි.

"මහණෙනි, කණ මඩනා ලද්දේවෙයි. ශබ්දයෝ මඩනා ලද්දාහ. සොතවිඤ්ඤාණය මඩනා ලද්දේ වෙයි. සෝතසම්ඵස්සය මඩනා ලද්දේ වෙයි. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද එයද මඩනා ලද්දේ වෙයි. කුමකින් මඩනා ලද්දේද? ජාතියෙන් ජරාමරණයෙන් මඩනා ලද්දේ වෙයි. ශෝකයෙන් හැඬීමෙන් වැළපීමෙන් දුකින් දොම්නසින් දැඩි වෙහෙසින් මඩනා ලද්දේයයි කියමි.

"නාසය මඩනා ලද්දේ වෙයි. ගන්ධයෝ මඩනා ලද්දාහ. ඝාණවිඤ්ඤාණය මඩනා ලද්දේ වෙයි. ඝාණසම්ඵස්සය මඩනා ලද්දේවෙයි. ඝාණසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද මඩනා ලද්දේ වෙයි. කුමකින් මඩනා ලද්දේද? ජාතියෙන් ජරාමරණයෙන් මඩනා ලද්දේ වෙයි. ශෝකයෙන් හැඬීමෙන් වැළපීමෙන් දුකින් දොම්නසින් දැඩි වෙහෙසින් මඩනා ලද්දේයයි කියමි.

"දිව මඩනා ලද්දේය. රසයෝ මඩනා ලද්දාහ. ජිව්හා විඤ්ඤාණය මඩනා ලද්දේය. ජිව්හා සම්ඵස්සය මඩනා ලද්දේය. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද මඩනා ලද්දේය. කුමකින් මඩනා ලද්දේද? ජාතියෙන් ජරාමරණයෙන් මඩනා ලද්දේය. ශෝකයෙන් හැඬීමෙන් දුකින් දොම්නසින් දැඩි වෙහෙසින් මඩනා ලද්දේයයි කියමි.

"මහණෙනි, කය මඩනා ලද්දේ වෙයි. ස්පර්ශයෝ මඩනා ලද්දාහ. කාය විඤ්ඤාණය මඩනා ලද්දේ වෙයි. කාය සම්ඵස්සය මඩනා ලද්දේ වෙයි. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද මඩනා ලද්දේ වෙයි. කුමකින් මඩනා ලද්දේද? ජාතියෙන් ජරාමරණයෙන් මඩනාලද්දේ වෙයි. ශෝකයෙන් හැඬීමෙන් වැළපීමෙන් දුකින් දොම්නසින් දැඩි වෙහෙසින් මඩනා ලද්දේයයි කියමි.

"සිත මඩනා ලද්දේ වෙයි. ධර්මයෝ මඩනා ලද්දාහ. මනොවිඤ්ඤාණය මඩනා ලද්දේය. මනො සම්ඵස්සය මඩනා ලද්දේය. මනො සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද මඩනා ලද්දේය. කුමකින් මඩනා ලද්දේද? ජාතියෙන් ජරාමරණයෙන් මඩනා ලද්දේය. ශෝකයෙන් හැඬීමෙන් දුකින් දොම්නසින් දැඩි වෙහෙසින් මඩනා ලද්දේයයි කියමි.

3. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම ඇස කෙරෙහිද කලකිරෙයි. රූපය කෙරෙහිද කලකිරෙයි චක්ඛු විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. චක්ඛු සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. කණ කෙරෙහිද කලකිරෙයි. ශබ්දය කෙරෙහිද කලකිරෙයි. සොත විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි සොත සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. නාසය කෙරෙහිද කලකිරෙයි. ගන්ධය කෙරෙහිද කලකිරෙයි. ඝාණ විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. ඝාණසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. කය කෙරෙහිද කලකිරෙයි. ස්පර්ශය කෙරෙහිද කලකිරෙයි. කාය විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. කාය සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. සිත කෙරෙහිද කලකිරෙයි. ධර්මය කෙරෙහිද කලකිරෙයි. මනොවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. මනොසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. මනොසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුකද නොවූ සැපද නොවූ යම් මේ වෙදනාවක් උපදීද, ඒ වෙදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුනේය යන දැනුම ඇතිවේ. ජාතිය ක්ෂය විය.

බ්‍රහ්මචර්‍යාව වැස නිමවන ලදී. කළයුතු දෙය කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනීයයි” (වදාළේය.)

---

## 8. සාරුප්ප සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරණ ලදී)

2. “මහණෙනි, සියලු තෘෂ්ණාදී හැඟීම් නැසීමට සුදුසු ප්‍රතිපදාව තොපට දේශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, ඒ සියලු හැඟීම් නැසීමට සුදුසු ප්‍රතිපදාව කවරේද?

3. ‘මහණෙනි, ඇස (මම වෙමි යනාදි වශයෙන්) නොහඟියි. ඇස කෙරෙහි මම ඇතැයි නොහඟියි. ඇස කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. ඇස මාගේ යයි නොහඟියි. රූපයන් මමයයි නොහඟියි. රූපයන් කෙරෙහි මම ඇතැයි නොහඟියි. රූපය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. රූපයෝ මාගේයයි නොහඟියි. චක්ඛුවිඥානය මමයයි නොහඟියි. චක්ඛුවිඥානය කෙරෙහි මම ඇතැයි නොහඟියි. චක්ඛු විඥානය කෙරෙන් අන්‍ය වූවක් මම යයි නොහඟියි. චක්ඛු විඥානය මාගේ යයි නොහඟියි. චක්ඛුසම්ඵස්සය මම යයි නොහඟියි. චක්ඛුසම්ඵස්සය කෙරෙහි මම ඇතැයි නොහඟියි. චක්ඛුසම්ඵස්සය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. චක්ඛුසම්ඵස්සය මාගේ යයි නොහඟියි. චක්ඛුසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවක් උපදීද, එයද මමයයි නොහඟියි. එය කෙරෙහි මම ඇතැයි නොහඟියි. එය කෙරෙන් අන්‍යයක් මම යයි නොහඟියි. එය මාගේයයි නොහඟියි.

4. “මහණෙනි, කණ (මම වෙමි යනාදි වශයෙන්) නොහඟියි. කණ කෙරෙහි මම ඇතැයි නොහඟියි. කණ කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. කණ මාගේ යයි නොහඟියි. ශබ්දයන් මම

යයි නොහඟියි. ශබ්දයන් කෙරෙහි මම ඇතැයි නොහඟියි. ශබ්දය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. ශබ්දයෝ මාගේ යයි නොහඟියි. සෝතවිඥානය මමයයි නොහඟියි. සෝතවිඥානය කෙරෙහි මම ඇතැයි නොහඟියි. සෝතවිඥානය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. සෝතවිඥානය මාගේ යයි නොහඟියි. සෝතසම්ඵස්සය මමයයි නොහඟියි. සෝතසම්ඵස්සය කෙරෙහි මම ඇතැයි නොහඟියි. සෝතසම්ඵස්සය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. සෝතසම්ඵස්සය මාගේ යයි නොහඟියි. සෝතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවක් උපදීද, එයද මම යයි නොහඟියි. එය කෙරෙහි මම ඇතැයි නොහඟියි. එය කෙරෙන් අන්‍යයක් මමයයි නොහඟියි. එය මාගේ යයි නොහඟියි.

5. "මහණෙනි, නාසය (මම වෙමි යනාදි වශයෙන්) නොහඟියි. නාසය කෙරෙහි මම ඇතැයි නොහඟියි. නාසය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. නාසය මාගේ යයි නොහඟියි. ගන්ධයන් මම යයි නොහඟියි. ගන්ධයන් කෙරෙහි මම ඇතැයි නොහඟියි. ගන්ධය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. ගන්ධයෝ මාගේ යයි නොහඟියි. ඝාණවිඥානය මම යයි නොහඟියි. ඝාණවිඥානය කෙරෙහි මම ඇතැයි නොහඟියි. ඝාණවිඥානය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. ඝාණවිඥානය මාගේ යයි නොහඟියි. ඝාණසම්ඵස්සය මම යයි නොහඟියි. ඝාණසම්ඵස්සය කෙරෙහි මම ඇතැයි නොහඟියි. ඝාණසම්ඵස්සය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. ඝාණසම්ඵස්සය මාගේයයි නොහඟියි. ඝාණසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ, සැපද නොවූ යම් මේ වේදනාවක් උපදීද, එයද මම යයි නොහඟියි. එය කෙරෙහි මම ඇතැයි නොහඟියි. එය කෙරෙන් අන්‍යයක් මම යයි නොහඟියි. එය මාගේයයි නොහඟියි.

6. "මහණෙනි, දිව (මම වෙමි යනාදි වශයෙන්) නොහඟියි. දිව කෙරෙහි මම ඇතැයි නොහඟියි. දිව කෙරෙන් අන්‍යවූවක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

මම යයි නොහඟියි. දිව මාගේ යයි නොහඟියි. රස මම යයි නොහඟියි. රස කෙරෙහි මම ඇතැයි නොහඟියි. රස කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. රස මාගේ යයි නොහඟියි. ජිව්හා විඤ්ඤාණය මම යයි නොහඟියි. ජිව්හා විඤ්ඤාණය කෙරෙහි මම ඇතැයි නොහඟියි. ජිව්හා විඤ්ඤාණය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. ජිව්හා විඤ්ඤාණය මාගේ යයි නොහඟියි. ජිව්හා සම්ඵස්සය මම යයි නොහඟියි. ජිව්හා සම්ඵස්සය කෙරෙහි මම ඇතැයි නොහඟියි. ජිව්හා සම්ඵස්සය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. ජිව්හා සම්ඵස්සය මාගේ යයි නොහඟියි. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් වේදනාවක් උපදීද, එයද මම යයි නොහඟියි. එය කෙරෙහිද මම ඇතැයි නොහඟියි. එය කෙරෙන් අන්‍යවූවක් මම වෙමියි නොහඟියි. එය මාගේ යයි නොහඟියි.

7 "මහණෙනි, කය (මම වෙමි යනාදි වශයෙන්) නොහඟියි. කය කෙරෙහි මම ඇතැයි නොහඟියි. කය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. කය මාගේ යයි නොහඟියි. ස්පර්ශයන් මමයයි නොහඟියි. ස්පර්ශයන් කෙරෙහි මම ඇතැයි නොහඟියි. ස්පර්ශය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. ස්පර්ශය මාගේ යයි නොහඟියි කාය විඥානය මම යයි නොහඟියි. කාය විඥානය කෙරෙහි මම ඇතැයි නොහඟියි. කාය විඥානය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. කාය විඥානය මාගේ යයි නොහඟියි. කාය සම්ඵස්සය මම යයි නොහඟියි. කාය සම්ඵස්සය කෙරෙහි මම ඇතැයි නොහඟියි. කාය සම්ඵස්සය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. කාය සම්ඵස්සය මාගේ යයි නොහඟියි. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවක් උපදීද, එයද මම යයි නොහඟියි. එය කෙරෙහි මම ඇතැයි නොහඟියි එය කෙරෙන් අන්‍යයක් මම යයි නොහඟියි. එය මාගේ යයි නොහඟියි

8. "සිත මමයයි නොහඟියි. සිත කෙරෙහි මම ඇතැයි නොහඟියි. සිත කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. සිත

මාගේයයි නොහඟියි. ධර්මයන් මමයයි නොහඟියි. ධර්මයන් කෙරෙහි මම ඇතැයි නොහඟියි. ධර්මයන් කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. ධර්මයෝ මාගේයයි නොහඟියි. මනොවිඤ්ඤාණය මමයයි නොහඟියි. මනොවිඤ්ඤාණය කෙරෙහි මම ඇතැයි නොහඟියි. මනොවිඤ්ඤාණය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි මනොවිඤ්ඤාණය මාගේයයි නොහඟියි. මනො සම්ඵස්සය මමයයි නොහඟියි. මනො සම්ඵස්සය කෙරෙහි මම ඇතැයි නොහඟියි. මනොසම්ඵස්සය කෙරෙන් අන්‍යවූවක් මාගේයයි නොහඟියි. මනෝසම්ඵස්සය මාගේ යයි නොහඟියි. මනොසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද එයද මමයයි නොහඟියි. එය කෙරෙහි මම ඇතැයි නොහඟියි. එය කෙරෙන් අන්‍යවූවක් මම යයි නොහඟියි. එය මාගේයයි නොහඟියි. සියල්ල මමයයි නොහඟියි. සියල්ල කෙරෙහි මම ඇතැයි නොහඟියි. සියල්ල කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. සියල්ල මාගේයයි නොහඟියි."

**9.** "මෙසේ නොහඟින්නාවූ හෙතෙම ලෝකයෙහි කිසිවක් මමය මාගේයයි නොගනියි. මමය මාගේ යයි නොගන්නේ ආශා නොකරන්නේය. ආශා නොකරන්නේ මේ ආත්මයෙහි පිරිනිවෙන්නේය. ජාතිය ක්ෂය විය. බඹසර වැස නිමවන ලද්දේය. කළයුත්ත කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි. මහණෙනි, මේ වනාහි සියලු හැඟීම් නැසීමට සුදුසුවූ ප්‍රතිපදාවවේයයි" (වදාළේය)

---

## 9. සප්පාය සූත්‍රය (1)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

**2.** "මහණෙනි, සියලු (රාගාදී) හැඟීම් නැසීමට උපකාරවූ ප්‍රතිපදාව තොපට දෙශනා කරමි. එය අසව්. මහණෙනි, සියලු හැඟීම් නැසීමට උපකාරවූ ඒ ප්‍රතිපදාව කවරේද?"

3. "මහණෙනි, මෙහි මහණතෙම ඇස මමයයි නොහඟියි. ඇස කෙරෙහි මම ඇතැයි නොහඟියි. ඇස කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි, ඇස මාගේයයි නොහඟියි. රූපයන් මෙයයි නොහඟියි. රූපයන් කෙරෙහි මම ඇතැයි නොහඟියි. රූපයන් කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. රූපය මාගේයයි නොහඟියි. චක්ඛුවිඤ්ඤාණය මමයයි නොහඟියි. චක්ඛුවිඤ්ඤාණය කෙරෙහි මම ඇතැයි නොහඟියි. චක්ඛු විඤ්ඤාණය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. චක්ඛු විඤ්ඤාණය මාගේයයි නොහඟියි. චක්ඛුසම්ඵස්සය මමයයි නොහඟියි. චක්ඛුසම්ඵස්සය කෙරෙහි මම ඇතැයි නොහඟියි. චක්ඛුසම්ඵස්සය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. චක්ඛුසම්ඵස්සය මාගේයයි නොහඟියි. චක්ඛුසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද මමයයි නොහඟියි. එය කෙරෙහිද මම ඇතැයි නොහඟියි. එය කෙරෙන්ද අන්‍යවූවක් මමයයි නොහඟියි. එය මාගේයයි නොහඟියි. මහණෙනි, යමක් මමයයි හඟීද, යමක් කෙරෙහි මම ඇතැයි හඟීද, යමක් කෙරෙන් අනිකක් මමයයි හඟීද, යමක් මාගේයයි හඟීද, එයින් එය අන් ආකාරයක්ම වේ. අන් ආකාරයක් වන්නාවූ භවයෙහි ඇළුනාවූ ලෝවැසි තෙම භවයටම ඇලෙයි.

4. "මහණෙනි, මෙහි මහණතෙම කණ මමයයි නොහඟියි. කණ කෙරෙහි මම ඇතැයි නොහඟියි. කණ කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි කණ මාගේයයි නොහඟියි. ශබ්දයන් මමයයි නොහඟියි. ශබ්දයන් කෙරෙහි මම ඇතැයි නොහඟියි ශබ්දයන් කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. ශබ්දය මාගේයයි නොහඟියි සොතවිඤ්ඤාණය මමයයි නොහඟියි. සොතවිඤ්ඤාණ කෙරෙහි මම ඇතැයි නොහඟියි. සෝතවිඤ්ඤාණය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. සොතවිඤ්ඤානය මගේයයි නොහඟියි සොතසම්ඵස්සය මමයයි නොහඟියි සොතසම්ඵස්සය කෙරෙහි මම ඇතැයි නොහඟියි. සොතසම්ඵස්සය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. සොතසම්ඵස්සය මාගේයයි නොහඟියි. සොතසම්පස්සය නිසා

සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද. එයද මමයයි නොහඟියි. එය කෙරෙහිද මම ඇතැයි නොහඟියි. එය කෙරෙන්ද අන්‍යවූවක් මමයයි නොහඟියි. එය මාගේයයි නොහඟියි. මහණෙනි, යමක් මමයයි හඟීද, යමක් කෙරෙහි මම ඇතැයි හඟීද, යමක් කෙරෙන් අනිකක් මමයයි හඟීද, යමක් මාගේයයි හඟීද එයින් එය අන් ආකාරයක්ම වේ. අන් ආකාරයක් වන්නාවූ භවයෙහි ඇළුනාවූ ලෝ වැසි තෙම භවයටම ඇලෙයි."

5. 'මහණෙනි, මෙහි මහණතෙම නාසය මමයයි නොහඟියි. නාසය කෙරෙහි මම ඇතැයි නොහඟියි. නාසය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි නාසය මාගේයයි නොහඟියි. ගන්ධයන් මමයයි නොහඟියි. ගන්ධයන් කෙරෙහි මම ඇතැයි නොහඟියි. ගන්ධයන් කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. ගන්ධය මාගේයයි නොහඟියි. ඝාණවිඤ්ඤාණය මමයයි නොහඟියි ඝාණවිඤ්ඤාණය කෙරෙහි මම ඇතැයි නොහඟියි. ඝාණවිඤ්ඤාණය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. ඝාණවිඤ්ඤාණය මාගේයයි නොහඟියි. ඝාණ සම්ඵස්සය මමයයි නොහඟියි ඝාණ සම්ඵස්සය කෙරෙහි මම ඇතැයි නොහඟියි. ඝාණසම්ඵස්සය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. ඝාණ සම්ඵස්සය මාගේයයි නොහඟියි. ඝාණසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද මමයයි නොහඟියි. එය කෙරෙහිද මම ඇතැයි නොහඟියි. එය කෙරෙන්ද අන්‍යවූවක් මමයයි නොහඟියි. එය මාගේයයි නොහඟියි මහණෙනි, යමක් මමයයි හඟීද යමක් කෙරෙහි මම ඇතැයි හඟීද, යමක් කෙරෙන් අනිකක් මමයයි හඟීද, යමක් මාගේයයි හඟීද එයින් එය අන් ආකාරයක්ම වේ. අන් ආකාරයක් වන්නාවූ භවයෙහි ඇළුනාවූ ලෝවැසිතෙම භවයටම ඇලෙයි"

6. "මහණෙනි, මෙහි මහණතෙම දිව මමයයි නොහඟියි දිව කෙරෙහි මම ඇතැයි නොහඟියි දිව කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. දිව මාගේයයි නොහඟියි. රසයන් මමයයි

නොහඟියි. රස කෙරෙහි මම ඇතැයි නොහඟියි. රසයන් කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. රස මාගේයයි නොහඟියි. ජිව්හා විඤ්ඤාණය මමයයි නොහඟියි. ජිව්හා විඤ්ඤාණය කෙරෙහි මම ඇතැයි නොහඟියි. ජිව්හා විඤ්ඤාණය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. ජිව්හා විඤ්ඤාණය මාගේයයි නොහඟියි. ජිව්හා සම්ඵස්සය මමයයි නොහඟියි. ජිව්හා සම්ඵස්සය කෙරෙහි මම ඇතැයි නොහඟියි ජිව්හා සම්ඵස්සය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. ජිව්හා සම්ඵස්සය මාගේයයි නොහඟියි. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් වේදනාවකුත් උපදීද, එයද මමයයි නොහඟියි. එය කෙරෙහි මම ඇතැයිද නොහඟියි. එය කෙරෙන් අනිකක් මමයයිද නොහඟියි. එය මාගේ යයිද නොහඟියි. මහණෙනි, යමක් මමයයි හඟීද, යමක් කෙරෙහි මම ඇතැයි හඟීද, යමක් කෙරෙන් අනිකක් මමයයි හඟීද, යමක් මාගේයයි හඟීද එයින් එය අන් ආකාරයක්ම වේ. අන් ආකාරයක් වන්නාවූ භවයෙහි ඇළුනාවූ ලෝවැසි තෙම භවයටම ඇලෙයි.”

7. “මහණෙනි, මෙහි මහණතෙම කය මමයයි නොහඟියි. කය කෙරෙහි මම ඇතැයි නොහඟියි. කය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. කය මාගේයයි නොහඟියි. ස්පර්ශයන් මමයයි නොහඟියි ස්පර්ශයන් කෙරෙහි මම ඇතැයි නොහඟියි. ස්පර්ශයන් කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. ස්පර්ශය මාගේයයි නොහඟියි. කායවිඤ්ඤාණය මමයයි නොහඟියි. කායවිඤ්ඤාණය කෙරෙහි මම ඇතැයි නොහඟියි. කායවිඤ්ඤාණය කෙරෙන් අන්‍ය වූවක් මමයයි නොහඟියි. කායවිඤ්ඤාණය මාගේයයි නොහඟියි කායසම්ඵස්සය මමයයි නොහඟියි. කායසම්ඵස්සය කෙරෙහි මම ඇතැයි නොහඟියි කායසම්ඵස්සය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. කාය සම්ඵස්සය මාගේයයි නොහඟියි. කායසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූහෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද මමයයි නොහඟියි. එය කෙරෙහිද

මම ඇතැයි නොහඟියි. එය කෙරෙන්ද අන්‍යවූවක් මමයයි නොහඟියි එය මාගේ යයි නොහඟියි. මහණෙනි, යමක් මමයයි හඟීද, යමක් කෙරෙහි මම ඇතැයි හඟීද, යමක් කෙරෙන් අනිකක් මමයයි හඟීද, යමක් මාගේයයි හඟීද, එයින් එය අන්ආකාරයක්ම වේ. අන් ආකාරයක් වන්නාවූ භවයෙහි ඇළුනාවූ ලෝවැසි තෙම භවයටම ඇලෙයි”

8. “සිත මමයයි නොහඟියි සිත කෙරෙහි මම ඇතැයි නොහඟියි. සිත කෙරෙන් අනිකක් මමයයි නොහඟියි. සිත මගේයයි නොහඟියි. ධර්මයන් මමයයි නොහඟියි. ධර්මයන් කෙරෙහි මම ඇතැයි නොහඟියි. ධර්මයන් කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. ධර්මය මාගේයයි නොහඟියි. මනෝ විඤ්ඤාණය මමයයි නොහඟියි. මනෝවිඤ්ඤාණය කෙරෙහි මම ඇතැයි නොහඟියි. මනෝවිඤ්ඤාණය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි. මනොවිඤ්ඤාණය මාගේයයි නොහඟියි. මනෝසම්ඵස්සය මමයයි නොහඟියි. මනෝ සම්ඵස්සය කෙරෙහි මම ඇතැයි නොහඟියි. මනොසම්ඵස්සය කෙරෙන් අන්‍යවූවක් මමයයි නොහඟියි මනොසම්ඵස්සය මාගේයයි නොහඟියි. මහණෙනි, යමක් මමයයි හඟීද, යමක් කෙරෙහි මම ඇතැයි හඟීද යමක් කෙරෙන් අනිකක් මමයයි හඟීද, එයින් එය අන්ආකාරයක් වේ. අන්ආකාරයක්වූ භවයෙහි ඇළුනාවූ ලෝවැසිතෙම භවයටම ඇලෙයි. මහණෙනි, යම් පමණ සතහට ධාතු ආයතන වෙත්ද, එයද මමයයි නොහඟියි. එය කෙරෙහි මම ඇතැයිද නොහඟියි. එය කෙරෙන් අනිකක් මමයයිද නොහඟියි. එය මාගේයයිද නොහඟියි.”

9. “හෙතෙම මෙසේ නොහඟිනු ලබන්නේ ලොකයෙහි කිසිවක් මමය මාගේයයි නොගනියි. මමය මාගේයයි නොගන්නේ නොඇලෙයි නොඇලෙන්නේ මේ ආත්මයෙහිම පිරිනිවෙයි. ‘ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවනලදී. කළ යුත්ත කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි. මහණෙනි, මේ වනාහි සියලු හැඟීම් නැසීමට උපකාරවූ ප්‍රතිපදාව වේය”යි (වදාළේය.)

## 10. සප්පාය සූත්‍රය. ()

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී)

2. 'මහණෙනි, සියලු හැඟීම් නැසීමට උපකාරවූ ප්‍රතිපදාව තොපට දෙශනා කරන්නෙමි. එය අසව්' මහණෙනි, ඒ සියලු හැඟීම් නැසීමට උපකාරවූ ප්‍රතිපදාව කවරීද?"

"මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? ඇස නිත්‍ය හෝ අනිත්‍ය වේද?"-"ස්වාමීනි, අනිත්‍යය"

"යමක් වනාහි අනිත්‍යයද එය දුක හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද 'එය මෙය මාගේය. මෙතෙම මම වෙමියි මෙතෙම මාගේ ආත්මයයි දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"රූපයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

'චක්ඛුවිඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-'ස්වාමීනි, දුක්ය."

'යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛුසම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද? එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

3. "මහණෙනි, කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- "ස්වාමීනි, අනිත්‍යය"

"යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"- "ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ශබ්දයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සෝත විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'- "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

සෝතසම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සොතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

4. "මහණෙනි, නාසය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද දුකද වෙනස්වන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය. මෙතෙම මම වෙමියි. මෙතෙම මාගේ ආත්මයයි, දකින්ට සුදුසුද?"-"ස්වාමීනි මෙය සුදුසු නොවේමැයි."

"ගන්ධයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

ඝාණ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ඝාණ සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේ."

සාණසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

5. "මහණෙනි, දිව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

'යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

රසයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ජිව්හා විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

"ජිව්හා සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ජිව්හා සම්ඵස්සය හේතුකොට ගෙණ සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?'-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

**6.** "මහණෙනි, කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරළෙන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම

මාගේ ආත්මයයි දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි.'

"ස්පර්ශය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි' මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"කාය විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"කාය සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේ මැයි."

"කායසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ හෝ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

7. "මහණෙනි, සිත නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය, මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"ධර්මයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"මනෝ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- "ස්වාමීනි, අනිත්‍යය."

'යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ඝාණ සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"මනෝසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය,"

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

8. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම ඇස කෙරෙහිද කලකිරෙයි, රූපය කෙරෙහිද කලකිරෙයි, චක්ඛුවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, චක්ඛුසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ වේදනාවකුත් උපදීද, එය කෙරෙහිද කලකිරෙයි.

9. "කණ කෙරෙහිද කලකිරෙයි, ශබ්දය කෙරෙහිද කලකිරෙයි, සෝත විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, සෝත සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, සෝතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

10. "නාසය කෙරෙහිද කලකිරෙයි, ගන්ධය කෙරෙහිද කලකිරෙයි, ඝාණ විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, ඝාණ

සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, එය කෙරෙහිද කලකිරෙයි.

11. "දිව කෙරෙහිද කලකිරෙයි, රසය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

12. "කය කෙරෙහිද කලකිරෙයි, ස්පර්ශය කෙරෙහිද කලකිරෙයි, කාය විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, කාය සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

13. "සිත කෙරෙහිද කලකිරෙයි, ධර්මයන් කෙරෙහිද කලකිරෙයි, මනො විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, මනො සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, මනොසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුණේය යන දැනීමවේ. ජාතිය (ඉපදීම) ක්ෂයවිය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගණියි. මහණෙනි, මේ වනාහි සියලු හැඟීම් නැසීමට උපකාරවූ ප්‍රතිපදාවයයි" (වදාළසේක)

**(තුන්වෙනි සබ්බ වර්ගය නිමි.)**

---

# 4. ජාති ධම්ම වර්ගය.

## 1. ජාති ධම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, සියල්ල ඉපදීම ස්වභාවකොට ඇත්තේය. මහණෙනි, කවර නම් සියල්ල ඉපදීම ස්වභාවකොට ඇත්තේද?

3. "මහණෙනි, ඇස ඉපදීම ස්වභාවකොට ඇත්තේය. රූපයෝ ඉපදීම ස්වභාවකොට ඇත්තාහ. චක්ඛුවිඥානය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. චක්ඛුසම්ඵස්සය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. චක්ඛුසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද ඉපදීම ස්වභාවකොට ඇත්තේය.

4. "මහණෙනි, කණ ඉපදීම ස්වභාවකොට ඇත්තේය. ශබ්දයෝ ඉපදීම ස්වභාවකොට ඇත්තාහ. සෝතවිඤ්ඤාණය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. සෝතසම්ඵස්සය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. සෝතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද ඉපදීම ස්වභාවකොට ඇත්තේය.

5 "මහණෙනි, නාසය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. ගන්ධයෝ ඉපදීම ස්වභාවකොට ඇත්තාහ. ඝාණවිඤ්ඤාණය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. ඝාණසම්ඵස්සය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. ඝාණසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද ඉපදීම ස්වභාවකොට ඇත්තේය.

6. "මහණෙනි, දිව ඉපදීම ස්වභාවකොට ඇත්තේය. රසයෝ ඉපදීම ස්වභාවකොට ඇත්තාහ. ජිව්හාවිඤ්ඤාණය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. ජිව්හාසම්ඵස්සය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. ජිව්හාසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද ඉපදීම ස්වභාවකොට ඇත්තේය

7. "මහණෙනි, කය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. ස්පර්ශයෝ ඉපදීම ස්වභාවකොට ඇත්තාහ. කායවිඤ්ඤාණය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. කායසම්ඵස්සය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. කායසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද ඉපදීම ස්වභාවකොට ඇත්තේය.

8. "මහණෙනි, සිත ඉපදීම ස්වභාවකොට ඇත්තේය. ධර්මයෝ ඉපදීම ස්වභාවකොට ඇත්තාහ. මනොවිඤ්ඤාණය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. මනොසම්ඵස්සය ඉපදීම ස්වභාවකොට ඇත්තේය. මනොසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද ඉපදීම ස්වභාවකොට ඇත්තේය.

9. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ඇස කෙරෙහිද කලකිරෙයි. රූපය කෙරෙහිද කලකිරෙයි. චක්ඛුවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. චක්ඛුසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. චක්ඛුසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

10. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම කණ කෙරෙහිද කලකිරෙයි. ශබ්දය කෙරෙහිද කලකිරෙයි. සෝතවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. සෝතසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. සෝතසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

11. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙම නාසය කෙරෙහිද කලකිරෙයි ගන්ධය කෙරෙහිද කලකිරෙයි. ඝාණවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. ඝාණසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. ඝාණසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

12. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙම දිව කෙරෙහිද කලකිරෙයි. රසය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

13. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙම කය කෙරෙහිද කලකිරෙයි. ස්පර්ශය කෙරෙහිද කලකිරෙයි. කාය විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. කායසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. කායසම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

14. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙම සිත කෙරෙහිද කලකිරෙයි. ධර්මය කෙරෙහිද කලකිරෙයි. මනොවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. මනොසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. මනොසම්ඵස්සය නිසා සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනුකල්හි මිදුනේය යන දැනීම වේ. 'ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වැස නිමවන ලද්දේය. කළයුතු දෙය කරණලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගණීයයි" වදාළසේක.

---

## 2. ජරා ධම්ම සූත්‍රය.

(මේ වර්ගයේ අනික් සූත්‍ර පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරන ලදී.)

2. "මහණෙනි, සියල්ල දිරීම ස්වභාවකොට ඇත්තේ වෙයි. කවර නම් සියල්ල දිරීම ස්වභාවකොට ඇත්තේද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡේද 3-9 දක්වා 'ඉපදීම' වෙනුවට 'දිරීම' යොදාගත යුතුයි.)

---

## 3. ව්‍යාධි ධම්ම සූත්‍රය.

2. "මහණෙනි, සියල්ල ව්‍යාධිය ස්වභාවකොට ඇත්තේ වෙයි. කවර නම් සියල්ල ව්‍යාධිය ස්වභාවකොට ඇත්තේද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡේද 3-9 දක්වා 'ඉපදීම' වෙනුවට 'ව්‍යාධිය' යොදාගත යුතුයි.)

---

## 4. මරණ ධම්ම සූත්‍රය.

2. "මහණෙනි, සියල්ල මරණය ස්වභාවකොට ඇත්තේ වෙයි. කවර නම් සියල්ල මරණය ස්වභාවකොට ඇත්තේද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡේද 3-9 දක්වා 'ඉපදීම' වෙනුවට 'මරණය' යොදාගත යුතුයි.)

---

## 5. සොක ධම්ම සූත්‍රය.

2. "මහණෙනි, සියල්ල සෝකකිරීම ස්වභාවකොට ඇත්තේ වෙයි. කවර නම් සියල්ල සෝකකිරීම ස්වභාවකොට ඇත්තේද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡේද 3-9 දක්වා 'ඉපදීම' වෙනුවට 'සෝකකිරීම' යොදාගත යුතුයි.)

---

## 6. සංකිලෙස ධම්ම සූත්‍රය.

**2.** "මහණෙනි, සියල්ල කෙලෙසීම ස්වභාවකොට ඇත්තේ වෙයි. කවර නම් සියල්ල කෙලෙසීම ස්වභාවකොට ඇත්තේද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡේද 3-9 දක්වා 'ඉපදීම' වෙනුවට 'කෙලෙසීම' යොදාගත යුතුයි.)

---

## 7. ඛය ධම්ම සූත්‍රය.

**2.** "මහණෙනි, සියල්ල ක්ෂයවීම ස්වභාවකොට ඇත්තේ වෙයි. කවර නම් සියල්ල ක්ෂයවීම ස්වභාවකොට ඇත්තේද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡේද 3-9 දක්වා 'ඉපදීම' වෙනුවට 'ක්ෂයවීම' යොදාගත යුතුයි.

---

## 8. වය ධම්ම සූත්‍රය.

**2.** "මහණෙනි, සියල්ල විනාශවීම ස්වභාවකොට ඇත්තේ වෙයි. කවර නම් සියල්ල විනාශවීම ස්වභාවකොට ඇත්තේද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡේද 3-9 දක්වා 'ඉපදීම' වෙනුවට 'විනාශවීම' යොදාගත යුතුයි.)

---

## 9. සමුදය ධම්ම සූත්‍රය.

**2.** "මහණෙනි, සියල්ල හටගැනීම ස්වභාවකොට ඇත්තේ වෙයි. කවර නම් සියල්ල හටගැනීම ස්වභාවකොට ඇත්තේද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡේද 3-9 දක්වා 'ඉපදීම' වෙනුවට 'හටගැනීම' යොදාගත යුතුයි.)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 10. නිරොධ ධම්ම සූත්‍රය.

2. "මහණෙනි, සියල්ල නිරුද්ධවීම ස්වභාවකොට ඇත්තේ වෙයි. කවර නම් සියල්ල නිරුද්ධවීම ස්වභාවකොට ඇත්තේද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡෙද 3-9 දක්වා 'ඉපදීම' වෙනුවට 'නිරුද්ධවීම' යොදාගත යුතුයි.)

**(හතරවෙනි ජාති ධම්ම වර්ගය නිමි.)**

---

# 5. අනිච්ච වර්ගය.

## 1. අනිච්ච ධම්ම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2 "මහණෙනි, සියල්ල අනිත්‍යවෙයි. මහණෙනි, කවර නම් සියල්ලක් අනිත්‍යද?

3. "මහණෙනි, ඇස අනිත්‍යය. රූපයෝ අනිත්‍යයෝය. චක්ඛු විඤ්ඤාණය අනිත්‍යය. චක්ඛුසම්ඵස්සය අනිත්‍යය. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍යය

4. "මහණෙනි, කණ අනිත්‍යය. ශබ්දයෝ අනිත්‍යයෝය. සෝත විඤ්ඤාණය අනිත්‍යය. සෝත සම්ඵස්සය අනිත්‍යය. සෝතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍යය.

5. "මහණෙනි, නාසය අනිත්‍යය. ගන්ධයෝ අනිත්‍යයෝය. ඝාණ විඤ්ඤාණය අනිත්‍යය. ඝාණ සම්ඵස්සය අනිත්‍යය. ඝාණ

සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍යය.

6. "මහණෙනි, දිව අනිත්‍යය. රසයෝ අනිත්‍යයහ. ජිව්හා විඤ්ඤාණය අනිත්‍යය. ජිව්හා සම්ඵස්සය අනිත්‍යවේ. ජිව්හාසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍යවේ.

7. "මහණෙනි, කය අනිත්‍යය. ස්පර්ශයෝ අනිත්‍යයෝය. කාය විඤ්ඤාණය අනිත්‍යය. කාය සම්ඵස්සය අනිත්‍යය. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍යය.

8. "මහණෙනි, සිත අනිත්‍යය. ධර්මයෝ අනිත්‍යයෝය. මනෝ විඤ්ඤාණය අනිත්‍යය. මනෝ සම්ඵස්සය අනිත්‍යය. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍යයි.

9. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ඇස කෙරෙහිද කලකිරෙයි. රූපය කෙරෙහිද කලකිරෙයි. චක්ඛු විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. චක්ඛු සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. චක්ඛු සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

10. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම කණ කෙරෙහිද කලකිරෙයි. ශබ්දය කෙරෙහිද කලකිරෙයි. සෝත විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. සෝත සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. සෝත සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

11. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම නාසය කෙරෙහිද කලකිරෙයි. ගන්ධය කෙරෙහිද කලකිරෙයි. ඝාණ විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. ඝාණ සම්ඵස්සය

කෙරෙහිද කලකිරෙයි. ඝාණ සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

12. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම දිව කෙරෙහිද කලකිරෙයි. රසය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

13. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම කය කෙරෙහිද කලකිරෙයි. ස්පර්ශය කෙරෙහිද කලකිරෙයි. කාය විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. කාය සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. කාය සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, එහිද කලකිරෙයි.

14. "මහණෙනි, සිත කෙරෙහිද කලකිරෙයි. ධර්මය කෙරෙහිද කලකිරෙයි. මනෝ විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. මනෝ සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. මනෝ සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක්වේදනාවක් හෝ උපෙක්ෂා වේදනාවක් හෝ උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම වේ. "ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වැස නිමවන ලද්දේය. කළයුතු දෙය කරණලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැන ගණීයයි" (වදාළසේක.)

---

## 2. දුක්ඛ ධම්ම සූත්‍රය.

(මේ වර්ගයේ අනික් සූත්‍ර පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරනලදී.)

2. "මහණෙනි, සියල්ල දුකය. කවර නම් සියල්ලක් දුකද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡේද 3-9 දක්වා 'අනිත්‍යය' වෙනුවට 'දුකය' යනු යොදාගත යුතුයි.)

---

## 3. අනත්ත ධම්ම සූත්‍රය.

2. "මහණෙනි, සියල්ල අනාත්මය. කවර නම් සියල්ල අනාත්මද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡේද 3-9 දක්වා 'අනිත්‍යය' වෙනුවට 'අනාත්මය' යනු යොදාගත යුතුයි.)

---

## 4. අභිඤ්ඤෙය්‍ය සූත්‍රය.

2. 'මහණෙනි, සියල්ල මනානුවණින් දතයුතුයි. කවර නම් සියල්ල මනානුවණින් දතයුතුද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡේද 3-9 දක්වා 'අනිත්‍යය' වෙනුවට 'මනා නුවණින් දතයුතුයි' යනු යොදාගත යුතුයි.)

---

## 5. පරිඤ්ඤෙය්‍ය සූත්‍රය.

2. "මහණෙනි, සියල්ල පිරිසිඳ දතයුතුයි. කවර නම් සියල්ල පිරිසිඳ දතයුතුද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡේද 3-9 දක්වා 'අනිත්‍යය' වෙනුවට 'පිරිසිඳ දතයුතුයි' යනු යොදාගත යුතුයි.)

---

## 6. පහාතබ්බ සූත්‍රය.

2. "මහණෙනි, සියල්ල පහකටයුතුයි. කවර නම් සියල්ල පහකටයුතුද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡෙද 3-9 දක්වා 'අනිත්‍යය' වෙනුවට 'පහකටයුතුයි' යනු යොදාගත යුතුයි.)

---

## 7. සච්ඡිකාතබ්බ සූත්‍රය.

2. "මහණෙනි, සියල්ල ප්‍රත්‍යක්ෂ කටයුතුයි. කවර නම් සියල්ල ප්‍රත්‍යක්ෂ කටයුතුද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡෙද 3-9 දක්වා 'අනිත්‍යය' වෙනුවට 'ප්‍රත්‍යක්ෂ කටයුතුයි' යනු යොදාගත යුතුයි.)

---

## 8. අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍ය සූත්‍රය.

2. "මහණෙනි, සියල්ල මනා නුවණින් පිරිසිඳ දත යුතුයි. කවර නම් සියල්ල මනා නුවණින් පිරිසිඳ දතයුතුද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡෙද 3-9 දක්වා 'අනිත්‍යය' වෙනුවට 'මනා නුවණින් පිරිසිඳ දතයුතුයි' යනු යොදාගත යුතුයි.)

---

## 9. උපද්දුත සූත්‍රය.

2. "මහණෙනි, සියල්ල උවදුරට පැමිණෙන ලදී. කවර නම් සියල්ල උවදුරට පැමිණෙන ලද්දේද?

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡෙද 3-9 දක්වා 'අනිත්‍යය' වෙනුවට 'උවදුරට පැමිණෙන ලදී' යනු යොදාගත යුතුයි.)

---

## 10. උපස්සට්ඨ සූත්‍රය.

2. "මහණෙනි, සියල්ල විපතට පැමිණෙන ලදී. කවර නම් සියල්ල විපතට පැමිණෙන ලද්දේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ ඡෙද 3-9 දක්වා 'අනිත්‍යය' වෙනුවට 'විපතට පැමිණෙන ලදී' යනු යොදාගත යුතුයි.)

**(පස්වෙනි අනිත්‍ය වර්ගය නිමි.)**

**(පළමුවන පණ්ණාසය නිමි.)**

---

## 6. අවිජ්ජා වර්ගය.

### 1. අවිජ්ජා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී එක්තරා භික්ෂුවක්තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ඒ භික්ෂු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය.

2. "ස්වාමීනි, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ අවිද්‍යාව (චතුරාර්‍ය්‍යසත්‍යය නොදැනීම) දුරුවේද? විද්‍යාව (අර්හත් මාර්ගඥානය) උපදීද?'

3. "මහණ, ඇස අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ විද්‍යාව උපදියි. රූපයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. චක්ඛු විඥානය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි චක්ඛු සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි.

4. 'මහණ, කණ අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. ශබ්දයන් අනිත්‍ය වශයෙන්

දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. සෝත විඥානය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. සෝත සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ විද්‍යාව උපදියි.

**5.** 'මහණ, නාසය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. ගන්ධයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. ඝාණ විඥානය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි ඝාණ සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ විද්‍යාව උපදියි. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි.

**6.** "මහණ, දිව අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. රසයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. ජිව්හා විඥානය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි ජිව්හා සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි.

**7.** "මහණ, කය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි ස්පර්ශයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. කාය විඥානය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. කාය සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. කාය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි.

8. 'මහණ, සිත අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවෙයි. විද්‍යාව උපදියි. ධර්මයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. මනෝ විඥ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවෙයි. විද්‍යාව උපදියි. මනෝ සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවෙයි. විද්‍යාව උපදියි. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදීයයි" වදාළේය.

## 2. සඤ්ඤොජන සූත්‍රය. (1)

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

"ස්වාමීනි, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ සංයොජනයෝ පහවෙත්ද?"

2. "මහණ, ඇස අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණ වෙත්. රූපයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණ වෙත්. චක්ඛු විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. චක්ඛු සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණ වෙත්.

"චක්ඛුසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුකද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ ප්‍රහීණ වෙත්.

මහණෙ මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්.

3. "මහණෙ, කණ අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. ශබ්දයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. සෝත විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. සෝත සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ ප්‍රහීණවෙත්.

"සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. මහණෙ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්.

4. "මහණෙ, නාසය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ ප්‍රහීණවෙත්. ගන්ධයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ ප්‍රහීණවෙත්. ඝාණ විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ ප්‍රහීණවෙත්. ඝාණ සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ ප්‍රහීණවෙත්.

"ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. මහණෙ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ ප්‍රහීණවෙත්.

5. "මහණෙ, දිව අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. රසයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණ වෙත්. ජිව්හා විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. ජිව්හා සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ ප්‍රහීණවෙත්.

"ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්.

**6.** "මහණ, කය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. ස්පර්ශයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. කාය විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. කාය සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ ප්‍රහීණවෙත්.

"කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්.

**7.** "මහණ, සිත අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. ධර්මයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. මනෝ විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. මනෝ සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත් යයි" වදාළේය.

---

## 3. සඤ්ඤෝජන සූත්‍රය. (2)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමු වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරනලදී.)

"ස්වාමීනි, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්ද?"

2. "මහණෙ, ඇස අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්, රූපයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්. චක්ඛු විඥානය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. චක්ඛු සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්.

"චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්. මහණෙ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ ප්‍රහීණවෙත්.

3. "මහණෙ, කණ අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. ශබ්දයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. සෝත විඥානය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. සෝත සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්.

"සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්. මහණෙ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්.

4. "මහණෙ, නාසය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්, ගන්ධයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. ඝාණවිඥානය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. ඝාණ සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්.

"ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්. මහණෙ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්.

5. "මහණෙ, දිව අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්, රසයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. ජිව්හා විඥානය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. ජිව්හා සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්.

"ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්. මහණෙ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්.

6. 'මහණෙ, කය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. ස්පර්ශයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. කාය විඥානය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. කාව සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්.

"කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්.

7. "මහණ, සිත අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. ධර්මයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. මනෝ විඥානය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. මනෝ සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයොජනයෝ විනාශයට පැමිණෙත් යයි" වදාළේය.

---

## 4. ආසව සූත්‍රය

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

"ස්වාමීනි, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණ වෙත්ද?'

2. "මහණ, ඇස වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. රූපයන් වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. චක්ඛු විඥානය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. චක්ඛු සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්.

'චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්.

3. "මහණ, කණ වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. ශබ්දයන් වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. සෝතවිඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. සෝත සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්.

'සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ සංයෝජනයෝ විනාශයට පැමිණෙත්.

4. "මහණ, නාසය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. ගන්ධයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. ඝාණ විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. ඝාණ සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්.

'ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණ වෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණ වෙත්.

5. "මහණ, දිව වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. රසයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. ජිව්හා විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රහීණවෙත්. ජිව්හා සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්.

"ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණ වෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණ වෙත්.

6. "මහණ, කය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. ස්පර්ශයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. කාය විඥානය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. කාය සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්.

'කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණ වෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණ වෙත්.

7. "මහණ, සිත වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. ධර්මයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. මනෝ විඥානය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. මනෝ සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ ආශ්‍රවයෝ ප්‍රහීණවෙත් යයි" වදාළේය.

---

## 5. ආසව සූත්‍රය. (2)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ස්වාමීනි, කෙසේ නම් දන්නහුගේ කෙසේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්ද?"

2. "මහණ, ඇස වනාහි අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. රූපයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. චක්ඛු විඤ්ඤාණය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. චක්ඛු සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්.

"චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්.

3 "මහණ, කණ වනාහි අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. ශබ්දයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. සෝත විඤ්ඤාණය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. සෝත සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්.

"සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්.

4. "මහණ, නාසය වනාහි අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. ගන්ධයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. ඝාණ විඤ්ඤාණය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. ඝාණසම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්.

"ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. මහණෙ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්.

**5.** "මහණෙ, දිව වනාහි අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. රසයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. ජිව්හා විඤ්ඤාණය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. ජිව්හා සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්.

"ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. මහණෙ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්.

**6.** "මහණෙ, කය වනාහි අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. ස්පර්ශයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. කාය විඤ්ඤාණය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. කාය සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්.

"කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. මහණෙ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්.

**7.** "මහණෙ, සිත වනාහි අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. ධර්මයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්.

මනෝ විඤ්ඤාණය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. මනෝ සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්.

"මහණ, මනෝසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයෝ නැසීමට පැමිණෙත්යයි' වදාළේය.

---

## 6. අනුසය සූත්‍රය (1)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරන ලදී.)

2. "ස්වාමීනි, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්ද?" "මහණ ඇස වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්' රූපයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. චක්ඛුවිඥානය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. චක්ඛු සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්.

'චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්.

3. "කණ වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. ශබ්දයන් වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. සෝතවිඥානය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ

ප්‍රහීණ වෙත්. සෝතසම්ඵස්සය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්."

"සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්.

**4.** "නාසය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. ගන්ධයන් වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. ඝාණවිඥානය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. ඝාණසම්ඵස්සය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්."

"ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්දනොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්.

**5.** "දිව වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. රස වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්. ජිව්හා විඥානය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. ජිව්හා සම්ඵස්සය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්."

"ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්දනොවූ සැපදනොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්.

**6.** "කය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. ස්පර්ශය වනාහි අනිත්‍ය වශයෙන්

දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. කායවිඥානය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්. කායසම්ඵස්සය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්."

"කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්.

7. "සිත වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. ධර්මයන් වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණවෙත්. මනෝ විඥානය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. මනෝසම්ඵස්සය වනාහි අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්."

"මනොසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ අනුසයයෝ ප්‍රහීණ වෙත්යයි" වදාළේය.

---

## 7. අනුසය සූත්‍රය. (2)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරන ලදී.)

2. "ස්වාමීනි, කෙසේ නම් දන්නහුගේ කෙසේ දක්නහුගේ අනුසයයෝ සහමුලින් නැසීමට පැමිණෙත්ද?"

"මහණ, ඇස වනාහි අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. රූපයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට

පැමිණෙත්. චක්ඛුවිඥානය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. චක්ඛුසම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්.

"චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්.

3. "මහණ, කණ වනාහි අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. ශබ්දයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. සෝතවිඥානය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. සෝතසම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්."

"සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්.

4. "මහණ, නාසය වනාහි අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. ගන්ධයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. ඝාණවිඥානය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. ඝාණසම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්."

"ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම

වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්.

**5.** "මහණ, දිව වනාහි අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. රස අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. ජිව්හා විඥානය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. ජිව්හාසම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්."

"ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්.

**6.** "මහණ, කය වනාහි අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. ස්පර්ශය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. කාය විඥානය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. කාය සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්.

"කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්.

**7.** "මහණ, සිත වනාහි අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. ධර්මයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට

පැමිණෙත්. මනෝවිඥානය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. මනෝ සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්.

"මනෝසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්. මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ අනුසයයෝ නැසීමට පැමිණෙත්.

---

## 8. සබ්බූපාදාන පරිඤ්ඤා සූත්‍රය.

(මේ සූත්‍රයද ජාති ධම්ම වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, සියලු උපාදානයන් පිරිසිඳ දැනීම පිණිස තොපට ධර්මය දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, සියලු උපාදානයන් පිරිසිඳ දැනීම පිණිස (පවත්නාවූ) ධර්මය කවරේද? ඇසද, රූපයන්ද නිසා චක්ඛු විඥානය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ. ස්පර්ශය හෙතුකොට ගෙන වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම ඇස කෙරෙහිද කලකිරෙයි. රූපයන් කෙරෙහිද කලකිරෙයි. චක්ඛු විඥානය කෙරෙහිද කලකිරෙයි. චක්ඛුසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. 'මා විසින් මිදීමෙන් උපාදානය පිරිසිඳ දන්නා ලද්දේයයි" දැනගණියි.

3. "කණද, ශබ්දයන්ද නිසා සෝතවිඥානය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ. ස්පර්ශය හෙතුකොටගෙන වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම කණ කෙරෙහිද කලකිරෙයි. ශබ්දයන් කෙරෙහිද

කලකිරෙයි. සෝතවිඥානය කෙරෙහිද කලකිරෙයි. සෝත සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. 'මා විසින් මිදීමෙන් උපාදානය පිරිසිඳ දන්නා ලද්දේය'යි දැනගණියි.

4. "නාසයද, ගන්ධයන්ද නිසා ඝාණ විඥානය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ. ස්පර්ශය හෙතුකොට ගෙන වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම නාසය කෙරෙහිද කලකිරෙයි. ගන්ධයන් කෙරෙහිද කලකිරෙයි. ඝාණ විඥානය කෙරෙහිද කලකිරෙයි. ඝාණ සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. 'මා විසින් මිදීමෙන් උපාදානය පිරිසිඳ දන්නා ලද්දේයයි' දැනගණියි.

5. "දිවද රසයන්ද නිසා ජිව්හා විඥානය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ. ස්පර්ශය හෙතුකොටගෙන වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම දිව කෙරෙහිද කලකිරෙයි. රසයන් කෙරෙහිද කලකිරෙයි. ජිව්හා විඥානය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. 'මා විසින් මිදීමෙන් උපාදානය පිරිසිඳ දන්නා ලද්දේයයි' දැනගනියි.

6. "කයද, ස්පර්ශයෝද නිසා කාය විඥානය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ ස්පර්ශය හෙතුකොටගෙන වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම කය කෙරෙහිද කලකිරෙයි. ස්පර්ශයන් කෙරෙහිද කලකිරෙයි. කායවිඥානය කෙරෙහිද කලකිරෙයි. කාය සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. 'මා විසින් මිදීමෙන් උපාදානය පිරිසිඳ දන්නා ලද්දේයයි' දැනගනියි.

7. "සිතද, ධර්මයන්ද නිසා මනෝවිඥානය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ. ස්පර්ශය හෙතුකොටගෙන වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සිත කෙරෙහිද කලකිරෙයි. ධර්මයන් කෙරෙහිද කලකිරෙයි. මනොවිඥානය කෙරෙහිද කලකිරෙයි. මනෝ සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. 'මා විසින් මිදීමෙන් උපාදානය පිරිසිඳ දන්නා ලද්දේයයි' දැනගණියි. මහණෙනි, මේ වනාහි සියලු උපාදානයන් පිරිසිඳ දැනීම පිණිස (පවත්නාවූ) ධර්මය වේයයි" වදාළේය.

---

## 9. සබ්බුපාදාන පරියාය සූත්‍රය (1)

(මේ සූත්‍රය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, සියලු උපාදානයන් දුරුකිරීම පිණිස (පවත්නාවූ) ධර්මය තොපට දේශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, සියලු උපාදානයන් දුරුකිරීම පිණිස පවත්නාවූ ධර්මය කවරේද?

3. "ඇසද රූපයන්ද නිසා චක්ඛු විඥානය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ. ස්පර්ශය නිසා වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම ඇස කෙරෙහිද කලකිරෙයි, රූපයන් කෙරෙහිද කලකිරෙයි. චක්ඛු විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, චක්ඛුසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, වේදනාව කෙරෙහිද කලකිරෙයි, කලකිරෙන්නේ නොඇලෙයි, නොඇලීමෙන් මිදෙයි 'මා විසින් මිදීමෙන් උපාදානය දුරුකරන ලද්දේයයි' දැනගණියි.

4. "කණද, ශබ්දයන්ද නිසා සෝතවිඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය වේ. ස්පර්ශය නිසා වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම

කණ කෙරෙහිද කලකිරෙයි, ශබ්දයන් කෙරෙහිද කලකිරෙයි, සෝත විඥානය කෙරෙහිද කලකිරෙයි, සෝත සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, වේදනාව කෙරෙහිද කලකිරෙයි, කලකිරෙන්නේ නොඇලෙයි, නොඇලීමෙන් මිදෙයි. 'මා විසින් මිදීමෙන් උපාදානය දුරුකරන ලද්දේයයි' දැනගණියි.

**5.** "නාසයද ගන්ධයන්ද නිසා ඝාණ විඥානය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ. ස්පර්ශය නිසා වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම නාසය කෙරෙහිද කලකිරෙයි, ගන්ධයන් කෙරෙහිද කලකිරෙයි. ඝාණ විඥානය කෙරෙහිද කලකිරෙයි, ඝාණසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, කලකිරෙන්නේ නොඇලෙයි, නොඇලීමෙන් මිදෙයි 'මා විසින් මිදීමෙන් උපාදානය දුරුකරන ලද්දේයයි' දැනගණියි.

**6.** "දිවද රූපයන්ද නිසා ජිව්හාවිඥානය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය වේ. ස්පර්ශය නිසා වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම දිව කෙරෙහිද කලකිරෙයි, රස කෙරෙහිද කලකිරෙයි. ජිව්හා විඥානය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, වේදනාව කෙරෙහිද කලකිරෙයි, කලකිරෙන්නේ නොඇලෙයි, නොඇලීමෙන් මිදෙයි. 'මා විසින් මිදීමෙන් උපාදානය දුරුකරන ලදැයි' දැනගණියි.

**7.** "කයද, ස්පර්ශයන්ද නිසා කාය විඥානය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ. ස්පර්ශය නිසා වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම කය කෙරෙහිද කලකිරෙයි, ස්පර්ශයන් කෙරෙහිද කලකිරෙයි. කාය විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. කාය සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, වේදනාව කෙරෙහිද කලකිරෙයි, කලකිරෙන්නේ නොඇලෙයි, නොඇලීමෙන් මිදෙයි. 'මා විසින් මිදීමෙන් උපාදානය දුරුකරන ලද්දේයයි' දැනගණියි.

**8.** "සිතද ධර්මයන්ද නිසා මනො විඥානය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශයවේ. ස්පර්ශය නිසා වේදනාව

වේ. මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම සිත කෙරෙහිද කලකිරෙයි, ධර්මයන් කෙරෙහිද කලකිරෙයි. මනොවිඥානය කෙරෙහිද කලකිරෙයි, මනොසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, වේදනාව කෙරෙහිද කලකිරෙයි, කලකිරෙන්නේ නොඇලෙයි, නොඇලීමෙන් මිදෙයි. 'මා විසින් මිදීමෙන් උපාදානය දුරුකරන ලද්දේයයි' දැනගණියි. මහණෙනි, මේ වනාහි සියලු උපාදානයන් දුරුකිරීම පිණිස පවත්නාවූ ධර්මය වේයයි" වදාළේය.

---

## 10. සබ්බුපාදාන පරියාය සූත්‍රය. (2)

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2 "මහණෙනි, සියලු උපාදානයන් දුරුකිරීම පිණිස පවත්නාවූ ධර්මය තොපට දෙශනා කරන්නෙමි. එය අසව් මහණෙනි, සියලු උපාදානයන් දුරුකිරීම පිණිස පවත්නාවූ ධර්මය කවරේද යත්?

"මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? ඇස නිත්‍ය හෝ අනිත්‍ය වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය. මෙතෙම මම වෙමියි මෙතෙම මාගේ ආත්මයයි දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"රූපයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යයහ"

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛුවිඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- 'ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇතතේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛුසම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද? එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

3. "මහණෙනි, කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ශබ්දයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි. මෙතෙම මාගේ ආත්මයයි' දක්නට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සෝත විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සෝතසම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සොතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

4. "මහණෙනි, නාසය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-'ස්වාමීනි, අනිත්‍යය."

'යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය. මෙතෙම මම වෙමියි. මෙතෙම මාගේ ආත්මයයි, දකින්ට සුදුසුද?"-"ස්වාමීනි මෙය සුදුසු නොවේමැයි."

"ගන්ධයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-'ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සාණ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- 'ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- 'ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සාණ සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- 'ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේ"

"සාණසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- 'ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

5 "මහණෙනි, දිව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"රසයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ජිව්හා විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ජිව්හා සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ජිව්හා සම්ඵස්සය හේතුකොටගෙණ සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?'-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

**6.** "මහණෙනි, කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද"-"ස්වාමීනි, දුක්ය."

'යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරලෙන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

'ස්පර්ශය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි' මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"කාය විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම

මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"කාය සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේ මැයි."

"කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ හෝ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

7. "මහණෙනි, සිත නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය, මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"ධර්මයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"මනෝ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- "ස්වාමීනි, අනිත්‍යය."

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- 'ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

'මනෝ සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි මෙය සුදුසු නොවේමැයි."

"මනෝසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම

මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

8. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම ඇස කෙරෙහිද කලකිරෙයි, රූපය කෙරෙහිද කලකිරෙයි, චක්ඛුවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, චක්ඛුසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ වේදනාවකුත් උපදීද, එය කෙරෙහිද කලකිරෙයි.

9. "කණ කෙරෙහිද කලකිරෙයි. ශබ්දය කෙරෙහිද කලකිරෙයි, සෝත විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, සෝත සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. සෝතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

10. "නාසය කෙරෙහිද කලකිරෙයි, ගන්ධය කෙරෙහිද කලකිරෙයි, ඝාණ විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, ඝාණ සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

11. "දිව කෙරෙහිද කලකිරෙයි, රසය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

12. "කය කෙරෙහිද කලකිරෙයි, ස්පර්ශය කෙරෙහිද කලකිරෙයි, කාය විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, කාය සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

13. "සිත කෙරෙහිද කලකිරෙයි, ධර්මයන් කෙරෙහිද කලකිරෙයි, මනෝ විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, මනෝ

සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. මනෝසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුණේය යන දැනීමවේ. ජාතිය (ඉපදීම) ක්ෂයවිය. මාර්ග බ්‍රහ්මචය්‍ය‍්‍යාව වැස නිමවන ලද්දේය. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගණියි. මහණෙනි, මේ වනාහි සියලු හැඟීම් නැසීමට උපකාරවූ ප්‍රතිපදාවයයි" (වදාළසේක)

(පළමුවෙනි අවිජ්ජා වර්ගය නිමි.)

---

## 2 මිගජාල වර්ගය.

### 1. මිගජාල සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. ඉක්බිති ආයුෂ්මත් මිගජාල ස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් මිගජාල ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

"ස්වාමීනි, 'එකවිහාරි ඒකවිහාරී' යයි හෙවත් එකලාව වාසය කරන්නේයයි කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි එකලාව වාසය කරන්නේ වේද? කොපමණකින් දෙවැන්නෙක් සහිතව වාසය කරන්නේවේද?" කියායි.

2. "මිගජාලය, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ රූපයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම එයට තෘෂ්ණාවෙන් සතුටුවේද, එය ප්‍රියයයි මනාපයයි කියාද,

එහි ගැලී සිටීද, එයට තෘෂ්ණාවෙන් සතුටුවන්නාවූ එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ එහි ගිලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණා සතුට උපදියි. තෘෂ්ණා සතුට ඇති කල්හි බලවත් ආශාවෙන් යුක්තවේ. ඒ බලවත් ආශාව ඇතිකල්හි බැඳීම වේ. මිගජාලය, තෘෂ්ණාවෙන් බැඳුනාවූ මහණතෙම දෙවැන්නෙකු සහිතව වාසය කරන්නේයයි කියනු ලැබේ.

3. "මිගජාලය, සෝත විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ශබ්දයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම එයට තෘෂ්ණාවෙන් සතුටුවේද, එය ප්‍රියයයි, මනාපයයි කියාද, එහි ගැලී සිටීද, එයට තෘෂ්ණාවෙන් සතුටුවන්නාවූ එය ප්‍රියයයි, මනාපයයි, කියන්නාවූ එහි ගිලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණා සතුට උපදියි. තෘෂ්ණා සතුට ඇති කල්හි බලවත් ආශාවෙන් යුක්තවේ. ඒ බලවත් ආශාව ඇති කල්හි බැඳීම වේ. මිගජාලය, තෘෂ්ණාවෙන් බැඳුනාවූ මහණතෙම දෙවැන්නෙකු සහිතව වාසය කරන්නේයයි කියනු ලැබේ.

4. "මිගජාලය, ඝාණවිඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ගන්ධයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම එයට තෘෂ්ණාවෙන් සතුටුවේද, එය ප්‍රියයයි, මනාපයයි කියාද, එහි ගැලී සිටීද, එයට තෘෂ්ණාවෙන් සතුටුවන්නාවූ එය ප්‍රියයයි, මනාපයයි කියන්නාවූ එහි ගිලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණා සතුට උපදියි. තෘෂ්ණා සතුට ඇති කල්හි බලවත් ආශාවෙන් යුක්තවේ. ඒ බලවත් ආශාව ඇතිකල්හි බැඳීම වේ. මිගජාලය, තෘෂ්ණාවෙන් බැඳුනාවූ මහණතෙම දෙවැන්නෙකු සහිතව වාසය කරන්නේයයි කියනු ලැබේ.

5. "මිගජාලය, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ රසයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එයට තෘෂ්ණාවෙන් සතුටුවේද, එය ප්‍රියයයි, මනාපයයි කියාද, එහි බැසගෙන සිටීද, එයට තෘෂ්ණාවෙන් සතුටුවන්නාවූ එය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රියයයි, මනාපයයි කියන්නාවූ එහි ඇතුළත්ව සිටින්නාවූ ඔහුට තෘෂ්ණා සතුට උපදියි. තෘෂ්ණා සතුට ඇතිකල්හි බලවත් ඇලීම වෙයි. බලවත් ඇලීම ඇතිකල්හි බැඳීම වේ. මිගජාලය, තෘෂ්ණා බන්ධනයෙන් බැඳුනාවූ මහණතෙම දෙවැන්නෙකු සහිතව වාසය කරන්නේයයි කියනු ලැබේ.

6. "මිගජාලය, කාය විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ස්පර්ශයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එයට තෘෂ්ණාවෙන් සතුටුවේද, එය ප්‍රියයයි, මනාපයයි කියාද, එහි ගැලී සිටීද එයට තෘෂ්ණාවෙන් සතුටුවන්නාවූ එය ප්‍රියයයි, මනාපයයි කියන්නාවූ එහි ගිලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණා සතුට උපදියි. තෘෂ්ණා සතුට ඇති කල්හි බලවත් ආශාවෙන් යුක්තවේ. ඒ බලවත් ආශාව ඇතිකල්හි බැඳීමවේ. මිගජාලය, තෘෂ්ණාවෙන් බැඳුනාවූ මහණතෙම දෙවැන්නෙකු සහිතව වාසය කරන්නේයයි කියනු ලැබේ.

7. "මිගජාලය, මනොවිඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ධර්මයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම එයට තෘෂ්ණාවෙන් සතුටුවෙයිද, එය ප්‍රියයයි, මනාපයයි කියාද, එහිගැලී සිටීද, එයට තෘෂ්ණාවෙන් සතුටුවන්නාවූ එය ප්‍රියයයි, මනාපයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණා සතුට උපදියි. තෘෂ්ණා සතුට ඇතිකල්හි ඇල්ම වේ. ඇල්ම ඇතිකල්හි බැඳීමවේ. මිගජාලය, තෘෂ්ණා බන්ධනයෙන් බැඳුනාවූ මහණතෙම දෙවැන්නෙකු සමග වාසය කරන්නේයයි කියනු ලැබේ.

8. "මිගජාලය, මෙසේ වාසය කරන්නාවූද මහණතෙම හුදෙක් වනයෙහි ශබ්ද නැත්තාවූ ඝොෂා නැත්තාවූ විජනය ඇසුරුකොට හමන වාතය නැත්තාවූ මිනිසුන්ගේ රහසි ගත වීමට සුදුසුවූ සැඟවී වාසයට සුදුසුවූ ඉතා දුරවූ වන සෙනසුන් සේවනය කෙරේද, එතකුදු වුවත් දෙවැන්නෙකු සහිතව වාසය කරන්නේයයි කියනු ලැබේ. ඊට හේතු කවරේද? ඔහුට තෘෂ්ණාව

දෙවැන්න වේ. මොහුගේ ඒ තෘෂ්ණාව ප්‍රහීණ නොවීය. එහෙයින් දෙවැන්නකු සහිතව වාසය කරන්නේයයි කියනු ලැබේ

9. "මිගජාලය, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කමනීයවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ රූපයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම එයට තෘෂ්ණාවෙන් සතුටු නොවේද, එය ප්‍රියයයි, මනාපයයි නොකියාද, එහි නොගිලේද, එයට තෘෂ්ණාවෙන් සතුටු නොවන්නාවූ එය ප්‍රියයයි, මනාපයයි නොකියන්නාවූ එහි නොගිලුණාවූ ඔහුගේ තෘෂ්ණා සතුට නිරුද්ධවේ. තෘෂ්ණා සතුට නැති කල්හි ඇලීම නොවේ ඇලීම නැති කල්හි බැඳීම නොවේ. මිගජාලය, තෘෂ්ණා බන්ධනයෙන් මිදුනාවූ මහණ තෙම එකලාව වාසය කරන්නේයයි කියනු ලැබේ.

10 "මිගජාලය, සොත විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කමනීයවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ශබ්දයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම තෘෂ්ණාවෙන් සතුටු නොවේද, එය ප්‍රියයයි, මනාපයයි, නොකියාද, එහි නොගිලේද, එයට තෘෂ්ණාවෙන් සතුටු නොවන්නාවූ එය ප්‍රියයයි, මනාපයයි නොකියන්නාවූ එහි නොගිලුණාවූ ඔහුගේ තෘෂ්ණා සතුට නිරුද්ධවේ. තෘෂ්ණා සතුට නැති කල්හි ඇලීම නොවේ. ඇලීම නැති කල්හි බැඳීම නොවේ. මිගජාලය, තෘෂ්ණා බන්ධනයෙන් මිදුනාවූ මහණ තෙම එකලාව වාසය කරන්නේයයි කියනු ලැබේ

11. "මිගජාලය, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කමනීයවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ගන්ධයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එයට තෘෂ්ණාවෙන් සතුටු නොවේද, එය ප්‍රියයයි, මනාපයයි නොකියාද, එහි නොගිලේද, එයට තෘෂ්ණාවෙන් සතුටු නොවන්නාවූ එය ප්‍රියයයි, මනාපයයි නොකියන්නාවූ එහි නොගිලුණාවූ ඔහුගේ තෘෂ්ණා සතුට නිරුද්ධවේ. තෘෂ්ණා සතුට නැති කල්හි ඇලීම නොවේ. ඇලීම නැති කල්හි බැඳීම නොවේ.

මිගජාලය, තෘෂ්ණා බන්ධනයෙන් මිදුනාවූ මහණ තෙම එකලාව වාසය කරන්නේයයි කියනු ලැබේ.

12. "මිගජාලය, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කමනීයවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ රසයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එයට තෘෂ්ණාවෙන් නොසතුටුවේද, එය ප්‍රියයයි, මනාපයයි නොකියාද, එහි ගිලී නොසිටීද, එයට තෘෂ්ණාවෙන් නොසතුටු වන්නාවූ එය ප්‍රියයයි, මනාපයයි නොකියන්නාවූ එහි නොගිලුනාවූ ඔහුගේ තෘෂ්ණා සතුට නිරුද්ධවේ. තෘෂ්ණා සතුට නැති කල්හි ඇලීම නොවේ ඇලීම නැති කල්හි බැඳීම නොවේ. මිගජාලය, තෘෂ්ණා බන්ධනයෙන් මිදුනාවූ මහණතෙම එකලාව වාසය කරන්නේයයි කියනු ලැබේ.

13. "මිගජාලය, කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කමනීයවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ස්පර්ශයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එයට තෘෂ්ණාවෙන් සතුටු නොවේද, එය ප්‍රියයයි, මනාපයයි නොකියාද, එහි නොගිලේද, එයට තෘෂ්ණාවෙන් සතුටු නොවන්නාවූ එය ප්‍රියයයි, මනාපයයි නොකියන්නාවූ එහි නොගිලුණාවූ ඔහුගේ තෘෂ්ණා සතුට නිරුද්ධවේ. තෘෂ්ණා සතුට නැති කල්හි ඇලීම නොවේ. ඇලීම නැති කල්හි බැඳීම නොවේ. මිගජාලය, තෘෂ්ණා බන්ධනයෙන් මිදුනාවූ මහණතෙම එකලාව වාසය කරන්නේයයි කියනු ලැබේ.

14. "මිගජාලය, මනො විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කමනීයවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ධර්මයෝ ඇත්තාහ. මහණතෙම ඉදින් එයට තෘෂ්ණාවෙන් සතුටු නොවේද, එය ප්‍රියයයි, මනාපයයි, නොකියාද, එහි නොගිලේද, එයට තෘෂ්ණාවෙන් සතුටු නොවන්නාවූ එය ප්‍රියයයි, මනාපයයි නොකියන්නාවූ එහි නොගිලුණාවූ ඔහුගේ තෘෂ්ණා සතුට නිරුද්ධවේ. තෘෂ්ණා සතුට නැති කල්හි ඇලීම නොවේ. ඇලීම නැති කල්හි බැඳීම නොවේ.

මිගජාලය, තෘෂ්ණා බන්ධනයෙන් මිදුනාවූ මහණතෙම එකලාව වාසය කරන්නේයයි කියනු ලැබේ.

15. "මිගජාලය, මෙසේ වාසය කරන්නාවූ මහණතෙම හුදෙක් භික්ෂූන්ගෙන් භික්ෂුණීන්ගෙන් උපාසකවරුන්ගෙන් උපාසිකාවරුන්ගෙන් රජුන්ගෙන් රජ මහ ඇමැතියන්ගෙන් තීර්ථකයන්ගෙන් තීර්ථක ශ්‍රාවකයන්ගෙන් ගැවසීගත්තාවූ ගම්වල වාසය කෙරේද, එතකුදුවුවත් එකලාව වාසය කරන්නේයයි කියනු ලැබේ.

ඊට හේතු කවරේද? තෘෂ්ණාව වනාහි ඔහුගේ දෙවැන්න වේ. ඔහුගේ ඒ තෘෂ්ණාව ප්‍රහීණ වූවාය. එහෙයින් එකලාව වාසය කරන්නේයයි කියනු ලැබේයයි" (වදාළේය.)

---

## 2. මිගජාල සූත්‍රය. (2)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා එකලාව සමූහයෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නෙම්ද, භාග්‍යවතුන් වහන්සේ මට එබඳු ධර්මයක් දේශනා කරනසේක් නම් මැනව" කියායි.

3. "මිගජාලය, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කමනීයවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ රූපයෝ ඇත්තාහුමය. ඉදින් මහණතෙම ඊට ඇලෙයිද, එය ප්‍රියයයි මනාපයයි කියාද එහි ගිලෙයිද, එහි ඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ, එහි ගිලුනාවූ ඔහුට තෘෂ්ණාව උපදියි. මිගජාලය, තෘෂ්ණාව නිසා දුක් ඉපදීම වේ යයි කියමි"

4. "මිගජාලය, සෝත විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කමනීයවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ශබ්දයෝ ඇත්තාහුමය. ඉදින් මහණතෙම ඊට ඇලෙයිද, එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගිලෙයිද, එහි ඇලෙන්නාවූ, එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ, එහි ගිලුනාවූ ඔහුට තෘෂ්ණාව උපදියි. මිගජාලය, තෘෂ්ණාව නිසා දුක් ඉපදීම වේයයි කියමි.

5. 'මිගජාලය, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කමනීයවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ගන්ධයෝ ඇත්තාහුමය. ඉදින් මහණතෙම ඊට ඇලෙයිද, එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගිලෙයිද, එහි ඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ එහි ගිලුනාවූ ඔහුට තෘෂ්ණාව උපදියි. මිගජාලය, තෘෂ්ණාව නිසා දුක් ඉපදීම වේයයි කියමි.

6 "මිගජාලය, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කමනීයවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ රසයෝ ඇත්තාහුමය. ඉදින් මහණතෙම ඊට ඇලෙයිද, එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගිලෙයිද, එහි ඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ, එහි ගිලුනාවූ ඔහුට තෘෂ්ණාව උපදියි. මිගජාලය, තෘෂ්ණාව නිසා දුක් ඉපදීම වේයයි කියමි.

7. "මිගජාලය, කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කමනීයවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ස්පර්ශයෝ ඇත්තාහුමය. ඉදින් මහණතෙම ඊට ඇලෙයිද, එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගිලෙයිද, එහි ඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ, එහි ගිලුනාවූ ඔහුට තෘෂ්ණාව උපදියි. මිගජාලය, තෘෂ්ණාව නිසා දුක් ඉපදීම වේයයි කියමි.

8. "මිගජාලය, මනෝ විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇලුම් කටයුතුවූ ධර්මයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එහි ඇලෙයිද, එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගැලී සිටීද, එහි ඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණාව උපදියි. මිගජාලය, තෘෂ්ණාව නිසා දුක් ඉපදීම වේයයි කියමි.

9. "මිගජාලය, චක්ඛු විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ රූපයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එහි නොඇලේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද, එහි නොගිලේද, එහි නො ඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ. මිගජාලය, තෘෂ්ණාව නිරුද්ධවීමෙන් දුක් නිරුද්ධවීම වේයයි කියමි.

10. "මිගජාලය, සෝත විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ශබ්දයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එහි නොඇලේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද, එහි නොගිලේද, එහි නොඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ. මිගජාලය, තෘෂ්ණාව නිරුද්ධවීමෙන් දුක් නිරුද්ධවීම වේයයි කියමි.

11. "මිගජාලය, ඝාණ විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ගන්ධයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එහි නොඇලේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද, එහි නොගිලේද, එහි නොඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. මිගජාලය, තෘෂ්ණාව නිරුද්ධවීමෙන් දුක් නිරුද්ධවීම වේයයි කියමි.

12. "මිගජාලය, ජිව්හා විඥානයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන්

යුක්තවූ ඇලුම් කටයුතු වූ රසයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එහි නොඇලේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද එහි නොගිලේද, එහි නොඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ. මිගජාලය තෘෂ්ණාව නිරුද්ධවීමෙන් දුක් නිරුද්ධවීම වේයයි කියමි

13. "මිගජාලය, කාය විඥානයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතු වූ ස්පර්ශයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එහි නොඇලේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද, එහි නොගිලේද, එහි නොඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ. මිගජාලය තෘෂ්ණාව නිරුද්ධවීමෙන් දුක් නිරුද්ධවීම වේයයි කියමි.

14. 'මිගජාලය, මනොවිඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ධර්මයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එහි නොඇලේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද එහි නොගිලී සිටීද, එහි නොඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි නොකියන්නාවූ එහි නොගිලුණාවූ ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ. මිගජාලය තෘෂ්ණාව නිරුද්ධවීමෙන් දුක නිරුද්ධවීම වේයයි කියමියි" වදාළේය.

15. ඉක්බිති ආයුෂ්මත් මිගජාල ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගෞරව දක්වා වැඩියේය. ඉක්බිති ආයුෂ්මත් මිගජාල ස්ථවිරතෙම හුදකලාව සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව ආත්මාලය දුරුකොට වාසයකරන්නේ නොබෝ කලකින්ම යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවර කොට

ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙළේය.

16 ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවන ලද්දේය. සතර මගින් කළයුත්ත කරණලදී. මේ ආත්ම භාවය පිණිස කළයුතු අනිකක් නැතැයි විශෙෂයෙන් දැනගත් සේක. ආයුෂ්මත් මිගජාල ස්ථවිර තෙමේ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක්ද වූයේයයි වදාළේය.

---

## 3. සමිද්ධි සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි ආයුෂ්මත් සමිද්ධි ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් සමිද්ධි ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. ස්වාමීනි, 'මාරයා, මාරයා යයි' කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් මාරයා හෝ මාරයා යන පැනවීම හෝ වන්නේද?

2 "සමිද්ධිය, යම්තැනක වනාහි ඇස ඇත්තේද රූප ඇත්තාහුද චක්ඛුවිඤ්ඤාණය ඇත්තේද, චක්ඛුවිඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි මාරයා හෝ මාරයාය යන පැනවීම හෝ ඇත්තේය.

"සමිද්ධිය, යම්තැනක වනාහි කණ ඇත්තේද ශබ්ද ඇත්තාහුද සෝත විඥානය ඇත්තේද, සෝතවිඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි මාරයා හෝ මාරයාය යන පැනවීම හෝ ඇත්තේය.

"සමිද්ධිය, යම්තැනක වනාහි නාසය ඇත්තේද ගන්ධ ඇත්තාහුද ඝාණ විඥානය ඇත්තේද, ඝාණවිඥානයෙන් දතයුතු

ධර්මයෝ ඇත්තාහුද, එහි මාරයා හෝ මාරයාය යන පැනවීම හෝ ඇත්තේය.

'සමිද්ධිය, යම්තැනක වනාහි දිව ඇත්තේද, රසයෝ ඇත්තාහුද, ජිව්හා විඥානය ඇත්තේද, ජිව්හා විඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි මාරයා හෝ මාරයාය යන පැනවීම හෝ ඇත්තේය.

"සමිද්ධිය, යම්තැනක වනාහි කය ඇත්තේද ස්පර්ශය ඇත්තාහුද කාය විඥානය ඇත්තේද, කාය විඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි මාරයා හෝ මාරයාය යන පැනවීම හෝ ඇත්තේය.

"සමිද්ධිය, යම්තැනක සිත ඇත්තේද ධර්මයෝ ඇත්තාහුද මනොවිඥානය ඇත්තේද මනොවිඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද එහි මාරයා හෝ මාරයාය යන පැනවීම හෝ ඇත්තේය.

3. "සමිද්ධිය, යම් තැනක වනාහි ඇස නැත්තේද, රූපයෝ නැත්තාහුද, චක්ඛුවිඥානය නැත්තේද චක්ඛු විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි මාරයා හෝ මාරයා යන පැනවීම හෝ නැත්තේය.

'සමිද්ධිය, යම් තැනක වනාහි කණ නැත්තේද ශබ්දයෝ නැත්තාහුද, සෝතවිඥානය නැත්තේද, සෝත විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි මාරයා හෝ මාරයා යන පැනවීම හෝ නැත්තේය.

'සමිද්ධිය, යම් තැනක වනාහි නාසය නැත්තේද, ගන්ධයෝ නැත්තාහුද, ඝාණවිඥානය නැත්තේද, ඝාණ විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි මාරයා හෝ මාරයා යන පැනවීම හෝ නැත්තේය.

"සමිද්ධිය, යම් තැනක වනාහි දිව නැත්තේද, රසයෝ නැත්තාහුද, ජිව්හාවිඥානය නැත්තේද, ජිව්හාවිඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි මාරයා හෝ මාරයා යන පැනවීම හෝ නැත්තේය.

"සමිද්ධිය, යම් තැනක වනාහි කය නැත්තේද, ස්පර්ශයෝ නැත්තාහුද, කායවිඥානය නැත්තේද, කායවිඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි මාරයා හෝ මාරයා යන පැනවීම හෝ නැත්තේය.

"සමිද්ධිය, යම් තැනක වනාහි සිත නැත්තේද, ධර්මයෝ නැත්තාහුද, මනෝවිඥානය, නැත්තේද මනෝවිඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද එහි මාරයා හෝ මාරයා යන පැනවීම හෝ නැත්තේය"යි වදාළේය.

---

## 4. සමිද්ධි සූත්‍රය (2)

(මේ සූත්‍රයද මේ වර්ගයේ තුන්වෙනි සූත්‍රය මෙන් වේළුවනාරාමයේ දී දේශනාකරන ලදී.)

"ස්වාමීනි, 'සත්වයා සත්වයායයි කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි සත්වයා හෝ සත්වයා යන පැනවීම හෝ වන්නේද?"

**2.** "සමිද්ධිය, යම්තැනක වනාහි ඇස ඇත්තේද රූපයෝ ඇත්තාහුද, චක්ඛු විඤ්ඤාණය ඇත්තේද චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි සත්වයා හෝ සත්වයා යන පැනවීම හෝ ඇත්තේය.

"සමිද්ධිය, යම් තැනක වනාහි කණ ඇත්තේද, ශබ්දයෝ ඇත්තාහුද, සෝත විඤ්ඤාණය ඇත්තේද සෝත විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි සත්වයා හෝ සත්වයාා යන පැනවීම හෝ ඇත්තේය.

"සමිද්ධිය, යම්තැනක වනාහි නාසය ඇත්තේද, ගන්ධයෝ ඇත්තාහුද, ඝාණ විඤ්ඤාණය ඇත්තේද, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි සත්වයා හෝ සත්වයා යන පැනවීම හෝ ඇත්තේය.

"සමිද්ධිය, යම් තැනක වනාහි දිව ඇත්තේද, රසයෝ ඇත්තාහුද, ජිව්හා විඤ්ඤාණය ඇත්තේද ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි සත්වයා හෝ සත්වයා යන පැනවීම හෝ ඇත්තේය.

"සමිද්ධිය, යම් තැනක වනාහි කය ඇත්තේද, ස්පර්ශයෝ ඇත්තාහුද, කාය විඤ්ඤාණය ඇත්තේද, කාය විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි සත්වයා හෝ සත්වයා යන පැනවීම හෝ ඇත්තේය.

"සමිද්ධිය, යම් තැනක වනාහි සිත ඇත්තේද, ධර්මයෝ ඇත්තාහුද, මනො විඤ්ඤාණය ඇත්තේද, මනො විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි සත්වයා හෝ සත්වයා යන පැනවීම හෝ ඇත්තේය.

3 "සමිද්ධිය, යම්තැනක වනාහි ඇස නැත්තේද, රූපයෝ නැත්තාහුද, චක්ඛු විඤ්ඤාණය නැත්තේද, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි සත්වයා හෝ සත්වයා යන පැනවීම හෝ නැත්තේය.

"සමිද්ධිය, යම්තැනක වනාහි කණ නැත්තේද, ශබ්දයෝ නැත්තාහුද, සෝත විඤ්ඤාණය නැත්තේද, සෝත විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි සත්වයා හෝ සත්වයා යන පැනවීම හෝ නැත්තේය.

"සමිද්ධිය, යම්තැනක වනාහි නාසය නැත්තේද, ගන්ධයෝ නැත්තාහුද, ඝාණ විඤ්ඤාණය නැත්තේද, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි සත්වයා හෝ සත්වයා යන පැනවීම හෝ නැත්තේය.

"සමිද්ධිය යම්තැනක වනාහි දිව නැත්තේද, රසයෝ නැත්තාහුද, ජිව්හා විඤ්ඤාණ නැත්තේද, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි සත්වයා හෝ සත්වයා යන පැනවීම හෝ නැත්තේය.

"සමිද්ධිය යම්තැනක වනාහි කය නැත්තේද, ස්පර්ශයෝ නැත්තාහුද, කාය විඤ්ඤාණය නැත්තේද, කාය විඤ්ඤාණයෙන්

දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි සත්වයා හෝ සත්වයා යන පැනවීම හෝ නැත්තේය.

"සමිද්ධිය යම්තැනක වනාහි සිත නැත්තේද, ධර්මයෝ නැත්තාහුද, මනො විඤ්ඤාණය නැත්තේද, මනොවිඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි සත්වයා හෝ සත්වයා යන පැනවීම හෝ නැත්තේයි" වදාළේය.

---

## 5 සමිද්ධි සූත්‍රය. (3)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ තුන්වෙනි සූත්‍රය මෙන් වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

"ස්වාමීනි, 'දුකය, දුකයයි' කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි දුක හෝ දුකය යන පැනවීම හෝ වන්නේද?"

2. "සමිද්ධිය, යම් තැනක වනාහි ඇස ඇත්තේද, රූපයෝ ඇත්තාහුද, චක්ඛු විඥානය ඇත්තේද, චක්ඛු විඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි දුක හෝ දුකය යන පැනවීම හෝ ඇත්තේය.

"යම්තැනක වනාහි කණ ඇත්තේද, ශබ්දයෝ ඇත්තාහුද සෝත විඥානය ඇත්තේද, සෝත විඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි දුක හෝ දුකය යන පැනවීම හෝ ඇත්තේය.

"යම්තැනක වනාහි නාසය ඇත්තේද, ගන්ධයෝ ඇත්තාහුද, ඝාණ විඥානය ඇත්තේද, ඝාණ විඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි දුක හෝ දුකය යන පැනවීම හෝ ඇත්තේය.

"යම්තැනක වනාහි දිව ඇත්තේද, රසයෝ ඇත්තාහුද ජිව්හා විඥානය ඇත්තේද, ජිව්හා විඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි දුක හෝ දුකය යන පැනවීම හෝ ඇත්තේය.

"යම්තැනක වනාහි කය ඇත්තේද, ස්පර්ශයෝ ඇත්තාහුද, කාය විඥානය ඇත්තේද, කාය විඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි දුක හෝ දුකය යන පැනවීම හෝ ඇත්තේය.

"යම්තැනක වනාහි සිත ඇත්තේද, ධර්මයෝ ඇත්තාහුද, මනො විඥානය ඇත්තේද, මනොවිඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි දුක හෝ දුකය යන පැනවීම හෝ ඇත්තේය.

3. "සමිද්ධිය, යම්තැනක වනාහි ඇස නැත්තේද, රූපයෝ නැත්තාහුද, චක්ඛු විඥානය නැත්තේද, චක්ඛු විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි දුක හෝ දුකය යන පැනවීම හෝ නැත්තේය.

"යම්තැනක වනාහි කණ නැත්තේද, ශබ්දයෝ නැත්තාහුද, සෝත විඥානය නැත්තේද, සෝත විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි දුක හෝ දුකය යන පැනවීම හෝ නැත්තේය.

"යම්තැනක වනාහි නාසය නැත්තේද, ගන්ධයෝ නැත්තාහුද, ඝාණ විඥානය නැත්තේද, ඝාණ විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි දුක හෝ දුකය යන පැනවීම හෝ නැත්තේය.

"යම්තැනක වනාහි දිව නැත්තේද, රසයෝ නැත්තාහුද, ජිව්හා විඥානය නැත්තේද, ජිව්හා විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි දුක හෝ දුකය යන පැනවීම හෝ නැත්තේය.

"යම්තැනක වනාහි කය නැත්තේද, ස්පර්ශයෝ නැත්තාහුද, කාය විඥානය නැත්තේද, කාය විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි දුක හෝ දුකය යන පැනවීම හෝ නැත්තේය.

"යම්තැනක වනාහි සිත නැත්තේද, ධර්මයෝ නැත්තාහුද, මනො විඥානය නැත්තේද, මනො විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි දුක හෝ දුකය යන පැනවීම හෝ නැත්තේයයි" වදාළේය.

---

## 6. සමිද්ධි සූත්‍රය. (4)

(මේ සූත්‍රයද මේ වර්ගයේ තුන්වෙනි සූත්‍රය මෙන් වේළුවනාරාමයේදී දේශනා කරණ ලදී.)

"ස්වාමීනි, 'ලෝකය, ලෝකයයි' කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි ලෝකය හෝ ලෝකය යන පැනවීම හෝ වන්නේද?"

2 "සමිද්ධිය, යම්තැනක වනාහි ඇස ඇත්තේද, රූපයෝ ඇත්තාහුද, චක්ඛු විඥානය ඇත්තේද, චක්ඛු විඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි ලෝකය හෝ ලෝකය යන පැනවීම හෝ ඇත්තේය.

"යම්තැනක වනාහි කණ ඇත්තේද, ශබ්දයෝ ඇත්තාහුද, සෝත විඥානය ඇත්තේද, සෝත විඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි ලෝකය හෝ ලෝකය යන පැනවීම හෝ ඇත්තේය.

"යම්තැනක වනාහි නාසය ඇත්තේද, ගන්ධයෝ ඇත්තාහුද, ඝාණ විඥානය ඇත්තේද, ඝාණ විඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි ලෝකය හෝ ලෝකය යන පැනවීම හෝ ඇත්තේය.

"යම්තැනක වනාහි දිව ඇත්තේද, රසයෝ ඇත්තාහුද, ජිව්හා විඥානය ඇත්තේද, ජිව්හා විඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි ලෝකය හෝ ලෝකය යන පැනවීම හෝ ඇත්තේය.

"යම්තැනක වනාහි කය ඇත්තේද, ස්පර්ශයෝ ඇත්තාහුද, කාය විඥානය ඇත්තේද, කාය විඥානයෙන් දතයුතු ධර්මයෝ ඇත්තාහුද, එහි ලෝකය හෝ ලෝකය යන පැනවීම හෝ ඇත්තේය.

"යම්තැනක වනාහි සිත ඇත්තේද, ධර්මයෝ ඇත්තාහුද, මනොවිඥානය ඇත්තේද, මනොවිඥානයෙන් දතයුතු ධර්මයෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඇත්තාහුද, එහි ලෝකය හෝ ලෝකය යන පැනවීම හෝ ඇත්තේය.

3. "සමිද්ධිය යම්තැනක වනාහි ඇස නැත්තේද, රූපයෝ නැත්තාහුද චක්ඛු විඥානය නැත්තේද, චක්ඛු විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි ලෝකය හා ලෝකය යන පැනවීම හෝ නැත්තේය.

"යම්තැනක වනාහි කණ නැත්තේද, ශබ්දයෝ නැත්තාහුද, සෝත විඥානය නැත්තේද, සෝත විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි ලෝකය හා ලෝකය යන පැනවීම හෝ නැත්තේය.

"යම්තැනක වනාහි නාසය නැත්තේද, ගන්ධයෝ නැත්තාහුද, ඝාණ විඥානය නැත්තේද, ඝාණ විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි ලෝකය හා ලෝකය යන පැනවීම හෝ නැත්තේය.

"යම්තැනක වනාහි දිව නැත්තේද, රසයෝ නැත්තාහුද, ජිව්හා විඥානය නැත්තේද, ජිව්හා විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි ලෝකය හා ලෝකය යන පැනවීම හෝ නැත්තේය.

"යම්තැනක වනාහි කය නැත්තේද, ස්පර්ශයෝ නැත්තාහුද, කාය විඥානය නැත්තේද, කාය විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි ලෝකය හා ලෝකය යන පැනවීම හෝ නැත්තේය.

"යම්තැනක වනාහි සිත නැත්තේද, ධර්මයෝ නැත්තාහුද, මනොවිඥානය නැත්තේද, මනො විඥානයෙන් දතයුතු ධර්මයෝ නැත්තාහුද, එහි ලෝකය හා ලෝකය යන පැනවීම හෝ නැත්තේයයි" වදාළේය.

---

## 7. උපසේන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් උපසේන ස්ථවිරයන් වහන්සේද, රජගහනුවර සීතවන නම් සොහොනෙහිවූ සප්පසොණ්ඩික නම් ලෙනෙහි වැඩ වාසය කෙරෙත්. එකල්හි වනාහි ආයුෂ්මත් උපසේන ස්ථවිරයන් වහන්සේගේ ශරීරයෙහි සර්පයෙක් වැටුනේය.*

2. "ඉක්බිති ආයුෂ්මත් උපසේන ස්ථවිරයන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කෙළේය. "ඇවැත්නි, එව් මාගේ මේ සිරුර මෙහිම බොල් මිටක් මෙන් විසිර යාමට (විනාශවීමට) පළමු ඇඳකට නංවා පිටතට ගෙනයව්යයි" කීයේය.

3. මෙසේ කීකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් උපසේන ස්ථවිරයන්ට මෙය කීයේය. "ආයුෂ්මත් උපසේනයන්ගේ ශරීරයෙහි අන්‍යප්‍රකාරයක් හෝ ඉන්ද්‍රියයන්ගේ වෙනස්වීමක් හෝ අපි නොමදකිමු. එතකුදු වූවත් ආයුෂ්මත් උපසේන තෙම මෙසේ කියයි. 'ඇවැත්නි, එව් මාගේ මේ සිරුර මෙහිම බොල් මිටක් මෙන් විසිර යාමට පළමු ඇඳකට නංවා පිටතට ගෙණ යව්' කියායි.

4. "ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, 'ඇස මම වෙමියි කියා හෝ මාගේ ඇසය' කියා හෝ 'කණ මම වෙමියි කියා හෝ මාගේ කණය' කියා හෝ 'නාසය මම වෙමියි කියා හෝ මාගේ නාසය' කියා හෝ 'දිව මම වෙමියි කියා හෝ මාගේ දිවය' කියා හෝ 'කය මම වෙමියි කියා හෝ මාගේ කයය' කියා හෝ 'සිත මම වෙමි කියා හෝ මාගේ සිතය' කියා හෝ යන අදහස යමෙකුට ඇත්තේද,

5. "ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, ඔහුගේ ශරීරයෙහි අන්‍යප්‍රකාරයක් හෝ ඉන්ද්‍රියන්ගේ වෙනස්වීමක් හෝ වන්නේය. ආයුෂ්මත් ශාරීපුත්‍රයෙනි, මට වනාහි 'ඇස මම වෙමියි කියා හෝ මාගේ ඇසය' කියා හෝ 'කණ මම වෙමියි කියා හෝ

---

* ශරීරයෙහි ස්පර්ශවූ පමණින් විස නගන්නාවූ ප්‍රත්‍යය විසනම් වර්ගයට අයත් සර්පයෙකි.

මාගේ කණය' කියා හෝ 'නාසය මම වෙමියි හෝ මාගේ නාසයය' කියා හෝ 'දිව මම වෙමියි හෝ මාගේ දිවය' කියා හෝ කය මම වෙමියි හෝ මාගේ කයය' කියා හෝ 'සිත මම වෙමියි හෝ මාගේ සිතයයි' යන අදහසක් නැත්තේය.

6. "ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, ඒ මාගේ සිරුරෙහි අන් ප්‍රකාරයක් හෝ ඉන්ද්‍රියයන්ගේ විපරිනාමයක් හෝ කුමක් හෙයින් වන්නේද, එසේනම් ආයුෂ්මත් උපසේන ස්ථවිරයන්ගේ බොහෝ කලක් අහංකාරය, මමායනය, (මාගේයයි සිතීම) මානය, සහ ක්ලේශයෝ හොඳින් නසන ලද්දාහු නොවෙත්ද, එහෙයින් ආයුෂ්මත් උපසේන ස්ථවිරයන්ට 'ඇස මම වෙමියි හෝ මාගේ ඇසයයි' හෝ 'කණ මම වෙමියි හෝ මාගේ කණයයි' හෝ 'නාසය මම වෙමියි හෝ මාගේ නාසයයි' හෝ 'දිව මම වෙමියි හෝ මාගේ දිවයයි' හෝ 'කය මම වෙමියි හෝ මාගේ කයයයි' හෝ 'සිත මම වෙමියි හෝ මාගේ සිතයයි' හෝ මෙබඳු අදහසක් නොවේයයි" කීහ.

7. ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් උපසේන ස්ථවිරයන්ගේ සිරුර ඇඳකට නංවා පිටතට ගෙණ ගියාහුය. ඉක්බිති ආයුෂ්මත් උපසේන ස්ථවිරයන්ගේ සිරුර බොල් මිටක් මෙන් එහිම විසුරුනේය.

---

## 8. උපවාණ සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

"ස්වාමීනි, ධර්මය සන්දිට්ඨිකයයි (මේ ආත්මයේම ලැබිය යුතුඵල ඇත්තේ යයි) කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි ධර්මය සන්දිට්ඨිකවේද, අකාලිකවේද, (කල්නොයවා දෙන විපාක ඇත්තේද) එහිපස්සිකවේද, (එව බලව යන විධියට සුදුසුවේද) ඕපනයික (තමා කෙරෙහි පමුණුවා ගතයුතු වේද) නුවණැත්තන් විසින් වෙන වෙනම තම තමන් විසින් දතයුතුවේද?"

2. "උපවාණය, මෙහි මහණ තෙම ඇසින් රූපය දැක රූපය දැනගත්තේද, වෙයි, රූප රාගය දැනගත්තේද වෙයි. අධ්‍යාත්මය තුළ ඇත්තාවූ රාගය 'මාගේ අධ්‍යාත්මය තුළ රූපයන් කෙරෙහි ඇලෙන රාගය ඇත්තේයයි' දැනගනියි. උපවාණය, මහණ තෙම ඇසින් යම් ඒ රූපයක් දැක රූපය දැනගත්තේද, යම් රූප රාගයක් දැනගත්තේද, අධ්‍යාත්මය තුළ ඇත්තාවූ රූපයන්හි ඇලෙන යම් රාගයක් මාගේ අධ්‍යාත්මය තුළ රූපයන්හි ඇලෙන රාගය ඇත්තේයයි දැන ගණියිද, උපවාණය මෙසේද වනාහි ධර්මයතෙම සංදිට්ඨික වේ. අකාලික වේ. එහි පස්සික වේ. ඕපනයික වේ. නුවණැත්තන් විසින් වෙන වෙනම තම තමන් කෙරෙහි ලා දත යුතු වේ."

3. "උපවාණය, මෙහි මහණතෙම කණින් ශබ්දය දැන ශබ්දය දැනගත්තේද වෙයි. ශබ්දරාගය දැනගන්නේද වෙයි. අධ්‍යාත්මය තුළ ඇත්තාවූ රාගය 'මාගේ අධ්‍යාත්මය තුළ ශබ්දයන් කෙරෙහි ඇලෙන රාගය ඇත්තේයයි' දැනගණියි. උපවාණය, මහණ තෙම කණින් යම් ඒ ශබ්දයක් දැක ශබ්දය දැනගන්නේද, යම් ශබ්දරාගයක් දැනගන්නේද අධ්‍යාත්මය තුළ ඇත්තාවූ ශබ්දයන්හි ඇලෙන යම් රාගයක් 'මාගේ අධ්‍යාත්මය තුළ ශබ්දයන්හි ඇලෙන රාගය ඇත්තේයයි' දැනගණියිද, උපවාණය මෙසේද වනාහි ධර්මය තෙම සංදිට්ඨික වේ. අකාලික වේ. එහිපස්සික වේ. ඕපනයික වේ. නුවණැත්තන් විසින් වෙන වෙනම තම තමන් කෙරෙහි ලා දතයුතුවේ."

4. "උපවාණය, මෙහි මහණතෙම නාසයෙන් ගන්ධය දැක ගන්ධය දැනගත්තේද වෙයි. ගන්ධ රාගය දැනගත්තේද වෙයි. අධ්‍යාත්මය තුළ ඇත්තාවූ රාගය 'මාගේ අධ්‍යාත්මය තුළ ගන්ධයන් කෙරෙහි ඇලෙන රාගය ඇත්තේයයි' දැනගනියි. උපවාණය, මහණ තෙම නාසයෙන් යම් ඒ ගන්ධයක් දැක ගන්ධය දැනගත්තේද, යම් ගන්ධ රාගයක් දැනගත්තේද අධ්‍යාත්මය තුළ ඇත්තාවූ ගන්ධයන්හි ඇලෙන යම් රාගයක් 'මාගේ අධ්‍යාත්මය තුළ ගන්ධයන්හි ඇලෙන රාගය ඇත්තේයයි' දැනගණියිද, උපවාණය මෙසේද වනාහි ධර්මය තෙම, සංදිට්ඨික

වේ. අකාලික වේ. එහිපස්සික වේ. ඕපනයික වේ. නුවණැත්තන් විසින් වෙන වෙනම තම තමන් කෙරෙහි ලා දතයුතු වේ.”

5. “උපවාණය, නැවත අනිකක්ද කියමි. මහණ තෙම දිවෙන් රසය විඳ රසය දන්නේ වෙයි. රසරාගය දන්නේද වෙයි. තමාතුළ ඇත්තාවූ රසයන්හි ඇලෙන රාගයද ‘මාගේ අධ්‍යාත්මය තුළ රසයන් කෙරෙහි ඇලෙන රාගය ඇත්තේ යයි’ දැනගනියි. උපවාණය, මහණ තෙම දිවෙන් යම් ඒ රසයක් විඳ රස දන්නේද යම් ඒ රස රාගයක් දන්නේවේද, තමාතුළවූ රසයන්හි ඇලෙන රාගය ‘මාගේ අධ්‍යාත්මය තුළ රසයන් කෙරෙහි ඇලෙන රාගය ඇත්තේයයි’ දැනගණියි. උපවාණය, මෙසේද වනාහි ධර්මය තෙම සංදිට්ඨික වේ. අකාලික වේ. එහිපස්සික වේ. ඕපනයික වේ. නුවණැත්තන් විසින් වෙන වෙනම තමතමන් කෙරෙහි ලා දතයුතු වෙයි.

6. “උපවාණය, මෙහි මහණතෙම කයින් ස්පර්ශය දැක ස්පර්ශය දැනගත්තේද වෙයි. ස්පර්ශ රාගය දැනගන්නේද වෙයි. අධ්‍යාත්මය තුළ ඇත්තාවූ රාගය ‘මාගේ අධ්‍යාත්මය ස්පර්ශයන් කෙරෙහි ඇලෙන රාගය ඇත්තේයයි’ දැනගනියි. උපවාණය, මහණතෙම කයින් යම් ඒ ස්පර්ශයක් දැක ස්පර්ශය දැනගන්නේද, යම් ස්පර්ශ රාගයක් දැනගන්නේද අධ්‍යාත්මය තුළ ඇත්තාවූ ස්පර්ශයන්හි ඇලෙන යම් රාගයක් ‘මාගේ ආත්මය තුළ ස්පර්ශයන්හි ඇලෙන රාගය ඇත්තේයයි’ දැන ගණියිද උපවාණය, මෙසේද වනාහි ධර්මය තෙම සංදිට්ඨිකවේ. අකාලික වේ. එහිපස්සික වේ. ඕපනයික වේ. නුවණැත්තන් විසින් වෙන වෙනම තමතමන් කෙරෙහි ලා දතයුතු වෙයි.”

7. “උපවාණය නැවත අනිකක්ද කියමි. මහණතෙම සිතින් ධර්මය දැන ධර්මය දන්නේද වෙයි. ධර්මරාගය දන්නේද වෙයි. තමා තුළ ඇති ධර්මයන් කෙරෙහි ඇලෙන රාගය මාගේ අධ්‍යාත්මය තුළ ධර්මයන් කෙරෙහි ඇලෙන රාගය ඇත්තේයයි, දැනගණියි. උපවාණය මහණ තෙම සිතින් යම් මේ ධර්මයක් දැන ධර්මය දන්නේවේද, ධර්මරාගය දන්නේත් වේද, තමා තුළ ඇති ධර්මයන් කෙරෙහි ඇලෙන රාගය මාගේ අධ්‍යාත්මය

තුළ ධර්මයන් කෙරෙහි ඇලෙන රාගය ඇත්තේ යයි දැනගන්නේද වෙයි. උපවාණය, මෙසේද වනාහි ධර්මය සංදිට්ඨික වේ. අකාලික වේ. එහිපස්සික වේ. ඕපනයික වේ. නුවණැත්තන් විසින් වෙන වෙනම තමතමන් කෙරෙහි ලා දතයුතු වෙයි.”

8. “උපවාණය, මෙහි මහණ තෙම ඇසින් රූපය දැක රූපය දන්නේම වේ. රූප රාගය දන්නේ නොවේ. තමා තුළ නැත්තාවූ රූපයන් කෙරෙහි ඇලෙන රාගය මාගේ අධ්‍යාත්මය තුළ රූපයන් කෙරෙහි ඇලෙන රාගය නැත්තේ යයි, දැනගණියි. උපවාණය, මහණතෙම ඇසින් යම් ඒ රූපයක් දැක රූපය දන්නේම වේද, රූපරාගය දන්නේ නොවේද, අධ්‍යාත්මයෙහි නැත්තාවූ රූපයන් කෙරෙහි ඇලෙන රාගය මාගේ අධ්‍යාත්මයෙහි රූපයන් කෙරෙහි ඇලෙන රාගය නැත්තේයයි දැනගණියි. උපවාණය, මෙසේද වනාහි ධර්මය තෙම සංදිට්ඨික වේ. අකාලික වේ. එහිපස්සික වේ. ඕපනයික වේ. නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දත යුතු වේ.

9. “උපවාණය, මෙහි මහණතෙම කණින් ශබ්දය අසා ශබ්දය දන්නේම වේ. ශබ්දරාගය දන්නේ නොවේ. තමා තුළ නැත්තාවූ ශබ්දයන් කෙරෙහි ඇලෙන රාගය මාගේ අධ්‍යාත්මය තුළ ශබ්දයන් කෙරෙහි ඇලෙන රාගය නැත්තේ යයි, දැන ගණියි. උපවාණය, මහණ තෙම කණින් යම් ඒ ශබ්දයක් දැන ශබ්දය දන්නේම වේද, ශබ්ද රාගය දන්නේ නොවේද, අධ්‍යාත්මයෙහි නැත්තාවූ ශබ්දයන් කෙරෙහි ඇලෙන රාගය මාගේ අධ්‍යාත්මයෙහි ශබ්දයන් කෙරෙහි ඇලෙන රාගය නැත්තේයයි දැනගණියි. උපවාණය, මෙසේද වනාහි ධර්මය තෙම සංදිට්ඨික වේ. අකාලික වේ. ඕපනයිකවේ. එහිපස්සික වේ. නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දත යුතුවේ.

10. “උපවාණය, මෙහි මහණ තෙම නාසයෙන් ගන්ධය දැන ගන්ධය දන්නේමවේ. ගන්ධ රාගය දන්නේ නොවේ. තමා තුළ නැත්තාවූ ගන්ධයන් කෙරෙහි ඇලෙන රාගය මාගේ අධ්‍යාත්මය තුළ ගන්ධයන් කෙරෙහි ඇලෙන රාගය නැත්තේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

යයි, දැනගණියි. උපවාණය, මහණ තෙම නාසයෙන් යම් ඒ ගන්ධයක් දැන ගන්ධය දන්නේම වේද, ගන්ධ රාගය දන්නේ නොවේද, අධ්‍යාත්මයෙහි නැත්තාවූ ගන්ධයන් කෙරෙහි ඇලෙන රාගය මාගේ අධ්‍යාත්මයෙහි ගන්ධයන් කෙරෙහි ඇලෙන රාගය නැත්තේයයි දැනගණියි. උපවාණය, මෙසේද වනාහි ධර්මය තෙම සංදිට්ඨිකවේ. අකාලික වේ ඒහිපස්සික වේ. ඕපනයික වේ. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දතයුතු වේ.

11. "උපවාණය, නැවත අනිකක්ද කියමි. මහණ තෙම දිවෙන් රසය විඳ දන්නේ වේද, රස රාගය නොදන්නේ වේද, අධ්‍යාත්මය තුළ නැති රස රාගය මාතුළ රසයන් කෙරෙහි රාගය නැත්තේයයි දැනගණියි. උපවාණය, මෙසේද වනාහි ධර්මය තෙම සංදිට්ඨික වේ. අකාලික වේ. ඒහිපස්සික වේ. ඕපනයිකවේ. නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දතයුතු වෙයි."

12. "උපවාණය, මෙහි මහණතෙම කයින් ස්පර්ශය දැන ස්පර්ශය දන්නේම වේ. ස්පර්ශ රාගය දන්නේ නොවේ. තමා තුළ නැත්තාවූ ස්පර්ශයන් කෙරෙහි ඇලෙන රාගය මාගේ අධ්‍යාත්මය තුළ ස්පර්ශයන් කෙරෙහි ඇලෙන රාගය නැත්තේයයි දැනගණියි. උපවාණය, මහණ තෙම කයින් යම් ඒ ස්පර්ශයක් දැන ස්පර්ශය දන්නේම වේද, ස්පර්ශරාගය දන්නේ නොවේද, අධ්‍යාත්මයෙහි නැත්තාවූ ස්පර්ශයන් කෙරෙහි ඇලෙන රාගය මාගේ අධ්‍යාත්මයෙහි ස්පර්ශයන් කෙරෙහි ඇලෙන රාගය නැත්තේයයි දැනගණියි. උපවාණය, මෙසේද වනාහි ධර්මය තෙම සංදිට්ඨිකවේ. අකාලික වේ. ඒහිපස්සික වේ. ඕපනයික වේ. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දතයුතු වේ."

13. "උපවාණය, නැවත අනිකක්ද කියමි. මහණතෙම සිතින් ධර්මයන් දැන ධර්මය දන්නේවේ. ධර්මරාගය නොදන්නේ වෙයි. තමාතුළ නැති ධර්මයන් කෙරෙහි රාගය මාතුළ ධර්මයන් කෙරෙහි රාගය නැත්තේයයි දැනගණියි. උපවාණය, මහණ තෙම සිතින් යම් ඒ ධර්මයන් දැන ධර්මය දන්නේ වේද, ධර්මරාගය නොදන්නේ වේද, තමා තුළ නැති ධර්මයන් කෙරෙහි

රාගය මා තුළ ධර්මයන් කෙරෙහි රාගය නැත්තේ යයි දැනගණියි. උපවාණය, මෙසේද වනාහි ධර්මය සංදිට්ඨික වේ. අකාලික වේ. එහිපස්සික වේ. ඕපනයිකවේ. නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දතයුතු වේයයි වදාළේය.”

---

## 9. ඡඵස්සායතන සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම්ලත් වේළුවනයෙහි (උණවනයෙහි) වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන්හට කථාකළ සේක. පින්වතුන් වහන්සැයි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළ සේක.

2. “මහණෙනි, යම්කිසි මහණෙක් වනාහි සවැදෑරුම්වූ ස්පර්ශායතනයන්ගේ හටගැණීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් නොදනීද ඔහු විසින් බ්‍රහ්මචයර්‍ය්‍යාව නොවසන ලදී. හෙතෙම මේ ධර්ම විනයෙන් දුරවූවෙක්ම වන්නේය.

3. “මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. “ස්වාමීනි, මෙහි මම නැසුනෙමි. ස්වාමීනි, මම වනාහි සවැදෑරුම්වූ ස්පර්ශායතනයන්ගේ හට ගැණීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් නොදනිමියි” කීයේය.

4. “මහණ, ඒ කුමකැයි හඟින්නෙහිද? ඇස ‘මෙය මාගේය, මෙය, මම වෙමි, මෙය මාගේ ආත්මයයි’ දක්නෙහිද?”-“ස්වාමීනි, එය නොවේමැයි.”

“මහණ, මැනව. මහණ, මෙහිද තා විසින් ඇස ‘මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමියි, මෙය මාගේ ආත්මය නොවේයයි’ මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් මනාව දක්නා ලද්දේ වන්නේය. මෙයම දුක්ඛයාගේ කෙළවර වන්නේය.

**5.** "කණ 'මෙය මාගේය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි' දක්නෙහිද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"මහණ, මැනව. මහණ, මෙහිද තා විසින් කණ 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමියි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් මනාව දක්නා ලද්දේ වන්නේය. මෙයම දුක්ඛයාගේ කෙළවර වන්නේය.

**6.** "නාසය, 'මෙය මාගේය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි' දක්නෙහිද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"මහණ, මැනව. මහණ, මෙහිද තා විසින් නාසය 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමියි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් මනාව දක්නා ලද්දේ වන්නේය. මෙයම දුක්ඛයාගේ කෙළවර වන්නේය.

**7.** "දිව 'මෙය මාගේය, මෙය මම වෙමි; මෙය මාගේ ආත්මයයි' දක්නෙහිද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"මහණ, මැනව. මහණ මෙහිද තා විසින් දිව 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් මනාව දක්නා ලද්දේ වන්නේය. මෙයම දුක්ඛයාගේ කෙළවර වන්නේය.

**8.** "කය 'මෙය මාගේය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි' දක්නෙහිද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"මහණ, මැනව, මහණ, මෙහිද, තා විසින් කය 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමියි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් නොව දක්නා ලද්දේ වන්නේය. මෙයම දුක්ඛයාගේ කෙළවර වන්නේය.

**9.** "සිත 'මෙය මාගේය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි' දකින්නෙහිද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"මහණ, මැනවි. මහණ, මෙහිද තා විසින් සිත 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය

නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් මනාව දක්නා ලද්දේ වන්නේය. මෙයම දුක්ඛයාගේ කෙළවර වන්නේයයි" වදාළේය.

---

## 10. ඡඵස්සායතන සූත්‍රය (2)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ නවවෙනි සූත්‍රය මෙන් වේළුවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, යම්කිසි මහණෙක් තෙම සවැදෑරුම්වූ ස්පර්ශායතනයන්ගේ හටගැණීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද, තත්වූ පරිද්දෙන් නොදනීද, ඔහු විසින් බ්‍රහ්මචර්‍ය්‍යාව නොවසන ලදී. හෙතෙම මේ ධර්ම විනයෙන් ඈත්වූවෙක් වන්නේය."

3. "මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. "ස්වාමීනි, මෙහි මම නැසුනෙමි. ස්වාමීනි, මම වනාහි සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ හටගැණීමද, විනාශයද, නිස්සරණයද, තත්වූ පරිද්දෙන් නොදනිමියි කීය.

4. "මහණ, ඒ කුමකැයි හඟින්නෙහිද? ඇස 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙහිද?"-"එසේය, ස්වාමීනි"

'මහණ, මැනව, මහණ, මෙහිද, තා විසින් ඇස මෙය මාගේ නොවෙයි, 'මෙය මම නොවෙමි, මාගේ ආත්මය නොවේ යයි' මෙසේ තත්වූ පරිද්දෙන් මනා නුවණින් දක්නා ලද්දේ වන්නේය. මෙසේ තා විසින් මේ පළමුවන ස්පර්ශායතනය මත්තෙහි නැවත නොවීම පිණිස පහකරන ලද්දේ වන්නේය.

5. "කණ 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙහිද?"-"එසේය ස්වාමීනි"

"මහණ, මැනව, මහණ, මෙහිද තා විසින් කණ මෙය මාගේ නොවෙයි, 'මෙය මම නොවෙමි මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දක්නා ලද්දේ වන්නේය. මෙසේ තා විසින් මේ දෙවන ස්පර්ශායතනය මත්තෙහි නැවත නොවීම පිණිස පහකරන ලද්දේ වන්නේය.

6. "නාසය 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙහිද?"-"එසේය ස්වාමීනි"

"මහණ, මැනව, මහණ, මෙහිද තා විසින් නාසය මෙය මාගේ නොවෙයි, 'මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දක්නා ලද්දේ වන්නේය. මෙසේ තා විසින් මේ තුන්වන ස්පර්ශායතනය මත්තෙහි නැවත නොවීම පිණිස පහකරන ලද්දේ වන්නේමය.

7. "දිව 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙහිද?'-"එසේය ස්වාමීනි"

'මහණ, මැනව, මහණ, මෙහිද තා විසින් 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දක්නා ලද්දේ වන්නේය. මෙසේ තා විසින් මේ සතරවන ස්පර්ශායතනය මත්තෙහි නැවත නොවීම පිණිස පහකරන ලද්දේ වන්නේය.

8. "කය 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි දක්නෙහිද?"-"එසේය ස්වාමීනි"

"මහණ, මැනව, මහණ, මෙහිද තා විසින් 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දක්නා ලද්දේ වන්නේය. මෙසේ තා විසින් මේ පස්වන ස්පර්ශායතනය මත්තෙහි නැවත නොවීම පිණිස පහකරන ලද්දේ වන්නේය.

9. "සිත 'මෙය මාගේ නොවෙයි' මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙහිද?"-"එසේය ස්වාමීනි"

"මහණ, මැනව, මහණ, මෙහිද තා විසින් සිත 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දක්නා ලද්දේ වන්නේය. මෙසේ තා විසින් මේ සවන ස්පර්ශායතනය මත්තෙහි නැවත නොවීම පිණිස පහකරන ලද්දේ වන්නේයයි" (වදාළේය.)

---

## 11. ඡඵස්සායතන සූත්‍රය (3)

(මේ වර්ගයේ 9 වෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, යම්කිසි මහණෙක් වනාහි සවැදෑරුම්වූ ස්පර්ශායතනයන්ගේ හටගැනීමද, නැතිවීමද, ආශ්වාදයද, ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් නොදනීද, ඔහු විසින් බ්‍රහ්මචය්‍යීාව නොවසන ලදී. හෙතෙම මේ ධර්මවිනයෙන් ඈත්වූවෙක්ම වන්නේය."

3. මෙසේ වදාළ කල්හි, එක්තරා භික්ෂුවක් තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය. "ස්වාමීනි, 'මම මෙහි නැසුනෙමි. 'ස්වාමීනි, මම වනාහි සවැදෑරුම්වූ ස්පර්ශායතනයන්ගේ හටගැණීමද, නැතිවීමද, ආශ්වාදයද, ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් නොදනිමියි' කීයේය.

4. "මහණ, ඒ කුමකැයි හඟින්නෙහිද? ඇස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

5. "කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

6. "නාසය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

7. "දිව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

8. කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, ඒ දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද, එය, මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

9. "සිත නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?'-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

10. "මහණෙ, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම ඇස කෙරෙහිද කලකිරෙයි. කණ කෙරෙහිද කලකිරෙයි. නාසය කෙරෙහිද කලකිරෙයි. දිව කෙරෙහිද කලකිරෙයි. කය කෙරෙහිද කලකිරෙයි. සිත කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීමවේ. "ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වැස නිමවන ලද්දේය. සතර මාර්ගයෙන් කළයුතු දෙය කරණලදී මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගණීයයි" (වදාළසේක.)

(දෙවෙනි මිගජාල වර්ගය නිමි.)

---

# 3. ගිලාන වර්ගය

## 1. ගිලාන සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

ඉක්බිති එක්තරා භික්ෂුවක් තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්

වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එකත් පසෙක හුන්නාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය. "ස්වාමීනි, අසවල් විහාරයෙහි අලුත පැවිදිවූ අප්‍රසිද්ධ භික්ෂුවක් තෙම හටගත් ආබාධ ඇත්තේ දුකින් පෙළුනේ දැඩිගිලන්වූයේ වේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුතෙම යම් තැනෙක්හිද, අනුකම්පා පිණිස එතැනට වඩිනසේක් නම් මැනවැ"යි කියායි.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අලුත පැවිදි වූවෙකැයිද ගිලනෙකැයිද අසා අප්‍රසිද්ධ භික්ෂුවකැයි මෙසේ දැන ඒ භික්ෂුතෙම යම් තැනෙක්හිද, එතැනට වැඩිසේක. ඒ භික්ෂුතෙම දුරදීම වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දැක ඇඳෙන් නැඟිටින ආකාරයක් දැක්වීය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුවට "මහණ, කම් නැත. නුඹ ඇඳෙන් නොනැඟිටුව. පනවන ලද මේ ආසන ඇත්තාහ එහි මම ඉඳගන්නෙමියි" වදාළේය.

3. භාග්‍යවතුන් වහන්සේ පනවන ලද ආසනයෙහි වැඩහුන්හ. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ඒ භික්ෂුවට මෙය වදාළේය. "මහණ, කිමෙක්ද, තොපට ඉවසිය හැක්කේද? කිම යැපිය හැක්කේද, කිමෙක්ද දුක්වූ වේදනාවෝ අඩු වෙත්ද? වැඩිනොවෙත්ද? අඩුවන බවක් පෙනේද? වැඩිවන බවක් නොපෙනේද" කියායි.

4 "ස්වාමීනි, මට ඉවසිය නොහැක. යැපිය නොහැක. මාගේ දැඩිවූ දුක් වේදනාවෝ වැඩිවෙත් අඩු නොවෙත්. වැඩි වන බව පෙනෙයි, අඩුවන බවක් නොපෙනේයයි" කීය.

"මහණ, කිමෙක්ද, තොපට කිසියම් කුකුසක් නැත්තේද, පසුතැවීමක් නැත්තේද?"-"ස්වාමීනි, මට ඒකාන්තයෙන් ස්වල්ප නොවූ කුකුසක් ඇත්තේය. ස්වල්ප නොවූ පසුතැවීමක් ඇත්තේයයි" කීය.

"මහණ, කිමෙක්ද, නුඹ තමාම ශීලයෙන් චොදනා කරන්නේද?"-"ස්වාමීනි, මට තමාම ශීලයෙන් චොදනා නොකරන්නේය."

**5.** "මහණ, ඉදින් වනාහි නුඹ තමාම ශීලයෙන් චොදනා නොකෙරේ නම් එකල්හි කවර කරුණෙකින් නුඹට කුකුසක් වේද, පසුතැවීමක් වේද?"

"ස්වාමීනි, මම ශීලයෙන් පිරිසිදු වීම පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය දෙශනා නොකරණ ලද බව දනිමියි" කීය.

"මහණ ඉදින් වනාහි නුඹ ශීලයෙන් පිරිසිදුවීම පිණිස මා විසින් ධර්මය දෙශනා නොකරණ ලද බව නොදන්නෙහි නම්, මහණ, එසේ ඇතිකල්හි කුමක් සඳහා මා විසින් ධර්මය දෙශනා කරණ ලදැයි දන්නෙහිද?"

"ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් රාගය දුරු කිරීම පිණිස ධර්මය දෙශනා කරණ ලදැයි දනිමියි" කීය.

"යහපත යහපත, මහණ, මහණ, නුඹ වනාහි මා විසින් රාගය දුරුකිරීම පිණිස ධර්මය දෙශනා කරණ ලදැයි දන්නෙහි එය යහපත. මහණ මා විසින් රාගය දුරුකිරීම පිණිසම ධර්මය දෙශනා කරණ ලදී."

**6.** "මහණ, ඒ කුමකැයි හඟින්නෙහිද? ඇස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද එය 'මෙය මාගේය. මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි දකින්ට සුදුසුද?'-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

**7.** "කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද එය 'මෙය මාගේය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

8. "නාසය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද එය 'මෙය මාගේය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

9. "දිව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද එය 'මෙය මාගේය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

10. "කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය"

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද එය 'මෙය මාගේය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-'ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

11. "සිත නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරළෙන ස්වභාවද එය 'මෙය මාගේය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

12. "මහණ, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආයර්‍ය්‍යශ්‍රාවකතෙම ඇස කෙරෙහිද කලකිරෙයි. කණ කෙරෙහිද කලකිරෙයි. නාසය කෙරෙහිද කලකිරෙයි. දිව කෙරෙහිද කලකිරෙයි. කය කෙරෙහිද කලකිරෙයි. සිත කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇල්මෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුණේය යන දැනීමවේ. ජාතිය ක්ෂයවිය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය. සතර මාර්ගයෙන් කළයුත්ත කරනලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනී." භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළේය.

13. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්තේය. මේ දේශනාව කරනු ලබන කල්හි ඒ භික්ෂුවහට කෙලෙස් රජස් රහිතවූ පහවූ කෙලෙස්මල ඇති යම් කිසිවක් ඉපදීම ස්වභාව කොට ඇත්තේද ඒ සියල්ල නිරුද්ධවීම ස්වභාව කොට ඇත්තේය යන දහම් ඇස පහළවිය.

---

## 2. ගිලාන සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. ඉක්බිති එක්තරා භික්ෂුවක් තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එකත් පසෙක උන්නාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය. 'ස්වාමීනි, අසවල් විහාරයෙහි අලුත පැවිදිවූ අප්‍රසිද්ධවූ එක්තරා භික්ෂුවක් තෙම හටගත් ආබාධ ඇත්තේ දුකින් පෙළුනේ දැඩි ගිලන් වූයේ වෙයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුතෙම යම් තැනෙක්හිද, අනුකම්පා පිණිස එතැන්හි වඩින සේක්නම් යහපතියි" කියායි.

2. "එකල්හි භාග්‍යවතුන් වහන්සේ අලුත පැවිදි වූවෙකැයිද ගිලනෙකැයිද අසා අප්‍රසිද්ධවූ භික්ෂුවකැයි මෙසේ දැන ඒ

භික්ෂුතෙම යම් තැනෙක්හිද එතැන්හි වැඩිසේක. ඒ භික්ෂුතෙම දුරදීම වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුටුවේමය. දැක ඇඳෙන් නැගිටින ආකාරයක් දැක්වීය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුවට "මහණ, කම් නැත. නුඹ ඇඳෙන් නොනැගිටුව. පණවනලද මේ ආසන ඇත්තාහ. එහි මම හිඳගන්නෙමි"යි වදාළේය. භාග්‍යවතුන් වහන්සේ පණවනලද අස්නෙහි හිඳගත් සේක.

3. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ඒ භික්ෂුවට මෙය වදාළේය. "මහණ, කිමෙක්ද, තොපට ඉවසිය හැකිද? කිම යැපිය හැකිද? කිමෙක්ද, තොපගේ දුක්වූ වේදනාවෝ අඩු වෙත්ද, වැඩි නොවෙත්ද, අඩුවන බවක් පෙනේද, වැඩිවන බවක් නොපෙනේදැ"යි ඇසූහ.

4. "ස්වාමීනි, මට ඉවසිය හැකි නොවේ. යැපිය හැකි නොවේ. මාගේ දැඩිවූ දුක් වේදනාවෝ වැඩිවෙති. අඩු නොවෙත්. වැඩිවන බවම පෙනේ. අඩුවන බවක් නොපෙනේයයි" කීය.

"මහණ, කිමෙක්ද? තොපට කිසි කුකුසක් නැත්තේද, පසුතැවීමක් නැත්තේද, පසුතැවීමක් නැත්තේද?"

"ස්වාමීනි, මට ඒකාන්තයෙන් ස්වල්ප නොවූ කුකුසක් ඇත්තේය. පසුතැවීමක් ඇත්තේය"යි කීය.

"මහණ, කිමෙක්ද? නුඹ තමාම ශීලයෙන් චෝදනා කෙරේද?"-"ස්වාමීනි, මට තමාම ශීලයෙන් චොදනා නො කෙරේයයි" කීය.

"මහණ, ඉදින් වනාහි නුඹ තමාම ශීලයෙන් චොදනා නොකෙරේනම් එසේ ඇතිකල්හි, තොපට කිනම් කරුණකින් කුකුසක් වේද, පසු තැවීමක් වේද?"-"ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් ශීලවිසුද්ධිය පිණිස ධර්මය දෙශනා නොකරණ ලද බව දනිමි."

"මහණ, ඉදින් වනාහි නුඹ මා විසින් ශීල විසුද්ධිය පිණිස ධර්මය දෙශනා නොකරණ ලද බව දන්නෙහි නම්, මහණ එකල්හි කුමක් සඳහා නුඹ මා විසින් ධර්මය දෙශනා කරණ

ලදැයි දන්නෙහිද?"-"ස්වාමීනි, මම උපාදාන රහිතව පිරිනිවීම පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය දෙශනා කරණ ලදැයි දනිමි"යි කීය.

"යහපත, යහපත, මහණ, මහණ නුඹ උපාදාන රහිතව පිරිනිවීම පිණිස මා විසින් ධර්මය දෙශනා කරන ලදැයි දන්නෙහි, එය මැනව. මහණ, මා විසින් උපාදාන රහිතව, පිරිනිවීම පිණිස ධර්මය දෙශනා කරන ලදී.

"මහණෙනි, නුඹ ඒ කුමකැයි හඟින්නෙහිද? ඇස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාවද, 'එය මෙය මාගේය. මෙය මම වෙමියි මෙය මාගේ ආත්මයයි, දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛුවිඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛුසම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද? එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

3. "මහණෙනි, කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ශබ්දයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සෝත විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සෝතසම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සොතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

4. "මහණෙනි, නාසය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

'යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි, දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ගන්ධයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

"ඝාණ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ඝාණ සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේ."

"ඝාණසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

5. "මහණෙනි, දිව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"රසයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ජිව්හා විඥ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ජිව්හා සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

"ජිව්හා සම්ඵස්සය හේතුකොටගෙණ සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

**6.** "මහණෙනි, කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද"- "ස්වාමීනි, දුක්ය."

'යමක් වනාහි අනිත්‍යද, දුක්ද පෙරළෙන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය. මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?" - "ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ස්පර්ශය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි' මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"කාය විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"කාය සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේ මැයි."

"කායසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ හෝ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

7. "මහණෙනි, සිත නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"ධර්මයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ.'

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"මනෝ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- 'ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

'මනෝ සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

මනෝසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- 'ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

8. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම ඇස කෙරෙහිද කලකිරෙයි, රූපය කෙරෙහිද කලකිරෙයි. චක්ඛුවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. චක්ඛුසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ වේදනාවකුත් උපදීද, එය කෙරෙහිද කලකිරෙයි.

9. "කණ කෙරෙහිද කලකිරෙයි. ශබ්දය කෙරෙහිද කලකිරෙයි. සෝත විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, සෝත සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. සෝතසම්ඵස්සය නිසා සැපවූ

හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

10. "නාසය කෙරෙහිද කලකිරෙයි, ගන්ධය කෙරෙහිද කලකිරෙයි, ඝාණ විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, ඝාණ සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එය කෙරෙහිද කලකිරෙයි.

11. "දිව කෙරෙහිද කලකිරෙයි, රසය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

12. "කය කෙරෙහිද කලකිරෙයි, ස්පර්ශය කෙරෙහිද කලකිරෙයි, කාය විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, කාය සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

13. "සිත කෙරෙහිද කලකිරෙයි, ධර්මයන් කෙරෙහිද කලකිරෙයි, මනොවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, මනො සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, මනොසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එය වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුනේය යන දැනීමවේ. 'ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වැස නිමවන ලදී. සතර මගින් කළයුත්ත කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගණියි." භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේය. මේ දේශනාව කරනු ලබන කල්හි ඒ භික්ෂුහුගේ සිත උපාදාන රහිතව ආශ්‍රවයන්ගෙන් මිදුනේයයි වදාළේය."

---

## 3. රාධ සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී ආයුෂ්මත් රාධ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ, ආයුෂ්මත් රාධ ස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේට මෙය සැළකෙළේය.

2. "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා හුදකලාව සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව ආත්මපරිත්‍යාගයෙන් වාසය කරන්නෙම්ද, භාග්‍යවතුන් වහන්සේ මට එබඳු ධර්මයක් සැකෙවින් දේශනා කරණසේක් නම් මැනවැයි" කීය.

3 "රාධය, යමක් වනාහි අනිත්‍යද එහි තොප විසින් ආලය දුරුකට යුතුයි. රාධය, කුමක් අනිත්‍යද? රාධය, ඇස වනාහි අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. රූපයෝ අනිත්‍යයහ. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. චක්ඛු විඤ්ඤාණය අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. චක්ඛු සම්ඵස්සය අනිත්‍යවේ. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. චක්ඛු සම්ඵස්සය නිසා යම් සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද. එයද අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි.

4. "කණ වනාහි අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. ශබ්දයෝ අනිත්‍යයහ. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. සෝත විඤ්ඤාණය අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. සෝත සම්ඵස්සය අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. සෝත සම්ඵස්සය නිසා යම් සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5 "නාසය වනාහි අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරු කටයුතුයි. ගන්ධයෝ අනිත්‍යයහ. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. ඝාණ විඤ්ඤාණය අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකට යුතුයි. ඝාණ සම්ඵස්සය අනිත්‍යවේ. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. ඝාණ සම්ඵස්සය නිසා යම් සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි.

6. "දිව අනිත්‍යය එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. රසයෝ අනිත්‍යයහ. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. ජිව්හා විඤ්ඤාණය අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. ජිව්හා සම්ඵස්සය අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි, ජිව්හා සම්ඵස්සය නිසා යම් සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි.

7. "කය අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරු කටයුතුයි. ස්පර්ශයෝ අනිත්‍යයහ. එහි තොප විසින් ආලයදුරුකටයුතුයි. කාය විඤ්ඤාණය අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි කාය සම්ඵස්සය අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. කායසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි.

8. "සිත අනිත්‍ය වේ. එහි තොප විසින් ආලය දුරු කටයුතුයි ධර්මයෝ අනිත්‍යයහ. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. මනෝ විඤ්ඤාණය අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. මනෝ සම්ඵස්සය අනිත්‍යය. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද එයද අනිත්‍යවේ. එහි තොප විසින් ආලය දුරුකටයුතුයි. රාධය, යමක් වනාහි අනිත්‍යද එහි තොප විසින් ආලය දුරුකටයුත්තේයයි" වදාළේය.

---

## 4. රාධ සූත්‍රය. (2)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද මේ වර්ගයේ තුන්වෙනිවූ රාධ සූත්‍රයේ මෙනි. ඒ සූත්‍රයේම ඡේද 3, 8 දක්වා 'අනිත්‍ය' වෙනුවට 'දුක' යන වචනය යොදාගත යුතුයි)

---

## 5. රාධ සූත්‍රය. (3)

(මේ සූත්‍රයේ 1, 2 වෙනි ඡේද මේ වර්ගයේ තුන්වෙනිවූ රාධ සූත්‍රයේ මෙනි ඒ සූත්‍රයේම ඡේද 3, 8 දක්වා 'අනිත්‍ය' වෙනුවට 'අනාත්ම' යන වචනය යොදාගත යුතුයි.)

---

## 6. අවිජ්ජා සූත්‍ර. (1)

(මේ සූත්‍රයද 1905 වෙනි පිටේ අවිජ්ජා සූත්‍රය මෙන් වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

2 "ස්වාමීනි, යමක්හු දුරුකිරීමෙන් භික්ෂුවහට අවිද්‍යාව ප්‍රහීණ වේද, විද්‍යාව උපදීද, එබඳු එක් ධර්මයක් ඇත්තේදැයි" ඇසීය.

"මහණ, යමක්හු දුරුකිරීමෙන් භික්ෂුවහට අවිද්‍යාව දුරුවේද, විද්‍යාව උපදීද, එබඳුවූ එක ධර්මයෙක් ඇත්තේයයි" වදාළේය.

'ස්වාමීනි, යමක්හු දුරු කිරීමෙන් භික්ෂුවහට අවිද්‍යාව දුරුවේද, විද්‍යාව උපදීද, ඒ කවර නම් එක ධර්මයක්දැයි" ඇසීය.

"මහණ, යමක් දුරු කිරීමෙන් භික්ෂුවහට අවිද්‍යාව ප්‍රහීණ වේද, විද්‍යාව උපදීද, අවිද්‍යාව වනාහි ඒ එක ධර්මයවේයයි" වදාළේය.

"ස්වාමීනි කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව ප්‍රහීණ වේද, විද්‍යාව උපදීද?"

3. "මහණ, ඇස වනාහි අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. රූපයන් අනිත්‍ය

වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. චක්ඛුවිඥානය අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. චක්ඛු සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. මහණ, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදීයයි වදාළේය.

4. "මහණ, කණ වනාහි අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. ශබ්දයන් අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. සෝතවිඥානය අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. සෝත සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. මහණ, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදීයයි වදාළේය.

5. "මහණ, නාසය වනාහි අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. ගන්ධයන් අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. ඝාණවිඥානය අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. ඝාණ සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ විද්‍යාව උපදියි. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. මහණ, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදීයයි වදාළේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**6.** "මහණෙි, දිව වනාහි අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. රසයන් අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. ජිව්හා විඥ්ඥාණය අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. ජිව්හා සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ විද්‍යාව උපදියි. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. මහණෙි, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදීයයි වදාළේය.

**7.** "මහණෙි, කය වනාහි අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. ස්පර්ශයන් අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. කාය විඥානය අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. කාය සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. මහණෙි, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදීයයි වදාළේය.

**8.** "මහණෙි, සිත වනාහි අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවෙයි. විද්‍යාව උපදියි. ධර්මයන් අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. මනෝ විඥ්ඥාණය අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. මනෝ සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවෙයි. විද්‍යාව උපදියි. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නාවූ දක්නාවූ භික්ෂුවහට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදියි. මහණ, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේ. විද්‍යාව උපදීයයි" වදාළේය.

---

## 7. අවිජ්ජා සූත්‍රය. (2)

1. (මේ සූත්‍රයද 1905 වෙනි පිටේ අවිජ්ජා සූත්‍රය මෙන් වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "ස්වාමීනි, යමක්හු දුරුකිරීමෙන් භික්ෂුවහට අවිද්‍යාව දුරුවේද, විද්‍යාව උපදීද, එබඳු එක් ධර්මයක් ඇත්තේද?"

"මහණ, යමක්හු දුරුකිරීමෙන් භික්ෂුවහට අවිද්‍යාව දුරුවේද, විද්‍යාව උපදීද, එබඳු එක් ධර්මයක් ඇත්තේයයි" වදාළේය.

"ස්වාමීනි, 'යමක්හු දුරුකිරීමෙන් භික්ෂුවහට අවිද්‍යාව දුරුවේද, විද්‍යාව උපදීද' ඒ කවරනම් එක් ධර්මයක්ද?"

"මහණ, 'යමක්හු දුරු කිරීමෙන් භික්ෂුවහට අවිද්‍යාව දුරුවේද, විද්‍යාව උපදීද, අවිද්‍යාව වනාහි ඒ එක ධර්මය වේ."

"ස්වාමීනි, කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ භික්ෂුවහට අවිද්‍යාව දුරුවේද, විද්‍යාව උපදීද?"

3 "මහණ, මෙහි භික්ෂූහු විසින් සියලු ධර්මයෝ තමායයි ඇතුළත්කොට ගැණීමට නුසුදුසුයයි, අසන ලද්දේ වෙයි. මහණ, ඉදින් මෙසේ සියලු ධර්මයෝ තමායයි ඇතුළත්කොට ගැණීමට නුසුදුසුයයි භික්ෂූහු විසින් එය අසන ලද්දේද, හෙතෙම සියලු ධර්මය දනියි, සියලු ධර්මය දැන, සියලු ධර්මය පිරිසිඳ දනියි. සියලු ධර්මය පිරිසිඳ දැන සියලු නිමිති අන්දෙයක් වශයෙන් දකියි. ඇස අන් දෙයක් වශයෙන් දකියිද, රූපයන් අන් දෙයක් වශයෙන් දකීද, චක්ඛු විඤ්ඤාණය අන් දෙයක් වශයෙන් දකීද, චක්ඛු සම්ඵස්සය අන් දෙයක් වශයෙන් දකීද, චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අන් දෙයක් වශයෙන් දකීද,

4. "කණ අන් දෙයක් වශයෙන් දකීද, ශබ්දයන් අන්දෙයක් වශයෙන් දකීද, සෝත විඤ්ඤාණය අන් දෙයක් වශයෙන් දකීද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සෝත සම්ඵස්සය අන් දෙයක් වශයෙන් දකීද, සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අන් දෙයක් වශයෙන් දකීද,

5. "නාසය අන් දෙයක් වශයෙන් දකීද, ගන්ධය අන්දෙයක් වශයෙන් දකීද, ඝාණ විඤ්ඤාණය අන් දෙයක් වශයෙන් දකීද, ඝාණ සම්ඵස්සය අන් දෙයක් වශයෙන් දකීද, ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අන් දෙයක් වශයෙන් දකීද,

6. "දිව අන් දෙයක් වශයෙන් දකීද, රසය අන් දෙයක් වශයෙන් දකීද, ජිව්හා විඤ්ඤාණය අන් දෙයක් වශයෙන් දකීද, ජිව්හා සම්ඵස්සය අන් දෙයක් වශයෙන් දකීද, ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අන් දෙයක් වශයෙන් දකීද,

7. "කය අන් දෙයක් වශයෙන් දකීද, ස්පර්ශයත් අන්දෙයක් වශයෙන් දකීද, කාය විඤ්ඤාණය අන් දෙයක් වශයෙන් දකීද, කාය සම්ඵස්සය අන් දෙයක් වශයෙන් දකීද කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අන් දෙයක් වශයෙන් දකීද,

8. "සිත අන්දෙයක් වශයෙන් දකීද ධර්මය අන් දෙයක් වශයෙන් දකීද, මනෝවිඤ්ඤාණය අන් දෙයක් වශයෙන් දකීද, මනෝසම්ඵස්සය අන් දෙයක් වශයෙන් දකීද, මනෝසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අන් දෙයක් වශයෙන් දකීද, මහණ, මෙසේ වනාහි දන්නාවූ මෙසේ දක්නාවූ භික්ෂුවට අවිද්‍යාව ප්‍රහීණ වේ. විද්‍යාව උපදීයයි වදාළේය.

---

## 8. භික්ඛු සූත්‍රය.

(මේ සූත්‍රයද 1905 වෙනි පිටේ අවිජ්ජා සූත්‍රය මෙන් වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2 'ස්වාමීනි, මෙහි අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ අපගෙන් මෙසේ අසන්නාහුය. 'ඇවැත්නි, කිනම් අර්ථයක් පිණිස ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මහණකම් කරන්නේද' කියායි. ස්වාමීනි මෙසේ අසන ලද්දාවූ ඒ අපි අන්‍ය තීර්ථක පරිව්‍රාජකයන්ට මෙසේ ප්‍රකාශ කරමු. 'ඇවැත්නි, දුක පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය යනුයි.

3. "ස්වාමීනි, කිමෙක්ද, මෙසේ අසන ලද්දාවූ අපි මෙසේ ප්‍රකාශ කරන්නමෝ භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දක් කියන්නෝ වෙමුද, භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් චොදනා නොකරන්නමෝ නොවෙමුද, ධර්මයට එකඟව ප්‍රකාශ කරමුද, කිසියම් කරුණු සහිතවූ කීමක් ගැරහිය යුතු කරුණකට නොපැමිණේදැයි" ඇසූහ.

4. "මහණනි, තෙපි මෙසේ අසන ලද්දාහු මෙසේ ප්‍රකාශ කරන්නාහු නම් මා විසින් කියන ලද්දක් කියන්නාහුද වෙත්. මට අභූතයෙන් චෝදනා කරන්නාහුද නොවෙත්. ධර්මයට එකඟව ප්‍රකාශ කරන්නාහුද වෙත්. කිසියම් කරුණු සහිතවූ කීමක් ගැරහිය යුතු තැනට පැමිණෙන්නේද නොවේ. මහණෙනි මා කෙරෙහි දුක පිරිසිඳ දැනීම පිණිසම මහණකම් කරන්නේය.

"මහණෙනි, ඉදින් තොපගෙන් අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ 'ඇවැත්නි, යමක් පිරිසිඳ දැන ගැනීම පිණිස ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මහණකම් කරන්නේද, ඒ දුක කවරේදැයි' අසන්නාහුනම් මහණෙනි, මෙසේ අසන ලද්දාවූ තෙපි ඒ අන්‍ය තීර්ථක පරිව්‍රාජකයන්ට මෙසේ ප්‍රකාශ කරව්.

5 "ඇවැත්නි, ඇස වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය රූපය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. චක්ඛු විඤ්ඤාණය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. චක්ඛු සම්ඵස්සය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ

දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය.

**6.** 'කණ වනාහි දුකය එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. ශබ්දය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. සෝත විඤ්ඤාණය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. සෝත සම්ඵස්සය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද දුකය එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය.

7. "නාසය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. ගන්ධය වනාහි දුකය එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය ඝාණවිඤ්ඤාණය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. ඝාණසම්ඵස්සය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. ඝාණසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය.

8. "දිව වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. රසය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. ජිව්හා විඤ්ඤාණය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. ජිව්හා සම්ඵස්සය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම

පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය.

**9.** "කය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. ස්පර්ශය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. කාය විඤ්ඤාණය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. කාය සම්ඵස්සය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණකම් කරන්නේය.

**10.** "සිත දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරන්නේය. ධර්මයෝ දුකය. ඔවුන් පිරිසිඳ දැනීම පිණිස මහණ දම් පුරන්නේය. මනෝ විඤ්ඤාණය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණ දම් පුරන්නේය. මනෝසම්ඵස්සය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණ දම් පුරන්නේය. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණදම් පුරන්නේය.

ඇවැත්නි, දුක නම් මේය ඒ දුක පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහණ දම් පුරන්නේය.

'මහණෙනි, මෙසේ අසන ලද්දාවූ තෙපි ඒ අන්‍යතීර්ථක පරිව්‍රාජකයන්ට මෙසේ ප්‍රකාශ කරව්යයි" වදාළේය.

## 9. ලෝක සූත්‍රය

1. (මේ සූත්‍රයද 1905 වෙනි පිටේ අවිජ්ජා සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනාකරනලදී.)

2. "ස්වාමීනි, 'ලෝකය, ලෝකයයි කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි ලෝකයයි කියනු ලැබේද?" යනුවෙනි.

3. "මහණ, නැසෙන හෙයින් ලෝකයයි කියනු ලැබේ. කුමක් නැසේදයත්, මහණ, ඇස වනාහි නැසේ. රූපයෝ නැසෙත්. චක්ඛු විඥ්ඥාණය නැසෙයි. චක්ඛු සම්ඵස්සය නැසෙයි. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් ඒ වේදනාවකුත් උපදීද, එයද නැසෙයි.

4. "කණ නැසෙයි. ශබ්දයෝ නැසෙයි. සෝත විඥ්ඥාණය නැසෙයි. සොත සම්ඵස්සය නැසෙයි. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් ඒ වේදනාවකුත් උපදීද, එයද නැසෙයි.

5. "නාසය නැසෙයි. ගන්ධය නැසෙයි. ඝාණ විඥ්ඥාණය නැසෙයි. ඝාණ සම්ඵස්සය නැසෙයි. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් ඒ වේදනාවකුත් උපදීද, එයද නැසෙයි.

6. "දිව නැසෙයි, රසය නැසෙයි, ජිව්හා විඥ්ඥාණය නැසෙයි, ජිව්හා සම්ඵස්සය නැසෙයි. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් ඒ වේදනාවකුත් උපදීද, එයද නැසෙයි.

7. 'කය නැසෙයි, ස්පර්ශය නැසෙයි, කාය විඥ්ඥාණය නැසෙයි, කාය සම්ඵස්සය නැසෙයි. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් ඒ වේදනාවකුත් උපදීද, එයද නැසෙයි.

8. "සිත නැසෙයි, ධර්මයෝ නැසෙයි, මනෝ විඥ්ඥාණය නැසෙයි, මනෝ සම්ඵස්සය නැසෙයි, මනෝ සම්ඵස්සය නිසා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් ඒ වේදනාවකුත් උපදීද, එයද නැසෙයි. මහණ, නැසෙන හෙයින් වනාහි ලෝකයයි කියනු ලැබේයයි" වදාළේය.

---

## 10. එග්ගුණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. ඉක්බිති ආයුෂ්මත් එග්ගුන ස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ආයුෂ්මත් එග්ගුන ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

2. "ස්වාමීනි, යම් ඇසක් කරණකොට ගෙන සිඳින ලද තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති සිඳින ලද තෘෂ්ණා මාර්ග ඇති කෙළවර කරණලද සංසාර හිත ඇති සියලු දුක් ඉක්මවූ පිරිනිවියාවූ අතීත බුදුවරයන් වහන්සේලා ප්‍රකාශ කරනු ලබන්නේ ප්‍රකාශ කරන්නේද එබඳු ඇසක් ඇත්තේද?

"ස්වාමීනි, යම් කණක් කරණකොට ගෙන සිඳින ලද තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති සිඳින ලද තෘෂ්ණා මාර්ග ඇති කෙළවර කරණ ලද සංසාර වෘත ඇති සියලු දුක් ඉක්මවූ පිරිනිවියාවූ අතීත බුදුවරයන් වහන්සේලා ප්‍රකාශ කරනු ලබන්නේ ප්‍රකාශ කරන්නේද එබඳු කණක් ඇත්තේද?

"ස්වාමීනි, යම් නාසයක් කරණකොට ගෙන සිඳින ලද තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති සිඳින ලද තෘෂ්ණා මාර්ග ඇති කෙළවර කරණ ලද සංසාර වෘත ඇති සියලු දුක් ඉක්මවූ පිරිනිවියාවූ අතීත බුදුවරයන් වහන්සේලා ප්‍රකාශ කරනු ලබන්නේ ප්‍රකාශ කරන්නේද, එබඳු නාසයක් ඇත්තේද?

"ස්වාමීනි, යම් දිවක් කරණකොට ගෙන සිඳින ලද තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති සිඳිනලද තෘෂ්ණා මාර්ග ඇති කෙළවර කරණ ලද සංසාර වෘත ඇති සියලු දුක් ඉක්මවූ පිරිනිවියාවූ අතීත බුදුවරයන් වහන්සේලා ප්‍රකාශ කරනු ලබන්නේ ප්‍රකාශ කරන්නේද එබඳු දිවක් ඇත්තේද?

"ස්වාමීනි, යම් කයක් කරණකොට ගෙන සිඳිනලද තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති සිඳින ලද තෘෂ්ණා මාර්ග ඇති කෙළවර කරණ ලද සංසාර වෘත ඇති සියලු දුක් ඉක්මවූ පිරිනිවියාවූ අතීත බුදුවරයන් වහන්සේලා ප්‍රකාශ කරනු ලබන්නේ ප්‍රකාශ කරන්නේද එබඳු කයක් ඇත්තේද?

'ස්වාමීනි, යම් සිතක් කරණකොට ගෙන සිඳින ලද තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති සිඳිනලද තෘෂ්ණා මාර්ග ඇති කෙළවර කරණ ලද සංසාර වෘත ඇති සියලු දුක් ඉක්මවූ පිරිනිවියාවූ අතීත බුදුවරයන් වහන්සේලා ප්‍රකාශ කරනු ලබන්නේ ප්‍රකාශ කරන්නේද එබඳු ඇසක් ඇත්තේද?" කියායි.

3. "එග්ගුණය, යම් ඇසක් කරණකොටගෙන සිඳිනලද තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති සිඳිනලද තෘෂ්ණා මාර්ග ඇති කෙළවර කළ සංසාර වෘත දුක්ඛය ඇති සියලු දුක් ඉක්මවූ පිරිනිවියාවූ අතීත බුදුවරයන් ප්‍රකාශ කරනු ලබන්නේ, ප්‍රකාශ කරන්නේද එබඳු ඇසක් නැත්තේය.

"එග්ගුණය, යම් කණක් කරණකොටගෙන සිඳිනලද තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති සිඳිනලද තෘෂ්ණා මාර්ග ඇති කෙළවර කළ සංසාර වෘත දුක්ඛය ඇති සියලු දුක් ඉක්මවූ පිරිනිවියාවූ අතීත බුදුවරයන් ප්‍රකාශ කරනු ලබන්නේ, ප්‍රකාශ කරන්නේද එබඳු කණක් නැත්තේය.

"එග්ගුණය, යම් නාසයක් කරණකොට ගෙන සිඳිනලද තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති සිඳිනලද තෘෂ්ණා මාර්ග ඇති කෙළවර කළ සංසාර වෘත දුක්ඛය ඇති සියලු දුක් ඉක්මවූ පිරිනිවියාවූ අතීත බුදුවරයන් ප්‍රකාශ කරනු ලබන්නේ, ප්‍රකාශ කරන්නේද එබඳු නාසයක් නැත්තේය.

'එග්ගුණය, යම් දිවක් කරණකොට සිඳිනලද තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති සිඳිනලද තෘෂ්ණා මාර්ග ඇති කෙළවර කළ සංසාර වෘත දුක්ඛය ඇති සියලු දුක් ඉක්මවූ පිරිනිවියාවූ අතීත බුදුවරයන් ප්‍රකාශ කරනු ලබන්නේ, ප්‍රකාශ කරන්නේද එබඳු දිවක් නැත්තේය.

"එග්ගුණය, යම් කයක් කරණකොටගෙන සිඳිනලද තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති සිඳිනලද තෘෂ්ණා මාර්ග ඇති කෙළවර කළ සංසාර වෘත දුක්ඛය ඇති සියලු දුක් ඉක්මවූ පිරිනිවියාවූ අතීත බුදුවරයන් ප්‍රකාශ කරනු ලබන්නේ, ප්‍රකාශ කරන්නේද එබඳු කයක් නැත්තේය.

"එග්ගුණය, යම් සිතක් කරණකොට සිඳිනලද තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති සිඳින ලද තෘෂ්ණා මාර්ග ඇති කෙළවර කළ සංසාර වෘත දුක්ඛය ඇති සියලු දුක් ඉක්මවූ පිරිනිවියාවූ අතීත බුදුවරයන් ප්‍රකාශ කරනු ලබන්නේ, ප්‍රකාශ කරන්නේද, එබඳු සිතක් නැත්තේයයි" වදාළේය.

3. වෙනි ගිලාන වර්ගය නිමි.

---

# 4. ඡන්න වර්ගය

## 1. පලොක ධම්ම සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මෙය සැළ කෙළේය.

2. "ස්වාමීනි, ලෝකය ලෝකයයි කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි ලෝකයයි කියනු ලැබේද?"

3. "ආනන්දය, යමක් වනාහි බිඳෙන ස්වභාව ඇත්තේද, මෙය ආර්‍ය්‍ය විනයෙහි ලෝකයයි කියනු ලැබේ. ආනන්දය, කුමක් බිඳෙන ස්වභාව ඇත්තේද?

"ආනන්දය, ඇස වනාහි බිඳෙන ස්වභාව ඇත්තේය. රූපයෝ බිඳෙන ස්වභාව ඇත්තාහුය. චක්ඛු විඤ්ඤාණය බිඳෙන ස්වභාව ඇත්තේය. චක්ඛු සම්ඵස්සය බිඳෙන ස්වභාව ඇත්තේය. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුකද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද බිඳෙන ස්වභාව ඇත්තේය.

4. "ආනන්දය, කණ වනාහි බිඳෙන ස්වභාව ඇත්තේය. ශබ්දයෝ බිඳෙන ස්වභාව ඇත්තාහුය. සෝත විඤ්ඤාණය බිඳෙන ස්වභාව ඇත්තේය. සෝත සම්ඵස්සය බිඳෙන ස්වභාව ඇත්තේය. සෝතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද එයද බිඳෙන ස්වභාවය ඇත්තේය.

5 "ආනන්දය, නාසය වනාහි බිඳෙන ස්වභාව ඇත්තේය. ගන්ධයෝ බිඳෙන ස්වභාව ඇත්තාහුය. ඝාණ විඤ්ඤාණය බිඳෙන ස්වභාව ඇත්තේය. ඝාණ සම්ඵස්සය බිඳෙන ස්වභාව ඇත්තේය. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, එයද බිඳෙන ස්වභාව ඇත්තේය.

6. "ආනන්දය, දිව බිඳෙන ස්වභාව ඇත්තේය. රසයෝ බිඳෙන ස්වභාව ඇත්තේය. ජිව්හා විඤ්ඤාණය බිඳෙන ස්වභාව ඇත්තේය. ජිව්හා සම්ඵස්සය බිඳෙන ස්වභාව ඇත්තේය. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, එයද බිඳෙන ස්වභාවය ඇත්තේය.

7. "ආනන්දය, කය බිඳෙන ස්වභාව ඇත්තේය. ස්පර්ශය බිඳෙන ස්වභාව ඇත්තාහුය. කාය විඤ්ඤාණය බිඳෙන ස්වභාව ඇත්තේය. කාය සම්ඵස්සය බිඳෙන ස්වභාව ඇත්තේය. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, එයද බිඳෙන ස්වභාවය ඇත්තේය.

8. "ආනන්දය, සිත බිඳෙන ස්වභාව ඇත්තේය. ධර්මයෝ බිඳෙන ස්වභාව ඇත්තාහ. මනෝ විඤ්ඤාණය බිඳෙන ස්වභාව ඇත්තේය. මනෝ සම්ඵස්සය බිඳෙන ස්වභාව ඇත්තේය. මනෝසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වේදනාවකුත් උපදීද, එයද බිඳෙන ස්වභාවය ඇත්තේය.

"ආනන්දය, යමක් වනාහි බිඳෙන ස්වභාව ඇත්තේද?' හෙතෙම ආර්‍ය්‍ය විනයෙහි ලෝකයයි කියනු ලැබේයයි" (වදාළේය.)

---

## 2. සුඤ්ඤ සූත්‍රය

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2. "ස්වාමීනි ලොකය සුන්‍යය ලොකය සුන්‍යයයි කියනු ලැබේ. ස්වාමීනි කොපමණකින් වනාහි ලොකය සුන්‍යයයි කියනු ලැබේද?"

3. "ආනන්දය යම් හෙයකින් වනාහි ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳ වූවකින් හෝ සුන්‍යවේද, එහෙයින් ලොකය සුන්‍යයයි කියනු ලැබේ. ආනන්දය, කුමක් නම් ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳ වූවකින් හෝ සුන්‍යවේද,

4. "ආනන්දය ඇස වනාහි ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳ වූවකින් හෝ සුන්‍යවේ. රූපයෝ ආත්මයෙන් හෝ ආත්මය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

පිළිබඳවූවකින් හෝ සූන්‍ය වෙත්. චක්ඛු විඥානය ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් සූන්‍යවේ. චක්ඛු සම්ඵස්සය ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍යවේ. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද එයද ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍යවේ.

**5.** "ආනන්දය, කණ වනාහි ආත්මයත් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍යවේ. ශබ්දයෝ ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍ය වෙත්. සෝත විඥානය ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් සූන්‍යවේ. සෝත සම්ඵස්සය ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍යවේ. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද එයද ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍යවේ.

**6.** "ආනන්දය නාසය වනාහි ආත්මයත් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍යවේ. ගන්ධයෝ ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍ය වෙත්. ඝාණ විඤ්ඤාණය ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් සූන්‍යවේ. ඝාණ සම්ඵස්සය ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍යවේ. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍යවේ.

**7.** "ආනන්දය දිව වනාහි ආත්මයත් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍යවේ. රසයෝ ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍ය වෙත්. ජිව්හා විඤ්ඤාණය ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් සූන්‍යවේ. ජිව්හා සම්ඵස්සය ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍යවේ. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද එයද ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍යවේ.

8. ආනන්දය කය වනාහි ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සුන්‍යවේ. ස්පර්ශයෝ ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සුන්‍ය වෙත්. කායවිඥ්ඥාණය ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් සුන්‍යවේ. කාය සම්ඵස්සය ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සුන්‍යවේ. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද එයද ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සුන්‍යවේ.

9. ආනන්දය සිත වනාහි ආත්මයන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සුන්‍යවේ. ධර්මයෝ ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සුන්‍යවෙත්. මනෝවිඥ්ඥාණය ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් සුන්‍යවේ. මනෝ සම්ඵස්සය ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සූන්‍යවේ. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද එයද ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සුන්‍යවේ.

"ආනන්දය, යම්හෙයකින් වනාහි ආත්මයෙන් හෝ ආත්මය පිළිබඳවූවකින් හෝ සුන්‍යවේද, එහෙයින් ලොකය සුන්‍යයයි කියනු ලැබේයයි, වදාළේය.

---

## 3. සංඛිත්ත සූත්‍රය

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා එකලාව සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව හරණ ලද ආත්මාලය ඇතිව වාසය කරන්නෙම්ද, එබඳු ධර්මයක් භාග්‍යවතුන් වහන්සේ මට කොටින් දේශනා කරන සේක්නම් මැනවැයි" කියයි.

3. "ආනන්දය, ඒ කුමකැයි හඟින්නෙහිද? ඇස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"රූපයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛුවිඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛුසම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද? එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

4. "ආනන්දය, කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරළෙන ස්වභාවද එය 'මෙය මාගේය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"ශබ්දයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සෝත විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සෝතසම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සොතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

**5** "ආනන්දය නාසය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි, දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

“ගන්ධයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?”-“ස්වාමීනි, අනිත්‍යහ.”

“යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?”- “ස්වාමීනි, දුක්ය.”

“යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය ‘මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි’ දකින්ට සුදුසුද?”-“ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි”

“ඝාණ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?”- “ස්වාමීනි, අනිත්‍යය.”

“යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?”- “ස්වාමීනි, දුක්ය.”

“යමක් වනාහි අනිත්‍යද, දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය ‘මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි’ දකින්ට සුදුසුද?”-“ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි.”

“ඝාණ සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?”-“ ස්වාමීනි, අනිත්‍යය.”

“යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?”- “ස්වාමීනි, දුක්ය.”

“යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය ‘මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි’ දකින්ට සුදුසුද?”-“ස්වාමීනි, මෙය සුදුසු නොවේ.”

“ඝාණසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?”-“ස්වාමීනි, අනිත්‍යය.”

“යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?”- “ස්වාමීනි, දුක්ය.”

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

**6.** "මහණෙනි, දිව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"රසයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ජිව්හා විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- "ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ජිව්හා සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

"ජිව්හා සම්ඵස්සය හේතුකොටගෙණ සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?'-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

7. "ආනන්දය, කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද"-"ස්වාමීනි, දුක්ය."

'යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරළෙන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය. මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ස්පර්ශය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි' මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"කාය විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"කාය සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේ මැයි"

"කායසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ හෝ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය"

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

8. "මහණෙනි, සිත නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"ධර්මයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"මනෝ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"මනෝ සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

'මනෝසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය,"

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

8. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම ඇස කෙරෙහිද කලකිරෙයි, රූපය කෙරෙහිද කලකිරෙයි චක්ඛුවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. චක්ඛුසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එය කෙරෙහිද කලකිරෙයි.

9. "කණ කෙරෙහිද කලකිරෙයි, ශබ්දය කෙරෙහිද කලකිරෙයි, සෝත විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, සෝත සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. සෝතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

10. "නාසය කෙරෙහිද කලකිරෙයි, ගන්ධය කෙරෙහිද කලකිරෙයි, ඝාණ විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, ඝාණ සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එය කෙරෙහිද කලකිරෙයි.

11. "දිව කෙරෙහිද කලකිරෙයි, රසය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

12. "කය කෙරෙහිද කලකිරෙයි, ස්පර්ශය කෙරෙහිද කලකිරෙයි, කාය විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, කාය සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

13. "සිත කෙරෙහිද කලකිරෙයි, ධර්මයන් කෙරෙහිද කලකිරෙයි, මනොවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, මනො සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, මනෝසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුනේය යන දැනීමවේ. 'ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වැස නිමවන ලදී. සතර මගින් කළයුත්ත කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගණියි." භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේය. මේ දේශනාව කරනු ලබන කල්හි ඒ භික්ෂුහුගේ සිත උපාදාන රහිතව ආශ්‍රවයන්ගෙන් මිදුනේයයි වදාළේය."

---

## 4. ඡන්න සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිර තෙමේද, ආයුෂ්මත් ඡන්න ස්ථවිර තෙමේද ගිජුකුළු පව්වෙහි වාසය කෙරෙත්, එකල්හි වනාහි ආයුෂ්මත් ඡන්න ස්ථවිර තෙම හටගත් ආබාධ ඇත්තේ දුකින් පෙළුනේ දැඩි ගිලන් වූයේ වේ.

2. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙම සවස් වේලෙහි විවේකයෙන් නැගී සිටියේ ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිර තෙම

යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන්ට "ඇවැත් චුන්දය, ආයුෂ්මත් ඡන්න ස්ථවිර තෙම යම් තැනෙක්හිද එහි අසනිස බැලීම සඳහා යමුයි" කීය. "ඇවැත්නි, එසේයයි' කියා ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිර තෙම ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ට උත්තර දුන්නේය.

3. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙමේද ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිර තෙමේද, ආයුෂ්මත් ඡන්න ස්ථවිරතෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ පණවන ලද ආසනයෙහි ඉඳගත්හ. ඉඳගෙන ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙමේ ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන්ගෙන් "ඇවැත් ඡන්නය, කිමෙක්ද, ඔබට ඉවසිය හැක්කේ ද? කිම යැපිය හැක්කේද? කිම දුක් වේදනාවෝ අඩුවෙත්ද, වැඩි නොවෙත් ද, අඩුවන බවක් පෙනේද, වැඩිවන බවක් නොපෙනේදැයි" ඇසීය.

4. "ඇවැත් ශාරිපුත්‍රයෙනි 'මට ඉවසිය නොහැක. යැපිය නොහැක. දැඩිවූ මාගේ දුක්වේදනාවෝ වැඩිවෙත්. අඩු නොවෙත්. වැඩිවන බවම පෙනේ. අඩුවන බවක් නොපෙනේ, ඇවැත්නි, යම්සේ බලවත් පුරුෂයෙක් සියුම්වූ විදින කටුවෙන් හිස් මුදුන විදින්නේද, ඇවැත්නි එපරිද්දෙන්ම බලවත්වූ වාතයෝ හිස පහරත්.

"ඇවැත් ශාරිපුත්‍රයෙනි මට ඉවසිය නොහැක. යැපිය නොහැක. දැඩිවූ මාගේ දුක්වේදනාවෝ වැඩිවෙත්. අඩු නොවෙත්. වැඩිවන බවම පෙනේ. අඩුවනබවක් නොපෙනේ. ඇවැත්නි, යම්සේ බලවත් පුරුෂයෙක් දැඩිවූ වරපටකින් හිසෙහි හිස් වෙළුමක් දෙන්නේද ඇවැත්නි එපරිද්දෙන්ම මාගේ හිසෙහි වේදනාවෝ බලවත්ය.

"ඇවැත් ශාරිපුත්‍රයෙනි, මට ඉවසිය නොහැක. යැපිය නොහැක දැඩිවූ මාගේ දුක් වේදනාවෝ වැඩිවෙත්. අඩුනොවෙත්. වැඩිවන බවම පෙනේ. අඩුවන බවක් නොපෙනේ.

"ඇවැත්නි, යම්සේ දක්ෂවූ ගවයන් මරන්නෙක් ගවයන් මරන්නෙකුගේ අතවැසියෙක් හෝ තියුණුවූ ගෙරි කපන කැත්තෙන් කුස කපන්නේද? ඇවැත්නි එපරිද්දෙන්ම බලවත්වූ වාතයෝ කුස කපත්.

"ඇවැත් ශාරිපුත්‍රයෙනි, මට ඉවසිය නොහැක. යැපිය නොහැක. දැඩිවූ මාගේ දුක් වේදනාවෝ වැඩිවෙත්. අඩු නොවෙත්. වැඩිවන බවම පෙනේ, අඩුවන බවක් නොපෙනේ. ඇවැත්නි, යම්සේ බලවත්වූ පුරුෂයෝ දෙදෙනෙක් ඉතා දුර්වලවූ පුරුෂයෙකු වෙන වෙනම අත් වලින් අල්ලා ගෙණ ගිනි අඟුරු වලෙක්හි තවන්නාහුද, අතිශයින් තවන්නාහුද, ඇවැත්නි, එපරිද්දෙන්ම සිරුරෙහි බලවත්වූ දැවිල්ලක්වේ.

"ඇවැත් ශාරිපුත්‍රයෙනි, මට ඉවසිය නොහැක. යැපිය නොහැක, දැඩිවූ මාගේ දුක් වේදනාවෝ වැඩිවෙත්. අඩු නොවෙත්. වැඩිවීමම පෙනේ. අඩුවීමක් නොපෙනේ. ආයුෂ්මත්වූ ශාරිපුත්‍රය ආයුධයකින් දිවි තොරකර ගන්නෙමි. ජීවිතය බලාපොරොත්තු නොවෙමියි" කීයේය.

**5.** "ආයුෂ්මත් ඡන්න තෙමේ ආයුධයකින් දිවි තොර කර නොගණීවා, ආයුෂ්මත් ඡන්න තෙමේ ජීවත් වේවා අපි ජීවත් වන්නාවූ ආයුෂ්මත් ඡන්නයන් (දැකීමට) කැමති වෙමු. ඉදින් ආයුෂ්මත් ඡන්නයන්ට සුදුසුවූ ආහාර නැති නම් මම ආයුෂ්මත් ඡන්නයන්ට සුදුසු ආහාර සපයා දෙන්නෙමි. ඉදින් ආයුෂ්මත් ඡන්නයන්ට සුදුසුවූ බෙහෙත් නැතිනම් මම ආයුෂ්මත් ඡන්නයන්ට සුදුසුවූ බෙහෙත් සපයා දෙන්නෙමි. ඉදින් ආයුෂ්මත් ඡන්නයන්ට සුදුසුවූ උපස්ථායකයෝ නැත්නම් මම ආයුෂ්මත්වූ ඡන්න ස්ථවිරයන්ට උපස්ථාන කරන්නෙමි. ආයුෂ්මත් ඡන්න තෙමේ ආයුධයකින් දිවි තොර කර නොගණීවා. ආයුෂ්මත් ඡන්න තෙමේ ජීවත් වේවා! අපි ජීවත් වන්නාවූ ආයුෂ්මත් ඡන්නයන් (දැකීමට) කැමැත්තෙමුයි" කීය.

**6.** "ඇවැත් ශාරිපුත්‍රයෙනි, මට සුදුසුවූ ආහාර නැත්තේ නොවේ. මට සුදුසුවූ ආහාර ඇත. මට සුදුසුවූ බෙහෙත් නැත්තේද නොවේ. මට සුදුසුවූ බෙහෙත්ද ඇත. මට සුදුසු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

උපස්ථායකයෝ නැත්තාහුද නොවෙත්. මට සුදුසු උපස්ථායකයෝද ඇත්තාහ. ඇවැත්නි, එතකුදුවුවත් මා විසින් ශාස්තෲන් වහන්සේ බොහෝ කලක් කායකර්මාදියෙන්ම ඇසුරු කරණලදී. අයහපත්වූ කාය කර්මාදියෙන් ඇසුරු නොකරණ ලදී. ඇවැත්නි, යහපත්වූ කාය කර්මාදියෙන් ශාස්තෲන් වහන්සේ ඇසුරු කරන්නේය. අයහපත්වූ කාය කර්මාදියෙන් ඇසුරු නොකරන්නේය යන යමක් වේද, ඒ වනාහි ශ්‍රාවකයාහට සුදුසුවේ. ඇවැත් ශාරිපුත්‍රයෙනි, ඡන්න භික්ෂුතෙම නැවත ප්‍රතිසන්ධියක් නැත්තාවූ ආයුධයකින් දිවි තොරකර ගැනීමක් කරන්නේය යන මේ කාරණය මෙසේ දරණු මැනවැයි” කීය.

7. “ඉදින් ආයුෂ්මත් ඡන්නතෙමේ ප්‍රශ්න ඇසීමට අවකාශ කෙරේනම්, අපි ආයුෂ්මත් ඡන්නයන්ගෙන් කිසියම් කරුණක් විචාරන්නෙමු.”

“ඇවැත් ශාරීපුත්‍රයෙනි, අසනු මැනව. අසා දැන ගන්නෙමියි” ඇවැත් ඡන්නය, ඇස, චක්ඛු විඤ්ඤාණය, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් ‘මෙය මාගේය, මෙය මම වෙමි. මෙය මාගේ ආත්මයයි’ දක්නෙහිද?

ඇවැත් ඡන්නය, කණ, සෝත විඤ්ඤාණය සෝත විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් ‘මෙය මාගේය මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි’ දන්නෙහිද?

“ඇවැත් ඡන්නය, නාසය, ඝාණ විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් ‘මෙය මාගේය මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි’ දක්නෙහිද?

“ඇවැත් ඡන්නය, දිව, ජිව්හා විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් ‘මෙය මාගේය මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි’ දක්නෙහිද?

“ඇවැත් ඡන්නය, කය, කාය විඤ්ඤාණය, කාය විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් ‘මෙය මාගේය මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි’ දක්නෙහිද?

"ඇවැත් ඡන්නය, සිත, මනො විඤ්ඤාණය, මනො විඤ්ඤාණයෙන් දත යුතු ධර්මයන් 'මෙය මාගේය මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි' දක්නෙහිද?"

8 "ඇවැත් ශාරිපුත්‍රය, ඇස, චක්ඛු විඤ්ඤාණය, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි.' මෙය මාගේ ආත්මය නොවේයයි දක්නෙමි.

"ඇවැත් ශාරිපුත්‍රය, කණ, සෝත විඤ්ඤාණය, සෝත විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙමි.

"ඇවැත් ශාරිපුත්‍රය, නාසය, ඝාණ විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් 'මෙය මාගේ නොවෙයි මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙමි.

"ඇවැත් ශාරිපුත්‍රය, දිව, ජිව්හා විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙමි.

"ඇවැත් ශාරිපුත්‍රය, කය, කාය විඤ්ඤාණය, කාය විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් 'මෙය මාගේ නොවෙයි මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙමි.

"ඇවැත් ශාරිපුත්‍රය, සිත, මනෝ විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් 'මෙය මාගේ නොවෙයි මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙමි

9 "ඇවැත්වූ ඡන්නය, ඇසෙහි චක්ඛු විඤ්ඤාණයෙහි චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්හි කුමක් දැක, කුමක් දැන ඇස, චක්ඛුවිඤ්ඤාණය, චක්ඛුවිඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි මෙය මාගේ ආත්මය නොවේයයි', දක්නෙහිද?

"ඇවැත්වූ ඡන්නය, කණෙහි සෝත විඤ්ඤාණයෙහි සෝත විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්හි කුමක් දැක, කුමක් දැන කණ, සෝත විඤ්ඤාණය, සෝත විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙහිද,

"ඇවැත්වූ ඡන්නය, නාසයෙහි ඝාණ විඤ්ඤාණයෙහි ඝාණ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්හි කුමක් දැක කුමක් දැන නාසය ඝාණ විඤ්ඤාණය ඝාණ විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙහිද,

"ඇවැත්වූ ඡන්නය, දිවෙහි ජිව්හා විඤ්ඤාණයෙහි ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්හි කුමක් දැක කුමක් දැන දිව, ජිව්හා විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්, 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙහිද,

"ඇවැත්වූ ඡන්නය, කයෙහි කාය විඤ්ඤාණයෙහි කාය විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්හි කුමක් දැක, කුමක් දැන කය, කාය විඤ්ඤාණය, කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මයන් 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙහිද?

"ඇවැත්වූ ඡන්නය, සිතෙහි මනො විඤ්ඤාණයෙහි මනො විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන්හි කුමක් දැක කුමක් දැන සිත, මනො විඤ්ඤාණය, මනොවිඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙහිදැයි' ඇසූහ.

**10.** "ඇවැත් ශාරිපුත්‍රයෙනි, ඇසෙහි චක්ඛු විඤ්ඤාණයෙහි චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් කෙරෙහි නිරුද්ධවීම දැක නිරුද්ධවීම දැන ඇස, චක්ඛු විඤ්ඤාණය, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙමි.

"ඇවැත් ශාරිපුත්‍රයෙනි, කණෙහි සෝත විඤ්ඤාණයෙහි සෝත විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් කෙරෙහි නිරුද්ධවීම දැක නිරුද්ධවීම දැන කණ, සෝත විඤ්ඤාණය, සෝත විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයන් 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙමි.

"ඇවැත් ශාරිපුත්‍රයෙනි, නාසයෙහි ඝ්‍රාණ විඥ්ඥාණයෙහි ඝ්‍රාණ විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයන් කෙරෙහි නිරුද්ධවීම දැක නිරුද්ධවීම දැන නාසය ඝ්‍රාණ විඥාණය, ඝ්‍රාණ විඥානයෙන් දතයුතු ධර්මයන් මෙය මාගේ නොවෙයි. 'මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙමි.

"ඇවැත් ශාරිපුත්‍රයෙනි, දිවෙහි ජිව්හා විඥ්ඥාණයෙහි, ජිව්හා විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයන් කෙරෙහි, නිරොධය දැක නිරොධය දැන දිව, ජිව්හා විඥ්ඥාණය, ජිව්හා විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයන් 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' දක්නෙමි.

"ඇවැත් ශාරිපුත්‍රයෙනි, කයෙහි, කාය විඥ්ඥාණයෙහි, කාය විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයන් කෙරෙහි නිරොධය දැක, නිරොධය දැන, කය, කායවිඥ්ඥාණය, කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ ධර්මයන් 'මෙය මාගේ නොවෙයි මෙය මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේයයි' දක්නෙමියි කීයේය.

"ඇවැත් ශාරිපුත්‍රයෙනි, සිතෙහි මනො විඥ්ඥාණයෙහි මනො විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයන්හි නිරොධය දැක නිරොධය දැන සිත, මනො විඥ්ඥාණය, මනො විඥානයෙන් දතයුතු ධර්මයන් මෙය මාගේ නොවෙයි, 'මෙය මම නොවෙමි. මේ මාගේ ආත්මය නොවේයයි' දක්නෙමියි" කීයේය.

11. "මෙසේ කී කල්හි ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරතෙම ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන්ට මෙසේ කීය. "ඇවැත් ඡන්නය, එසේනම් මෙහිදී ඒ භාග්‍යවතුන් වහන්සේගේ මේ අනුශාසනයද නිරන්තරයෙන් මනාකොට මෙනෙහි කටයුතුයි. තෘෂ්ණාදිය ඇසුරුකළහුගේ කම්පාවීම ඇසුරු නොකළහුට කම්පාවීමක් නැත. කම්පාවීමක් නැති කල්හි ඇලීම ඇති නොවේ. ඇලීම නැති කල්හි ප්‍රතිසන්ධි වශයෙන් ඊමක් හෝ චුති වශයෙන් යාමක් හෝ නැත. ඊමකින් හෝ යාමක් නැති කල්හි චුතවීමක් හෝ ඉපදීමක් හෝ නැත. චුතිය හා උත්පත්තිය නැති කල්හි, මෙලොවද නැත. පරලොවද නැත දෙලොවම නැත. මෙයම දුක්ඛයාගේ කෙළවර වේය." යන අනුශාසනාවයි.

12 ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරතෙමේද ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන්ට මේ අවවාදයෙන් අවවාදකොට හුනස්නෙන් නැගිට ගියාහුය.

13. ඉක්බිති ආයුෂ්මත් ඡන්න ස්ථවිර තෙම ඒ ආයුෂ්මතුන් වහන්සේලා බැහැර ගියාවූ නොබෝකල්හි ආයුධයකින් බෙල්ල කපා ගත්තේය. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍රය ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය.

14. "ස්වාමීනි, ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් විසින් ආයුධයකින් දිවි තොරකර ගන්නා ලදී. ඔහුගේ ගතිය කවරීද පරලොව කවරේද?"

"ශාරිපුත්‍රය තොපට ඡන්න භික්ෂුව විසින් ඉදිරියෙහිදීම නැවත උත්පත්තියක් නැති බව ප්‍රකාශ කරණ ලද්දේ නොවේද?"

"ස්වාමීනි, පුබ්බවිජ්ජිර නම් වජ්ජි ග්‍රාමයක් ඇත්තේය. එහි ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන්ගේ මිත්‍රවූ කුලයෝ යහලුවූ කුලයෝ එළඹිය යුතු කුලයෝ වෙත්යයි" කීය.

"ශාරිපුත්‍රය, ඡන්න භික්ෂුහුගේ මේ මිත්‍රවූ කුලයෝ යහලුවූ කුලයෝ එළඹිය යුතු කුලයෝ වෙත්මැයි, ශාරිපුත්‍රය, මම මෙතකින් එළඹිය යුතුයයි නොකියමි. ශාරිපුත්‍රය, යමෙක් වනාහි මේ කය බහා තබාද, අනික් කයක් ගණීද, මම් ඔහු එළඹිය යුත්තෙකැයි කියමි. එය ඡන්න භික්ෂූහුට නැත්තේය. ඡන්න භික්ෂුව විසින් නැවත ඉපදීමක් නැති ආයුධයකින් දිවි තොරකර ගැනීම කරන ලද්දේයයි, ශාරිපුත්‍රය, මෙය මෙසේ දරවයි" වදාළේය.

---

## 5. පුණ්ණ සූත්‍රය.

1. (මේ සූත්‍රයද 1905 වෙනි පිටේ අවිජ්ජා සූත්‍රය මෙන් වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඉක්බිති ආයුෂ්මත් පුණ්ණ ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් පුණ්ණ ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය.

**2.** "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා එකලාව සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව හරණ ලද ආත්මාලය ඇතිව වාසය කරන්නෙම්ද, භාග්‍යවතුන් වහන්සේ මට එබඳු ධර්මයක් සැකෙවින් දෙශනා කරණසේක් නම් මැනවයි" යනුයි

**3.** "පුණ්ණය, ඇසින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සුව එලවන්නාවූ ඇළුම්කටයුතුවූ රූපයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම ඒ රූපයෙහි ඇළේද, එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගැලීසිටීද, එහි ඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ එහි ගැලීසිටින්නාවූ ඔහුට තෘෂ්ණාව උපදියි, පුණ්ණය, තෘෂ්ණාව නිසා දුක් හට ගැණීම වේයයි කියම්

"පුණ්ණය, කණින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සුව එලවන්නාවූ ඇළුම් කටයුතුවූ ශබ්දයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම ඒ ශබ්දයෙහි ඇලේද එය ප්‍රියයි මනාපයයි කියාද, එහි ගැලීසිටීද, එහි ඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණාව උපදියි. පුණ්ණය, තෘෂ්ණාව නිසා දුක් හට ගැණීම වේයයි කියමි.

"පුණ්ණය, නාසයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සුව එලවන්නාවූ ඇළුම්කටයුතුවූ ගන්ධයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම ඒ ගන්ධයෙහි ඇලේද එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගැලීසිටීද, එහි ඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණාව උපදියි. පුණ්ණය, තෘෂ්ණාව නිසා දුක් හට ගැනීම වේයයි කියමි

"පුණ්ණය, දිවෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සුව එලවන්නාවූ ඇළුම් කටයුතුවූ රසයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම ඒ රසයෙහි ඇලේද එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගැලී සිටීද, එහි ඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණාව උපදියි. පුණ්ණය, තෘෂ්ණාව නිසා දුක් හට ගැණීම වේයයි කියමි.

"පුණ්ණය, කයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සුව එලවන්නාවූ ඇළුම් කටයුතුවූ ස්පර්ශයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම ඒ ස්පර්ශයෙහි ඇලේද එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගැලීසිටීද, එහි ඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණාව උපදියි. පුණ්ණය තෘෂ්ණාව නිසා දුක් හට ගැණීම වේයයි කියමි.

"පුණ්ණය මනසින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයන් පිණිස පවත්නාවූ ඇළුම් කටයුතුවූ ධර්මයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එහි ඇලෙයිද එය ප්‍රියයයි මනාපයයි කියාද එහි ගැලී සිටීද, එහි ඇලෙන්නාවූ එය ප්‍රියයයි මනාපයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණාව උපදියි, පුණ්ණය තෘෂ්ණාව නිසා දුක් හට ගැණීම වේයයි කියමි.

4. "පුණ්ණය, ඇසින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සුව එලවන්නාවූ ඇලුම් කටයුතුවූ රූපයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම එහි නොඇලේද සතුටු වචන නොකියාද එහි නොගිලෙයිද එහි නොඇලෙන්නාවූ සතුටු වචන නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ. පුණ්ණය, තෘෂ්ණාව නිරුද්ධවීමෙන් දුක්ඛනිරෝධය වේයයි කියමි.

"පුණ්ණය, කණින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයන් පිණිස පවත්නාවූ, ඇළුම් කටයුතුවූ ශබ්දයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම එහි නොඇලෙයිද, සතුටු

වචන නොකියාද එහි නොගිලෙයිද එහි නොඇලෙන්නාවූ සතුටු වචන නොකියන්නාවූ එහි නොගිලෙන්නාවූ ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ. පුණ්ණය තෘෂ්ණාව නිරුද්ධවීමෙන් දුක්ඛ නිරෝධය වේයයි, කියමි.

"පුණ්ණය, නාසයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රියස්වභාව ඇත්තාවූ කාමයන් පිණිස පවත්නාවූ ඇළුම් කටයුතුවූ ගන්ධයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම එහි නොඇලෙයිද සතුටු වචන නොකියාද එහි නොගිලෙයිද එහි නොඇලෙන්නාවූ සතුටු වචන නොකියන්නාවූ එහි නොගිලෙන්නාවූ ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ පුණ්ණය තෘෂ්ණාව නිරුද්ධවීමෙන් දුක්ඛ නිරෝධය වේයයි, කියමි.

"පුණ්ණය, දිවෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයන් පිණිස පවත්නාවූ ඇළුම් කටයුතුවූ රසයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම එහි නොඇලෙයිද සතුටු වචන නොකියාද එහි නොගිලෙයිද එහි නොඇලෙන්නාවූ සතුටු වචන නොකියන්නාවූ එහි නොගිලෙන්නාවූ ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ. පුණ්ණය තෘෂ්ණාව නිරුද්ධවීමෙන් දුක්ඛ නිරෝධය වේයයි' කියමි.

"පුණ්ණය, කයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ස්වභාව ඇත්තාවූ කාමයන් පිණිස පවත්නාවූ ඇළුම් කටයුතුවූ ස්පර්ශයෝ ඇත්තාහ ඉදින් මහණ තෙම එහි නොඇලෙයිද සතුටුවචන නොකියාද එහි නොගිලෙයිද එහි නොඇලෙන්නාවූ සතුටු වචන නොකියන්නාවූ එහි නොගිලෙන්නාවූ ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ. පුණ්ණය, තෘෂ්ණාව නිරුද්ධවීමෙන් දුක්ඛ නිරෝධය වේයයි කියමි.

"පුණ්ණය, සිතින් දැනගත යුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයන් පිණිස පවත්නාවූ ඇළුම් කටයුතුවූ ධර්මයෝ ඇත්තාහ. ඉදින් මහණ තෙම එහිනොඇලේද සතුටු වචන නොකියාද එහි නොගිලේද එහි නොඇලෙන්නාවූ සතුටු වචන නොකියන්නාවූ එහි

නොගිලෙන්නාවූ ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධවේ. පුණ්ණය තෘෂ්ණාව නිරුද්ධවීමෙන් දුක්ඛ නිරෝධය වේයයි කියමි.

**5.** "පුණ්ණය, මා විසින් මේ සංක්ෂිප්තවූ අවවාදයෙන් අවවාද කරණලද්දාවූ නුඹ කවර නම් ජනපදයෙක්හි වාසය කරන්නෙහිද?"

"ස්වාමීනි, සුනාපරන්ත නම් ජනපදයෙක් ඇත්තේය. මම එහි වාසය කරන්නෙමි."

"පුණ්ණය, සුනාපරන්ත වැසි මිනිස්සු නපුරුය පුණ්ණය, සුනාපරන්ත වැසි මිනිස්සු කෘෘරය, පුණ්ණය ඉදින්, තොපට සුනාපරන්ත වැසි මිනිස්සු ආක්‍රොශ කරන්නාහුනම් පරිභව කරන්නාහු නම්, පුණ්ණය, එහි තොපට කුමක් වන්නේද?"

"ස්වාමීනි, ඉදින් මට සුනාපරන්ත වැසි මිනිස්සු ආක්‍රොශ කරන්නාහු නම් පරිභව කරන්නාහු නම් එහි මට මෙබඳු සිතක් වන්නේය. 'ඒකාන්තයෙන් මේ සුනාපරන්ත වැසි මිනිස්සු යහපත්ය. ඒකාන්තයෙන් මේ සුනාපරන්ත වැසි මිනිස්සු ඉතා යහපත්ය. මොව්හු යම් හෙයකින් මට අතින් පහර නොදෙත්ද, (එහෙයිනි.) භාග්‍යවතුන් වහන්ස මෙහි මට මෙබඳු සිතක් වන්නේය. සුගතයන්වහන්ස මෙහි මට මෙබඳු සිතක් වන්නේයයි," කීය.

**6.** "පුණ්ණය, ඉදින් වනාහි තොපට සුනාපරන්ත වැසි මිනිස්සු අතින් පහර දෙන්නාහු නම් පුණ්ණය එහි වනාහි තොපට කෙසේ වන්නේද?"-"ස්වාමීනි, ඉදින් මට සුනාපරන්ත වැසි මිනිස්සු අතින් පහර දෙන්නහු නම් එහි මට මෙබඳු සිතක් වන්නේය. 'ඒකාන්තයෙන් මේ සුනාපරන්ත වැසි මිනිස්සු යහපත්ය. ඒකාන්තයෙන් මේ සුනාපරන්ත වැසි මිනිස්සු ඉතා යහපත්ය. යම් හෙයකින් මට මොව්හු කැටකින් පහර නොදෙත්ද, එහෙයිනි භාග්‍යවතුන් වහන්ස, මෙහි මට මෙබඳු සිතක් වන්නේය. සුගතයන් වහන්ස, මෙහි මට මෙබඳු සිතක් වන්නේයයි" කීය.

7. "පුණ්ණය, ඉදින් වනාහි තොපට සුනාපරන්ත වැසි මිනිස්සු කැටකින් පහර දෙන්නාහුනම් පුණ්ණය එහි වනාහි තොපට කෙසේ වන්නේද?"-"ස්වාමීනි, ඉදින් මට සුනාපරන්ත වැසි මිනිස්සු කැටකින් පහර දෙන්නාහු නම්, එහි මට මෙබඳු සිතක් වන්නේය. 'ඒකාන්තයෙන් මේ සුනාපරන්ත වැසි මිනිස්සු යහපත්ය. ඒකාන්තයෙන් මේ සුනාපරන්ත වැසි මිනිස්සු ඉතා යහපත්ය. යම්හෙයකින් මොව්හු මට දණ්ඩෙන් පහර නොදෙත්ද, එහෙයිනි. භාග්‍යවතුන් වහන්ස, මෙහි මට මෙබඳු සිතක් වන්නේය. සුගතයන් වහන්ස මෙහි මට මෙබඳු සිතක් වන්නේයයි" කීය.

8 "පුණ්ණය, ඉදින් වනාහි තොපට සුනාපරන්ත වැසි මිනිස්සු දණ්ඩෙන් පහර දෙන්නාහු නම් පුණ්ණය එහි වනාහි තොපට කෙසේ වන්නේද?"-"ස්වාමීනි, ඉදින් මට සුනාපරන්ත වැසි මිනිස්සු දණ්ඩකින් පහර දෙන්නාහු නම්, එහි මට මෙබඳු සිතක් වන්නේය. 'ඒකාන්තයෙන් මේ සුනාපරන්ත වැසි මිනිස්සු යහපත්ය. ඒකාන්තයෙන් මේ සුනාපරන්ත වැසි මිනිස්සු ඉතා යහපත්ය. යම් හෙයකින් මට මොවුහු ආයුධයෙන් පහර නොදෙත්ද, එහෙයිනි. භාග්‍යවතුන් වහන්ස, මට මෙහි මෙබඳු සිතක් වන්නේය. සුගතයන් වහන්ස, මට මෙහි මෙබඳු සිතක් වන්නේයයි" කීය

9. "පුණ්ණය, ඉදින් වනාහි තොපට සුනාපරන්ත වැසි මිනිස්සු ආයුධයෙන් පහර දෙන්නාහු නම්, පුණ්ණය, එහි වනාහි තොපට කෙසේ වන්නේද?"-"ස්වාමීනි, ඉදින් මට සුනාපරන්ත වැසි මිනිස්සු ආයුධයෙන් පහර දෙන්නාහු නම්, එහි මට මෙබඳු සිතක් වන්නේය. 'ඒකාන්තයෙන් මේ සුනාපරන්ත වැසි මිනිස්සු යහපත්ය. ඒකාන්තයෙන් මේ සුනාපරන්ත වැසි මිනිස්සු ඉතා යහපත්ය. යම් හෙයකින් මා මොහු තියුණු ආයුධයකින් ජීවිතයෙන් තොර නොකෙරෙත්ද, එහෙයිනි.' භාග්‍යවතුන් වහන්ස, මට මෙහි මෙබඳු සිතක් වන්නේය. සුගතයන් වහන්ස, මට මෙහි මෙබඳු සිතක් වන්නේයයි" කීය.

10. "පුණ්ණය, ඉදින් වනාහි නුඹ සුනාපරන්ත වැසි මිනිස්සු තියුණුවූ ආයුධයකින් ජීවිතයෙන් තොර කරන්නාහු නම්, පුණ්ණය, එහි වනාහි තොපට කෙසේ වන්නේද?"-"ස්වාමීනි, ඉදින් මා සුනාපරන්ත වැසි මිනිස්සු තියුණුවූ ආයුධයකින් ජීවිතයෙන් තොර කරන්නාහුනම් එහි මට මෙබඳු සිතක් වන්නේය. 'කයටද ජීවිතයටද කළකිරීමෙන් පිළිකුල් කිරීමෙන් දිවි තොර කරන්නවුන් සොයමින් වාසය කරන්නාවූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ ඇත්තාහ. මා විසින් නොසොයාම දිවි තොර කරන්නෙක් ලද්දේය' කියායි. භාග්‍යවතුන් වහන්ස, මට මෙහි මෙබඳු සිතක් වන්නේය සුගතයන් වහන්ස, මට මෙහි මෙබඳු සිතක් වන්නේයයි," කීයේය.

11. "පුණ්ණය, යහපත, යහපත. පුණ්ණය ඉවසීමෙන් හා සංසිඳීමෙන් යුක්තවූ නුඹට සුනාපරන්ත ජනපදයෙහි වාසය කළ හැකිය. පුණ්ණය නුඹ යම් ගමනක් වේනම් එයට කල් දනුවයි," (වදාළේය.)

12. "ඉක්බිති ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගෞරව දක්වා සෙනස්න තැන්පත් කොට පාසිවුරු ගෙන සුනාපරන්ත ජනපදය යම් තැනෙක්හිද, එතැන්හි චාරිකාවෙහි ගියේය. පිළිවෙලින් චාරිකාවෙහි හැසිරෙන්නේ සුනාපරන්ත ජනපදය යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. එහි වනාහි ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරයන් වහන්සේ සුනාපරන්ත ජනපදයෙහි වාසය කරන්නේය.

12. "ඉක්බිති ආයුෂ්මත් පුණ්ණ ස්ථවිරතෙම එම වස තුළදීම පන්සියයක් පමණ උපාසකවරුන්ට ධර්මාවබොධය කරවීය. එම වස තුළදීම ත්‍රිවිද්‍යාව ප්‍රත්‍යක්ෂ කෙළේය. එම වස තුළදීම පිරිනිවන් පෑයේය.

13 "ඉක්බිති බොහෝවූ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන්

වහන්සේට වැඳ එක් පසෙක හුන්නාහුය. එකත් පස්ව හුන්නාවූම ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළාහුය. "ස්වාමීනි, යම් මේ පුණ්ණ නම් කුලපුත්‍රයෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂිප්තවූ අවවාදයෙන් අවවාද කරණ ලද්දේද, හෙතෙම කළුරිය කළේවෙයි ඔහුගේ ගතිය කවරීද, පරලොව කවරේද?" කියායි.

14 "මහණෙනි, පුණ්ණ නම් කුලපුත්‍ර තෙම පණ්ඩිත වූයේය. සත්‍ය වචන කියන සුළුවූයේය. ලොකොත්තර ධර්මයට අනුකූල වූයේය. ධර්මාවබොධ කරණ කොට මට වෙහෙස නොකෙළේය. මහණෙනි, පුණ්ණ නම් කුලපුත්‍ර තෙම පිරිනිවියේයයි," (වදාළේය.)

---

## 6. බාහිය සූත්‍රය

(මේ සූත්‍රයද 1905 වෙනි පිටේ අවිජ්ජා සූත්‍රය මෙන් වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

ඉක්බිති ආයුෂ්මත් බාහිය ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නේය. එකත් පස්වහුන්නාවූම ආයුෂ්මත් බාහිය ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය.

2. 'ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා එකලාව සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව හරණ ලද ආත්මාලය ඇතිව වාසය කරන්නෙම්ද, භාග්‍යවතුන් වහන්සේ මට එබඳු ධර්මයක් සැකෙවින් දෙශනා කරණසේක් නම් මැනව යනුයි."

3. "බාහිය, ඒ කුමකැයි හඟින්නෙහිද? ඇස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවද එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"රූපයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛුවිඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛුසම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-'ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

4. "බාහිය, කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- 'ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරළෙන ස්වභාවද එය 'මෙය මාගේය, මෙය මම වෙමි, මෙය මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"ශබ්දයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?" " ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමියි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-'ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සෝත විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?'-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"සෝතසම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"සොතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

**5.** "බාහිය, නාසය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යයද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යයද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, 'එය මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි, දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ගන්ධයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

"ඝාණ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ඝාණ සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේ."

"ඝාණසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

6. "බාහිය, දිව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි"

"රසයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ජිව්හා විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ජිව්හා සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"ජිව්හා සම්ඵස්සය හේතුකොටගෙණ සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

7. "බාහිය, කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද"-"ස්වාමීනි, දුක්ය."

'යමක් වනාහි අනිත්‍යද, දුක්ද, පෙරළෙන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි.'

"ස්පර්ශය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යයහ."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"-"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි' මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි මෙය සුදුසු නොවේමැයි."

"කාය විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

'යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"කාය සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- " ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද එය මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේ මැයි."

"කායසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ හෝ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

8. "බාහිය, සිත නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම

මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, එය සුදුසු නොවේමැයි."

"ධර්මයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත්ද?"-"ස්වාමීනි, අනිත්‍යයහ.'

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

'මනෝ විඤ්ඤාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"- "ස්වාමීනි, අනිත්‍යය."

'යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

"මනෝ සම්ඵස්සය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-" ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය. මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

මනෝසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මෙය මාගේය, මෙතෙම මම වෙමි, මෙතෙම මාගේ ආත්මයයි' දකින්ට සුදුසුද?"-"ස්වාමීනි, මෙය සුදුසු නොවේමැයි."

8. 'බාහිය, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම ඇස කෙරෙහිද කලකිරෙයි, රූපය කෙරෙහිද කලකිරෙයි. චක්ඛුවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. චක්ඛුසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එය කෙරෙහිද කලකිරෙයි.

9. "කණ කෙරෙහිද කලකිරෙයි. ශබ්දය කෙරෙහිද කලකිරෙයි, සෝත විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, සෝත සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. සෝතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

10. "නාසය කෙරෙහිද කලකිරෙයි, ගන්ධය කෙරෙහිද කලකිරෙයි, ඝාණ විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, ඝාණ සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එය කෙරෙහිද කලකිරෙයි.

11. "දිව කෙරෙහිද කලකිරෙයි, රසය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

12. "කය කෙරෙහිද කලකිරෙයි, ස්පර්ශය කෙරෙහිද කලකිරෙයි, කාය විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, කාය සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, කාය සම්ඵස්සය නිසා සැපවූ

හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි.

13. "සිත කෙරෙහිද කලකිරෙයි, ධර්මයන් කෙරෙහිද කලකිරෙයි, මනොවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි, මනො සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි, මනොසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, ඒ වේදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුනේය යන දැනීමවේ. 'ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වැස නිමවන ලදී. සතර මගින් කළයුත්ත කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගණියි." වදාළේය.

"ඉක්බිති ආයුෂ්මත් බාහිය ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගෞරව දක්වා ගියේය.

ඉක්බිති ආයුෂ්මත් බාහිය ස්ථවිර තෙම එකලාව සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව හරණ ලද ආත්මාලය ඇතිව වාසය කරමින් නොබෝ කලකින්ම යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොටම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවෙත්ද, බ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවරකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමවන ලදී. සතර මගින් කළයුත්ත කරණ ලදී. මේ ආත්ම භාවය පිණිස කළයුතු අනිකක් නැතැයි විශෙෂයෙන් දැනගත්තේය. ආයුෂ්මත් බාහිය ස්ථවිර තෙමේද රහතුන්ගෙන් එක්තරා නමක් වූයේ යයි වදාළේය.

---

## 7. ඒජා සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර, ‘කලන්දක නිවාප’ නම් ලත් වේළු (උණ) වනයෙහි වාසය කරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන් ඇමතූ සේක. ‘ස්වාමීනි’යි කියා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. “මහණෙනි, තෘෂ්ණාව ලෙඩකි. තෘෂ්ණා ගඩකි. තෘෂ්ණාව හුලකි. මහණෙනි, එහෙයින් තථාගතතෙම මෙහිලා තෘෂ්ණා රහිතව පහකරන ලද තෘෂ්ණා හුල් ඇතිව වාසය කරයි. මහණෙනි, එහෙයින් මෙහිලා භික්ෂුතෙමේද ඉදින් තෘෂ්ණා රහිතව පහකරන ලද තෘෂ්ණා හුල් ඇතිව වාසය කරනු කැමැත්තේ නම් ඇස මමයයි නොහඟින්නේය. ඇස කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය. ඇස කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය ඇස මාගේයයි නොහඟින්නේය. රූපයන් මමයයි නොහඟින්නේය. රූප කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය. රූපය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය. රූපය මාගේයයි නොහඟින්නේය. චක්ඛු විඤ්ඤාණය, මමයයි නොහඟින්නේය. චක්ඛු විඤ්ඤාණය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය. චක්ඛු විඤ්ඤාණය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය. චක්ඛු විඤ්ඤාණය මාගේයයි නොහඟින්නේය, චක්ඛුසම්ඵස්සය මමයයි නොහඟින්නේය. චක්ඛුසම්ඵස්සය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය. චක්ඛුසම්ඵස්සය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය. චක්ඛු සම්ඵස්සය මාගේයයි නොහඟින්නේය. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද මමයයි නොහඟින්නේය. එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය. එය කෙරෙන්ද, අනිකක් මමයයි නොහඟින්නේය. එය මාගේයයි නොහඟින්නේය.

3. කණ මමයයි නොහඟින්නේය, කණ කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, කණ කෙරෙන් අනිකක් මමයයි

නොහඟින්නේය, කණ මාගේයයි නොහඟින්නේය, ශබ්දය මමයයි නොහඟින්නේය, ශබ්දය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය. ශබ්දය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ශබ්දය මාගේයයි නොහඟින්නේය, සෝතවිඤ්ඤාණය මමයයි නොහඟින්නේය, සොතවිඤ්ඤාණය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, සොත විඤ්ඤාණය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, සොත විඤ්ඤාණය මාගේයයි නොහඟින්නේය, සෝත සම්ඵස්සය මමයයි නොහඟින්නේය, සෝත සම්ඵස්සය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, සෝතසම්ඵස්සය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, සෝත සම්ඵස්සය මාගේයයි නොහඟින්නේය, සොත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද මමයයි නොහඟින්නේය, එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය. එය කෙරෙන්ද අනිකක් මමයයි නොහඟින්නේය, එය මාගේයයි නොහඟින්නේය.

4. නාසය මමයයි නොහඟින්නේය, නාසය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, නාසය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, නාසය මාගේයයි නොහඟින්නේය, ගන්ධයන් මමයයි නොහඟින්නේය, ගන්ධය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය. ගන්ධය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ගන්ධයෝ මාගේයයි නොහඟින්නේය ඝාණවිඤ්ඤාණය මමයයි නොහඟින්නේය, ඝාණ විඤ්ඤාණය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ඝාණ විඤ්ඤාණය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ඝාණ විඤ්ඤාණය මාගේයයි නොහඟින්නේය, ඝාණ සම්ඵස්සය මමයයි නොහඟින්නේය, ඝාණ සම්ඵස්සය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ඝාණසම්ඵස්සය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ඝාණ සම්ඵස්සය මාගේයයි නොහඟින්නේය, ඝාණසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද මමයයි නොහඟින්නේය, එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එය කෙරෙන්ද අනිකක් මමයයි නොහඟින්නේය, එය මාගේයයි නොහඟින්නේය.

**5.** දිව මමයයි නොහඟින්නේය, දිව කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, දිව කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, දිව මාගේයයි නොහඟින්නේය, රසයන් මමයයි නොහඟින්නේය, රසය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය. රසය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, රසය මාගේයයි නොහඟින්නේය. ජිව්හා විඤ්ඤාණය මමයයි නොහඟින්නේය, ජිව්හා විඤ්ඤාණය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ජිව්හා විඤ්ඤාණය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ජිව්හා විඤ්ඤාණය මාගේයයි නොහඟින්නේය, ජිව්හා සම්ඵස්සය මමයයි නොහඟින්නේය, ජිව්හා සම්ඵස්සය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ජිව්හා සම්ඵස්සය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ජිව්හා සම්ඵස්සය මාගේයයි නොහඟින්නේය, ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද මමයයි නොහඟින්නේය, එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය. එය කෙරෙන්ද අනිකක් මමයයි නොහඟින්නේය, එය මාගේයයි නොහඟින්නේය.

**6.** කය මමයයි නොහඟින්නේය, කය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, කය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, කය මාගේයයි නොහඟින්නේය, ස්පර්ශයන් මමයයි නොහඟින්නේය, ස්පර්ශ කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ස්පර්ශය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ස්පර්ශය මාගේයයි නොහඟින්නේය, කාය විඤ්ඤාණය මමයයි නොහඟින්නේය, කාය විඤ්ඤාණය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, කාය විඤ්ඤාණය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, කාය විඤ්ඤාණය මාගේයයි නොහඟින්නේය, කාය සම්ඵස්සය මමයයි නොහඟින්නේය, කාය සම්ඵස්සය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, කාය සම්ඵස්සය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, කාය සම්ඵස්සය මාගේයයි නොහඟින්නේය,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද එයද මමයයි නොහඟින්නේය, එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය, එය කෙරෙන්ද අනිකක් මමයයි නොහඟින්නේය, එය මාගේයයි නොහඟින්නේය.

7. සිත මමයයි නොහඟින්නේය, සිත කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, සිත කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, සිත මාගේයයි නොහඟින්නේය, ධර්මයන් මමයයි නොහඟින්නේය, ධර්ම කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ධර්මය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ධර්මය මාගේයයි නොහඟින්නේය, මනෝවිඤ්ඤාණය මමයයි නොහඟින්නේය, මනෝවිඤ්ඤාණය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, මනොවිඤ්ඤාණය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, මනොවිඤ්ඤාණය මාගේයයි නොහඟින්නේය, මනොසම්ඵස්සය මමයයි නොහඟින්නේය, මනොසම්ඵස්සය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, මනො සම්ඵස්සය මාගේයයි නොහඟින්නේය, මනෝසම්ඵස්සය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, මනො සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද එයද මමයයි නොහඟින්නේය, එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය, එය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, එය මාගේයයි නොහඟින්නේය.

8. "හෙතෙම මෙසේ නොහඟින්නේ ලොකයෙහි කිසිවකුත් මමය, මාගේයයි අල්වා නොගන්නේය, අල්වා නොගන්නේ නො ඇලෙන්නේය. නො ඇලෙන්නේ මේ ආත්මයෙහිම පිරිනිවෙන්නේය. "ජාතිය ක්ෂය විය බ්‍රහ්මචය්‍ර්‍යාවෙහි වැස නිමවන ලදී. සතර මාර්ගයෙන්කළයුතු දෙය කරණලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැන ගණියි" (වදාළේය.)

## 8. ඒජා සූත්‍රය. (2)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ හත්වෙනි සූත්‍රය මෙන් වේළුවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, තෘෂ්ණාව රෝගයකි. තෘෂ්ණාව ගඩුවකි. තෘෂ්ණාව හුලකි, මහණෙනි, එහෙයින් මෙහිලා තථාගතතෙම තෘෂ්ණා රහිතවූයේ පහවූ තෘෂ්ණා හුල් ඇත්තේ වාසය කරයි. මහණෙනි, එහෙයින් මෙහිලා මහණ තෙමේද තෘෂ්ණා රහිතවූයේ පහවූ තෘෂ්ණා හුල් ඇතිව ඉදින් වාසය කිරීමට කැමති වන්නේනම් ඇස මමයයි නොහඟින්නේය. ඇස කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ඇස කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ඇස මාගේ යයි නොහඟින්නේය, රූපයන් මමයයි නොහඟින්නේය, රූපයන් කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, රූපය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, රූපයන් මාගේ යයි නොහඟින්නේය. චක්ඛු විඥානය මමයයි නොහඟින්නේය. චක්ඛු විඥානය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, චක්ඛු විඥානය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, චක්ඛු විඥානය මාගේයයි නොහඟින්නේය. චක්ඛු සම්ඵස්සය මමයයි නොහඟින්නේය, චක්ඛු සම්ඵස්සය කෙරෙහි මා ඇතැයි නො හඟින්නේය, චක්ඛු සම්ඵස්සයෙන් අනිකක් මමයයි නොහඟින්නේය, චක්ඛු සම්ඵස්සය මාගේයයි නොහඟින්නේය, චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්දනොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද එයද මමයයි නොහඟින්නේය, එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය, එය කෙරෙන්ද අනිකක් මමයයි නොහඟින්නේය එය මාගේ යයි නොහඟින්නේය.

"මහණෙනි, යමක් මමයයි හඟීද, යමක් කෙරෙහි මා ඇතැයි හඟිද, යමක් කෙරෙන් අනිකක් මමයයි හඟීද, යමක් මාගේයයි හඟීද, එය එයින් අන් ආකාරයක් වෙයි. අන් ආකාරයක් වන්නාවූ භවයෙහි ඇළුනාවූ ලොකය තෙම භවයටම කැමතිවෙයි.

"කණ මමයයි නොහඟින්නේය, කණ කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය. කණ කෙරෙන් අනිකක් මම යයි

නොහඟින්නේය, කණ මාගේයයි නොහඟින්නේය. ශබ්දය මමයයි නොහඟින්නේය, ශබ්දය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය. ශබ්දය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ශබ්දයන් මාගේයයි නොහඟින්නේය; සෝතවිඥානය මමයයි නොහඟින්නේය, සොත විඥානය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, සෝත විඥානය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, සෝත විඥානය මාගේයයි නොහඟින්නේය. සෝත සම්ඵස්සය මමයයි නොහඟින්නේය, සෝත සම්ඵස්සය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, සෝත සම්ඵස්සය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, සෝත සම්ඵස්සය මාගේයයි නොහඟින්නේය. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද මමයයි නොහඟින්නේය, එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය, එය කෙරෙන්ද අනිකක් මමයයි නොහඟින්නේය, එය මාගේයයි නොහඟින්නේය.

"මහණෙනි, යමක් මමයයි හඟීද, යමක් කෙරෙහි මා ඇතැයි හඟීද, යමක් කෙරෙන් අනිකක් මමයයි හඟීද, යමක් මාගේයයි හඟීද, එය එයින් අන් ආකාරයක් වෙයි. අන් ආකාරයක් වන්නාවූ භවයෙහි ඇළුනාවූ ලොකය තෙම භවයටම කැමතිවෙයි.

4. "නාසය මමයයි නොහඟින්නේය, නාසය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, නාසය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය. නාසය මාගේයයි නොහඟින්නේය, ගන්ධය මමයයි නොහඟින්නේය, ගන්ධය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ගන්ධය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ගන්ධයන් මාගේයයි නොහඟින්නේය, ඝාණ විඥානය මමයයි නොහඟින්නේය, ඝාණ විඥානය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ඝාණ විඥානය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ඝාණවිඥානය මාගේයයි නොහඟින්නේය, ඝාණ සම්ඵස්සය මමයයි නොහඟින්නේය, ඝාණසම්ඵස්සය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ඝාණසම්ඵස්සය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය,

ඝාණ සම්ඵස්සය මාගේයයි නොහඟින්නේය, ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද මමයයි නොහඟින්නේය, එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය, එය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, එය මාගේයයි නොහඟින්නේය.

"මහණෙනි, යමක් මමයයි හඟීද, යමක් කෙරෙහි මා ඇතැයි හඟීද, යමක් කෙරෙන් අනිකක් මමයයි හඟීද, යමක් මාගේයයි හඟීද, එය එයින් අන් ආකාරයක් වෙයි. අන් ආකාරයක් වන්නාවූ භවයෙහි ඇළුනාවූ ලෝකය තෙම භවයටම කැමතිවෙයි.

5. "දිව මමයයි නොහඟින්නේය, දිව කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, දිව කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය. දිව මාගේයයි නොහඟින්නේය, රසයන් මමයයි නොහඟින්නේය, රසයන් කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, රසයන් කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, රසයන් මාගේයයි නොහඟින්නේය, ජිව්හා විඤ්ඤාණය මමයයි නොහඟින්නේය, ජිව්හා විඤ්ඤාණය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ජිව්හා විඤ්ඤාණය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ජිව්හා විඤ්ඤාණය මාගේයයි නොහඟින්නේය, ජිව්හා සම්ඵස්සය මමයයි නොහඟින්නේය, ජිව්හා සම්ඵස්සය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ජිව්හා සම්ඵස්සය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ජිව්හා සම්ඵස්සය මාගේයයි නොහඟින්නේය. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද මමයයි නොහඟින්නේය, එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය, එය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, එය මාගේයයි නොහඟින්නේය.

"මහණෙනි, යමක් මමයයි හඟීද, යමක් කෙරෙහි මා ඇතැයි හඟීද, යමක් කෙරෙන් අනිකක් මමයයි හඟීද, යමක් මාගේයයි හඟීද, එය එයින් අන් ආකාරයක් වෙයි. අන් ආකාරයක් වන්නාවූ භවයෙහි ඇළුනාවූ ලෝකයතෙම භවයටම කැමති වෙයි.

**6.** "කය මමයයි නොහඟින්නේය, කය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, කය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය. කය මාගේයයි නොහඟින්නේය, ස්පර්ශය මමයයි නොහඟින්නේය, ස්පර්ශය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ස්පර්ශය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ස්පර්ශය මාගේයයි නොහඟින්නේය, කාය විඥානය මමයයි නොහඟින්නේය, කාය විඥානය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, කාය විඥානය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, කාය විඥානය මාගේයයි නොහඟින්නේය, කායසම්ඵස්සය මමයයි නොහඟින්නේය, කායසම්ඵස්සය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, කායසම්ඵස්සය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, කාය සම්ඵස්සය මාගේයයි නොහඟින්නේය. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද එයද මමයයි නොහඟින්නේය, එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය, එය කෙරෙන්ද අනිකක් මමයයි නොහඟින්නේය, එය මාගේයයි නොහඟින්නේය.

"මහණෙනි, යමක් මමයයි හඟීද, යමක් කෙරෙහි මා ඇතැයි හඟීද, යමක් කෙරෙන් අනිකක් මමයයි හඟීද, යමක් මගේයයි හඟීද, එය එයින් අන් ආකාරයක් වෙයි. අන් ආකාරයක් වන්නාවූ භවයෙහි ඇළුනාවූ ලෝකයතෙම භවයටම කැමති වෙයි.

**7.** "සිත මමයයි නොහඟින්නේය, සිත කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, සිත කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, සිත මාගේයයි නොහඟින්නේය, ධර්මයන් මමයයි නොහඟින්නේය, ධර්මයන් කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, ධර්මයන් කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, ධර්මයන් මාගේයයි නොහඟින්නේය, මනෝවිඥානය මමයයි නොහඟින්නේය, මනොවිඥානය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, මනෝ විඥානය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, මනෝවිඥානය මාගේයයි

නොහඟින්නේය, මනෝසම්ඵස්සය මමයයි නොහඟින්නේය, මනෝසම්ඵස්සය කෙරෙහි මා ඇතැයි නොහඟින්නේය, මනෝසම්ඵස්සය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, මනෝ සම්ඵස්සය මාගේයයි නොහඟින්නේය මනොසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද මමයයි නොහඟින්නේය, එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය, එය කෙරෙන් අනිකක් මමයයි නොහඟින්නේය, එය මාගේයයි නොහඟින්නේය.

"මහණෙනි, යමක් මමයයි හඟීද, යමක් කෙරෙහි මා ඇතැයි හඟීද, යමක් කෙරෙන් අනිකක් මමයයි හඟීද, යමක් මාගේයයි හඟීද, එයින් එය අන් ආකාරයක් වෙයි. අන් ආකාරයක් වන්නාවූ භවයෙහි ඇළුනාවූ ලෝකය තෙම භවයටම කැමතිවේ.

8. "මහණෙනි, යම්තාක් ස්කන්ධ, ධාතු, ආයතනයෝ වෙත්ද, එයද මමයයි නොහඟින්නේය. එය කෙරෙහිද මා ඇතැයි නොහඟින්නේය, එය කෙරෙන් අනිකක්ද මමයයි නොහඟින්නේය. එය මාගේයයි නොහඟින්නේය. මෙසේ නොහඟින්නාවූ හෙතෙම ලෝකයෙහි කිසිවක් මමය, මගේ යයි නොගනියි. මමය, මාගේයයි නොගන්නේ තෘෂ්ණා පිපාසයෙන් පිපාසිත නොවේ. පිපාසිත නොවන්නේ මේ ආත්මයෙහිම පිරිනිවෙයි. ජාතිය ක්ෂයවිය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. මේ සතර මාර්ගයෙන් කළයුත්ත කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැන ගණීයයි" වදාළේය.

## 9. ද්වය සූත්‍රය. (1)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 7 වෙනි සූත්‍රය මෙන් වේළුවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, තොපට දෙකක් දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, කවරනම් දෙකක්ද යත්; ඇසද රූපයෝද,

කණද ශබ්දයෝද, නාසයද ගන්ධයෝද, දිවද රසයෝද, කයද ස්පර්ශයෝද, සිතද ධර්මයෝද වෙත්. මහණෙනි, මෙය දෙකයයි කියනු ලැබේ.

3. "මහණෙනි, යමෙක් මම මේ දෙක අත්හැර අනික් දෙකක් දක්වන්නෙමියි කියන්නේ නම් ඔහුගේ කීම වචනයක් පමණක් වන්නේය. අසන ලද්දේද පිළිතුරකට නොපැමිණෙන්නේය. වඩාත් වෙහෙසට පැමිණෙන්නේය. ඊට හේතු කවරේද? මහණෙනි, විෂය නොවූවක් යම්සේද එමෙනැයි" වදාළේය.

---

## 10. ද්වය සූත්‍රය

(මේ සූත්‍රය මේ වර්ගයේ 7 වෙනි සූත්‍රය මෙන් වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, දෙකක් නිසා විඥානය හට ගනියි. මහණෙනි, කෙසේනම් දෙකක් නිසා විඥානය හට ගනීද? ඇසද, රූපයන්ද නිසා චක්ෂුර්විඥානය උපදියි. ඇස අනිත්‍යය. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයකට පෙරළෙන ස්වභාවය ඇත්තේය. රූපයෝ අනිත්‍යහ. පෙරළෙන ස්වභාව ඇත්තාහුය. අන් ආකාරයක් වන ස්වභාවය. මෙසේ මේ දෙකම සැලෙන්නේය. විනාශවන්නේය. අනිත්‍යය. පෙරළෙන ස්වභාවය, අන් ආකාරයක් වන ස්වභාවය. චක්ෂුර්විඥානයද අනිත්‍යය. පෙරළෙන ස්වභාවය, අන් ආකාරයක් වන ස්වභාවය, චක්ඛු විඥානයාගේ පහළවීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද, අනිත්‍යවේ. පෙරලෙන ස්වභාව ඇත්තේය. අන් ආකාරයක් වන ස්වභාවය.

"මහණෙනි, අනිත්‍යවූ ප්‍රත්‍යයක් නිසා හට ගත්තාවූ චක්ඛු විඥානය කෙසේ නම් නිත්‍ය වන්නේද, මහණෙනි, මේ ධර්මයන් තුන්දෙනාගේ යම් සමාගමයක් රැස්වීමක් එක්වීමක් වේද, මහණෙනි, මේ චක්ඛුසම්ඵස්සයයි කියනු ලැබේ. චක්ඛුසම්ඵස්සයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන්

ආකාරයක් වන ස්වභාවය චක්ඛු සම්ඵස්සයාගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද, අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නේය.

"මහණෙනි, අනිත්‍යවූ ප්‍රත්‍යයක් නිසා උපන්නාවූ චක්ඛු සම්ඵස්සය කෙසේ නම් නිත්‍ය වන්නේද, මහණෙනි, ස්පර්ශ කරණ ලද්දේ විඳියි. ස්පර්ශ කරණ ලද්දේ විධානය කරයි. ස්පර්ශ කරණ ලද්දේ හඳුනයි. මෙසේ මේ ධර්මයෝද සැලෙන්නාහුය. විනාශවන්නාහුය, අනිත්‍යයහ. පෙරළෙන ස්වභාවය ඇත්තාහුය. අන් ආකාරයක් වන්නාහුය.

3. කණද ශබ්දයන්ද නිසා සොත විඥානය උපදියි. කණ අනිත්‍යය. පෙරළෙන ස්වභාවය අන් ආකාරයකට පෙරළෙන ස්වභාවය ඇත්තේය. ශබ්දයෝ අනිත්‍යහ. පෙරළෙන ස්වභාව ඇත්තාහුය, අන් ආකාරයක් වන ස්වභාවය. මෙසේ මේ දෙකම සැලෙන්නේය. විනාශ වන්නේය. අනිත්‍යය. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන ස්වභාවය. සොත විඥානයද අනිත්‍යය. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන ස්වභාවය. සොත විඥානයාගේ පහළවීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද, ඒ ප්‍රත්‍යයද, අනිත්‍යවේ. පෙරළෙන ස්වභාව ඇත්තේය. අන් ආකාරයක් වන ස්වභාවය.

"මහණෙනි, අනිත්‍යවූ ප්‍රත්‍යයක් නිසා හට ගත්තාවූ සොත විඥානය කෙසේ නම් නිත්‍ය වන්නේද, මහණෙනි, මේ ධර්මයන් තුන්දෙනාගේ යම් සමාගමයක් රැස්වීමක් එක්වීමක් වේද, මහණෙනි, මේ සොත සම්ඵස්සයයි කියනු ලැබේ. සොත සම්ඵස්සයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන ස්වභාවය. සොත සම්ඵස්සයාගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හෙතුවද, ඒ ප්‍රත්‍යයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නේය.

"මහණෙනි, අනිත්‍යවූ ප්‍රත්‍යයක් නිසා උපන්නාවූ සොත සම්ඵස්සය කෙසේ නම් නිත්‍ය වන්නේද, මහණෙනි, ස්පර්ශ කරණ ලද්දේ විඳියි. ස්පර්ශ කරණ ලද්දේ විධානය කරයි. ස්පර්ශ

කරණ ලද්දේ හඳුනයි. මෙසේ මේ ධර්මයෝද සැලෙන්නාහුය. විනාශවන්නාහුය. අනිත්‍යයහ. පෙරළෙන ස්වභාවය ඇත්තාහුය. අන් ආකාරයක් වන්නාහුය.

4. නාසයද, ගන්ධයන්ද නිසා ඝාණ විඥානය උපදියි. නාසය අනිත්‍යය. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයකට පෙරළෙන ස්වභාවය ඇත්තේය. ගන්ධයෝ අනිත්‍යයහ. පෙරළෙන ස්වභාව ඇත්තාහුය. අන් ආකාරයක් වන ස්වභාවය මෙසේ මේ දෙකම සැලෙන්නේය. විනාශ වන්නේය. අනිත්‍යය. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන ස්වභාවය. ඝාණවිඥානයද අනිත්‍යය. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක්වන ස්වභාවය. ඝාණවිඥානයාගේ පහළවීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාව ඇත්තේය. අන් ආකාරයක් වන ස්වභාවය.

"මහණෙනි, අනිත්‍යවූ ප්‍රත්‍යයක් නිසා හටගත්තාවූ ඝාණ විඥානය කෙසේ නම් නිත්‍ය වන්නේද, මහණෙනි, මේ ධර්මයන් තුන්දෙනාගේ යම් සමාගමයක් රැස්වීමක් එක්වීමක් වේද, මහණෙනි, මේ ඝාණ සම්ඵස්සයයි කියනු ලැබේ. ඝාණ සම්ඵස්සයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන ස්වභාවය. ඝාණ සම්ඵස්සයාගේ ඉපදීමට යමක් හේතුවේද යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද අනිත්‍ය වේ. පෙරළෙන ස්වභාවය අන් ආකාරයක් වන්නේය.

"මහණෙනි, අනිත්‍යවූ ප්‍රත්‍යයක් නිසා උපන්නාවූ ඝාණ සම්ඵස්සය කෙසේ නම් නිත්‍ය වන්නේද, මහණෙනි, ස්පර්ශ කරණ ලද්දේ විඳියි. ස්පර්ශ කරණ ලද්දේ විධානය කරයි. ස්පර්ශ කරණ ලද්දේ හඳුනයි. මෙසේ මේ ධර්මයෝද සැලෙන්නාහුය. විනාශ වන්නාහුය. අනිත්‍යයහ. පෙරළෙන ස්වභාවය ඇත්තාහුය. අන් ආකාරයක් වන්නාහුය.

5. "දිවද, රසයන්ද නිසා ජිහ්වා විඥානය උපදියි. දිව අනිත්‍යය. පෙරළෙන ස්වභාව ඇත්තේය. අන් ආකාරයක් වන ස්වභාවය. රසයෝ අනිත්‍යයහ. පෙරළෙන ස්වභාව ඇත්තාහුය.

අන් ආකාරයක් වන්නාහුය. මෙසේ මේ ධර්ම දෙක සැලෙන්නේය. විනාශ වන්නේය. අනිත්‍යය. පෙරළෙන ස්වභාව ඇත්තේය. අන් ආකාරයක් වන ස්වභාවය. ජිහ්වා විඥානයද අනිත්‍යය. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නේය. ජිහ්වා විඥානයාගේ ඉපදීමට යමක් හේතු වේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නේය.

"මහණෙනි, අනිත්‍යවූම ප්‍රත්‍යයක් නිසා හට ගත්තාවූ ජිහ්වා විඥානය කෙසේ නිත්‍ය වන්නේද, මහණෙනි, යම් මේ ධර්මයන් තුන්දෙනාගේ සමාගමයක් රැස්වීමක් එක්වීමක් වේද, මේ ජිහ්වා සම්ඵස්සයයි කියනු ලැබේ. ජිහ්වා සම්ඵස්සයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවවේ. අන් ආකාරයක් වන්නේය. ජිහ්වා සම්ඵස්සයාගේ ඉපදීමට යම් හේතුවක් යම් ප්‍රත්‍යක් වේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නේය.

"මහණෙනි, අනිත්‍යවූම ප්‍රත්‍යයක් නිසා උපන්නාවූ ජිහ්වා සම්ඵස්සය කෙසේ නිත්‍ය වන්නේද, මහණෙනි, ස්පර්ශ කරණ ලද්දේ විඳියි. ස්පර්ශ කරණ ලද්දේ විධානය කරයි. ස්පර්ශ කරණ ලද්දේ හඳුනයි. මෙසේ මේ ධර්මයෝද සැලෙන්නාහුය. විනාශ වන්නාහුය. අනිත්‍යයහ. පෙරළෙන ස්වභාවවෙත්. අන් ආකාරයක් වන්නාහු වෙත්.

**6.** "කයද, ස්පර්ශයන්ද නිසා කාය විඥානය උපදියි. කය අනිත්‍යය. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයට පෙරළෙන ස්වභාවය ඇත්තේය. ස්පර්ශයෝ අනිත්‍යයහ. පෙරළෙන ස්වභාව ඇත්තාහුය. අන් ආකාරයක් වන ස්වභාවය. මෙසේ මේ දෙකම සැලෙන්නේය. විනාශ වන්නේය. අනිත්‍යය. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන ස්වභාවය. කාය විඤ්ඤාණයද අනිත්‍යය. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන ස්වභාවය. කාය විඤ්ඤාණයාගේ පහළවීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද, අනිත්‍යවේ. පෙරළෙන ස්වභාව ඇත්තේය. අන් ආකාරයක්වන ස්වභාවය.

"මහණෙනි, අනිත්‍යවූ ප්‍රත්‍යයක් නිසා හට ගත්තාවූ කාය විඤ්ඤාණය කෙසේ නම් නිත්‍ය වන්නේද, මහණෙනි, මේ ධර්මයන් තුන්දෙනාගේ යම් සමාගමයක් රැස්වීමක් එක්වීමක් වේද, මහණෙනි, මේ කාය සම්ඵස්සයයි කියනු ලැබේ. කාය සම්ඵස්සයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන ස්වභාවය කාය සම්ඵස්සයාගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නේය.

"මහණෙනි, අනිත්‍යවූ ප්‍රත්‍යයක් නිසා උපන්නාවූ කාය සම්ඵස්සය කෙසේ නම් නිත්‍ය වන්නේද, මහණෙනි, ස්පර්ශ කරණ ලද්දේ විඳියි. ස්පර්ශ කරණ ලද්දේ විධානය කරයි. ස්පර්ශ කරණ ලද්දේ හඳුනයි. මෙසේ මේ ධර්මයෝද සැලෙන්නාහුය. විනාශ වන්නාහුය, අනිත්‍යයහ. පෙරළෙන ස්වභාවය ඇත්තාහුය. අන් ආකාරයක් වන්නාහුය.

7. "සිතද ධර්මයන්ද නිසා මනොවිඤ්ඤාණය උපදියි. සිත අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නේය. ධර්මයෝ අනිත්‍යයහ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නාහුය. මෙසේ මේ දෙක සැලෙන්නේය, විනාශ වන්නේය, අනිත්‍යය, පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නේය. මනො විඤ්ඤාණයද අනිත්‍යය. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නේය. මනො විඤ්ඤාණයාගේ ඉපදීමට යම් හේතුවක් යම් ප්‍රත්‍යයක් වේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නේය.

"මහණෙනි, අනිත්‍යවූම ප්‍රත්‍යයක් නිසා උපන්නාවූ මනොවිඤ්ඤාණය කෙසේ නිත්‍ය වන්නේද, මහණෙනි, මේ තුන්වැදෑරුම්වූ ධර්මයන්ගේ යම් සමාගමයක් රැස්වීමක් එක්වීමක් වේද, මහණෙනි මෙය මනො සම්ඵස්ස යයි කියනු ලැබේ. මනො සම්ඵස්සයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නේය. මනො සම්ඵස්සයාගේ ඉපදීමට යම් හේතුවක් යම් ප්‍රත්‍යයක් වේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද අනිත්‍යවේ. පෙරළෙන ස්වභාවය. අන් ආකාරයක් වන්නේය. මහණෙනි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අනිත්‍යවූම ප්‍රත්‍යයක් නිසා උපන්නාවූ මනො සම්ඵස්සය කෙසේ නිත්‍ය වන්නේද, මහණෙනි, ස්පර්ශ කරණ ලද්දේ විඳියි. ස්පර්ශ කරණ ලද්දේ විධානය කරයි. ස්පර්ශ කරණ ලද්දේ හඳුනයි. මෙසේ මේ ධර්මයෝද සැලෙන්නාහුය. විනාශ වන්නාහුය. අනිත්‍යයහ. පෙරළෙන ස්වභාවයහ අන් ආකාරයක් වන්නාහුය. මහණෙනි, මෙසේ වනාහි දෙකක් නිසා විඤ්ඤාණය හටගණීයයි" වදාළේය.

**(සතරවන ඡන්න වර්ගය නිමි.)**

---

## 5. ඡල වර්ගය.

### 1 සංගය්හ සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහිවූ "කලන්දක නිවාප" නම් ලත් වේළු (උණ) වනයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන්හට කථාකළ සේක. පින්වතුන්වහන්සැයි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනාකළ සේක.

2. 'මහණෙනි, දමනය නොකරන ලද්දාවූ ගෝපනය නොකරන ලද්දාවූ නොරක්නා ලද්දාවූ සංවර නොකරන ලද්දාවූ මේ ස්පර්ශායතනයෝ සදෙනෙක් අධික දුක් එලවන්නාහු වෙත්, කවර සදෙනෙක්ද යත්?

"මහණෙනි, දමනය නොකරන ලද්දාවූ ගොපනය නොකරන ලද්දාවූ, නොරක්නා ලද්දාවූ, සංවර නොකරන ලද්දාවූ චක්ඛුඑස්සායතනය අධික දුක් එලවන්නේ වෙයි.

"මහණෙනි, දමනය නොකරන ලද්දාවූ, ගොපනය නොකරන ලද්දාවූ, නොරක්නා ලද්දාවූ, සංවර නොකරන ලද්දාවූ සෝතඑස්සායතනය අධික දුක් එලවන්නේ වෙයි.

"මහණෙනි, දමනය නොකරන ලද්දාවූ, ගොපනය නොකරන ලද්දාවූ, නොරක්නා ලද්දාවූ, සංවර නොකරන ලද්දාවූ ඝාණඵස්සායතනය අධික දුක් එලවන්නේ වෙයි.

"මහණෙනි, දමනය නොකරන ලද්දාවූ, ගොපනය නොකරන ලද්දාවූ, නොරක්නා ලද්දාවූ, සංවර නොකරන ලද්දාවූ ජිව්හාඵස්සායතනය අධික දුක් එලවන්නේ වෙයි.

'මහණෙනි, දමනය නොකරන ලද්දාවූ, ගොපනය නොකරන ලද්දාවූ, නොරක්නා ලද්දාවූ, සංවර නොකරන ලද්දාවූ කායඵස්සායතනය අධික දුක් එලවන්නේ වෙයි.

"මහණෙනි, දමනය නොකරන ලද්දාවූ, ගොපනය නොකරන ලද්දාවූ, නොරක්නා ලද්දාවූ, සංවර නොකරන ලද්දාවූ මනෝඵස්සායතනය අධික දුක් එලවන්නේ වෙයි.

"මහණෙනි, දමනය නොකරන ලද්දාවූ ගොපනය නොකරන ලද්දාවූ නොරක්නා ලද්දාවූ සංවර නොකරන ලද්දාවූ මේ ස්පර්ශ ආයතනයෝ සදෙන අධික දුක් එලවන්නහු වෙත්.

3. 'මහණෙනි, මනාව දමනය කරන ලද්දාවූ, මනාව ගොපනය කරන ලද්දාවූ මනාව රක්නා ලද්දාවූ, මනාව සංවර කරන ලද්දාවූ මේ ස්පර්ශ ආයතනයෝ සදෙන අධික සැප එලවන්නාහු වෙත්. කවර සදෙනෙක්ද යත්?

"මහණෙනි, මනාව දමනය කරන ලද්දාවූ, මනාව ගොපනය කරන ලද්දාවූ මනාව රක්නා ලද්දාවූ, මනාව සංවර කරන ලද්දාවූ, චක්ඛුඵස්සායතනය අධික සැප එලවන්නේ වෙයි.

"මහණෙනි, මනාව දමනය කරන ලද්දාවූ, මනාව ගොපනය කරන ලද්දාවූ, මනාව රක්නා ලද්දාවූ, මනාව සංවර කරන ලද්දාවූ, සෝත ඵස්සායතනය අධික සැප එලවන්නේ වෙයි.

"මහණෙනි, මනාව දමනය කරන ලද්දාවූ, මනාව ගොපනය කරන ලද්දාවූ, මනාව රක්නා ලද්දාවූ, මනාව සංවර කරන ලද්දාවූ, ඝාණඵස්සායතනය අධික සැප එලවන්නේ වෙයි.

"මහණෙනි, මනාව දමනය කරන ලද්දාවූ, මනාව ගොපනය කරන ලද්දාවූ, මනාව රක්නා ලද්දාවූ, මනාව සංවර කරන ලද්දාවූ, ජිව්හාඵස්සායතනය අධික සැප එලවන්නේ වෙයි.

"මහණෙනි, මනාව දමනය කරන ලද්දාවූ, මනාව ගොපනය කරන ලද්දාවූ, මනාව රක්නා ලද්දාවූ, මනාව සංවර කරන ලද්දාවූ, කායඵස්සායතනය අධික සැප එලවන්නේ වෙයි.

"මහණෙනි, මනාව දමනය කරන ලද්දාවූ, මනාව ගොපනය කරන ලද්දාවූ, මනාව රක්නා ලද්දාවූ, මනාව සංවර කරන ලද්දාවූ, මනෝඵස්සායතනය අධික සැප එලවන්නේ වෙයි.

"මහණෙනි, මනාව දමනය කරන ලද්දාවූ, මනාව ගොපනය කරන ලද්දාවූ, මනාව රක්නා ලද්දාවූ, මනාව සංවර කරන ලද්දාවූ, මේ ස්පර්ශායතනයෝ සදෙන වනාහි අධික සැප එලවන්නාහු වෙත්" භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. මෙසේ වදාරා, සුගතවූ ශාස්තෲන් වහන්සේ නැවත එයම (මෙසේ) වදාළසේක.

4. (1) "මහණෙනි, යම් ආයතනයන්හි අසංවරවූයේ දුකට පැමිණේද, එවැනි ආයතනයෝ සයක් වෙත්. යම් කෙනෙක් ඔවුන්ගේ සංවරයට පැමිණියාහුද, ශ්‍රද්ධාව දෙවෙනි කොට ඇත්තාහුද, ඔවුහු කෙලෙසුන් ගෙන් තෙත් නොවී වාසය කරත්.

(2) "ප්‍රිය රූපයන් දැකද තවද අප්‍රිය රූපයන් දැකද ප්‍රිය රූපයෙහි ඇලීම දුරු කරන්නේය. මට අප්‍රියයි සිත දූෂ්‍ය නොකරන්නේය.

(3) 'ප්‍රියවූද, අප්‍රියවූද, දෙවදෑරුම් ශබ්දයද අසා ප්‍රියවූ ශබ්දයෙහි මූර්ඡා සහිතවූවෙක් නොවන්නේය. තවද, ප්‍රියවූ ශබ්දයෙහි ද්වෙෂ සහගත සිත දුරු කරන්නේය. මට අප්‍රිය යයි, සිත දූෂ්‍ය නොකරන්නේය.

(4) "සිත් කලුවූ මනා සුවඳ ඇත්තාවූ ගන්ධයද ආඝ්‍රාණය කොට, තවද අපවිත්‍රවූ නොකැමැතිවූ ගන්ධයද

ආඝ්‍රාණය කොට නොකැමැතිවූ ගන්ධයෙහි ද්වෙෂය දුරු කරන්නේය. කැමැතිවූ ගන්ධය ඡන්දය අනුව නොපවත්නේය.

(5) "රස විඳීම් ඇත්තාවූද, මිහිරිවූද, රසය අනුභව කොටද, තවද සමහර කලෙක නොමිහිරි රසය අනුභව කොටද, මිහිරි රසයෙහි වැදගෙන අනුභව නොකරන්නේය නොමිහිරි රසයන්හි විරුද්ධ බවක් පහළ නොකරන්නේය.

(6) "සැපවූ ස්පර්ශය ස්පර්ශ කරණ ලද්දේ මත් නොවන්නේය දුක්වූ ස්පර්ශය ස්පර්ශ කරණ ලද්දේද කම්පා නොවන්නේය. සැප දුක් ස්පර්ශ දෙකෙහි උපෙක්ෂා ඇත්තේ වෙයි. කිසිවෙකු සමගත් ඇලෙන්නේද, විරුද්ධ වන්නේද නොවන්නේය.

(7) "කිලෙස සංඥාවෙන් ප්‍රමාදවූ ලාමකවූ සත්වයෝ ප්‍රමාද වන්නාහු ව්‍රත දුක්ඛයට එළඹෙත්. පඤ්චකාම ගුණ නිශ්‍රිතවූ සියලු විතර්කය දුරලා (මහණතෙම) නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කිරීමෙන්ම වාසය කරයි.

(8) මෙසේ සිත ෂඩාරම්මණයන්හි යම් කලෙක යහපත්ලෙස වඩනා ලද්දේද, ස්පර්ශ කරණ ලද්දාවූ ඔහුගේ සිත කිසි තැනෙක්හිත් කම්පා නොවන්නේය. මහණෙනි, රාගය හා ද්වෙෂය මැඩ පවත්වා ජාති ජරා මරණ දෙදෙනාගේ පරතෙරට ගියාහු වව්යයි' වදාළේය.

---

## 2. සංගය්හ සූත්‍රය (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහිවූ "කලන්දක නිවාප" නම් ලත් වේළු (උණ) වනයෙහි වාසය කරන සේක.

2. ඉක්බිති ආයුෂ්මත් මාලුංක්‍ය පුත්‍ර නම් ස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් මාලුංක්‍ය පුත්‍ර ස්ථවිර තෙම

භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. 'ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා එකලාව සමූහයෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීයර්‍යයෙන් යුක්තව ආත්ම පරිත්‍යාගයෙන් වාසය කරන්නෙම්ද, භාග්‍යවතුන් වහන්සේ මට එබඳු ධර්මයක් සැකෙවින් දෙශනා කරණ සේක්නම් මැනව" කියායි.

3. "මාලුංක්‍ය පුත්‍රය, ජරාජීර්ණවූ වයොවෘද්ධවූ මහලුවූ කල් ඉක්මවූ වැඩි වයසට පැමිණියාවූ භික්ෂුවක්වූ නුඹ වනාහි සැකෙවින් අවවාදය ඉල්ලන්නෙහිය. මේ කාරණයෙහි ලා තරුණ භික්ෂූන්ට කුමක් කියන්නෙමුද?"

"ස්වාමීනි, මම ජරාජීර්ණවූ වයෝවෘද්ධවූ මහලුවූ කල් ඉක්මගිය වයස්ගත වූයෙක් වී නමුත් ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට සැකෙවින් ධර්මය දේශනා කරණ සේක්වා. සුගතයන් වහන්සේ මට සැකෙවින් ධර්මය දෙශනා කරණ සේක්වා. මම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවෙහි අර්ථය දැන ගන්නෙම් නම්, යෙහෙක. මම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට උරුමක්කාරයෙක් වන්නෙම් නම් යෙහෙකැයි" කීය.

4. "මාලුංක්‍ය පුත්‍රය, ඒ කුමකැයි හඟින්නෙහිද? ඇසින් දතයුතුවූ, නුදුටුවාවූ නුදුටුවිරූ යම් ඒ රූපයෝ වෙත්ද (දැනුදු) ඒ රූපයන් නොදක්නෙහිද, (මතු) ඒ රූපයන් දක්නෙමියි නොසිතෙයිද (එවිට) තොපට එහි කැමැත්තක් හෝ ඇල්මක් හෝ ප්‍රේමයක් හෝ ඇත්තේද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"කණින් දතයුතුවූ, නො ඇසුවාවූ නො අසනලද විරූ යම් මේ ශබ්දයෝ වෙත්ද, (දැනුදු) ඒ ශබ්දයන් නොඅසන්නෙහිද, (මතු) ඒ ශබ්දයන් අසන්නෙමියි නොසිතෙයිද (එවිට) තොපට එහි කැමැත්තක් හෝ ඇල්මක් හෝ ප්‍රේමයක් හෝ ඇත්තේද?"- "ස්වාමීනි, එය නොවේමැයි."

"නාසයෙන් දතයුතුවූ ආඝ්‍රාණය නොකළාවූ ආඝ්‍රාණය නොකළවිරූ යම් මේ ගන්ධයෝ වෙත්ද. (දැනුදු) ඒ ගන්ධයන්

ආඝ්‍රාණය නොකෙරෙහිද, (මතු) ඒ ගන්ධයන් ආඝ්‍රාණය කරන්නෙමියි නොසිතෙයිද (එවිට) තොපට එහි කැමැත්තක් හෝ ඇල්මක් හෝ ප්‍රේමයක් හෝ ඇත්තේද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"දිවෙන් දතයුතුවූ රස නොවින්දාවූ රස නොවිඳින ලදවිරූ යම් මේ රසයෝවෙත්ද, (දැනුදු) ඒ රස නොවිඳින්නෙහිද, (මතු) ඒ රසයන් රස විඳින්නෙමියි නොසිතෙයිද (එවිට) තොපට එහි කැමැත්තක් හෝ ඇල්මක් හෝ ප්‍රේමයක් හෝ ඇත්තේද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"කයින් දතයුතුවූ ස්පර්ශ නොකළාවූ ස්පර්ශ නොකළවිරූ යම් මේ ස්පර්ශයෝ වෙත්ද, (දැනුදු) ඒ ස්පර්ශයන් ස්පර්ශය නොකෙරෙහිද, (මතු) ඒ ස්පර්ශයන් ස්පර්ශ කරන්නෙමියි නොසිතෙයිද (එවිට) තොපට එහි කැමැත්තක් හෝ ඇල්මක් හෝ ප්‍රේමයක් හෝ ඇත්තේද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"සිතින් දතයුතුවූ නොදන්නා ලද්දාවූ නොදන්නා ලදවිරූ යම් මේ ධර්මයෝ වෙත්ද, (දැනුදු) ඒ ධර්මයන් නොදන්නෙහිද, (මතු) ඒ ධර්මයන් දැනගන්නෙමියි නොසිතෙයිද (එවිට) තොපට එහි කැමැත්තක් හෝ ඇල්මක් හෝ ප්‍රේමයක් හෝ ඇත්තේද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

5. "මාලුංක්‍යා පුත්‍රය, මෙහිද තොපට ඇසින් කණින් නැහැයෙන් දිවෙන් කයින් සිතෙන් දතයුතු ධර්මයන් අතුරෙන් දක්නා ලද්දෙහි, දැකීම පමණක් වන්නේය. අසන ලද්දෙහි ඇසීම පමණක් වන්නේය, සිඹින ලද්දෙහි සිඹීම පමණක් වන්නේය. රස විඳින ලද්දෙහි රස විඳීම පමණක් වන්නේය. ස්පර්ශ කරන ලද්දෙහි ස්පර්ශ කිරීම පමණක් වන්නේය. දන්නා ලද්දෙහි දැනගැනීම පමණක් වන්නේය.

"මාලුංක්‍යා පුත්‍රය, යම්කලෙක තොපට ඇස, කණ, නැහැය, දිව, කය සහ සිත යන මෙයින් දතයුතු ධර්මයන් අතුරෙහි දුටු දෙයෙහි දැකීම පමණක් වන්නේද, ඇසූ දෙයෙහි ඇසීම පමණක් වන්නේද, සිඹින ලද දෙයෙහි සිඹීම පමණක් වන්නේද, රස

විඳින ලද දෙයෙහි රස විඳීම පමණක් වන්නේද, ස්පර්ශ කරන ලද දෙයෙහි ස්පර්ශ කිරීම පමණක් වන්නේද, දැන ගත් දෙයෙහි දැනගැනීම පමණක් වන්නේද, මාලුංක්‍ය පුත්‍රය, එකල්හි නුඹ එයින් (ඒ රාගාදියෙන් රත් වූවෙක්) නොවන්නෙහිය, මාලුංක්‍ය පුත්‍රය, යම් කලෙක නුඹ එයින් යුක්ත නොවෙහිද, මාලුංක්‍ය පුත්‍රය, එකල්හි නුඹ එහි ඒ දිට්ඨි ආදියෙහි ඇළුනෙක් නොවෙහිය. මාලුංක්‍ය පුත්‍රය, යම් කලෙක නුඹ එහි ඇළුනෙක් නොවෙහිද, මාලුංක්‍ය පුත්‍රය, එකල්හි නුඹ මෙලොවද නැත පරලොවද නැත දෙලොවෙහිම නැත. මෙයම දුක්ඛයාගේ කෙළවර වේයයි" වදාළේය. "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් දේශනා කරණ ලද මේ ධර්මයාගේ අර්ථය විස්තර වශයෙන් දනිමි.

**6.** "රූපය දැක ප්‍රිය අරමුණක් වශයෙන් මෙනෙහි කරන්නහුගේ සිහිය විනාශවේ. හෙතෙම ඇලෙන්නාවූ සිතින් එය විඳියි. එහි ගිලී සිටියි.

"ඔහුට රූපය නිසා හට ගන්නාවූ නොයෙක් විඳීම් වැඩෙත්. අභිධ්‍යාවෙන්ද විහිංසාවෙන්ද ඔහුගේ සිත නැසේ. මෙසේ දුක් රැස් කරන්නහුට නිවණ දුරයයි කියනු ලැබේ.

"ශබ්දයක් අසා ප්‍රිය අරමුණක් වශයෙන් මෙනෙහි කරන්නහුගේ සිහිය විනාශවේ. ඇළුම් සහිත සිත් ඇත්තේ එයද විඳියි. එහි ගිලී සිටියි.

"ඔහුට ශබ්දය නිසා හටගන්නාවූ නොයෙක් විඳීම් වැඩෙත්. අභිධ්‍යාවෙන්ද, විහිංසාවෙන්ද, මොහුගේ සිත නැසේ. මෙසේ දුක් රැස් කරන්නහුට නිවණ දුරයයි කියනු ලැබේ.

'ගඳ ආඝ්‍රාණය කොට ප්‍රිය අරමුණක් වශයෙන් මෙනෙහි කරන්නහුගේ සිහිය විනාශවේ. ඇළුම් සහිත සිත් ඇත්තේ එයද විඳියි. එහි ගැලී සිටියි.

"ඔහුට ගන්ධය නිසා හටගන්නාවූ නොයෙක් විඳීම් වැඩෙත්, අභිධ්‍යාවෙන්ද විහිංසාවෙන්ද මොහුගේ සිත නැසේ. මෙසේ දුක රැස් කරන්නහුට නිවන දුරයයි කියනු ලැබේ.

"රසය විඳ ප්‍රියවූ අරමුණක් වශයෙන් මෙනෙහි කරන්නහුගේ සිහිය විනාශවේ. ඇළුම් සහිත සිත් ඇත්තේ එයද විඳියි. එහි ගැලී සිටී. ඔහුට රසය නිසා හටගන්නාවූ විඳීම් වැඩෙත්. අභිධ්‍යාවෙන්ද, විහිංසාවෙන්ද මොහුගේ සිත නැසේ. මෙසේ දුක රැස්කරන්නහුට නිවන දුරයයි කියනු ලැබේ.

(ස්පර්ශයක්) ස්පර්ශ කොට ප්‍රියවූ අරමුණක් වශයෙන් මෙනෙහි කරන්නහුගේ සිහිය විනාශවේ. ඇළුම් සහිත සිත් ඇත්තේ එයද විඳියි. එහි ගැලී සිටියි. ඔහුට ස්පර්ශය නිසා හටගන්නාවූ නොයෙක් විඳීම් වැඩෙත්. අභිධ්‍යාවෙන්ද, විහිංසාවෙන්ද මොහුගේ සිත නැසේ. මෙසේ දුක් රැස්කරන්නහුට නිවණ දුරයයි කියනු ලැබේ.

"ධර්මාරමුණු දැන ප්‍රියවූ අරමුණක් වශයෙන් මෙනෙහි කරන්නහුගේ සිහිය විනාශවේ. ඇළුම් සිත් ඇත්තේ එයද විඳියි. එහි ගැලී සිටියි. ඔහුට ධර්මාරම්මණය නිසා හටගන්නාවූ නොයෙක් විඳීම් වැඩෙත්. අභිධ්‍යාවෙන්ද විහිංසාවෙන්ද මොහුගේ සිත වැනසේ. මෙසේ දුක් රැස්කරන්නහුට නිවණ දුරයයි කියනු ලැබේ.

7. "හෙතෙම සිහියෙන් යුක්තව රූපයක් දැක රූපයන්හි නො ඇලෙයිද, නොඇලුණු සිතින් එය විඳියිද, එහි නොගිලී සිටියිද, රූපය දක්නාවූද වේදනාව සේවනය කරන්නාවූද, ඔහුට දුක යම්සේ ක්ෂයවේද, රැස් නොවේද, එසේ හෙතෙම සිහියෙන් යුක්තව වාසය කරයි. මෙසේ දුක් රැස් නොකරන්නහුට නිවණ ළඟයයි කියනු ලැබේ.

"හෙතෙම සිහියෙන් යුක්තව ශබ්දය අසා ශබ්දයන්හි නො ඇලෙයි. නො ඇලුනු සිතින් එයද විඳියි, එහි නොගැලී සිටියි. ශබ්දය අසන්නාවූද වේදනාව සේවනය කරන්නාවූද මොහුට යම්සේ දුක ක්ෂයවේද, රැස් නොවේද, එසේ හෙතෙම සිහියෙන් යුක්තව වාසය කරයි. මෙසේ දුක රැස් නොකරන්නහුට නිවණ ළඟයයි කියනු ලැබේ.

"හෙතෙම සිහියෙන් යුක්තව ගන්ධය ආඝ්‍රාණය කොට ගන්ධයන්හි නොඇලෙයි. නොඇළුනු සිතින් එයද විඳියි. එහි

නොගැලී සිටියි. ගන්ධය ආඝ්‍රාණය කරන්නාවූද වේදනාව සේවනය කරන්නාවූද මොහුට යම්සේ දුක ක්ෂය වේද, රැස් නොවේද, මෙසේ හෙතෙම සිහියෙන් යුක්තව වාසය කරයි. මෙසේ දුක් රැස් නොකරන්නහුට නිවණ ලඟයයි කියනු ලැබේ.

"හෙතෙම සිහියෙන් යුක්තව රසය විඳ රසයන්හි නොඇලෙයි, නො ඇළුනු සිතින් එයද විඳියි, එහි නොගැලී සිටියි. රසය විඳින්නාවූද, වේදනාව සේවනය කරන්නාවූද, මොහුට යම්සේ දුක ක්ෂය වේද, රැස් නොවේද, එසේ හෙතෙම සිහියෙන් යුක්තව වාසය කරයි. මෙසේ දුක් රැස් නොකරන්නහුට නිවණ ලඟයයි කියනු ලැබේ.

"හෙතෙම සිහියෙන් යුක්තව ස්පර්ශයක් ස්පර්ශකොට ස්පර්ශයන්හි නොඇලෙයි. නොඇළුනු සිතින් එයද විඳියි. එහි නොගැලී සිටියි. ස්පර්ශයක් ස්පර්ශ කරන්නාවූද, වේදනාව සේවනය කරන්නාවූද, මොහුට යම්සේ දුක ක්ෂය වේද, රැස් නොවේද, එසේ හෙතෙම සිහියෙන් යුක්තව වාසය කරයි. මෙසේ දුක් රැස් නොකරන්නහුට නිවණ ලඟයයි කියනු ලැබේ.

"හෙතෙම සිහියෙන් යුක්තව ධර්මාරම්මණයන් දැන ධර්මයන්හි නො ඇලෙයි, නොඇළුනු සිතින් එයද විඳියි. එහි නොගැලී සිටියි. ධර්මාරම්මණයන් දන්නාවූද වේදනාව සේවනය කරන්නාවූද මොහුට යම්සේ දුක ක්ෂය වේද, රැස් නොවේද, මෙසේ හෙතෙම සිහි ඇතුව වාසය කරයි. මෙසේ දුක රැස් නොකරන්නහුට නිවණ ලඟයයි කියනු ලැබේ."

"ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරණ ලද මේ ධර්මයාගේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දනිමියි" (කීයේය.)

8. "මාලුංක්‍ය පුත්‍රය, යහපත, යහපත, මාලුංක්‍ය පුත්‍රය, නුඹ මා විසින් කොටින් කියන ලද්දහුගේ අර්ථය විස්තර වශයෙන් දැන ගත්තෙහිය, යහපත.

(මෙහි මේ සූත්‍රයේ 6, 7 ඡේද යොදා ගතයුතුයි.)

"මාලුංක්‍යා පුත්‍රය, මා විසින් සැකෙවින් කියන ලද්දාවූ මේ ධර්මයාගේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දත යුත්තේ යයි" වදාළේය.

**9.** ඉක්බිති ආයුෂ්මත් මාලුංක්‍යා පුත්‍ර ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගෞරව කොට ගියේය. ඉක්බිති ආයුෂ්මත් මාලුංක්‍යා පුත්‍ර ස්ථවිරතෙම හුදකලාව සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීය්‍ය්‍යීයෙන් යුක්තව ආත්මපරිත්‍යාගයෙන් වාසය කරන්නේ නොබෝ කලකින්ම යමක් සඳහා කුල පුත්‍රයෝ මනාකොටම ගිහි ගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචය්‍ය්‍යීාව කෙළවරකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙළේය.

ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචය්‍ය්‍යීාව වැස නිමවන ලද්දේය. සතර මගින් කළයුත්ත කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගත්තේය. ආයුෂ්මත් මාලුංක්‍යා පුත්‍ර ස්ථවිරතෙමේ වනාහි රහතුන්ගෙන් එක්තරා කෙනෙක්ද වූයේයයි වදාළේය.

---

## 3. පරිහාන සූත්‍රය

1. (මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, තොපට පිරිහීමට හේතුවන ධර්මයද නොපිරිහීමට හේතුවන ධර්මයද මැඩපවත්වන ලද සවැදෑරුම්වූ ආයතනයන්ද දෙශනාකරන්නෙමි. එය අසව්. මහණෙනි පරිහානි ධර්මය කෙසේ නම් වේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් හට ඇසින් රූපයක් දැක අරමුණු වලට දුවන්නාවූ බැඳීමට

හේතුවූ ලාමකවූ අකුශල කල්පනාවෝ උපදිත්ද ඉදින් භික්ෂුතෙම ඒ කල්පනා ඉවසාද, නොහරීද, දුරු නොකෙරේද, කෙළවර නොකෙරේද, විනාශ නොකරයිද, මහණෙනි, මෙය භික්ෂූහු විසින් කුශල ධර්මයන්ගෙන් පිරිහීමයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදැයි දත යුතුයි.

3. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට කණින් ශබ්දයක් අසා අරමුණු වලට දුවන්නාවූ, බැඳීමට හෙතුවූ, ලාමකවූ අකුශල කල්පනාවෝ උපදිත්ද ඉදින් භික්ෂුතෙම ඒ කල්පනා ඉවසාද, නොහරීද, දුරු නොකෙරේද, කෙළවර නොකෙරේද විනාශ නොකරයිද, මහණෙනි, මෙය භික්ෂුව විසින් කුශල ධර්මයන්ගෙන් පිරිහීමයයි දත යුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය පිරිහීමයයි වදාරණ ලදී.

4. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට නාසයෙන් ගඳක් දැන අරමුණුවලට දුවන්නාවූ, බැඳීමට හේතුවූ ලාමකවූ අකුශල කල්පනාවෝ උපදිත්ද ඉදින් භික්ෂුතෙම ඒ කල්පනා ඉවසාද, නොහරීද, දුරු නොකෙරේද, කෙළවර නොකෙරේද, විනාශ නොකරයිද මහණෙනි මෙය භික්ෂුව විසින් කුශල ධර්මයන්ගෙන් පිරිහීමයයි දත යුතුයි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය පිරිහීමයයි වදාරණ ලදී.

5. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට දිවෙන් රස විඳ අරමුණුවලට දුවන්නාවූ, බැඳීමට හේතුවූ, ලාමකවූ අකුශල කල්පනාවෝ උපදිත්ද ඉදින් භික්ෂුතෙම ඒ කල්පනා ඉවසාද, නොහරීද, දුරු නොකෙරේද, කෙළවර නොකෙරේද, විනාශ නොකරයිද, මහණෙනි, මෙය භික්ෂුව විසින් කුශල ධර්මයන්ගෙන් පිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන්වහන්සේ විසින් මෙය පිරිහීමයයි වදාරණ ලදී.

6. 'මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට කයින් ස්පර්ශයක් කොට අරමුණුවලට දුවන්නාවූ, බැඳීමට හෙතුවූ, ලාමකවූ අකුශල කල්පනාවෝ උපදිත්ද ඉදින් භික්ෂුතෙම ඒ කල්පනා ඉවසාද, නොහරීද, දුරු නොකෙරේද, කෙළවර

නොකෙරේද, විනාශ නොකරයිද මහණෙනි, මෙය භික්ෂුව විසින් කුශල ධර්මයන්ගෙන් පිරිහීමයයි දත යුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය පිරිහීමයයි වදාරණ ලදී.

7. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට සිතින් ධර්මාරමුණු දැන අරමුණු කරා දුවන්නාවූ, බන්ධනයට හේතුවූ ලාමකවූ, අකුශල කල්පනාවෝ උපදිත්ද ඉදින් භික්ෂුතෙම ඒ කල්පනා ඉවසාද, අත්නොහරීද, දුරු නොකෙරේද, කෙළවර නොකෙරේද, විනාශ නොකෙරේද, මහණෙනි, මෙය භික්ෂුව විසින් කුශල ධර්මයන්ගෙන් පිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය පිරිහීමයයි වදාරණ ලදී. මහණෙනි, මෙසේ වනාහි පරිහානි ධර්මය වේ.

8. "මහණෙනි, කෙසේ නම් අපරිහානි ධර්මය වේද?, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුහට ඇසින් රූපයක් දැක අරමුණට දුවන්නාවූ, බැඳීමට හේතුවූ, ලාමකවූ අකුශල කල්පනාවෝ උපදිත්ද මහණෙනි, ඉදින් භික්ෂුතෙම එය නොඉවසාද, හැරදමාද, දුරුකෙරේද, කෙළවර කෙරේද, විනාශ කෙරේද, මහණෙනි, මෙසේ භික්ෂුව විසින් කුශල ධර්මයන්ගෙන් නොපිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොපිරිහීමයයි වදාරණ ලදී.

9. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට කණින් ශබ්දය අසා අරමුණට දුවන්නාවූ, බැඳීමට හේතුවූ, ලාමකවූ අකුශල කල්පනාවෝ උපදිත්ද, මහණෙනි, ඉදින් භික්ෂුතෙම එය නොඉවසාද, හැරදමාද, දුරු කෙරේද, කෙළවර කෙරේද, විනාශ කෙරේද, මහණෙනි, මෙසේ භික්ෂුව විසින් කුශල ධර්මයන්ගෙන් නොපිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොපිරිහීමයයි වදාරණ ලදී.

10. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට නාසයෙන් ගන්ධය දැන අරමුණට දුවන්නාවූ, බැඳීමට හේතුවූ, ලාමකවූ අකුශල කල්පනාවෝ උපදිත්ද මහණෙනි, ඉදින් භික්ෂුතෙම එය නොඉවසාද, හැරදමාද, දුරු කෙරේද, කෙළවර

කෙරේද, විනාශ කෙරේද, මහණෙනි, මෙසේ භික්ෂුව විසින් කුසල ධර්මයන්ගෙන් නොපිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොපිරිහීමයයි වදාරණ ලදී.

11. “මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට කයින් ස්පර්ශයක් කොට අරමුණට දුවන්නාවූ, බැඳීමට හෙතුවූ ලාමකවූ අකුසල කල්පනාවෝ උපදිත්ද, මහණෙනි, ඉදින් භික්ෂුතෙම එය නොඉවසාද, හැරදමාද, දුරුකෙරේද, කෙළවර කෙරේද, විනාශ කෙරේද, මහණෙනි, මෙසේ භික්ෂුව විසින් කුසල ධර්මයන්ගෙන් නොපිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොපිරිහීමයයි වදාරණ ලදී.

12. “මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට සිතින් ධර්මාරමුණු දැන අරමුණු කරා දුවන්නාවූ, බන්ධනයට හෙතුවූ, ලාමකවූ අකුසල කල්පනාවෝ උපදිත්ද, මහණෙනි, ඉදින් භික්ෂු තෙම එය නොඉවසාද, අත්හරීද, දුරු කෙරේද, කෙළවර කෙරේද, විනාශ කෙරේද, මහණෙනි, මෙය භික්ෂුව විසින් කුසල ධර්මයන්ගෙන් නොපිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොපිරිහීමයයි වදාරණ ලදී. මහණෙනි, මෙසේ වනාහි අපරිහානි ධර්මය වේ.

13 “මහණෙනි, සවැදෑරුම්වූ නොවඩන ලද ආයතන සය කවරහුද?

“මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුහට ඇසින් රූපය දැක අරමුණුකරා දුවන්නාවූ, බන්ධනයට හෙතුවූ, ලාමකවූ අකුසල කල්පනාවෝ නූපදිත්ද, මහණෙනි, භික්ෂුව විසින් මේ නොවඩන ලද ආයතනයයි දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොවඩන ලද ආයතනයයි වදාරණ ලදී.

14. “මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට කණින් ශබ්දයක් අසා අරමුණුකරා දුවන්නාවූ, බන්ධනයට හේතුවූ, ලාමකවූ අකුසල කල්පනාවෝ නූපදිත්ද, මහණෙනි, භික්ෂුව විසින් නොවඩන ලද ආයතනයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොවඩන ලද ආයතනයයි වදාරණ ලදී.

15. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට නාසයෙන් ගන්ධයක් දැන අරමුණුකරා දුවන්නාවූ, බන්ධනයට හේතුවූ, ලාමකවූ අකුසල කල්පනාවෝ නූපදිත්ද, මහණෙනි, භික්ෂුව විසින් නොවඩන ලද ආයතනයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොවඩන ලද ආයතනයයි වදාරණ ලදී.

16. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට දිවෙන් රසය විඳ අරමුණුකරා දුවන්නාවූ, බන්ධනයට හෙතුවූ, ලාමකවූ අකුසල කල්පනාවෝ නූපදිත්ද, මහණෙනි, භික්ෂුව විසින් නොවඩන ලද ආයතනයයි දත යුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොවඩන ලද ආයතනයයි වදාරණ ලදී.

17. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට කයින් ස්පර්ශයක් කොට අරමුණු කරා දුවන්නාවූ, බන්ධනයට හෙතුවූ, ලාමකවූ අකුසල කල්පනාවෝ නූපදිත්ද, මහණෙනි, භික්ෂුව විසින් මේ නොවඩන ලද ආයතනයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොවඩනලද ආයතනයයි වදාරණ ලදී.

18. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට සිතින් ධර්මාරම්මණයන් දැන අරමුණුට දුවන්නාවූ, බන්ධනයට හෙතුවූ, ලාමකවූ අකුසල කල්පනාවෝ නූපදිත්ද, මහණෙනි, භික්ෂුව විසින් නොවඩන ලද ආයතනයයි දතයුතුයි. භාග්‍යවතුන්වහන්සේ විසින් මෙය නොවඩන ලද ආයතනයයි වදාරණ ලදී. මහණෙනි, මොහු සවැදෑරුම්වූ නොවඩන ලද ආයතනයෝයයි කියනු ලැබෙත් යයි" (වදාළේය.)

---

## 4. පමාද සූත්‍රය.

1. (මේ සූත්‍රයද, මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් වේළුවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, ප්‍රමාදව වාසය කරන්නාවූ පුද්ගලයාද අප්‍රමාදව වාසය කරන්නාවූ පුද්ගලයාද තොපට දෙශනා

කරන්නෙමි. එය අසව්. මහණෙනි කෙසේ නම් ප්‍රමාදව වාසය කරන්නේ වෙයිද?

3. "මහණෙනි; චක්ඛු ඉන්ද්‍රියාගේ සංවරයක් නැතුව වාසය කරන්නහුගේ සිත චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ රූපයන් කෙරෙහි ක්ලේශයන්ගෙන් තෙත්වේ. ඒ ක්ලේශයන්ගෙන් තෙත්වූ සිත් ඇත්තහුගේ ප්‍රමොදය (දුර්වල ප්‍රීතිය) නොවෙයි. දුර්වල ප්‍රීතිය නැති කල්හි බලවත් ප්‍රීතිය නොවෙයි, බලවත් ප්‍රීතිය නැති කල්හි පස්සද්ධිය (දාහසංසිඳීම) නොවෙයි. පස්සද්ධිය නැති කල්හි දුකසේ වාසය කරයි. දුක් ඇත්තහුගේ සිත එකඟ නොවෙයි. එකඟ නොවූ සිත ඇති කල්හි සමථවිදර්ශනා ධර්මයෝ පහළ නොවෙත්. ධර්මයන්ගේ පහළ නොවීමෙන් ප්‍රමාදව වාසය කරන්නේය, යන සංඛ්‍යාවට පැමිණේ

4. "මහණෙනි; සෝත ඉන්ද්‍රියේ සංවරයක් නැතුව වාසය කරන්නහුගේ සිත සෝත විඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දයන් කෙරෙහි ක්ලේශයන්ගෙන් තෙත්වේ. ඒ ක්ලේශයන්ගෙන් තෙත්වූ සිත් ඇත්තහුගේ ප්‍රමොදය (දුර්වල ප්‍රීතිය) නොවෙයි. දුර්වල ප්‍රීතිය නැති කල්හි බලවත් ප්‍රීතිය නොවෙයි. බලවත් ප්‍රීතිය නැතිකල්හි පස්සද්ධිය (දාහ සංසිඳීම) නොවෙයි. පස්සද්ධිය නැති කල්හි දුකසේ වාසය කරයි. දුක් ඇත්තහුගේ සිත එකඟ නොවෙයි. එකඟ නොවූ සිත් ඇති කල්හි සමථ විදර්ශනා ධර්මයෝ පහළ නොවෙත්. ධර්මයන්ගේ පහළ නොවීමෙන් ප්‍රමාදව වාසය කරන්නේය, යන සංඛ්‍යාවට පැමිණේ.

5. "මහණෙනි, ඝාණඉන්ද්‍රියේ සංවරයක් නැතුව වාසය කරන්නහුගේ සිත ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධයන් කෙරෙහි ක්ලේශයන්ගෙන් තෙත් වේ. ඒ ක්ලේශයන්ගෙන් තෙත්වූ සිත් ඇත්තහුගේ ප්‍රමොදය (දුර්වල ප්‍රීතිය) නොවෙයි. දුර්වල ප්‍රීතිය නැති කල්හි බලවත් ප්‍රීතිය නොවෙයි. බලවත් ප්‍රීතිය නැති කල්හි පස්සද්ධිය (දාහ සංසිඳීම) නොවෙයි. පස්සද්ධිය නැති කල්හි දුකසේ වාසය කරයි. දුක් ඇත්තහුගේ සිත එකඟ නොවෙයි. එකඟ නොවූ සිත් ඇති කල්හි සමථවිදර්ශනා ධර්මයෝ පහළ නොවෙත්. ධර්මයන්ගේ පහළ

නොවීමෙන් ප්‍රමාදව වාසය කරන්නේය, යන සංඛ්‍යාවට පැමිණේ.

6. "මහණෙනි, ජිව්හා ඉන්ද්‍රියයන්ගේ සංවරයක් නැතුව වාසය කරන්නහුගේ සිත ජිව්හාවිඤ්ඤාණයෙන් දතයුතුවූ රසයන් කෙරෙහි ක්ලේශයන් ගෙන් තෙත්වේ. ඒ ක්ලේශයන්ගෙන් තෙත්වූ සිත් ඇත්තහුගේ ප්‍රමොදය (දුර්වල ප්‍රීතිය) නොවෙයි. දුර්වල ප්‍රීතිය නැති කල්හි බලවත් ප්‍රීතිය නොවෙයි. බලවත් ප්‍රීතිය නැති කල්හි පස්සද්ධිය (දාහ සංසිඳීම) නොවෙයි. පස්සද්ධිය නැති කල්හි දුකසේ වාසය කරයි. දුක් ඇත්තහුගේ සිත එකඟ නොවෙයි, එකඟ නොවූ සිත ඇති කල්හි සමථ විදර්ශනා ධර්මයෝ පහළ නොවෙත්. ධර්මයන්ගේ පහළ නොවීමෙන් ප්‍රමාදව වාසය කරන්නේය යන සංඛ්‍යාවට පැමිණේ.

7. "මහණෙනි, කාය ඉන්ද්‍රියයන්ගේ සංවරයක් නැතුව වාසය කරන්නහුගේ සිත කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ස්පර්ශයන් කෙරෙහි ක්ලේශයන්ගෙන් තෙත්වේ. ඒ ක්ලේශයන්ගෙන් තෙත්වූ සිත් ඇත්තහුගේ ප්‍රමොදය (දුර්වල ප්‍රීතිය) නොවෙයි. දුර්වල ප්‍රීතිය නැති කල්හි බලවත් ප්‍රීතිය නොවෙයි, බලවත් ප්‍රීතිය නැති කල්හි පස්සද්ධිය (දාහ සංසිඳීම) නොවෙයි. පස්සද්ධිය නැති කල්හි දුකසේ වාසය කරයි. දුක් ඇත්තහුගේ සිත එකඟ නොවෙයි. එකඟ නොවූ සිත නැති කල්හි සමථ විදර්ශනා ධර්මයෝ පහළ නොවෙත්. ධර්මයන්ගේ පහළ නොවීමෙන් ප්‍රමාදව වාසය කරන්නේය, යන සංඛ්‍යාවට පැමිණේ.

8. "මහණෙනි, මනෝඉන්ද්‍රියෙහි සංවර නැතිව වාසය කරන්නහුගේ සිත මනෝවිඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මයන් විෂයෙහි කෙලෙසුන්ගෙන් තෙත්වේ. ඒ කෙලෙසුන්ගෙන් තෙත්වූ සිත් ඇත්තහුට දුර්වල ප්‍රීතිය නොවෙයි. දුර්වල ප්‍රීතිය නැති කල්හි බලවත් ප්‍රීතිය නොවෙයි. බලවත් ප්‍රීතිය නැතිකල්හි පස්සද්ධිය (දාහ සංසිඳීම) නොවෙයි. පස්සද්ධිය නැති කල්හි දුකසේ වාසය කරයි. දුක් ඇත්තහුගේ සිත එකඟ නොවෙයි. එකඟ නොවූ සිත ඇති කල්හි සමථ විදර්ශනා ධර්මයෝ පහළ

නොවෙත්. සමථ විදර්ශනා ධර්මයන්ගේ පහළ නොවීමෙන් ප්‍රමාදව වාසය කරන්නේය, යන සංඛ්‍යාවට පැමිණෙයි. මහණෙනි, මෙසේ වනාහි ප්‍රමාදව වාසය කරන්නේ වෙයි.

9. "මහණෙනි කෙසේනම් අප්‍රමාදව වාසය කරන්නේ වේද? මහණෙනි චක්ඛු ඉන්ද්‍රියයෙහි සංවර ඇතුව වාසය කරන්නහුගේ සිත චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ රූපයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවෙයි. කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සිත් ඇත්තහුට දුර්වල ප්‍රීතිය උපදියි. දුර්වල ප්‍රීති උපන්නහුට බලවත් ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ හිත එකඟ වේ. එකඟවූ සිත ඇතිකල්හි සමථ විදර්ශනා ධර්මයෝ පහළ වෙත්. සමථ විදර්ශනා ධර්මයන්ගේ පහළ වීමෙන් අප්‍රමාදව වාසය කරන්නේය, යන සංඛ්‍යාවට පැමිණේ.

10. "මහණෙනි, සෝත ඉන්ද්‍රියයෙහි සංවර ඇතුව වාසය කරන්නහුගේ සිත සෝතවිඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවෙයි. කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සිත් ඇත්තහුට දුර්වල ප්‍රීතිය උපදියි. දුර්වල ප්‍රීති උපන්නහුට බලවත් ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ හිත එකඟ වේ. එකඟවූ සිත ඇතිකල්හි සමථ විදර්ශනා ධර්මයෝ පහළ වෙත්. සමථ විදර්ශනා ධර්මයන්ගේ පහළ වීමෙන් අප්‍රමාදව වාසය කරන්නේය, යන සංඛ්‍යාවට පැමිණේ.

11. "මහණෙනි, ඝාණෙන්ද්‍රියයෙහි සංවර ඇතුව වාසය කරන්නහුගේ සිත ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවෙයි. කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සිත් ඇත්තහුට දුර්වල ප්‍රීතිය උපදියි. දුර්වල ප්‍රීති උපන්නහුට බලවත් ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ හිත එකඟ වේ. එකඟවූ සිත ඇති කල්හි සමථ විදර්ශනා ධර්මයෝ පහළ වෙත්. සමථ විදර්ශනා ධර්මයන්ගේ පහළ වීමෙන් අප්‍රමාදව වාසය කරන්නේය, යන සංඛ්‍යාවට පැමිණේ.

12. "මහණෙනි, ජිව්හා ඉන්ද්‍රියයෙහි සංවර ඇතුව වාසය කරන්නහුගේ සිත ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවෙයි. කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සිත් ඇත්තහුට දුර්වල ප්‍රීතිය උපදියි. දුර්වල ප්‍රීති උපන්නහුට බලවත් ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ හිත එකඟ වේ. එකඟවූ සිත ඇති කල්හි සමථ විදර්ශනා ධර්මයෝ පහළ වෙත්. සමථ විදර්ශනා ධර්මයන්ගේ පහළ වීමෙන් අප්‍රමාදව වාසය කරන්නේය, යන සංඛ්‍යාවට පැමිණේ.

13. "මහණෙනි, කාය ඉන්ද්‍රියයෙහි සංවර ඇතුව වාසය කරන්නහුගේ සිත කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ස්පර්ශයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවෙයි. කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සිත් ඇත්තහුට දුර්වල ප්‍රීතිය උපදියි. දුර්වල ප්‍රීතිය උපන්නහුට බලවත් ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සංසිඳෙයි සංසිඳුණු කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟවේ. එකඟවූ සිත ඇතිකල්හි සමථ විදර්ශනා ධර්මයෝ පහළ වෙත්. සමථ විදර්ශනා ධර්මයන්ගේ පහළ වීමෙන් අප්‍රමාදව වාසය කරන්නේය, යන සංඛ්‍යාවට පැමිණේ.

14. "මහණෙනි, මනින්ද්‍රියෙහි සංවර ඇතුව වාසය කරන්නහුගේ සිත මනොවිඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවෙයි. කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සිත් ඇත්තහුට දුර්වල ප්‍රීතිය උපදියි. දුර්වල ප්‍රීතිය ඇත්තහුට බලවත් ප්‍රීතිය උපදියි. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟ වෙයි. එකඟවූ සිත ඇතිකල්හි සමථ විදර්ශනා ධර්මයෝ පහළ වෙත්. සමථ විදර්ශනා ධර්මයන්ගේ පහළ වීමෙන් අප්‍රමාදව වාසය කරන්නේය යන සංඛ්‍යාවට පැමිණේ. මහණෙනි, මෙසේ වනාහි අප්‍රමාදව වාසය කරන්නේවේයයි." වදාළේය.

---

## 5. සංවර සූත්‍රය

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, තොපට සංවරයද අසංවරයද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, කෙසේනම් අසංවරය වේද, මහණෙනි, චක්ඛු විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇලුම් කරන්නාවූ රූපයෝ වෙත්. ඉදින් මහණ තෙම එය ප්‍රිය කරයිද. එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගැලී සිටීද, මහණෙනි, භික්ෂුව විසින් මෙය කුශල ධර්මයන්ගෙන් පිරිහෙමින් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය පිරිහීමයයි වදාළේ යයි දතයුතුයි.

3. මහණෙනි, සෝතවිඥ්ඥාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමයෙන් යුක්තවූ ඇලුම් කරන්නාවූ ශබ්දයෝ වෙත්. ඉදින් මහණ තෙම එය ප්‍රිය කරයිද, එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගැලී සිටීද, මහණෙනි, භික්ෂුව විසින් මෙය කුසල ධර්මයන්ගෙන් පිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය පිරිහීමයයි වදාරණ ලදී.

4 මහණෙනි, ඝාණ විඥ්ඥාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමයෙන් යුක්තවූ, ඇලුම් කරන්නාවූ ගන්ධයෝ වෙත්. ඉදින් මහණ තෙම එය ප්‍රිය කරයිද, එය ප්‍රිය මනාපයයි කියාද, එහි ගැලී සිටීද, මහණෙනි, භික්ෂුව විසින් මෙය කුසල ධර්මයන්ගෙන් පිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය පිරිහීමයයි වදාරණ ලදී.

5. මහණෙනි, ජිව්හාවිඥ්ඥාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමයෙන් යුක්තවූ, ඇලුම් කරන්නාවූ රසයෝවෙත්. ඉදින් මහණ තෙම එය ප්‍රිය කරයිද එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගැලී සිටීද, මහණෙනි, භික්ෂුව විසින් මෙය කුශල ධර්මයන්ගෙන් පිරිහීමයයි

දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය පිරිහීමයයි වදාරණ ලදී.

6. මහණෙනි, කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමයෙන් යුක්තවූ, ඇළුම් කරන්නාවූ ස්පර්ශයෝ වෙත්. ඉදින් මහණ තෙම එය ප්‍රිය කරයිද එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගැලී සිටීද, මහණෙනි, භික්ෂුව විසින් මෙය කුසල ධර්මයන්ගෙන් පිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය පිරිහීමයයි වදාරණ ලදී.

7. මහණෙනි, මනෝවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමයෙන් යුක්තවූ, ඇලුම් කරන්නාවූ, ධර්මයෝ වෙත්. ඉදින් මහණ තෙම එය ප්‍රිය වේද, එය ප්‍රියයයි මනාපයයි කියාද, එහි ගිලී සිටීද මහණෙනි, භික්ෂුව විසින් මෙය කුශල ධර්මයන් ගෙන් පිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය පිරිහීමයයි වදාරණ ලදී. මහණෙනි, මෙසේ වනාහි අසංවරයවෙයි.

8. "මහණෙනි, කෙසේ නම් සංවරය වේද? මහණෙනි, චක්ඛුවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ, ඇලුම් කරන්නාවූ, රූපයෝ ඇත්තාහ. ඉදින් භික්ෂු තෙම එයට ප්‍රිය නොවේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද එහි ගිලී නොසිටීද, මහණෙනි, භික්ෂුව විසින් මෙය කුසල ධර්මයන් ගෙන් නොපිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොපිරිහීමයයි වදාරණ ලදී.

9. මහණෙනි, සෝතවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ, ඇලුම් කරන්නාවූ, ශබ්දයෝ ඇත්තාහ. ඉදින් භික්ෂු තෙම එයට ප්‍රිය නොවේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද, එහි ගිලී නොසිටීද, මහණෙනි, භික්ෂුව විසින් මෙය කුසල ධර්මයන්ගෙන් නොපිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොපිරිහීමයයි වදාරණ ලදී.

10. මහණෙනි, ඝාණවිඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම් කරන්නාවූ ගන්ධයෝ ඇත්තාහ. ඉදින් භික්ෂු තෙම එයට ප්‍රිය නොවේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද, එහි ගිලී නොසිටීද, මහණෙනි, භික්ෂුව විසින් මෙය කුසල ධර්මයන්ගෙන් නොපිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොපිරිහීමයයි වදාරණ ලදී.

11. මහණෙනි, ජිව්හාවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම් කරන්නාවූ රසයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට ප්‍රිය නොවේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද, එහි ගිලී නොසිටීද, මහණෙනි, භික්ෂුව විසින් මෙය කුසල ධර්මයන්ගෙන් නොපිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන්වහන්සේ විසින් මෙය නොපිරිහීමයයි වදාරණලදී.

12. මහණෙනි, කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම් කරන්නාවූ ස්පර්ශයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට ප්‍රිය නොවේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද, එහි ගිලී නොසිටීද, මහණෙනි, භික්ෂුව විසින් මෙය කුසල ධර්මයන්ගෙන් නොපිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොපිරිහීමයයි වදාරණ ලදී.

13. මහණෙනි, මනො විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම් කරන්නාවූ ධර්මයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට ප්‍රිය නොවේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද, එහි ගිලී නොසිටීද, මහණෙනි, භික්ෂුහු විසින් කුසල ධර්මයන්ගෙන් නොපිරිහීමයයි දතයුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නොපිරිහීමයයි වදාරණ ලදී. මහණෙනි, මෙසේ වනාහි සංවරය වේයයි” වදාළේය.

---

## 6. සමාධි සූත්‍රය.

(සබ්බ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, සමාධිය වඩව්. මහණෙනි, එකඟවූ සිත් ඇති භික්ෂුතෙම තත්වූ පරිද්දෙන් දැන ගණියි. කුමක් තත්වූ පරිද්දෙන් දැන ගණීද? "ඇස අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැනගණියි. රූපයන් අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. චක්ඛු විඤ්ඤාණය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැනගණියි. චක්ඛු සම්ඵස්සය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැනගණියි. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ යම් මේ වෙදනාවකුත් උපදීද, එයද අනිත්‍යයයි, තත්වූ පරිද්දෙන් දැන ගණියි.

3. "කණ අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. ශබ්දයන් අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. සෝත විඤ්ඤාණය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. සෝත සම්ඵස්සය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවකුත් උපදීද, එයද අනිත්‍යයයි. තත්වූ පරිද්දෙන් දැන ගණියි.

4. "නාසය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. ගන්ධයන් අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. ඝාණ විඤ්ඤාණය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. ඝාණ සම්ඵස්සය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ යම් මේ වෙදනාවකුත් උපදීද, එයද අනිත්‍යයයි, තත්වූ පරිද්දෙන් දැන ගණියි.

5 "දිව අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. රසයන් අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. ජිහ්වා විඥානය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. ජිහ්වා සම්ඵස්සය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යම් මේ වෙදනාවකුත් උපදීද, එයද අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි.

6. "කය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. ස්පර්ශයන් අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. කාය විඤ්ඤාණය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. කාය සම්ඵස්සය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවකුත් උපදීද, එයද අනිත්‍යයයි. තත්වූ පරිද්දෙන් දැන ගණියි.

7. "සිත අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. ධර්මයන් අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැනගණියි. මනො විඤ්ඤාණය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මනො සම්ඵස්සය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මනො සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි.

8. "මහණෙනි, සමාධිය වඩව්. මහණෙනි, එකඟවූ සිත් ඇති භික්ෂුතෙම තත්වූ පරිද්දෙන් දැන ගණීයයි." වදාළේය.

---

## 7. පටිසල්ලාණ සූත්‍රය.

(සබ්බ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දෙශනා කරන ලදී.)

"මහණෙනි, විවේකයෙහි යෙදී වාසය කරව්. මහණෙනි විවේකයෙන් යුක්තවූ භික්ෂුතෙම තත්වූ පරිද්දෙන් දැන ගණියි. කුමක් නම්, තත්වූ පරිද්දෙන් දනියිද,

(මේ සූත්‍රයේ 2 සිට 7 දක්වා ඡෙද මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ මෙනි.)

8. 'මහණෙනි, විවේකයෙහි යෙදී වාසය කරව්. මහණෙනි, විවේකයෙන් යුත් භික්ෂුතෙම තත්වූ පරිද්දෙන් දැන ගණීයයි," වදාළේය

---

## 8. නතුම්හාක සූත්‍රය (1)

(සබ්බ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දෙශනා කරන ලදී.)

2. "මහණෙනි, යමක් තොපගේ නොවේද, එය දුරු කරව්. දුරු කරණ ලද්දාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. මහණෙනි, කුමක් නම් තොපගේ නොවේද මහණෙනි, 'ඇස' තොපගේ නොවේ. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. රූපයෝ තොපගේ නොවෙත්. ඔවුන් දුරු කරව්. දුරුකළාවූ ඔව්හු තොපට හිත පිණිස සැප පිණිස වන්නාහුය. චක්ඛු විඤ්ඤාණය තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. චක්ඛු සම්ඵස්සය තොපගේ නොවේ. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය.

3. "කණ තොපගේ නොවේ එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. ශබ්දයෝ තොපගේ නොවෙත්. ඔවුන් දුරු කරව්. දුරුකළාවූ ඔව්හු තොපට හිත පිණිස සැප පිණිස වන්නාහුය. සෝත විඤ්ඤාණය තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරුකළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. සෝත සම්ඵස්සය තොපගේ නොවේ. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත්

උපදීද, එයද තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය.

4. නාසය තොපගේ නොවේ. එය දුරුකරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. ගන්ධයෝ තොපගේ නොවෙත්. ඔවුන් දුරු කරව්. දුරුකළාවූ ඔව්හු තොපට හිත පිණිස සැප පිණිස වන්නාහුය. ඝාණ විඤ්ඤාණය තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. ඝාණ සම්ඵස්සය තොපගේ නොවේ. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය.

5. "දිව තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. රසයෝ තොපගේ නොවෙත්. ඔවුන් දුරු කරව්. දුරුකළාවූ ඔව්හු තොපට හිත පිණිස සැප පිණිස වන්නාහුය. ජිව්හා විඤ්ඤාණය තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරුකළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. ජිව්හා සම්ඵස්සය තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය.

6. "කය තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. ස්පර්ශයෝ තොපගේ නොවෙත්. ඔවුන් දුරු කරව්. දුරුකළාවූ ඔව්හු තොපට හිත පිණිස සැප පිණිස වන්නාහුය. කාය විඤ්ඤාණය තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරුකළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. කාය සම්ඵස්සය තොපගේ නොවෙයි.

එය දුරු කරව්. දුරු කරණ ලද්දාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් උපදීද, එයද තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය.

7. "සිත තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. ධර්මයෝ තොපගේ නොවෙත්. ඔවුන් දුරු කරව්. දුරු කළාවූ ඔව්හු තොපට හිත පිණිස සැප පිණිස වන්නාහුය. මනො විඤ්ඤාණය තොපගේ නොවෙයි. එය දුරු කරව්. දුරුකළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. මනො සම්ඵස්සය තොපගේ නොවේ. එය දුරු කරව්. දුරු කළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය. මනො සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවකුත් වේද, එයද තොපගේ නොවෙයි. එය දුරු කරව් දුරුකළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය.

8. "මහණෙනි, යම්සේ මේ ජේතවනයෙහි තෘණය, කාෂ්ඨය, අතුය, කොලය, යන යමක් වේද, එය ජන තෙමේ ගෙණ යන්නේ හෝ වේද, දවන්නේ හෝ වේද, කැමැතිපරිද්දකින් කරන්නේ හෝ වේද, (එවිට) තොපට මෙබඳු සිතක් වන්නේද?, අප ජන තෙමේ ගෙණ යයි කියා හෝ, දවයි කියා හෝ, කැමැති පරිද්දෙකින් හෝ කෙරේය, කියායි"-"ස්වාමීනි, එය නොවේමැයි."

"ඊට හෙතු කවරේද?"-"ස්වාමීනි, මෙය තමා හෝ තමා පිළිබඳ වූවක් හෝ නොවේමැයි."

9. "මහණෙනි, මෙපරිද්දෙන්ම

(මේ සූත්‍රයේ 2 වෙනි ඡේදයේ 'ඇස' යන තැන සිට 7 වෙනි ඡේදයේ අගදක්වා මෙහි යොදාගත යුතුයි)

## 9. නතුම්හාක සූත්‍රය. (2)

1. (මේ සූත්‍රයද සබ්බ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී)

(මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ ඡේද 2 සිට 7 අවසානය දක්වා යෙදීමෙන් මේ සූත්‍රය සම්පූර්ණවේ) මහණෙනි, යමක් වනාහි තොපගේ නොවේද, එය දුරුකරව්. දුරුකළාවූ එය තොපට හිත පිණිස සැප පිණිස වන්නේය.

---

## 10. රාම සූත්‍රය.

1. (මේ සූත්‍රයද සබ්බ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2 "මහණෙනි, උද්දක නම් රාම පුත්‍රතෙම මෙබඳු වචනයක් කියයි.

> 'මම ඒකාන්තයෙන් වෙදගූ (-මම ඒකාන්තයෙන් සියලු වෘත්තය දැන මැඩ පවත්වා සිටියේ) වෙමි. මම ඒකාන්තයෙන් සියල්ල ජයගත්තේ වෙමි. ඒකාන්තයෙන් සාරා නොදමනලද ගණ්ඩමූලය (-දුක් මුල) සාරා දැමුවෙමි' යනුයි.

3. "මහණෙනි, උද්දකරාම පුත්‍රතෙම වෙදගූ නොවූයේම (-වෙදයෙහි පරතෙරට නොගියේම) 'වෙදගූ වෙමියි කියයි. සියල්ල ජය නොගත්තේම 'සියල්ල දිනුවෙමි'යි කියයි. සාරා නොදමන ලද දුක්මුල සාරා දැමුවෙමියි' කියායි.

4. "මහණෙනි, මෙහි වනාහි භික්ෂුතෙම මනාව කියන්නේ නම් මෙසේ කියන්නේය. 'ඒකාන්තයෙන් මම වෙදගූ වෙමි. ඒකාන්තයෙන් සියල්ල ජයගත්තේ වෙමි. ඒකාන්තයෙන් සාරා නොදමන ලද දුක්මුල සාරා දැමුවෙමි' කියායි.

5. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම වෙදගූ වේද? මහණෙනි, භික්ෂුතෙම යම් හෙයකින් සවැදෑරුම්වූ ස්පර්ශ

ආයතනයන්ගේ හටගැණීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැනගණීද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම වෙදගූ වේ.

**6.** "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම සියල්ල ජය ගත්තේ වේද, මහණෙනි, යම්හෙයකින් භික්ෂුතෙම සවැදෑරුම්වූ ස්පර්ශායතනයන්ගේ හට ගැණීමද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද, තත්වූ පරිද්දෙන් දැන උපාදාන රහිතව කෙලෙසුන් කෙරෙන් මිදුනේ වේද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂූතෙම සියල්ල ජයගත්තේ වේ.

**7.** "මහණෙනි, කෙසේනම් භික්ෂුහුගේ නො සාරාදමන ලද දුක් මුල සාරාදමන ලද්දේ වේද, මහණෙනි, ගණ්ඩය යනු මාතා පිතෘ සම්භවයෙන් හටගත්තාවූ බතින් හා කොමු පිඬුවෙන් වැඩුණාවූ අනිත්‍යය; උච්ඡාදනය (ඇඟ ඉලිම) මැඩීම බිඳීම නැසීම, ස්වභාවකොට ඇත්තාවූ, මේ සතර මහාභූතයන් ගෙන් හටගත්තාවූ ශරීරයට නමකි.

**8** "මහණෙනි, ගණ්ඩ මූලය යනු තෘෂ්ණාවට නමකි මහණෙනි, යම්හෙයකින් භික්ෂුහුගේ තෘෂ්ණාව පහකරන ලද්දීද, මුල් සිඳින ලද්දීද, උදුරා දැමූ තල් ගසක් මෙන් කරණ ලද්දීද, විනාශ කරන ලද්දීද, මත්තෙහි නූපදනා ස්වභාවයට පමුණුවන ලද්දීද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුහුගේ නො සාරාදමන ලද ගණ්ඩමූලය සාරාදමන ලද්දේ වෙයි.

**9** "මහණෙනි, උද්දකනම් රාමපුත්‍ර තෙමේ මෙබඳු කීමක් කියයි.

> 'මම ඒකාන්තයෙන් වෙදගූ වෙමි, ඒකාන්තයෙන් සියල්ල දිනුවේ වෙමි, ඒකාන්තයෙන් නොසාරාදමන ලද ගණ්ඩමූලය සාරා දැමුවෙමි' යනුයි.

"මහණෙනි, උද්දකාරාමපුත්‍රතෙම වෙදයෙහි කෙළවරට නොගියේම, 'වෙදයෙහි කෙළවරට ගියේ වෙමියි' කියයි. සියල්ල ජය නොගත්තේම, සියල්ල ජයගත්තේ වෙමියි කියයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොසාරාදමන ලද ගණ්ඩමූලයම, සාරා දැමුවෙමියි කියයි. මහණෙනි, මෙහි වනාහි භික්ෂූතෙම මනාකොට කියනු ලබන්නේ එය මෙසේ කියන්නේය.

'මම ඒකාන්තයෙන් වෙදයෙහි පරතෙරට ගියේ වෙමි. මම ඒකාන්තයෙන් සියල්ල ජය ගත්තේ වෙමි. ඒකාන්තයෙන් නොසාරාදමන ලද ගණ්ඩමූලය සාරා දැමුවෙමි' කියයි."

(2. පණ්ණාසකය නිමි.)

පස්වන ඡල වර්ගයයි.

---

# 3. පණ්ණාසකය.

## 1. යොගක්ඛෙම් වර්ගය.

### 1. යොගක්ඛෙම් සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, සතර යොගයන්ගෙන් පැමිණෙන භය දුරුවීමට කරුණුවූ ධර්මකාරණය තොපට දේශනා කරන්නෙමි එය අසව්. මහණෙනි, සතර යොගයන්ගෙන් පැමිණෙන භය දුරුවීමට කරුණුවූ ධර්මකාරණය කවරේද?

3. "මහණෙනි, චක්ඛු විඥ්ඥාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සුව එලවන්නාවූ ඇලුම් කරන්නාවූ රූපයෝ ඇත්තාහ. ඒ රූපයෝ තථාගතයන් වහන්සේට ප්‍රහීණවූවාහු, සිඳින ලද මුල් ඇත්තාවූ, මස්තකය සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දාහු, විනාශ කරණ

ලද්දාහු, මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහු වෙත්. ඔවුන්ගේ පහකිරීම පිණිස යෙදීම වදාළේය. එහෙයින් තථාගතතෙම “යොගක්ඛෙමීයයි” කියනු ලැබේ.

4. “මහණෙනි, සෝත විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සුව එලවන්නාවූ ඇලුම් කරන්නාවූ ශබ්දයෝ ඇත්තාහ. ඒ ශබ්දයෝ තථාගතයන් වහන්සේට ප්‍රහීණ වූවාහු, සිඳින ලද මුල් ඇත්තාහු, මස්තකය සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දාහු, විනාශ කරණ ලද්දාහු, මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහු වෙත්. ඔවුන්ගේ පහකිරීම පිණිස යෙදීම වදාළේය. එහෙයින් තථාගතතෙම යොගක්ඛෙමීයයි කියනු ලැබේ.

5. “මහණෙනි, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කම්සුව එලවන්නාවූ, ඇලුම් කරන්නාවූ ගන්ධයෝ ඇත්තාහ. ඒ ගන්ධයෝ තථාගතයන්ගේ ප්‍රහීණ වූවාහු, සිඳින ලද මුල් ඇත්තාහු, මස්තකය සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දාහු, විනාශ කරණ ලද්දාහු, මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහු වෙත්. ඔවුන්ගේ පහකිරීම පිණිස යෙදීම වදාළේය. එහෙයින් තථාගතතෙම යොගක්ඛෙමීයයි කියනු ලැබේ.

6. “මහණෙනි, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කම්සුව එලවන්නාවූ, ඇලුම් කරන්නාවූ රූපයෝ ඇත්තාහ. ඒ රසයෝ තථාගතයන්ගේ ප්‍රහීණ වූවාහු, සිඳින ලද මුල් ඇත්තාහු, මස්තකය සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දාහු, විනාශ කරණ ලද්දාහු, මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහු වෙත් ඔවුන්ගේ පහකිරීම පිණිස යෙදීම වදාළේය. එහෙයින් තථාගතතෙම යොගක්ඛෙමීයයි කියනු ලැබේ.

7. “මහණෙනි, කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සුව එලවන්නාවූ, ඇලුම් කරන්නාවූ ස්පර්ශයෝ ඇත්තාහ. ඒ ස්පර්ශයෝ

තථාගතයන්ගේ ප්‍රහීණ වූවාහු, සිඳින ලද මුල් ඇත්තාහු, මස්තකය සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දාහු, විනාශ කරණ ලද්දාහු මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහු වෙත්. ඔවුන්ගේ පහකිරීම පිණිස යෙදීම වදාළේය. එහෙයින් තථාගතතෙම යොගක්ඛෙමීයයි කියනු ලැබේ.

8. "මහණෙනි, මනො විඥ්ඥාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම් සැප එලවන්නාවූ ඇලුම් කරන්නාවූ, ධර්මයෝ ඇත්තාහ. ඔව්හු තථාගතයන්ගේ ප්‍රහීණ වූවාහු, සිඳින ලද මුල් ඇත්තාහු, මස්තකය සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දාහු, විනාශ කරණලද්දාහු, මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහු වෙත්. ඔවුන්ගේ දුරුකිරීම පිණිස යෙදීම වදාළේය. එහෙයින් තථාගතතෙම යොගක්ඛෙමීයයි කියනු ලැබේ.

9. "මහණෙනි, මේ වනාහි සතර යොගයන්ගෙන් පැමිණෙන භය දුරුකිරීම පිණිස පවත්නාවූ ධර්ම කාරණය වේයයි වදාළේය.

---

## 2. උපාදාය සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, කුමක් ඇති කල්හි, වනාහි කුමක් නිසා තමා තුළ සැප දුක් දෙක උපදීද?"-"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහු වෙත්. භාග්‍යවතුන් වහන්සේ අප ධර්මයන්ට පමුණුවන සේක. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තේය. මේ අදහස භාග්‍යවතුන් වහන්සේටම වැටහෙන සේක් නම් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා (එහි) අර්ථය දැනගත්තාහුයයි (කීහ.) මහණෙනි, එසේ වීනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමි'යි වදාළසේක. එසේය ස්වාමීනියි කියා ඒ භික්ෂූහු

භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**3.** "මහණෙනි, ඇස ඇති කල්හි, ඇස නිසා තමා තුළ සුව දුක් දෙක උපදියි. කණ ඇති කල්හි කණ නිසා තමා තුළ සුව දුක් දෙක උපදියි. නාසය ඇති කල්හි නාසය නිසා තමා තුළ සුව දුක් දෙක උපදියි. දිව ඇති කල්හි දිව නිසා තමා තුළ සුව දුක් දෙක උපදියි, කය ඇති කල්හි කය නිසා තමා තුළ සුව දුක් දෙක උපදියි. සිත ඇති කල්හි සිත නිසා තමා තුළ සුව දුක් උපදියි.

**4.** "මහණෙනි, ඒ කුමකැයි හඟින්නෙහිද? ඇස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය"

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුක්ද, වෙනස්වන ස්වභාව ඇත්තේද, එය 'මමය මාගේයයි, නොගෙන තමා තුළ සුවදුක් දෙක උපදින්නේද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

**5.** "කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යවේ"

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාව ඇත්තේද, එය මමය, මාගේයයි නොගෙන තමා තුළ සුවදුක් දෙක උපදින්නේද?"-"ස්වාමීනි, එය නොවේමැයි"

**6.** "නාසය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාව ඇත්තේද, එය මමය, මාගේයයි නොගෙන තමා තුළ සුවදුක් දෙක උපදින්නේද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

7. "දිව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?-" "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාව ඇත්තේද, එය මමය, මාගේයයි නොගෙන තමා තුළ සුව දුක් දෙක උපදින්නේද?"-"ස්වාමීනි, එය නොවේමැයි"

8. "කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?" "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාව ඇත්තේද, එය මමය, මාගේයයි නොගෙන තමා තුළ සුව දුක් දෙක උපදින්නේද?"-"ස්වාමීනි, මෙය නොවේමැයි."

9. "සිත නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් අනිත්‍යද දුකද, පෙරලෙන ස්වභාව ඇත්තේද, එය මමය, මාගේයයි නොගෙන තමා තුළ සැපදුක් දෙක උපදින්නේද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

10. "මහණෙනි මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ඇස කෙරෙහිද කලකිරෙයි. කණ කෙරෙහිද කලකිරෙයි. නාසය කෙරෙහිද කලකිරෙයි. දිව කෙරෙහිද කලකිරෙයි. කය කෙරෙහිද කලකිරෙයි. සිත කෙරෙහිද කලකිරෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම වේ. "ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වැස නිමවන ලද්දේය. සතර මගින් කළයුත්ත කරණලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගණීයයි" (වදාළේය.)

---

## 3. දුක්ඛ සූත්‍රය

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, දුක්ඛයාගේ හටගැණීමද, විනාශයද දේශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, දුක්ඛයාගේ හටගැණීම කවරේදයත්, ඇසද රූපයද නිසා චක්ඛුවිඥ්ඥාණය උපදියි (ඒ) තිදෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා වේදනාව උපදියි වේදනාව නිසා තණ්හාව උපදියි. මේ දුක්ඛයාගේ හටගැණීමවේ.

"කණද ශබ්දයද නිසා සෝත විඥ්ඥාණය උපදියි. (ඒ) තිදෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා වෙදනාව උපදියි. වෙදනාව නිසා තණ්හාව උපදියි. මේ දුක්ඛයාගේ හට ගැණීම වේ.

"නාසයද ගන්ධයද නිසා ඝාණවිඥ්ඥාණයද උපදියි. (ඒ) තිදෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා වෙදනාව උපදියි. වෙදනාව නිසා තණ්හාව උපදියි. මේ දුක්ඛයාගේ හටගැණීමවේ.

"දිවද රසද නිසා ජිව්හා විඥ්ඥාණය උපදියි (ඒ) තිදෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා වෙදනාව උපදියි. වෙදනාව නිසා තණ්හාව උපදියි. මේ දුක්ඛයාගේ හටගැණීමවේ.

"කයද ස්පර්ශයද නිසා කාය විඥ්ඥාණය උපදියි (ඒ) තිදෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා වෙදනාව උපදියි. වේදනාව නිසා තණ්හාව උපදියි. මේ දුක්ඛයාගේ හටගැණීමවේ.

"සිත නිසාද ධර්මයන් නිසාද මනොවිඥ්ඥාණය උපදියි. (ඒ) තුන්දෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා වෙදනාව

වේ. වෙදනාව නිසා තණ්හාව වේ. මහණෙනි, මේ වනාහි දුක්ඛයාගේ හටගැනීම වේ.

'මහණෙනි, දුක්ඛයාගේ විනාසය කවරේදයත්. ඇසද රූපද නිසා චක්ඛුවිඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා වේදනාව වේ. වෙදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ගයෙන් නිරුද්ධ කිරීම හෙතුකොට ගෙන උපාදානයන්ගේ (තණ්හා දිට්ඨි මානයන්ගෙන් තදින් අල්වා ගැනීම) නිරොධයවේ. උපාදාන නිරොධයෙන් කර්ම භවයාගේ නිරොධයවේ. කර්ම භවයාගේ නිරොධය වීමෙන් ජාති නිරොධයවේ (උත්පත්තිය නිරුද්ධවේ.) ජාති නිරොධයෙන් ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස යන මොහු නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුක්ඛ සමූහයාගේ වැලැක්මවේ. මේ දුක්ඛයාගේ විනාසය වේ.

"කණද ශබ්දයද නිසා සෝත විඤ්ඤාණය උපදියි. (ඒ) තුන්දෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා වේදනාවවේ. වෙදනාව නිසා තණ්හාවවේ. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ගයෙන් නිරුද්ධ කිරීම හේතුකොට ගෙන උපාදානයන්ගේ (තණ්හා දිට්ඨි මානයන්ගෙන් තදින් අල්වා ගැනීම) නිරොධයවේ. උපාදාන නිරොධයෙන් කර්ම භවයාගේ නිරොධයවේ කර්ම භවයාගේ නිරොධය වීමෙන් ජාති නිරොධයවේ. (උත්පත්තිය නිරුද්ධවේ.) ජාති නිරොධයෙන් ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස යන මොහු නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුක්ඛ සමූහයාගේ වැලැක්මවේ. මේ දුක්ඛයාගේ විනාසය වේ.

"නාසයද ගන්ධයද නිසා ඝාණ විඤ්ඤාණය උපදියි. (ඒ) තුන්දෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා වෙදනාවවේ. වෙදනාව නිසා තණ්හාවවේ. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ගයෙන් නිරුද්ධ කිරීම හේතුකොට ගෙන උපාදානයන්ගේ (තණ්හා දිට්ඨි මානයන්ගෙන් තදින් අල්වා ගැනීම) නිරොධයවේ. උපාදාන නිරොධයෙන් කර්මභවයාගේ නිරොධයවේ. කර්මභවයාගේ නිරොධය වීමෙන් ජාති නිරොධයවේ.

(උත්පත්තිය නිරුද්ධවේ.) ජාති නිරොධයෙන් ජරාමරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස යන මොහු නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුක්ඛ සමූහයාගේ වැලැක්ම වේ. මේ දුක්ඛයාගේ විනාසයවේ.

"දිවද රසද නිසා ජිව්හා විඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා වෙදනාවවේ. වෙදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ගයෙන් නිරුද්ධ කිරීම හේතුකොටගෙන උපාදානයන්ගේ (තණ්හා දිට්ඨි මානයන්ගෙන් තදින් අල්වා ගැනීම) නිරොධය වේ. උපාදාන නිරොධයෙන් කර්ම භවයාගේ නිරොධය වේ. කර්ම භවයාගේ නිරොධය වීමෙන් ජාති නිරොධයවේ. (උත්පත්තිය නිරුද්ධවේ.) ජාති නිරොධයෙන් ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස යන මොහු නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුක්ඛ සමූහයාගේ වැලැක්ම වේ. මේ දුක්ඛයාගේ විනාසය වේ.

'කයද ස්පර්ශයද නිසා කාය විඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා වේදනාවවේ. වෙදනාව නිසා තණ්හාවවේ. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ගයෙන් නිරුද්ධ කිරීම හේතුකොටගෙන උපාදානයන්ගේ (තණ්හා දිට්ඨි මානයන්ගෙන් තදින් අල්වා ගැනීම) නිරොධය වේ. උපාදාන නිරෝධයෙන් කර්ම භවයාගේ නිරොධයවේ. කර්ම භවයාගේ නිරොධය වීමෙන් ජාති නිරොධය වේ. (උත්පත්තිය නිරුද්ධවේ.) ජාති නිරෝධයෙන් ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස යන මොහු නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුක්ඛ සමූහයාගේ වැලැක්ම වේ. මේ දුක්ඛයාගේ විනාසය වේ.

"සිතද ධර්මයන්ද නිසා මනොවිඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා වෙදනාව වේ. වෙදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ගයෙන් නිරුද්ධ කිරීමමෙන් උපාදානය නිරුද්ධයවේ.

උපාදාන නිරෝධයෙන් භව නිරෝධය වේ. භව නිරෝධයෙන් ජාති නිරෝධය වේ. ජාති නිරෝධයෙන් ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස යන මොවුහු නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුක්ඛ සමූහයාගේ වැලැක්මවේ. මහණෙනි, මේ වනාහි දුක නැසීම වේයයි” (වදාළේය.)

---

## 4. ලොක සූත්‍රය

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමු වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයෙහිදී දේශනා කරන ලදී)

2 “මහණෙනි, ලොකයාගේ හටගැණීමද විනාසයද දෙශනා කරන්නෙමි. එය අසව්. “මහණෙනි, ලොකයාගේ හට ගැණීම කවරේදයත්? ඇසද රූපයද නිසා චක්ඛු විඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා වෙදනාව වේ වෙදනාව නිසා තණ්හාව වේ. තණ්හාව නිසා උපාදානය (තදින් අල්වා ගැණීම) වේ. උපාදානය නිසා භවය වේ. භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරාමරණ සොක පරිදෙව දුක් දොම්නස් උපායාස යන මොහු හට ගණිත්. මහණෙනි, මේ වනාහී ලෝකයාගේ හටගැණීම වේ.

3. ‘කණද ශබ්දයද නිසා සෝත විඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා වෙදනාව වේ. වෙදනාව නිසා තණ්හාව වේ. තණ්හාව නිසා උපාදානය (තදින් අල්වා ගැණීම) වේ. උපාදානය නිසා භවය වේ. භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරා මරණ සොක පරිදෙව දුක් දොම්නස් උපායාස යන මොහු හට ගණිත්. මහණෙනි, මේ වනාහි ලෝකයාගේ හට ගැණීම වේ.

4. “නාසයද ගන්ධයද නිසා ඝාණ විඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සයවේ. ඵස්සය නිසා වෙදනාව වේ. වෙදනාව නිසා තණ්හාව වේ. තණ්හාව නිසා උපාදානය (තදින්

අල්වා ගැණීම) වේ, උපාදානය නිසා භවය වේ. භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරා මරණ සොක පරිදෙව දුක් දොම්නස් උපායාස යන මොහු හටගණිත්. මහණෙනි, මේ වනාහි ලොකයාගේ හට ගැණීම වේ.

5. "දිවද රසයද නිසා ජිව්හා විඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා වෙදනාව වේ. වෙදනාව නිසා තණ්හාව වේ. තණ්හාව නිසා උපාදානය (තදින් අල්වා ගැණීම) වේ. උපාදානය නිසා භවය වේ. භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරා මරණ සොක පරිදෙව දුක් දොම්නස් උපායාස යන මොහු හට ගණිත්. මහණෙනි, මේ වනාහි ලොකයාගේ හටගැණීම වේ.

6. "කයද ස්පර්ශයද නිසා කාය විඤ්ඤාණය උපදියි ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා වේදනාවවේ. වේදනාව නිසා තණ්හාව වේ. තණ්හාව නිසා උපාදානය (තදින් අල්වා ගැණීම) වේ. උපාදානය නිසා භවය වේ. භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරාමරණ සොක පරිදේව දුක්ඛ දොම්නස් උපායාස යන මොහු හටගණිත්. මහණෙනි, මේ වනාහී ලෝකයාගේ හට ගැණීම වේ.

7. "සිතද ධර්මයන්ද නිසා මනො විඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා වේදනාවවේ. වේදනාව නිසා තණ්හාව වේ. තණ්හාව නිසා උපාදානය වේ. උපාදානය නිසා කර්ම භවය වේ. කර්ම භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරාමරණය, සෝකය, පරිදේවය, දුකය, දොම්නස්ස, උපායාසය යන මොහු හටගණිත්. මහණෙනි, මේ වනාහී ලෝකයාගේ හට ගැණීම වේ.

8. "මහණෙනි, ලෝකයාගේ විනාශය කෙසේද යත්? ඇසද, රූපයන්ද නිසා චක්ඛු විඤ්ඤාණය හටගණී. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා වේදනාව වේ වේදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ගයෙන් නිරුද්ධ කිරීමෙන් උපාදාන නිරොධය වේ.

9. "කණද, ශබ්දයද නිසා සෝත විඤ්ඤාණය හටගණී. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ගයෙන් නිරුද්ධ කිරීමෙන් උපාදාන නිරෝධය වේ.

10. "නාසයද, ගන්ධයද නිසා ඝාණ විඤ්ඤාණය හටගණී. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ගයෙන් නිරුද්ධ කිරීමෙන් උපාදාන නිරෝධය වේ.

11. "දිවද, රසයද නිසා ජිව්හා විඤ්ඤාණය හටගණී. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ගයෙන් නිරුද්ධ කිරීමෙන් උපාදාන නිරෝධයවේ.

12. 'කයද, ස්පර්ශයද නිසා කාය විඤ්ඤාණය හටගණී. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ගයෙන් නිරුද්ධ කිරීමෙන් උපාදාන නිරෝධයවේ.

13. "සිතද, ධර්මයන්ද නිසා මනෝවිඤ්ඤාණය හටගණී. ඒ තුන්දෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ගයෙන් නිරුද්ධ කිරීමෙන් උපාදාන නිරෝධයවේ. "මෙසේ මේ සියලු දුක් සමූහයාගේ නිරුද්ධ කිරීම වේ. මහණෙනි, මේ වනාහි ලෝකයාගේ විනාශය වේයයි (වදාළේය)

---

## 5. සෙයාය සූත්‍රය

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමක් ඇතුළත් කොට ගෙන මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමියි කියා හෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වේද, මම සදෘශයෙක් වෙමියි කියා හෝ වේද, මම හීනයෙක් වෙමියි කියා හෝ වේද?"-"ස්වාමීනි, අපට ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තෝය"

භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන්වහන්සේ විසින් කියා දෙතොත් හොඳය.

3. "මහණෙනි, ඇස ඇති කල්හි ඇස නිසා ඇස ඇතුළත් කොට ගෙන මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමියි කියා හෝ වෙයි. මම සදෘශයෙක් වෙමියි කියා හෝ වෙයි. මම හීනයෙක් වෙමියි කියා හෝ වෙයි.

'මහණෙනි, කණ ඇති කල්හි කණ නිසා කණ ඇතුළත් කොට ගෙන මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමියි කියා හෝ වෙයි. මම සදෘශයෙක් වෙමියි කියා හෝ වෙයි. මම හීනයෙක් හෝ වෙමියි කියා හෝ වෙයි

"මහණෙනි, නාසය ඇති කල්හි නාසය නිසා නාසය ඇතුළත්කොට ගෙන මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමියි කියා හෝ වෙයි. මම සදෘශයෙක් වෙමියි කියා හෝ වෙයි. මම හීනයෙක් හෝ වෙමියි කියා හෝ වෙයි.

"මහණෙනි, දිව ඇති කල්හි දිව නිසා දිව ඇතුළත් කොට ගෙන මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමියි කියා හෝ වෙයි. මම සදෘශයෙක් වෙමියි කියා හෝ වෙයි. මම හීනයෙක් හෝ වෙමියි කියා හෝ වෙයි.

"මහණෙනි, කය ඇති කල්හි කය නිසා කය ඇතුළත් කොට ගෙන මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමියි කියා හෝ වෙයි. මම සදෘශයෙක් වෙමියි කියා හෝ වෙයි. මම හීනයෙක් හෝ වෙමියි කියා හෝ වෙයි.

"මහණෙනි, සිත ඇති කල්හි සිත නිසා සිත ඇතුළත් කොට ගෙන මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමියි කියා හෝ වේයි. මම සදෘශයෙක් වෙමියි කියා හෝ වෙයි. මම හීනයෙක් වෙමියි කියා හෝ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද, ඇස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

'යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවයෙන් යුක්තද එය (තණ්හාදි වශයෙන්) නොගෙන "මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමි"යි කියා හෝ වන්නේද, "මම සදෘශයෙක් වෙමි"යි කියා හෝ වන්නේද, "මම හීනයෙක් වෙමි"යි කියා හෝ වන්නේද?"-" ස්වාමීනි, එය නොවන්නේ මැයි."

5. "කණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුක්ය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරලෙන ස්වභාවයෙන් යුක්තද එය (තණ්හාදී වශයෙන්) නොගෙන "මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමි"යි කියා හෝ වන්නේද, "මම සදෘශයෙක් වෙමියි" කියා හෝ වන්නේද, "මම හීනයෙක් වෙමි"යි කියා හෝ වන්නේද?"-" ස්වාමීනි, එය නොවන්නේ මැයි."

6. "නාසය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවයෙන් යුක්තද එය (තණ්හාදී වශයෙන්) නොගෙන "මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමි"යි කියා හෝ වන්නේද, "මම සදෘශයෙක් වෙමි"යි කියා හෝ වන්නේද, "මම හීනයෙක් වෙමි"යි කියා හෝ වන්නේද?"-" ස්වාමීනි, එය නොවන්නේ මැයි."

7. "දිව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවයෙන් යුක්තද එය (තණ්හාදී වශයෙන්) නොගෙන, "මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමි"යි කියා හෝ වන්නේද, "මම සදෘශයෙක් වෙමි"යි කියා හෝ වන්නේද, "මම හීනයෙක් වෙමි"යි කියා හෝ වන්නේද?"-" ස්වාමීනි, එය නොවන්නේ මැයි."

8. කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, ඒ දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවයෙන් යුක්තද එය (තණ්හාදී වශයෙන්) නොගෙන "මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමි"යි කියා හෝ වන්නේද, "මම සදෘශයෙක් වෙමි"යි කියා හෝ වන්නේද, "මම හීනයෙක් වෙමි"යි කියා හෝ වන්නේද?"-" ස්වාමීනි, එය නොවන්නේ මැයි."

9. "සිත නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද?"-"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, එය දුක් හෝ සැප හෝ වේද?"- "ස්වාමීනි, දුකය."

"යමක් අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාවයෙන් යුක්තද එය (තණ්හාදී වශයෙන්) නොගෙන "මම ශ්‍රෙෂ්ඨයෙක් වෙමි"යි කියා හෝ වන්නේද, "මම සදෘශයෙක් වෙමි"යි කියා හෝ වන්නේද, "මම හීනයෙක් වෙමි"යි කියා හෝ වන්නේද?"-" ස්වාමීනි, එය නොවන්නේ මැයි."

10. "මහණෙ, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම ඇස කෙරෙහිද කලකිරෙයි. කණ කෙරෙහිද කලකිරෙයි. නාසය කෙරෙහිද කලකිරෙයි. දිව කෙරෙහිද කලකිරෙයි. කය කෙරෙහිද කලකිරෙයි. සිත කෙරෙහිද කලකිරෙයි කලකිරෙමින්

නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි මිදුනු කල්හි මිදුනේය යන නුවණ ඇතිවෙයි. ඉපදීම ක්ෂය විය. බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන ලදී. කළයුත්ත කරනලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගණියි" (වදාළසේක)

---

## 6. සංයොජන සූත්‍රය

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, සංයොජනයන්ට හිතවූ ධර්මයන්ද, සංයොජනයද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි සංයොජනයන්ට හිතවූ ධර්මයෝ කවරහුද, සංයොජනය කවරේද?

3. "මහණෙනි, ඇස, සංයොජනයන්ට හිතවූ ධර්මයවේ. එහි යම් ඇලීමක් වේද එය එහි සංයොජනය වේ. කණ සංයොජනයන්ට හිතවූ ධර්මයවේ. එහි යම් අලීමක් වේද, එය එහි සංයොජනය වේ. නාසය, සංයොජනයන්ට හිතවූ ධර්මයවේ. එහි යම් ඇලීමක් වේද, එය එහි සංයොජනය වේ. දිව, සංයොජනයන්ට හිතවූ ධර්මයවේ. එහි යම් ඇලීමක් වේද එය එහි සංයොජනය වේ. කය, සංයොජනයන්ට හිතවූ ධර්මයවේ. එහි යම් ඇලීමක් වේද, එය එහි සංයොජනය වේ. සිත, සංයොජනයන්ට හිතවූ ධර්මයවේ. එහි යම් ඇල්මක් වේද, එය එහි සංයොජනයවේ. මහණෙනි, මොහු සංයොජනයන්ට හිතවූ ධර්මයෝයයිද මෙය සංයොජනයයිද කියනු ලැබෙත්යයි" (වදාළේය.)

---

## 7. උපාදාන සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි උපාදානයන්ට හිතවූ ධර්මයන්ට උපාදානයද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, උපාදානයන්ට හිතවූ ධර්මයෝ කවරහුද, උපාදානය කවරේද?

3 මහණෙනි, ඇස, උපාදානයන්ට හිතවූ ධර්මය වේ. එහි යම් ඡන්දරාගයෙක් වේද එය එහි උපාදානයවේ. කණ, උපාදානයන්ට හිතවූ ධර්මයවේ. එහි යම් ඡන්දරාගයෙක් වේද, එය එහි උපාදානයවේ. නැහැය, උපාදානයන්ට හිතවූ ධර්මය වේ. එහි යම් ඡන්දරාගයෙක් වේද එය එහි උපාදානයවේ. දිව, උපාදානයන්ට හිතවූ ධර්මය වේ. එහි යම් ඡන්දරාගයෙක් වේද එය එහි උපාදානයවේ. කය, උපාදානයන්ට හිතවූ ධර්මයවේ. එහි යම් ඡන්දරාගයෙක්වේද, එය එහි උපාදානයවේ. සිත, උපාදානයන්ට හිතවූ ධර්මයවේ. එහි යම් ඡන්දරාගයෙක් වේද, එය එහි උපාදානය වේ මහණෙනි, මොව්හු උපාදානයන්ට හිතවූ ධර්මයෝයයිද මෙය උපාදානයයිද කියනු ලැබෙත්යයි" (වදාළේය.)

---

## 8. පරිජාන සූත්‍රය (1)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. මහණෙනි, ඇස විශෙෂයෙන් නොදන්නේ, පිරිසිඳ නොදන්නේ, විරාගයට නොපමුණුවන්නේ, මාර්ගඥානයෙන් පහනොකරන්නේ දුක් නැතිකිරීම පිණිස සුදුසු නොවේ. කණ, විශෙෂයෙන් නොදන්නේ, පිරිසිඳ නොදන්නේ, විරාගයට නොපමුණුවන්නේ, මාර්ගඥානයෙන් පහනොකරන්නේ දුක්නැති කිරීම පිණිස සුදුසු නොවේ. නාසය විශෙෂයෙන් නොදන්නේ, පිරිසිඳ නොදන්නේ විරාගයට නොපමුණුවන්නේ මාර්ගඥානයෙන් පහනොකරන්නේ, දුක් නැතිකිරීම පිණිස සුදුසු නොවේ. දිව, විශෙෂයෙන් නොදන්නේ, පිරිසිඳ නොදන්නේ, විරාගයට නොපමුණුවන්නේ, මාර්ගඥානයෙන්

පහනොකරන්නේ දුක් නැති කිරීම පිණිස සුදුසු නොවේ. කය, විශෙෂයෙන් නොදන්නේ, පිරිසිඳ නොදන්නේ විරාගයට නොපමුණුවන්නේ, මාර්ගඥානයෙන් පහනොකරන්නේ දුක් නැති කිරීම පිණිස සුදුසු නොවේ. සිත, විශෙෂයෙන් නොදන්නේ, පිරිසිඳ නොදන්නේ, විරාගයට නොපමුණුවන්නේ, මාර්ගඥානයෙන් දුරු නොකරන්නේ දුක් නැතිකිරීමට සුදුසු නොවේ.

3. "මහණෙනි, ඇසද, විශෙෂයෙන් දන්නේ පිරිසිඳ දන්නේ විරාගයට පමුණුවන්නේ, මාර්ගඥානයෙන් දුරු කරන්නේ දුක් නැසීමට සුදුසුවේ. කණ, විශෙෂයෙන් දන්නේ, පිරිසිඳ දන්නේ, විරාගයට පමුණුවන්නේ, මාර්ගඥානයෙන් දුරුකරන්නේ දුක් නැසීමට සුදුසුවේ. නාසය, විශෙෂයෙන් දන්නේ, පිරිසිඳ දන්නේ විරාගයට පමුණුවන්නේ මාර්ග ඥානයෙන් දුරුකරන්නේ දුක් නැසීමට සුදුසුවේ. දිව, විශෙෂයෙන් දන්නේ පිරිසිඳ දන්නේ, විරාගයට පමුණුවන්නේ, මාර්ගඥානයෙන් දුරුකරන්නේ දුක් නැසීමට සුදුසුවේ. කය, විශෙෂයෙන් දන්නේ, පිරිසිඳ දන්නේ, විරාගයට පමුණුවන්නේ මාර්ගඥානයෙන් දුරු කරන්නේ දුක් නැසීමට සුදුසුවේ. සිත, විශෙෂයෙන් දන්නේ, පිරිසිඳ දන්නේ විරාගයට පමුණුවන්නේ මාර්ගඥානයෙන් දුරු කරන්නේ දුක් නැසීමට සුදුසු වේයයි" (වදාළේය.)

---

## 9. පරිජාන සූත්‍රය (2)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දෙශනා කරන ලදී.)

2. "මහණෙනි, රූපයන් වනාහි විශෙෂයෙන් නොදන්නේ, පිරිසිඳ නොදන්නේ විරාගයට නොපමුණුවන්නේ මාර්ග ඥානයෙන් දුරු නොකරන්නේ දුක් නැසීමට සුදුසු වූයේ නොවේ. ශබ්දයන් වනාහි විශෙෂයෙන් නොදන්නේ, පිරිසිඳ නොදන්නේ,

විරාගයට නොපමුණුවන්නේ, මාර්ගඥානයෙන් දුරුනොකරන්නේ දුක් නැසීමට සුදුසුවූයේ නොවේ. ගන්ධයන් වනාහි විශෙෂයෙන් නොදන්නේ, පිරිසිඳ නොදන්නෙ විරාගයට නොපමුණුවන්නේ, මාර්ගඥානයෙන් දුරු නොකරන්නේ දුක් නැසීමට සුදුසු වූයේ නොවේ රසයන් වනාහි විශෙෂයෙන් නොදන්නේ, පිරිසිඳ නොදන්නේ විරාගයට නොපමුණුවන්නේ, මාර්ගඥානයෙන් දුරු නොකරන්නේ දුක් නැසීමට සුදුසු වූයේ නොවේ. ස්පර්ශයන් වනාහි විශෙෂයෙන් නොදන්නේ පිරිසිඳ නොදන්නේ විරාගයට නොපමුණුවන්නේ මාර්ගඥානයෙන් දුරු නොකරන්නේ දුක් නැසීමට සුදුසු වූයේ නොවේ. ධර්මයන් වනාහි විශෙෂයෙන් නොදන්නේ පිරිසිඳ නොදන්නේ විරාගයට නොපමුණුවන්නේ, මාර්ගඥානයෙන් දුරු නොකරන්නේ දුක් නැසීමට සුදුසු වූයේ නොවේ

3. "මහණෙනි, රූපයන්ද වනාහි විශෙෂයෙන් දන්නේ, පිරිසිඳ දන්නේ විරාගයට පමුණුවන්නේ, මාර්ගඥානයෙන් දුරු කරන්නේ දුක් නැසීමට සුදුසුවූයේ වේ. ශබ්දයන් වනාහි විශෙෂයෙන් දන්නේ පිරිසිඳ දන්නේ, විරාගයට පමුණුවන්නේ මාර්ගඥානයෙන් දුරුකරන්නේ දුක් නැසීමට සුදුසු වූයේ වේ. ගන්ධයන් වනාහි විශෙෂයෙන් දන්නේ, පිරිසිඳ දන්නේ, විරාගයට පමුණුවන්නේ, මාර්ගඥානයෙන් දුරු කරන්නේ දුක් නැසීමට සුදුසු වූයේ වේ රසයන් වනාහි විශෙෂයෙන් දන්නේ පිරිසිඳ දන්නේ, විරාගයට පමුණුවන්නේ මාර්ගඥානයෙන් දුරුකරන්නේ දුක් නැසීමට සුදුසු වූයේවේ. ස්පර්ශයන් වනාහි විශෙෂයෙන් දන්නේ, පිරිසිඳ දන්නේ විරාගයට පමුණුවන්නේ මාර්ගඥානයෙන් දුරුකරන්නේ දුක්නැසීමට සුදුසු වූයේ වේ. ධර්මයන් විශෙෂයෙන් දන්නේ පිරිසිඳ දන්නේ විරාගයට පමුණුවන්නේ මාර්ගඥානයෙන් දුරුකරන්නේ දුක් නැසීමට සුදුසු වේයයි' (වදාළේය)

---

## 10. උපස්සුති සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ නෑයන් විසින් කරනලද 'ගිඤ්ජකාවසථයෙහි' (උළු සෙවිලි ඇති ආවාසයක) වාසය කරණ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රහසිගතව විවේකව වැඩවසමින් මේ ධර්ම පයර්‍ය්‍යාය වදාළසේක.

2. "ඇසද, රූපයද, නිසා චක්ඛු විඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශයවේ. ස්පර්ශය හෙතුකොට ගෙණ වේදනාව වේ. වේදනාව හේතුකොටගෙණ තෘෂ්ණාව වේ. තෘෂ්ණාව හෙතුකොටගෙණ උපාදානය වේ. උපාදානය නිසා භවය වේ භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරා මරණය, සෝක, පරිදේව, දුක් දොම්නස් යන මොහු හට ගණිත්. මෙසේ මේ සියලු දුක් සමූහයාගේ හටගැණීමවේ.

3. "කණද, ශබ්දයද නිසා සෝත විඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ. ස්පර්ශය හෙතු කොටගෙන වේදනාව වේ. වේදනාව හේතුකොට ගෙන තෘෂ්ණාව වේ. තෘෂ්ණාව හෙතුකොට ගෙන උපාදානය වේ. උපාදානය නිසා භවයවේ. භවය නිසා ජාතියවේ ජාතිය නිසා ජරාමරණය, ශොක පරිදේව දුක් දොම්නස් උපායාස යන මොහු හටගණිත්. මෙසේ මේ දුක් සමූහයාගේ හටගැණීම වේ.

4. "නාසයද, ශබ්දයද නිසා ඝාණ විඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශයවේ. ස්පර්ශය හේතුකොට ගෙන වේදනාව වේ. වේදනාව හේතුකොට ගෙන තෘෂ්ණාව වේ. තෘෂ්ණාව හෙතුකොට ගෙන උපාදානය වේ. උපාදානය නිසා භවය වේ. භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරාමරණය, සෝක, පරිදේව, දුක් දොම්නස්, උපායාස යන මොහු හටගණිත්. මෙසේ මේ සියලු දුක් සමූහයාගේ හටගැණීම වෙ.

5. "දිවද, රසයද, නිසා ජිව්හා විඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ. ස්පර්ශය හේතුකොට ගෙන

වේදනාව වේ. වේදනාව හේතුකොට ගෙන තෘෂ්ණාව වේ. තෘෂ්ණාව හේතුකොට ගෙණ උපාදානය වේ. උපාදානය නිසා භවය වේ. භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරා මරණය, සෝක, පරිදේව, දුක් දොම්නස්, උපායාස යන මොහු හටගණිත් මෙසේ මේ සියලු දුක් සමූහයාගේ හටගැණීම වේ.

6. "කයද, ස්පර්ශයද, නිසා කායවිඥ්ඥාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ. ස්පර්ශය හේතුකොට ගෙණ වේදනාව වේ වේදනාව හේතුකොටගෙණ තෘෂ්ණාව වේ තෘෂ්ණාව හෙතුකොට ගෙණ උපාදානය වේ. උපාදානය නිසා භවය වේ. භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරා මරණය, සෝක, පරිදේව, දුක් දොම්නස්, උපායාස යන මොහු හටගණිත්. මෙසේ මේ සියලු දුක් සමූහයාගේ හට ගැණීමවේ.

7. "සිතද, ධර්මයන්ද නිසා මනෝ විඥ්ඥාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම හේතුකොටගෙන ස්පර්ශයවේ. ස්පර්ශය හේතුකොට ගෙණ වේදනාව වේ. වේදනාව හේතුකොට ගෙණ තෘෂ්ණාව වේ. තෘෂ්ණාව හෙතුකොටගෙන උපාදානය වේ උපාදානය නිසා භවය වේ. භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරාමරණය, දුක් දොම්නස්, උපායාස යන මොහු හටගණිත්. මෙසේ මේ සියලු දුක් සමූහයාගේ හටගැණීම වේ.

8. "ඇසද, රූපයන්ද නිසා චක්ඛු විඥ්ඥාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම නිසා ස්පර්ශය වේ. ස්පර්ශය හේතු කොටගෙණ වේදනාව වේ. වේදනාව හේතුකොට ගෙණ තෘෂ්ණාව වේ. ඒ තෘෂ්ණාව ඉතිරි නොකොට මාර්ගයෙන් පහකිරීමෙන් උපාදාන නිරොධයවේ උපාදාන නිරෝධය නිසා භවය නිරෝධවේ. භවය නිරෝධවීම නිසා ජාතිය නිරෝධවේ. ජාතිය නිරෝධවීම නිසා ජරාමරණය, සෝක, පරිදේව, දුක් දොම්නස්, උපායාස යන මොහු හට නොගණිත්. මෙසේ මේ සියලු දුක් සමූහයාගේ නිරෝධයවේ.

9. "කණද, ශබ්දයද, නිසා සෝත විඥ්ඥාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශයවේ. ස්පර්ශය හේතුකොට ගෙන

වේදනාව වේ. වේදනාව හේතුකොටගෙන තෘෂ්ණාව වේ. ඒ තෘෂ්ණාව ඉතිරි නොකොට මාර්ගයෙන් පහකිරීමෙන් උපාදාන නිරොධය වේ. උපාදාන නිරොධය නිසා භවය නිරෝධවේ. භවය නිරෝධවීම නිසා ජාතිය නිරෝධවේ. ජාතිය නිරෝධවීම නිසා ජරාමරණය, සෝක, පරිදේව, දුක් දොම්නස්, උපායාස යන මොහු හට නොගණිත්. මෙසේ මේ සියලු දුක් සමූහයාගේ නිරොධයවේ.

10. නාසයද, ගන්ධයද, නිසා සාණ විඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශයවේ. ස්පර්ශය හේතුකොටගෙන වේදනාවවේ. වේදනාව හේතුකොටගෙන තෘෂ්ණාව වේ. ඒ තෘෂ්ණාව ඉතිරි නොකොට මාර්ගයෙන් පහකිරීමෙන් උපාදාන නිරෝධය වේ. උපාදාන නිරොධය නිසා භවය නිරෝධවේ. භවය නිරෝධවීම නිසා ජාතිය නිරෝධවේ. ජාතිය නිරෝධවීම නිසා ජරාමරණය, සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාස යන මොහු හටනොගණිත්. මෙසේ මේ සියලු දුක් සමූහයාගේ නිරොධය වේ.

11. දිවද, රසයද, නිසා ජිව්හාවිඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශයවේ. ස්පර්ශය හේතුකොට ගෙන වේදනාව වේ. වේදනාව හේතුකොටගෙන තෘෂ්ණාව වේ. ඒ තෘෂ්ණාව ඉතිරි නොකොට මාර්ගයෙන් පහකිරීමෙන් උපාදාන නිරොධය වේ. උපාදාන නිරොධය නිසා භවය නිරෝධවේ. භවය නිරෝධවීම නිසා ජාතිය නිරෝධවේ. ජාතිය නිරෝධවීම නිසා ජරාමරණය, සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාස යන මොහු හට නොගණිත්. මෙසේ මේ සියලු දුක් සමූහයාගේ නිරොධය වේ.

12. "කයද, ස්පර්ශයද, නිසා කායවිඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශය වේ. ස්පර්ශය හේතුකොට ගෙන වේදනාව වේ. වේදනාව හේතුකොටගෙන තෘෂ්ණාව වේ. ඒ තෘෂ්ණාව ඉතිරි නොකොට මාර්ගයෙන් පහකිරීමෙන් උපාදාන නිරොධය වේ. උපාදාන නිරොධය නිසා භවය නිරෝධවේ.

භවය නිරෝධවීම නිසා ජාතිය නිරෝධවේ. ජාතිය නිරෝධවීම නිසා ජරාමරණය, සෝක, පරිදේව, දුක් දොම්නස්, උපායාස යන මොහු හට නොගණිත්. මෙසේ මේ සියලු දුක් සමූහයාගේ නිරෝධය වේ.

13. "සිතද, ධර්මයන්ද, නිසා මනෝවිඤ්ඤාණය උපදියි. ඒ තුන්දෙනාගේ එක්වීම ස්පර්ශයවේ ස්පර්ශය හේතුකොට ගෙන වේදනාවවේ. වේදනාව හේතුකොටගෙන තෘෂ්ණාවවේ. එම තෘෂ්ණාව ඉතිරි නොකොට මාර්ගයෙන් පහකිරීමෙන් උපාදාන නිරොධයවේ. උපාදාන නිරොධය නිසා භවය නිරෝධවේ. භවය නිරෝධවීම නිසා ජාතිය නිරෝධවේ. ජාතිය නිරෝධවීම නිසා ජරාමරණය, සෝක, පරිදේව, දුක් දොම්නස්, උපායාස යන මොහු හටනොගණිත්. මෙසේ මේ සියලු දුක් සමූහයාගේ නිරොධය වේයයි. (වදාළේය.)

14. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක්තෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි අසාගෙණ සිටියේ වෙයි. සමීපයෙහි අසා සිටි ඒ භික්ෂුව භාග්‍යවතුන්වහන්සේ දුටුසේක. දැක ඒ භික්ෂුවට මෙය වදාළේය. "මහණ, නුඹ මේ ධර්මපර්‍ය්‍යාය ඇසුවෙහිද" කියායි. "එසේය, ස්වාමීනියි" හේ පිළිතුරු දිනි. මහණ, නුඹ මේ ධර්මපර්‍ය්‍යාය උගණුව. මහණ, නුඹ මේ ධර්මපර්‍ය්‍යාය පුරුදු කරව මහණ, නුඹ මේ ධර්මපර්‍ය්‍යාය දරව. මහණ, මේ ධර්ම පර්‍ය්‍යාය තෙම ආදි බ්‍රහ්මචරියක (බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරීමට මුල්) වූයේ, වැඩ පිණිස පවතින්නේවේයයි" වදාළේය.

(පළමුවන යොගක්ඛෙම් වර්ගය නිමි.)

---

## 2. ලෝක කාම ගුණ වර්ගය.

### 1. මාරපාස සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේය.

2. මහණෙනි, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම් සැප ගෙන දෙන්නාවූ, ඇලුම් කටයුතුවූ රූපයෝ වෙත්. ඉදින් මහණතෙම එයට සතුටු වෙයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවා වසන තැනට පැමිණියේ, මරුවාගේ වසඟයට පැමිණියේ, මළපුඩුව ගෙලෙහි දමන ලද්දේ වන්නේය. මාරයාගේ බැම්මෙන් බඳනා ලද්දාවූ හෙතෙම මාරයා කැමැති දෙයක් කළයුත්තෙක් වන්නේයයි කියනු ලැබේ.

3. මහණෙනි, සෝතවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ ශබ්දයෝ වෙත්. ඉදින් මහණතෙම එයට සතුටුවෙයිද එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවා වසන තැනට පැමිණියේ මරුවාගේ වසඟයට පැමිණියේ, මළපුඩුව ගෙලෙහි දමන ලද්දේ වන්නේය. මාරයාගේ බැම්මෙන් බඳනා ලද්දාවූ හෙතෙම මාරයා කැමැති දෙයක් කළයුත්තෙක් වන්නේයයි කියනු ලැබේ.

4. මහණෙනි, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ ගන්ධයෝ වෙත් ඉදින් මහණතෙම එයට සතුටුවෙයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටීද, මහණෙනි මේ භික්ෂුතෙම මරුවා වසන තැනට පැමිණියේ, මරුවාගේ වසඟයට පැමිණියේ මළපුඩුව ගෙලෙහි දමන ලද්දේ වන්නේය. මාරයාගේ බැම්මෙන් බඳනා ලද්දාවූ හෙතෙම මාරයා කැමැති දෙයක් කළයුත්තෙක් වන්නේයයි කියනු ලැබේ.

5. මහණෙනි, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ රූපයෝ වෙත්. ඉදින් මහණතෙම එයට සතුටු වෙයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවා වසන තැනට පැමිණියේ, මරුවාගේ වසඟයට, පැමිණියේ මළ පුඩුව ගෙලෙහි දමන ලද්දේ වන්නේය. මාරයාගේ බැම්මෙන් බඳනා ලද්දාවූ හෙතෙම මාරයා කැමැති දෙයක් කළ යුත්තෙක් වන්නේයයි කියනු ලැබේ.

6 මහණෙනි, කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇළුම් කටයුතුවූ ස්පර්ශයෝ වෙත් ඉදින් මහණතෙම එයට සතුටුවෙයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවා වසන තැනට පැමිණියේ, මරුවාගේ වසඟයට, පැමිණියේ මළ පුඩුව, ගෙලෙහි දමන ලද්දේ වන්නේය. මාරයාගේ බැම්මෙන් බඳනා ලද්දාවූ හෙතෙම මාරයා කැමැති දෙයක් කළ යුත්තෙක් වන්නේයයි කියනු ලැබේ

7. මහණෙනි, මනෝවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙන දෙන්නාවූ ඇලුම් කටයුතුවූ, ධර්මයෝ වෙත්. ඉදින් මහණ, තෙම එයට සතුටුවෙයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලීසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවා වසන තැනට පැමිණියේ, මරුවාගේ වසඟයට පැමිණියේ, මළපුඩුව ගෙලෙහි දමන ලද්දේ වන්නේය. හෙතෙම මරුවාගේ බැම්මෙන් බඳනා ලද්දේ මරුවාට කැමැති දෙයක් කළ යුත්තෙක් වන්නේයයි වන්නේය.

8. "මහණෙනි, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සුව ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ රූපයෝ වෙත්. ඉදින් මහණතෙම එයට නොකැමැති වේද, එය ප්‍රියයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවා වසන

තැනට නොපැමිණියේ, මරුවාගේ වසඟයට නොපැමිණියේ, මළපුඩුව මුදන ලද්දේ වන්නේය. මරුවාගේ බැම්මෙන් මිදුනාවූ හෙතෙම මරුවාට කැමැති දෙයක් කළයුත්තෙක් නොවන්නේය.

9 "මහණෙනි, සෝත විඥ්ඥාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සුව ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ ශබ්දයෝ වෙත්. ඉදින් මහණතෙම එයට නොකැමැතිවේද, එය ප්‍රියයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවා වසන තැනට නොපැමිණියේ, මරුවාගේ වසඟයට නොපැමිණියේ, මළපුඩුව මුදන ලද්දේ වන්නේය. මරුවාගේ බැම්මෙන් මිදුනාවූ හෙතෙම මරුවාට කැමැති දෙයක් කළ යුත්තෙක් නොවන්නේය.

10. "මහණෙනි, ඝාණ විඥ්ඥාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සුව ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ ගන්ධයෝ වෙත්. ඉදින් මහණතෙම එයට නොකැමැති වේද, එය ප්‍රියයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවා වසන තැනට නොපැමිණියේ, මරුවාගේ වසඟයට නොපැමිණියේ, මළපුඩුව මුදන ලද්දේ වන්නේය. මරුවාගේ බැම්මෙන් මිදුනාවූ හෙතෙම මරුවාට කැමැති දෙයක් කළ යුත්තෙක් නොවන්නේය.

11. "මහණෙනි, ජිව්හා විඥ්ඥාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සුව ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, රසයෝ වෙත්. ඉදින් මහණ තෙම එයට නොකැමැතිවේද, එය ප්‍රියයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවා වසන තැනට නොපැමිණියේ, මරුවාගේ වසඟයට නොපැමිණියේ, මළපුඩුව මුදන ලද්දේ වන්නේය. මරුවාගේ බැම්මෙන් මිදුනාවූ හෙතෙම මරුවාට කැමැති දෙයක් කළ යුත්තෙක් නොවන්නේය.

12. "මහණෙනි, කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සුව ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ ස්පර්ශයෝ වෙත්. ඉදින් මහණතෙම එයට නොකැමැති වේද, එය ප්‍රියයයි නොකියයිද,

එහි ගැලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවා වසන තැනට නොපැමිණියේ, මරුවාගේ වසඟයට නොපැමිණියේ, මළපුඩුව මුදන ලද්දේ වන්නේය. මරුවාගේ බැම්මෙන් මිදුනාවූ හෙතෙම මරුවාට කැමැති දෙයක් කළ යුත්තෙක් නොවන්නේය.

13. "මහණෙනි, මනො විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සුව ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ ධර්මයෝ වෙත්. ඉදින් භික්ෂුතෙම එයට නොකැමැති වෙයිද, එය ප්‍රියයයි නොකියයිද, එහි ගිලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවා වසන තැනට නොපැමිණියේ, මරුවාගේ වසඟයට නොපැමිණියේ, මළපුඩුව මුදන ලද්දේ වන්නේය. මරුවාගේ බැම්මෙන් මිදුනාවූ හෙතෙම මරුවාට කැමැති දෙයක් කළයුත්තෙක් නොවන්නේයයි" (වදාළේය.)

---

## 2. මාරපාස සූත්‍රය. (2)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙන දෙන්නාවූ ඇලුම් කටයුතුවූ රූපයෝ වෙත්. ඉදින් භික්ෂුතෙම එයට කැමැති වෙයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ රූපයන් කෙරෙහි බැඳුනේ, මරුවා වසන තැනට පැමිණියේ මරුවාගේ වසඟයට ගියේ, මරුවා විසින් කැමැති දෙයක් කළ යුත්තෙක් වේයයි කියනු ලැබේ.

2 "මහණෙනි, සෝතවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙන දෙන්නාවූ, ඇලුම් කටයුතුවූ ශබ්දයෝවෙත් ඉදින් භික්ෂුතෙම එයට කැමැති වෙයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම සෝත විඤ්ඤාණයෙන් දතයුතුවූ,

ශබ්දයන් කෙරෙහි බැඳුනේ, මරුවා වසන තැනට පැමිණියේ, මරුවාගේ වසඟයට ගියේ, මරුවා විසින් කැමැති දෙයක් කළ යුත්තෙක් වේයයි කියනු ලැබේ.

4 "මහණෙනි, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම් සැප ගෙන දෙන්නාවූ, ඇලුම් කටයුතුවූ ගන්ධයෝ වෙත්. ඉදින් භික්ෂුතෙම එයට කැමැති වෙයිද එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ, ගන්ධයන් කෙරෙහි බැඳුනේ මරුවා වසන තැනට පැමිණියේ, මරුවාගේ වසඟයට ගියේ, මරුවා විසින් කැමැති දෙයක් කළ යුත්තෙක් වේයයි කියනු ලැබේ.

5. "මහණෙනි, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම් සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ රසයෝ වෙත්. ඉදින් භික්ෂු තෙම එයට කැමැති වෙයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටීද, මහණෙනි, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසයන් කෙරෙහි බැඳුනේ, මරුවා වසන තැනට පැමිණියේ, මරුවාගේ වසඟයට ගියේ, මරුවා විසින් කැමැති දෙයක් කළයුත්තෙක් වේයයි කියනු ලැබේ.

6. "මහණෙනි, කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම් සැප ගෙන දෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, ස්පර්ශයෝ වෙත්. ඉදින් භික්ෂුතෙම එයට කැමැති වෙයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ස්පර්ශයන් කෙරෙහි බැඳුනේ, මරුවා වසන තැනට පැමිණියේ, මරුවාගේ වසඟයට ගියේ, මරුවා විසින් කැමැති දෙයක් කළ යුත්තෙක් වේයයි කියනු ලැබේ.

7. "මහණෙනි, මනෝ විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, ධර්මයෝ වෙත්. ඉදින් භික්ෂුතෙම එයට කැමැති වෙයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී

සිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මනෝ විඥ්ඤාණයෙන් දතයුතුවූ ධර්මයන් කෙරෙහි බැඳුනේ, මරුවා වසන තැනට පැමිණියේ, මරුවාගේ වසඟයට ගියේ, මරුවා විසින් කැමැති දෙයක් කළ යුත්තෙක් වේයයි කියනු ලැබේ.

8. "මහණෙනි, චක්ඛු විඥ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, රූපයෝ ඇත්තාහ ඉදින් භික්ෂුතෙම එයට කැමැති නොවෙයිද, එය ප්‍රියයයි නොකියයිද එහි ගැලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම චක්ඛු විඥ්ඤාණයෙන් දතයුතුවූ, රූපයන්ගෙන්, මිදුනේ මරුවා වසන තැනට නොපැමිණියේ, මරුවාගේ වසඟයට නොගියේ මරුවා විසින් කැමැති දෙයක් කළ යුත්තෙක් නොවේයයි කියනු ලැබේ.

9. "මහණෙනි, සෝත විඥ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම් සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, ශබ්දයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට කැමැති නොවෙයිද, එය ප්‍රියයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම සෝත විඥ්ඤාණයෙන් දතයුතුවූ, ශබ්දයන්ගෙන් මිදුනේ, මරුවා වසන තැනට නොපැමිණියේ, මරුවාගේ වසඟයට නොගියේ, මරුවා විසින් කැමැති දෙයක් කළ යුත්තෙක් නොවේයයි කියනු ලැබේ.

10. "මහණෙනි, ඝාණ විඥ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, ගන්ධයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට කැමැති නොවෙයිද, එය ප්‍රියයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම ඝාණ විඥ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධයන්ගෙන්, මිදුනේ මරුවා වසන තැනට නොපැමිණියේ, මරුවාගේ වසඟයට නොගියේ, මරුවා විසින් කැමැති දෙයක් කළ යුත්තෙක් නොවේයයි කියනු ලැබේ.

11. "මහණෙනි, ජිව්හා විඥ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, රසයෝ ඇත්තාහ. ඉදින්

භික්ෂුතෙම එයට කැමැති නොවෙයිද, එය ප්‍රියයයි නොකියයිද එහි ගැලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම ජිව්හා විඥ්ඥාණයෙන් දතයුතුවූ රසයන්ගෙන් මිදුනේ, මරුවා වසන තැනට නොපැමිණියේ, මරුවාගේ වසඟයට නොගියේ, මරුවා විසින් කැමැති දෙයක් කළ යුත්තෙක් නොවේයයි කියනු ලැබේ.

12. "මහණෙනි, කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කටයුතුවූ, ස්පර්ශයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට කැමැති නොවෙයිද, එය ප්‍රියයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, මහණෙනි මේ භික්ෂුතෙම කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ, ස්පර්ශයන්ගෙන් මිදුනේ, මරුවා වසන තැනට නොපැමිණියේ, මරුවාගේ වසඟයට නොගියේ මරුවා විසින් කැමැති දෙයක් කළ යුත්තෙක් නොවේයයි කියනු ලැබේ.

13. මහණෙනි, මනෝ විඥ්ඥාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම් සැප ගෙනදෙන්නාවූ, ඇලුම් කරන්නාවූ, ධර්මයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට නොකැමැති වෙයිද, එය ප්‍රියයයි, මනාපයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මනෝ විඥ්ඥාණයෙන් දතයුතුවූ ධර්මයන්ගෙන් මිදුනේ, මරුවා වසන තැනට නොපැමිණියේ, මරුවාගේ වසඟයට නොගියේ, මරුවා විසින් කැමැති දෙයක් කළ යුත්තෙක් නොවේයයි කියනු ලැබේයයි" වදාළේය.

---

## 3. ලෝකකාමගුණ සූත්‍රය. (1)

(මේ සූත්‍රයේ මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, මම ගමනින් චක්‍රවාට ලෝකයාගේ කෙළවර දත හැකිය, දැක්ක හැකිය, පැමිණිය හැකියයි නොකියමි.

මහණෙනි, මම වනාහි සංස්කාර ලෝකයාගේද කෙළවරට නොපැමිණ දුක් කෙළවරකිරීම නොකියමියි" (වදාළේය.) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.

3. ඉක්බිති ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ කල්හි මෙබඳු අදහසක් විය. "ඇවැත්නි, අපට භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් මේ උදෙසීම උදෙසා විස්තරයෙන් අර්ථය විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක. 'මහණෙනි, මම ගමනින් චක්‍රවාට ලෝකයාගේ කෙළවර දත හැකිය, දැක්ක හැකිය, පැමිණිය හැකි යයි නොකියමි. මහණෙනි, මම වනාහි සංස්කාර ලෝකයාගේද කෙළවරට නොපැමිණ දුක් කෙළවර කිරීම නොකියමි' යනුයි භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තර වශයෙන් අර්ථය විභාග නොකරන ලද මේ උද්දේසයාගේ අර්ථය විස්තර වශයෙන් කවරෙක් වනාහි විභාග කරන්නේද" කියායි. ඉක්බිති ඒ භික්ෂූන්ට මෙබඳු අදහසක් විය.

'මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ වනාහි ශාස්තෲන් වහන්සේ විසින්ද මනාකොට වර්ණනා කරන ලද්දේය. නුවණ ඇති සබ්‍රම් සරුන් විසින්ද, ගරු කරන ලද්දේය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තර වශයෙන් අර්ථය විභාග නොකරණ ලද මේ උද්දේසයාගේ අර්ථ විස්තර වශයෙන් විභාග කරන්ට සමර්ථවේ. අපි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට යන්නෙමු නම්, ගොස් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගෙන් මේ කරුණ අසන්නෙමු නම් ඉතා යෙහෙකැයි' කියායි.

4. ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ යම් තැනෙක්හිද එතැනට ගියාහුය. ගොස් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූවාහුය. සතුටුවිය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එක් පසෙක හුන්නාහුය. එක්

පසක හුන්නාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙය සැළ කළාහුය. “ඇවැත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, අපට භාග්‍යවතුන් වහන්සේ මේ උද්දේසය සැකෙවින් උදෙසා විස්තරයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.

‘මහණෙනි, මම ගමනින් චක්‍රවාට ලෝකයාගේ කෙළවර දත හැකිය, දැක්ක හැකිය, පැමිණිය හැකියයි නොකියමි. මහණෙනි, මම වනාහි සංස්කාර ලෝකයාගේ කෙළවරට නොපැමිණ දුක් කෙළවර කිරීම නොකියමි’ යනුයි. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ කල්හි ඒ මේ අපට මෙබඳු අදහසක් විය. ‘ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් මේ උදෙසීම උදෙසා විස්තරයෙන් අර්ථය විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.

‘මහණෙනි, මම ගමනින් චක්‍රවාට ලෝකයාගේ කෙළවර දත හැකිය, දැක්ක හැකිය, පැමිණිය හැකියයි නොකියමි. මහණෙනි, මම වනාහි සංස්කාර ලෝකයාගේ කෙළවරට නොපැමිණ දුක් කෙළවර කිරීම නොකියමි’ යනුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තරයෙන් අර්ථ විභාග නොකරණ ලද මේ උද්දේසයාගේ අර්ථය විස්තර වශයෙන් කවරෙක් වනාහි විභාග කරන්නේද, කියායි. ඇවැත්නි, ඒ මේ අපට මෙබඳු අදහසක් විය.

‘මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ වනාහි ශාස්තෘන් වහන්සේ විසින් මනාව වර්ණනා කරණ ලද්දේය. නුවණ ඇති සබ්‍රම් සරුන් විසින්ද ගරු කරණ ලදී. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන්වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තරයෙන් අර්ථ විභාග නොකරන ලද මේ උද්දේසයාගේ අර්ථ විස්තර වශයෙන් විභාග කරන්ට සමර්ථ වේ. අපි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ යම් තැනෙක්හිද එතැනට යන්නෙමු නම්, ගොස් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගෙන් මේ කරුණ අසන්නෙමු නම් යෙහෙක’ කියායි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ එය විභාග කරණ සේක්වායි” කීහ.

**5.** "ඇවැත්නි, යම්සේ හරයෙන් ප්‍රයෝජන ඇත්තාවූ, හරය සොයන්නාවූ පුරුෂයෙක් තෙම හර සොයමින් හැසිරෙන්නේ හරය පිහිටියාවූ හරය ඇත්තාවූ මහත් වෘක්ෂයක්හුගේ මුලද, කඳද ඉක්මවා අතුරිකිලිවල හරය සෙවිය යුතු යයි හඟින්නේද, ආයුෂ්මත්හු ශාස්තෲන් වහන්සේ සම්මුඛවූ කල්හි ඒ භාග්‍යවතුන් වහන්සේ ඉක්මවා අපගෙන් මේ කාරණය ඇසිය යුතුයයි හඟින්නාහුය. එයද ඒ හා සමානය.

"ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි දතයුත්තම දනියි, දැකිය යුත්ත දකියි, ඇසක් වැනිවූ නුවණක්මවූ ධර්මයක්ම වූ ශ්‍රෙෂ්ඨවූ ධර්මය කියන්නාවූ පවත්වන්නාවූ අර්ථය නිකුත් කොට දක්වන්නාවූ, අමෘතය දෙන්නාවූ, ධර්ම ස්වාමීවූ තථාගතයන් වහන්සේය. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේගෙන්ම මේ කාරණය අසන්නාහුද, යම්සේ තොපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරන්නේද, එසේ එය දරන්නහුද, මෙයට ඒ කාලයද වූයේයයි" කීය.

"ඇවැත්නි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ දතයුත්ත දනියි. දැක්ක යුත්ත දකියි. ඇසක් මෙන්වූ නුවණක්මවූ ධර්මයක්මවූ ශ්‍රෙෂ්ඨවූ, ධර්මය දේශනා කරන්නාවූ ධර්මය පවත්වන්නාවූ අර්ථය නිකුත් කොට දක්වන්නාවූ අමෘතය දෙන්නාවූ ධර්ම ස්වාමීවූ තථාගතයන් වහන්සේය, යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේගෙන්ම මේ කාරණය අසන්නෙමුද, යම්සේ අපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරන්නේද, එසේ එය දරන්නෙමුද, මෙයට ඒ සුදුසු කාලයද වූයේය. එතකුදුවුවත්, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ශාස්තෲන් වහන්සේ විසින්ද මනාව වර්ණනා කරණ ලද්දේය, නුවණැති සබ්‍රම්වරුන් විසින්ද ගරු කරණ ලද්දේය, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තරයෙන් අර්ථ විභාග නොකරණ ලද, මේ උද්දෙසයාගේ අර්ථ විස්තරයෙන් විභාග කරන්ට සමර්ථවේ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ බරකොට නොසිතා ලිහිල්කොට විස්තර කරනු මැනවැයි" කීහ.

**6.** "ඇවැත්නි, එසේවී නම් අසව්, යහපත් කොට මෙනෙහි කරව්, කියන්නෙමි,"-"ඇවැත්නි, එසේය" කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට පිළිතුරු දුන්හ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ මෙය ප්‍රකාශ කෙළේය.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, මම ගමනින් චක්‍රවාළ ලෝකයාගේ කෙළවර දතහැකිය, දැක්ක හැකිය පැමිණිය හැකියයි නොකියමි. මහණෙනි, මම වනාහි සංස්කාර ලෝකයාගේ කෙළවරට නොපැමිණ දුක් කෙළවර කිරීම නොකියමි' යන යම් උද්දේසයක් සැකෙවින් උදෙසා විස්තරයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක්ද, ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තරයෙන් අර්ථ විභාග නොකරණ ලද මේ උද්දේසයාගේ අර්ථය මෙසේ විස්තරයෙන් දනිමි.

**7.** "ඇවැත්නි, යමක් නිසා ලෝකයෙහි ලෝකයයි හඟින්නේ වෙයිද, ලෝකයයි සිතන්නේ වේද, මෙය ආර්‍ය්‍ය විනයෙහි ලෝකයයි කියනු ලැබේ. ඇවැත්නි, කුමක් නිසා ලෝකයෙහි ලෝකයයි හඟින්නේ වෙයිද, ලෝකයයි සිතන්නේ වේද?

"ඇවැත්නි, ඇස නිසා ලෝකයෙහි ලෝකයයි හඟින්නේ වෙයි. ලෝකයයි සිතන්නේ වෙයි. ඇවැත්නි, කණ නිසා ලෝකයෙහි ලෝකයයි හඟින්නේවෙයි. ලෝකයයි සිතන්නේ වෙයි. ඇවැත්නි, නාසය නිසා ලෝකයෙහි ලෝකයයි හඟින්නේ වෙයි. ලෝකයයි සිතන්නේ වෙයි. දිව නිසා ලෝකයෙහි ලෝකයයි හඟින්නේ වෙයි. ලෝකයයි සිතන්නේ වෙයි. ඇවැත්නි, කය නිසා ලෝකයෙහි ලෝකයයි හඟින්නේ වෙයි. ලෝකයයි සිතන්නේ වෙයි, ඇවැත්නි, සිත නිසා ලෝකයෙහි ලෝකයයි හඟින්නේ වෙයි. ලෝකයයි සිතන්නේ වෙයි. මෙය ආර්‍ය්‍ය විනයෙහි ලෝකයයි කියනු ලැබේ.

**8.** 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ තොපට සැකෙවින් යම් උදෙසීමක් උදෙසා විස්තරයෙන් අර්ථය විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට පිවිසි සේක්ද, 'මහණෙනි, මම

ගමනින් ලෝකයාගේ කෙළවර දතහැකිය. දැක්ක හැකිය. පැමිණිය හැකියයි නොකියමි. මහණෙනි මම වනාහි ලෝකයාගේ කෙළවරට නොපැමිණ දුක් කෙළවර කිරීම නොකියමි’යි. ඇවැත්නි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තරයෙන් අර්ථ විභාග නොකරණ ලද මේ උද්දේසයාගේ අර්ථය මෙසේ විස්තරයෙන් දනිමි. ආයුෂ්මත්නි, කැමැති වන්නාහු නම් තෙපි භාග්‍යවතුන් වහන්සේ කරාම එළඹ මේ කාරණය විචාරව්. යම්සේ තොපට භාග්‍යවතුන්වහන්සේ ප්‍රකාශ කරද්ද එසේ එය දරා ගනිව්යයි” කීය.

**9.** “ඇවැත්නි, එසේයයි” ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට පිළිතුරු දී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක උන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළාහුය.

“ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අපට යම් උද්දේසයක් වනාහි සැකෙවින් උදෙසා විස්තරයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක්ද, ‘මහණෙනි, මම ගමනින් ලෝකයාගේ කෙළවර දත හැකිය, දැක්ක හැකිය, පැමිණිය හැකියයි නොකියමි. මහණෙනි, මම වනාහි ලෝකයාගේ කෙළවරට නොපැමිණ දුක් කෙළවර කිරීම නොකියමි’ යනුයි. ස්වාමීනි, ඒ මේ අපට භාග්‍යවතුන් වහන්සේ වැඩිය නොබෝ කල්හි මෙබඳු අදහසක් විය.

**10.** “ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට මේ උද්දේසය සැකෙවින් උදෙසා විස්තරයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක. ‘මහණෙනි, මම ගමනින් ලෝකයාගේ කෙළවර දත හැකිය. දැක්ක හැකිය පැමිණිය හැකියයි නොකියමි. මහණෙනි, මම වනාහි ලෝකයාගේ කෙළවරට නොපැමිණ දුක් කෙළවර කිරීම නොකියමි’ යනුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තරයෙන් අර්ථ විභාග නොකරන ලද මේ

උද්දේසයාගේ අර්ථය විස්තරයෙන් කවරෙක් වනාහි විභාග කරන්නේද' කියායි.

11. "ස්වාමීනි, ඒ මේ අපට මෙබඳු අදහසක් විය. 'මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ වනාහි ශාස්තෲන් වහන්සේ විසින්ද මනාකොට වර්ණනා කරන ලදී. නුවණැති සබ්‍රම් සරුන් විසින්ද ගරු කරණ ලද්දේය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තර වශයෙන් අර්ථ විභාග නොකරණ ලද මේ උද්දේසයාගේ අර්ථ විස්තරයෙන් විභාග කරන්ට සමර්ථවේ' යනුයි.

'අපි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ යම් තැනෙක්හිද එතැනට යන්නෙමු නම් ගොස් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගෙන් මේ කරුණ අසන්නෙමු නම් යෙහෙක' කියායි.

12. "ස්වාමීනි, ඉක්බිත්තෙන් අපි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට ගියෙමු. ගොස් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගෙන් මේ කරුණ ඇසුවෙමු. ස්වාමීනි, ඒ අපට මෙය ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් විසින් මේ ආකාරයන්ගෙන් මේ පදයන්ගෙන් ව්‍යඤ්ජනයන්ගෙන් අර්ථය විභාග කරණ ලද්දේයයි" කීහ.

13. "මහණෙනි, ආනන්දතෙමේ පණ්ඩිතවේ. මහණෙනි, ආනන්දතෙමේ මහත් ප්‍රඥා ඇත්තේවේ. මහණෙනි, තෙපි ඉදින් මාගෙන්ද මේ කරුණ අසන්නහු නම් ආනන්ද විසින් යම්සේ එය ප්‍රකාශ කරණ ලද්දේද, මමද එසේම ප්‍රකාශ කරන්නෙමි. ඒ දේශනාවේ අර්ථය එයම වේ. එසේම දරාගනිව්යයි" (වදාළේය.)

---

## 4. ලෝකකාමගුණ සූත්‍රය. (2)

1. (මේ සූත්‍රයද, මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, සම්බොධියෙන් පූර්වයෙහිම සම්‍යක් සම්බුද්ධ නොවූ බොධිසත්ව වූම මට මෙබඳු අදහසක් විය. 'මාගේ සිතින් විඳින ලදුව යම් ඒ පඤ්චකාම ගුණ කෙනෙක් ඉකුත් වූවාහුද, නිරුද්ධවූවාහුද, වෙනස් වූවාහුද ඒ අතීත පඤ්චකාම ගුණයන්හි හෝ වර්තමාන පඤ්චකාම ගුණයන්හි හෝ මාගේ සිත බහුල වශයෙන් ගමන් කරන්නේය. අනාගත පඤ්චකාම ගුණයන්හි හෝ ස්වල්ප වශයෙන් ගමන් කරන්නේය. මහණෙනි, ඒ මට මෙබඳු අදහසක් විය. මාගේ සිතින් පෙර අනුභව කළාවූ ඉකුත්වූ නිරුද්ධවූ වෙනස්වූ යම් පඤ්චකාම ගුණකෙනෙක් වෙත්ද, තමහට වැඩ කැමැත්තාවූ මා විසින් පඤ්චකාමයට සිත නොයැවීමත් සිහියත් චිත්තයාගේ ආරක්ෂාව කටයුත්තේය' කියායි. මහණෙනි, එහෙයින් මෙහි තොපගේද සිතින් පෙර අනුභව කරන ලද්දාවූ ඉකුත්වූ නිරුද්ධවූ වෙනස්වූ පඤ්චකාම ගුණයෝ වෙත්ද ඒ අතීත පඤ්චකාමයන්හි හෝ වර්තමාන පඤ්චකාම ගුණයන්හි හෝ තොපගේ සිත බහුල වශයෙන් ගමන් කරන්නේය. අනාගත පඤ්චකාම ගුණයන්හි හෝ ස්වල්ප වශයෙන් ගමන් කරන්නේය.

3. "මහණෙනි, එහෙයින් මෙහි තොපගේද සිතින් අනුභව කරන ලද්දාවූ ඉකුත්වූ, නිරුද්ධවූ, වෙනස්වූ පඤ්චකාම ගුණයෝ වෙත්ද එහි තමහට වැඩකැමැත්තාවූ තොප විසින් අප්‍රමාදයත් සිහියත් ආරක්ෂාව කළ යුත්තේය.

4. "මහණෙනි, එහෙයින් (නිර්වාණයෙහි) යම් තැනෙක්හි ඇසත් නිරුද්ධ වේද, රූප සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි (නිර්වාණයෙහි) කණත් නිරුද්ධවේද, ශබ්ද සංඥාවත් දුරුවේද, ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි නාසයත් නිරුද්ධවේද, ගන්ධ සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි දිවත් නිරුද්ධවේද, රස සංඥාවත් වලකීද ඒ කරුණු දතයුතුයි. යම් කරුණෙක්හි කයත් නිරුද්ධවේද, ස්පර්ශ සංඥාවත් වලකීද ඒ කරුණු දතයුතුයි. යම් කරුණෙක්හි සිතත් නිරුද්ධවේද, ධර්ම සංඥාවත් වලකීද, ඒ කරුණු දතයුතුයයි-" මෙය වදාරා භාග්‍යවතුන් වහන්සේ හුනස්නෙන් නැගිට විහාරයට ඇතුල්වූ සේක.

**5.** ඉක්බිති ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ වැඩිය නොබෝ කල්හි මෙබඳු අදහසක් විය. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට මේ උද්දේසය සැකෙවින් උදෙසා විස්තරයෙන් අර්ථය විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.

'යම් තැනෙක්හි ඇසත් නිරුද්ධවේද, රූප සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි කණත් නිරුද්ධවේද, ශබ්ද සංඥාවත් දුරුවේද, ඒ ආයතනය දතයුතුයි යම් තැනෙක්හි නාසයත් නිරුද්ධවේද, ගන්ධ සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි දිවත් නිරුද්ධවේද, රස සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම්තැනෙක්හි කයත් නිරුද්ධවේද, ස්පර්ශ සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි සිතත් නිරුද්ධවේද, ධර්ම සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුය යනුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද්දාවූ විස්තරයෙන් අර්ථ විභාග නොකරණ ලද්දාවූ මේ උද්දේසයාගේ අර්ථය කවරෙක් වනාහි විස්තර වශයෙන් විභාග කරන්නේද?" කියායි.

**6.** ඉක්බිති ඒ භික්ෂූන්ට මෙබඳු අදහසක් විය. 'මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ වනාහි ශාස්තෘන් වහන්සේ විසින්ද මනාව වර්ණනා කරණ ලද්දේය. නුවණැති සබ්‍රම්සරුන් විසින්ද ගරු කරණ ලද්දේය ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තර වශයෙන් අර්ථ විභාග නොකරණ ලද මේ උද්දේසයාගේ අර්ථ විස්තර වශයෙන් විභාග කරන්ට සමර්ථවේ. අප ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම යම් තැනෙක්හිද එතැනට යන්නෙමුනම්, ගොස් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් ගෙන් මේ කරුණ අසන්නෙමු නම්, යෙහෙක' කියායි.

**7.** ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම යම් තැනෙක්හිද එතැනට ගියාහුය. ගොස් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූවාහුය. සතුටු වියයුතුවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක්පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙය කීවාහුය. "ඇවැත් ආනන්ද ස්ථවිරයෙනි, භාග්‍යවතුන් වහන්සේ අපට මේ උදෙසීම සැකෙවින් උදෙසා විස්තර වශයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.

'යම් තැනෙක්හි ඇසත් නිරුද්ධවේද, රූපසංඥාවත් දුරුවේද, ඒ ආයතනය දතයුතුයි. යම්තැනෙක්හි කණත් නිරුද්ධවේද ශබ්ද සංඥාවත් දුරුවේද, ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි නාසයත් නිරුද්ධවේද, ගන්ධ සංඥාවත් දුරුවේද, ඒ ආයතනය දතයුතුයි. යම්තැනෙක්හි දිවත් නිරුද්ධවේද, රස සංඥාවත් වලකීද ඒ කරුණු දතයුතුයි. යම් තැනෙක්හි කයත් නිරුද්ධවේද, ස්පර්ශ සංඥාවත් වලකීද ඒ කරුණු දතයුතුයි. යම් තැනෙක්හි සිතත් නිරුද්ධවේද, ධර්ම සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුය' යනුයි."

"ඇවැත්නි, ඒ මේ අපට භාග්‍යවතුන් වහන්සේ වැඩිය නොබෝකල්හි මෙබඳු අදහසක් විය. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට මේ උද්දේසය සැකෙවින් උදෙසා විස්තර වශයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.'

'යම් තැනෙක්හි ඇසත් නිරුද්ධවේද, රූප සංඥාවත් දුරුවේද, ඒ ආයතනය දතයුතුයි. යම්තැනෙක්හි කණත් නිරුද්ධවේද ශබ්ද සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි නාසයත් නිරුද්ධවේද, ගන්ධ සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි යම්තැනෙක්හි දිවත් නිරුද්ධවේද, රස සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම්තැනෙක්හි කයත් නිරුද්ධවේද, ස්පර්ශ සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම්තැනෙක්හි සිතත් නිරුද්ධවේද, ධර්ම සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුය' යනුයි.

8. 'භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තර වශයෙන් අර්ථ ප්‍රකාශ නොකරන ලද මේ උද්දේසයාගේ අර්ථ විස්තර වශයෙන් කවරෙක් විභාග කරන්නේද?' කියායි. ඇවැත්නි ඒ මේ අපට මෙබඳු අදහසක් විය. 'මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ වනාහි ශාස්තෲන් වහන්සේ විසින්ද මනාව වර්ණනා කරණ ලදී. නුවණැති සබ්‍රම්සරුන් විසින්ද, ගරු කරණ ලද්දේය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තරයෙන් අර්ථ විභාග නොකරන ලද මේ උද්දේසයාගේ අර්ථ විස්තරයෙන් විභාග කරන්ට සමර්ථවේ. අපි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ යම්තැනෙක්හිද එතැනට යන්නෙමු නම්, ගොස් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගෙන් මේ කරුණ අසන්නෙමු නම්, යෙහෙක' යනුයි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ මෙය විභාග කරණු මැනවයි" කීහ.

9. "ඇවැත්නි, යම්සේ හරයෙන් ප්‍රයොජන ඇත්තාවූ හර සොයන්නාවූ පුරුෂයෙක් හර සොයමින් හැසිරෙන්නේ හරය පිහිටියාවූ හර ඇත්තාවූ මහත් වෘක්ෂයක්හුගේ මුලද ඉක්මවා කඳද ඉක්මවා අතු රිකිලිවල හරය සෙවිය යුතු යයි හඟින්නේද, ආයුෂ්මත්හු ශාස්තෲන් වහන්සේ හමුවූ කල්හි ඒ භාග්‍යවතුන් වහන්සේ ඉක්මවා අපගෙන් මේ කරුණ ඇසිය යුතුයයි හඟින්නාහුය. එය ඒ හා සමානය. ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි දතයුත්ත දනියි දැක්ක යුත්ත දකියි. ඇසක් වැනිවූ ඥාණයක්මවූ ධර්මයක්මවූ ශ්‍රෙෂ්ඨවූ ධර්මය කියන්නාවූ ධර්මය පවත්වන්නාවූ අර්ථය නිකුත් කරන්නාවූ අමෘතය දෙන්නාවූ ධර්මස්වාමිවූ තථාගතයන් වහන්සේය. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ ගෙන්ම මේ කරුණ අසන්නාහුද, යම් සේ තොපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශකරන සේක්ද, එසේ එය දරන්නහුද, මෙයට ඒ සුදුසු කාලය වූයේයයි," කීය.

10. "ඇවැත්නි ආනන්ද ස්ථවිරය, ඒකාන්තයෙන් භාග්‍යවත් තෙමේ දතයුත්ත දනියි. දැක්ක යුත්ත දකියි. ඇසක් වැනිවූ නුවණක්මවූ ධර්මයක්මවූ ශ්‍රෙෂ්ඨවූ ධර්මය කියන්නාවූ ධර්මය

පවත්වන්නාවූ අර්ථය නිකුත් කරන්නාවූ අමෘතය දෙන්නාවූ ධර්මස්වාමීවූ තථාගතයන් වහන්සේය. යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේගෙන්ම මේ කරුණ අසන්නෙමුද, යම් සේ අපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරනසේක්ද, එසේ එය දරන්නෙමුද, මෙයට ඒ සුදුසු කාලයද වූයේය. එතකුදු වුවත් ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ ශාස්තෘන් වහන්සේ විසින්ද වර්ණනා කරණ ලදී. නුවණැති සබ්‍රම්සරුන් විසින්ද ගරු කරණ ලද්දේය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තරයෙන් අර්ථ විභාග නොකරණ ලද මේ උද්දේසයාගේ අර්ථ විස්තරයෙන් විභාග කරන්ට සමර්ථවේ.

11. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ මෙය ප්‍රකාශ කෙළේය. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ තොපට යම් උද්දේසයක් වනාහි සැකෙවින් උදෙසා විස්තර වශයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක්ද,

'මහණෙනි, එහෙයින් මෙහි 'යම් තැනෙක්හි ඇසත් නිරුද්ධවේද, රූප සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම්තැනෙක්හි කණත් නිරුද්ධවේද, ශබ්ද සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි නාසයත් නිරුද්ධවේද ගන්ධ සංඥාවත් දුරුවේද, ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි දිවත් නිරුද්ධවේද, රස සංඥාවත් වලකීද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි කයත් නිරුද්ධවේද, ස්පර්ශ සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි සිතත් නිරුද්ධවේද, ධර්ම සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුය' යනුයි.

12. "ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තර වශයෙන් අර්ථ විභාග නොකරණ ලද මේ උද්දේසයාගේ අර්ථය විස්තර වශයෙන් මෙසේ දනිමි. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින්, 'යම් තැනෙක්හි ඇසත් නිරුද්ධවේද, රූප සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි කණත් නිරුද්ධවේද, ශබ්ද සංඥාවත් දුරුවේද, ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි නාසයත් නිරුද්ධවේද,

ගන්ධ සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි දිවත් නිරුද්ධවේද, රස සංඥාවත් වලකීද ඒ ආයතනය දතයුතුයි යම් තැනෙක්හි කයත් නිරුද්ධවේද, ස්පර්ශ සංඥාවත් වලකීද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි සිතත් නිරුද්ධවේද ධර්ම සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුය' යන මෙය ෂඩායතන නිරෝධය (නිවණ) සඳහා වදාරණ ලදී.

"මහණෙනි, එහෙයින් මෙහි 'යම් තැනෙක්හි ඇසත් නිරුද්ධවේද, රූප සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි කණත් නිරුද්ධවේද, ශබ්ද සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි නාසයත් නිරුද්ධවේද, ගන්ධසංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම්තැනෙක්හි දිවත් නිරුද්ධවේද, රස සංඥාවත් වලකීද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි කයත් නිරුද්ධවේද, ස්පර්ශ සංඥාවත් වලකීද ඒ ආයතනය දතයුතුයි. යම්තැනෙක්හි සිතත් නිරුද්ධවේද, ධර්මසංඥාවත් දුරුවේද, ඒ ආයතනය දතයුතුය යන යම් උද්දේසයක් වනාහි සැකෙවින් උදෙසා විස්තරයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක්ද, ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තරවශයෙන් අර්ථ විභාග නොකරණ ලද මේ උද්දේසයාගේ අර්ථය මෙසේ විස්තරවශයෙන් දනිමි. ආයුෂ්මත්නි කැමැති වන්නාවූ තෙපි භාග්‍යවතුන් වහන්සේ කරාම පැමිණෙව් පැමිණ මේ කරුණ අසව් යම් සේ තොපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරන සේක්ද එසේ එය දරා ගනිව් යයි" කීය.

12. "ඇවැත්නි, එසේ යයි" ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට ප්‍රති වචන දී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළාහුය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අපට

'මහණෙනි, යම් තැනෙක්හි ඇසත් නිරුද්ධවේද, රූප සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි කණත්

නිරුද්ධවේද, ශබ්ද සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි නාසයත් නිරුද්ධවේද, ගන්ධ සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි දිවත් නිරුද්ධවේද, රස සංඥාවත් වලකීද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි කයත් නිරුද්ධවේද, ස්පර්ශ සංඥාවත් වලකීද, ඒ ආයතනය දතයුතුයි. යම්තැනෙක්හි සිතත් නිරුද්ධවේද, ධර්ම සංඥාවත් දුරුවේද, ඒ ආයතනය දතයුතුය යන යම් උද්දේසයක් සැකෙවින් උදෙසා විස්තරයෙන් අර්ථ විභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක්ද,

"ස්වාමීනි, ඒ මේ අපට භාග්‍යවතුන් වහන්සේ වැඩිය නොබෝ කල්හි මෙබඳු අදහසක් විය. 'ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ අපට

'මහණෙනි, එහෙයින් මෙහි 'යම් තැනෙක්හි ඇසත් නිරුද්ධවේද, රූපසංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි කණත් නිරුද්ධවේද, ශබ්ද සංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. නාසයත් නිරුද්ධවේද, ගන්ධසංඥාවත් දුරුවේද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි දිවත් නිරුද්ධවේද, රස සංඥාවත් වලකීද ඒ ආයතනය දතයුතුයි යම් තැනෙක්හි කයත් නිරුද්ධවේ, ස්පර්ශ සංඥාවත් වලකීද ඒ ආයතනය දතයුතුයි. යම් තැනෙක්හි සිතත් නිරුද්ධවේද, ධර්මසංඥාවත් දුරුවේද, ඒ ආයතනය දතයුතුය' යන යම් උද්දේසයක් වනාහි සැකවින් උදෙසා විස්තරයෙන් අර්ථවිභාග නොකොට හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.

"ස්වාමීනි, එවිට අපට මෙබඳු අදහසක් විය. මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ වනාහි ශාස්තෘන් වහන්සේ විසින්ද මනාකොට වර්ණනා කරණ ලදී. නුවණැති සබ්‍රම්සරුන් විසින්ද ගරු කරණ ලදී. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද්දාවූ විස්තර වශයෙන් අර්ථ විභාග නොකරණ ලද්දාවූ මේ උද්දේසයාගේ අර්ථ විස්තරයෙන් විභාග කරන්ට සමර්ථවේ. අපි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ යම් තැනෙක්හිද, එතැනට යන්නෙමු නම්, ගොස්

ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් ගෙන් මේ කරුණු අසන්නෙමු නම්, යෙහෙක' කියායි.

13. 'ස්වාමීනි, ඉක්බිති අපි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම්තැනෙක්හිද, එතැනට ගියෙමු, ගොස් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගෙන් මේ කරුණ ඇසීමු. ස්වාමීනි, ඒ අපට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් විසින් මේ ආකාරයන්ගෙන් මේ පදයන්ගෙන් මේ ව්‍යඤ්ජනයන්ගෙන් අර්ථය විභාග කරණ ලද්දේයයි" කීහ.

14. "මහණෙනි, ආනන්ද තෙමේ පණ්ඩිතවේ. මහණෙනි, ආනන්ද තෙමේ මහත් ප්‍රඥා ඇත්තේවේ. මහණෙනි, ඉදින් තෙපි මාගෙන්ද මේ කාරණය අසන්නාහු නම් මමද ආනන්ද විසින් එය යම්සේ ප්‍රකාශ කෙළේද, මෙපරිද්දෙන්ම ප්‍රකාශ කරන්නෙමි. මෙහි අර්ථය වනාහි මෙයම වේ. මෙසේම එය දරා ගනිව්යයි," (වදාළසේක.)

---

## 5. සක්කො සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර ගිජ්ඣකූට පර්වතයෙහි වැඩවසන සේක. එකල්හි ශක්‍රදෙවේන්ද්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව සිටියේය. එකත්පස්ව සිටියාවූ ශක්‍රදෙවේන්ද්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

2. 'ස්වාමීනි, මේ ලෝකයෙහි ඇතැම් සත්ව කෙනෙක් යම් හෙයකින් මේ ආත්මයෙහිම (ක්ලේශ පරිනිර්වාණයෙන්) නොපිරිනිවෙත්ද, ඊට හේතු කවරේද, ප්‍රත්‍යය කවරේද? ස්වාමීනි මේ ලෝකයෙහි ඇතැම් සත්වකෙනෙක් මේ ආත්මයෙහිම පිරිනිවෙත්ද, ඊට හේතු කවරේද, ප්‍රත්‍යය කවරේද?" යනුයි.

3. "දෙවේන්ද්‍රය, චක්ඛුවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කම් සුව එලවන්නාවූ,

ඇලුම් කටයුතුවූ, රූප ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට කැමතිවේද, එය ප්‍රියයි කියයිද, එහි ගැලී සිටීද, එයට කැමති වන්නාවූ එය ප්‍රියයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරුකළාවූ කර්මවිඥානයවේ. එය උපාදානය (තෘෂ්ණා ග්‍රහණයෙන් ගැනීම) වේ. දෙවේන්ද්‍රය උපාදාන සහිතවූ භික්ෂුතෙම (කෙළෙස් පරිනිර්වාණයෙන්) නොපිරිනිවෙයි.

"දෙවේන්ද්‍රය, සෝත විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සුව එළවන්නාවූ ඇලුම් කටයුතුවූ ශබ්ද ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට කැමති වේද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටීද, එයට කැමති වන්නාවූ එය ප්‍රියයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරුකළාවූ කර්ම විඥානය වේ. එය උපාදානය (තෘෂ්ණා ග්‍රහණයෙන් ගැණීම) වේ. දෙවෙන්ද්‍රය උපාදාන සහිතවූ භික්ෂුතෙම (කෙළෙස් පරිනිර්වාණයෙන්) නොපිරිනිවෙයි.

"දෙවෙන්ද්‍රය, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සුව එළවන්නාවූ ඇලුම් කටයුතුවූ ගන්ධ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට කැමති වේද, එය ප්‍රියයි කියයිද, එහි ගැලී සිටීද, එයට කැමති වන්නාවූ එය ප්‍රියයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ කර්මවිඥානය වේ. එය උපාදානය (තෘෂ්ණා ග්‍රහණයෙන් ගැණීම) වේ. දෙවේන්ද්‍රය උපාදාන සහිතවූ භික්ෂුතෙම (කෙළෙස් පරිනිර්වාණයෙන්) නොපිරිනිවෙයි.

"දෙවෙන්ද්‍රය, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සුව එළවන්නාවූ ඇලුම් කටයුතුවූ රස ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට කැමති වේද, එය ප්‍රියයි කියයිද, එහි ගැලී සිටීද, එයට කැමති වන්නාවූ එය ප්‍රියයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ කර්ම විඥානයවේ. එය උපාදානය (තෘෂ්ණා ග්‍රහණයෙන් ගැණීම) වේ. දෙවෙන්ද්‍රය උපාදාන සහිතවූ භික්ෂුතෙම (කෙළෙස් පරිනිර්වාණයෙන්) නොපිරිනිවෙයි.

"දෙවෙන්ද්‍රය, කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සුව එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ස්පර්ශ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට කැමති වේද, එය ප්‍රියයි කියයිද, එහි ගැලී සිටීද, එයට කැමති වන්නාවූ එය ප්‍රියයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ කර්ම විඥානයවේ. එය උපාදානය (තෘෂ්ණා ග්‍රහණයෙන් ගැණීම) වේ. දෙවෙන්ද්‍රය උපාදාන සහිතවූ භික්ෂුතෙම (කෙළෙස් පරිනිර්වාණයෙන්) නොපිරිනිවෙයි.

"දෙවෙන්ද්‍රය, මනො විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වරූපවූ කම්සුව එලවන්නාවූ ඇලුම් කරන්නාවූ ධර්ම ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට කැමති වේද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටීද, එයට කැමති වන්නාවූ එය ප්‍රියයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට එය ඇසුරු කළාවූ විඥ්ඥාණය වේ. එය උපාදානය (තෘෂ්ණාවෙන් දැඩිකොට ගැණීම) වේ. දෙවෙන්ද්‍රය උපාදාන සහිතවූ භික්ෂු තෙම නොපිරිනිවෙයි. දෙවෙන්ද්‍රය මේ ලොකයෙහි යම් හෙයකින් ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම නොපිරිනිවෙත්ද, (එයට) මෙය හේතුවේ. මේ ප්‍රත්‍යය වේ.

4. "දෙවෙන්ද්‍රය, චක්ඛු විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සුව එලවන්නාවූ ඇලුම් කටයුතුවූ රූප ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට නොකැමති වේද, එය ප්‍රියයයි නොකියාද, එහි ගැලී නොසිටීද, එයට නොකැමති වන්නාවූ එය ප්‍රියයයි නොකියන්නාවූ එහි නොගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ කර්ම විඥ්ඥාණය නොවෙයි. එය උපාදානය නොවෙයි. දෙවෙන්ද්‍රය උපාදාන රහිතවූ භික්ෂුතෙම පිරිනිවෙයි.

'දෙවෙන්ද්‍රය, සෝත විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සුව එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ශබ්ද ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට නොකැමති වේද, එය ප්‍රියයයි නොකියාද, එහි ගැලී නොසිටීද, එයට නොකැමති වන්නාවූ එය ප්‍රියයයි නොකියන්නාවූ එහි

නොගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ කර්ම විඥ්ඥාණය නොවෙයි. එය උපාදානය නොවෙයි. දෙවෙන්ද්‍රය උපාදාන රහිතවූ භික්ෂුතෙම පිරිනිවෙයි.

"දෙවෙන්ද්‍රය, ඝාණ විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සුව එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ගන්ධ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට නොකැමති වේද, එය ප්‍රියයයි නොකියාද, එහි ගැලී නොසිටීද, එයට නොකැමති වන්නාවූ එය ප්‍රියයයි නොකියන්නාවූ එහි නොගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ කර්ම විඥ්ඥාණය නොවෙයි. එය උපාදානය නොවෙයි. දෙවෙන්ද්‍රය උපාදාන රහිතවූ භික්ෂුතෙම පිරිනිවෙයි.

"දෙවෙන්ද්‍රය, ජිව්හා විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සුව එලවන්නාවූ ඇලුම් කටයුතුවූ රස ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට නොකැමතිවේද, එය ප්‍රියයයි නොකියාද, එහි ගැලී නොසිටීද එයට නොකමැති වන්නාවූ එය ප්‍රියයයි නොකියන්නාවූ එහි නොගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ කර්ම විඥ්ඥාණය නොවෙයි. එය උපාදානය නොවෙයි. දෙවෙන්ද්‍රය උපාදාන රහිතවූ භික්ෂුතෙම පිරිනිවෙයි.

"දෙවෙන්ද්‍රය, කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සුව එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ස්පර්ශ ඇත්තාහ ඉදින් භික්ෂුතෙම එයට නොකැමතිවේද, එය ප්‍රියයයි නොකියාද, එහි ගැලී නොසිටීද, එයට නොකැමති වන්නාවූ එය ප්‍රියයයි නොකියන්නාවූ එහි නොගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ කර්ම විඥ්ඥාණය නොවෙයි. එය උපාදානය නොවෙයි. දෙවෙන්ද්‍රය උපාදාන රහිතවූ භික්ෂුතෙම පිරිනිවෙයි.

"දෙවෙන්ද්‍රය, මනො විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සුව එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ධර්ම ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට නොකැමතිවේද, එය ප්‍රියයයි නොකියාද එහි ගැලී නොසිටීද

එයට නොකැමති වන්නාවූ එය ප්‍රියයයි නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුට තෘෂ්ණාව ඇසුරු කළාවූ විඥ්ඥාණය නොවේ. එය උපාදානය නොවේ. දෙවෙන්ද්‍රය උපාදාන රහිතවූ භික්ෂුතෙම පිරිනිවන් පායි. දෙවෙන්ද්‍රය මේ ලොකයෙහි ඇතැම් සත්ව කෙනෙක් යම් හෙයකින් මේ ආත්මයෙහිම පිරිනිවන් පාත්ද, එයට මෙය හේතුවේ. මේ ප්‍රත්‍යය වේයයි" (වදාළේය.)

---

## 6. පඤ්චසිඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයෙහි වූ විහාරයෙහි වැඩවසනසේක. එකල්හි පඤ්චසිඛ නම් ගාන්ධර්ව දිව්‍යපුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක සිටියේය. එක් පසෙක සිටියාවූ පඤ්චසිඛ නම් ගාන්ධර්ව දිව්‍යපුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

2 "ස්වාමීනි යම්හෙයකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම (ක්ලේශ පරිනිර්වාණයෙන්) නොපිරිනිවෙත්ද, ස්වාමීනි ඊට හේතු කවරේද ප්‍රත්‍ය කවරේද, යම් හෙයකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම (ක්ලේශ පරිනිර්වාණයෙන්) පිරිනිවෙත්ද, ඊට හේතු කවරේද, ප්‍රත්‍ය කවරේද, යනුයි.

(මේ වර්ගයේ 5 වෙනි සූත්‍රයේ 3, 4 වෙනි ඡෙද මෙහි යොදාගත යුතුයි-'දෙවේන්ද්‍රය' වෙනුවට 'පඤ්චසිඛය' යෙදිය යුතුයි.)

---

## 7. සාරිපුත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම්වූ

අනේපිඩු මහසිටුහුගේ ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි එක්තරා භික්ෂුවක් තෙම ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත් පසක උන්නේය. එකත් පසක උන්නාවූ ඒ භික්ෂුතෙම ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ට මෙය සැලකෙළේය. "ඇවැත් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, සද්ධිවිහාරිකවූ ශිෂ්‍ය භික්ෂුවක් තෙම ශික්ෂාව ප්‍රත්‍යඛ්‍යානය කොට (උපසම්පදාශීලය ඉවත්කොට) ගිහි බවට පෙරලුනේයයි" යනුයි.

"ඇවැත්නි, ඉන්ද්‍රියයන්හි නොරක්නාලද දොරටු ඇති භොජනයෙහි පමණ නොදන්නාවූ නිදි දුරු කිරීමෙහි නොයෙදුනාවූ මහණ හට එය එසේ වෙයි. ඇවැත්නි, ඉන්ද්‍රියයන්හි නොරක්නාලද දොරටු ඇති භොජනයෙහි පමණ නොදන්නේ නිදි දුරුකිරීමෙහි නොයෙදුනු ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් දිවිහිමියෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචය්‍ය්‍යාව රකින්නේය, යන මේ කාරණය විද්‍යමාන නොවේ.

"ඇවැත්නි, ඉන්ද්‍රියයන්හි රකිනලද දොරටු ඇත්තාවූ භොජනයෙහි පමණ දන්නාවූ නිදි දුරුකිරීමෙහි යෙදුනාවූ ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් දිවිහිමියෙන් සම්පූර්ණවූ පිරිසිදු වූ බ්‍රහ්මචය්‍ය්‍යාව රක්නේය යන මේ කරුණ විද්‍යමානවේ.

3. "ඇවැත්නි, කෙසේනම් ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇත්තේ වේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ඇසින් රූපයක් දැක මහත් සටහන් වශයෙන් ගන්නේ නොවෙයිද. කුඩා සටහන් වශයෙන් ගන්නේ නොවෙයිද. යම් හේතුවකින් මේ චක්ෂුඉන්ද්‍රියය අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත පහළ වෙත්ද එය සංවර කිරීම පිණිස පිළිපදියිද, චක්ඛු ඉන්ද්‍රිය රකියිද, චක්ඛුඉන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයිද,

"ඇවැත්නි, කෙසේනම් ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇත්තේවේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම කණින්

ශබ්දයක් අසා මහත් සටහන් වශයෙන් ගන්නේ නොවෙයිද, කුඩා සටහන් වශයෙන් ගන්නේ නොවෙයිද, යම් හෙතුවකින් මේ සෝතඉන්ද්‍රියය අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත පහළ වෙත්ද, එය සංවර කිරීම පිණිස පිළිපදියිද, සෝත ඉන්ද්‍රිය රකියිද, සෝතඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයිද,

"ඇවැත්නි, කෙසේනම් ඉන්ද්‍රියයන්හි රක්නා ලද දොරටු ඇත්තේවේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණකොට මහත් සටහන් වශයෙන් ගන්නේ නොවෙයිද, කුඩා සටහන් වශයෙන් ගන්නේ නොවෙයිද, යම් හෙයකින් මේ ඝාණඉන්ද්‍රියය අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත පහළවෙත්ද, එය සංවර කිරීම පිණිස පිළිපදියිද, ඝාණ ඉන්ද්‍රිය රකියිද, ඝාණඉන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයිද,

"ඇවැත්නි, කෙසේ නම් ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇත්තේවේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම දිවෙන් රසයක් විඳ මහත් සටහන් වශයෙන් ගන්නේ නොවෙයිද, කුඩා සටහන් වශයෙන් ගන්නේ නොවෙයිද, යම් හෙයකින් මේ ජිව්හා ඉන්ද්‍රිය අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වේෂ ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත පහළ වෙත්ද එය සංවර කිරීම පිණිස පිළිපදියිද, ජිව්හා ඉන්ද්‍රිය රකියිද ජිව්හා ඉන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයිද,

"ඇවැත්නි, කෙසේ නම් ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇත්තේවේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම කයෙන් ස්පර්ශයක් කර මහත් සටහන් වශයෙන් ගන්නේ නොවෙයිද, කුඩා සටහන් වශයෙන් ගන්නේ නොවෙයිද, යම් හේතුවකින් මේ ස්පර්ශඉන්ද්‍රිය අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත පහළ වෙත්ද, එය සංවර කිරීම පිණිස පිළිපදියිද, කාය ඉන්ද්‍රිය රකියිද, කායඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයිද,

"ඇවැත්නි, කෙසේ නම් ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇතිවේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම සිතින් ධර්මාරමුණක් දැන මහ සටහන් වශයෙන් ගන්නේ නොවෙයිද. කුඩා සටහන් වශයෙන් ගන්නේ නොවෙයිද, යම්හේතුවකින් මේ මනින්ද්‍රියය අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත පහළවන්නාහුද එය සංවර කිරීම පිණිස පිළිපදියිද, මනින්ද්‍රිය රකියිද, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයිද, ඇවැත්නි මෙසේ වනාහි ඉන්ද්‍රියන්හි රක්නාලද දොරටු ඇත්තේ වෙයි.

4. 'ඇවැත්නි, කෙසේනම් භොජනයෙහි පමණ දන්නේ වේද? ඇවැත්නි මේ ශාසනයෙහි භික්ෂුතෙම 'ක්‍රීඩා පිණිස මද වැඩීම පිණිස සැරසීම පිණිස අලංකාර කිරීම පිණිස ආහාර නොවළඳමි, මේ ශාරීරයාගේ පැවැත්ම පිණිසම යැපීම පිණිසම පීඩා වැළැක්ම පිණිසම බ්‍රහ්මචය්‍ය්‍යාවට අනුග්‍රහය පිණිසම ආහාර වළඳමි මෙසේ පුරාණ වෙදනාවද නසමි. අළුත්වූ වේදනාද නොඋපදවන්නෙමි. මාගේ ජීවිත යාත්‍රාවද නිවරද බවද සැප පහසුවද වන්නේයයි' නුවණින් සලකා ආහාර වළඳයිද, ඇවැත්නි මෙසේ වනාහි භොජනයෙහි පමණ දන්නේවෙයි.

5. "ඇවැත්නි, කෙසේනම් නිදිදුරු කිරීමෙහි යෙදුනේ වේද? "ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම දහවල් දවස සක්මනින්ද හිඳීමෙන්ද වැළැක්විය යුතු ධර්මයන්ගෙන් සිත පිරිසිදු කෙරෙයිද, රාත්‍රියෙහි පළමුවන යාමය සක්මනින්ද, හිඳීමෙන්ද වැළැක්විය යුතු ධර්මයන්ගෙන් සිත පිරිසිදු කෙරෙයිද, රාත්‍රියෙහි මධ්‍යම යාමය දකුණු පයින් දකුණු පයෙහි වම් පය මදක් ඉක්මවා තබා සිහි ඇත්තේ නුවණ ඇත්තේ නැගිටිම් යන සංඥාව මෙනෙහි කොට ශ්‍රෙෂ්ඨවූ සයනය කෙරෙයිද, රාත්‍රියෙහි පශ්චිම යාමය නැවත නැගිට සක්මනින්ද හිඳීමෙන්ද වැළැක්වියයුතු ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයිද, ඇවැත්නි මෙසේ වනාහි නිදිදුරු කිරීමෙහි යෙදුනේ වෙයි.

6 'ඇවැත්නි එසේ හෙයින් 'මෙහි ඉන්ද්‍රියයන්හි රක්නා ලද දොරටු ඇත්තෝ භෝජනයෙහි පමණ දන්නෝ නිදි දුරු

කිරීමෙහි යෙදුනෝ වන්නෙමුයි’ මෙසේ හික්මිය යුතුයි. ඇවැත්නි තොපවිසින් මෙසේ වනාහි හික්මිය යුතුයයි” (වදාළේය)

---

## 8. රාහුල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි වනාහි රහසිගතව විවේකව වැඩ සිටියාවූ භාග්‍යවතුන් වහන්සේගේ සිතට මෙබඳු කල්පනාවක් පහළවිය. ‘රාහුලගේ අර්හත්ඵල ඥානය මුහුකුරන්නාවූ ධර්මයෝ මුහුකුරා ගියාහුය. මම රාහුල වැඩිදුරට ආශ්‍රවයන් නැසීමෙහි (රහත්වීමට) හික්මවන්නෙම් නම්,’ යෙහෙක යනුයි.

2 ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ උදය කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරුගෙන සැවැත්නුවරට පිඬු පිණිස වැඩිසේක. සැවැත්නුවර පිඬු පිණිස හැසිර බතින් පසු පිණ්ඩපාතයෙන් වැලකුනේ ආයුෂ්මත් රාහුලයන්ට ආමන්ත්‍රණය කළසේක.

‘රාහුලය, නිසීදනය (පත්කඩ) ගනුව. අන්ධවනය යම් තැනෙක්හිද, දවල් වාසය පිණිස එහි යන්නෙමුයි වදාළේය.” “එසේය, ස්වාමීනි’යි කියා ආයුෂ්මත් රාහුලතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී නිසීදනය ගෙන භාග්‍යවතුන් වහන්සේ පිටුපසින් පිටුපසින් පසුපස්සෙහි ගියේය. එකල්හි වනාහි නොයෙක් දහස් ගණන් දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ අද ආයුෂ්මත් රාහුලයන් වැඩිදුරට ආශ්‍රවයන් නැසීමෙහි හික්ම වන්නේයයි, ලුහුබැඳ ගියාහු වෙත්.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අන්ධවනයට ඇතුල්ව එක්තරා ගසක් මුල පණවන ලද අස්නෙහි වැඩ උන්සේක. ආයුෂ්මත් රාහුල තෙමේද භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක උන්නේය. එක්පසෙක උන්නාවූ ආයුෂ්මත් රාහුලයන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

(මෙහි සබ්බුපාදානපරියාය සූත්‍රයේ ‘මහණෙනි ඒ කුමකැයි හඟිව්ද?’ යන තැනසිට සූත්‍රයේ අවසානය දක්වා යොදා ගතයුතුයි (1926 පිටේ සිට 1936 වෙනි පිට දක්වා. මෙහි ‘මහණෙනි’ වෙනුවට ‘රාහුලය’ ද ‘සම්ඵස්සය නිසා’ කියා තිබෙන වචන අගට ‘යම් වේදනාවක් සංඥාවක් සංස්කාරයක්, විඤ්ඤාණයක් උපදීද’ යන වචන යෙදියයුතුයි.)

“භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ ආයුෂ්මත් රාහුල තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්තේය. මේ දේශනාව දේශනා කරනු ලබන කල්හි ආයුෂ්මත් රාහුල ස්ථවිරයන්ගේ සිත උපාදාන රහිතව ආශ්‍රවයන්ගෙන් මිදුනේය. නොයෙක් දහස් ගණන් දෙවියන්ටද යම් කිසිවක් හටගැණීම ස්වභාව කොට ඇත්තේද, ඒ සියල්ල නැසීම ස්වභාව කොට ඇත්තේයයි, පහවූ රජස් ඇති පහවූ කෙලෙස්මල ඇති ධර්මචක්ෂුස (සතරමග සතරඵල නුවණ) පහළ විය.

---

## 9. සංයොජන සූත්‍රය.

(සබ්බ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. “මහණෙනි, සංයෝජනයන්ට හිතවූ ධර්මයන්ද සංයොජනයද දේශනා කරන්නෙමි එය අසව්. මහණෙනි, සංයොජනයන්ට හිතවූ ධර්මයෝ කවරහුද, සංයොජනය කවරේද?

3. “මහණෙනි, ඇසින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කරන්නාවූ, රූප ඇත්තාහ. මහණෙනි, මොවුහු සංයොජනයන්ට හිතවූ ධර්මයෝයයි කියනු ලැබෙත්. එහි යම් ඇල්මක් වේද, එය එහි සංයොජනය වේ.

4. "මහණෙනි, කණින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කරන්නාවූ, ශබ්දයෝ ඇත්තාහ. මහණෙනි, මොවුහු සංයොජනයන්ට හිතවූ ධර්මයෝයයි කියනු ලැබෙත්. එහි යම් ඇල්මක් වේද, එය එහි සංයොජනය වේ.

5 "මහණෙනි, නාසයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කරන්නාවූ, ගන්ධයෝ ඇත්තාහ. මහණෙනි, මොවුහු සංයොජනයන්ට හිතවූ ධර්මයෝයයි කියනු ලැබෙත්. එහි යම් ඇල්මක් වේද, එය එහි සංයොජනය වේ.

6. "මහණෙනි, දිවෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කරන්නාවූ රසයෝ ඇත්තාහ. මහණෙනි, මොවුහු සංයොජනයන්ට හිතවූ ධර්මයෝයයි කියනු ලැබෙත්. එහි යම් ඇල්මක් වේද, එය එහි සංයොජනය වේ.

7. "මහණෙනි, කයින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කරන්නාවූ, ස්පර්ශයෝ ඇත්තාහ. මහණෙනි, මොවුහු සංයොජනයන්ට හිතවූ ධර්මයෝයයි කියනු ලැබෙත්. එහි යම් ඇල්මක් වේද, එය එහි සංයොජනය වේ.

8. "මහණෙනි, සිතින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කරන්නාවූ, ධර්මාරම්මණයෝ ඇත්තාහ. මහණෙනි මොවුහු සංයොජනයන්ට හිතවූ ධර්මයෝයයි කියනු ලැබෙත්. එහි යම් ඇල්මක් වේද, එහි ඒ සංයොජනය නම් වේයයි" වදාළේය.

---

## 10. උපාදාන සූත්‍රය.

1. (මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, උපාදානයන්ට හිතවූ ධර්මයන්ද, උපාදානයද දේශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, උපාදානයන්ට හිතවූ, ධර්මයෝ කවරහුද, උපාදානය කවරේද?

3. "මහණෙනි, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කරන්නාවූ, රූපයෝ වෙත්. මහණෙනි, මොවුහු උපාදානයන්ට හිතවූ ධර්මයෝයයි කියනු ලැබෙත්. එහි යම් ඇලීමක් වේද, එය එහි උපාදානය වේ.

4. "මහණෙනි, සෝත විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කරන්නාවූ ශබ්දයෝ වෙත්. මහණෙනි මොව්හු උපාදානයන්ට හිතවූ ධර්මයෝයයි කියනු ලැබෙත්. එහි යම් ඇලීමක් වේද එය එහි උපාදානය වේ.

5. "මහණෙනි, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කරන්නාවූ ගන්ධයෝ වෙත්. මහණෙනි, මොවුහු උපාදානයන්ට හිතවූ ධර්මයෝයයි කියනු ලැබෙත්. එහි යම් ඇලීමක් වේද, එය එහි උපාදානය වේ.

6. "මහණෙනි, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කරන්නාවූ රසයෝ වෙත්. මහණෙනි, මොව්හු උපාදානයන්ට හිතවූ ධර්මයෝයයි කියනු ලැබෙත්. එහි යම් ඇලීමක් වේද, එය එහි උපාදානය වේ.

7. "මහණෙනි, කාය විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කරන්නාවූ ස්පර්ශයෝ වෙත්. මහණෙනි මොව්හු උපාදානයන්ට හිතවූ ධර්මයෝයයි කියනු ලැබෙත්. එහි යම් ඇලීමක් වේද, එය එහි උපාදානය වේ.

8. "මහණෙනි, මනො විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇලුම් කරන්නාවූ ධර්මයෝ වෙත්. මහණෙනි මොව්හු උපාදානයන්ට හිතවූ ධර්මයෝයයි කියනු ලැබෙත්. එහි යම් ඇලීමක් වේද, එය එහි උපාදානය වේයයි" වදාළේය.

---

## 2. ලොක කාමගුණ වර්ගයයි.

---

# ගෘහපති වර්ගය.

## 1. වේසාලි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලාමහනුවර අසල මහවනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි විශාලාමහනුවර වැසි උග්ග නම් ගෘහපතිතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය එක්පසෙක හුන්නාවූ විශාලාමහනුවර වැසි උග්ග නම් ගෘහපතිතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

2. "ස්වාමීනි, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම නොපිරිනිවෙත්ද, ඊට හේතු කවරේද, ප්‍රත්‍ය කවරේද, මේ ලෝකයෙහි ඇතැම් සත්ව කෙනෙක් යම්හෙයකින් මේ ආත්මයෙහිම පිරිනිවෙත්ද, ඊට හේතු කවරේද, ප්‍රත්‍ය කවරේද?"

3. "ගෘහපතිය, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ, කාන්තවූ මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එළවන්නාවූ ඇලුම් කරන්නාවූ රූප ඇත්තාහ. ඉදින් මහණ තෙම එයට ප්‍රියකරයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටියිද, එයට ප්‍රිය වන්නාවූ එය ප්‍රියයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ විඤ්ඤාණය වෙයි. එය උපාදානය වෙයි. ගෘහපතිය, උපාදාන සහිතවූ මහණතෙම නොපිරිනිවෙයි.

4. "ගෘහපතිය, සෝතවිඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ ඇලුම් කරන්නාවූ ශබ්ද ඇත්තාහ. ඉදින් මහණ තෙම එය ප්‍රිය කරයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටියිද, එයට ප්‍රිය වන්නාවූ එය ප්‍රියයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ විඤ්ඤාණය වෙයි. එය උපාදානය වෙයි. ගෘහපතිය, උපාදාන සහිතවූ මහණතෙම නොපිරිනිවෙයි.

5. "ගෘහපතිය, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සැප එලවන්නාවූ ඇලුම් කරන්නාවූ ගන්ධ ඇත්තාහ. ඉදින් මහණ තෙම එයට ප්‍රිය කරයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටියිද, එයට ප්‍රිය වන්නාවූ එය ප්‍රියයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ විඤ්ඤාණය වෙයි. එය උපාදානය වෙයි. ගෘහපතිය, උපාදාන සහිතවූ මහණතෙම නොපිරිනිවෙයි.

6 "ගෘහපතිය, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සැප එලවන්නාවූ ඇලුම් කරන්නාවූ රස ඇත්තාහ. ඉදින් මහණ තෙම එය ප්‍රියකරයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටියිද, එයට ප්‍රිය වන්නාවූ එය ප්‍රියයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ විඤ්ඤාණය වෙයි එය උපාදානය වෙයි. ගෘහපතිය, උපාදාන සහිතවූ මහණතෙම නොපිරිනිවෙයි.

7. "ගෘහපතිය, කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කරන්නාවූ ස්පර්ශ ඇත්තාහ. ඉදින් මහණ තෙම එය ප්‍රිය කරයිද එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටියිද, එයට ප්‍රිය වන්නාවූ එය ප්‍රියයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ විඤ්ඤාණය වෙයි. එය උපාදානය වෙයි. ගෘහපතිය, උපාදාන සහිතවූ මහණතෙම නොපිරිනිවෙයි.

8. "ගෘහපතිය, මනෝවිඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ

ඇලුම් කටයුතුවූ ධර්මයෝ ඇත්තාහ. ඉදින් මහණතෙම එයට ප්‍රිය කරයිද, එය ප්‍රියයයි කියයිද, එහි ගැලී සිටියි ද, එයට ප්‍රිය වන්නාවූ එය ප්‍රියයයි කියන්නාවූ එහි ගැලී සිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ විඥ්ඥාණය වෙයි. එය උපාදානය වෙයි. ගෘහපතිය, උපාදාන සහිතවූ මහණතෙම නොපිරිනිවෙයි.

"ගෘහපතිය, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම නොපිරිනිවෙත්ද, මේ වනාහි එයට හේතුවේ මේ ප්‍රත්‍යය වේ.

9. "ගෘහපතිය, චක්ඛුවිඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ, කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ රූපද ඇත්තාහ. ඉදින් මහණ තෙම එයට ප්‍රිය නොකෙරේද, එය ප්‍රියයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, එයට ප්‍රිය නොවන්නාවූ එය ප්‍රියයයි නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ විඥ්ඥාණය නොවෙයි. එය උපාදානය නොවෙයි. ගෘහපතිය, උපාදාන නැත්තාවූ මහණතෙම පිරිනිවෙයි.

10. "ගෘහපතිය, සෝත විඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ශබ්දද ඇත්තාහ. ඉදින් මහණ තෙම එය ප්‍රිය නොකෙරේද, එය ප්‍රියයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, එයට ප්‍රිය නොවන්නාවූ එය ප්‍රියයයි නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ විඥ්ඥාණය නොවෙයි. එය උපාදානය නොවෙයි. ගෘහපතිය, උපාදාන නැත්තාවූ මහණතෙම පිරිනිවෙයි.

11. "ගෘහපතිය, ඝාණවිඥ්ඥාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ගන්ධද ඇත්තාහ. ඉදින් මහණ තෙම එය ප්‍රිය නොකෙරේද, එය ප්‍රියයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, එයට ප්‍රිය නොවන්නාවූ එය ප්‍රියයයි නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ විඥ්ඥාණය

නොවෙයි. එය උපාදානය නොවෙයි. ගෘහපතිය, උපාදාන නැත්තාවූ මහණතෙම පිරිනිවෙයි.

12. "ගෘහපතිය, ජිව්හා විඥානයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ රසද ඇත්තාහ. ඉදින් මහණ තෙම එය ප්‍රිය නොකෙරේද, එය ප්‍රියයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, එයට ප්‍රිය නොවන්නාවූ එය ප්‍රියයයි නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ විඤ්ඤාණය නොවෙයි. එය උපාදානය නොවෙයි. ගෘහපතිය, උපාදාන නැත්තාවූ මහණතෙම පිරිනිවෙයි.

13. "ගෘහපතිය, කාය විඥානයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ස්පර්ශද ඇත්තාහ. ඉදින් මහණ තෙම එය ප්‍රිය නොකෙරේද, එය ප්‍රියයයි නොකියයිද එහි ගැලී නොසිටීද, එයට ප්‍රිය නොවන්නාවූ එය ප්‍රියයයි නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ විඤ්ඤාණය නොවෙයි. එය උපාදානය නොවෙයි. ගෘහපතිය, උපාදාන නැත්තාවූ මහණතෙම පිරිනිවෙයි.

14. "ගෘහපතිය, මනොවිඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ධර්මයෝද ඇත්තාහ. ඉදින් මහණ තෙම එය ප්‍රිය නොකෙරේද, එය ප්‍රියයයි නොකියයිද එහි ගැලී නොසිටීද, එයට ප්‍රිය නොවන්නාවූ එය ප්‍රියයයි නොකියන්නාවූ එහි ගැලී නොසිටින්නාවූ ඔහුට ඒ තෘෂ්ණාව ඇසුරු කළාවූ විඤ්ඤාණය නොවෙයි. එය උපාදානය නොවෙයි. ගෘහපතිය, උපාදාන රහිතවූ මහණතෙම පිරිනිවෙයි.

"ගෘහපතිය, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම පිරිනිවෙත්ද, මේ වනාහි එයට හේතුවේ මේ ප්‍රත්‍යය වේයයි වදාළේය.

---

## 2. වජ්ජි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ වැදෑරට හස්තිග්‍රාමයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි හස්තිග්‍රාම වැසිවූ උග්ග නම් ගෘහපතිතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක් හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ හස්තිග්‍රාම වැසි උග්ග නම් ගෘහපතිතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය.

(මේ වර්ගයේ පළමු සූත්‍රයේ ඡේද 2 සිට 14 අවසානය දක්වා මෙහි යොදාගත යුතුයි.)

---

## 3 නාලන්දා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ නාලන්දා නුවර පාවාරික නම් අඹ උයනෙහි වැඩවසන සේක. එකල්හි උපාලි නම් ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නේය. එකත්පස්ව උන්නාවූ උපාලි නම් ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය. "ස්වාමීනි, යම් හෙයකින් මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම නොපිරිනිවෙත්ද, ඊට හේතු කවරේද, ප්‍රත්‍ය කවරේද, යම් හෙයකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම පිරිනිවෙත් ද, ඊට හේතු කවරේද ප්‍රත්‍ය කවරේද,

(මේ වර්ගයේ පළමු සූත්‍රයේ ඡේද 2 සිට 14 අවසානය දක්වා මෙහි යොදාගත යුතුයි.)

---

## 4 භාරද්වාජ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් පිණ්ඩොල භාරද්වාජ ස්ථවිරයන් වහන්සේ කොසඹෑ නුවර

ඝොසිතාරාමයෙහි වැඩවසන සේක. එකල්හි උදේන නම් රජ තෙම ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජතෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවූයේය. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක් පසෙක උන්නේය. එක් පසෙක උන්නාවූ උදේන නම් රජතෙම ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ ස්ථවිරයන්ට මෙය සැල කෙළේය.

2. භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, යම් හෙයකින් මේ තරුණවූ යෞවනවූ කළු ඉසකේ ඇත්තාවූ යහපත් යෞවන භාවයෙන් යුක්තවූ ප්‍රථම වයසෙහි සිටියාවූ පඤ්චකාමයන්හි නොකළ ක්‍රීඩා ඇත්තාවූ භික්ෂූහු දිවිහිමියෙන් සම්පූර්ණකොට පිරිසිදුකොට බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත්ද, දීර්ඝ කාලයක් සම්පාදනය කෙරෙත්ද, ඒ හේතුව කවරේද, ඒ ප්‍රත්‍යය කවරේද, යනුයි.”

3. “මහරජ, සියල්ල දන්නාවූ ධර්මයන් දක්නාවූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ‘මහණෙනි එව් තෙපි මව් පමණ ඇත්තියන් කෙරෙහි මව්ය යන සිත එලවව්. නැගණියන් පමණ ඇත්තියන් කෙරෙහි නැගණියන්ය යන සිත එලවව්. දියණියන් පමණ ඇත්තියන් කෙරෙහි දියණිය යන සිත එලවව් යයි (උපද වව්යයි)’ මෙසේ වදාරණලදී.

“මහරජ, යම් හෙයකින් මේ තරුණවූ යෞවනවූ කලු හිසකේ ඇත්තාවූ යෞවන භාවයෙන් යුක්තවූ පළමුවන වයසින් යුක්තවූ පඤ්චකාමයන්හි නොකරනලද ක්‍රීඩා ඇත්තාවූ භික්ෂූහු දිවිහිමියෙන් සම්පූර්ණකොට පිරිසිදුකොට බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත්ද, බොහෝ කාලයකුත් සම්පාදනය කෙරෙත්ද, මේ වනාහි ඒ හේතුවවේ, ප්‍රත්‍ය වේයයි” (කීයේය.)

4. පින්වත් භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, හිත ලොල්ය සමහරවිටක මව් සමාන ඇත්තියක් කෙරෙහිද ලොභසිත් උපදිත්, නැගණියන් සමාන තැනැත්තියන් කෙරෙහිද ලොභ සිත් උපදිත්, දියණියන් සමාන තැනැත්තියන් කෙරෙහිද ලොභ සිත් උපදිත්.

භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, යම් හේතුවකින් මේ තරුණවූ යෞවනවූ කළු හිසකේ ඇත්තාවූ යහපත් යෞවන භාවයෙන් යුක්තවූ පළමුවන වයසින් යුක්ත පඤ්චකාමයන්හි නොකරනලද ක්‍රීඩා ඇත්තාවූ භික්ෂූහු දිවිහිමියෙන් සම්පූර්ණකොට පිරිසිදුකොට බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත්ද, බොහෝ කාලයකුත් සම්පාදනය කෙරෙත්ද, ඒ අනික් හේතුවකුත් ඇත්තේද, අනික් ප්‍රත්‍යයකුත් ඇත්තේද?"

**5** "මහරජ, සියල්ල දන්නාවූ සියලුධර්මයන් දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, තෙපි එව්, පාද තලයෙන් උඩ හිසකේ මතුයෙන් යට සම කෙළවරකොට ඇති අනේකප්‍රකාර අසූචියෙන් පිරුණාවූ මේ ශරීරයම සලකව්. මේ ශරීරයෙහි කෙස්ද, ලොම්ද, නියද, දත්ද, සමද, මසද, නහරද, ඇටද, ඇටමිදුලුද, වකුගඩුවද, හෘදයමාංශයද, අක්මාවද, දළබුවද, බඩදිවද, පපුවද, අතුණුද, අතුණු බහන්ද, නොපැසුණු ආහාරද, මළද, පිතද, සෙමද, සැරවද, ලේද, ඩහදියද, මේදයද, කඳුලුද, වුරුණු තෙල්ද, තෙලද, සොටුද, සඳමිදුලුද, මුත්‍රද, ඇත්තේයයි වදාරණ ලදී.

මහරජ, යම්හෙයකින් මේ තරුණවූ යෞවනවූ කලු හිසකේ ඇත්තාවූ භික්ෂූහු යහපත් යෞවන භාවයෙන් යුක්ත වූ පළමුවන වයසින් යුක්තවූ පඤ්චකාමයන්හි නොකරණලද ක්‍රීඩා ඇත්තාවූ භික්ෂූහු දිවිහිමියෙන් සම්පූර්ණකොට පිරිසිදු කොට බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත්ද, බොහෝ කාලයකුත් සම්පාදනය කෙරෙත්ද, මේ වනාහි ඒ හේතුව වේ. ප්‍රත්‍යවේයයි' කීය.

**6.** "පින්වත් භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, යම් ඒ භික්ෂූහු වඩනලද කය ඇත්තාවූ වඩනලද සිත් ඇත්තාවූ වඩනලද සිත් ඇත්තාවූ වඩනලද නුවණ ඇත්තෝ වෙත්ද, ඔවුන්ට එය දුෂ්කර නොවෙයි. භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, යම් ඒ භික්ෂූහු වනාහි නොවඩනාලද කය ඇත්තාවූ නොවඩනාලද සිල් ඇත්තාවූ නොවඩනාලද සිත් ඇත්තාවූ නොවඩනා ලද නුවණ ඇත්තෝ වෙත්ද, ඔවුන්ට එය දුෂ්කර වේ. පින්වත් භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, සමහර කලෙක අසුභවශයෙන් මෙනෙහි කරන්නෙමුයි,

සුභ වශයෙන්ම (මෛත්‍රී කිරීමට) පැමිණෙයි. පින්වත් භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, යම් හෙයකින් මේ තරුණවූ යෞවනවූ කලු ඉසකේ ඇත්තාවූ භික්ෂූහු යහපත් යෞවන භාවයෙන් යුක්තවූ පළමුවන වයසින් යුක්තවූ පඤ්චකාමයන්හි නොකරණලද ක්‍රීඩා ඇත්තාවූ භික්ෂූහු දිවිහිමියෙන් සම්පූර්ණකොට පිරිසිදුකොට බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත්ද, බොහෝ කාලයකුත් සම්පාදනය කෙරෙත්ද, එයට අන්‍යවූ හේතුවකුත් අන්‍යවූ ප්‍රත්‍යකුත් ඇත්තේද?"

7. "මහරජ, සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, තොපි එව්, ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇත්තෝව වාසය කරව්.

8. 'ඇසින් රූපයක් දැක මහ සටහන් වශයෙන් ගන්නෝ නොවව්. කුඩා සටහන් වශයෙන් ගන්නෝ නොවව්. යමක් හෙතුකොටගෙණ මේ චක්ඛු ඉන්ද්‍රියෙහි සංවර රහිතව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද එය සංවර කිරීම පිණිස පිළිපදිව්. චක්ඛු ඉන්ද්‍රියය රකිව්. චක්ඛු ඉන්ද්‍රියෙහි සංවරයට පැමිණෙව්.

9. කණින් ශබ්දයක් අසා මහ සටහන් වශයෙන් ගන්නෝ නොවව්. කුඩා සටහන් වශයෙන් ගන්නෝ නොවව්. යමක් හෙතුකොට ගෙණ මේ සෝත ඉන්ද්‍රියෙහි සංවර රහිතව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද, එය සංවර කිරීම පිණිස පිළිපදිව්. සෝත ඉන්ද්‍රියය රකිව්. සෝතඉන්ද්‍රියෙහි සංවරයට පැමිණෙව්.

10 නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට මහ සටහන් වශයෙන් ගන්නෝ නොවව්. කුඩා සටහන් වශයෙන් ගන්නෝ නොවව්. යමක් හෙතුකොට ගෙණ මේ ඝාණ ඉන්ද්‍රියෙහි සංවර රහිතව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද, එය සංවර කිරීම පිණිස පිළිපදිව්. ඝාණ ඉන්ද්‍රියය රකිව්. ඝාණ ඉන්ද්‍රියෙහි සංවරයට පැමිණෙව්.

11. දිවෙන් රසයක් විඳ මහ සටහන් වශයෙන් ගන්නෝ නොවව්. කුඩා සටහන් වශයෙන් ගන්නෝ නොවව්. යමක් හෙතුකොටගෙණ මේ ජිව්හා ඉන්ද්‍රියෙහි සංවර රහිතව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද, එය සංවර කිරීම පිණිස පිළිපදිව්. ජිව්හා ඉන්ද්‍රියය රකිව්. ජිව්හා ඉන්ද්‍රියෙහි සංවරයට පැමිණෙව්.

12. කයින් ස්පර්ශයක් කොට මහ සටහන් වශයෙන් ගන්නෝ නොවව්. කුඩා සටහන් වශයෙන් ගන්නෝ නොවව්. යමක් හෙතු කොට ගෙණ මේ කාය ඉන්ද්‍රියෙහි සංවර රහිතව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද, එය සංවර කිරීම පිණිස පිළිපදිව්. කාය ඉන්ද්‍රියය රකිව්. කාය ඉන්ද්‍රියෙහි සංවරයට පැමිණෙව්.

13. "සිතින් ධර්මයක් දැන මහත් සටහන් වශයෙන් ගන්නෝ නොවව් කුඩා සටහන් වශයෙන් ගන්නෝ නොවව්. යම් හෙතුවකින් මේ මනින්ද්‍රියෙහි සංවර නැතුව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද, එය සංවර කිරීම පිණිස පිළිපදිව්. මනින්ද්‍රිය රකිව්. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව්යයි' මෙසේ වදාරණ ලද්දේමය.

මහරජ, යම් හේතුවකින් මේ තරුණවූ යෞවනවූ කළු හිසකේ ඇත්තාවූ භික්ෂූහු යහපත් යෞවනභාවයෙන් යුක්තවූ පළමුවන වයසින් යුක්තවූ පඤ්චකාමයන්හි නොකරණ ලද ක්‍රීඩා ඇත්තාවූ භික්ෂූහු දිවිහිමියෙන් සම්පූර්ණ කොට පිරිසිදු කොට බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත්ද, බොහෝ කාලයකුත් සම්පාදනය කෙරෙත්ද, එයට මේද හෙතුව වේ. ප්‍රත්‍යයවේයයි' (වදාළේය.)

14. "පින්වත් භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, ආශ්චර්‍ය්‍යයකි. පින්වත් භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, පුදුමයකි. පින්වත් භාරද්වාජ ස්ථවිරයන් වහන්ස සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ

විසින් යම් හේතුවකින් මේ තරුණවූ යෞවනවූ කළු හිසකේ ඇත්තාවූ යහපත් යෞවන භාවයෙන් යුක්තවූ පළමු වයසින් යුක්තවූ පඤ්චකාමයන්හි නොකරණ ලද ක්‍රීඩා ඇත්තාවූ භික්ෂූහු දිවිහිමියෙන් සම්පූර්ණකොට පිරිසිදු කොට බ්‍රහ්මචය්‍ර්‍යාවෙහි හැසිරෙත්ද, දීර්ඝ කාලයකුත් පිළියෙළ කෙරෙත්ද, මෙය ඊට හෙතුව වේ මෙය ප්‍රත්‍යය වේයයි වදාරන ලද්දේද එය මනාකොට වදාරණ ලද්දකි.

**15.** "පින්වත් භාරද්වාජ ස්ථවිරයන්වහන්ස, යම් කලෙක්හි මමද නොරක්නා ලද්දාවූම කයින් යුක්තව නොරක්නා ලද වචනයෙන් යුක්තව නොරක්නා ලද සිතින් යුක්තව නොඑළඹ සිටියාවූ සිහියෙන් යුක්තව සංවර නොවූ ඉන්ද්‍රියයන්ගෙන් යුක්තව අන්තඃපුරයට ඇතුල්වෙම්ද, එකල්හි ලොභ ධර්මයෝ අතිශයින්ම මා මැඩපවත්වත්. පින්වත් භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, යම් කලෙක්හි මම රක්නා ලද්දාවූම කයින් යුක්තව රක්නා ලද වචනයෙන් යුක්තව රක්නා ලද සිතින් යුක්තව එළඹ සිටියාවූ සිහියෙන් යුක්තව සංවරවූ ඉන්ද්‍රියයන්ගෙන් යුක්තව අන්තඃපුරයට ඇතුල්වෙම්ද, එකල්හි එහි ලොභ ධර්මයෝ මා නොමැඩපවත්වත්.

**16.** "පින්වත් භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, ඉතා යහපත, පින්වත් භාරද්වාජ ස්ථවිරයන් වහන්ස ඉතා යහපත, පින්වත් භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, යම්සේ යටිකුරු කොට තබන ලද්දක් හෝ උඩුකුරු කරන්නේද, වසා තබන ලද්දක් හෝ වැහුම් අරින්නේද, මංමුළාවූවෙකුට හෝ මග කියන්නේද, අන්ධකාරයෙහි හෝ 'ඇස් ඇත්තෝ රූප දකිත්වායි,' තෙල් පහනක් දල්වන්නේද, එපරිද්දෙන්ම පින්වත් භාරද්වාජ ස්ථවිරයන් විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලදී. පින්වත් භාරද්වාජ ස්ථවිරයන් වහන්ස, ඒ මම ඒ භාග්‍යවතුන් වහන්සේ සරණකොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද, (සරණකොට යමි) පින්වත් භාරද්වාජ ස්ථවිරතෙමේ මා අද පටන් දිවිහිමි කොට සරණ ගියාවූ උපාසකයෙකැයි දරණු මැනවැයි" කීය.

---

## 5. සෝණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාපනම්වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි සෝණ නම් ගෘහපති පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක උන්නේය. එක්පසෙක උන්නාවූ සෝණ නම් ගෘහපති පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය.

2. "ස්වාමීනි යම් හෙයකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම නොපිරිනිවෙත්ද, ඊට හේතු කවරේද, ප්‍රත්‍ය කවරේද, ස්වාමීනි යම් හෙයකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම පිරිනිවෙත්ද, ඊට හෙතු කවරේද, ප්‍රත්‍යය කවරේද?" කියායි.

මේ වර්ගයේ පළමු සූත්‍රයේ ඡෙද 3 සිට 15 දක්වා මෙහි යොදාගත යුතුයි.

---

## 6. ඝෝසිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කොසඹෑනුවර ඝෝසිතාරාමයෙහි වාසය කරති. එකල්හි වනාහි ඝෝසිත නම් ගෘහපති තෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවූයේය. සතුටු විය යුතුවූ සිහිකටයුතුවූ කථාකොට නිමවා එක්පසෙක උන්නේය. එක්පසෙක උන්නාවූ ඝොසිත නම් ගෘහපති තෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙය සැලකෙළේය.

2. "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, ධාතුන්ගේ නානත්වය ධාතුන්ගේ නානත්වයයි කියනු ලැබේ. ස්වාමීනි,

කොපමණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් ධාතූන්ගේ නානත්වය වදාරණ ලද්දේද” යනුයි.

3. “ගෘහපතිය, චක්ෂු ධාතුවද ඇත්තේය. මනවඩන්නාවූ රූපයෝද ඇත්තාහ. චක්ඛු විඤ්ඤාණයද ඇත්තේය. සැප වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා සැපවූ වෙදනාවද උපදියි. ගෘහපතිය, චක්ෂු ධාතුවද ඇත්තේය. මන නොවඩන්නාවූ රූපයෝද ඇත්තාහුය. චක්ඛු විඤ්ඤාණයද ඇත්තේය. දුක් වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්වූ වෙදනාවද උපදියි. ගෘහපතිය, චක්ෂු ධාතුද ඇත්තේය. උපෙක්ෂාවට කරුණුවූ රූපයෝද ඇත්තාහ. චක්ඛු විඤ්ඤාණයද ඇත්තේය දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවද උපදියි.

4. ගෘහපතිය, සෝත ධාතුවද ඇත්තේය. මන වඩන්නාවූ ශබ්දයෝද ඇත්තාහ. සෝතවිඤ්ඤාණයද ඇත්තේය සැප වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා සැපවූ වේදනාවද උපදියි. ගෘහපතිය, සෝත ධාතුවද ඇත්තේය. මන නොවඩන්නාවූ ශබ්දයෝද ඇත්තාහුය. සෝත විඤ්ඤාණයද ඇත්තේය. දුක් වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්වූ වෙදනාවද උපදියි. ගෘහපතිය, සෝත ධාතුවද ඇත්තේය. උපෙක්ෂාවට කරුණුවූ ශබ්දයෝද ඇත්තාහ. සෝත විඤ්ඤාණයද ඇත්තේය. දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවද උපදියි.

5. “ගෘහපතිය, ඝාණ ධාතුවද ඇත්තේය. මනවඩන්නාවූ ගන්ධයෝ ඇත්තාහ. ඝාණ විඤ්ඤාණයද ඇත්තේය. සැපවෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා සැපවූ වෙදනාවද උපදියි. ගෘහපතිය, ඝාණ ධාතුවද ඇත්තේය. මන නොවඩන්නාවූ ගන්ධයෝද ඇත්තාහුය. ඝාණ විඤ්ඤාණයද ඇත්තේය. දුක් වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්වූ වෙදනාවද උපදියි. ගෘහපතිය, ඝාණ ධාතුවද ඇත්තේය. උපෙක්ෂාවට කරුණුවූ ගන්ධයෝද ඇත්තාහ. ඝාණ විඤ්ඤාණයද ඇත්තේය. දුක්ද

නොවූ සැපද නොවූ වේදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවද උපදියි.

**6.** "ගෘහපතිය ජිව්හා ධාතුවද ඇත්තේය. මනවඩන්නාවූ රසයෝද ඇත්තාහ. ජිව්හා විඤ්ඤාණයද ඇත්තේය. සැප වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා සැපවූ වෙදනාවද උපදියි. ගෘහපතිය, ජිව්හා ධාතුවද ඇත්තේය. මනනොවඩන්නාවූ රසයෝද ඇත්තාහ. ජිව්හා විඤ්ඤාණයද ඇත්තේය. දුක් වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්වූ වෙදනාවද උපදියි. ගෘහපතිය, ජිව්හා ධාතුවද ඇත්තේය. උපෙක්ෂාවට කරුණුවූ රසයෝද ඇත්තාහ. ජිව්හා විඤ්ඤාණයද, ඇත්තේය. දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවද උපදියි.

**7.** "ගෘහපතිය, කාය ධාතුවද ඇත්තේය. මන වඩන්නාවූ ස්පර්ශයෝද ඇත්තාහ. කාය විඤ්ඤාණයද ඇත්තේය. සැපවේදනාවට කරුණු ස්පර්ශය නිසා සැපවූ වෙදනාවද උපදියි. ගෘහපතිය, කාය ධාතුවද ඇත්තේය. මන නොවඩන්නාවූ ස්පර්ශයෝද ඇත්තාහුය. කාය විඤ්ඤාණයද ඇත්තේය. දුක් වෙදනාවට කරුණු ස්පර්ශය නිසා දුක්වූ වෙදනාවද උපදියි. ගෘහපතිය, කාය ධාතුද ඇත්තේය. උපෙක්ෂාවට කරුණුවූ ස්පර්ශයෝද ඇත්තේය. කාය විඤ්ඤාණයද ඇත්තේය. දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවද උපදියි.

**8.** "ගෘහපතිය, මනො ධාතුවද ඇත්තේය. මන වඩන්නාවූ ධර්මයෝද ඇත්තාහ. මනො විඤ්ඤාණයද ඇත්තේය. සැපවෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා සැපවූ වෙදනාවද උපදියි. ගෘහපතිය, මනො ධාතුවද ඇත්තේය. මන නොවඩන්නාවූ ධර්මයෝද ඇත්තාහ. මනො විඤ්ඤාණයද ඇත්තේය. දුක් වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්වූ වෙදනාවද උපදියි. ගෘහපතිය, මනො ධාතුවද ඇත්තේය. උපෙක්ෂාවට කරුණුවූ ධර්මයෝද ඇත්තාහ. මනො විඤ්ඤාණයද, ඇත්තේය. දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවට

කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවද උපදියි. ගෘහපතිය මෙතෙකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් ධාතුන්ගේ නානත්වය වදාරණ ලදැයි" කීය.

---

## 7. හාලිද්දක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි ආයුෂ්මත් මහා කාත්‍යයන ස්ථවිර තෙම අවන්තී රට කුරිරඝරයෙහි පවත්ත නම් පර්වතයෙහි වාසය කරයි. එකල්හි වනාහි හාලිද්දකානි නම් ගෘහපති තෙම ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරතෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ මහා කත්‍යායන ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු වියයුතුවූ සිහිකටයුතුවූ කථාකොට නිමවා එක්පසෙක උන්නේය. එක්පසෙක උන්නාවූ හාලිද්දකානි නම් ගෘහපති තෙම ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවීරයන්ට මෙය සැල කෙළේය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ධාතුන්ගේ නානත්වය නිසා ස්පර්ශයන්ගේ නානත්වය නිසා වෙදනාවන්ගේ නානත්වය උපදී යන මෙය වදාරණ ලදී. ස්වාමීනි, කෙසේ නම් ධාතුන්ගේ නානත්වය නිසා ස්පර්ශයන්ගේ නානත්වය උපදීද? ස්පර්ශයන්ගේ නානත්වය නිසා වෙදනාවන්ගේ නානත්වය උපදීදැයි" (ඇසුයේය.)

3. "ගෘහපතිය, මේ ලොකයෙහි භික්ෂුතෙම ඇසින් රූපයක් දැක මේ ආකාරයෙන් මෙය මන වඩන්නේයයි දැන ගණියි. චක්ඛු විඤ්ඤණයද සැපවෙදනාවට කරුණුවූ ස්පර්ශයද නිසා සැපවූ වෙදනාව උපදියි ඇසින්ම රූපයක් දැක මේ ආකාරයෙන් මෙය මන නොවඩන්නේයයි, දැන ගණියි. චක්ඛු විඤ්ඤාණයද දුක් වෙදනාවට කරුණුවූ ස්පර්ශයද නිසා දුක්වූ වෙදනාව උපදියි. ඇසින්ම වනාහි රූපයක් දැක මේ ආකාරයෙන් මෙය උපෙක්ෂාවට කරුණු වේයයි දැන ගණියි. චක්ඛු විඤ්ඤාණයද දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වෙදනාව උපදියි.

**4.** "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. කණින් ශබ්දයක් අසා මේ ආකාරයෙන් මෙය මන වඩන්නේයයි දැන ගණියි. සෝත විඤ්ඤාණයද සැප වෙදනාවට කරුණුවූ ස්පර්ශයද නිසා සැපවූ වෙදනාව උපදියි. කණින්ම ශබ්දයක් අසා මේ ආකාරයෙන් මෙය මන නොවඩන්නේයයි, දැන ගණියි. සෝත විඤ්ඤාණයද දුක් වේදනාවට කරුණුවූ ස්පර්ශයද නිසා දුක්වූ වෙදනාව උපදියි. කණින්ම වනාහි ශබ්දයක් අසා මේ ආකාරයෙන් මෙය උපෙක්ෂාවට කරුණුවේයයි දැන ගණියි. සෝත විඤ්ඤාණයද දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වෙදනාව උපදියි.

**5** "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට මේ ආකාරයෙන් මෙය මන වඩන්නේයයි දැන ගණියි. ඝාණ විඤ්ඤාණයද සැප වේදනාවට කරුණුවූ ස්පර්ශයද නිසා සැපවූ වෙදනාව උපදියි. නාසයෙන්ම ගන්ධයක් ආඝ්‍රාණය කොට මේ ආකාරයෙන් මෙය මන නොවඩන්නේයයි. දැන ගණියි. ඝාණ විඤ්ඤාණයද දුක් වෙදනාවට කරුණුවූ ස්පර්ශයද නිසා දුක්වූ වෙදනාව උපදියි. නාසයෙන්ම ගන්ධයක් ආඝ්‍රාණය කොට මේ ආකාරයෙන් මෙය උපෙක්ෂාවට කරුණු වේයයි දැන ගණියි. ඝාණ විඤ්ඤාණයද දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වෙදනාව උපදියි.

**6.** "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. දිවෙන් රසයක් විඳ මේ ආකාරයෙන් මෙය මන වඩන්නේයයි, දැන ගණියි. ජිව්හා විඤ්ඤාණයද සැප වෙදනාවට කරුණුවූ ස්පර්ශයද නිසා සැපවූ වෙදනාව උපදියි දිවෙන්ම රසයක් විඳ මේ ආකාරයෙන් මෙය මන නොවඩන්නේයයි දැන ගණියි. ජිව්හා විඤ්ඤාණයද දුක් වෙදනාවට කරුණුවූ ස්පර්ශයද නිසා දුක්වූ වෙදනාව උපදියි. දිවෙන්ම රසයක් විඳ මේ ආකාරයෙන් මෙය උපෙක්ෂාවට කරුණු වේයයි දැන ගණියි. ජිව්හා විඤ්ඤාණයද දුක්ද නොවූ

සැපද නොවූ වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වෙදනාව උපදියි.

7. "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. කයින් ස්පර්ශයක් කර මේ ආකාරයෙන් මෙය මන වඩන්නේයයි, දැන ගණියි. කාය විඤ්ඤාණයද සැප වෙදනාවට කරුණුවූ ස්පර්ශයද නිසා සැපවූ වෙදනාව උපදියි. කයින්ම වනාහි ස්පර්ශයක් කර මේ ආකාරයෙන් මෙය මන නොවඩන්නේයයි, දැන ගණියි. කාය විඤ්ඤාණයද දුක් වෙදනාවට කරුණුවූ ස්පර්ශයද නිසා දුක්වූ වෙදනාව උපදියි. කයින්ම ස්පර්ශයක් කර මේ ආකාරයෙන් මෙය උපෙක්ෂාවට කරුණු වේයයි දැන ගණියි. කාය විඤ්ඤාණයද දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වෙදනාව උපදියි.

8. "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. සිතින් ධර්මයක් දැන මේ ආකාරයෙන් මෙය මන වඩන්නේයයි දැන ගණියි. මනො විඤ්ඤාණයද සැප වෙදනාවට කරුණුවූ ස්පර්ශයද නිසා සැපවූ වේදනාව උපදියි. සිතින්ම වනාහි ධර්මයක් දැන මේ ආකාරයෙන් මෙය මන නොවඩන්නේයයි දැන ගණියි. මනො විඤ්ඤාණයද දුක් වේදනාවට කරුණුවූ ස්පර්ශයද නිසා දුක්වූ වෙදනාව උපදියි. සිතින්ම වනාහි ධර්මයක් දැන මේ ආකාරයෙන් මෙය උපෙක්ෂාවට කරුණු වේයයි දැන ගණියි. මනො විඤ්ඤාණයද දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවට කරුණුවූ ස්පර්ශය නිසා දුක්ද නොවූ සැපද නොවූ වෙදනාව උපදියි. ගෘහපතිය මෙසේ වනාහි ධාතුන්ගේ නානත්වය නිසා ස්පර්ශයන්ගේ නානත්වය උපදියි ස්පර්ශයන්ගේ නානත්වය නිසා වෙදනාවන්ගේ නානත්වය උපදීයයි" (වදාළේය.)

---

## 8. නකුලපිතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ භගුරට සුංසුමාර ගිරි නම් නුවර මිගදාය නම්වූ

භෙසකලා වනයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි නකුල පිතු නම් ගෘහපතිතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ නකුල පිතු නම් ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය.

(මේ වර්ගයේ පළමු සූත්‍රයේ ඡෙද 2 සිට 15 දක්වා මෙහි යොදා ගතයුතුයි.)

---

## 9. ලෝහිච්ච සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක්හි ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරතෙම අවන්තිරට මක්කරකට නම් නගරයෙහි ආරණ්‍යයෙහිවූ කුටියෙක්හි වාසය කරති. එකල්හි වනාහි ලෝහිච්ච නම් බ්‍රාහ්මණයාගේ බොහෝවූ දර ගෙනෙන්නාවූ මානවකයෝ ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ ආරණ්‍යයෙහි වූ කුටිය යම් තැනෙක්හිද, එතැනට පැමිණියාහුය. පැමිණ කුටිය හාත්පසින් සිට "මේ මුඩු ශ්‍රමණයෝ වනාහි හීන ගෘහපතියෝය. කළුවූවෝය. බ්‍රහ්මයාගේ පිටිපතුලෙන් උපන්නෝය. මේ රටවැසියන් විසින් සත්කාර කරණ ලද්දාහු. ගෞරව කරණ ලද්දාහු, බුහුමන් කරණ ලද්දාහු, පුදන ලද්දාහු, සැලකිලි කරණ ලද්දාහු වෙත්යයි' උස් හඬින් මහත් හඬින් කියමින් කුටිය වටේ සක්මන් කරත්. ඔබමොබ හැසිරෙත්"

2. එකල්හි ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරතෙම විහාරයෙන් නික්ම ඒ මානවකයන්ට මෙය කීයේය. "මානවකයිනි, තොපි ශබ්ද නොකරව්. තොපට ධර්මය දෙශනා කරන්නෙමි,"යි මෙසේ කී කල්හි ඒ මානවකයෝ නිශ්ශබ්ද වූහ. ඉක්බිති ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරතෙම ඒ මානවකයන්ට ගාථාවලින් මෙය ප්‍රකාශ කෙළේය.

(1) "යම් කෙනෙක් පුරාණ බ්‍රාහ්මණ ධර්මය සිහි කෙරෙත්ද, ඉතා පූර්වයෙහිවූ ඒ බ්‍රාහ්මණයෝ සීලය උතුම්

කොට ඇත්තේ වූහ. ඔවුන්ගේ ක්‍රොධය මැඩපවත්වා මනාව රක්නාලද ගොපනය කරණලද දොරටු ඇත්තෝ වූහ.

(2) යම් කෙනෙක් පුරාණවූ (බ්‍රාහ්මණ ධර්මය) සිහි කෙරෙත්ද, ඒ බ්‍රාහ්මණයෝ දසකුශල ධර්මයෙහිද, ධ්‍යානයෙහිද, ඇලුනෝ වූහ. මේ ගුණයන්ද ඉක්මවා අප මන්ත්‍ර හදාරන්නෙමුයි, ගොත්‍රයෙන් මත්වූවාහු ගන්නාලද නොයෙක් දඬු ඇත්තාහු. ක්‍රොධයෙන් මඩනා ලද්දාහු තෘෂ්ණා සහිතවූද තෘෂ්ණා රහිතවූද, සත්වයන් කෙරෙහි වරද කෙරෙමින් විසමව හැසිරෙත්.

(3) නොරක්නාලද දොරටු ඇත්තහුගේ ආහාර නොගැණීමද නිල් කුසතණ ඇතිරියෙහි සයනය කිරීමද, උදෑසන ස්නානය කිරීමද, ත්‍රිවෙදයද යන මොහු පුරුෂයෙකුගේ සිහිනෙන් ලබනලද වස්තුවක් මෙන් හිස් වූවාහුවෙත්.

(4) රළු ස්පර්ශ ඇති අඳුන් දිවිසමද, ජටාවද, දත් මැලියම්ද, මන්ත්‍රද අන්‍ය ශීල ව්‍රත සමාදානයවූ තපසද, කුහක බවද, වක්වූ දඬු ඇති බවද, ජලයෙන් පිරිසිදු කිරීමද, කිසියම් ආමිස ලාභයන් පිණිස කරණලද මොව්හු බ්‍රාහ්මණයන්ගේ වර්ණයෝ (ගුණයෝ) වෙත්.

(5) යම් කෙනකුන්ගේ සිතද මනාව එකඟ කරණ ලද්දේද, විශෙෂයෙන් ප්‍රසන්නවූයේ නොකැළඹුනේ සියලු සත්වයන් කෙරෙහි මෘදුවූයේ වේද, එය ශ්‍රෙෂ්ඨ බවට පැමිණීමට මාර්ගය වේයයි” (කීය)

3. එකල්හි ඒ මානවකයෝ කිපුනාහු නොසතුටුසිත් ඇත්තාහු ලෝහිච්ච නම් බ්‍රාහ්මණයා යම් තැනෙක්හිද එතැනට ගියාහුය. ගොස් ලොහිච්චනම් බ්‍රාහ්මණයාට මෙය කීවාහුය. “මහාකාත්‍යායන නම් ශ්‍රමණතෙම බ්‍රාහ්මණයන්ගේ මන්ත්‍රවලට ඒකාන්තයෙන් දොස් කියයි. ආක්‍රොශ කරයි. යන මෙය දන්නේද” යනුයි. මෙසේ කී කල්හි ලොහිච්ච නම් බ්‍රාහ්මණතෙම කිපියේ නොසතුටුසිත් ඇත්තේ වූයේය. ඉක්බිති ලෝහිච්චනම් බ්‍රාහ්මණයාට මෙබඳු අදහසක් විය. ‘යම්බඳු මම ඒකාන්තයෙන්

මානවකයන්ගෙන්ම අසා මහා ආක්‍රොශ කාත්‍යායන ශ්‍රමණයන්ට කරන්නෙම් නම් පරිභව කරන්නෙම්නම් මේ මට සුදුසු නොවෙයි. මම පැමිණ අසන්නෙම්නම්යහපති කියායි.

**4.** ඉක්බිති ලෝහිච්ච නම් බ්‍රාහ්මණතෙම ඒ මානවකයන් සමග ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිර තෙම යම් තැනෙක්හිද එතැනට ගියේය. ගොස් ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් සමග සතුටු වූයේය. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක් පසෙක හුන්නේය. එක් පසෙක උන්නාවූ ලෝහිච්චනම් බ්‍රාහ්මණතෙම ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන්ට මෙය කීයේය.

"භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, අපගේ බොහෝවූ අතවැසිවූ දරගෙණියන්නාවූ මානවකයෝ මෙහි ආවාහුද?"

"බ්‍රාහ්මණය, තොපගේ බොහෝවූ අතවැසිවූ දරගෙණියන්නාවූ මානවකයෝ මෙහි ආවාහුය,"

"භවත් කාත්‍යායන ස්ථවිරයන්ගේ ඒ මානවකයන් සමග කිසියම් කථාබහෙක් වූයේද?"

"බ්‍රාහ්මණය, මාගේ ඒ මානවකයන් සමග කිසියම් කතාබහෙක් වූයේය."

"භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්සේගේ ඒ මානවකයන් සමග කෙබඳුවූ කතාබහෙක් වීද?"

**5.** "බ්‍රාහ්මණය, මෙසේ වනාහි මාගේ ඒ මානවකයන් සමග කතාබහෙක් වූයේය.

(1) "යම් කෙනෙක් පුරාණ බ්‍රාහ්මණ ධර්මය සිහි කෙරෙත්ද, ඉතා පූර්වයෙහිවූ ඒ බ්‍රාහ්මණයෝ සීලය උතුම් කොට ඇත්තෝ වූහ. ඔවුන්ගේ ක්‍රොධය මැඩ පවත්වා මනාව රක්නාලද ගොපනය කරණලද දොරටු ඇත්තෝ වූහ.

(2) යම්කෙනෙක් පුරාණවූ (බ්‍රාහ්මණ ධර්මය) සිහි කෙරෙත්ද, ඒ බ්‍රාහ්මණයෝ දසකුසල ධර්මයෙහිද, ධ්‍යානයෙහිද, ඇලුනෝවූහ. මේ ගුණයන්ද ඉක්මවා අපි මන්ත්‍ර හදාරන්නෙමුයි, ගොත්‍රයෙන් මත්වූවාහු ගන්නා ලද

නොයෙක් දඬු ඇත්තාහු, ක්‍රොධයෙන් මඩනාලද්දාහු තෘෂ්ණා සහිතවූද, තෘෂ්ණා රහිතවූද, සත්වයන් කෙරෙහි වරද කෙරෙමින් හැසිරෙත්.

(3) නොරක්නාලද දොරටු ඇත්තහුගේ ආහාර නොගැනීමද, තිල් කුසතණ ඇතිරියෙහි සයනය කිරීමද, උදෑසන ස්නානය කිරීමද, ත්‍රිවෙදයද, යන මොහු පුරුෂයෙකුගේ සිහිනෙන් ලබනලද වස්තුවක් මෙන් හිස් වූවාහු වෙත්.

(4) රළු ස්පර්ශ ඇති අඳුන් දිවිසමද, ජටාවද, දත් මැලියම්ද, මන්ත්‍රද, අන්‍ය ශීලව්‍රත සමාදානයවූ තපසද, කුහක බවද, වක්වූ දඬුඇති බවද, ජලයෙන් පිරිසිදු කිරීම්ද, කිසියම් ආමිස ලාභයන් පිණිස කරණලද මොව්හු බ්‍රාහ්මණයන්ගේ වර්ණයෝ (ගුණයෝ) වෙත්.

(5) යම්කෙනෙකුන්ගේ සිතද, මනාව එකඟ කරණ ලද්දේද, විශෙෂයෙන් ප්‍රසන්නවූයේ නොකැළඹුනේ සියලු සත්වයන් කෙරෙහි මෘදුවූයේ වේද, එය ශ්‍රෙෂ්ඨ බවට පැමිණීමට මාර්ගය වේයයි” (කීය.)

**6.** නොරක්නාලද දොරටු ඇත්තේයයි, භවත් කාත්‍යායන තෙමේ කීයේය. කාත්‍යායන වහන්ස, කොපමණකින් වනාහි නොරක්නාලද දොරටු ඇත්තේවේද?” “බ්‍රාහ්මණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ඇසින් රූපයක් දැක ප්‍රිය ස්වභාව ඇත්තාවූ රූපයෙහි කෙලෙස් වශයෙන් ඇලෙයි. අප්‍රිය ස්වභාව ඇත්තාවූ රූපයෙහි කිපෙයි. නොඑළඹ සිටි සිහිය හේතුකොටගෙණ ස්වල්පවූ (දුර්වලවූ) සිත් ඇතිව වාසය කරයි. ඔහුට යම් අරමුණෙක්හි උපන්නාවූ ලාමකවූ ඒ අකුසල ධර්මයෝ ඉතිරිනොවී නිරුද්ධ නොවෙත්ද, ඒ අර්හත් ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රතිඥාවද තත්වාකාරයෙන් නොදනියි.

**7.** “බ්‍රහ්මණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කණින් ශබ්දයක් අසා ප්‍රිය ස්වභාව ඇත්තාහු ශබ්දයෙහි කෙලෙස් වශයෙන් ඇලෙයි. අප්‍රිය ස්වභාව ඇත්තාවූ ශබ්දයෙහි කිපෙයි.

නොඑළඹ සිටි සිහිය හේතුකොටගෙණ ස්වල්ප වූ (දුර්වලවූ) සිත් ඇතුව වාසය කරයි. යම් අරමුණෙක්හි ඔහුට උපන්නාවූ ලාමක වූ ඒ අකුසල ධර්මයෝ ඉතුරුනොවී නිරුද්ධ නොවෙත්ද, ඒ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාවද තත්වාකාරයෙන් නොදනියි.

8. 'බ්‍රහ්මණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකර ප්‍රිය ස්වභාව ඇත්තාවූ ගන්ධයෙහි කෙලෙස් වශයෙන් ඇලෙයි. අප්‍රිය ස්වභාව ඇත්තාවූ ගන්ධයෙහි කිපෙයි. නොඑළඹසිටි සිහිය හේතුකොටගෙණ ස්වල්පවූ (දුර්වලවූ) සිත් ඇතුව වාසය කරයි. යම් අරමුණෙක්හි ඔහුට උපන්නාවූ ලාමකවූ ඒ අකුසල ධර්මයෝ ඉතිරි නොවී නිරුද්ධ නොවෙත්ද, ඒ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාවද තත්වාකාරයෙන් නොදනියි.

9. "බ්‍රහ්මණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දිවෙන් රසයක් විඳ ප්‍රිය ස්වභාව ඇත්තාවූ රසයෙහි කෙලෙස් වශයෙන් ඇලෙයි අප්‍රිය ස්වභාව ඇත්තාවූ රසයෙහි කිපෙයි. නොඑළඹ සිටි සිහිය හේතුකොටගෙණ ස්වල්පවූ (දුර්වලවූ) සිත් ඇතුව වාසය කරයි. යම් අරමුණෙක්හි ඔහුට උපන්නාවූ ලාමක වූ ඒ අකුශල ධර්මයෝ ඉතිරිනොවී නිරුද්ධ නොවෙත්ද, ඒ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාවද තත්වාකාරයෙන් නොදනියි.

10. "බ්‍රහ්මණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කයෙන් ස්පර්ශයක් කර ප්‍රිය ස්වභාව ඇත්තාවූ කයෙහි කෙලෙස් වශයෙන් ඇලෙයි. අප්‍රිය ස්වභාව ඇත්තාවූ ස්පර්ශයෙහි කිපෙයි. නොඑළඹ සිටි සිහිය හේතුකොටගෙණ ස්වල්ප වූ (දුර්වලවූ) සිත් ඇතුව වාසය කරයි. යම් අරමුණෙක්හි ඔහුට උපන්නාවූ ඒ අකුශල ධර්මයෝ ඉතිරි නොවී නිරුද්ධ නොවෙත්ද ඒ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාවද තත්වාකාරයෙන් නොදනියි.

11. 'සිතින් ධර්මාරම්මණයක් දැන ප්‍රිය ස්වභාව ඇත්තාවූ ධර්මාරම්මණයෙහි ඇල්ම කෙරෙයි. අප්‍රිය ස්වභාව ඇත්තාවූ ධර්මාරම්මණයෙහි කිපෙයි. නොඑළඹසිටි සිහිය නිසා ස්වල්පවූ සිත් ඇතිව වාසය කරයි. යම් අරමුණෙක්හි ඔහුට උපන්නාවූ

ලාමකවූ ඒ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධනොවෙත්ද, ඒ ඵල සමාධියද ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැන නොගණියි. බ්‍රාහ්මණය මෙසේ වනාහි නොරක්නාලද දොරටු ඇත්තේ වේයයි” (කීය.)

12. “භවත් කාත්‍යායන ස්ථවිරයන්වහන්ස, ආශ්චර්‍ය්‍යය භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්ස පුදුමය. භවත් කාත්‍යායන ස්ථවිරයන් විසින් නොරක්නාලද දොරටු ඇත්තේම, නොරක්නාලද දොරටු ඇත්තේය යන මෙය, යහපත් කොටම ප්‍රකාශ කරණලදී. ‘රක්නාලද දොරටු ඇත්තේයයි, භවත් කාත්‍යායන තෙමේ කීයේය. භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, කොපමණකින් වනාහි රක්නා ලද දොරටු ඇත්තේ වේද?”

13. “බ්‍රාහ්මණය, මේ ලොකයෙහි භික්ෂුතෙම ඇසින් රූපයක් දැක ප්‍රිය ස්වභාව ඇත්තාවූ රූපය කෙරෙහි කෙලෙස් වශයෙන් ගිජු නොවෙයි. අප්‍රිය ස්වභාව ඇත්තාවූ රූපය කෙරෙහි නොකිපෙයි. එළඹ සිටි සිහිය නිසා අප්‍රමාණ සිත් ඇතිව වාසය කෙරෙයි. යම් අරමුණෙක්හි ඔහුට ඒ උපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධවෙත්ද, ඒ ඵල සමාධියද ඵල ප්‍රඥාවද දැන ගණියි.

14. කණින් ශබ්දයක් අසා ප්‍රිය ස්වභාව ඇත්තාවූ ශබ්දය කෙරෙහි කෙලෙස් වශයෙන් ගිජු නොවෙයි. අප්‍රිය ස්වභාව ඇත්තාවූ ශබ්දය කෙරෙහි නොකිපෙයි. එළඹ සිටි සිහිය නිසා අප්‍රමාණ සිත් ඇතිව වාසය කෙරෙයි. යම් අරමුණෙක්හි ඔහුට ඒ උපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධ වෙත්ද, ඒ ඵල සමාධියද ඵල ප්‍රඥාවද දැන ගණියි.

15. නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකර ප්‍රිය ස්වභාව ඇත්තාවූ ගන්ධය කෙරෙහි කෙලෙස් වශයෙන් ගිජු නොවෙයි. අප්‍රිය ස්වභාව ඇත්තාවූ ගන්ධය කෙරෙහි නොකිපෙයි. එළඹ සිටි සිහිය නිසා අප්‍රමාණ සිත් ඇතිව වාසය කෙරෙයි. යම් අරමුණෙක්හි ඔහුට ඒ උපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයෝ

ඉතිරි නැතිව නිරුද්ධ වෙත්ද, ඒ ඵල සමාධියද ඵල ප්‍රඥාවද දැන ගණියි.

16. දිවෙන් රසයක් විඳ ප්‍රිය ස්වභාව ඇත්තාවූ රසය කෙරෙහි කෙලෙස් වශයෙන් ගිජු නොවෙයි. අප්‍රිය ස්වභාව ඇත්තාවූ රසය කෙරෙහි නොකිපෙයි. එළඹ සිටි සිහිය නිසා අප්‍රමාණ සිත් ඇතිව වාසය කෙරෙයි. යම් අරමුණෙක්හි ඔහුට ඒ උපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධවෙත්ද, ඒ ඵල සමාධියද ඵල ප්‍රඥාවද දැන ගණියි.

17. කයෙන් ස්පර්ශයක් කර ප්‍රිය ස්වභාව ඇත්තාවූ ස්පර්ශය කෙරෙහි කෙලෙස් වශයෙන් ගිජු නොවෙයි. අප්‍රිය ස්වභාව ඇත්තාවූ ස්පර්ශය කෙරෙහි නොකිපෙයි. එළඹ සිටි සිහිය නිසා අප්‍රමාණ සිත් ඇතිව වාසය කෙරෙයි. යම් අරමුණෙක්හි ඔහුට ඒ උපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධවෙත්ද, ඒ ඵල සමාධියද ඵල ප්‍රඥාවද දැන ගණියි.

18. "සිතින් ධර්මාරම්මණයක් දැන ප්‍රිය ස්වභාව ඇත්තාවූ ධර්මාරම්මණයන් කෙරෙහි නොඇලෙයි. අප්‍රිය ස්වභාව ඇත්තාවූ ධර්මාරම්මණයන් කෙරෙහි නොකිපෙයි. එළඹ සිටි සිහිය නිසා අප්‍රමාණ සිත් ඇතිව වාසය කරයි. යම් අරමුණෙක්හි ඔහුට ඒ උපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නොවී නිරුද්ධ වෙත්ද, ඒ ඵල සමාධියද ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැන ගණියි. බ්‍රාහ්මණය, මෙසේ වනාහි රක්නාලද දොරටු ඇත්තේ වේයයි" කීය.

19. "භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, ආශ්චර්‍ය්‍යය භවත් කත්‍යායන ස්ථවිරයන් වහන්ස, පුදුමය භවත් කත්‍යායන ස්ථවිරයන් විසින් රක්නා ලද දොරටු ඇත්තෙන්ම රක්නා ලද දොරටු ඇත්තේය, යන මෙය යහපත් කොට ප්‍රකාශ කරණ ලදී. භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, ඉතා යහපති, භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, ඉතා යහපති.

"භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්ස යම්සේ යටිකුරු කොට තබන ලද්දක් හෝ උඩුකුරු කරන්නේද, වසා තබන

ලද්දක් හෝ වැසුම් හරින්නේද, මංමුළාවූවෙකුට හෝ මග කියන්නේද, අන්ධකාරයෙහි හෝ 'ඇස් ඇත්තෝ රූප දකිත්වායි' තෙල් පහනක් දරන්නේද, එපරිද්දෙන්ම භවත් කාත්‍යායන ස්ථවිරයන් විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලදී.

**20** "භවත් කාත්‍යායන ස්ථවිරයන් වහන්ස, ඒ මම ඒ භාග්‍යවතුන් වහන්සේ සරණකොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද (සරණකොට යමි.) භවත් කාත්‍යායන ස්ථවිර තෙමේ මා අද පටන් දිවිහිමියෙන් සරණ ගියාවූ උපාසකයෙකු කොට දරණු මැනව. යම්සේ භවත් කාත්‍යායන ස්ථවිර තෙමේ මක්කරකට නම් නගරයෙහි උපාසක කුලවලට එළඹෙන්නේද එපරිද්දෙන්ම ලෝහිච්ච බ්‍රාහ්මණයාගේ ගෙදරටද එළඹෙනු මැනවි. එහි යම් මානවකයෝද මානවිකාවෝද භවත් කාත්‍යායන ස්ථවිරයන්ට වඳින්නාහුද දැක හුනස්නෙන් නැගිටින්නාහුද, ආසනයක් හෝ ජලයක් දෙන්නාහුද ඔවුන්ට එය බොහෝ කලක් වැඩ පිණිස සැප පිණිස වන්නේයයි" (කීයේය.)

---

## 10. වේරහච්චානී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි ආයුෂ්මත් උදායී ස්ථවිරයන් වහන්සේ කාමණ්ඩා නම් නුවර තෝදෙය්‍ය නම් බ්‍රාහ්මණයාගේ අඹ උයනෙහි වාසය කරති. එකල්හි වෙරහච්චානි ගොත්‍ර ඇත්තාවූ බැමිණියගේ අතවැසිවූ මානවකයෙක් තෙම ආයුෂ්මත් උදායී ස්ථවිරතෙම යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් උදායී ස්ථවිරයන් සමග සතුටුවූයේය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ මානවකයාට ආයුෂ්මත් උදායී ස්ථවිරතෙම දැහැමිවූ කථාවෙන් කරුණු දැක්වීය සමාදන් කරවූයේය. තෙද ගැන්වීය. සතුටු සිත් ඇති කෙළේය.

2. ඉක්බිති ඒ මානවකතෙම ආයුෂ්මත් උදායී ස්ථවිරයන් විසින් දැහැමිවූ කථාවෙන් කරුණු දක්වන ලද්දේ, සමාදන් කරවන ලද්දේ තෙදගන්වන ලද්දේ, සතුටු කරවන ලද්දේ, හුනස්නෙන් නැගිට වෙරහච්චානි නම් ගෝත්‍ර ඇති බැමිණි තොමෝ යම් තැනෙක්හිද එතැනට ගියේය. ගොස්, වෙරහච්චානි ගෝත්‍රයෙහිවූ බැමිණියට මෙය කීයේය. "පින්වතිය, දන්නේද, උදායී ශ්‍රමණතෙමේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ, අර්ථ සහිතවූ, ව්‍යඤ්ජන සහිතවූ, සියල්ලෙන් සම්පූර්ණවූ ධර්මය දේශනා කරයි. පිරිසිදුවූ බ්‍රහ්මචය්‍ය්‍යාව ප්‍රකාශ කෙරේය කියායි.

3. "මානවකය, එසේනම් නුඹ මාගේ වචනයෙන් උදායී ශ්‍රමණයන් වහන්සේට සෙට දවස පිණිස බතින් ආරාධනා කරව"-"එසේය, පින්වතියයි" කියා ඒ මානවක තෙම වෙරහච්චානි නම් ගෝත්‍ර බැමිණියට උත්තරදී ආයුෂ්මත් උදායී ස්ථවිර තෙම යම් තැනෙක්හිද, එතැනට ගියේය. ගොස් ආයුෂ්මත් උදායී ස්ථවිරයන්ට මෙය කීයේය.

4. "භවත් උදායි ස්ථවිර තෙමේ සෙට දවසට අපගේ ආචාය්‍ය්‍ය භාය්‍ය්‍යාවවූ වෙරහච්චානි නම් ගෝත්‍රයෙහි බැමිණියගේ බත ඉවසනු මැනව කියායි" ආයුෂ්මත් උදායි ස්ථවිර තෙමේ වනාහි නිශ්ශබ්දවීමෙන් ඉවසූයේය.

5. ඉක්බිති ආයුෂ්මත් උදායී ස්ථවිර තෙමේ ඒ රාත්‍රිය ඇවෑමෙන් පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙණ වෙරහච්චානි නම් ගෝත්‍රයෙහි බැමිණියගේ ගෙදර යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ පණවන ලද ආසනයෙහි වැඩ හුන්නේය.

එකල්හි වෙරහච්චානි නම් ගෝත්‍ර බැමිණිය ආයුෂ්මත් උදායී ස්ථවිරයන්ට ප්‍රණීතවූ කෑ යුතු දෙයින් හා අනුභව කළ යුතු දෙයින් සියතින් වැළඳවීය. ඇතිතාක් වැළඳවිය. ඉක්බිති වෙරහච්චානි නම් ගොත්‍ර බැමිණිතොමෝ වළඳා අවසන්වූ පාත්‍රයෙන් ඉවතට ගත් අත් ඇති ආයුෂ්මත් උදායී ස්ථවිරයන්ට

වහන් පයලා උස්වූ ආසනයෙක්හි හිඳ හිස වසා පොරවාගෙණ මෙය කීයේය. 'ශ්‍රමණය, ධර්මය දේශනා කරවයි" කීය.

"නැගණිය, ඊට කාලය වන්නේයයි කියා හුනස්නෙන් නැගිට වැඩියේය.

**6.** දෙවනුවද ඒ මානවකතෙම ආයුෂ්මත් උදායී ස්ථවිර තෙම යම් තැනෙක්හිද එතැනට ගියේය. ගොස් ආයුෂ්මත් උදායී ස්ථවිරයන් සමග සතුටු වූයේය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාවකොට නිමවා එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ මානවකයාට ආයුෂ්මත් උදායී ස්ථවිර තෙමේ දැහැමිවූ කථාවෙන් කරුණු දැක්වූයේය. සමාදන් කරවූයේය. තෙද ගැන්වූයේය. සිත් සතුටු කෙළේය. දෙවනුවද ඒ මානවකතෙම ආයුෂ්මත් උදායී ස්ථවිරයන් විසින් දැහැමිවූ කථාවෙන් කරුණු දක්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ තෙද ගන්වන ලද්දේ සතුටු කරවන ලද්දේ හුනස්නෙන් නැගිට වෙරහච්චානි නම් ගෝත්‍ර බැමිණි තොමෝ යම් තැනෙක්හිද, එතැනට ගියේය. ගොස් වෙරහච්චානි නම් ගෝත්‍ර ඇති බැමිණියට මෙය කීයේය.

**7.** "පින්වතිය, දන්නේද, උදායී ශ්‍රමණතෙමේ මුල යහපත්වූ මැද යහපත්වූ කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ සියල්ලෙන් සම්පූර්ණවූ ධර්මය දේශනා කරයි පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කෙරේයි" කියායි.

**8.** "මානවකය, මෙපරිද්දෙන්ම නුඹ උදායී ශ්‍රමණයන්ගේ ගුණ කීයෙහිය. උදායී ශ්‍රමණතෙමේ වනාහි 'ශ්‍රමණය, බණ කියවයි, කියන ලද්දේම. නැගණිය, ඊට කාලය වන්නේ යයි' හුනස්නෙන් නැගිට විහාරයට ගියේය.

"පින්වතිය, එසේ යන ආකාරයෙන් නුඹ වහන් පයලා උස් ආසනයෙක හිඳ හිස වසාගෙණ 'ශ්‍රමණය බණ කියවයි' මෙසේ කීය. ඒ පින්වත්හු ධර්මයට ගරු කරන්නාහු ධර්මය කෙරෙහි ගෞරව ඇත්තෝ වෙත්යයි" කීය.

"මානවකය, එසේනම් නුඹ මාගේ වචනයෙන් උදායී ශ්‍රමණයන්ට සෙට දවසට බතින් ආරාධනා කරවයි" කීය.

"පින්වතිය, එසේයයි" කියා ඒ මානවකතෙම වෙරහච්චානි නම් ගෝත්‍ර ඇති බැමිණියට උත්තරදී ආයුෂ්මත් උදායී ස්ථවිරතෙම යම් තැනෙක්හිද, එතැනට ගියේය. ගොස් ආයුෂ්මත් උදායී ස්ථවිරයන්ට මෙය කීයේය. "භවත් උදායි ස්ථවිර තෙමේ සෙට දවසට අපගේ ආචාර්‍ය්‍ය භාර්‍ය්‍යාවවූ වෙරහච්චානි නම් ගෝත්‍ර ඇති බැමිණියගේ බත ඉවසනු මැනවැයි" කීය. ආයුෂ්මත් උදායී ස්ථවිරතෙමේ වනාහි නිශ්ශබ්දවීමෙන් ඉවසූයේය.

**9.** ඉක්බිති ආයුෂ්මත් උදායී ස්ථවිරතෙම ඒ රාත්‍රිය ඇවෑමෙන් පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙණ වෙරහච්චානි නම් ගෝත්‍ර ඇති බැමිණියගේ ගෙදර යම් තැනෙක්හිද, එතැනට ගියේය. ගොස් පණවන ලද ආසනයෙහි වැඩ හුන්නේය. එකල්හි වෙරහච්චානි නම් ගෝත්‍ර ඇති බැමිණි තොමෝ ආයුෂ්මත් උදායී ස්ථවිරයන්ට ප්‍රණීතවූ කෑ යුතු දෙයින් හා බුදිය යුතු දෙයින් සියතින් වැළඳවීය. ඇති පමණ වැළඳවීය. ඉක්බිති වෙරහච්චානි නම් ගෝත්‍ර ඇති බැමිණි තොමෝ වළඳා අවසන්වූ පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති ආයුෂ්මත් උදායී ස්ථවිරයන්ට වහන්වලින් බැස මිටි අස්නෙක්හි හිඳ, හිස විවෘත කොට මෙය කීයේය. "ස්වාමීනි, කුමක් ඇති කල්හි වනාහි රහත්හු සුව දුක් දෙක පණවත්ද, කුමක් නැති කල්හි රහත්හු සුව දුක් දෙක නොපණවත්ද' කියායි.

**10.** "නැගණිය, ඇස ඇතිකල්හි රහත්හු සුව දුක් දෙක පණවත්, ඇස නැති කල්හි රහත්හු සුව දුක් දෙක නොපණවත්. කණ ඇති කල්හි රහත්හු සුව දුක් දෙක පණවත්. කණ නැති කල්හි රහත්හු සුව දුක් දෙක නොපණවත්. නාසය ඇති කල්හි රහත්හු සුව දුක් දෙක පණවත්. නාසය නැති කල්හි රහත්හු සුව දුක් දෙක නොපණවත්. දිව ඇති කල්හි රහත්හු සුව දුක් දෙක පණවත්. දිව නැති කල්හි රහත්හු සුව දුක් දෙක නොපණවත්. කය ඇති කල්හි රහත්හු සුව දුක් දෙක පණවත්. කය නැති කල්හි රහත්හු සුව දුක් දෙක නොපණවත්. සිත ඇතිකල්හි රහත්හු සුව දුක් දෙක පණවත් සිත නැති කල්හි රහත්හු සුව දුක් නොපණවත්යයි" කීය.

11. මෙසේ වදාළ කල්හි වෙරහච්චානි නම් ගෝත්‍ර ඇති බැමිණී තොමෝ ආයුෂ්මත් උදායී ස්ථවිරයන්ට මෙය කීයේය. "ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, ඉතා යහපත ස්වාමීනි යම්සේ යටිකුරුකොට තබන ලද්දක් හෝ උඩුකුරු කරන්නේද, වසන ලද්දක් හෝ වැසුම් හරින්නේද, මංමුළාවූවෙකුට හෝ මග කියන්නේද, අන්ධකාරයෙහි හෝ 'ඇස් ඇත්තෝ රූප දකිත්වායි' තෙල් පහනක් දරන්නේද, මෙපරිද්දෙන්ම ආයුෂ්මත් උදායී ස්ථවිරයන් විසින් අනේකප්‍රකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලදී. ආයුෂ්මත් උදායී ස්ථවිරයන් වහන්ස, මම ඒ භාග්‍යවතුන් වහන්සේ සරණකොට යමි. ධර්මයද, භික්ෂු සංඝයාද, (සරණකොට යමි.) ආයුෂ්මත් උදායී ස්ථවිරයන් වහන්සේ මා අද පටන් දිවිහිම්කොට සරණ ගියාවූ උපාසිකාවක්යයි දරණු මැනවයි" (කීයේය)

(තුන්වෙනි ගෘහපති වර්ගය නිමි)

---

# 4. දෙවදහ වර්ගය.

## 1. දේවදහ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයන්හි දෙවදහනම්වූ ශාක්‍ය රජදරුවන්ගේ නියම්ගමෙක්හි වැඩ වසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක.

2 "මහණෙනි, මම සියලු භික්ෂූන්ටම සවැදෑරුම්වූ ස්පර්ශ ආයතනයන්හි අප්‍රමාදව කටයුතු කළ යුතුයයි නොකියමි. මහණෙනි, මම වනාහි සියලුම භික්ෂූන්ට සවැදෑරුම්වූ ස්පර්ශ ආයතනයන්හි අප්‍රමාදව කටයුතු නොකළ යුතුයයි නොකියමි. මහණෙනි, යම් ඒ භික්ෂූහු රහත්වූවාහු ක්ෂය කළ ආශ්‍රව ඇත්තාහු වැස නිමවන ලද බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තාහු සතර මගින් කරණ ලද කටයුතු ඇත්තාහු බහා තබන ලද ස්කන්ධභාර ඇත්තාහු, පිළිවෙළින් පැමිණියාවූ අර්හත්වය ඇත්තාහු ක්ෂය කළ

භවසංයොජන ඇත්තාහු මනාකොට දැන කෙලෙසුන් කෙරෙන් මිදුනාහු වෙත්ද, මහණෙනි, මම ඒ භික්ෂූන්ට සවැදෑරුම්වූ ස්පර්ශ ආයතනයන්හි අප්‍රමාදව කටයුතු කළ යුතුයයි නොකියමි. ඊට හේතු කවරේද? ඔවුන් විසින් අප්‍රමාදව කටයුතු කරණ ලදී. ඔවුහු ප්‍රමාදවන්ට සුදුස්සෝ නොවෙත්.

3. "මහණෙනි, යම් ඒ භික්ෂූහු වනාහි ශෛක්ෂවූවාහු නොපැමිණි අර්හත්වය ඇත්තාහු නිරුත්තරවූ යොගක්ෂෙමය (නිර්වාණය) ප්‍රාර්ථනා කරමින් වාසය කෙරෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ට මම සවැදෑරුම්වූ ස්පර්ශ ආයතනයන්හි අප්‍රමාදව කටයුතු කළයුතුයයි කියමි. ඊට හේතු කවරේද?

"මහණෙනි, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ මනාපවූද අමනාපවූද රූප ඇත්තාහ. ඔවුහු මොහුගේ සිත ස්පර්ශ කෙරෙමින් හාත්පස මැඩගෙණ නොසිටිත්, සිත හාත්පස නොමැඩගෙන පැවැත්ම හේතුකොටගෙන නොහැකුළුණාවූ, පටන් ගන්නාලද වීර්‍ය්‍යය ඇතිවෙයි. නුමුළාවූ එළඹ සිටි සිහිය ඇතිවෙයි. දාහ රහිතවූ සංසිඳුනාවූ නාම කය වෙයි. සිත එකඟව සමාධියෙන් යුක්තවෙයි. මහණෙනි, මම මේ අප්‍රමාද ඵලය දකිමින් ඒ භික්ෂූන්ට සවැදෑරුම්වූ ස්පර්ශ ආයතනයන්හි අප්‍රමාදව කටයුතු කළ යුතුයයි කියමි.

4. "මහණෙනි, සෝත විඤ්ඤාණයෙන් දතයුතුවූ මනාපවූද, අමනාපවූද ශබ්දයෝ ඇත්තාහ. ඔවුහු මොහුගේ සිත ස්පර්ශ කෙරෙමින් හාත්පස මැඩගෙණ නොසිටිත්. සිත හාත්පස නොමැඩගෙන පැවැත්ම හේතුකොටගෙන නොහැකුළුණාවූ පටන් ගන්නාලද වීර්‍ය්‍යය ඇතිවෙයි නුමුළාවූ එළඹ සිටි සිහිය ඇති වෙයි. දාහ රහිතවූ සංසිඳුනාවූ නාම කය වෙයි. සිත එකඟව සමාධියෙන් යුක්තවෙයි. මහණෙනි, මම මේ අප්‍රමාද ඵලය දකිමින් ඒ භික්ෂූන්ට සවැදෑරුම්වූ ස්පර්ශ ආයතනයන්හි අප්‍රමාදව කටයුතු කළ යුතුයයි කියමි.

5. "මහණෙනි, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ මනාපවූද, අමනාපවූද, ගන්ධයෝ ඇත්තාහ. ඔවුහු මොහුගේ සිත ස්පර්ශ කෙරෙමින් හාත්පස මැඩගෙණ නොසිටිත්. සිත හාත්පස

නොමැඩගෙන පැවැත්ම හේතුකොටගෙන නොහැකුළුණාවූ පටන් ගන්නාලද වීය්‍යීය ඇතිවෙයි. නුමුළාවූ එළඹ සිටි සිහිය ඇතිවෙයි. දාහ රහිතවූ සංසිඳුනාවූ නාම කය වෙයි. සිත එකඟව සමාධියෙන් යුක්තවෙයි. මහණෙනි, මම මේ අප්‍රමාද ඵලය දකිමින් ඒ භික්ෂූන්ට සවැදෑරුම්වූ ස්පර්ශ ආයතනයන්හි අප්‍රමාදව කටයුතු කළ යුතුයයි කියමි.

6. "මහණෙනි, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ මනාපවූද, අමනාපවූද රසයෝ ඇත්තාහ. ඔවුහු මොහුගේ සිත ස්පර්ශ කෙරෙමින් හාත්පස මැඩගෙණ නොසිටිත්. සිත හාත්පස නොමැඩගෙන පැවැත්ම හේතුකොටගෙන නොහැකුළුණාවූ පටන්ගන්නා ලද වීය්‍යීය ඇතිවෙයි. නුමුළාවූ එළඹ සිටි සිහිය ඇතිවෙයි. දාහ රහිතවූ සංසිඳුනාවූ නාම කය වෙයි. සිත එකඟව සමාධියෙන් යුක්තවෙයි. මහණෙනි, මම මේ අප්‍රමාද ඵලය දකිමින් ඒ භික්ෂූන්ට සවැදෑරුම්වූ ස්පර්ශ ආයතනයන්හි අප්‍රමාදව කටයුතු කළ යුතුයයි කියමි.

7. "මහණෙනි, කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ, මනාපවූද, අමනාපවූද ස්පර්ශයෝ ඇත්තාහ. ඔවුහු මොහුගේ සිත ස්පර්ශ කෙරෙමින් හාත්පස මැඩගෙණ නොසිටිත්, සිත හාත්පස නොමැඩගෙන පැවැත්ම හේතුකොටගෙන නොහැකුළුණාවූ පටන්ගන්නාලද වීය්‍යීය ඇතිවෙයි. නුමුළාවූ එළඹ සිටි සිහිය ඇති වෙයි. දාහ රහිතවූ සංසිඳුනාවූ නාම කය වෙයි. සිත එකඟව සමාධියෙන් යුක්තවෙයි. මහණෙනි, මම මේ අප්‍රමාද ඵලය දකිමින් ඒ භික්ෂූන්ට සවැදෑරුම්වූ ස්පර්ශ ආයතනයන්හි අප්‍රමාදව කටයුතු කළ යුතුයයි කියමි.

8. "මහණෙනි, මනෝ විඤ්ඤාණයෙන් දතයුතුවූ මනාපවූද අමනාපවූද ධර්මයෝ ඇත්තාහ. ඔවුහු මොහුගේ සිත ස්පර්ශ කෙරෙමින් හාත්පස මැඩගෙන නොසිටිත්. සිත මැඩ නොගැණීමෙන් නොහැකුළුණු පටන් ගන්නාලද වීය්‍යීය ඇතිවෙයි. නුමුළාවූ එළඹසිටි සිහිය ඇතිවෙයි. දාහ රහිතවූ සංසිඳුණාවූ කය වෙයි. සිත එකඟවූ සමාධිය වෙයි. මහණෙනි, මම මේ අප්‍රමාදයෙහි ඵලය දකිමින් ඒ භික්ෂූන්ට සවැදෑරුම්වූ

ස්පර්ශ ආයතනයන්හි අප්‍රමාදව කටයුතු කළ යුතුයයි කියමියි" වදාළේය.

---

## 2. ක්ෂණ සූත්‍රය.

1. (මේ සූත්‍රයද ලෝක කාමගුණ වර්ගයේ පළමු සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, නුඹලාට ලාභයෙකි. මහණෙනි, තොප විසින් ලැබූ යහපත් ලාභයකි. තොප විසින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි විසීමට සුදුසුවූ ක්ෂණය (මනුෂ්‍යාත්මභාවය) ලබන ලද්දේය. මහණෙනි, මා විසින් *ඡඵස්සායතනික නම්වූ, නිරයෝ දක්නා ලදහ.

3 එහි ඇසින් යම්කිසි රූපයක් දකීනම් අනිෂ්ටවූ (නොකැමැතිවූ) ස්වභාවය ඇතියක්ම දකියි. ඉෂ්ටවූ ස්වභාවය ඇතියක් නොදකියි. නොකැමැතිවූ ස්වභාවය ඇතියක්ම දකියි. කැමැති ස්වභාවය ඇතියක් නොදකියි. අමනාපවූ ස්වභාවය ඇතියක්ම දකියි. මනාපවූ ස්වභාවය ඇතියක් නොදකියි.

එහි කණින් යම්කිසි ශබ්දයක් අසයි නම් අනිෂ්ටවූ (නොකැමැතිවූ) ස්වභාවය ඇතියක්ම අසයි. ඉෂ්ටවූ ස්වභාවය ඇතියක් නොඅසයි. නොකැමැතිවූ ස්වභාවය ඇතියක්ම අසයි. කැමැති ස්වභාවය ඇතියක් නොඅසයි. අමනාපවූ ස්වභාවය ඇතියක්ම අසයි. මනාපවූ ස්වභාවය ඇතියක් නොඅසයි.

"එහි නාසයෙන් යම්කිසි ගන්ධයක් ආඝ්‍රාණය කරයි නම් අනිෂ්ටවූ (නොකැමැතිවූ) ස්වභාවය ඇතියක්ම ආඝ්‍රාණය කරයි. ඉෂ්ටවූ ස්වභාවය ඇතියක් නොකරයි. නොකැමැතිවූ ස්වභාවය ඇතියක්ම කරයි කැමැති ස්වභාවය ඇතියක් නොකරයි. අමනාපවූ ස්වභාවය ඇතියක්ම කරයි. මනාපවූ ස්වභාවය ඇතියක් නොකරයි

---

* මෙයින් අවීචි නිරය අදහස් කරන ලද බව අටුවාවෙහි කියනලදී.

"එහි දිවෙන් යම්කිසි රසයක් විඳීනම් අනිෂ්ටවූ (නොකැමැතිවූ) ස්වභාවය ඇතියක්ම විඳියි. ඉෂ්ටවූ ස්වභාවය ඇතියක් නොවිඳියි. නොකැමැතිවූ ස්වභාවය ඇතියක්ම විඳියි. කැමැති ස්වභාවය ඇතියක් නොවිඳියි. අමනාපවූ ස්වභාවය ඇතියක්ම විඳියි. මනාපවූ ස්වභාවය ඇතියක් නොවිඳියි.

'එහි කයෙන් යම්කිසි ස්පර්ශයක් කරයි නම් අනිෂ්ටවූ (නොකැමැතිවූ) ස්වභාවය ඇතියක්ම කරයි. ඉෂ්ටවූ ස්වභාවය ඇතියක් නොකරයි. නොකැමැතිවූ ස්වභාවය ඇතියක්ම කරයි. කැමැති ස්වභාවය ඇතියක් නොකරයි අමනාපවූ ස්වභාවය ඇතියක්ම කරයි. මනාපවූ ස්වභාවය ඇතියක් නොකරයි.

"සිතින් යම්කිසි ධර්මයක් දැනගණීද, අනිෂ්ටවූ ස්වභාවය ඇතියක්ම දැනගණියි. ඉෂ්ටවූ ස්වභාවය ඇතියක් නොදැනගණියි. අකැමැතිවූ ස්වභාවය ඇතියක්ම දැනගණියි. කැමැතිවූ ස්වභාවය ඇතියක් දැන නොගණියි. අමනාපවූ ස්වභාවය ඇතියක්ම දැනගණියි. මනාපවූ ස්වභාවය ඇතියක් දැන නොගණියි.

"මහණෙනි, තොපට ලාභයෙකි. මහණෙනි, තොප විසින් ලැබූ යහපත් ලාභයකි. බ්‍රහ්මචයර්‍ය වාසයට සුදුසු කාලය තොප විසින් ලබන ලදී මහණෙනි, මා විසින් *ඡඵස්සායතනික නම්වූ ස්වර්ගයෝ දක්නා ලද්දාහ

5. "එහි ඇසින් යම්කිසි රූපයක් දකීද, ඉෂ්ටවූ ස්වභාවය ඇතියක්ම දකියි. අනිෂ්ටවූ ස්වභාවය ඇතියක් නොදකියි කැමැතිවූ ස්වභාවය ඇතියක් දකියි. නොකැමැති ස්වභාවය ඇතියක් නොදකියි. මනාපවූ ස්වභාවය ඇතියක්ම දකියි. අමනාපවූ ස්වභාව ඇතියක් නොදකියි.

"එහි කණින් යම්කිසි ශබ්දයක් අසාද, ඉෂ්ටවූ ස්වභාවය ඇතියක්ම අසයි. අනිෂ්ටවූ ස්වභාවය ඇතියක් නොඅසයි.

* මෙයින් තව්තිසා දෙව්ලොව අදහස් කරන ලද බව අටුවාවෙහි කියන ලදී.

කැමැතිවූ ස්වභාවය ඇතියක්ම අසයි. නොකැමැතිවූ ස්වභාවය ඇතියක් නොඅසයි. මනාපවූ ස්වභාවය ඇතියක්ම අසයි. අමනාපවූ ස්වභාව ඇතියක් නොඅසයි.

"එහි නාසයෙන් යම්කිසි ගන්ධයක් ආඝ්‍රාණය කරයිද, ඉෂ්ටවූ ස්වභාවය ඇතියක්ම කරයි. අනිෂ්ටවූ ස්වභාවය ඇතියක් නොකරයි. කැමැතිවූ ස්වභාවය ඇතියක්ම කරයි නොකැමැතිවූ ස්වභාවය ඇතියක් නොකරයි. මනාපවූ ස්වභාවය ඇතියක්ම කරයි. අමනාපවූ ස්වභාවය ඇතියක් නොකරයි.

"එහි දිවෙන් යම්කිසි රසයක් විඳීද, ඉෂ්ටවූ ස්වභාවය ඇතියක්ම විඳියි. අනිෂ්ටවූ ස්වභාවය ඇතියක් නොවිඳියි. කැමැතිවූ ස්වභාවය ඇතියක්ම විඳියි, නොකැමැතිවූ ස්වභාවය ඇතියක් නොවිඳියි. මනාපවූ ස්වභාවය ඇතියක්ම විඳියි. අමනාපවූ ස්වභාව ඇතියක් නොවිඳියි.

"එහි කයෙන් යම්කිසි ස්පර්ශයක් කරයිද, ඉෂ්ටවූ ස්වභාවය ඇතියක්ම කරයි. අනිෂ්ටවූ ස්වභාවය ඇතියක්ම නොකරයි. කැමැතිවූ ස්වභාවය ඇතියක්ම කරයි. නොකැමැති ස්වභාවය ඇතියක්ම නොකරයි. මනාපවූ ස්වභාවය ඇතියක්ම කරයි. අමනාපවූ ස්වභාව ඇතියක්ම නොකරයි.

"සිතින් යම්කිසි ධර්මයක් දැනගණියිද, ඉෂ්ටවූ ස්වභාවය ඇතියක්ම දැනගණියි අනිෂ්ටවූ ස්වභාවය ඇතියක්ම දැනනොගණියි. කැමැතිවූ ස්වභාවය ඇතියක්ම දැනගණියි. නොකැමැතිවූ ස්වභාවය ඇතියක්ම දැන නොගණියි මනාපවූ ස්වභාවය ඇතියක්ම දැනගණියි. අමනාපවූ ස්වභාව ඇතියක් දැන නොගණියි.

"මහණෙනි, තොපට ලාභයෙකි. මහණෙනි, තොප විසින් ලැබූ යහපත් ලාභයකි. තොප විසින් බ්‍රහ්මචර්‍ය්‍යා වාසයට සුදුසු කාලය (මේ මනුෂ්‍යාත්මභාවය) ලබන ලද්දේයයි" වදාළේය.

---

## 3. සගය්හ ගය්හ සූත්‍රය. (1)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, දෙව්මිනිසුන් රූපයන්හි බැඳුනෝ රූපයෙහි ඇළුනෝ රූපයෙහි සතුටුවන්නෝ වෙත්. මහණෙනි, දෙව්මිනිසුන් රූපයන්ගේ වෙනස්වීම වෙන්වීම නිරුද්ධවීම යන මෙයින් දුක්වූවාහු වාසය කෙරෙත්.

"මහණෙනි, දෙව්මිනිසුන් ශබ්දයන්හි බැඳුනෝ ශබ්දයෙහි ඇළුනෝ ශබ්දයෙහි සතුටුවන්නෝ වෙත්. මහණෙනි දෙව්මිනිසුන් ශබ්දයන්ගේ වෙනස්වීම වෙන්වීම නිරුද්ධවීම යන මෙයින් දුක්වූවාහු වාසය කෙරෙත්.

"මහණෙනි, දෙව්මිනිසුන් ගන්ධයන්හි බැඳුනෝ ගන්ධයෙහි ඇළුනෝ ගන්ධයෙහි සතුටුවන්නෝ වෙත්. මහණෙනි, දෙව්මිනිසුන් ගන්ධයන්ගේ වෙනස්වීම වෙන්වීම නිරුද්ධවීම යන මෙයින් දුක්වූවාහු වාසය කෙරෙත්.

"මහණෙනි, දෙව්මිනිසුන් රසයන්හි බැඳුනෝ රසයෙහි ඇළුනෝ රසයෙහි සතුටුවන්නෝ වෙත්. මහණෙනි, දෙව්මිනිසුන් රසයන්ගේ වෙනස්වීම වෙන්වීම නිරුද්ධවීම යන මෙයින් දුක්වූවාහු වාසය කෙරෙත්.

"මහණෙනි, දෙව් මිනිසුන් ස්පර්ශයන්හි බැඳුනෝ ස්පර්ශයෙහි ඇලුනෝ ස්පර්ශයෙහි සතුටුවන්නෝ වෙත්. මහණෙනි දෙව්මිනිසුන් ස්පර්ශයන්ගේ වෙනස්වීම වෙන්වීම නිරුද්ධවීම යන මෙයින් දුක්වූවාහු වාසය කෙරෙත්.

"මහණෙනි, දෙව්මිනිසුන් ධර්මයන්හි බැඳුනෝ ධර්මයන්හි ඇළුනෝ ධර්මයන්හි සතුටුවූවෝ වෙත්. මහණෙනි දෙව්මිනිසුන් ධර්මයන්ගේ වෙනස්වීම, වෙන්වීම නිරුද්ධවීම හෙතුකොටගෙන දුක්වූවාහු වාසය කෙරෙත්.

3. "මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේ වනාහි රූපයන්ගේ හටගැණීමද විනාශයද ආශ්වාදයද ආදීනවයද

නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැන රූපයෙහි නොබැඳී රූපයෙහි නොඇලී රූපයෙහි නොසතුටුව වාසය කරයි. මහණෙනි, තථාගත තෙම රූපයන්ගේ වෙනස්වීම වෙන්වීම නිරුද්ධවීම හෙතුකොටගෙන සුවසේ වාසය කරයි.

"මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේ වනාහි ශබ්දයන්ගේ හටගැනීමද විනාශයද ආශ්වාදයද ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැන ශබ්දයෙහි නොබැඳී ශබ්දයෙහි නොඇලී ශබ්දයෙහි නොසතුටුව වාසය කරයි. මහණෙනි, තථාගත තෙම ශබ්දයන්ගේ වෙනස්වීම වෙන්වීම නිරුද්ධවීම හෙතුකොටගෙන සුවසේ වාසය කරයි.

"මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේ වනාහි ගන්ධයන්ගේ හටගැණීමද විනාශයද ආශ්වාදයද ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැන ගන්ධයෙහි නොබැඳී ගන්ධයෙහි නොඇලී ගන්ධයෙහි නොසතුටුව වාසය කරයි. මහණෙනි, තථාගත තෙම ගන්ධයන්ගේ වෙනස්වීම වෙන්වීම නිරුද්ධවීම හෙතුකොටගෙන සුවසේ වාසය කරයි.

"මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේ වනාහි රසයන්ගේ හටගැණීමද විනාශයද ආශ්වාදයද ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැන රසයෙහි නොබැඳී රසයෙහි නොඇලී රසයෙහි නොසතුටුව වාසය කරයි. මහණෙනි, තථාගත තෙම රසයන්ගේ වෙනස්වීම වෙන්වීම නිරුද්ධවීම හෙතුකොටගෙන සුවසේ වාසය කරයි.

"මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේ වනාහි සර්පර්ශයන්ගේ හටගැණීමද විනාශයද ආශ්වාදයද ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැන ස්පර්ශයෙහි නොබැඳී ස්පර්ශයෙහි නොඇලී ස්පර්ශයෙහි නොසතුටුව වාසය කරයි මහණෙනි, තථාගත තෙම ස්පර්ශයන්ගේ වෙනස්වීම වෙන්වීම නිරුද්ධවීම හෙතුකොටගෙන සුවසේ වාසය කරයි.

'ධර්මයන්ගේ හටගැණීමද විනාශයද ආශ්වාදයද ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැන ධර්මයෙහි නොබැඳී ධර්මයෙහි නොඇලී ධර්මයෙහි නොසතුටුව වාසය කරයි.

මහණෙනි, තථාගත තෙම ධර්මයන්ගේ වෙනස්වීම, වෙන්වීම නිරුද්ධවීම හේතුකොටගෙන සුවසේ වාසය කෙරේයයි" (වදාළේය.)

4. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. ශාස්තෘවූ සුගතයන් වහන්සේ මෙය වදාරා නැවත මත්තේහි මේ ගාථා වදාළසේක.

(1) ඉෂ්ටවූද කාන්තවූද මනාපවූද සියලු රූපයෝද ශබ්දයෝද රසයෝද ගන්ධයෝද ස්පර්ශයෝද ධර්මයෝද යම්තාක් ඇතැයි කියනු ලැබේද,

(2) මොව්හු දෙවියන් සහිත ලොකයා විසින් සැප යයි සම්මත කරණ ලදහ. මොව්හු යම්තැනෙක්හි නිරුද්ධවෙත්ද, එය ඔවුන්ගේ දුකයයි සම්මතය.

(3) මෙයයි ගැනීමෙන් වැළැක්ම සැපයයි ආර්‍ය්‍යයන් විසින් දක්නා ලදී. මෙසේ දක්නාවූ නුවණැතියන්ගේ දැකීමට මුළු ලොකය විරුද්ධය.

(4) අන්‍යයෝ යමක් සැපයයි කියත්ද, ආර්‍ය්‍යයෝ එය දුකයයි කියත්. අන්‍යයෝ යමක් දුකයයි කියත්ද ආර්‍ය්‍යයෝ එය සැපයයි දනිත්.

(5) දැනගැණීමට දුෂ්කරවූ ධර්මය බලව. මේ නිවනෙහි අඥානයෝ මුලාවූවාහු වෙත්. කෙලෙසුන්ගෙන් ගැවසීගත්තවුන්ගේ මොහ නමැති අන්ධකාරය වේ නිර්වාණය නොදක්නාවූ බාලයන්ගේ මොහාන්ධකාරය වේ.

(6) නුවණින් දක්නාවූ සත්පුරුෂයන්ටද ආලොකයක් මෙන් නිවන විතෘත වේ. සමීපයෙහිවූද මෙය මග නොමග දෙක්හි අදක්ෂවූවෝ නොදනිත්.

(7) භවරාගයෙන් ඇලුනාවූ භවශ්‍රොතය අනුව ගමන් කරන්නාවූ මරුවාගේ වසඟයට යටත්වූවන් විසින් මේ ධර්මය මනාව අවබොධ කළහැක්කේ නොවෙයි.

(8) යම් නිවණක් අර්හත් මාර්ගඥානයෙන් මනාකොට දැන ආශ්‍රව රහිතවූවාහු පිරිනිවෙත්ද, මේ නිර්වාණ පදය

ආයුෂ්මතුන් හැර කවරෙක් නම් අවබොධ කිරීමට සුදුසුවේදැයි වදාළේය.

---

## 3. සගය්හ ගය්හ සූත්‍රය. (2)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

(3-1 සගය්හ සූත්‍රයේ 2, 3 ඡේද ගැනීමෙන් මේ සූත්‍රය සම්පූර්ණවේ.)

---

## 4. පලාස සූත්‍රය. (1)

(මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. මහණෙනි, යමක් තොපගේ නොවේද?, එය දුරුකරව්. එය දුරුකිරීම තොපට හිතපිණිස සැප පිණිස වන්නේය. "මහණෙනි, කුමක් නම් තොපගේ නොවේද,"-"මහණෙනි, ඇස තොපගේ නොවෙයි. එය දුරුකරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය"

"මහණෙනි, කණ තොපගේ නොවෙයි. එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය."

"මහණෙනි, නාසය තොපගේ නොවෙයි. එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය."

"මහණෙනි, දිව තොපගේ නොවෙයි. එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය."

"මහණෙනි, කය තොපගේ නොවෙයි එය දුරුකරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය."

"මහණෙනි, සිත තොපගේ නොවෙයි. එය දුරු කරව් එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, යම්සේ මේ ජේතවනාරාමයෙහි යම් තණ ලීදඬු අතු කොල වේද, එය ජනතෙම හැර ගෙනයන්නේ හෝ වේද, දවන්නේ හෝ වේද, කැමති පරිද්දක් හෝ කරන්නේද, කිම, තොපට මෙබඳු අදහසක් වන්නේද, 'ජනතෙමේ අප ගෙණයයි හෝ දවයි හෝ කැමති පරිද්දක් කෙරේයයි' කියායි" "ස්වාමීනි, එය නොවේමැයි"

"ඊට හෙතු කවරේද?" ස්වාමීනි, මෙය වනාහි අපගේ හෝ තමා හෝ තමා පිළිබඳ වූවක් හෝ නොවෙයි."

4. "මහණෙනි, එපරිද්දෙන්ම ඇස තොපගේ නොවෙයි. එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය.

කණ තොපගේ නොවෙයි. එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය.

නාසය තොපගේ නොවෙයි. එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය.

දිව තොපගේ නොවෙයි. එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය.

කය තොපගේ නොවෙයි එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේය.

සිත තොපගේ නොවෙයි. එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිත පිණිස සැප පිණිස වන්නේයයි" වදාළේය.

---

## 5 පලාස සූත්‍රය. (2)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, යමක් තොපගේ නොවේද, එය දුරු කරව්. එය දුරුකිරීම තොපට හිතපිණිස සැප පිණිස වන්නේය. මහණෙනි, කුමක්නම් තොපගේ නොවේද,

3. "මහණෙනි, රූපයෝ තොපගේ නොවෙත්. ඔවුන් දුරු කරව්. දුරුකළාවූ ඔවුහු තොපට හිත පිණිස සැප පිණිස වන්නාහුය.

"මහණෙනි, ශබ්දයෝ තොපගේ නොවෙත්. ඔවුන් දුරු කරව්. දුරුකළාවූ ඔවුහු තොපට හිත පිණිස සැප පිණිස වන්නාහුය.

"මහණෙනි, ගන්ධයෝ තොපගේ නොවෙත්. ඔවුන් දුරු කරව්. දුරුකළාවූ ඔවුහු තොපට හිත පිණිස සැප පිණිස වන්නාහුය.

"මහණෙනි, රසයෝ තොපගේ නොවෙත්. ඔවුන් දුරු කරව්. දුරුකළාවූ ඔවුහු තොපට හිත පිණිස සැප පිණිස වන්නාහුය.

"මහණෙනි, ස්පර්ශයෝ තොපගේ නොවෙත්. ඔවුන් දුරු කරව්. දුරුකළාවූ ඔවුහු තොපට හිත පිණිස සැප පිණිස වන්නාහුය.

"ධර්මයෝ තොපගේ නොවෙත්. ඔවුන් දුරුකරව්. දුරුකළාවූ ඔවුහු තොපට හිත පිණිස සැප පිණිස වන්නාහුය.

4. (මෙතැනට මෙහි මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය යොදාගත යුතුයි.)

5. ("මහණෙනි, ඒ පරිද්දෙන්ම, මෙහි මේ සූත්‍රයේ 3 වෙනි ඡෙදය යොදාගත යුතුයි.)

---

## 6. හේතු සූත්‍රය. (1)

1. ("මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, ඇස අනිත්‍යය. ඇස ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, එයද අනතිය්‍යය. මහණෙනි අනිත්‍ය හේතුයෙන් හටගත්තාවූ ඇස කොයින් නිත්‍ය වන්නේද?

"මහණෙනි, කණ අනිත්‍යය. කණ ඉපදීමට යමක් හේතුවේද යමක් ප්‍රත්‍ය වේද, එයද අනිත්‍යය. මහණෙනි, අනිත්‍ය හේතුයෙන් හටගත්තාවූ කණ කොයින් නිත්‍ය වන්නේද?

"මහණෙනි, නාසය අනිත්‍යය. නාසය ඉපදීමට යමක් හේතුවේද යමක් ප්‍රත්‍ය වේද, එයද අනිත්‍යය. මහණෙනි, අනිත්‍ය හේතුයෙන් හටගත්තාවූ නාසය කොයින් නිත්‍ය වන්නේද?

"මහණෙනි, දිව අනිත්‍යය. දිව ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, එයද අනිත්‍යය. මහණෙනි, අනිත්‍ය හේතුයෙන් හටගත්තාවූ දිව කොයින් නිත්‍ය වන්නේද?

"මහණෙනි, කය අනිත්‍යය. කය ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍ය වේද, එයද අනිත්‍යය මහණෙනි, අනිත්‍ය හේතුයෙන් හටගත්තාවූ කණ කොයින් නිත්‍ය වන්නේද?

"මහණෙනි, සිත අනිත්‍යය. සිත ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, එයද අනිත්‍යය. මහණෙනි, අනිත්‍ය හේතුයෙන් හටගත්තාවූ සිත කොයින් නිත්‍ය වන්නේද?

3. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම ඇස කෙරෙහිද කලකිරෙයි. කණ කෙරෙහිද, නාසය කෙරෙහිද, දිව කෙරෙහිද, කය කෙරෙහිද, සිත කෙරෙහිද, කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි.

මෙයින් අන්‍යවූ ආත්මභාවයක් නැතැයි. දැනගණීයයි" වදාළේය.

---

## 7. හේතු සූත්‍රය. (2)

(මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් වේළුවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, ඇස දුක්වේ. ඇස ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, හෙද දුක්වේ. මහණෙනි, දුක්වූ හේතුවෙන් හටගත්තාවූ ඇස කොයින් සැප වන්නේද?

කණ දුක්වේ. කණ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, හෙද දුක්වේ. මහණෙනි, දුක්වූ හේතුවෙන් හටගත්තාවූ කණ කොයින් සැප වන්නේද?

නාසය දුක්වේ. නාසය ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, හෙද දුක්වේ. මහණෙනි, දුක්වූ හේතුවෙන් හටගත්තාවූ නාසය කොයින් සැප වන්නේද?

දිව දුක්වේ. දිව ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, හෙද දුක්වේ. මහණෙනි, දුක්වූ හේතුවෙන් හටගත්තාවූ දිව කොයින් සැප වන්නේද?

"කය දුක්වේ කය ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද හෙද දුක්වේ. දුක්වූ හේතුවෙන් හටගත්තාවූ කය කොයින් සැප වන්නේද?

"සිත දුක්වේ. සිත ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, හෙද දුක්වේ. මහණෙනි, දුක්වූ හේතුවෙන් හටගත්තාවූ සිත කොයින් සැප වන්නේද?

3. (මෙහි මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙහි යොදාගත යුතුයි)

---

## 8. (අද්ධ්‍යාත්මික) හේතු සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, ඇස අනාත්මය. ඇස ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍ය වේද, හෙද අනාත්මය. මහණෙනි, අනාත්ම හේතුයෙන් හටගත් ඇස කොයින් ආත්ම වන්නේද?

"කණ අනාත්මය. කණ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, හෙද අනාත්මය. මහණෙනි, අනාත්ම හේතුයෙන් හටගත් කණ කොයින් ආත්ම වන්නේද?

"නාසය අනාත්මය. නාසය ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, හෙද අනාත්මය. මහණෙනි, අනාත්ම හේතුයෙන් හටගත් නාසය කොයින් ආත්ම වන්නේද?

"දිව අනාත්මය. දිව ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, හෙද අනාත්මය මහණෙනි, අනාත්ම හේතුයෙන් හටගත් දිව කොයින් ආත්ම වන්නේද?

"කය අනාත්මය. කය ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, හෙද අනාත්මය. මහණෙනි, අනාත්ම හේතුයෙන් හටගත් කය කොයින් ආත්ම වන්නේද?

"සිත අනාත්ම වේ. සිත ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, හෙද අනාත්මය. මහණෙනි, අනාත්ම හෙතුයෙන් හටගත්තාවූ සිත කොයින් ආත්ම වන්නේද?

3. (මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙහි යොදාගත යුතුයි.)

---

## 9. (බාහිර) හේතු සූත්‍රය. (1)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, රූපයෝ අනිත්‍යයහ. රූපයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, එයද අනිත්‍යය මහණෙනි, අනිත්‍ය හේතුවෙන් හටගත්තාවූ රූපයෝ කොයින් නිත්‍ය වන්නාහුද?

"ශබ්දයෝ අනිත්‍යයහ. ශබ්දයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, එයද අනිත්‍යය. මහණෙනි, අනිත්‍ය හේතුවෙන් හටගත්තාවූ ශබ්දයෝ කොයින් නිත්‍ය වන්නාහුද?

"ගන්ධයෝ අනිත්‍යයහ. ගන්ධයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, එයද අනිත්‍යය. මහණෙනි, අනිත්‍ය හේතුවෙන් හටගත්තාවූ ගන්ධයෝ කොයින් නිත්‍ය වන්නාහුද?

"රසයෝ අනිත්‍යයහ. රසයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, එයද අනිත්‍යය. මහණෙනි, අනිත්‍ය හේතුවෙන් හටගත්තාවූ රසයෝ කොයින් නිත්‍යවන්නාහුද?

"ස්පර්ශයෝ අනිත්‍යයහ ස්පර්ශයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, එයද අනිත්‍යය මහණෙනි, අනිත්‍ය හේතුවෙන් හටගත්තාවූ ස්පර්ශයෝ කොයින් නිත්‍ය වන්නාහුද?

"ධර්මයෝ අනිත්‍යයහ. ධර්මයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, එයද අනිත්‍යය. මහණෙනි, අනිත්‍ය හේතුවෙන් හටගත්තාවූ ධර්මයෝ කොයින් නිත්‍යවන්නාහුද?

3. (මෙ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙහි යොදාගත යුතුයි.)

---

## 10. (බාහිර) හේතු සූත්‍රය. (2)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, රූපයෝ දුක්වෙත්. රූපයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, හෙද දුක්වේ. මහණෙනි, දුක්වූ හෙතුවෙන් හටගත්තාවූ රූපයෝ කොයින් සැප වන්නාහුද?

"ශබ්දයෝ දුක්වෙත්. ශබ්දයන්ගේ ඉපදීමට යමක් හේතු වේද, යමක් ප්‍රත්‍යයවේද, හෙද දුක්වේ. මහණෙනි, දුක්වූ හේතුවෙන් හටගත්තාවූ ශබ්දයෝ කොයින් සැප වන්නාහුද?

"ගන්ධයෝ දුක්වෙත්. ගන්ධයන්ගේ ඉපදීමට යමක් හේතු වේද, යමක් ප්‍රත්‍යයවේද, හෙද දුක්වේ. මහණෙනි, දුක්වූ හේතුවෙන් හටගත්තාවූ ගන්ධයෝ කොයින් සැප වන්නාහුද?

"රසයෝ දුක් වෙත්. රසයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, හෙද දුක්වේ. මහණෙනි, දුක්වූ හේතුවෙන් හටගත්තාවූ රසයෝ කොයින් සැප වන්නාහුද?

"ස්පර්ශයෝ දුක් වෙත්. ස්පර්ශයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, හෙද දුක්වේ. මහණෙනි, දුක්වූ හේතුවෙන් හටගත්තාවූ ස්පර්ශයෝ කොයින් සැප වන්නාහුද?

"ධර්මයෝ දුක් වෙත්. ධර්මයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, හෙද දුක්වේ. මහණෙනි, දුක්වූ හේතුවෙන් හටගත්තාවූ ධර්මයෝ කොයින් සැප වන්නාහුද?

3. (මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙහි යොදාගත යුතුයි.)

---

## 11. (බාහිර) හේතු සූත්‍රය. (3)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, රූපයෝ අනාත්ම වෙත්. රූපයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, හෙද අනාත්ම වේ. මහණෙනි, අනාත්ම හේතුවෙන් හටගත්තාවූ රූපයෝ කොයින් ආත්ම වන්නාහුද?

"ශබ්යෝ අනාත්ම වෙත්. ශබ්දයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, හෙද අනාත්ම වේ. මහණෙනි, අනාත්ම හේතුවෙන් හටගත්තාවූ ශබ්දයෝ කොයින් ආත්ම වන්නාහුද?

"ගන්ධයෝ අනාත්ම වෙත්. ගන්ධයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, හෙද අනාත්මවේ. මහණෙනි, අනාත්ම හේතුවෙන් හටගත්තාවූ ගන්ධයෝ කොයින් ආත්ම වන්නාහුද?

"රසයෝ අනාත්ම වෙත්. රසයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යයවේද, හෙද අනාත්මවේ. මහණෙනි, අනාත්ම හේතුවෙන් හටගත්තාවූ රසයෝ කොයින් ආත්ම වන්නාහුද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ස්පර්ශයෝ අනාත්ම වෙත්. ස්පර්ශයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, හෙද අනාත්මවේ. මහණෙනි, අනාත්ම හේතුවෙන් හටගත්තාවූ ස්පර්ශයෝ කොයින් ආත්ම වන්නාහුද?

"ධර්මයෝ අනාත්ම වෙත්. ධර්මයන්ගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, හෙද අනාත්මවේ. මහණෙනි, අනාත්ම හේතුවෙන් හටගත්තාවූ ධර්මයෝ කොයින් ආත්ම වන්නාහුද?"

3. මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙහි යොදා ගත යුතුයි.

**(හතරවෙනි දෙවදහ වර්ගය නිමි.)**

---

## 5 නවපුරාණ වර්ගය.

### 1. කම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2 "මහණෙනි, අළුත්වූද, පැරණිවූද කර්මයන්ද කර්මයන්ගේ නිරෝධයද කර්මයන් නිරුද්ධ කිරීම පිණිස පිළිපදින්නාවූ මාර්ගයද දෙශනා කරමි. එය අසව්. මහණෙනි, පුරාණවූ කර්මය කවරේද?

3. 'මහණෙනි, ඇස* පුරාණ කර්මයයි ප්‍රත්‍යයන් විසින් එක්ව කරන ලදැයිද චෙතනාවෙන් පිළියෙල කරන ලදැයිද වේදනාවට වස්තුයයිද දැකිය යුතුයි.

---

* ඇස පුරාණ කර්මය නිසා හටගත් බැවින් ඵලයෙන් හේතුව දක්වා වදාළ තැනකි

"කණ පුරාණ කර්මයයි. ප්‍රත්‍යයන් විසින් එක්ව කරන ලදැයිද, චේතනාවෙන් පිළියෙල කරන ලදැයිද, වේදනාවට වස්තුයයිද දැකිය යුතුය.

"නාසය පුරාණ කර්මයයි. ප්‍රත්‍යයන් විසින් එක්ව කරන ලදැයිද, චේතනාවෙන් පිළියෙල කරන ලදැයිද, වේදනාවට වස්තුයයිද දැකිය යුතුය.

"දිව පුරාණ කර්මයයිද, ප්‍රත්‍යයන් විසින් එක්ව කරන ලදැයිද චේතනාව විසින් පිළියෙල කරන ලදැයිද වේදනාවට වස්තුයයිද දැකිය යුතුය.

"කය පුරාණ කර්මයයිද ප්‍රත්‍යයන් විසින් එක්ව කරන ලදැයිද චේතනාව විසින් පිළියෙල කරන ලදැයිද වෙදනාවට වස්තුයයිද දැකිය යුතුය.

"සිත පුරාණ කර්මයයිද, ප්‍රත්‍යයන් විසින් එක්ව කරන ලදැයිද චේතනාව විසින් පිළියෙල කරන ලදැයිද වෙදනාවට වස්තුයයිද දැකිය යුතුය. "මහණෙනි, මෙය පුරාණ කර්මයයි කියනු ලැබේ.

4. "මහණෙනි, අළුත්වූ කර්මය නම් කවරේද? මහණෙනි, මේ කාලයෙහි කයින් වචනයෙන් සිතින් යම් කර්මයක් කෙරේද, මහණෙනි, මෙය අළුත්වූ කර්මයයි කියනු ලැබේ.

5. "මහණෙනි, කර්ම නිරෝධය කවරේද? මහණෙනි, යමෙක් වනාහි කාය කර්මය, වාග් කර්මය, මනො කර්මය නිරුද්ධ කිරීමෙන් විමුක්තිය (නිවන) ස්පර්ශ කෙරේද, මහණෙනි, මෙය කර්ම නිරෝධයයි කියනු ලැබේ.

6. "මහණෙනි, කර්ම නිරුද්ධ කිරීම පිණිස පිළිපදින්නාවූ ප්‍රතිපදාව කවරීද? මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම වේ. එනම් සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය, (යන මේය) මහණෙනි, මෙය කර්මයන් නිරුද්ධකිරීම පිණිස පිළිපදින්නාවූ ප්‍රතිපදාවයයි කියනු ලැබේ.

7. 'මහණෙනි, මෙසේ වනාහි තොපට මා විසින් පුරාණවූ කර්මය දේශනා කරණ ලදී. අළුත්වූ කර්මය දේශනාකරණ ලදී. කර්ම නිරෝධය දේශනා කරණ ලදී. කර්ම නිරොධය පිණිස පිළිපදින ප්‍රතිපදාව දේශනා කරණ ලදී. මහණෙනි, හිත වැඩ කැමැත්තාවූ අනුකම්පා ඇත්තාවූ ශාස්තෘවරයෙකු විසින් අනුකම්පා පිණිස ශ්‍රාවකවූ තොපට යමක් කටයුතුද, මා විසින් තොපට එය කරණ ලදී. මහණෙනි, මේ වෘක්ෂ මූලයෝ වෙත්. මේ ශූන්‍යගාර වෙත්. මහණෙනි, භාවනා කරව්. ප්‍රමාද නොවව්. පසුව පසුතැවිලි වන්නෝ නොවව්. මෙය තොපට අපගේ අනුශාසනාව වේයයි" වදාළේය.

---

## 2. සප්පාය සූත්‍රය. (1)

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, නිවනට උපකාරවූ ප්‍රතිපදාව තොපට දේශනා කරන්නෙමි. එය අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමි. මහණෙනි, නිවනට උපකාරවූ ප්‍රතිපදාව කවරීද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූතෙම ඇස අනිත්‍යයයි දකීද, රූපයෝ අනිත්‍යයහයි දකීද, චක්ඛුවිඤ්ඤාණය අනිත්‍යයයි දකීද, චක්ඛු සම්ඵස්සය අනිත්‍යයයි දකීද, චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි දකීද?

"කණ අනිත්‍යයයි දකීද, ශබ්දයෝ අනිත්‍යයහයි දකීද, සෝත විඤ්ඤාණය අනිත්‍යයයි දකීද, සෝත සම්ඵස්සය අනිත්‍යයයි දකීද, සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි දකීද?

"නාසය අනිත්‍යයයි දකීද, ගන්ධයෝ අනිත්‍යයහයි දකීද, ඝාණ විඤ්ඤාණය අනිත්‍යයයි දකීද, ඝාණ සම්ඵස්සය

අනිත්‍යයයි දකීද, ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි දකීද?

“දිව අනිත්‍යයයි දකීද, රසයෝ අනිත්‍යයහයි දකීද, ජිව්හා විඥ්ඥාණය අනිත්‍යයයි දකීද, ජිව්හා සම්ඵස්සය අනිත්‍යයයි දකීද, ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි දකීද?

“කය අනිත්‍යයයි දකීද, සපර්ශයෝ අනිත්‍යයහයි දකීද, කාය විඥ්ඥාණය අනිත්‍යයයි දකීද, කාය සම්ඵස්සය අනිත්‍යයයි දකීද, කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි දකීද?

“සිත අනිත්‍යයයි දකීද, ධර්මයෝ අනිත්‍යයහයි දකීද, මනොවිඥ්ඥාණය අනිත්‍යයයි දකීද, මනොසම්ඵස්සය අනිත්‍යයයි දකීද, මනොසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි දකීද?

“මහණෙනි, මේ වනාහි ඒ නිවනට උපකාරවූ ප්‍රතිපදාව වේයයි” වදාළේය.

---

## 3. සප්පාය සූත්‍රය. (2)

(මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දෙශනා කරන ලදී.)

2. “මහණෙනි, නිවනට උපකාරවූ ප්‍රතිපදාව තොපට දේශනා කරන්නෙමි. එය අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමි. මහණෙනි, නිවනට උපකාරවූ ප්‍රතිපදාව කවරීද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ඇස දුකයයි දකීද, රූපයෝ දුක්ඛයහයි දකීද, චකඛු විඥ්ඥාණය දුකයයි දකීද, චක්ඛු සම්ඵස්සය දුකයයි දකීද, චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද දුකයයි දකීද?

4 "කණ දුකයයි දකීද, ශබ්දයෝ දුක්ඛයහයි දකීද, සෝත විඥ්ඥාණය දුකයයි දකීද? සෝත සම්ඵස්සය දුකයයි දකීද, සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද දුකයයි දකීද?

5. "නාසය දුකයයි දකීද, ගන්ධයෝ දුක්ඛයහයි දකීද, ඝාණ විඥ්ඥාණය දුකයයි දකීද? ඝාණ සම්ඵස්සය දුකයයි දකීද, ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද දුකයයි දකීද?

6. "දිව දුකයයි දකීද, රසයෝ දුක්ඛයහයි දකීද, ජිව්හා විඥ්ඥාණය දුකයයි දකීද, ජිව්හා සම්ඵස්සය දුකයයි දකීද, ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද දුකයයි දකීද?

7. "කය දුකයයි දකීද ස්පර්ශයෝ දුක්ඛයහයි දකීද, කාය විඥ්ඥාණය දුකයයි දකීද, කාය සම්ඵස්සය දුකයයි දකීද, කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද දුකයයි දකීද?

8. "සිත දුකයයි දකීද, ධර්මයෝ දුක්ඛයහයි දකීද, මනො විඥ්ඥාණය දුකයයි දකීද, මනො සම්ඵස්සය දුකයයි දකීද, මනො සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද දුකයයි දකීද, මහණෙනි, මේ වනාහි ඒ නිවනට උපකාරවූ ප්‍රතිපදාවයයි" වදාළේය.

---

## 4. සප්පාය සූත්‍රය. (3)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමු වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, නිවනට උපකාරවූ ප්‍රතිපදාව තොපට දෙශනා කරන්නෙමි එය අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමි. මහණෙනි නිවනට උපකාරවූ ප්‍රතිපදාව කවරීද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙම ඇස අනාත්මයයි දකීද, රූපයෝ අනාත්මයහයි දකීද, චක්ඛු විඤ්ඤාණය අනාත්මයයි දකීද, චක්ඛු සම්ඵස්සය අනාත්මයයි දකීද, චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනාත්මයයි දකීද,

"කණ අනාත්මයයි දකීද, ශබ්දයෝ අනාත්මයහයි දකීද, සෝත විඤ්ඤාණය අනාත්මයයි දකීද, සෝත සම්ඵස්සය අනාත්මයයි දකීද, සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනාත්මයයි දකියිද,

"නාසය අනාත්මයයි දකීද, ගන්ධයෝ අනාත්මයහයි දකීද, ඝාණ විඤ්ඤාණය අනාත්මයයි දකීද, ඝාණ සම්ඵස්සය අනාත්මයයි දකීද, ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනාත්මයයි දකියිද,

"දිව අනාත්මයයි දකීද, රසයෝ අනාත්මයහයි දකීද, ජිව්හා විඤ්ඤාණය අනාත්මයයි දකීද, ජිව්හා සම්ඵස්සය අනාත්මයයි දකීද, ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනාත්මයයි දකියිද,

"කය අනාත්මයයි දකීද, ස්පර්ශයෝ අනාත්මයහයි දකීද, කාය විඤ්ඤාණය අනාත්මයයි දකීද, කාය සම්ඵස්සය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අනාත්මයයි දකීද, කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනාත්මයයි දකියිද,

"සිත අනාත්මයයි දකියිද, ධර්මයෝ අනාත්මයහයි දකීද, මනො විඤ්ඤාණය අනාත්මයයි දකියිද, මනො සම්ඵස්සය අනාත්මයයි දකියිද, මනො සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනාත්මයයි දකියිද, මහණෙනි, මේ වනාහි ඒ නිවනට උපකාරවූ ප්‍රතිපදාව යයි" වදාළේය.

---

## 5. සප්පාය සූත්‍රය. (4)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, තොපට නිර්වාණයට උපකාරවූ ප්‍රතිපදාව දෙශනා කරන්නෙමි. එය අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමි. මහණෙනි, නිවනට උපකාරවූ ප්‍රතිපදාව කවරීද?

(මෙහි 1926 වෙනි පිටේ සිට 1936 වෙනි පිටේ 'කළයුතු අනිකක් නැතැයි දැනගණියි.' දක්වා ගතයුතුයි) මහණෙනි, මේ වනාහි ඒ නිවනට උපකාරවූ ප්‍රතිපදාව වේයයි" වදාළේය.

---

## 6. අනන්තෙවාසික සූත්‍රය

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී)

2. "මහණෙනි, ඇතුළත කෙළෙස් නැත්තාවූ කෙලෙස් නොහැසිරෙන්නාවූ මේ බ්‍රහ්මචර්‍ය්‍යාවාසය වසන්නේය. මහණෙනි, ඇතුළත කෙළෙස් සහිතවූ කෙලෙසුන්ගේ හැසිරීම සහිතවූ භික්ෂුතෙම දුකසේ අපහසුවෙන් වාසය කරයි. මහණෙනි,

ඇතුළත කෙලෙස් නැත්තාවූ කෙලෙසුන්ගේ හැසිරීම නැත්තාවූ භික්ෂුතෙම සැපසේ පහසුවෙන් වාසය කරයි.

3 "මහණෙනි, කෙසේ නම් ඇතුළත කෙලෙස් සහිතවූ කෙලෙසුන්ගේ හැසිරීම සහිතවූ භික්ෂුතෙම දුකසේ අපහසුවෙන් වාසය කෙරේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුහට ඇසින් රූපයක් දැක මානසංයොජන නම්වූ ලාමකවූ අකුසල ධර්මයෝ උපදිත්ද, ඔව්හු මොහු තුළ වාසය කරත්ද ඒ ලාමකවූ අකුසල ධර්මයෝ මොහු තුළ වාසය කෙරෙත්නුයි, ඇතුළත කෙලෙස් සහිත පුද්ගලයායයි කියනු ලැබේ. ඒ ක්ලෙශයෝ ඔහු මැඩගෙන සිටිත්ද ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු මැඩපවත්වත්නුයි. කෙලෙසුන්ගේ හැසිරීම සහිත පුද්ගලයායයි කියනු ලැබේ.

**4.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට කණින් ශබ්දයක් අසා මානසංයොජන නම්වූ ලාමකවූ අකුසල ධර්මයෝ උපදිත්ද, ඔව්හු මොහු තුළ වාසය කරත්ද ඒ ලාමකවූ අකුසල ධර්මයෝ මොහු තුළ වාසය කෙරෙත්නුයි, ඇතුළත කෙලෙස් සහිතවූ පුද්ගලයායයි කියනු ලැබේ. ඒ ක්ලෙශයෝ ඔහු මැඩගෙන සිටිත්ද ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු මැඩපවත්වත්නුයි. කෙලෙසුන්ගේ හැසිරීම සහිත පුද්ගලයායයි කියනු ලැබේ.

**5.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට මානසංයොජන නම්වූ ලාමකවූ අකුසල ධර්මයෝ උපදිත්ද ඔව්හු මොහු තුළ වාසය කරත්ද ඒ ලාමකවූ අකුසල ධර්මයෝ මොහු තුළ වාසය කෙරෙත්නුයි ඇතුළත කෙලෙස් සහිත පුද්ගලයායයි කියනු ලැබේ. ඒ ක්ලෙශයෝ ඔහු මැඩගෙන සිටිත්ද ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු මැඩපවත්වත්නුයි කෙලෙසුන්ගේ හැසිරීම සහිත පුද්ගලයායයි කියනු ලැබේ

**6.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට දිවෙන් රසයක් විඳ මානසංයොජන නම්වූ ලාමකවූ අකුසල ධර්මයෝ උපදිත්ද ඔව්හු මොහු තුළ වාසය කරත්ද, ඒ ලාමකවූ අකුසල ධර්මයෝ මොහු තුළ වාසය කෙරෙත්නුයි ඇතුළත කෙලෙස් සහිතවූ පුද්ගලයායයි කියනු ලැබේ. ඒ ක්ලෙශයෝ ඔහු මැඩගෙන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සිටිත්ද ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු මැඩපවත්වත්නුයි කෙලෙසුන්ගේ හැසිරීම සහිත පුද්ගලයායයි කියනු ලැබේ.

7. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට කයින් ස්පර්ශයක් විඳ මානසංයොජන නම්වූ ලාමකවූ අකුසල ධර්මයෝ උපදිත්ද ඔව්හු මොහු තුළ වාසය කරත්ද ඒ ලාමකවූ අකුසල ධර්මයෝ මොහු තුළ වාසය කෙරෙත්නුයි ඇතුළත කෙලෙස් සහිතවූ පුද්ගලයායයි කියනු ලැබේ ඒ ක්ලෙශයෝ ඔහු මැඩගෙන සිටිත්ද ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු මැඩපවත්වත්නුයි. කෙලෙසුන්ගේ හැසිරීම සහිත පුද්ගලයායයි කියනු ලැබේ.

8. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂූහට සිතින් ධර්මයක් දැන මානසංයොජන නම්වූ ලාමකවූ අකුසල ධර්මයෝ උපදිත්ද ඒ අකුසල ධර්මයෝ ඔහු තුළ වසත්ද ලාමකවූ ඒ අකුසල ධර්මයෝ මොහු තුළ වසත්නුයි, ඇතුළත කෙලෙස් සහිත පුද්ගලයායයි කියනු ලැබේ. ඒ ක්ලෙශයෝ මොහු යටපත් කෙරෙත්ද ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු යටපත් කෙරෙත්නුයි. කෙලෙසුන්ගේ හැසිරීම සහිත පුද්ගලයායයි කියනුලැබේ මහණෙනි මෙසේ වනාහි ඇතුළත කෙලෙස් සහිතවූ කෙලෙසුන්ගේ හැසිරීම සහිතවූ භික්ෂුතෙම දුකසේ අපහසුව වාසය කෙරේ.

9. "මහණෙනි, කෙසේනම් ඇතුළත කෙලෙස් නොවසන්නාවූ කෙලෙසුන්ගේ හැසිරීම නැති භික්ෂු තෙම සුවසේ පහසුවෙන් වාසය කෙරේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුහට ඇසින් රූපයක් දැක මානසංයොජන නම්වූ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්ද, ඒ ක්ලෙශයෝ ඔහු තුළ වාසය නොකරත්ද, ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු තුළ වාසය නොකරත්නුයි, ඇතුළත කෙලෙසුන් නොවසන පුද්ගලයා යයි කියනු ලැබේ. ඔව්හු ඔහු යටපත් නොකෙරෙත්ද ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු යටපත් නොකෙරෙත්නුයි. කෙලෙසුන්ගේ හැසිරීම නැති පුද්ගලයායයි කියනු ලැබේ.

10. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට කණින් ශබ්දයක් අසා මානසංයොජන නම්වූ ලාමකවූ අකුසල ධර්මයෝ

නූපදිත්ද, ඒ ක්ලෙශයෝ ඔහු තුළ වාසය නොකරත්ද, ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු තුළ වාසය නොකරත්නුයි, ඇතුළත කෙලෙසුන් නොවසන පුද්ගලයා යයි කියනු ලැබේ. ඔව්හු ඔහු යටපත් නොකෙරෙත්ද, ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු යටපත් නොකෙරෙත්නුයි. කෙලෙසුන්ගේ හැසිරීම නැති පුද්ගලයායයි කියනු ලැබේ

11 "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට මානසංයොජන නම්වූ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්ද, ඒ ක්ලෙශයෝ ඔහු තුළ වාසය නොකරත්ද, ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු තුළ වාසය නොකරත්නුයි, ඇතුළත කෙලෙසුන් නොවසන පුද්ගලයා යයි කියනු ලැබේ. ඔව්හු ඔහු යටපත් නොකෙරෙත්ද, ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු යටපත් නොකෙරෙත්නුයි. කෙලෙසුන්ගේ හැසිරීම නැති පුද්ගලයායයි කියනු ලැබේ.

12. "මහණෙනි, නැවත අනිකක්ද කියමි භික්ෂුහට දිවෙන් රසයක් රසයක් විඳ මානසංයොජන නම්වූ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්ද, ඒ ක්ලෙශයෝ ඔහුතුළ වාසය නොකරත්ද, ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු තුළ වාසය නොකරත්නුයි, ඇතුළත කෙලෙසුන් නොවසන පුද්ගලයා යයි කියනු ලැබේ. ඔව්හු ඔහු යටපත් නොකෙරෙත්ද ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු යටපත් නොකෙරෙත්නුයි, කෙලෙසුන්ගේ හැසිරීම නැති පුද්ගලයායයි කියනු ලැබේ.

13. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට කයින් ස්පර්ශයක් විඳ මානසංයොජන නම්වූ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්ද, ඒ ක්ලෙශයෝ ඔහුතුළ වාසය නොකරත්ද, ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු තුළ වාසය නොකරත්නුයි, ඇතුළත කෙලෙසුන් නොවසන පුද්ගලයායයි කියනු ලැබේ. ඔව්හු ඔහු යටපත් නොකෙරෙත්ද, ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු යටපත් නොකෙරෙත්නුයි. කෙලෙසුන්ගේ හැසිරීම නැති පුද්ගලයායයි කියනු ලැබේ.

14 "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට සිතින් ධර්මයක් දැන මානසංයොජන නම්වූ ලාමකවූ අකුසල ධර්මයෝ නූපදිත්ද, ඔව්හු මොහුගේ ඇතුළත නොවසත්. ලාමකවූ අකුසල ධර්මයෝ මොහුගේ ඇතළත නොවසත්නුයි. ඇතුළත කෙලෙස් නොවසන පුද්ගලයායයි කියනු ලැබේ. ඒ ක්ලෙශයෝ මොහු මැඩගෙන නොසිටිත්ද, ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු මැඩගෙන නොසිටිත්නුයි, කෙලෙසුන්ගේ හැසිරීම නැති පුද්ගලයායයි කියනු ලැබේ.

15. "මහණෙනි, මෙසේ වනාහි ඇතුළත කෙලෙස් නොවසන්නාවූ කෙලෙසුන්ගේ හැසිරීම නැත්තාවූ භික්ෂු තෙම සැපසේ පහසුවෙන් වාසය කරයි. මහණෙනි, ඇතුළත කෙලෙස් නොවසන්නාවූ කෙලෙසුන්ගේ හැසිරීම නැත්තාවූ මේ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වසන්නේය. මහණෙනි, ඇතුළත කෙලෙස් සහිතවූ කෙලෙසුන්ගේ හැසිරීම ඇත්තාවූ භික්ෂු තෙම දුකසේ අපහසුවෙන් වාසය කරයි. මහණෙනි, ඇතුළත කෙලෙස් නැත්තාවූ කෙලෙසුන්ගේ හැසිරීම නැත්තාවූ භික්ෂුතෙම සැපසේ පහසුවෙන් වාසය කෙරේයයි" වදාළේය.

---

## 7. කිමත්ථික සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, අන්‍ය තීර්ථක පරිව්‍රාජකයෝ ඉදින් තොපගෙන් මෙසේ අසන්නාහු නම්, 'ඇවැත්නි, කුමක් පිණිස ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නේද මහණෙනි, මෙසේ අසන ලද්දාවූ තෙපි ඒ අන්‍ය තීර්ථක පරිව්‍රාජකයන්ට මෙසේ ප්‍රකාශකරන්නාහුය. 'ඇවැත්නි, දුක්ඛයාගේ පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වසන්නේය කියායි.'

3. "මහණෙනි, ඉදින් වනාහි තොපගෙන් අන්‍ය තීර්ථක පරිව්‍රාජකයෝ මෙසේ අසන්නාහු නම්, 'ඇවැත්නි, යමක් පිරිසිඳ දැනීම පිණිස ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි බ්‍රහ්මචය්‍ය්‍යාවෙහි හැසිරෙන්නේද? ඒ දුකනම් කවරේදැයි, මහණෙනි, මෙසේ අසන ලද්දාවූ තෙපි ඒ අන්‍ය තීර්ථක පරිව්‍රාජකයන්ට මෙසේ ප්‍රකාශ කරන්නාහුය.

"ඇවැත්නි, ඇස වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේය. රූපයෝ දුක්යහ. ඔවුන් පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේය. චක්ඛු විඤ්ඤාණය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය. චක්ඛු සම්ඵස්සය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද එයද දුක්වේ.

4. "ඇවැත්නි, කණ වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේය. ශබ්දයෝ දුක්යහ. ඔවුන් පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේය. සෝත විඤ්ඤාණය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය. සෝත සම්ඵස්සය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවකුත් උපදීද එයද දුක්වේ.

5. "ඇවැත්නි, නාසය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේය. ගන්ධයෝ දුක්යහ. ඔවුන් පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේය. ඝාණ විඤ්ඤාණය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය. ඝාණ සම්ඵස්සය දුකය එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය. ඝාණ

සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවකුත් උපදීද එයද දුක්වේ.

6. "ඇවැත්නි, දිව වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේය. රසයෝ දුක්යහ. ඔවුන් පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේය. ජිව්හා විඤ්ඤාණය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය. ජිව්හා සම්ඵස්සය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද එයද දුක්වේ.

7. "ඇවැත්නි, කය වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේය. ස්පර්ශයෝ දුක්යහ. ඔවුන් පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේය. කාය විඤ්ඤාණය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය. කාය සම්ඵස්සය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද එයද දුක්වේ.

8. "ඇවැත්නි, සිත වනාහි දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේය. ධර්මයෝ දුක්යහ. ඔවුන් පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසන්නේය මනෝ විඤ්ඤාණය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය. මනෝ සම්ඵස්සය දුකය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද එයද දුක්වේ. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසන්නේය.' මහණෙනි, මෙසේ අසන ලද්දාවූ තෙපි ඒ අන්‍ය

තීර්ථක පරිව්‍රාජකයන්ට මෙසේ ප්‍රකාශ කරන්නාහුයයි” වදාළසේක.

---

## 8. අර්ථනබොපරියාය සූත්‍රය.

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

“මහණෙනි, භික්ෂුතෙම යම් ආකාරයක් නිසා ශ්‍රද්ධාවෙන් තොරව, කැමැත්තෙන් තොරව, ඇසීමෙන් තොරව, කරුණු සැලකීමෙන් තොරව, ලබ්ධි වශයෙන් ගැනීමෙන් තොරව ජාතිය ක්ෂයවිය, බඹසර වැස නිමවනලදී, සතර මගින් කටයුතු දෙය කරණ ලදී, මෙයින් අන්‍යවූ ආත්මභාවයක් නැතැයි දැනගණිමියි රහත් බව ප්‍රකාශ කරන ආකාරයක් ඇත්තේද?”

2. ‘ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහුය, භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය, භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දරන්නාහුය.”

“මහණෙනි, එසේවීනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි” වදාළසේක.

“එසේය, ස්වාමීනි” කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

(එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක

3. “මහණෙනි, භික්ෂුතෙම යම් ආකාරයක් නිසා ශ්‍රද්ධාවෙන් තොරව, කැමැත්තෙන් තොරව, ඇසීමෙන් තොරව, කරුණු සැලකීමෙන් තොරව, ලබ්ධි වශයෙන් ගැනීමෙන් තොරව, ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවනලදී සතරමගින් කටයුතු දෙය කරණලදී. මෙයින් අන්‍යවූ ආත්ම භාවයක් නැතැයි දැනගණිමියි රහත්බව ප්‍රකාශ කරණ ආකාරයක් ඇත්තේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**4.** "මහණෙනි, භික්ෂුතෙම යම් ආකාරයක් නිසා ශ්‍රද්ධාවෙන් තොරව, කැමැත්තෙන් තොරව, ඇසීමෙන් තොරව, කරුණු සැලකීමෙන් තොරව, ලබ්ධි වශයෙන් ගැනීමෙන් තොරව ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවනලදී. සතරමගින් කටයුතුදෙය කරණලදී. මෙයින් අන්‍යවූ ආත්මභාවයක් නැතැයි දැනගණිමි යන මෙයද රහත් බව ප්‍රකාශ කරන ආකාරයකි.

**5.** "මහණෙනි, මහණතෙම ඇසින් රූපය දැක, තමා කෙරෙහි ඇත්තාවූ රාග, දෝස, මෝහ, මා තුළ රාග දෝස මෝහ ඇතැයි හෝ දැනගණියිද, තමා කෙරෙහි නැත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දෝස මෝහ නැතැයි හෝ දැන ගණියිද, මහණෙනි, භික්ෂුතෙම ඇසින් රූපයක් දැක, තමා කෙරෙහි ඇත්තාවූ රාග දෝස මෝහ මා තුළ රාග දොස මෝහ ඇතැයි හෝ දැනගණියි. තමා කෙරෙහි නැත්තාවූ රාග දොස මෝහ මා තුළ රාගය දොස මෝහ නැතැයි හෝ දැනගණියි යන යමක් වේද, මහණෙනි, මේ ධර්මයෝ ශ්‍රද්ධාවෙන් හෝ දත යුත්තාහුද, කැමැත්තෙන් හෝ දතයුත්තාහුද, ඇසීමෙන් හෝ දතයුත්තාහුද, කරුණු සැලකීමෙන් හෝ දතයුත්තාහුද, ලබ්ධි වශයෙන් ගැනීමෙන් හෝ දතයුත්තාහුද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"මහණෙනි, මේ ධර්මයෝ ප්‍රඥාවෙන් දැක දතයුත්තාහු නොවෙත්ද?"-"ස්වාමීනි, එසේය."

**6.** "මහණෙනි, භික්ෂුතෙම යම් ආකාරයක් නිසා ශ්‍රද්ධාවෙන් තොරව, කැමැත්තෙන් තොරව, ඇසීමෙන් තොරව, කරුණු සැලකීමෙන් තොරව, ලබ්ධි වශයෙන් ගැනීමෙන් තොරව ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. සතර මගින් කටයුතු දෙය කරණ ලදී. මෙයින් අන්‍යවූ ආත්මභාවයක් නැතැයි දැනගණිමි යන මෙයද රහත්බව ප්‍රකාශ කරන ආකාරයකි"

**7.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම කණින් ශබ්දයක් අසා, තමා කෙරෙහි ඇත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දොස මෝහ ඇතැයි හෝ දැනගණියිද, තමා කෙරෙහි නැත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දොස මෝහ නැතැයි

හෝ දැනගණියිද, මහණෙනි, භික්ෂුතෙම කණින් ශබ්දයක් අසා තමා කෙරෙහි ඇත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දොස මෝහ ඇතැයි හෝ දැනගණියි. තමා කෙරෙහි නැත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දොස මෝහ නැතැයි හෝ දැනගණියි යන යමක් වේද, මහණෙනි, මේ ධර්මයෝ ශ්‍රද්ධාවෙන් හෝ දතයුත්තාහුද, කැමත්තෙන් හෝ දතයුත්තාහුද, ඇසීමෙන් හෝ දතයුත්තාහුද, කරුණු සැලකීමෙන් හෝ දතයුත්තාහුද, ලබ්ධි වශයෙන් ගැනීමෙන් හෝ දතයුත්තාහුද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"මහණෙනි, මේ ධර්මයෝ ප්‍රඥාවෙන් දැක දතයුත්තාහු නොවෙත්ද?"-"ස්වාමීනි, එසේය"

"මහණෙනි, භික්ෂුතෙම යම් ආකාරයක් නිසා ශ්‍රද්ධාවෙන් තොරව, කැමැත්තෙන් තොරව, ඇසීමෙන් තොරව, කරුණු සැලකීමෙන් තොරව, ලබ්ධි වශයෙන් ගැනීමෙන් තොරව ජාතිය ක්ෂයවිය, බඹසර වැස නිමවනලදී. සතර මගින් කටයුතු දෙය කරණලදී. මෙයින් අන්‍යවූ ආත්ම භාවයක් නැතැයි දැනගණිමි යන මෙයද රහත් බව ප්‍රකාශ කරන ආකාරයකි.

8. "මහණෙනි නැවත අනිකක්ද කියමි. 'මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට තමා කෙරෙහි ඇත්තාවූ රාග දොස මෝහයෝ මාතුළ රාග දොස මෝහයෝ ඇතැයි හෝ දැන ගණියිද තමා කෙරෙහි නැත්තාවූ රාග දොස මෝහයෝ මාතුළ රාග දොස මෝහයෝ නැතැයි හෝ දැන ගණියිද, මහණෙනි, භික්ෂුතෙම නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණකොට තමා කෙරෙහි ඇත්තාවූ රාග දොස මෝහයෝ මාතුළ රාග, දොස, මෝහයෝ නැතැයි හෝ දැන ගණියි. තමා කෙරෙහි නැත්තාවූ රාග, දොස, මෝහයෝ මා තුළ රාග, දොස, මෝහයෝ නැතැයි හෝ දැනගණියි යන යමක් වේද, මහණෙනි, මේ ධර්මයෝ ශ්‍රද්ධාවෙන් හෝ කැමත්තෙන් හෝ දතයුත්තාහුද, ඇසීමෙන් හෝ දතයුත්තාහුද, කරුණු සැලකීමෙන් හෝ දතයුත්තාහුද, ලබ්ධි වශයෙන් ගැනීමෙන් හෝ දතයුත්තාහුද?"- "ස්වාමීනි, එය නොවේමැයි."

"මහණෙනි, මේ ධර්මයෝ ප්‍රඥාවෙන් දැක දතයුත්තාහු නොවෙත්ද?"-"ස්වාමීනි, එසේය."

"මහණෙනි, භික්ෂුතෙම යම් ආකාරයක් නිසා ශ්‍රද්ධාවෙන් තොරව, කැමැත්තෙන් තොරව, ඇසීමෙන් තොරව, කරුණු සැලකීමෙන් තොරව, ලබ්ධි වශයෙන් ගැනීමෙන් තොරව ජාතිය ක්ෂයවිය. බඹසරවැස නිමවනලදී. සතර මගින් කටයුතුදෙය කරණලදී. මෙයින් අන්‍යවූ ආත්මභාවයක් නැතැයි දැනගනිමි යන මෙයද රහත් බව ප්‍රකාශ කරන ආකාරයකි.

**9.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම දිවෙන් රසයක් විඳ තමා කෙරෙහි ඇත්තාවූ රාග දොස මෝහ මා තුල රාග දොස මෝහ ඇතැයි හෝ දැනගණියිද, තමා කෙරෙහි නැත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දෝස මෝහ නැතැයි හෝ දැනගණියිද, මහණෙනි භික්ෂුතෙම දිවෙන් රසයක් විඳ තමා කෙරෙහි ඇත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග, දොස මෝහ ඇතැයි හෝ දැනගණියි. තමා කෙරෙහි ඇත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දොස මෝහ නැතැයි හෝ දැනගණියි යන යමක් වේද, මහණෙනි, මේ ධර්මයෝ ශ්‍රද්ධාවෙන් හෝ දතයුත්තාහුද, කැමැත්තෙන් හෝ දතයුත්තාහුද, ඇසීමෙන් හෝ දතයුත්තාහුද කරුණු සැලකීමෙන් හෝ දතයුත්තාහුද, ලබ්ධි වශයෙන් ගැනීමෙන් හෝ දතයුත්තාහුද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"මහණෙනි, මේ ධර්මයෝ ප්‍රඥාවෙන් දැක දතයුත්තාහු නොවෙත්ද?"-"ස්වාමීනි, එසේය."

"මහණෙනි, භික්ෂුතෙම යම් ආකාරයක් නිසා ශ්‍රද්ධාවෙන් තොරව, කැමැත්තෙන් තොරව, ඇසීමෙන් තොරව, කරුණු සැලකීමෙන් තොරව, ලබ්ධි වශයෙන් ගැනීමෙන් තොරව ජාතිය ක්ෂයවිය. බඹසරවැස නිමවනලදී සතර මගින් කටයුතුදෙය කරණලදී මෙයින් අන්‍යවූ ආත්මභාවයක් නැතැයි දැනගනිමි යන මෙයද රහත් බව ප්‍රකාශ කරන ආකාරයෙකි

**10.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම කයෙන් ස්පර්ශයක් විඳ තමා කෙරෙහි ඇත්තාවූ රාග දොස

මෝහ මා තුළ රාග දොස මෝහ ඇතැයි හෝ දැනගණියිද, තමා කෙරෙහි නැත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දෝස මෝහ නැතැයි හෝ දැනගණියිද, මහණෙනි, භික්ෂුතෙම කයෙන් ස්පර්ශයක් විඳ තමා කෙරෙහි ඇත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දොස මෝහ ඇතැයි හෝ දැනගණියි. තමා කෙරෙහි නැත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දොස මෝහ නැතැයි හෝ දැනගනියි යන යමක් වේද, මහණෙනි, මේ ධර්මයෝ ශ්‍රද්ධාවෙන් හෝ දතයුත්තාහුද, කැමැත්තෙන් හෝ දතයුත්තාහුද, ඇසීමෙන් හෝ දතයුත්තාහුද, කරුණු සැලකීමෙන් හෝ දතයුත්තාහුද, ලබ්ධි වශයෙන් ගැනීමෙන් හෝ දතයුත්තාහුද?"- "ස්වාමීනි, එය නොවේමැයි."

"මහණෙනි, මේ ධර්මයෝ ප්‍රඥාවෙන් දැක දතයුත්තාහු නොවෙත්ද?"-"ස්වාමීනි, එසේය,"

"මහණෙනි, භික්ෂුතෙම යම් ආකාරයක් නිසා ශ්‍රද්ධාවෙන් තොරව, කැමැත්තෙන් තොරව, ඇසීමෙන් තොරව, කරුණු සැලකීමෙන් තොරව. ලබ්ධි වශයෙන් ගැනීමෙන් තොරව ජාතිය ක්ෂයවිය. බඹසරවැස නිමවනලදී, සතරමගින් කටයුතු දෙය කරණලදී මෙයින් අන්‍යවූ ආත්මභාවයක් නැතැයි දැනගනිමි යන මෙයද රහත්බව ප්‍රකාශ කරන ආකාරයකි.

11. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම සිතින් ධර්මයක් දැන තමා කෙරෙහි ඇත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දොස මෝහ ඇතැයි හෝ දැනගණියිද, තමා කෙරෙහි නැත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දෝස මෝහ නැතැයි දැනගණියිද, මහණෙනි, භික්ෂුතෙම සිතින් ධර්මයක් දැන තමා කෙරෙහි ඇත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග, දොස මෝහ ඇතැයි හෝ දැනගණියි තමා කෙරෙහි නැත්තාවූ රාග දොස මෝහ මා තුළ රාග දොස මෝහ නැතැයි හෝ දැනගණියි යන යමක් වේද, මහණෙනි, මේ ධර්මයෝ ශ්‍රද්ධාවෙන් හෝ දතයුත්තාහුද, කැමැත්තෙන් හෝ දතයුත්තාහුද, ඇසීමෙන් හෝ දතයුත්තාහුද, කරුණු සැලකීමෙන් හෝ දතයුත්තාහුද, ලබ්ධි

වශයෙන් ගැනීමෙන් හෝ දතයුත්තාහුද?"-"ස්වාමීනි, එය නොවේමැයි."

"මහණෙනි, මේ ධර්මයෝ ප්‍රඥාවෙන් දැක දතයුත්තාහු නොවෙත්ද?"-"ස්වාමීනි, එසේය."

"මහණෙනි, භික්ෂුතෙම යම් ආකාරයක් නිසා ශ්‍රද්ධාවෙන් තොරව, කැමැත්තෙන් තොරව, ඇසීමෙන් තොරව, කරුණු සැලකීමෙන් තොරව, ලබ්ධි වශයෙන් ගැනීමෙන් තොරව ජාතිය ක්ෂයවිය, බඹසරවැස නිමවනලදී. සතරමගින් කටයුතු දෙය කරණලදී. මෙයින් අන්‍යවූ ආත්මභවයක් නැතැයි දැනගනිමි යන මෙයද රහත්බව ප්‍රකාශ කරන ආකාරයක් වේයයි" වදාළේය.

## 9 ඉන්ද්‍රියසම්පන්න සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති එක්තරා භික්ෂුවක්තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක උන්නේය. එක් පසෙක උන්නාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය.

2. "ස්වාමීනි, සම්පූර්ණ ඉන්ද්‍රිය ඇති පුද්ගලයාය සම්පූර්ණ ඉන්ද්‍රිය ඇති පුද්ගලයායයි කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි සම්පූර්ණ ඉන්ද්‍රිය ඇති පුද්ගලයෙක් වේද?"

3. "ඉදින් භික්ෂුතෙම චක්ඛුඉන්ද්‍රියයෙහි ඇතිවීම නැතිවීම නැවත නැවත දකිමින් වාසය කරන්නේ චක්ඛු ඉන්ද්‍රිය කෙරෙහි කලකිරේද, සොතෙන්ද්‍රියයෙහි ඇතිවීම නැතිවීම නැවත නැවත දකිමින් වාසය කරන්නේ සොත ඉන්ද්‍රියයෙහි කලකිරේද, ඝාණෙන්ද්‍රියයෙහි ඇතිවීම නැතිවීම නැවත නැවත දකිමින් වාසය කරන්නේ ඝාණඉන්ද්‍රියයෙහි කළකිරේද, ජිව්හා

ඉන්ද්‍රියයෙහි ඇතිවීම නැතිවීම නැවත නැවත දකිමින් වාසය කරන්නේ ජිව්හාඉන්ද්‍රියයෙහි කළකිරේද, කායඉන්ද්‍රියයෙහි ඇතිවීම නැතිවීම නැවත නැවත දකිමින් වාසය කරන්නේ කායඉන්ද්‍රියයෙහි කලකිරේද, ඉදින් මනින්ද්‍රියයෙහි ඇතිවීම නැතිවීම නැවත නැවත දකිමින් වාසය කරන්නේ මනින්ද්‍රියය කෙරෙහි කලකිරේද, කලකිරෙමින් නොඇලේද, නොඇල්මෙන් මිදේද, මිදුනු කල්හි මිදුනේය යන දැනීමවේද, ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලද්දේය. සතර මගින් කටයුතු දෙය කරණලදී. මෙයින් අන්‍ය ආත්මභාවයක් නැතැයි දැනගණීද, මෙතෙකින් වනාහි භික්ෂුතෙම සම්පූර්ණ ඉන්ද්‍රිය ඇත්තෙක් වේයයි" (වදාළේය.)

---

## 10. ධර්මකථික සූත්‍රය

(මේ වර්ගයේ 9 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙහි යොදා ගතයුතුයි.)

2. "ස්වාමීනි, ධර්මකථිකයාය, ධර්මකථිකයායයි කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි ධර්මකථිකයෙක් වේද?

3. "ඉදින් මහණතෙම ඇස පිළිබඳ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස ධර්මය දෙශනා කෙරේද, ඒ භික්ෂුතෙම ධර්මකථිකයායි කීමට සුදුසුවේ. ඉදින් භික්ෂුතෙම ඇස පිළිබඳ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස පිළිපදින්නේ වේද, ඒ භික්ෂුතෙම ධර්මයට අනුව පිළිපදින්නේයයි කීමට සුදුසුය ඉදින් භික්ෂුතෙම ඇස පිළිබඳ කලකිරීමෙන් නොඇල්මෙන් නිරොධයෙන් උපාදාන රහිතව මිදුනේවේද, ඒ භික්ෂුතෙම මේ ආත්මයෙහි නිවනට පැමිණියේයයි කීමට සුදුසුවේ

4. "ඉදින් මහණතෙම කණ පිළිබඳ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස ධර්මය දේශනා කෙරේද, ඒ භික්ෂුතෙම ධර්මකථිකයායි කීමට සුදුසුවේ. ඉදින් භික්ෂුතෙම

කණ පිළිබඳ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේද, ඒ භික්ෂුතෙම ධර්මයට අනුව පිළිපදින්නේයයි කීමට සුදුසුය. ඉදින් භික්ෂුතෙම කණ පිළිබඳ කලකිරීමෙන් නොඇල්මෙන් නිරොධයෙන් උපාදාන රහිතව මිදුනේවේද, ඒ භික්ෂුතෙම මේ ආත්මයෙහි නිවනට පැමිණේයයි කීමට සුදුසුවේ.

**5.** "ඉදින් මහණතෙම නාසය පිළිබඳ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස ධර්මය දෙශනා කෙරේද, ඒ භික්ෂුතෙම ධර්මකථිකයායි කීමට සුදුසුවේ. ඉදින් භික්ෂුතෙම නාසය පිළිබඳ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේද, ඒ භික්ෂුතෙම ධර්මයට අනුව පිළිපදින්නේයයි කීමට සුදුසුය. ඉදින් භික්ෂුතෙම නාසය පිළිබඳ කලකිරීමෙන් නොඇල්මෙන් නිරොධයෙන් උපාදාන රහිතව මිදුනේ වේද, ඒ භික්ෂුතෙම මේ ආත්මයෙහි නිවනට පැමිණේයයි කීමට සුදුසුවේ.

**6.** ඉදින් මහණතෙම දිව පිළිබඳ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස ධර්මය දේශනා කෙරේද, ඒ භික්ෂුතෙම ධර්ම කථිකයායි කීමට සුදුසු වේ. ඉදින් භික්ෂු තෙම දිව පිළිබඳ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේද, ඒ භික්ෂුතෙම ධර්මයට අනුව පිළිපදින්නේයයි කීමට සුදුසුය. ඉදින් භික්ෂුතෙම දිව පිළිබඳ කලකිරීමෙන් නොඇල්මෙන් නිරොධයෙන් උපාදාන රහිතව මිදුනේ වේද, ඒ භික්ෂුතෙම මේ ආත්මයෙහි නිවනට පැමිණේයයි කීමට සුදුසුවේ.

**7.** "ඉදින් මහණතෙම කය පිළිබඳ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස ධර්මය දේශනා කෙරේද, ඒ භික්ෂුතෙම ධර්මකථිකයායි කීමට සුදුසුවේ. ඉදින් භික්ෂුතෙම කය පිළිබඳ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේද, ඒ භික්ෂුතෙම ධර්මයට අනුව පිළිපදින්නේයයි කීමට සුදුසුය. ඉදින් භික්ෂුතෙම කය පිළිබඳ කලකිරීමෙන් නොඇල්මෙන් නිරොධයෙන් උපාදාන රහිතව මිදුනේ වේද, ඒ භික්ෂුතෙම මේ ආත්මයෙහි නිවනට පැමිණේයයි කීමට සුදුසුවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8. "ඉදින් මහණතෙම සිත පිළිබඳ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස ධර්මය දෙශනා කෙරේද, ඒ භික්ෂුතෙම ධර්මකථිකයායි කීමට සුදුසුවේ. ඉදින් භික්ෂුතෙම සිත පිළිබඳ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේද, ඒ භික්ෂුතෙම ධර්මයට අනුව පිළිපදින්නේයයි කීමට සුදුසුවේ. ඉදින් භික්ෂුතෙම සිත පිළිබඳ කලකිරීමෙන් නොඇල්මෙන් නිරොධයෙන් උපාදාන රහිතව මිදුනේවේද, ඒ භික්ෂුතෙම මේ ආත්මයෙහි නිවනට පැමිණේයයි කීමට සුදුසුයයි." (වදාළේය)

(5 වෙනි නවපුරාණ වර්ගය නිමි.)

3 පණ්ණාසකය නිමි.

---

# 4. පණ්ණාසකය.

## නන්දික්ඛය වර්ගය

### 1. නන්දික්ඛය සූත්‍රය.(1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, භික්ෂූතෙම අනිත්‍යවූම ඇස අනිත්‍යයයි දකියි. එය ඔහුගේ යහපත්කොට දැකීම වෙයි. යහපත්ව දක්නේ කලකිරෙයි. තෘෂ්ණාව ක්ෂයකිරීමෙන් රාගය ක්ෂයවේ. රාගය ක්ෂය කිරීමෙන් තෘෂ්ණාව ක්ෂයවේ. තෘෂ්ණා රාග දෙක නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

3. "මහණෙනි, භික්ෂුතෙම අනිත්‍යවූම කණ අනිත්‍යයයි දකියි. එය ඔහුගේ යහපත් දැකීම වෙයි. යහපත්ව දක්නේ කලකිරෙයි. තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් රාගය ක්ෂයවේ. රාගය ක්ෂය කිරීමෙන් තෘෂ්ණාව ක්ෂයවේ. තෘෂ්ණා රාග දෙක නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

4 "මහණෙනි, භික්ෂුතෙම අනිත්‍යවූම නාසය අනිත්‍යයයි දකියි. එය ඔහුගේ යහපත්කොට දැකීම වෙයි. යහපත්ව දක්නේ කලකිරෙයි තෘෂ්ණාව ක්ෂයකිරීමෙන් රාගය ක්ෂයවේ රාගය ක්ෂයකිරීමෙන් තෘෂ්ණාව ක්ෂයවේ. තෘෂ්ණා රාග දෙක නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

5. "මහණෙනි, භික්ෂුතෙම අනිත්‍යවූම දිව අනිත්‍යයයි දකියි. එය ඔහුගේ යහපත්කොට දැකීම වෙයි. යහපත්ව දක්නේ කලකිරෙයි. තෘෂ්ණාව ක්ෂයකිරීමෙන් රාගය ක්ෂයවේ. රාගය ක්ෂයවීමෙන් තෘෂ්ණාව ක්ෂයවේ තෘෂ්ණා රාග දෙක නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ

6. "මහණෙනි, භික්ෂුතෙම අනිත්‍යවූම කය අනිත්‍යයයි දකියි. එය ඔහුගේ යහපත් දැකීම වෙයි. යහපත්ව දක්නේ කලකිරෙයි. තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් රාගය ක්ෂයවේ. රාගය ක්ෂයවීමෙන් තෘෂ්ණාව ක්ෂයවේ තෘෂ්ණා රාග දෙක නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

7. 'මහණෙනි, භික්ෂුතෙම අනිත්‍යවූම සිත අනිත්‍යයයි දකියි. එය ඔහුගේ යහපත් දැකීම වෙයි. යහපත්ව දක්නේ කලකිරෙයි තෘෂ්ණාව ක්ෂයකිරීමෙන් රාගය ක්ෂයවේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. නන්දි රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාසේ මිදුනේයයි, කියනු ලැබේයයි" (වදාළේය.)

---

## 2. නන්දික්ඛය සූත්‍රය. (2)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, භික්ෂුතෙම අනිත්‍යවූම රූපයක් අනිත්‍යයයි දකියි. එය ඔහුගේ යහපත් දැකීම වෙයි. යහපත්ව දක්නේ කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

3. "මහණෙනි, භික්ෂුතෙම අනිත්‍යවූම ශබ්දයක් අනිත්‍යයයි දකියි. එය ඔහුගේ යහපත් දැකීම වෙයි. යහපත්ව දක්නේ කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

4. "මහණෙනි, භික්ෂුතෙම අනිත්‍යවූම ගන්ධයන් අනිත්‍යයයි දකියි. එය ඔහුගේ යහපත් දැකීම වෙයි. යහපත්ව දක්නේ කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

5. "මහණෙනි, භික්ෂුතෙම අනිත්‍යවූම රසයන් අනිත්‍යයයි දකියි. එය ඔහුගේ යහපත් දැකීම වෙයි. යහපත්ව දක්නේ කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

6. "මහණෙනි, භික්ෂුතෙම අනිත්‍යවූම ස්පර්ශයන් අනිත්‍යයයි දකියි. එය ඔහුගේ යහපත් දැකීම වෙයි. යහපත්ව දක්නේ කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනුලැබේ.

7. "මහණෙනි, භික්ෂුතෙම අනිත්‍යවූම ධර්මයන් අනිත්‍යයයි දකියි. එය ඔහුගේ යහපත් දැකීම වෙයි. යහපත්ව දක්නේ කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසෙයි. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේයයි" (වදාළේය.)

---

## 3 නන්දික්ඛය සූත්‍රය (3)

1. (මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, ඇස නුවණින් මෙනෙහි කරව්. ඇස පිළිබඳ අනිත්‍ය බව තත්වූ පරිද්දෙන් මනාකොට බලව්. මහණෙනි, භික්ෂුතෙම ඇස නුවණින් මෙනෙහි කරන්නේ ඇස පිළිබඳ අනිත්‍ය බවද, තත්වූ පරිද්දෙන් මනාකොට බලන්නේ ඇස කෙරෙහිද කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

3. "මහණෙනි, කණ නුවණින් මෙනෙහි කරව්. කණ පිළිබඳ අනිත්‍ය බව තත්වූ පරිද්දෙන් මනාකොට බලව්. මහණෙනි, භික්ෂුතෙම කණ නුවණින් මෙනෙහි කරන්නේ කණ පිළිබඳ අනිත්‍ය බවද, තත්වූ පරිද්දෙන් මනාකොට බලන්නේ කණ කෙරෙහිද කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

4. "මහණෙනි, නාසය නුවණින් මෙනෙහි කරව්. නාසය පිළිබඳ අනිත්‍ය බවද තත්වූ පරිද්දෙන් මනාකොට බලව්. මහණෙනි, භික්ෂුතෙම නාසය නුවණින් මෙනෙහි කරන්නේ නාසය පිළිබඳ අනිත්‍ය බවද, තත්වූ පරිද්දෙන් මනාකොට බලන්නේ නාසය කෙරෙහිද කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ

5. "මහණෙනි, දිව නුවණින් මෙනෙහිකරව්. දිව පිළිබඳ අනිත්‍ය බවද තත්වූ පරිද්දෙන් මනාකොට බලව්. මහණෙනි, භික්ෂුතෙම දිව නුවණින් මෙනෙහි කරන්නේ දිව පිළිබඳ අනිත්‍ය බවද තත්වූ පරිද්දෙන් මනාකොට බලන්නේ දිව කෙරෙහිද කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය

නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

6. "මහණෙනි, කය නුවණින් මෙනෙහි කරව්. කය පිළිබඳ අනිත්‍ය බවද තත්වූ පරිද්දෙන් මනාකොට බලව්. මහණෙනි, භික්ෂුතෙම කය නුවණින් මෙනෙහි කරන්නේ කය පිළිබඳ අනිත්‍ය බවද, තත්වූ පරිද්දෙන් මනාකොට බලන්නේ කය කෙරෙහිද කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

7. "මහණෙනි, සිත නුවණින් මෙනෙහි කරව්. සිත පිළිබඳ අනිත්‍ය බව තත්වූ පරිද්දෙන් මනාකොට බලව්. මහණෙනි, භික්ෂුතෙම සිත නුවණින් මෙනෙහි කරන්නේ සිත පිළිබඳ අනිත්‍ය බවද තත්වූ පරිද්දෙන් මනාකොට බලන්නේ සිත කෙරෙහිද කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසෙයි. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේයයි" (වදාළේය.)

---

## 4. නන්දික්ඛය සූත්‍රය (4)

1. (මේ සූත්‍රයද, මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයෙහිදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, රූපයන් නුවණින් මෙනෙහි කරව්. රූපයන්ගේ අනිත්‍ය බවද තත්වූ පරිද්දෙන් මනාකොට බලව්. මහණෙනි, භික්ෂුතෙම රූපයන් මෙනෙහි කරන්නේ රූපයන්ගේ අනිත්‍ය බැව්ද, තත්වූ පරිද්දෙන් මනාකොට බලන්නේ රූපයන්හි කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

3. "මහණෙනි, ශබ්දයන් නුවණින් මෙනෙහි කරව්. ශබ්දයන්ගේ අනිත්‍ය බවද තත්වූ පරිද්දෙන් මනාකොට බලව්. මහණෙනි, භික්ෂුතෙම ශබ්දයන් නුවණින් මෙනෙහි කරන්නේ ශබ්දයන්ගේ අනිත්‍ය බැව්ද, තත්වූ පරිද්දෙන් මනාකොට බලන්නේ ශබ්දයන්හි කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

4. "මහණෙනි, ගන්ධයන් නුවණින් මෙනෙහි කරව්. ගන්ධයන්ගේ අනිත්‍ය බවද තත්වූ පරිද්දෙන් මනාකොට බලව්. මහණෙනි, භික්ෂුතෙම ගන්ධයන් නුවණින් මෙනෙහිකරන්නේ ගන්ධයන්ගේ අනිත්‍ය බැව්ද තත්වූ පරිද්දෙන් මනාකොට බලන්නේ ගන්ධයන්හි කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

5. "මහණෙනි, රසයන් නුවණින් මෙනෙහි කරව්. රසයන්ගේ අනිත්‍ය බවද තත්වූ පරිද්දෙන් මනාකොට බලව් මහණෙනි, භික්ෂුතෙම රසයන් නුවණින් මෙනෙහි කරන්නේ රසයන්ගේ අනිත්‍ය බැව්ද තත්වූ පරිද්දෙන් මනාකොට බලන්නේ රසයන්හි කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

6. "මහණෙනි, ස්පර්ශයන් නුවණින් මෙනෙහි කරව්. ස්පර්ශයන්ගේ අනිත්‍ය බවද තත්වූ පරිද්දෙන් මනාකොට බලව්. මහණෙනි, භික්ෂුතෙම ස්පර්ශයන් නුවණින් මෙනෙහි කරන්නේ ස්පර්ශයන්ගේ අනිත්‍ය බැව්ද තත්වූ පරිද්දෙන් මනාකොට බලන්නේ ස්පර්ශයන්හි කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසේ. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේ.

7. "මහණෙනි, ධර්මයන් නුවණින් මෙනෙහි කරව්. ධර්මයන්ගේ අනිත්‍ය බැව්ද තත්වූ පරිද්දෙන් මනාකොට බලව්. මහණෙනි, භික්ෂුතෙම ධර්මයන් නුවණින් මෙනෙහි කරන්නේ ධර්මයන්ගේ අනිත්‍ය බැව්ද තත්වූ පරිද්දෙන් මනාකොට බලන්නේ ධර්මයන්හි කලකිරෙයි. තෘෂ්ණාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තෘෂ්ණාව නැසේ. තෘෂ්ණා රාග දෙදෙනාගේ නැසීමෙන් සිත මනාකොට මිදුනේයයි කියනු ලැබේයයි" (වදාළේය.)

---

## 5. සමාධි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ජීවක නම් වෛද්‍යවරයාගේ අඹ උයනෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට අඬගා වදාළසේක.

2. "මහණෙනි, සමාධිය වඩව්. මහණෙනි, එකඟවූ සිත් ඇත්තාවූ භික්ෂුහට තත්වූ පරිද්දෙන් වැටහෙයි. (පෙනෙයි.) කුමක් නම් තත්වූ පරිද්දෙන් වැටහේද?

3. "ඇස අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. රූපයෝ අනිත්‍යයහයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. චක්ඛු විඤ්ඤාණය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. චක්ඛු සම්ඵස්සය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නුවූ සැපද නුවූ යම් මේ වේදනාවකුත් උපදීද, එයද අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි.

4. "කණ අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. ශබ්දයෝ අනිත්‍යයහයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. සෝත විඤ්ඤාණය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. සෝත සම්ඵස්සය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නුවූ සැපද නුවූ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි.

5. "නාසය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. ගන්ධයෝ අනිත්‍යයහයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. ඝ්‍රාණ විඤ්ඤාණය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. ඝ්‍රාණ සම්ඵස්සය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. ඝ්‍රාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නුවූ සැපද නුවූ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි.

6 "දිව අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. රසයෝ අනිත්‍යයහයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. ජිව්හා විඤ්ඤාණය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. ජිව්හා සම්ඵස්සය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නුවූ සැපද නුවූ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි.

7 "කය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. ස්පර්ශයෝ අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. කාය විඤ්ඤාණය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. කාය සම්ඵස්සය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නුවූ සැපද නුවූ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි.

8. "සිත අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. ධර්මයෝ අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. මනො විඤ්ඤාණය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. මනො සම්ඵස්සය අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි. මනො සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නුවූ සැපද නුවූ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි තත්වූ පරිද්දෙන් වැටහෙයි.

9. "මහණෙනි, සමාධිය වඩව්. මහණෙනි, එකඟවූ සිත් ඇති භික්ෂුහට තත්වූ පරිද්දෙන් වැටහේයයි" (වදාළසේක.)

---

## 6. පටිසල්ලාණ සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 5 වෙනි සූත්‍රය මෙන් රජගහ නුවර ජීවක වෛද්‍යවරයාගේ අඹ උයනේදී දේශනා කරණ ලදී.)

2. "මහණෙනි, විවේකස්ථානයෙහි උත්සාහ කරව්. විවේකස්ථානයට පැමිණියාවූ භික්ෂුහට තත්වූ පරිද්දෙන් වැටහෙයි. කමක් නම් තත්වූ පරිද්දෙන් වැටහේද?

3. (මෙහි මේ වර්ගයේ 5 වෙනි සූත්‍රයේ 3, 4, 5, 6, 7, 8 වෙනි ඡේද යොදාගත යුතුයි.)

9. මහණෙනි, විවේකස්ථානයෙහි හිඳ උත්සාහ කරව්. මහණෙනි, විවෙකස්ථානයට පැමිණියාවූ භික්ෂුහට තත්වූ පරිද්දෙන් වැටහේයයි" (වදාළේය.)

---

## 7. කොට්ඨිත සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වසනසේක.

ඉක්බිති ආයුෂ්මත් මහා කොට්ඨිත නම් ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක උන්නාවූ ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය.

2. "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා එකලාවූයේ, වෙන්වූ වාසය ඇත්තේ, අප්‍රමාදවූයේ, වීර්‍ය්‍ය ඇත්තේ, හරණලද ආත්මාලය ඇත්තේ වාසය කරන්නෙම්ද, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් (එබඳු) ධර්මයක් දෙශනා කරණසේක් නම් මැනවැ යනුයි."

3. "කොට්ඨිතය, යමක් වනාහි අනිත්‍යද, එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. කොට්ඨිතය, කුමක්නම් අනිත්‍යද?

**4** "කොට්ඨිතය, ඇස වනාහි අනිත්‍යවේ. එහි තොපගේ ආශාව දුරුකටයුතුවේ. රූපයෝ අනිත්‍යයෝය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. චක්ඛු විඤ්ඤාණය අනිත්‍යය, එහි තොපගේ ආශාව දුරු කටයුතුවේ. චක්ඛු සම්ඵස්සය අනිත්‍යවේ. එහි තොපගේ ආශාව දුරු කටයුතු වේ. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ.

**5.** "කොට්ඨිතය, කණ වනාහි අනිත්‍යවේ. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ, ශබ්දයෝ අනිත්‍යයෝය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. සෝත විඤ්ඤාණය අනිත්‍යය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. සෝත සම්ඵස්සය අනිත්‍යවේ. එහි තොපගේ ආශාව දුරුකටයුතුවේ. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යය එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ.

**6.** "කොට්ඨිතය, නාසය වනාහි අනිත්‍යවේ. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. ගන්ධයෝ අනිත්‍යයෝය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. ඝාණ විඤ්ඤාණය අනිත්‍යය. එහි තොපගේ ආශාව දුරු කටයුතු වේ. ඝාණ සම්ඵස්සය අනිත්‍යවේ. එහි තොපගේ ආශාව දුරු කටයුතු වේ. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනිත්‍යය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ.

**7.** "කොට්ඨිතය, දිව වනාහි අනිත්‍යවේ. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. රසයෝ අනිත්‍යයෝය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. ජිව්හා විඤ්ඤාණය අනිත්‍යය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. ජිව්හා සම්ඵස්සය අනිත්‍යවේ. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ

වේදනාවක් උපදීද, එයද අනිත්‍යය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ.

8. "කොට්ඨිතය, කය වනාහි අනිත්‍යවේ. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. ස්පර්ශයෝ අනිත්‍යයෝය. එහි තොපගේ ආශාව දුරු කටයුතුවේ. කාය විඤ්ඤාණය අනිත්‍යය එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. කාය සම්ඵස්සය අනිත්‍යවේ. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනිත්‍යය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ.

9. "කොට්ඨිතය, සිත වනාහි අනිත්‍යවේ. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. ධර්මයෝ අනිත්‍යයෝය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. මනෝ විඤ්ඤාණය අනිත්‍යය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. මනෝ සම්ඵස්සය අනිත්‍යවේ. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යය. එහි තොපගේ ආශාව දුරුකටයුතු වේ. කොට්ඨිතය, යමක් වනාහි අනිත්‍යද එහි තොපගේ ආශාව දුරු කටයුතු වේයයි (වදාළේය.)

---

## 8. කොට්ඨිත සූත්‍රය (2)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 7 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2. එක්පසෙක උන්නාවූ ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය. "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා එකලාව වෙන්වූ වාසය ඇත්තේ, අප්‍රමාදවූයේ, වීර්‍ය්‍ය ඇත්තේ, හරණලද ආත්මාලය ඇත්තේ වාසය කරන්නෙම්ද, භාග්‍යවතුන් වහන්සේ මට සැකෙවින් (එබඳු) ධර්මයක් දෙශනා කරණසේක් නම් ඒ මැනව" යනුයි.

3. "කොට්ඨිතය, යමක් වනාහි දුකද එහි තොපගේ ආශාව දුරුකටයුතුවේ. කොට්ඨිතය, කුමක් නම් දුකද? කොට්ඨිතය, ඇස දුකය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. රූපයෝ දුක්යහ. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. චක්ඛු විඤ්ඤාණය දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. චක්ඛු සම්ඵස්සය දුකය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද දුකය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය.

4. "කොට්ඨිතය, කණ දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. ශබ්දයෝ දුක්යහ. එහි තොපගේ ආශාව දුරු කළයුතුය. සෝත විඤ්ඤාණය දුකය එහි තොපගේ ආශාව දුරුකළයුතුය. සෝත සම්ඵස්සය දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය.

5. "කොට්ඨිතය, නාසය දුකය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. ගන්ධයෝ දුක්යහ. එහි තොපගේ ආශාව දුරු කළයුතුය. ඝාණ විඤ්ඤාණය දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. ඝාණ සම්ඵස්සය දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය.

6. "කොට්ඨිතය, දිව දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. රසයෝ දුක්යහ. එහි තොපගේ ආශාව දුරු කළයුතුය. ජිව්හා විඤ්ඤාණය දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. ජිව්හා සම්ඵස්සය දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය.

7. "කොට්ඨිතය, කය දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. ස්පර්ශයෝ දුක්යහ. එහි තොපගේ ආශාව දුරු කළයුතුය. කාය විඤ්ඤාණය දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. කාය සම්ඵස්සය දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය.

8. "කොට්ඨිතය, සිත දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. ධර්මයෝ දුක්යහ. එහි තොපගේ ආශාව දුරු කළයුතුය. මනෝ විඤ්ඤාණය දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. මනෝ සම්ඵස්සය දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද දුකය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. කොට්ඨිතය, යමක් වනාහි දුක්ද එහි තොපගේ ආශාව දුරු කටයුතුයයි" වදාළේය.

---

## 9. කොට්ඨිත සූත්‍රය. (3)

1. ("මේ සූත්‍රයද මේ වර්ගයේ 7 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. එක්පසෙක උන්නාවූ ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය. "මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා එකලාව වෙන්වූ වාසය ඇත්තේ අප්‍රමාදවූයේ වීර්‍ය්‍ය ඇත්තේ හරණ ලද ආත්මාලය ඇත්තේ වාසය කරන්නෙම්ද භාග්‍යවතුන් වහන්සේ මට සැකෙවින් එබඳු ධර්මයක් දෙශනා කරණසේක් නම් මැනවැයි" කියායි.

3. "කොට්ඨිතය, යමක් අනාත්මද, එහි තොපගේ ආශාව දුරුකළයුතුය කොට්ඨිතය, කුමක් නම් අනාත්මද? කොට්ඨිතය, ඇස අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. රූපයෝ

අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. චක්ඛු විඤ්ඤාණය අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. චක්ඛු සම්ඵස්සය අනාත්මය එහි තොපගේ ආශාව දුරුකළයුතුය. චක්ඛුසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුවේ.

4. "කණ අනාත්මය එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. ශබ්දයෝ අනාත්මය එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. සෝත විඤ්ඤාණය අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. සෝත සම්ඵස්සය අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුවේ.

5. "නාසය අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. ගන්ධයෝ අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. ඝාණ විඤ්ඤාණය අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. ඝාණ සම්ඵස්සය අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුවේ.

6. 'දිව අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. රසයෝ අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. ජිව්හා විඤ්ඤාණය අනාත්මය එහි තොපගේ ආශාව දුරුකළයුතුය, ජිව්හා සම්ඵස්සය අනාත්මය. එහි තොපගේ ආශාව දුරු කළ යුතුය. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුවේ.

7. "කය අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. ස්පර්ශයෝ අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. කාය විඤ්ඤාණය අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ

යුතුය. කාය සම්ඵස්සය අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළයුතුය. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුවේ.

8. "සිත අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. ධර්මයෝ අනාත්මයහ. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. මනෝ විඥ්ඥාණය අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. මනො සම්ඵස්සය අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. මනො සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවකුත් උපදීද, එයද අනාත්මය. එහි තොපගේ ආශාව දුරුකළ යුතුය. කොට්ඨිතය, යමක් අනාත්මද, එහි තොපගේ ආශාව දුරුකළයුතුයයි" (වදාළේය.)

---

## 10. මිච්ඡාදිට්ඨි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක.

ඉක්බිති එක්තරා භික්ෂුවක් තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක උන්නාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය.

2. "ස්වාමීනි, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණ වේදැයි?" කියායි. "මහණ, ඇස අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. රූපයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යා දෘෂ්ටිය ප්‍රහීණවේ. චක්ඛුවිඥ්ඥාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණ වේ. චක්ඛුසම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණ වේ. චක්ඛු

සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ.

3. "කණ අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ ශබ්දයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. සෝත විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. සෝත සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ.

4. "නාසය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණ වේ. ගන්ධයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. ඝාණ විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. ඝාණ සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ.

5. "දිව අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. රසයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. ජිව්හාවිඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. ජිව්හා සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**6.** "කය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. ස්පර්ශයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. කාය විඥ්ඥාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. කාය සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ.

**7.** "සිත අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. ධර්මයන් අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. මනෝ විඥ්ඥාණය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. මනෝ සම්ඵස්සය අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, එයද අනිත්‍ය වශයෙන් දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේ. මහණ මෙසේ වනාහි දන්නහුගේ දක්නහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණවේයයි" (වදාළේය)

---

## 11. සක්කායදිට්ඨි සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂු තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය. "ස්වාමීනි, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේදැයි" කියායි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "මහණෙනි, ඇස දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. රූපයන් දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. චක්ඛු විඤ්ඤාණය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. චක්ඛු සම්ඵස්සය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ

3. "මහණෙනි, කණ දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. ශබ්දයන් දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. සෝත විඤ්ඤාණය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. සෝත සම්ඵස්සය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ.

4. "මහණෙනි, නාසය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ ගන්ධයන් දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. ඝාණ විඤ්ඤාණය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. ඝාණ සම්ඵස්සය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ.

5. "මහණෙනි, දිව දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. රසයන් දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. ජිව්හා විඤ්ඤාණය

දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. ජිව්හා සම්ඵස්සය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ.

6. "මහණ, කය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. ස්පර්ශයන් දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. කාය විඤ්ඤාණය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. කාය සම්ඵස්සය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. කායසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ.

7. "මහණ, සිත දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. ධර්මයන් දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. මනොවිඤ්ඤාණය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. මනොසම්ඵස්සය දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ. මනො සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද දුක් වශයෙන් දන්නහුගේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේ.

"මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීණවේයයි" වදාළේය.

---

## 12. අත්තානුදිට්ඨි සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ 11 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

"ස්වාමීනි, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණ වේද?"

2. "මහණ, ඇස අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණ වේ. රූපයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණ වේ. චක්ඛු විඤ්ඤාණය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටි ප්‍රහීණවේ. චක්ඛු සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණ වේ. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ.

3. "මහණ, කණ අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණ වේ. ශබ්දයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ. සෝත විඤ්ඤාණය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටි ප්‍රහීණවේ සෝත සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණ වේ. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ.

4. "මහණ, නාසය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණ වේ. ගන්ධයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ. ඝාණ විඤ්ඤාණය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටි ප්‍රහීණවේ. ඝාණ සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණ වේ. ඝාණ සම්ඵස්සය නිසා

සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ.

**5.** "මහණ, දිව අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ. රසයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ. ජිව්හා විඤ්ඤාණය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටි ප්‍රහීණවේ. ජිව්හා සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ.

**6.** "මහණ, කය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ. ස්පර්ශපයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ. කායවිඤ්ඤාණය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටි ප්‍රහීණවේ. කාය සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ.

7. "මහණ, සිත අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ. ධර්මයන් අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ. මනෝ විඤ්ඤාණය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටි ප්‍රහීණවේ. මනෝ සම්ඵස්සය අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනාත්ම වශයෙන් දන්නහුගේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණවේයයි" (වදාළේය)

1 වන නන්දික්ඛය වර්ගය නිමි.

---

## සට්ඨි පෙය්‍යාලො (පෙය්‍යාල සැට) වර්ගය

### 1 අනිත්‍ය සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

"මහණෙනි, යමක් අනිත්‍යද එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. මහණෙනි, කුමක් නම් අනිත්‍යද? "මහණෙනි, ඇස අනිත්‍යය. එහි තොපගේ ඡන්දය දුරුකටයුතු වේ. කණ, නාසය, දිව, අනිත්‍යය. කය අනිත්‍යය. සිත අනිත්‍යය. එහි තොපගේ ඡන්දය දුරුකටයුතුය. මහණෙනි, යමක් අනිත්‍යද, එහි තොපගේ ඡන්දය දුරුකටයුතුයයි." (වදාළේය.)

---

### 2. අනිත්‍ය සූත්‍රය (2)

(මේ වර්ගයේ අනිත් සූත්‍රද 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරණ ලදී.)

"මහණෙනි, යමක් අනිත්‍යද එහි තොපගේ රාගය දුරුකටයුතුවේ. මහණෙනි, කුමක් නම් අනිත්‍යද? මහණෙනි, ඇස අනිත්‍යය. එහි තොපගේ රාගය දුරුකටයුතුවේ. කණ, නාසය, දිව අනිත්‍යය. එහි තොපගේ රාගය දුරුකටයුතුවේ.

කය අනිත්‍යය. සිත අනිත්‍යය. එහි තොපගේ රාගය දුරුකටයුතුවේ. මහණෙනි, යමක් අනිත්‍යද, එහි තොපගේ රාගය දුරු කටයුතු වේයයි” (වදාළේය.)

## 3. අනිත්‍ය සූත්‍රය (3)

“මහණෙනි, යමක් අනිත්‍යද, එහි තොපගේ ඡන්දරාගය දුරුකටයුතුවේ. මහණෙනි, කුමක්නම් අනිත්‍යද? මහණෙනි, ඇස අනිත්‍යය. එහි තොපගේ ඡන්දරාගය දුරුකටයුතුවේ. කණ අනිත්‍යය. නාසය, දිව අනිත්‍යය. එහි තොපගේ ඡන්දරාගය දුරුකටයුතුවේ. කය අනිත්‍යය. එහි තොපගේ ඡන්දරාගය දුරුකටයුතුවේ. සිත අනිත්‍යය. එහි තොපගේ ඡන්දරාගය දුරුකටයුතුවේ. මහණෙනි, යමක් අනිත්‍යද, එහි තොපගේ ඡන්දරාගය දුරුකටයුතුවේයයි’ (වදාළේය.)

## 4, 5, 6, දුක්ඛ සූත්‍ර

“මහණෙනි, යමක් දුකද, එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්දරාග දුරුකටයුතුවේ. මහණෙනි, කුමක්නම් දුකද? මහණෙනි, ඇස දුකය. එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්දරාගය දුරුකටයුතුවේ. කණ, දුකය. නාසය දුකය. දිව දුකය. කය දුකය. සිත දුකය. එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරු කටයුතුවේ. ඡන්ද රාගය දුරුකටයුතුවේ. මහණෙනි, යමක් දුකද එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්දරාගය දුරුකටයුතුවේයයි” (වදාළේය.)

## 7, 8, 9, අනත්ත සූත්‍ර

“මහණෙනි, යමක් අනාත්මද, එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්දරාගය දුරුකටයුතුවේ. මහණෙනි, කුමක් අනාත්මද? මහණෙනි, ඇස අනාත්මය, එහි

තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්දරාගය දුරුකටයුතුවේ. කණ, නාසය, දිව, කය, සිත, අනාත්මය. එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ ඡන්දරාගය දුරුකටයුතුවේ. මහණෙනි, යමක් අනාත්මද, එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරු කටයුතුවේ. ඡන්දරාගය දුරු කටයුතුවේයයි" (වදාළේය)

---

## 10, 11, 12, අනිත්‍ය සූත්‍ර

"මහණෙනි, යමක් අනිත්‍යද, එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්දරාගය දුරුකටයුතුවේ. මහණෙනි, කුමක් අනිත්‍යද? මහණෙනි, රූපයෝ අනිත්‍යයහ. එහි තොපගේ ඡන්දය දුරු කටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්දරාගය දුරුකටයුතුවේ. ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, ධර්මයෝ, අනිත්‍යහ එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්ද රාගය දුරුකටයුතුවේ. මහණෙනි, යමක් අනිත්‍යද, එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරු කටයුතුවේ. ඡන්දරාගය දුරු කටයුතුවේයයි" (වදාළේය)

---

## 13, 14, 15, දුක්ඛ සූත්‍ර

"මහණෙනි, යමක් දුකද, එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්ද රාගය දුරුකටයුතුවේ. මහණෙනි, කුමක්නම් දුකද? මහණෙනි, රූපයෝ දුක්වෙත් එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්දරාගය දුරුකටයුතුවේ. ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, ධර්මයෝ, දුක්වෙත්. එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්දරාගය දුරුකටයුතුවෙ. මහණෙනි, යමක් දුකද, එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරු කටයුතුවේ ඡන්දරාගය දුරු කටයුතුවේයයි" (වදාළේය)

---

## 16, 17, 18, අනත්ත සූත්‍ර

"මහණෙනි, යමෙක් අනාත්මවේද, එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්දරාගය දුරුකටයුතුවේ. මහණෙනි, කුමක් නම් අනාත්මද? මහණෙනි, රූපයෝ අනාත්මය, එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ ඡන්දරාගය දුරුකටයුතුවේ. ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, ධර්මයෝ, අනාත්මයහ එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරුකටයුතුවේ. ඡන්දරාගය දුරුකටයුතුවේ. මහණෙනි, යමක් අනාත්මද, එහි තොපගේ ඡන්දය දුරුකටයුතුවේ. රාගය දුරු කටයුතුවේ. ඡන්දරාගය දුරු කටයුතුවේයයි" (වදාළේය)

---

## 19. අනිත්‍ය සූත්‍රය. (4)

1. "මහණෙනි, අතීතවූ ඇස අනිත්‍යය. අතීතවූ කණ, නාසය, දිව, කය, සිත අනිත්‍යය.

2. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම ඇස කෙරෙහිද කලකිරෙයි. කණ කෙරෙහිද කලකිරෙයි. නාසය කෙරෙහිද කලකිරෙයි. දිව කෙරෙහිද කලකිරෙයි. කය කෙරෙහිද කලකිරෙයි. සිත කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම වේ "ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වැස නිමවන ලද්දේය. සතර මගින් කළයුත්ත කරණලදී. මෙයින් අන්‍යවූ ආත්මයක් නැතැයි දැනගණීයයි" (වදාළේය.)

---

## 20. අනිත්‍ය සූත්‍රය. (5)

1. "මහණෙනි, අනාගත ඇස අනිත්‍යය. අනාගත කණ නාසය, දිව, අනිත්‍යය. අනාගත කය, සිත, අනිත්‍යය.

2. (මේ වර්ගයේ 19 වෙනි සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

---

## 21. අනිත්‍ය සූත්‍රය. (6)

1. "මහණෙනි, වර්තමානවූ ඇස අනිත්‍යය. වර්තමානවූ කණ, නාසය, දිව, අනිත්‍යය. වර්තමානවූ කය, සිත අනිත්‍යය.

2. (මේ වර්ගයේ 19 වෙනි සූත්‍රයේ දෙවෙනි ඡෙදය මෙනි)

---

## 22 - 23 - 24 දුක්ඛ සූත්‍ර. (7)

1. "මහණෙනි, අතීතවූද, අනාගතවූද, වර්තමානවූද ඇස දුකය. අතීතවූද, අනාගතවූද, වර්තමානවූ කණ නාසය දිව දුක්ය. අතීතවූද, අනාගතවූද, වර්තමානවූද කය සිත දුකය.

2. (මේ වර්ගයේ 19 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡෙදය මෙනි.)

---

## 25 - 27 අනාත්ම සූත්‍ර.

1. "මහණෙනි, අතීතවූද, අනාගතවූද, වර්තමානවූද ඇස අනාත්මය. අතීතවූද, අනාගතවූද, වර්තමානවූ කණ, නාසය, දිව අනාත්මය. අතීතවූද, අනාගතවූද, වර්තමානවූද කය සිත අනාත්මය.

2. (මේ වර්ගයේ 19 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡෙදය මෙනි.)

---

## 28 - 30 අනිත්‍ය සූත්‍ර

1. "මහණෙනි, අතීතවූද, අනාගතවූද, වර්තමානවූද රූපයෝ අනිත්‍යයෝය. අතීත, අනාගත, වර්තමාන ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, ධර්මයෝ අනිත්‍යයහ.

2. "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම රූපයන්හිද කලකිරෙයි. ශබ්දයන් කෙරෙහිද කලකිරෙයි. ගන්ධයන් කෙරෙහිද කලකිරෙයි. රසයන් කෙරෙහිද කලකිරෙයි. ස්පර්ශයන් කෙරෙහිද කලකිරෙයි. ධර්මයන් කෙරෙහිද

කලකිරෙයි. කලකිරෙමින් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුනේය යන දැනීමවේ, ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචය¯ාව වැස නිමවන ලද්දේය. සතර මගින් කටයුතු දෙය කරන ලදී. මෙයින් අන්‍ය වූ ආත්මයක් නැතැයි දැනගණීයයි" (වදාළේය.)

---

## 31 - 33 දුක්ඛ සූත්‍ර.

1. "මහණෙනි, අතීත, අනාගත, වර්තමාන රූපයෝ දුක්වූවාහුය. අතීත, අනාගත, වර්තමාන ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, ධර්මයෝ දුක්වූවාහුය.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡෙදය මෙනි.)

---

## 34 - 36 අනාත්ම සූත්‍ර.

1. "මහණෙනි, අතීත, අනාගත, වර්තමාන රූපයෝ අනාත්මයහ. අතීත, අනාගත, වර්තමාන කණ ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, ධර්මයෝ අනාත්මයහ.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡෙදය මෙනි.)

---

## 37. අනිත්‍ය සූත්‍රය. (7)

1. "මහණෙනි, අතීත ඇස අනිත්‍යය. යමක් අනිත්‍යද එය දුකය. යමක් දුකද, එය අනාත්මය. යමක් අනාත්මද එය මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය. අතීතවූ කණ අනිත්‍යය. අතීතවූ නාසය අනිත්‍යය. අතීතවූ දිව අනිත්‍යය. අතීතවූ කය අනිත්‍යය. අතීතවූ සිත අනිත්‍යය.

"යමක් අනිත්‍යද, එය දුකය. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද, 'එය මෙය මාගේ නොවෙයි. මෙය මම

නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

## 38. අනිත්‍ය සූත්‍රය. (8)

1. "මහණෙනි, අනාගත ඇස අනිත්‍යය. යමක් අනිත්‍යද, එය දුකය. යමක් දුකද, එය අනාත්මය, යමක් අනාත්මද, 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේ' යයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය. අනාගත කණ අනිත්‍යය. අනාගත නාසය අනිත්‍යය. අනාගත දිව අනිත්‍යය. අනාගත කය, සිත අනිත්‍යය. යමක් අනිත්‍යද, එය දුකය. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද, 'එය මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි" මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

## 39. අනිත්‍ය සූත්‍රය. (9)

1. "මහණෙනි, වර්තමාන ඇස අනිත්‍යය. යමක් අනිත්‍යද, එය දුකය. යමක් දුකද, එය අනාත්මය. යමක් අනාත්මද එය මෙය මාගේ නොවෙයි. 'මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි වර්තමාන කණ, නාසය, දිව, කය, සිත අනිත්‍යය. යමක් අනිත්‍යද, එය දුකය. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද, 'එය මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 40 - 42 දුක්ඛ සූත්‍ර.

1. "මහණෙනි, අතීත, අනාගත, වර්තමාන ඇස දුකය. යමක් දුකද, එය අනාත්මය. යමක් අනාත්මද එය 'මෙය මාගේ නොවෙයි. 'මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි. අතීත, අනාගත, වර්තමාන කණ දුකය. නාසය, දිව, කය, සිත දුකය. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද, 'එය මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

## 43 - 45 අනාත්ම සූත්‍ර.

1. "මහණෙනි, අතීත, අනාගත, වර්තමාන ඇස අනාත්මය. යමක් අනාත්මද එය 'මෙය මාගේ නොවෙයි. 'මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි. අතීත, අනාගත, වර්තමාන කණ, නාසය, දිව, කය, සිත අනාත්මය. යමක් අනතාමද එය 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුයි.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

## 46 - 48 අනිත්‍ය සූත්‍ර

2. "මහණෙනි, අතීත, අනාගත, වර්තමාන රූපයෝ අනිත්‍යය, යමක් අනිත්‍යද එය දුකය. යමක් දුකද, එය අනාත්මය. යමක් අනාත්මද එය 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය

තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය. අතීත, අනාගත, වර්තමාන ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, ධර්මයෝ අනිත්‍යයහ. යමක් අනිත්‍යද එය දුකය. යමක් දුකද, එය අනාත්මය. යමක් අනාත්මද, එය 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය.

2, (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

## 49 - 51. දුක්ඛ සූත්‍ර.

1. "මහණෙනි, අතීත, අනාගත, වර්තමාන රූපයෝ දුක්යහ. යමක් දුකද එය අනාත්මය යමක් අනාත්මද එය 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය. අතීත, අනාගත, වර්තමාන ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, ධර්මයෝ දුක්යහ. යමක් දුකද එය අනාත්මය. යමක් අනාත්මද එය 'මෙය මාගේ නොවෙයි මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

## 52-54 අනාත්ම සූත්‍ර.

1. "මහණෙනි, අතීත, අනාගත, වර්තමාන රූපයෝ අනාත්මයහ. යමක් අනාත්මද එය 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය. අතීත, අනාගත, වර්තමාන ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, ධර්මයෝ අනාත්මයහ. යමක් අනාත්මද එය 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය

නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් නුවණින් දැක්ක යුතුය.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

## 55 අනිත්‍ය සූත්‍රය.

1 "මහණෙනි, ඇස අනිත්‍යය. කණ, නාසය, දිව, කය, සිත අනිත්‍යය.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

## 56. දුක්ඛ සූත්‍රය.

1 "මහණෙනි, ඇස අනිත්‍යය. කණ, නාසය, දිව, කය, සිත අනිත්‍යය.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

## 57. අනාත්ම සූත්‍රය.

1 "මහණෙනි, ඇස අනාත්මය. කණ, නාසය, දිව, කය, සිත අනාත්මය.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

## 58. අනිත්‍ය සූත්‍රය.

1 "මහණෙනි, රූපයෝ අනිත්‍යයහ. ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, ධර්මයෝ අනිත්‍යයහ.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 59. දුක්ඛ සූත්‍රය.

1. "මහණෙනි, රූපයෝ දුක්යහ. ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, ධර්මයෝ දුක්යහ.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

---

## 60. අනාත්ම සූත්‍රය.

1. "මහණෙනි, රූපයෝ අනාත්මයහ. ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ, ධර්මයෝ අනාත්මයහ.

2. (28-30 වෙනි සූත්‍රවල දෙවෙනි ඡේදය මෙනි.)

**(පෙය්‍යාල සැට නිමි.)**

---

# 3. සමුද්ද වර්ගය.

## 1. සමුද්ද සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

"මහණෙනි, සමුද්‍රය සමුද්‍රයයි අශ්‍රැතවත් පෘථග්ජන තෙම කියයි. මහණෙනි, මෙය ආර්‍ය්‍ය විනයෙහි සමුද්‍රය නොවේ. මහණෙනි මෙය මහත් දිය රාශියෙකි. මහත් ජලයකි.

මහණෙනි, ඇස පුරුෂයාට සමුද්‍රය වේ. එහි රූපයන්ගෙන් හටගත් රළ වේගය වේ. යමෙක් ඒ රූපයන්ගෙන් හටගත් රළවේගය (රාගාදී ක්ලෙශයන්ගෙන් වෙන්ව) ඉවසාද, මහණෙනි, හෙතෙම කෙලෙස් නමැති රළවේග සහිතවූ කෙලෙස් දියසුළි

සහිතවූ කෙලෙස් නමැති අල්වාගන්නා සතුන් ඇති කෙලෙස් රකුසන් සහිතවූ ඇස නමැති සමුද්‍රය තරණය කෙළේය. තරණය කළාවූ පරතෙරට ගියාවූ බ්‍රාහ්මණ තෙමේ ගොඩබිම සිටීයයි කියනු ලැබේ.

2. මහණෙනි, කණ පුරුෂයාට සමුද්‍රය වේ. එහි ශබ්දයන්ගෙන් හටගත් රළ වේගය වේ. යමෙක් ඒ ශබ්දයන්ගෙන් හටගත් රළ වේගය ඉවසාද, මහණෙනි, හෙතෙම කෙලෙස් නමැති රළවේග සහිතවූ කෙලෙස් දියසුළි සහිතවූ කෙලෙස් නමැති අල්වාගන්නා සතුන් ඇති කෙලෙස් රකුසන් සහිතවූ කණ නමැති සමුද්‍රය තරණය කෙළේය. තරණය කළාවූ පරතෙරට ගියාවූ බ්‍රාහ්මණතෙමේ ගොඩබිම සිටීයයි කියනු ලැබේ.

3. මහණෙනි, නාසය පුරුෂයාට සමුද්‍රය වේ. එහි ගන්ධයන්ගෙන් හටගත් රළ වේගය වේ. යමෙක් ඒ ගන්ධයන්ගෙන් හටගත් රළ වේගය ඉවසාද, මහණෙනි, හෙතෙම කෙලෙස් නමැති රළවේග සහිතවූ කෙලෙස් දියසුළි සහිත වූ කෙලෙස් නමැති අල්වාගන්නා සතුන් ඇති කෙලෙස් රකුසන් සහිතවූ නාසය නමැති සමුද්‍රය තරණය කෙළේය. තරණය කළාවූ පරතෙරට ගියාවූ බ්‍රාහ්මණ තෙමේ ගොඩබිම සිටීයයි කියනු ලැබේ.

4. මහණෙනි, දිව පුරුෂයාට සමුද්‍රය වේ. එහි රසයන්ගෙන් හටගත් රළවේගය වේ. යමෙක් ඒ රසයන්ගෙන් හටගත් රළ වේගය ඉවසාද, මහණෙනි, හෙතෙම කෙලෙස් නමැති රළවේග සහිතවූ කෙලෙස් දියසුළි සහිතවූ කෙලෙස් නමැති අල්වාගන්නා සතුන් ඇති කෙලෙස් රකුසන් සහිතවූ දිව නමැති සමුද්‍රය තරණය කෙළේය. තරණය කළාවූ පරතෙරට ගියාවූ බ්‍රාහ්මණතෙමේ ගොඩබිම සිටීයයි කියනු ලැබේ.

5. මහණෙනි, කය පුරුෂයාට සමුද්‍රය වේ. එහි ස්පර්ශයන්ගෙන් හටගත් රළ වේගය වේ. යමෙක් ඒ ස්පර්ශයන්ගෙන් හටගත් රළ වේගය ඉවසාද, මහණෙනි, හෙතෙම කෙලෙස් නමැති රළවේග සහිතවූ කෙලෙස් දියසුළි සහිතවූ කෙලෙස් නමැති අල්වාගන්නා සතුන් ඇති කෙලෙස්

රකුසන් සහිතවූ කය නමැති සමුද්‍රය තරණය කෙළේය. තරණය කළාවූ පරතෙරට ගියාවූ බ්‍රාහ්මණතෙමේ ගොඩබිම සිටීයයි කියනු ලැබේ.

**6.** මහණෙනි, සිත පුරුෂයාහට සමුද්‍රය වේ. එහි ධර්මයන්ගෙන් හටගත් රළවේගය වේ. යමෙක් ඒ ධර්මයන්ගෙන් හටගත්තාවූ රළවේගය ඉවසාද, මහණෙනි, හෙතෙම කෙලෙස් නමැති රළ වේග සහිතවූ කෙලෙස් දියසුළි සහිතවූ කෙලෙස් නමැති අල්වාගන්නා සතුන් සහිතවූ කෙලෙස් රකුසන් සහිතවූ සිත නමැති සමුද්‍රය තරණය කෙළේය. තරණය කළාවූ පරතෙරට ගියාවූ බ්‍රාහ්මණතෙම ගොඩබිම සිටීයයි කියනු ලැබේ.

"යමෙක් තෙම කෙලෙස් නමැති අල්වා ගන්නා සතුන් සහිතවූ කෙලෙස් රකුසන් සහිතවූ රළ භය සහිතවූ තරණය කිරීමට දුෂ්කරවූ මේ මුහුද තරණය කෙළේද, හෙතෙම වේදයන්ගේ පරතෙරට ගියාවූ වැස නිමවන ලද බඹසර ඇත්තාවූ සංස්කාර ලොකයාගේ කෙළවරට ගියාවූ නිර්වාණයට පැමිණියෙකැයි කියනු ලැබේ." යයි (වදාළේය.)

---

## 2. සමුද්ද සූත්‍රය. (2)

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** "මහණෙනි, සමුද්‍රය සමුද්‍රයයි අශ්‍රැතවත් පෘථග්ජන තෙම කියයි. මහණෙනි, එය ආර්‍ය්‍ය විනයෙහි සමුද්‍රය නොවේ. මහණෙනි එය මහත්වූ වතුර රාශියකි. මහත්වූ ජලයකි.

"මහණෙනි, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ රූපයෝ ඇත්තාහ. මහණෙනි, මෙය ආර්‍ය්‍ය විනයෙහි සමුද්‍රයයි කියනු ලැබේ. මෙහි මේ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝවැසිතෙම මහණ බමුණන් සහිතවූ දෙවිමිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාව බොහෝසෙයින් ගිලී නූල්

ගුලියක් මෙන් පැටලී රෙදි වියන්නන්ගේ කැඳ දැමූ නූල් ගුලියක් මෙන් ගැටගැසී මුදුතණ බබුස්තණ පඳුරක් මෙන් අවුල්වී සැපයෙන් පහවූ විෂමව වැටෙන්නාවූ දුර්ගති නම් සංසාරය නොඉක්මවයි.

3. මහණෙනි, සෝත විඥ්ඥාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ශබ්දයෝ ඇත්තාහ. මහණෙනි, මෙය ආර්‍ය්‍ය විනයෙහි සමුද්‍රයයි කියනු ලැබේ. මෙහි මේ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝවැසිතෙම මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාව බොහෝසෙයින් ගිලී නූල් ගුලියක් මෙන් පැටලී රෙදි වියන්නන්ගේ කැඳ දැමූ නූල් ගුලියක් මෙන් ගැටගැසී මුදුතණ බබුස්තණ පඳුරක් මෙන් අවුල්වී සැපයෙන් පහවූ විෂමව වැටෙන්නාවූ දුර්ගති නම්වූ සංසාරය නොඉක්මවයි.

4. මහණෙනි, ඝාණ විඥ්ඥාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ගන්ධයෝ ඇත්තාහ. මහණෙනි, මෙය ආර්‍ය්‍ය විනයෙහි සමුද්‍රයයි කියනු ලැබේ. මෙහි මේ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝවැසිතෙම මහණ බමුණන් සහිතවූ දෙව්මිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාව බොහෝසෙයින් ගිලී නූල් ගුලියක් මෙන් පැටලී රෙදි වියන්නන්ගේ කැඳ දැමූ නූල් ගුලියක් මෙන් ගැටගැසී මුදුතණ බබුස්තණ පඳුරක් මෙන් අවුල්වී සැපයෙන් පහවූ විෂමව වැටෙන්නාවූ දුර්ගති නම් සංසාරය නොඉක්මවයි.

5. මහණෙනි, ජිව්හා විඥ්ඥාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ රසයෝ ඇත්තාහ. මහණෙනි, මෙය ආර්‍ය්‍ය විනයෙහි සමුද්‍රයයි කියනු ලැබේ. මෙහි මේ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝවැසිතෙම මහණ බමුණන් සහිතවූ දෙව්මිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාව බොහෝසෙයින් ගිලී නූල් ගුලියක් මෙන් පැටලී රෙදි

වියන්නන්ගේ කැඳ දැමූ නූල් ගුලියක් මෙන් ගැටගැසී මුදුතණ බබුස්තණ පඳුරක් මෙන් අවුල්වී සැපයෙන් පහවූ විෂමව වැටෙන්නාවූ දුර්ගති නම්වූ සංසාරය නොඉක්මවයි.

**6.** මහණෙනි, කාය විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ස්පර්ශයෝ ඇත්තාහ මහණෙනි, මෙය ආර්‍ය්‍ය විනයෙහි සමුද්‍රයයි කියනු ලැබේ. මෙහි මේ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝවැසිතෙම මහණ බමුණන් සහිතවූ දෙවි මිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාව බොහෝසෙයින් ගිලී නූල් ගුලියක් මෙන් පැටලී රෙදි වියන්නන්ගේ කැඳ දැමූ නූල් ගුලියක් මෙන් ගැටගැසී මුදුතණ බබුස්තණ පඳුරක් මෙන් අවුල්වී සැපයෙන් පහවූ විෂමව වැටෙන්නාවූ දුර්ගති නම් සංසාරය නොඉක්මවයි.

**7.** "මහණෙනි, මනො විඤ්ඤාණයෙන් දතයුතු ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ධර්මයෝ ඇත්තාහ. මහණෙනි, මෙය ආර්‍ය්‍ය විනයෙහි සමුද්‍රයයි කියනු ලැබේ. මෙහි මේ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලෝවැසිතෙම මහණ බමුණන් සහිතවූ දෙවිමිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාව බොහෝසෙයින් ගිලී නූල් ගුලියක් මෙන් පැටලී රෙදි වියන්නන්ගේ කැඳ දැමූ නූල් ගුලියක් මෙන් ගැටගැසී මුදුතණ බබුස්තණ පඳුරක් මෙන් අවුල්වී සැපයෙන් පහවූ විෂමව වැටෙන්නාවූ දුර්ගති නම් සංසාරය නොඉක්මවයි." (වදාළේය.)

(1) "යමෙකුගේ රාගයද ද්වෙෂයද අවිද්‍යාවද වළක්වන ලද්දාහුද, හෙතෙම කෙලෙස් නමැති සතුන් අල්වාගන්නවුන් සහිතවූ කෙලෙස් රකුසන් සහිතවූ ක්ලෙශ නමැති රළ භය සහිතවූ තරණය කිරීමට දුෂ්කරවූ මේ සමුද්‍රය තරණය කෙළේය.

(2) "ඇලීම ඉක්මවූ මරුවන් දුරුකළාවූ උපධි රහිතවූ දුක්ඛයන්ගේ අස්තයට ගියාවූ හෙතෙම නැවත ඉපදීමට සුදුසු බවට නොපැමිණෙයි. මාරයා මුළා කෙළේයයි කියමියි' (වදාළේය)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 3. බාලිසික සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 2 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, යම්සේ බිලීබාන්නෙක් ඇම සහිතවූ බිලිය ගැඹුරුවූ දියෙහි බහාලන්නේද, ඇම දුටුවාවූ එක්තරා මත්ස්‍යයෙක් එය ගිලින්නේය. මහණෙනි, මෙසේ වනාහි බිලීබාන්නාගේ බිලිය ගිල්ලාවූ විනාශයට පැමිණියාවූ ව්‍යසනයට පැමිණියාවූ ඒ මාලුවාට බිලීබාන්නාට කැමති දෙයක් කළ හැකිවේද, මහණෙනි, එපරිද්දෙන්ම ලොකයෙහි සත්වයන්ගේ විනාශය පිණිස ප්‍රාණීන්ගේ පීඩාව පිණිස මේ බිලීකටු සයක් වෙත්. ඒ කවර සයක්ද යත්,

3. "මහණෙනි, චක්ඛුවිඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම්කටයුතුවූ රූපයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට සතුටුවේද, එය ප්‍රියයයි මනාපයයි කියයිද, එහි ගැලීසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මාරයාගේ බිලීකටුව ගිල්ලාවූ විනාශයට පැමිණියාවූ, ව්‍යසනයට පැමිණියාවූ, මරුවාට කැමති දෙයක් කළහැකියෙක් වේයයි කියනු ලැබේ.

4. "මහණෙනි, සෝතවිඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම්කටයුතුවූ ශබ්දයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට සතුටුවේද, එය ප්‍රියයයි මනාපයයි කියයිද, එහි ගැලීසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මාරයාගේ බිලීකටුව ගිල්ලාවූ, විනාශයට පැමිණියාවූ, ව්‍යසනයට පැමිණියාවූ මරුවාට කැමති දෙයක් කළහැකියෙක් වේයයි කියනු ලැබේ.

5. "මහණෙනි, ඝාණවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ, ඇලුම්කටයුතුවූ, ගන්ධයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට සතුටුවේද, එය ප්‍රියයයි මනාපයයි කියයිද, එහි ගැලීසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මාරයාගේ බිලීකටුව ගිල්ලාවූ,

විනාශයට පැමිණියාවූ, ව්‍යසනයට පැමිණියාවූ, මරුවාට කැමති දෙයක් කළහැකියෙක් වේයයි කියනු ලැබේ.

6. "මහණෙනි, ජිව්හාවිඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ, ඇලුම් කටයුතුවූ, රසයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට සතුටුවේද, එය ප්‍රියයයි මනාපයයි කියයිද, එහි ගැලීසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මාරයාගේ බිලීකටුව ගිල්ලාවූ, විනාශයට පැමිණියාවූ, ව්‍යසනයට පැමිණියාවූ, මරුවාට කැමතිදෙයක් කළ හැකියෙක් වේයයි කියනු ලැබේ.

7. "මහණෙනි, කායවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කටයුතුවූ ස්පර්ශයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට සතුටුවේද, එය ප්‍රියයයි මනාපයයි කියයිද, එහි ගැලීසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මාරයාගේ බිලීකටුව ගිල්ලාවූ, විනාශයට පැමිණියාවූ, ව්‍යසනයට පැමිණියාවූ, මරුවාට කැමති දෙයක් කළහැකියෙක් වේයයි කියනු ලැබේ.

8. "මහණෙනි, මනොවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කටයුතුවූ, ධර්මයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට සතුටුවේද, එය ප්‍රියයයි මනාපයයි කියයිද, එහි ගැලීසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවාගේ බිලිය ගිල්ලාවූ, විනාශයට පැමිණියාවූ, ව්‍යසනයට පැමිණියාවූ, මරුවා විසින් කැමති දෙයක් කළහැක්කෙක් වේයයි කියනු ලැබේ.

9. "මහණෙනි, චක්ඛුවිඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කටයුතුවූ රූපයෝද, ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට සතුටු නොවේද, එය ප්‍රියයයි මනාපයයි නොකියයිද, එහි ගැලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවාගේ බිලිය නොගිල මාරයාගේ බිලිය බින්දේය. විනාශයට නොපැමිණියාවූ, ව්‍යසනයට නොපැමිණියාවූ, මරුවා විසින් කැමති දෙයක් කළහැක්කෙක් නොවේයයි කියනු ලැබේ.

10. "මහණෙනි, සෝතවිඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ, ඇලුම් කටයුතුවූ, ශබ්දයෝද, ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට සතුටු නොවේද, එය ප්‍රියයයි මනාපයයි නොකියයිද, එහි ගිලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවාගේ බිලිය නොගිල මාරයාගේ බිලිය බින්දේය. විනාශයට නොපැමිණියාවූ, ව්‍යසනයට නොපැමිණියාවූ, මරුවා විසින් කැමති දෙයක් කළහැක්කෙක් නොවේයයි කියනු ලැබේ.

11. 'මහණෙනි, ඝාණවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම්කටයුතුවූ ගන්ධයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට සතුටු නොවේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද, එහි ගිලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවාගේ බිලිය නොගිල මාරයාගේ බිලිය බින්දේය. විනාශයට නොපැමිණියාවූ, ව්‍යසනයට නොපැමිණියාවූ, මරුවා විසින් කැමති දෙයක් කළහැක්කෙක් නොවේයයි කියනු ලැබේ.

12. "මහණෙනි, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කටයුතුවූ, රසයෝද, ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට සතුටු නොවේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද, එහි ගිලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවාගේ බිලිය නොගිල මාරයාගේ බිලිය බින්දේය. විනාශයට නොපැමිණියාවූ, ව්‍යසනයට නොපැමිණියාවූ, මරුවා විසින් කැමති දෙයක් කළහැක්කෙක් නොවේයයි කියනු ලැබේ.

13. "මහණෙනි, කායවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ස්පර්ශයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට සතුටු නොවේද, එය ප්‍රියයයි මනාපයයි නොකියාද, එහි ගිලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මරුවාගේ බිලිය නොගිල මාරයාගේ බිලිය බින්දේය. විනාශයට නොපැමිණියාවූ,

ව්‍යසනයට නොපැමිණියාවූ, මරුවා විසින් කැමතිදෙයක් කළහැක්කෙක් නොවේයයි කියනු ලැබේ.

14. “මහණෙනි, මනොවිඤ්ඤාණයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රියස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ ධර්මයෝ ඇත්තාහ. ඉදින් භික්ෂුතෙම එයට සතුටු නොවේද, එහි ගැලී නොසිටීද, මහණෙනි, මේ භික්ෂුතෙම මාරයාගේ නොගිලිනලද බිලිය ඇත්තේ බිලිය බින්දේය. විනාශයට නොපැමිණ ව්‍යසනයට නොපැමිණ මරුවා විසින් කැමති දෙයක් කළ හැක්කෙක් නොවේයයි (වදාළේය.)

---

## 4. ඛීරරුක්ඛ සූත්‍රය.

(මේ සූත්‍රයද, මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2 “මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ චක්ඛුවිඤ්ඤාණයෙන් දතයුතුවූ රූපයන් කෙරෙහි යම් රාගයක් වේද, එය ඇත්තේද, යම් ද්වෙෂයක් වේද, එය ඇත්තේද, යම් මොහයක් වේද, එය ඇත්තේද, යම් රාගයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, යම් ද්වෙෂයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, යම් මොහයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, ඔහුගේ ඇසට අනිෂ්ටවූද චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ රූපයෝ හමුවෙද්ද, ඔහුගේ සිත විනාශකරන්නාහුය. ඉෂ්ටාරම්මණය ගැන කියනුම කවරේද, ඊට හේතු කවරේද යත් මහණෙනි, යම් රාගයක් වේද, එය ඇත්තේය. යම් ද්වෙෂයක් වේද, එය ඇත්තේය. යම් මොහයක් වේද, එය ඇත්තේය. යම් රාගයක් වේද, එය ප්‍රහීණ නොවූයේය. යම් ද්වෙෂයක් වේද, එය ප්‍රහීණ නොවූයේය. යම් මොහයක් වේද, එය ප්‍රහීණ නොවූයේය. (එහෙයිනි)

3. “මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ සෝත විඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දයන් කෙරෙහි යම් රාගයක් වේද, එය ඇත්තේද, යම් මොහයක් වේද, එය ඇත්තේද, යම් රාගයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, යම් ද්වෙෂයක් වේද,

එය ප්‍රහීණ නොවූයේද, යම් මොහයක් වේද, එය ප්‍රහීණ නොවූයේද ඔහුගේ කණට අනිෂ්ටවූද සෝත විඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දයෝ හමුවෙද්ද ඔහුගේ සිත විනාශ කරන්නාහුය. ඉෂ්ටාරම්මණ ගැන කියනුම කවරේද, ඊට හේතු කවරේදයත්, මහණෙනි, යම් රාගයක් වේද, එය ඇත්තේය. යම් ද්වෙෂයක් වේද, එය ඇත්තේය. යම් මොහයක් වේද, එය ඇත්තේය. යම් රාගයක් වේද, එය ප්‍රහීණ නොවූයේය. යම් ද්වෙෂයක් වේද, එය ප්‍රහීණ නොවූයේය. යම් මොහයක් වේද, එය ප්‍රහීණ නොවූයේය.

4. "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධයන් කෙරෙහි යම් රාගයක් වේද, එය ඇත්තේද, යම් ද්වෙෂයක් වේද, එය ඇත්තේද, යම් මොහයක් වේද, එය ඇත්තේද, යම් රාගයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, යම් ද්වෙෂයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, ඔහුගේ නාසයට අනිෂ්ටවූද ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධයෝ හමුවෙද්ද ඔහුගේ සිත විනාශකරන්නාහුය. ඉෂ්ටාරම්මණ ගැන කියනුම කවරේද, ඊට හේතු කවරේද යත් මහණෙනි, යම් රාගයක් වේද, එය ඇත්තේය. යම් ද්වෙෂයක් වේද, එය ඇත්තේය. යම් මොහයක් වේද, එය ඇත්තේය. යම් රාගයක් වේද, එය ප්‍රහීණ නොවූයේය. යම් ද්වෙෂයක් වේද එය ප්‍රහීණ නොවූයේය. යම් මොහයක් වේද, එය ප්‍රහීණ නොවූයේය. (එහෙයිනි)

5. "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසයන් කෙරෙහි යම් රාගයක් වේද, යම් ද්වෙෂයක් වේද, එය ඇත්තේද, යම් මොහයක් වේද, එය ඇත්තේද, යම් රාගයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, යම් ද්වෙෂයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, යම් මොහයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, ඔහුගේ දිවට අනිෂ්ටවූද ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසයෝ හමුවෙද්ද, ඔහුගේ සිත විනාශ කරන්නාහුය. ඉෂ්ටාරම්මණ ගැන කියනුම කවරේද, ඊට හේතු කවරේදයත්, මහණෙනි, යම් රාගයක් වේද, එය ඇත්තේය. යම්

ද්වෙෂයක් වේද, එය ඇත්තේය. යම් මොහයක් වේද, එය ඇත්තේය. යම් රාගයක් වේද, එය ප්‍රහීණ නොවූයේය. යම් ද්වෙෂයක් වේද, එය ප්‍රහීණ නොවූයේය. යම් මොහයක් වේද, එය ප්‍රහීණ නොවූයේය.

**6.** "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ ස්පර්ශයන් කෙරෙහි යම් රාගයක් වේද, එය ඇත්තේද, යම් ද්වෙෂයක් වේද, එය ඇත්තේද, යම් මොහයක් වේද, එය ඇත්තේද, යම් රාගයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, යම් ද්වෙෂයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, යම් මොහයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, ඔහුගේ කයට අනිෂ්ටවූද කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ ස්පර්ශයෝ හමුවෙද්ද ඔහුගේ සිත විනාශ කරන්නාහුය. ඉෂ්ටාරම්මණ ගැන කියනුම කවරේද, ඊට හේතු කවරේදයත්, මහණෙනි, යම් රාගයක් වේද, එය ඇත්තේය. යම් ද්වෙෂයක් වේද, එය ඇත්තේය. යම් මොහයක් වේද, එය ඇත්තේය. යම් රාගයක් වේද, එය ප්‍රහීණ නොවූයේය. යම් ද්වෙෂයක් වේද, එය ප්‍රහීණ නොවූයේය. යම් මොහයක් වේද, එය ප්‍රහීණ නොවූයේය.

**7.** "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ මනෝවිඥ්ඥාණයෙන් දතයුතුවූ ධර්මයන් කෙරෙහි යම් රාගයක් වේද, එය ඇත්තේද, යම් ද්වෙෂයක් වේද, එය ඇත්තේද, යම් මොහයක් වේද, එය ඇත්තේද, යම් රාගයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, යම් ද්වෙෂයක් වේද, එය ප්‍රහීණ නොවූයේද, ඔහුගේ සිතට අනිෂ්ටවූද, මනොවිඥානයෙන් දතයුතුවූ ධර්මයෝ හමුවෙත්ද, ඔහුගේ සිත විනාශ කරත්මය. ඉෂ්ටවූ අරමුණු ගැන කියනුම කවරේද, ඊට හේතු කවරේදයත්, මහණෙනි, යම් රාගයක් වේද, ඒ ඇත්තේය. යම් ද්වෙෂයක් වේද, ඒ ඇත්තේය. යම් මොහයක් වේද, ඒ ඇත්තේය. යම් රාගයක් වේද, ඒ ප්‍රහීණ නොවූයේය. යම් ද්වෙෂයක් වේද, ඒ ප්‍රහීණ නොවූයේය. යම් මොහයක් වේද, ඒ ප්‍රහීණ නොවූයේය.

**8.** "මහණෙනි, ඇසතු හෝ නුග ගෝ පුලිල හෝ දිඹුල් හෝ තරුණවූ ලපටිවූ කිරි ඇති ගසක් වේද, එය පුරුෂයෙක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

තෙම තියුණුවූ කෙටේරියෙන් යම් ඒ තැනකින් සිඳින්නේ නම් කිරි ගලන්නේද?"-"එසේය, ස්වාමීනි."

"ඊට හේතු කවරේද?"-"ස්වාමීනි, යම් කිරක් වේද, එය ඇති හෙයිනි."

**9.** "මහණෙනි, එපරිද්දෙන්ම (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදයේ සිට 7 වෙනි ඡේදය අවසානය දක්වා යොදාගත යුතුයි.)

**15.** "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ රූපයන් කෙරෙහි යම් රාගයෙක් වේනම්, ඒ නැත්තේද, යම් ද්වෙෂයෙක් වේනම් ඒ නැත්තේද, යම් මොහයෙක් වේනම් ඒ නැත්තේද, යම් රාගයෙක් වේනම්, එය ප්‍රහීණවූයේද, යම් ද්වෙෂයෙක් වේනම්, එය ප්‍රහීණවූයේද, යම් මොහයෙක් වේනම්, එය ප්‍රහීණවූයේද ඔහුගේ ඇසට ඉදින් ඉෂ්ටවූද චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ රූපයෝ හමුවෙත්ද, ඔහුගේ සිත විනාශ නොකරත්මය. අනිෂ්ට රූපයක් ගැන කියනුම කවරේද, ඊට හේතු කවරේදයත්, මහණෙනි, යම් රාගයෙක් වේද, ඒ නැත්තේය. යම් ද්වෙෂයෙක් වේද, ඒ නැත්තේය. යම් මොහයෙක් වේද, ඒ නැත්තේය. යම් රාගයක් වේද, එය ප්‍රහීණවූයේය යම් ද්වෙෂයෙක් වේද, එය ප්‍රහීණවූයේය. යම් මොහයෙක් වේද, එය ප්‍රහීණ වූයේය. (එහෙයිනි)

**16.** "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ සෝත විඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දයන් කෙරෙහි යම් රාගයෙක් වේනම්, ඒ නැත්තේද, යම් ද්වෙෂයෙක් වේනම් ඒ නැත්තේද, යම් මොහයෙන් වේනම් ඒ නැත්තේද, යම් රාගයෙක් වේනම්, එය ප්‍රහීණවූයේද, යම් ද්වෙෂයෙක් වේනම්, එය ප්‍රහීණවූයේද, යම් මොහයෙක් වේනම් එය ප්‍රහීණවූයේද, ඔහුගේ කණට ඉදින් ඉෂ්ටවූද, සෝත විඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දයෝ හමුවෙත්ද, ඔහුගේ සිත විනාශ නොකරත්මය. අනිෂ්ටවූ ශබ්දයක් ගැන කියනුම කවරේද, ඊට හේතු කවරේද යත්, මහණෙනි, යම් රාගයෙක් වේද, ඒ නැත්තේය. යම් ද්වෙෂයෙක් වේද, ඒ නැත්තේය. යම් මොහයෙක් වේද, ඒ නැත්තේය. යම් රාගයෙක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

වේද, එය ප්‍රහීණවූයේය. යම් ද්වෙෂයෙක් වේද, එය ප්‍රහීණවූයේය. යම් මොහයෙක් වේද, එය ප්‍රහීණවූයේය.

17. "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධයන් කෙරෙහි යම් රාගයෙක් වේනම්, ඒ නැත්තේද, යම් ද්වෙෂයෙක් වේනම් ඒ නැත්තේද, යම් මොහයෙක් වේනම් ඒ නැත්තේද, යම් රාගයෙක් වේනම්, එය ප්‍රහීණවූයේද, යම් ද්වෙෂයෙක් වේනම්, එය ප්‍රහීණවූයේද, යම් මොහයෙක් වේනම්. එය ප්‍රහීණවූයේද, ඔහුගේ නාසයට ඉදින් ඉෂ්ටවූද ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධයෝ හමුවෙත්ද, ඔහුගේ සිත විනාශ නොකරත්මය. අනිෂ්ටවූ ගන්ධයක් ගැන කියනුම කවරේද, ඊට හේතු කවරේද යත්, මහණෙනි, යම් රාගයෙක්වේද, ඒ නැත්තේය. යම් ද්වෙෂයෙක් වේද, ඒ නැත්තේය. යම් මොහයෙක් වේද, ඒ නැත්තේය. යම් රාගයෙක් වේද, එය ප්‍රහීණවූයේය. යම් ද්වෙෂයෙක් වේද, එය ප්‍රහීණවූයේය. යම් මොහයෙක් වේද, එය ප්‍රහීණවූයේය.

18. "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසයන් කෙරෙහි යම් රාගයෙක් වේනම්, ඒ නැත්තේද, යම් ද්වෙෂයෙක් වේනම් ඒ නැත්තේද, යම් මොහයෙක් වේනම් ඒ නැත්තේද, යම් රාගයෙක් වේනම්, එය ප්‍රහීණවූයේද, යම් ද්වෙෂයෙක් වේනම් එය ප්‍රහීණවූයේද, යම් මොහයෙක් වේනම් එය ප්‍රහීණවූයේද, ඔහුගේ දිවට ඉදින් ඉෂ්ටවූද, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසයෝ හමුවෙත්ද, ඔහුගේ සිත විනාශ නොකරත්මය. අනිෂ්ටවූ රසයක් ගැන කියනුම කවරේද, ඊට හේතු කවරේද යත්, මහණෙනි, යම් රාගයෙක් වේද, ඒ නැත්තේය. යම් ද්වෙෂයෙක් වේද, ඒ නැත්තේය. යම් මොහයෙක් වේද, ඒ නැත්තේය. යම් රාගයක් වේද, එය ප්‍රහීණවූයේය. යම් ද්වෙෂයෙක් වේද, එය ප්‍රහීණවූයේය. යම් මොහයෙක් වේද, එය ප්‍රහීණවූයේය.

19. "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ස්පර්ශයන් කෙරෙහි යම්

රාගයෙක් වේනම්, ඒ නැත්තේද, යම් ද්වෙෂයෙක් වේනම් ඒ නැත්තේද, යම් මොහයෙක් වේනම් ඒ නැත්තේද, යම් රාගයෙක් වේනම්, එය ප්‍රහීණවූයේද, යම් ද්වෙෂයෙක් වේනම් එය ප්‍රහීණවූයේද, යම් මොහයෙක් වේනම් එය ප්‍රහීණවූයේද, ඔහුගේ කයට ඉදින් ඉෂ්ටවූද කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ ස්පර්ශයෝ හමුවෙත්ද, ඔහුගේ සිත විනාශ නොකරත්මය. අනිෂ්ටවූ ස්පර්ශයක් ගැන කියනුම කවරේද, ඊට හේතු කවරේදයත්, මහණෙනි, යම් රාගයෙක් වේද, ඒ නැත්තේය. යම් ද්වෙෂයෙක් වේද, ඒ නැත්තේය. යම් මොහයෙක් වේද, ඒ නැත්තේය. යම් රාගයක් වේද, එය ප්‍රහීණ වූයේය. යම් ද්වෙෂයෙක් වේද, එය ප්‍රහීණ වූයේය. යම් මොහයෙක් වේද, එය ප්‍රහීණ වූයේය.

**20.** "මහණෙනි, යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ මනොවිඥ්ඥාණයෙන් දතයුතුවූ ධර්මයන් කෙරෙහි යම් රාගයෙක් වේනම් ඒ නැත්තේද, යම් ද්වෙෂයෙක් වේනම් ඒ නැත්තේද, යම් මොහයෙන් වේනම් ඒ නැත්තේද, යම් රාගයක් වේනම් ඒ ප්‍රහීණ වූයේද, යම් ද්වෙෂයෙක් වේනම් ඒ ප්‍රහීණවූයේද, යම් මොහයක් වේනම් ඒ ප්‍රහීණවූයේද, ඉදින් ඔහුගේ සිතට ඉෂ්ටවූද මනොවිඥ්ඥාණයෙන් දතයුතුවූ ධර්මයෝ හමුවෙද්ද මොහුගේ සිත විනාශ නොකරත්. අනිෂ්ටවූ ධර්මාරම්මණයන් ගැන කියනුම කවරේද, ඊට හේතු කවරේදයත්? මහණෙනි, යම් රාගයෙක් වේනම් ඒ නැත්තේය. යම් ද්වෙෂයෙක් වේනම් ඒ නැත්තේය. යම් මොහයක් වේනම් ඒ නැත්තේය. යම් රාගයක් වේනම් ඒ ප්‍රහීණවූයේය. යම් ද්වෙෂයෙක් වේනම් ඒ ප්‍රහීණවූයේය. යම් මොහයක් වේනම් ඒ ප්‍රහීණවූයේය.

**21.** "මහණෙනි, යම්සේ ඇසතු හෝ නුග හෝ පුලිල හෝ දිඹුල් හෝ වියලුනාවූ මැළවුනාවූ දිරාගියාවූ කිරි ගසක් වේද, එය පුරුෂයෙක් තියුණුවූ කෙටේරියෙන් යම් ඒ තැනක් සිඳින්නේ නම්, කිරි එන්නේද?"- "ස්වාමීනි, එය නොවේමැයි"

"ඊට හේතු කවරේද?"-"ස්වාමීනි, යම් කිරක්වී නම් එය නැති හෙයිනි."

22. (මෙහි මේ සූත්‍රයේ 15 වෙනි ඡේදයේ සිට 20 වෙනි ඡේදයේ අවසානය දක්වා යොදාගත යුතුයි.)

---

## 5. කොට්ඨිත සූත්‍රය.

1 මා විසින් මෙසේ අසන ලදී. එක කලෙක්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙමේද, ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිර තෙමේද බරණැස් නුවර මිගදාය නම්වූ ඉසිපතනාරාමයෙහි වාසය කෙරෙත්. ඉක්බිති ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරතෙමේ සවස් වේලෙහි ඵලසමවතින් නැගීසිටියේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරතෙමේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරතෙමේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ට මෙය සැල කෙළේය.

"ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, කිමෙක්ද?

2. "ඇස රූපයන්ගේ සංයොජනය වේද, රූපයෝ ඇසට සංයෝජන වෙත්ද? කණ ශබ්දයන්ගේ සංයෝජනය වේද, ශබ්දයෝ කණට සංයෝජන වේද? නාසය ගන්ධයන්ගේ සංයෝජනයවේද, ගන්ධයෝ නාසයට සංයෝජනවේද, දිව රසයන්ගේ සංයෝජන වේද, රස දිවට සංයෝජන වේද, කය ස්පර්ශයන්ගේ සංයෝජන වේද, ස්පර්ශයෝ කයට සංයෝජන වේද? සිත ධර්මයන්ට සංයෝජනය වේද, ධර්මයෝ සිතට සංයෝජන වෙත්ද?" කියායි.

3. "ආයුෂ්මත් කොට්ඨිත ස්ථවිරයෙනි, ඇස රූපයන්ගේ සංයෝජන නොවේ. රූපයෝ ඇසට සංයෝජන නොවෙත්. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, ඒ එහි සංයෝජනය වේ.

"කණ ශබ්දයන්ගේ සංයෝජන නොවේ. ශබ්දයෝ කණට සංයෝජන නොවෙත්. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, ඒ එහි සංයෝජනය වේ.

"නාසය ගන්ධයන්ගේ සංයෝජන නොවේ. ගන්ධයෝ නාසයට සංයෝජන නොවෙත්. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, ඒ එහි සංයෝජනය වේ.

"දිව රසයන්ගේ සංයෝජනය නොවේ. රසයෝ දිවට සංයෝජන නොවෙත්. එහි ඒ දෙක නිසා ඡන්දරාගයකුත් වේද, එය එහි සංයෝජනය වේ.

"කය ස්පර්ශයන්ගේ සංයෝජනය නොවේ. ස්පර්ශයෝ කයට සංයෝජන නොවෙත්. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, ඒ එහි සංයෝජනය වේ.

"සිත ධර්මයන්ගේ සංයෝජනය නොවේ. ධර්මයෝ සිතට සංයෝජන නොවෙත්. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, ඒ එහි සංයෝජනය වේ.

4. "ඇවැත්නි, යම්සේ කළු ගවයෙක්ද, සුදු ගවයෙක්ද, එක දම්වැලකින් හෝ ලණුවකින් හෝ බඳින ලද්දාහු වන්නාහුද, යමෙක් වනාහි කළු ගවයා සුදු ගවයාට බන්ධනය වෙයි. සුදු ගවයා කළු ගවයාට බන්ධනය වෙයි' කියන්නේ නම් හෙතෙම සත්‍යයක් කියන්නේද?"-"ඇවැත්නි, එය නොවේමැයි."

"ඇවැත්නි, කලු ගවයා සුදු ගවයාගේ බන්ධනය නොවේ. සුදු ගවයා කලු ගවයාගේ බන්ධනය නොවේ. ඔවුහු යම් එක දම්වැලකින් හෝ එක් ලණුවකින් හෝ බඳින ලද්දාහුද, එය එහි සංයෝජනය (බන්ධනය) වේ.

5 "ඇවැත්නි, එපරිද්දෙන්ම ඇස රූපයන්ගේ බන්ධනය නොවේ. රූපයෝ ඇසට සංයොජන (බන්ධන) නොවෙත්. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, එය එහි සංයොජනය වේ.

"කණ ශබ්දයන්ගේ බන්ධනය නොවේ ශබ්දයෝ කණට සංයෝජන (බන්ධන) නොවෙත්. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, එය එහි සංයෝජනයවේ

"නාසය ගන්ධයන්ගේ බන්ධනය නොවේ. ගන්ධයෝ නාසයට සංයෝජන (බන්ධන) නොවෙත්. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, එය එහි සංයෝජනය වේ.

"දිව රසයන්ගේ බන්ධනය නොවේ. රසයෝ දිවට සංයෝජන නොවෙත්. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, එය එහි සංයෝජනයවේ.

"කය ස්පර්ශයන්ගේ බන්ධනය නොවේ. ස්පර්ශයෝ කයට සංයෝජන (බන්ධන) නොවෙත්. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, එය එහි සංයෝජනයවේ.

"සිත ධර්මයන්ට සංයෝජන නොවේ. ධර්මයෝ සිතට සංයෝජන (බන්ධන) නොවෙත්. එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, එය එහි සංයෝජනය වේ.

**6.** "ඇවැත්නි, ඇස හෝ රූපයන්ගේ සංයෝජනය වන්නේ නම් රූප හෝ ඇසට සංයෝජනය වන්නේ නම් මේ බ්‍රහ්මචාර්‍යයාවෙහි විසීම මනාව දුක් නැති කිරීම පිණිස නො පෙනෙන්නේය. ඇවැත්නි, යම් හෙයකින් ඇස රූපයන්ට සංයෝජන නොවේද, රූපයෝ ඇසට සංයෝජන නොවෙත්ද එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, ඒ එහි සංයෝජනය වේද, එහෙයින් බ්‍රහ්මචර්‍යයාවාසය මනාව දුක් නැති කිරීම පිණිස පෙනෙයි.

"ඇවැත්නි, කණ හෝ ශබ්දයන්ගේ සංයෝජනය වන්නේ නම් ශබ්ද හෝ කණට සංයෝජනය වන්නේ නම් මේ බ්‍රහ්මචර්‍යයාවෙහි විසීම මනාව දුක් නැති කිරීම පිණිස නොපෙනෙන්නේය. ඇවැත්නි, යම්හෙයකින් කණ ශබ්දයන්ට සංයොජන නොවෙත්ද, ශබ්දයෝ කණට සංයොජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, ඒ එහි සංයෝජනය වේද, එහෙයින් බ්‍රහ්මචර්‍යයාවාසය මනාව දුක් නැති කිරීම පිණිස පෙනෙයි.

"ඇවැත්නි, නාසය හෝ ගන්ධයන්ගේ සංයෝජනය වන්නේ නම් ගන්ධ හෝ නාසයට සංයෝජනය වන්නේනම් මේ බ්‍රහ්මචර්‍යයාවෙහි විසීම මනාව දුක් නැති කිරීම පිණිස නොපෙනෙන්නේය. ඇවැත්නි, යම් හෙයකින් නාසය ගන්ධයන්ට සංයෝජන නොවේද, ගන්ධයෝ නාසයට

සංයෝජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, ඒ එහි සංයෝජනය වේද, එහෙයින් බ්‍රහ්මචර්‍ය්‍යාවාසය මනාව දුක් නැතිකිරීම පිණිස පෙනෙයි.

"ඇවැත්නි, දිව හෝ රසයන්ගේ සංයෝජනය වන්නේ නම් රස හෝ දිවට සංයෝජනය වන්නේ නම්, මනාව දුක් නැති කිරීම පිණිස මේ බ්‍රහ්මචර්‍ය්‍යාවාසය නොපෙනෙන්නේය. යම් හෙයකින් දිව රසයන්ට සංයොජන නොවේද, රසයෝ දිවට සංයෝජනය නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, ඒ එහි සංයෝජනය වේද, එහෙයින් බ්‍රහ්මචර්‍ය්‍යාවාසය මනාව දුක් නැති කිරීම පිණිස පෙනේ.

"ඇවැත්නි, කය හෝ ස්පර්ශයන්ගේ සංයෝජනය වන්නේ නම් ස්පර්ශ හෝ කයට සංයෝජනය වන්නේ නම් මේ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි විසීම මනාව දුක් නැති කිරීම පිණිස නොපෙනෙන්නේය. ඇවැත්නි, යම් හෙයකින් කය ස්පර්ශයන්ට සංයොජන නොවේද, ස්පර්ශයෝ කයට සංයොජනය නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, ඒ එහි සංයෝජනය වේද, එහෙයින් බ්‍රහ්මචර්‍ය්‍යාවාසය මනාව දුක් නැති කිරීම පිණිස පෙනෙයි.

"ඇවැත්නි, සිත හෝ ධර්මයන්ට සංයොජනය වන්නේ නම් ධර්මයෝ හෝ සිතට සංයොජන වෙත් නම් මේ බ්‍රහ්මචර්‍ය්‍යාවාසය මනාව දුක් නැති කිරීම පිණිස නොපෙනෙන්නේය. ඇවැත්නි, යම් හෙයකින් සිත ධර්මයන්ට සංයොජන නොවේද, ධර්මයෝ සිතට සංයොජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, එය එහි සංයොජන වේද, එහෙයින් බ්‍රහ්මචර්‍ය්‍යාවාසය මනාව දුක් නැසීම පිණිස පෙනේ.

7. "ඇවැත්නි, ඒ මේ කාරණයෙනුත් මෙය දතයුතුයි. යම්සේ ඇස රූපයන්ට සංයෝජන නොවේද, රූපයෝ ඇසට සංයොජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, එය එහි සංයොජනය වේ.

"ඇවැත්නි, ඒ මේ කාරණයෙනුත් මෙය දතයුතුයි යම්සේ කණ ශබ්දයන්ට සංයොජන නොවේද, ශබ්දයෝ කණට සංයොජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, එය එහි සංයොජනය වේ.

"ඇවැත්නි, ඒ මේ කාරණයෙනුත් මෙය දතයුතුයි. යම්සේ නාසය ගන්ධයන්ට සංයොජන නොවේද, ගන්ධයෝ නාසයට සංයොජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, එය එහි සංයොජනය වේ.

"ඇවැත්නි, ඒ මේ කාරණයෙනුත් මෙය දතයුතුයි. යම්සේ දිව රසයන්ට සංයොජන නොවේද, රසයෝ දිවට සංයොජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, එය එහි සංයොජනය වේ.

"ඇවැත්නි, ඒ මේ කාරණයෙනුත් මෙය දතයුතුයි. යම්සේ කය ස්පර්ශයන්ට සංයෝජන නොවේද, ස්පර්ශයෝ කයට සංයෝජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, එය එහි සංයොජනය වේ.

"ඇවැත්නි, ඒ මේ කාරණයෙනුත් මෙය දතයුතුයි. යම්සේ සිත ධර්මයන්ට සංයොජන නොවේද, ධර්මයෝ සිතට සංයොජන නොවේද, එහි ඒ දෙක නිසා මම් ඡන්දරාගයක් උපදීද, ඒ එහි සංයොජනය වේ.

8. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේට ඇස විද්‍යමාන වේ. භාග්‍යවතුන් වහන්සේ ඇසින් රූප දකිත්. භාග්‍යවතුන් වහන්සේට ඡන්දරාගයක් නැත්තේය. භාග්‍යවතුන් වහන්සේ කෙලෙසුන් කෙරෙන් මිදුනු සිත් ඇතිසේක.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේට කණ විද්‍යමානවේ. භාග්‍යවතුන් වහන්සේ කණින් ශබ්ද අසත්. භාග්‍යවතුන් වහන්සේට ඡන්දරාගයක් නැත්තේය. භාග්‍යවතුන් වහන්සේ කෙලෙසුන් කෙරෙන් මිදුනු සිත් ඇතිසේක.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේට නාසය විද්‍යමානවේ. භාග්‍යවතුන් වහන්සේ නාසයෙන් ගන්ධයන් ආඝ්‍රාණය කරත්.

භාග්‍යවතුන් වහන්සේට ඡන්දරාගයක් නැත්තේය. භාග්‍යවතුන් වහන්සේ කෙලෙසුන් කෙරෙන් මිදුනු සිත් ඇතිසේක.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේට දිව ඇත්තේමය. භාග්‍යවතුන් වහන්සේ දිවෙන් රස විඳිත්. භාග්‍යවතුන් වහන්සේට ඡන්දරාගයක් නැත්තේය. භාග්‍යවතුන් වහන්සේ කෙලෙසුන්ගෙන් මිදුනේ වේ.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේට කය විද්‍යමානවේ. භාග්‍යවතුන්වහන්සේ කයෙන් ස්පර්ශය කරත්. භාග්‍යවතුන් වහන්සේට ඡන්දරාගයක් නැත්තේය. භාග්‍යවතුන් වහන්සේ කෙලෙසුන් කෙරෙන් මිදුනු සිත් ඇතිසේක.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේට සිත ඇත්තේය. භාග්‍යවතුන් වහන්සේ සිතින් ධර්මාරමුණු දනිත්. භාග්‍යවතුන් වහන්සේට ඡන්දරාගය නැත්තේය. භාග්‍යවතුන් වහන්සේ කෙලෙසුන්ගෙන් මිදුණු සිත් ඇත්තාහ.

**9.** "ඇවැත්නි, මේ ප්‍රකාරයෙන්ද, මෙය දතයුතුයි. යම්සේ ඇස රූපයන්ට සංයොජන නොවේද, රූපයෝ ඇසට සංයොජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, ඒ එහි සංයොජනය වේද,

"යම්සේ කණ ශබ්දයන්ට සංයොජන නොවේද, ශබ්දයෝ කණට සංයොජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, ඒ එහි සංයෝජනය වේද,

"යම්සේ නාසය ගන්ධයන්ට සංයොජන නොවේද, ගන්ධයෝ නාසයට සංයොජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, ඒ එහි සංයෝජනය වේද,

"යම්සේ දිව රසයන්ට සංයොජන නොවේද, රසයෝ දිවට සංයොජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, ඒ එහි සංයෝජනය වේද,

"යම්සේ කය ස්පර්ශයන්ට සංයොජන නොවේද, ස්පර්ශයෝ කයට සංයොජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයකුත් උපදීද, ඒ එහි සංයෝජනය වේද,

"යම්සේ සිත ධර්මයන්ගේ සංයොජන නොවේද, ධර්මයෝ සිතට සංයොජන නොවෙත්ද, එහි ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදීද, ඒ එහි සංයෝජනය වේයයි" වදාළේය.

---

## 6. කාමභූ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් කාමභූ ස්ථවිරයන් වහන්සේද කොසඹෑනුවර ඝෝසිතාරාමයෙහි වාසය කරති. ඉක්බිති ආයුෂ්මත් කාමභූ ස්ථවිරතෙමේ සවස් වේලෙහි විවේකයෙන් නැගී සිටියේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එක්පසෙක උන්නේය. එක්පසෙක උන්නාවූ ආයුෂ්මත් කාමභූ ස්ථවිරතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙය සැලකෙළේය.

"ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයෙනි, කිමෙක්ද?

2. මෙහි මේ වර්ගයේ 5 වෙනි සූත්‍රයවූ කොට්ඨිත සූත්‍රයේ 2, 3, 4, 5 ඡේද යොදාගත යුතුයි 3 වෙනි ඡේදයේ කොට්ඨිත ස්ථවිරයෙනි,' වෙනුවට 'කාමභූ ස්ථවිරයෙනි' කියා යොදාගත යුතුයි.)

## 7. උදායී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේද ආයුෂ්මත් උදායී ස්ථවිර තෙමේද කොසඹෑනුවර ඝොසිතාරාමයෙහි වාසය කෙරෙත්. ඉක්බිති ආයුෂ්මත් උදායී ස්ථවිර තෙම සවස් වේලෙහි විවේකයෙන් නැගීසිටියේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම යම්තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවූයේය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එක්පසෙක උන්නේය. එක්පසෙක උන්නාවූ

ආයුෂ්මත් උදායී ස්ථවිර තෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙය සැලකෙළේය.

2. "ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයෙනි, මේ ආකාරයෙන්ද මේ ශරීරය අනාත්මයයි භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ශරීරය නොයෙක් ප්‍රකාරයෙන් වදාරණ ලද්දේද, විවෘත කරණ ලද්දේද, ප්‍රකාශ කරණ ලද්දේද, එපරිද්දෙන් මෙසේද මේ විඥ්ඥාණය අනාත්මයයි දක්වන්ට දෙශනා කරන්ට පණවන්ට පිහිටුවන්ට විවරණය කරන්ට විභාග කරන්ට ප්‍රකට කරන්ට හැක්කේද?"

3. "ආයුෂ්මත් උදායී ස්ථවිරයෙනි, මේ ශරීරය භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේද, මේ ශරීරය අනාත්මයයි නොයෙක් ආකාරයෙන් යම් පරිද්දෙකින් වදාරණ ලද්දේද, විවෘත කරණ ලද්දේද, ප්‍රකාශ කරණ ලද්දේද, එපරිද්දෙන් මෙසේද, මේ විඥ්ඥාණය අනාත්මයයි දක්වන්ට දෙශනා කරන්ට පණවන්ට පිහිටුවන්ට විවෘත කරන්ට විභාග කරන්ට ප්‍රකට කරන්ට හැක්කේය.

4. "ඇවැත්නි, ඇසද රූපයන්ද නිසා චක්ඛු විඥ්ඥාණය උපදීද?"-"ඇවැත්නි, එසේය"

"ඇවැත්නි, චක්ඛු විඥ්ඥාණයාගේ ඉපදීමට යමක් හෙතුවේද, යමක් ප්‍රත්‍ය වේද, ඒ හෙතුවද ඒ ප්‍රත්‍යයද සියලු ආකාරයෙන් සර්වප්‍රකාරයෙන් ඉතිරි නොවී නිරුද්ධවන්නේ නම් කිම එකල්හි චක්ඛු විඥානයක් දක්නහුද?"-"ඇවැත්නි, එය නොවේමැයි"

"ඇවැත්නි, මේ ආකාරයෙන්ද භාග්‍යවතුන් වහන්සේ විසින් මේ විඥ්ඥාණය මෙසේද අනාත්මයයි, මෙය වදාරණ ලදී. විවෘත කරණ ලදී. ප්‍රකාශ කරණ ලදී.

"ඇවැත්නි, කණද, ශබ්දයන්ද, නිසා සොත විඥ්ඥාණය උපදීද?" "ඇවැත්නි එසේය"

"ඇවැත්නි, සොත විඥ්ඥාණයාගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද සියලු ආකාරයෙන් සර්වප්‍රකාරයෙන් ඉතිරි නොවී නිරුද්ධවන්නේ නම්

කිම එකල්හි සෝත විඥ්ඥාණයක් දක්නහුද?" "ඇවැත්නි එය නොවේමැයි."

"ඇවැත්නි, මේ ආකාරයෙන්ද භාග්‍යවතුන් වහන්සේ විසින් මේ විඥ්ඥාණය මෙසේද අනාත්මයයි, මෙය වදාරණ ලදී. විවෘත කරණලදී. ප්‍රකාශකරණලදී.

"ඇවැත්නි, නාසයද, ගන්ධයන්ද, නිසා ඝාණ විඥ්ඥාණය උපදීද?" "ඇවැත්නි එසේය"

"ඇවැත්නි ඝාණ විඥ්ඥාණයාගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද සියලු ආකාරයෙන් සර්වප්‍රකාරයෙන් ඉතිරි නොවී නිරුද්ධවන්නේ නම් කිම එකල්හි ඝාණ විඥ්ඥාණයක් දක්නහුද?" "ඇවැත්නි, එය නොවේමැයි."

"ඇවැත්නි, මේ ආකාරයෙන්ද භාග්‍යවතුන් වහන්සේ විසින් මේ විඥ්ඥාණය මෙසේද අනාත්මයයි, මෙය වදාරණ ලදී. විවෘත කරණලදී. ප්‍රකාශ කරණලදී.

"ඇවැත්නි දිවද රසයන්ද නිසා ජිව්හා විඥ්ඥාණය උපදීද?" "ඇවැත්නි එසේය."

"ඇවැත්නි, ජිව්හා විඥ්ඥාණයාගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද සියලු ආකාරයෙන් සර්වප්‍රකාරයෙන් ඉතිරි නොවී නිරුද්ධවන්නේ නම් කිම එකල්හි ජිව්හා විඥානයක් දක්නහුද?" "ඇවැත්නි ඒ නොවේමැයි."

"ඇවැත්නි, මෙය මේ ආකාරයෙන්ද භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේද මේ විඥානය අනාත්මයයි වදාරණ ලදී. විවෘත කරණලදී. ප්‍රකාශ කරණලදී.

"ඇවැත්නි, කයද ස්පර්ශයන්ද නිසා කාය විඥ්ඥාණය උපදීද?" "ඇවැත්නි එසේය"

"ඇවැත්නි කාය විඥ්ඥාණයාගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද සියලු ආකාරයෙන්

සර්වප්‍රකාරයෙන් ඉතිරි නොවී නිරුද්ධ වන්නේ නම් කිම එකල්හි කාය විඥානයක් දක්නාහුද?" "ඇවැත්නි එය නොවේමැයි"

"ඇවැත්නි, මේ ආකාරයෙන්ද භාග්‍යවතුන් වහන්සේ විසින් මේ විඤ්ඤාණය මෙසේද අනාත්මයයි, මෙය වදාරණ ලදී. විවෘතකරණලදී. ප්‍රකාශ කරණලදී.

"ඇවැත්නි, සිතද ධර්මයන්ද නිසා මනො විඤ්ඤාණය උපදීද?" "ඇවැත්නි එසේය"

"ඇවැත්නි, මනො විඤ්ඤාණයාගේ ඉපදීමට යමක් හේතුවේද, යමක් ප්‍රත්‍යවේද, ඒ හේතුවද ඒ ප්‍රත්‍යයද සියලු ආකාරයෙන් සර්වප්‍රකාරයෙන් නිරුද්ධ වන්නේ නම්, කිම එකල්හි මනො විඤ්ඤාණයක් දක්නහුද?" "ඇවැත්නි, ඒ නොවේමැයි."

"ඇවැත්නි, මේ ආකාරයෙන්ද, මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ ද මේ විඤ්ඤාණය අනාත්මයයි වදාරණලදී. විවෘත කරණලදී. ප්‍රකාශ කරණලදී.

**5.** "ඇවැත්නි, යම්සේ හරයෙන් ප්‍රයෝජන ඇත්තාවූ හරය සොයන්නාවූ හරය සෙවීමෙහි හැසිරෙන්නාවූ පුරුෂයෙක් තෙම තියුණු වූ කෙටේරියක් ගෙණ වනයට ඇතුල් වන්නේද හෙතෙම එහි ඍජුව අළුත්වූ නොපීදුනාවූ කෙසෙල් කඳක් දක්නේද, එය මුලින් සිඳින්නේය. මුලින් සිඳ අගින් සිඳින්නේය. අග සිඳ පත්වැටි (පතුරු) නගන්නේය. හෙතෙම එහි එලයකුත් නොලබන්නේය. කොයින් හරයක් ලබන්නේද, ඇවැත්නි එපරිද්දෙන්ම භික්ෂුතෙම සැවැදෑරුම් වූ ස්පර්ශ ආයතනයන්හි තමාද නොම දකියි. තමාගේ දෙයක්ද නොම දකියි. හෙතෙම මෙසේ නොදක්නේ ලොකයෙහි කිසිවක් තෘෂ්ණාවෙන් දැඩිකොට අල්වා නොගනියි. තෘෂ්ණාවෙන් දැඩිකොට අල්වා නොගන්නේ නොඇලෙයි. නොඇලෙන්නේ තමාම පිරිනිවෙයි. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය. සතර මගින් කළ යුතු දෙය කරණලදී. මෙයින් අන්‍ය ආත්මභාවයක් නැතැයි දැනගණීයයි" (වදාළේය).

---

## 8. ආදිත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරණ සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, තොපට ආදිත්තපරියාය නම් වූ ධර්ම දෙශනාවක් කරන්නෙමි. එය අසව්. මහණෙනි, ආදිත්ත පරියාය නම් වූ ධර්ම දෙශනාව කවරේද?

"මහණෙනි, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු වූ රූපයන් කෙරෙහි අත්ලක්ෂණය පාලක්ෂණය යනාදීන් සටහන් ගැනීමට වඩා ඇවිලගන්නාවූ දිලිසෙන්නාවූ ගිනිදැල් සහිතවූ රත්වූ යකඩ කූරකින් ඇස හාරා දැමීම උතුම්.

මහණෙනි, ශරීරය ලක්ෂණයයි සටහන් ආශ්වාදනය කිරීමෙහි බැඳුණාවූ අත්පාදිය ලක්ෂණයයි ගන්නා හෝ ආශ්වාදනය කිරීමෙහි බැඳුණාවූ හෝ සිත පවත්නේද ඉදින් ඒ කාලයෙහි කළුරිය කරන්නේ නම් නිරය හෝ තිරිසන් යොනිය හෝ යන ගති දෙක අතුරෙන් යම් එක්තරා ගතියකට පැමිණෙන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ. මහණෙනි, මම මේ දොෂය දැක මෙසේ කියමි.

4. "මහණෙනි, සොතවිඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දයන් කෙරෙහි ශබ්දය මිහිරිය යනාදී වශයෙන් නිමිති ගැණීමට වඩා ඇවිලගත්තාවූ දිළිසෙන්නාවූ ගිනිදැල් සහිතවූ තියුණුවූ යකඩ හුලක් කන් පසාරු කරගෙන යනසේ ගැසීම උතුම්.

මහණෙනි, නිමිති ආශ්වාදනය කිරීමෙහි බැඳුණාවූ හෝ කුඩා ලකුණු වශයෙන් ආශ්වාදනය කිරීමෙහි බැඳුනාවූ හෝ විඤ්ඤාණය පවත්නේද, ඉදින් ඒ කාලයෙහි කළුරිය කරන්නේ නම් නිරය හෝ තිරිසන් යෝනිය හෝ යන ගති දෙක අතුරෙන්

එක්තරා යම්ගතියකට පැමිණෙන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ. මහණෙනි, මම මේ දොෂය දැක මෙසේ කියමි.

5 "මහණෙනි, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධයන් විෂයෙහි සුවඳය මිහිරිය යනාදි වශයෙන් නිමිති ගැණීමට වඩා ඇවිලගන්නාවූ දිලිසෙන්නාවූ ගිනිදැල් සහිත වූ නියනකින් නාසය උළුප්පා දැමීම උතුම්.

මහණෙනි, නිමිති ආශ්වාදනය කිරීමෙහි බැඳුනාවූ හෝ කුඩා ලකුණු ආශ්වාදනය කිරීමෙහි බැඳුනාවූ විඤ්ඤාණය පවත්නේද, ඉදින් ඒ කාලයෙහි කළුරිය කරන්නේ නම් නිරය හෝ තිරිසන් යෝනිය හෝ යන ගති දෙක අතුරෙන් යම් එක්තරා ගතියකට පැමිණෙන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ. මහණෙනි, මම මේ දොෂය දැක මෙසේ කියමි.

6. "මහණෙනි, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසයන් කෙරෙහි රසය මධුරය යනාදි වශයෙන් ගැනීමට වඩා ඇවිලගත්තාවූ දිලිසෙන්නාවූ ගිනිදැල් සහිතවූ සියුම්වූ දැලිපිහියකින් දිව කපා දැමීම උතුම්. මහණෙනි, නිමිති ආශ්වාදය කිරීමෙහි බැඳුනාවූ කුඩා ලකුණු වශයෙන් රස විඳීමෙහි බැඳුනාවූ හෝ විඥානය පවත්නේද, ඉදින් ඒ කාලයෙහි කළුරිය කරන්නේ නම් නිරය හෝ තිරිසන් යෝනිය හෝ යන ගති දෙක අතුරෙන් යම් එක්තරා ගතියකට පැමිණෙන්නේය. යන මේ කාරණය විද්‍යමාන වේ. මහණෙනි, මම මේ දොෂය දැක මෙසේ කියමි.

7. "මහණෙනි, කාය විඥානයෙන් දතයුතුවූ ස්පර්ශයන් කෙරෙහි මෘදුය මොලොක්ය යනාදීන් නිමිති ගැණීමට වඩා ඇවිලගත්තාවූ දිලිසෙන්නාවූ ගිනිදැල් සහිතවූ තියුණුවූ මහත්වූ වෑයකින් කය හැස දැමීම උතුම්.

මහණෙනි, නිමිති ආශ්වාදය කිරීමෙහි බැඳුනාවූ හෝ කුඩා සලකුණු වශයෙන් ආශ්වාද කිරීමෙහි බැඳුනාවූ හෝ විඥානය පවත්නේද, ඉදින් ඒ කාලයෙහි කළුරිය කරන්නේ නම් නිරය හෝ තිරිසන් යොනිය හෝ යන ගති දෙක අතුරෙන් යම් එක්තරා ගතියකට පැමිණෙන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ. මහණෙනි, මම මේ දොෂය දැක මෙසේ කියමි.

8. 'මහණෙනි, නිදාගැණීම උතුම්. මහණෙනි, නිදාගැනීම වනාහි මම ජීවිතයාගේ වඳවීමයයි කියමි. ජීවිතයාගේ නිශ්චල භාවයයි කියමි. ජීවිතයාගේ මුළාවීමකැයි කියමි. යම්බඳු වූ විතර්කයන්ගේ වසඟයට ගියේ සංඝයා බිඳුවන්නේද එබඳු වූ විතර්කයන් කල්පනා කිරීම එතරම්ද නොවටනේය. මහණෙනි, මම මේ දොෂය දැක මෙසේ කියමි.

9. "මහණෙනි එහි ශ්‍රැතවත් ආයඝ්‍යශ්‍රාවකතෙම මෙසේ සලකයි. 'ඇවිලගත්තාවූ දිලිසෙන්නාවූ ගිනිදැල් සහිතවූ රත්වූ යකඩකූරකින් ඇස හාරා දැමීම තිබේවා. මම එයම මෙනෙහි කරමි. මෙසේ ඇස අනිත්‍යය. රූපයෝ අනිත්‍යයෝය. චක්ඛුවිඤ්ඤාණය අනිත්‍යය. චක්ඛුසම්ඵස්සය අනිත්‍යය. චක්ඛු සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද. එයද අනිත්‍යයි.

"ඇවිලගත්තාවූ දිලිසෙන්නාවූ, ගිනිදැල් සහිතවූ තියුණුවූ යකඩ හුලකින් කණ පසාකිරීම තිබේවා, මම මෙයම මෙනෙහි කරමි. කණ මෙසේ අනිත්‍යය. ශබ්දයෝ අනිත්‍යයෝය. සොත විඤ්ඤාණය අනිත්‍යය. සොතසම්ඵස්සය අනිත්‍යය. සොතසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි.

"ඇවිලගත්තාවූ දිලිසෙන්නාවූ ගිනිදැල් සහිතවූ තියුණුවූ නියනකින් නාසය උපුටා දැමීම තිබේවා. මම මෙයම මෙනෙහි කරමි. මෙසේ නාසය අනිත්‍යය. ගන්ධයෝ අනිත්‍යයෝය. ඝාණ විඥානය අනිත්‍යය. ඝාණ සම්ඵස්සය අනිත්‍යය ඝාණ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි.

"ඇවිලගත්තාවූ දිලිසෙන්නාවූ ගිනිදැල් සහිතවූ තියුණුවූ දැළිපිහියකින් දිව කපා දැමීම තිබේවා, මම මෙයම මෙනෙහි කරමි. මෙසේ දිව අනිත්‍යය. රසයෝ අනිත්‍යයෝය. ජිව්හා විඤ්ඤාණය අනිත්‍යය. ජිව්හාසම්ඵස්සය අනිත්‍යය. ජිව්හාසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිත්‍යයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඇවිලගත්තාවූ දිලිසෙන්නාවූ ගිනි දැල් සහිතවූ තියුණුවූ මහත් වෑයකින් කය හැස දැමීම තිබේවා, මම මෙයම මෙනෙහි කරමි. මෙසේ කය අනිත්‍යය. ස්පර්ශයෝ අනිත්‍යයෝය. කාය විඤ්ඤාණය අනිත්‍යය. කාය සම්ඵස්සය අනිත්‍යය කායසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, මෙයද අනිත්‍යයයි.

"වැදහෙව නිදාගැණීම තිබේවා. මම මෙයම මෙනෙහි කරමි. මෙසේ සිත අනිත්‍යය. ධර්මයෝ අනිත්‍යයෝය. මනො විඤ්ඤාණය අනිත්‍යය. මනොසම්ඵස්සය අනිත්‍යය. මනො සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වෙදනාවක් උපදීද, මෙයද අනිත්‍යයයි.

**10.** "මහණෙනි, මෙසේ දක්නාවූ ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙම ඇස කෙරෙහිද කලකිරෙයි. රූපයන් කෙරෙහිද කලකිරෙයි. චක්ඛු විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. චක්ඛු සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි.

කණ කෙරෙහිද කලකිරෙයි. ශබ්දයන් කෙරෙහිද කලකිරෙයි. සොත විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. සෝත සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි.

නාසය කෙරෙහිද කලකිරෙයි. ගන්ධයන් කෙරෙහිද කලකිරෙයි. ඝාණ විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. ඝාණ සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි.

දිව කෙරෙහිද කලකිරෙයි. රසයන් කෙරෙහිද කලකිරෙයි. ජිව්හා විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි.

කය කෙරෙහිද කලකිරෙයි. ස්පර්ශයන් කෙරෙහිද කලකිරෙයි. කාය විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. කාය සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි.

සිත කෙරෙහිද කලකිරෙයි. ධර්මයන් කෙරෙහිද කලකිරෙයි. මනෝ විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. මනෝ සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි.

මනොසම්ඵස්සය නිසා සැපවූ හෝ දුක්වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එය කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇල්මෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම වේ. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය. සතර මාර්ගයෙන් කළයුත්ත කරණ ලදී. මෙයින් අන්‍යවූ අනික් ආත්මභාවයක් නැතැයි දැනගනියි. මහණෙනි, මේ වනාහි ආදිත්තපරියාය නම්වූ ධර්මදෙශනාව වේයයි" (වදාළේය.)

---

## 9. හත්ථපාදූපමා සූත්‍රය (1)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, අත්දෙක ඇතිකල්හි ගැණීම බහාතැබීම පැනෙයි. පා දෙක ඇතිකල්හි ඉදිරියට යාම පසු බැසීම පැනෙයි. හන්දි ඇතිකල්හි හැකිලීම දිගහැරීම පැනෙයි. කුස (බඩ) ඇතිකල්හි බඩගිනි පිපාස දෙක පැනෙයි.

3. "මහණෙනි එපරිද්දෙන්ම ඇස ඇති කල්හි චක්ඛු සම්ඵස්සය හෙතුකොටගෙන තමා තුළ සැප හා දුක උපදියි.

"කණ ඇතිකල්හි සෝත සම්ඵස්සය හේතුකොටගෙන තමා තුළ සැප හා දුක උපදියි.

"නාසය ඇති කල්හි ඝාණ සම්ඵස්සය හේතුකොටගෙන තමා තුළ සැප හා දුක උපදියි.

"දිව ඇතිකල්හි ජිව්හා සම්ඵස්සය හේතුකොටගෙන තමා තුළ සැප හා දුක උපදියි.

"කය ඇති කල්හි කායසම්ඵස්සය හේතුකොටගෙන තමා තුළ සැප හා දුක උපදියි.

"සිත ඇති කල්හි, මනො සම්ඵස්සය හේතුකොටගෙන තමා තුළ සැප හා දුක උපදියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, අත් දෙක නැතිකල්හි ගැණීම බහා තැබීම නොපැනෙයි. පාදෙක නැති කල්හි ඉදිරියට යාම පස්සට යාම නොපැනෙයි. හන්දි නැති කල්හි හැකිලීම දිගහැරීම නොපැනෙයි. කුස නැතිකල්හි බඩගිනි පිපාස දෙක නොපැනෙයි.

5. "මහණෙනි, එපරිද්දෙන්ම ඇස නැති කල්හි චක්ඛු සම්ඵස්සය නිසා තමා තුළ සැප දුක නූපදියි. කණ නැති කල්හි සෝතසම්ඵස්සය නිසා තමා තුළ සැප හා දුක නූපදියි. නාසය නැති කල්හි ඝාණසම්ඵස්සය නිසා තමා තුළ සැප හා දුක නූපදියි. දිව නැති කල්හි ජිව්හාසම්ඵස්සය නිසා තමා තුළ සැප හා දුක නූපදියි. කය නැතිකල්හි කාය සම්ඵස්සය නිසා තමා තුළ සැප හා දුක නූපදියි. සිත නැතිකල්හි මනො සම්ඵස්සය හේතුකොටගෙන තමා තුළ සැප හා දුක නූපදීයයි" (වදාළේය.)

---

## 10. හත්ථපාදූපමා සූත්‍රය. (2)

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. මහණෙනි, අත් දෙක ඇතිකල්හි ගැණීම බහා තැබීම වේද, පාදෙක ඇතිකල්හි ඉදිරියට යාම ආපසු යාම වේද, හන්දි ඇතිකල්හි හැකිලීම දිගහැරීම වේද, කුස ඇතිකල්හි සා පිපාස දෙක වේද,

3. (මේ ඡේදය මේ වර්ගයේ 9 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

4. "මහණෙනි අත් දෙක නැතිකල්හි ගැණීම බහා තැබීම නොවේද, පාදෙක නැතිකල්හි ඉදිරියට යාම පස්සට යාම නොවේද, හන්දි නැතිකල්හි හැකිලීම දිගහැරීම නොවේද, කුස නැතිකල්හි සා පිපාසා දෙක නොවේද,

5. (මේ ඡේදය මේ වර්ගයේ 9 වෙනි සූත්‍රයේ 5 වෙනි ඡේදය මෙනි.)

(තුන්වෙනි සමුද්ද වර්ගය නිමි.)

---

# 4 ආසිවිස වර්ගය.

## 1 ආසිවිසි සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති එක්තරා භික්ෂුවක්තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක උන්නේය. එක් පසෙක උන්නාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළේය.

2. "මහණෙනි, යම්සේ බලවත් උග්‍රවිෂ ඇත්තාවූ දරුණු විෂ ඇත්තාවූ සර්පයෝ සතර දෙනෙක් වෙත්, ඉක්බිති ජීවත්වනු කැමැත්තාවූ නොමැරෙනු කැමැත්තාවූ සැප කැමැත්තාවූ දුක පිළිකුල් කරන්නාවූ පුරුෂයෙක් වන්නේය. ඔහුට මෙසේ කියන්නාහුය. 'පින්වත් පුරුෂය තොප විසින් උග්‍ර විෂ ඇත්තාවූ දරුණු විෂ ඇත්තාවූ මේ සර්පයෝ සතර දෙන කලින් කල නැගිටවිය යුත්තාහුය. කලින් කල නැහැවිය යුත්තාහුය. කලින් කල වැළඳවිය යුත්තාහුය. කලින් කල සයනය කරවිය යුත්තාහුය. පින්වත් පුරුෂය යම් කලෙක මේ උග්‍ර විෂ ඇත්තාවූ, දරුණු විෂ ඇත්තාවූ, සර්පයන් සතරදෙනාගෙන් එක්තරා එකෙක් තට කිපෙන්නේද, පින්වත් පුරුෂය, ඒ හේතුවෙන් නුඹ මරණයට හෝ මරණය සමාන දුකට හෝ පැමිණෙන්නේය. පින්වත් පුරුෂය, තොප විසින් යමක් කටයුතුද, එය කරව කියායි.

3. "මහණෙනි, එකල්හි ඒ පුරුෂ තෙම උග්‍ර විෂ ඇත්තාවූ දරුණු විෂ ඇත්තාවූ සර්පයන් සතරදෙනාට භයවී යම් ඒ

තැනකින් පැනයන්නේය. (ඉක්බිති) ඔහුට මෙසේ කියන්නාහුය. පින්වත් පුරුෂය, මේ තොපගේ පසුපස්සේ සතුරුවූ වධකයෝ පස් දෙනෙක් යම් තැනෙක්හිම ඔහු දක්නෙමුද, එතැන්හිම ඔහු දිවි තොර කරන්නෙමුයි, එලවා එන්නාහුය පින්වත් පුරුෂය, තොප විසින් යමක් කටයුතුද එය කරවයි කියායි.

4. "මහණෙනි, එකල්හි ඒ පුරුෂතෙම උග්‍ර විෂ ඇත්තාවූ දරුණු විෂ ඇත්තාවූ සර්පයන් සතරදෙනාට භයවී සතුරුවූ වධකයන් පස්දෙනාට භයවී යම් ඒ තැනකින් පැනයන්නේය. (ඉක්බිති) ඔහුට මෙසේ කියන්නාහුය. 'පින්වත් පුරුෂය, තොපගේ පසු පස්සේ ඔසවාගත් කඩුවක් ඇතිවූ සමීප ආශ්‍රය ඇති මේ හයවැනි වධකයෙක්ද යම් තැනකදී ඔහු දක්නෙම්ද, එතැනදීම ඔහුගේ හිස ගසා දමන්නෙමියි එලවා එන්නේ වෙයි. පින්වත් පුරුෂය, තොප විසින් යමක් කටයුතුද, එය කරවයි' යනුවෙනි.

5. "මහණෙනි, එකල්හි ඒ පුරුෂතෙම උග්‍ර විෂ ඇත්තාවූ ඝොර විෂ ඇත්තාවූ සර්පයන් සතරදෙනාට භයව සතුරු වධකයන් පස්දෙනාට භයව ඔසවාගත් කඩුවක් ඇති සමීප ආශ්‍රය ඇති වධකයාට භයව යම් ඒ තැනකින් පලායන්නේය, හෙතෙම හිස්වූ ගමක් දක්නේය. යම් ඒ ගෙයකට ඇතුල් වන්නේද, එය හිස්වූ ගෙයක්ම වන්නේය. කිසිවක් නැති ගෙයක්ම වන්නේය. ශූන්‍යවූ ගෙයක්ම වන්නේය. යම් ඒ භාජනයක් අල්වන්නේද, එය හිස්වූ භාජනයක්ම වන්නේය. කිසිවක් නැති භාජනයක් වන්නේය. ශූන්‍යවූ භාජනයක්ම වන්නේය. (ඉක්බිති) ඔහුට මෙසේ කියන්නාහුය. "පින්වත් පුරුෂය, දැන් මේ හිස්වූ ගම ගම්පහරණ සොරු වනසන්නාහුය. පින්වත් පුරුෂය, තොප විසින් යමක් කටයුතුද එය කරව' කියායි.

6. "මහණෙනි, ඉක්බිති ඒ පුරුෂතෙම උග්‍ර විෂ ඇත්තාවූ දරුණු විෂ ඇත්තාවූ නයි සතර දෙනාට භයව සතුරුවූ වධකයන් පස්දෙනාට භයව ඔසවාගත් කඩුවක් ඇති සමීපයෙහි හැසිරෙන්නාවූ හයවැනි වධකයාට භයව ගම්පහරණ සොරුන්ට භයව යම් ඒ තැනෙකින් හෝ පලා යන්නේය. හෙතෙම මෙතෙර

සැක සහිතවූ භය සහිතවූ එතෙර සැනසීම ඇත්තාවූ භයක් නැත්තාවූ එතර වියයුතු මහත් ජලයක් දක්නේය. මොහුට එතෙරවන්නාවූ ඔරුවක් හෝ එතෙරවන ඒදණ්ඩක් හෝ මෙතරින් එතරට යාමට නැත්තේය.

7. "මහණෙනි, ඉක්බිති ඒ පුරුෂයාට මෙබඳු අදහසක් වන්නේය. මේ මහා ජලයකි. මෙතෙර සැක සහිතය. භය සහිතය. එතෙර සැනසීම සහිතය. නිර්භයය. එතෙර වන්නාවූ ඔරුවක් හෝ එතෙරට යාමට ඒදණ්ඩක් හෝ නැත්තේය. මම උණ බට ලීදඬු අතු කොල එකතුකොට පහුරක් බැඳ ඒ පහුර අත් දෙකින්ද පා දෙකින්ද පදිමින් සුවසේ එතෙරට යන්නේ නම්, යෙහෙකැයි' කියායි.

8. "මහණෙනි, ඉක්බිති ඒ පුරුෂතෙම උණ බට ලීදඬු අතු කොල ආදිය එකතුකොට පහුරක් බැඳ ඒ පහුර අත් දෙකින්ද පා දෙකින්ද පදිමින් සුවසේ එතෙරට යන්නේය. එතෙරට ගියාවූ බ්‍රාහ්මණතෙම ගොඩබිම සිටියි.

9. "මහණෙනි, මා විසින් මේ උපමාව අර්ථ හැඟවීමට කරණලදී. මෙය මෙහි අර්ථය වන්නේය. මහණෙනි, උග්‍ර විෂ ඇත්තාවූ දරුණු විෂ ඇත්තාවූ නයි සතරදෙනා යනු පඨවි ධාතු, අපොධාතු, තෙජොධාතු, වායො ධාතු යන සතරමහා භූතයන්ට නමකි මහණෙනි, සතුරුවූ වධකයෝ පස්දෙනා යනු උපාදානස්කන්ධ පසට නමකි. එනම් රූප උපාදානස්කන්ධය, වෙදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය, (යනමොහුයි) මහණෙනි, ඔසවාගත් කඩුවක් ඇති සමීපයෙහි හැසිරෙන සවැනිවූ වධකයා යනු නන්දිරාගයට නමකි. මහණෙනි, හිස්ගම යනු සවැදෑරුම්වූ අධ්‍යාත්මික ආයතනයන්ට නමකි.

10. "මහණෙනි, පණ්ඩිතවූ, ව්‍යක්තවූ, නුවණැත්තාවූ භික්ෂුතෙම ඉදින් ඇසින් පරීක්ෂාකර බලන්නේ නම් සිස්වූවක්ම වැටහෙයි. කිසිත් නැතුවක්ම වැටහෙයි. ශූන්‍ය වූවක්ම වැටහෙයි.

මහණෙනි, පණ්ඩිතවූ, ව්‍යක්තවූ, නුවණැත්තාවූ භික්ෂුතෙම ඉදින් කණින් පරීක්ෂාකර බලන්නේ නම් සිස් වූවක්ම වැටහෙයි. කිසිත් නැතුවක්ම වැටහෙයි. ශූන්‍යවූවක්ම වැටහෙයි. මහණෙනි, පණ්ඩිතවූ, ව්‍යක්තවූ, නුවණැත්තාවූ භික්ෂුතෙම ඉදින් නාසයෙන් පරීක්ෂාකර බලන්නේ නම් සිස්වූවක්ම වැටහෙයි. කිසිත් නැතුවක්ම වැටහෙයි. ශූන්‍යවූවක්ම වැටහෙයි. මහණෙනි, පණ්ඩිතවූ, ව්‍යක්තවූ, නුවණැත්තාවූ භික්ෂුතෙම ඉදින් දිවෙන් පරීක්ෂාකර බලන්නේ නම් සිස්වූවක්ම වැටහෙයි. කිසිත් නැතුවක්ම වැටහෙයි. ශූන්‍යවූවක්ම වැටහෙයි මහණෙනි, පණ්ඩිතවූ, ව්‍යක්තවූ, නුවණැත්තාවූ භික්ෂුතෙම ඉදින් කයින් පරීක්ෂාකර බලන්නේ නම් සිස්වූවක්ම වැටහෙයි. කිසිත් නැතුවක්ම වැටහෙයි. ශූන්‍යවූවක්ම වැටහෙයි. මහණෙනි, ඉදින් ව්‍යක්තවූ නුවණැත්තාවූ පණ්ඩිත භික්ෂුතෙම සිත පරීක්ෂා කරයි නම් සිස්වූවක්ම වැටහෙයි. කිසිත් නැතුවක්ම වැටහෙයි. ශූන්‍යවූවක්ම වැටහෙයි.

11. "මහණෙනි, ගම් පහරණ සොරු යනු බාහිරවූ සවැදෑරුම්වූ ආයතනයන්ට නමකි. මහණෙනි, ඇස මනාප අමනාපවූ රූපයන්හි හැපෙයි. කණ මනාප අමනාප ශබ්දයන්හි හැපෙයි. නාසය මනාප අමනාප ගන්ධයන්හි හැපෙයි. දිව මනාප අමනාප රසයන්හි හැපෙයි. කය මනාප අමනාප ස්පර්ශයන්හි හැපෙයි. සිත මනාප අමනාප ධර්මයන්හි හැපෙයි.

12. "මහණෙනි, මහත් ජලය යනු සතර ඔඝයන්ට නමකි. එනම්, කාමඕඝය, භවඕඝය, දිට්ඨි ඕඝය සහ අවිජ්ජා ඕඝය, යන සතරයි. "මහණෙනි, සැක සහිතවූ භය සහිතවූ මෙතෙර යනු මමයයි ගන්නා පඤ්චස්කන්ධයට මේ නමකි. මහණෙනි, සැනසීම ඇති නිර්භයවූ එතෙර යනු නිර්වාණයට නමකි. මහණෙනි, පහුර යනු ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයට නමකි. එනම්, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොහුයි. මහණෙනි, අත් දෙකින්ද

පා දෙකින්ද පැදීම යනු වීයර්‍යයට නමකි. මහණෙනි, එතෙරෙහිවූ පරතෙරට ගියාවූ බ්‍රාහ්මණ තෙම ගොඩබිම සිටී යනු රහතුන් වහන්සේට නමකියි” (වදාළේය.)

---

## 2. රථ සූත්‍රය.

1. (මේ සූත්‍රය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. මහණෙනි, ධර්ම තුනකින් යුක්තවූ භික්ෂුතෙම මේ ආත්මයෙහිම සැප සොම්නස් බහුල කොට ඇතිව වාසය කරයි. ඔහු විසින් ආශ්‍රවයන් නැසීම පිණිස කාරණයද සම්පූර්ණ කරණ ලද්දේවෙයි. කවර ධර්ම තුනකින්ද යත්, ඉන්ද්‍රියයන් කෙරෙහි රක්නාලද දොරටු ඇත්තේවෙයිද, භොජනයෙහි පමණ දන්නේවෙයිද, නිදි දුරුකිරීමෙහි යෙදුනේවෙයිද (යන තුන වෙත්.)

3. “මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇත්තේවේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ඇසින් රූපයක් දැක නිමිති ගන්නේ නොවේද, කුඩා සටහන් ගන්නේ නොවේද, යම් හේතුවකින් චක්ඛු ඉන්ද්‍රියයෙහි සංවර රහිතව වාසය කරන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද, ඒ චක්ඛුඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදියි. චක්ඛුඉන්ද්‍රියය රකියි. චක්ඛුඉන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

“කණින් ශබ්දයක් අසා නිමිති ගන්නේ නොවේද, කුඩා සටහන් ගන්නේ නොවේද, යම් හේතුවකින් මේ සෝත ඉන්ද්‍රියයෙහි සංවර රහිතව වාසය කරන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද, ඒ සෝතඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදියි. සොතඉන්ද්‍රියය රකියි. සොතඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

"නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට නිමිති ගන්නේ නොවේද, කුඩා සටහන් ගන්නේ නොවේද, යම් හේතුවකින් මේ ඝාණඉන්ද්‍රියයෙහි සංවර රහිතව වාසය කරන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද, ඒ ඝාණඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදියි. ඝාණඉන්ද්‍රියය රකියි. ඝාණඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

"දිවෙන් රසයක් විඳ නිමිති ගන්නේ නොවේද, කුඩා සටහන් ගන්නේ නොවේද, යම් හේතුවකින් මේ ජිව්හා ඉන්ද්‍රියයෙහි සංවර රහිතව වාසය කරන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද, ඒ ජිව්හා ඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදියි. ජිව්හාඉන්ද්‍රියය රකියි. ජිව්හාඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

කයින් ස්පර්ශයක් ස්පර්ශකොට නිමිති ගන්නේ නොවේද, කුඩා සටහන් ගන්නේ නොවේද, යම් හේතුවකින් මේ කාය ඉන්ද්‍රියයෙහි සංවර රහිතව වාසය කරන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද, ඒ කායඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදියි. කායඉන්ද්‍රියය රකියි. කායඉන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

"සිතින් ධර්මයක් දැන නිමිතිගන්නේ නොවෙයිද, කුඩා ලකුණු ගන්නේ නොවෙයිද, යමක් හේතුකොටගෙන මේ මනින්ද්‍රියයෙහි අසංවරව වාසය කරන්නහුට විෂම ලෝභ දොම්නස් යන ලාමකවූ අකුසලකර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද, ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රිය රකියි. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

4 "මහණෙනි, යම්සේ සමභූමිය ඇති සතර මංසන්ධියක බහා තබන ලද කෙවිට ඇති ආජානීය අශ්වයන් යෙදූ රථයක් වන්නේද, අශ්වයන් දමනයකිරීමෙහි දක්ෂවූ සමර්ථවූ රථාචාර්‍යයෙක් ඒ රථයට නැග වම් අතින් රැහැන් ගෙණ දකුණතින් කෙවිට ගෙණ, යම් දිසාවකට කැමැතිද යම් තැනකට කැමතිද, එතැනට ගමන් කරවන්නේද, ආපසු ගමන්කරවන්නේද,

මහණෙනි එපරිද්දෙන්ම භික්ෂුතෙම මේ සවැදෑරුම්වූ ඉන්ද්‍රියයන්ගේ ආරක්ෂාව පිණිස හික්මෙයි. සංයමය පිණිස හික්මෙයි. දමනය පිණිස හික්මෙයි. සංසිඳීම පිණිස හික්මෙයි. මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇත්තේවෙයි.

**5.** මහණෙනි, භික්ෂුතෙම කෙසේ නම් භොජනයෙහි පමණ දන්නේවේද, මහණෙනි මේ ශාසනයෙහි භික්ෂුතෙම නුවණින් සලකා ආහාරය ගණියි. ක්‍රීඩා පිණිස නොවෙයි. මද වැඩීම පිණිස නොවෙයි. සැරසීම පිණිස නොවෙයි. අලංකාර කිරීම පිණිස නොවෙයි. මේ ශරීරයාගේ පැවැත්ම පිණිසම යැපීම පිණිසම විහිංසා වැළැක්ම පිණිසම බ්‍රහ්මචය්‍ය්‍යාවට අනුග්‍රහ පිණිසම වේ. මෙසේ (ආහාර ගැනීමෙන්) පුරාණ වේදනාවද නසමි. අළුත්වූ වේදනාද නූපදවන්නෙමි. මාගේ ජීවිත යාත්‍රාවද නිරවද්‍ය බවද පහසු විහරණයද වන්නේය යනුවෙනි.

**6.** "මහණෙනි යම්සේ පුරුෂයෙක් වැඩීම පිණිසම වනයක බෙහෙත් ගල්වන්නේද යම්සේ හෝ බර ඉසිලීම සඳහාම කඩඇණයට තෙල් දමන්නේද මහණෙනි, එමෙන්ම භික්ෂුතෙම නුවණින් සලකා ආහාරය ගණියි. ක්‍රීඩා පිණිස නොවෙයි. මද වැඩීම පිණිස නොවේ. සැරසීම පිණිස නොවේ. මේ ශරීරයාගේ පැවැත්ම පිණිසම යැපීම පිණිසම විහිංසා වැළැක්ම පිණිසම බ්‍රහ්මචය්‍ය්‍යාවට අනුග්‍රහ පිණිසම වේ. මෙසේ ආහාර වැළඳීමෙන් පුරාණ වේදනාද නසමි. අළුතවූ වේදනාද නූපදවන්නෙමි. මාගේ ජීවිත යාත්‍රාවද, නිරවද්‍ය බවද, පහසු විහරණද වන්නේය, යනුවෙනි. මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම භොජනයෙහි පමණ දන්නේවේ.

**7.** "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම නිදි දුරුකිරීමෙහි යෙදුනේවේද මහණෙනි මේ ශාසනයෙහි භික්ෂුතෙම (දාවල්) දවස සක්මනින්ද හිඳීමෙන්ද, නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි. රාත්‍රියෙහි පළමුවැනියාමය, සක්මනින්ද හිඳීමෙන්ද

නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි. රාත්‍රියෙහි මධ්‍යම යාමය, දකුණැලයෙන් දකුණු පයෙන් වම් පය මඳක් ඉක්මවා තබා සිහි ඇත්තේ නුවණ ඇත්තේ නැගිටිම් යන සංඥාව මෙනෙහි කොට උතුම් නිදීම (සිංහ සෙය්‍යාව) කරයි. රාත්‍රියෙහි අලුයම සයනයෙන් නැගිට සක්මනින්ද හිඳීමෙන්ද නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි. මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම නිදි දුරුකිරීමෙහි යෙදුනේවෙයි. මහණෙනි මේ ධර්ම තුනෙන් යුක්තවූ භික්ෂුතෙම මේ ආත්මයෙහිම සැප සොම්නස් බහුලකොට ඇතිව වාසය කරයි. මොහු විසින් ආශ්‍රවයන් නැසීම පිණිස පටන්ගන්නා ලද්දේයයි” (වදාළේය.)

---

### 3. කුම්ම සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** මහණෙනි, පෙරවූ දෙයක් කියමි. ඉදිබුවෙක් සවස් වේලෙහි ගංඉවුරක් සමීපයෙහි ගොදුරු සොයමින් ඇවිද්දේය. මහණෙනි, සිවලෙක්ද සවස් වේලෙහි ගංඉවුර සමීපයෙහි ගොදුරු සොයා ගියේය. මහණෙනි ඉදිබුවා ගොදුරු සොයා ගන්නාවූ සිවලා දුරදීම දුටුයේය. දැක හිස පස්වෙනි කොට ඇති අවයවයන් ස්වකීය කටුව තුළට ඇතුල්කොට දැඟලීමක් නැතිව නිශ්ශබ්දව සිටියේය. මහණෙනි, සිවලාද ඉදිබුවා දුරදීම දුටුයේය. දැක ඉදිබුවා යම් තැනෙක්හිද එතැනට ගියේය. ගොස් යම් කලෙක මේ ඉදිබුවා හිස පස්වෙනි කොට ඇති අවයවයන්ගෙන් යම් ඒ අවයවයක් හෝ පිටතට නිකුත් කෙරේද, එකල්හි එහිම එය ගෙණ කඩා කන්නෙමියි” ඉදිබුවාට ළංවී සිටියේය. මහණෙනි, යම් කලෙක වනාහි ඉදිබුවා හිස පස්වෙනිකොට ඇති අවයවයන්ගෙන් එක්තරා අවයවයක් හෝ පිටතට (නො) නික්මවීද, එකල්හි හිවල්තෙම ඉදිබුවා වෙතින් ඉඩක් නොලැබ කලකිරී බැහැර ගියේය.

3. "මහණෙනි, මෙපරිද්දෙන්ම තොපටද පවිටුවූ මාරතෙම නිරන්තරයෙන් 'මම මොවුන්ගේ ඇසින් හෝ ඉඩක් ලබන්නේ නම් යෙහෙක. කණින් හෝ ඉඩක් ලබන්නේ නම් යෙහෙක. නාසයෙන් හෝ ඉඩක් ලබන්නේ නම් යෙහෙක. දිවෙන් හෝ ඉඩක් ලබන්නේ නම් යෙහෙක. කයින් හෝ ඉඩක් ලබන්නේනම් යෙහෙක. සිතින් හෝ ඉඩක් ලබන්නේ නම්, යෙහෙකැයි ළංව සිටින්නේය.

4. "මහණෙනි, එහෙයින් මෙහි ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇතිව වාසය කරව්. ඇසින් රූපයක් දැක නිමිති ගන්නෝ නොවව්. කුඩා සටහන් ගන්නෝ නොවව්. යමක් හේතුකොටගෙන මේ චක්ඛුඉන්ද්‍රියයෙහි අසංවරව වාසය කරන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද එය සංවර කිරීම පිණිස පිළිපදිව්. චක්ඛුඉන්ද්‍රියය රකිව්. චක්ඛුඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව්.

කණින් ශබ්දයක් අසා නිමිති ගන්නෝ නොවව්. කුඩා ලකුණු ගන්නෝ නොවව්. යමක් හෙතුකොටගෙණ මේ සෝත ඉන්ද්‍රියයෙහි අසංවරව වාසය කරන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද එය සංවර කිරීම පිණිස පිළිපදිව්. සෝත ඉන්ද්‍රියය රකිව්. සෝතඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව්.

නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට නිමිති ගන්නෝ නොවව්. කුඩා ලකුණු ගන්නෝ නොවව්. යමක් හේතුකොටගෙණ මේ ඝාණඉන්ද්‍රියයෙහි අසංවරව වාසය කරන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද එය සංවර කිරීම පිණිස පිළිපදිව්. ඝාණ ඉන්ද්‍රියය රකිව්. ඝාණ ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව්.

"දිවෙන් රසයක් විඳ නිමිති ගන්නෝ නොවව්. කුඩා ලකුණු ගන්නෝ නොවව්. යමක් හේතුකොටගෙන මේ ජිව්හා

ඉන්ද්‍රියයෙහි අසංවරව වාසය කරන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද එය සංවර කිරීම පිණිස පිළිපදිව් ජිව්හා ඉන්ද්‍රියය රකිව්. ජිව්හාඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව්.

"කයින් ස්පර්ශයක් ස්පර්ශකොට නිමිති ගන්නෝ නොවව්. කුඩා ලකුණු ගන්නෝ නොවව්. යමක් හේතුකොටගෙන මේ කාය ඉන්ද්‍රියයෙහි අසංවරව වාසය කරන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද එය සංවරකිරීම පිණිස පිළිපදිව්. කාය ඉන්ද්‍රියය රකිව්. කාය ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව්.

"සිතින් ධර්මයක් දැන නිමිති ගන්නෝ නොවව්. කුඩා ලකුණු ගන්නෝ නොවව්. යමක් හේතුකොටගෙණ මේ මනින්ද්‍රියයෙහි සංවර රහිතව වාසය කරන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නාහුද එය සංවර කිරීම පිණිස පිළිපදිව්. මනින්ද්‍රියය රකිව්. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව්. මහණෙනි, යම් කලෙක්හි වනාහි තෙපි ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇතුව වාසය කරන්නහුද, එකල්හි තොපටද පවිටුවූ මාරයා කලකිරී ඉඩක් නොලැබ ඉදිබුවාගෙන් සිවලා මෙන් බැහැර ගන්නේය.'

"සිය කටුවෙහි අවයවයන් තැන්පත් කරන්නාවූ ඉදිබුවෙකු මෙන් මනොවිතර්කයන් ඇසුරු නොකරන්නාවූ අනුන්ට හිංසා නොකරන්නාවූ මහණතෙම පිරිනිවියාවූ කිසිවෙකුටත් උපවාද නොකරන්නේයයි" (දොස් නොකියන්නේයයි) වදාළේය.

---

## 4. දාරුක්ඛන්ධ සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ අයොධ්‍යා නම් නුවර ගංගානම් ගං ඉවුරෙහි වැඩ වසන සේක. භාග්‍යවතුන් වහන්සේ ගංගානම් නදියෙහි දිය

පහරින් ගසාගෙන යන්නාවූ මහත්වූ දර කඳක් දුටුසේක. දැක භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක.

2. "මහණෙනි ගංගානම් ගඟේ දිය පහරින් ගසාගෙන යන්නාවූ අර මහත්වූ දර කඳ තෙපි දක්නහුද?"-"එසේය, ස්වාමීනි."

3. "මහණෙනි, ඉදින් දර කඳ මෙතෙරට නොපැමිණේද එතෙරට නොපැමිණේද, ගඟ මැද නොගිලෙන්නේද, ගොඩට නොගසන්නේද, මනුෂ්‍යයන්ගේ ගැණීමක් නොවන්නේද, අමනුෂ්‍යයන්ගේ ගැණීමක් නොවන්නේද, දිය සුළියකට හසුනොවන්නේද, ඇතුළ කුණුවීමක් නොවන්නේද, මහණෙනි, මෙසේ වනාහි ඒ දරකඳ මුහුද කරා නැමුනේ වන්නේය. මුහුදට ගසා යන්නේ මුහුද දෙසට බරවූයේ වන්නේය. ඊට හේතු කවරේද, මහණෙනි, ගංගා නදියේ දිය පාර මුහුදට නැමීම ඇත්තේය. මුහුදට නැඹුරු වූයේය. මුහුදට බරවූයේ වේ.

4. "මහණෙනි, මෙපරිද්දෙන්ම ඉදින් තෙපිදු මෙතෙරට නොපැමිණෙන්නහුද, එතෙරට නොපැමිණෙන්නහුද, මැද නොගිලෙන්නහුද, ගොඩට නොනගින්නහුද, මනුෂ්‍යයන්ගේ ගැණීමක් නොවන්නහුද, අමනුෂ්‍යයන්ගේ ගැණීමෙක් නොවන්නහුද, දිය සුළියට අසු නොවන්නහුද, ඇතුළ කුණු නොවන්නහුද, මහණෙනි, එසේ තෙපි නිවනට නැමීම ඇත්තෝ නිවනට නැඹුරු වූවෝ නිවනට බරවූවෝ වන්නාහුය. ඊට හේතු කවරේද, මහණෙනි, සම්‍යක් දෘෂ්ටිය නිවනට නැමුණාවූ නිවන් කරා ගමන් කරන්නාවූ නිවනට නැඹුරුවූ ධර්මයකැයි" වදාළසේක.

5. මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය. "ස්වාමීනි, මෙතෙර නම් කුමක්ද එතෙර නම් කුමක්ද, මැද ගිලා බැසීම් නම් කුමක්ද, ගොඩට නැගීම නම් කුමක්ද, මිනිසුන්ගේ අල්වා ගැණීම නම් කුමක්ද, අමනුෂ්‍යයන්ගේ අල්වා ගැණීම නම් කුමක්ද, දිය සුළියට අසුවීම නම් කුමක්ද ඇතුළත කුණුවීම නම් කුමක්ද යනුයි.

**6.** "මහණ, මෙතෙර යනු සවැදෑරුම්වූ අධ්‍යාත්මිකවූ ආයතනයන්ට නමකි. මහණ, එතෙර යනු සවැදෑරුම් බාහිර ආයතනයන්ට නමකි. මහණ, මැද ගිලා බැසීම යනු නන්දි රාගයට නමකි. මහණ, ගොඩට නැගීම යනු අස්මිමානයට නමකි.

**7.** "මහණ, මිනිසුන්ගේ අල්වා ගැණීම නම් කවරේද, මේ ශාසනයෙහි භික්ෂුතෙම ගිහියන් සමග එකතුවී වාසය කෙරේද, සමග සතුටුවීම් ඇත්තේ, සමග සෝකවීම් ඇත්තේ සුවපත්වූ කල්හි සුවපත්වූයේ දුකට පත්වූ කල්හි දුකට පත්වූයේ උපන්නාවූ වැඩ කටයුතු ඇති කල්හි තෙමේම ඒ කටයුතුවල යෙදීමට පැමිණේද, මහණ, මෙය මිනිසුන් විසින් අල්වා ගැණීමයයි කියනු ලැබේ.

**8.** "මහණ, අමනුෂ්‍යයන්ගේ ගැණීම නම් කවරේද මහණ, මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනාකොට බ්‍රහ්මචර්‍ය්‍යාව රකීද, මම මේ සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍ය්‍යාවෙන් හෝ දෙවියෙක් හෝ වන්නෙමි. දෙවියන්ගෙන් එක්තරා අයෙක් හෝ වන්නෙමි කියායි. මහණ, මෙය අමනුෂ්‍යයන් විසින් අල්වා ගැණීමයයි කියනු ලැබේ.

"මහණ, දිය සුළියට අසුවීම යනු මේ පඤ්චකාම ගුණයන්ට නමකි.

**9.** "මහණ, ඇතුළත කුණුවීම නම් කවරේද, මහණ, මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් දුස්සීලවූයේ ලාමක ස්වභාව ඇත්තේ අපවිත්‍ර සැක කටයුතු හැසුරුම් ඇත්තේ, සැඟවුණු ක්‍රියා ඇත්තේ ශ්‍රමණ නොවූයේ ශ්‍රමණයාය යන ප්‍රතිඥා ඇත්තේ බ්‍රහ්මචාරී නොවූයේ බ්‍රහ්මචාරීය යන හැඟවීම ඇත්තේ ඇතුළත කුණුවූයේ කෙලෙස් වැගිරීම ඇත්තේ හටගත් කෙලෙස් කසල ඇත්තේවේද, මහණ, මෙය ඇතුළත කුණුවීමයයි කියනු ලැබේයයි" වදාළහ.

**10.** එසමයෙහි වනාහි නන්දනම් ගෝපාලතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි සිටියේ වෙයි. ඉක්බිති නන්ද නම්

ගෝපාලතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මම වනාහි මෙතෙරට නොපැමිණෙමි. එතෙරට නොපැමිණෙමි. මැද නොගිලෙන්නෙමි. ගොඩට නොනැගෙන්නෙමි. මිනිසුන්ට අසු නොවන්නෙමි. අමනුෂ්‍යයන්ට හසු නොවන්නෙමි. දිය සුළිවලට හසු නොවන්නෙමි. ඇතුළ කුණුවූවෙක් නොවන්නෙමි. ස්වාමීනි, මම භාග්‍යවතුන්වහන්සේ සමීපයෙහි මහණකමද, උපසම්පදාවද ලබන්නෙමි" (යනුයි.)

"නන්දය, එසේවීනම් නුඹ හිමියන්ට ගවයන් බාරදෙවයි" (වදාළේය.)

"ස්වාමීනි, වස්සන් කෙරෙහි ගිජුවූ දෙන්නු යන්නාහුයයි" (කීහ.)

"නන්දය, නුඹ විසින් හිමියන්ට ගවයන් බාරදීම කළ යුතුමයයි" (වදාළහ.)

11. ඉක්බිති නන්දනම් ගෝපාලතෙම හිමියන්ට ගවයන් බාරදී භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. ස්වාමීනි, හිමියන්ට ගවයෝ බාරදෙන ලදහ. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මහණකමද උපසම්පදාවද ලබන්නෙමියි" (කීය)

12. නන්දනම් ගෝපාලතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මහණකමද ලැබීය. උපසම්පදාවද ලැබීය. උපසපන්වූ නොබෝ කල් ඇත්තාවූ ආයුෂ්මත් නන්දතෙමේ එකලාවූයේ සමූහයාගෙන් වෙන්වූ වාසය ඇත්තේ අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව හරණලද ආත්මාලය ඇතිව වාසය කරමින් නොබෝ කලකින්ම යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොටම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවෙත්ද, බ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවරකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර නිමවන ලදී. සතර මගින් කළයුත්ත කරණලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු

අනිකක් නැතැයි විශෙෂයෙන් දැනගත්තේය. ආයුෂ්මත් නන්ද තෙමේ රහතුන්ගෙන් එක්තරා අයෙක් වූයේයයි (වදාළහ.)

---

## 5. දාරුක්ඛන්ධ සූත්‍රය. (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ කිම්බිලා නම් නුවර ගංගානම් ගං ඉවුරෙහි වැඩ වසන සේක. භාග්‍යවතුන් වහන්සේ ගංගා නම් ගඟේ දිය පහරින් ගසාගෙන යන්නාවූ මහත්වූ දර කඳක් දුටුසේක. දැක භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක.

2. "මහණෙනි, තෙපි ගංගානම් ගඟේ දිය පහරින් ගසාගෙන යන්නාවූ අර මහත්වූ දර කඳ දක්නාහුද?"-"එසේය, ස්වාමීනි."

(මෙහි මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 3, 4, 5, 6, 7, 8 ඡේද යොදාගත යුතුයි.)

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් කිම්බිල ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය. "ස්වාමීනි, මෙතෙර නම් කුමක්ද, එතෙර නම් කුමක්ද, මැද ගිලා බැසීම නම් කුමක්ද, ගොඩට නැඟීම නම් කුමක්ද, මිනිසුන්ගේ අල්වා ගැණීම නම් කුමක්ද අමනුෂ්‍යයන්ගේ අල්වා ගැණීම නම් කුමක්ද, දිය සුළියට අසුවීම නම් කුමක්ද ඇතුළත කුණුවීම නම් කුමක්ද යනුයි.

9. "කිම්බිලය, ඇතුළත කුණුවීම නම් කවරේද, කිම්බිලය, මේ ශාසනයෙහි භික්ෂුතෙම යම්බඳුවූ ඇවතකට පැමිණියේ වේද, යම්බඳුවූ ඇවතකින් නැඟී සිටිය යුතු බව පෙනේද, කිම්බිලය, මෙය ඇතුළත කුණුවීමැයි කියනු ලැබේයයි" වදාළහ.

---

## 6. අවස්සුත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයන්හි කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි

වැඩවසන සේක. එකල්හි වනාහි කිඹුල්වත්පුර වැසි ශාක්‍ය රජුන්ගේ අළුත්වූ සන්ථාගාර ශාලාව කරවනලද නොබෝ කල් ඇත්තේ වෙයි. ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ මනුෂ්‍යවූ කිසිවෙකු විසිනුත් නොවසන ලද්දේය. ඉක්බිති කිඹුල්වත්පුර වැසි ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක උන්හ. එක්පසෙක උන්නාවූ කිඹුල්වත්පුර වැසි ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළාහුය.

2. "ස්වාමීනි, මෙහි කිඹුල්වත් පුරවැසි ශාක්‍යයන්ගේ අළුත්වූ සන්ථාගාර ශාලාව කරවනලද නොබෝකල් ඇත්තේ වෙයි. ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ මනුෂ්‍යවූ කිසිවෙකු විසිනුත් නොවසන ලද්දේය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ එය පළමුව පරිභොග කරණසේක්වා. භාග්‍යවතුන් වහන්සේ විසින් පළමුව පරිභොග කරනලද කල්හි පසුව කිඹුල්වත්පුර වැසි ශාක්‍යයෝ පරිභොග කරන්නාහුය. එය කිඹුල්වත්පුර වැසි ශාක්‍යයන්ට බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වන්නේය" කියායි. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් ඉවසූසේක.

3. ඉක්බිති කිඹුල්වත් පුරවැසි ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගෞරවකොට අළුත්වූ සන්ථාගාර ශාලාව යම් තැනෙක්හිද එතැනට ගියාහුය. ගොස් සන්ථාගාර ශාලාව සියලු තන්හි ඇතිරිලි අතුරා අසුන් පණවා දියසැලක් තබ්බවා තෙල් පහන් දල්වා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට ගියාහුය. ගොස් භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළාහුය. "ස්වාමීනි, සන්ථාගාර ශාලාව සියලුතැන ඇතිරිලි අතුරණ ලදී. අසුන් පනවන ලදී. දියසැලි තබන ලද්දේය. තෙල් පහන් දල්වනලදී. භාග්‍යවතුන් වහන්සේ දැන් වැඩීමට කල් දන්නාසේක" යනුවෙනි

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැඳ පොරවා පාසිවුරු ගෙණ භික්ෂු සංඝයා සමග අළුත්වූ සන්ථාගාර ශාලාව යම් තැනෙක්හිද එතැනට වැඩිසේක. වැඩ පා සෝදා සන්ථාගාර ශාලාවට ඇතුල්ව මැදවූ කණුව ඇසුරුකොට නැගෙණහිරට මුහුණලා වැඩඋන්සේක. භික්ෂුසංඝයා පා සෝදා සන්ථාගාරයට ඇතුල්ව බස්නාහිර බිත්තිය ඇසුරුකොට නැගෙනහිරට මුහුණලා භාග්‍යවතුන් වහන්සේ පෙරටුකොට වැඩහුන්නේය. කිඹුල්වත්පුර වැසි ශාක්‍යයෝද පා සෝදා සන්ථාගාරයට ඇතුල්ව නැගෙණහිර බිත්තිය ඇසුරුකොට බස්නාහිරට මුහුණලා භාග්‍යවතුන් වහන්සේ පෙරටුකොට හුන්නාහුය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුර වැසි ශාක්‍යයන්ට රාත්‍රී බොහෝ වේලාවක්ම දැහැමිවූ කථාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තෙද ගන්වා සතුටු කරවා, ‘ගෞතමයෙනි, (ශාක්‍යයෙනි) රාත්‍රිය ඉක්ම ගියාය. යම් ගමනක් වේනම් ඊට දැන් කල් දනිව්යයි” වදාළසේක. “ස්වාමීනි, එසේයයි” කියා කිඹුල්වත්පුර වැසි ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී, හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගෞරවකොට ගියාහුය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුර වැසි ශාක්‍යයන් බැහැරගිය නොබෝ කල්හි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්ට කථාකළ සේක. “මොග්ගල්ලානයෙනි, භික්ෂුසංඝතෙම පහව ගියාවූ ථීනමිද්ධය (නිදිමත) ඇත්තේය. මොග්ගල්ලානය, භික්ෂූන්ට ධර්ම කථාවක් ප්‍රකාශ කෙරේවා, මාගේ පිට රුජා කෙරෙයි. එහෙයින් මම දිග හැරෙන්නෙමියි’ වදාළේය. “ස්වාමීනි, එසේයයි,” ආයුෂ්මත් මහා මොග්ගල්ලාන තෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සඟල සිවුර සතර ගුණකොට දකුණැලයෙන් දකුණු පයෙහි වම්පස මදක් ඉක්මවා තබා සිහියෙන් යුක්තව නුවණින් යුක්තව නැගිටිම් යන සංඥාව මෙනෙහිකොට ශ්‍රෙෂ්ඨවූ සයනය කළසේක.

6. එකල්හි වනාහි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම භික්ෂූන්ට “ඇවැත්” මහණෙනි කියා ආමන්ත්‍රණය

කෙළේය. "ඇවැත්නි" කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්ට පිළිතුරු දුන්හ. ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම මෙය වදාළේය. "ඇවැත්නි තොපට කෙලෙසුන්ගෙන් තෙත්වන ආකාරයද කෙලෙසුන්ගෙන් තෙත් නොවන ආකාරයද දේශනා කරන්නෙමි. එය අසව්.

7. "ඇවැත්නි, කෙසේනම් කෙලෙසුන්ගෙන් තෙත් වන්නේද? ඇවැත්නි මේ ශාසනයෙහි භික්ෂුතෙම ඇසින් රූපයක් දැක ප්‍රිය ස්වභාව ඇත්තාවූ රූපය කෙරෙහි ඇලෙයිද අප්‍රිය ස්වභාව ඇත්තාවූ රූපයෙහි කිපෙයිද නොඑළඹසිටි කය පිළිබඳ සිහි ඇත්තේද, කාමාවචර සිතිවිලිවලින් යුක්තව වාසය කෙරෙයිද යම් තැනෙක්හි මොහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනොවී නිරුද්ධවෙත්ද ඒ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද නොදනීද,

කණින් ශබ්දයක් අසා ප්‍රිය ස්වභාව ඇත්තාවූ ශබ්දය කෙරෙහි ඇලේද අප්‍රිය ස්වභාව ඇත්තාවූ ශබ්දයෙහි කිපෙයිද නොඑළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේද, කාමාවචර සිතිවිලිවලින් යුක්තව වාසය කෙරෙයිද යම් තැනෙක්හි මොහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනොවී නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද නොදනීද,

නැහැයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට ප්‍රිය ස්වභාව ඇත්තාවූ ගන්ධය කෙරෙහි ඇලෙයිද අප්‍රිය ස්වභාව ඇත්තාවූ ගන්ධයෙහි කිපෙයිද නොඑළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේද, කාමාවචර සිතිවිලිවලින් යුක්තව වාසය කෙරෙයිද, යම් තැනෙක්හි මොහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනොවී නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද නොදනීද,

දිවෙන් රසයක් විඳ ප්‍රිය ස්වභාව ඇත්තාවූ රසය කෙරෙහි ඇලෙයිද, අප්‍රිය ස්වභාව ඇත්තාවූ රසයෙහි කිපෙයිද නොඑළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේද, කාමාවචර සිතිවිලිවලින් යුක්තව

වාසය කෙරෙයිද යම් තැනෙක්හි මොහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනොවී නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද නොදනීද,

කයින් ස්පර්ශයක් විඳ ප්‍රියස්වභාව ඇත්තාවූ ස්පර්ශය කෙරෙහි ඇලෙයිද අප්‍රිය ස්වභාව ඇත්තාවූ ස්පර්ශයෙහි කිපෙයිද, නොඑළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේද, කාමාවචර සිතිවිලිවලින් යුක්තව වාසය කෙරෙයිද යම් තැනෙක්හි මොහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනොවී නිරුද්ධ වෙත්ද ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද නොදනීද,

සිතින් ධර්මයක් දැන ප්‍රිය ස්වභාව ඇත්තාවූ ධර්මයෙහි ඇලෙයිද අප්‍රිය ස්වභාව ඇත්තාවූ ධර්මයෙහි කිපෙයිද නොඑළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේද ස්වල්පවූ සිතිවිලි ඇත්තේ වාසය කරයිද යම් තැනෙක්හි මොහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධ වෙත්ද ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැන නොගනියිද.

8. "ඇවැත්නි, මේ භික්ෂුතෙම චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු රූපයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත්වූයේයයිද, සෝත විඤ්ඤාණයෙන් දතයුතු ශබ්දයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත්වූයේයයිද, ඝාණවිඤ්ඤාණයෙන් දතයුතු ගන්ධයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත්වූයේයයිද, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතු රසයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත්වූයේ යයිද, කාය විඤ්ඤාණයෙන් දතයුතු ස්පර්ශයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත්වූයේයයිද, මනෝ විඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත්වූයේ යයිද කියනු ලැබේ.

9. "ඇවැත්නි, මෙසේ වාසය කරන්නාවූද, ඒ භික්ෂුවට ඇස නිසාද මාරයා ළංවෙයි. මාරයා ඉඩක් ලබන්නේමය. ක්ලෙශ මාරයා කාරණයක් ලබන්නේමය. කණ නිසාද ඔහුට මාරයා ළංවෙයි. මාරයා ඉඩක් ලබන්නේමය. ක්ලෙශ මාරයා කාරණයක් ලබන්නේමය. නාසය නිසාද ඔහුට මාරයා ළංවෙයි. මාරයා ඉඩක් ලබන්නේමය. ක්ලෙශ මාරයා කාරණයක් ලබන්නේමය.

දිව නිසාද ඔහුට මාරයා ළංවෙයි. මාරයා ඉඩක් ලබන්නේමය. ක්ලෙශ මාරයා කාරණයක් ලබන්නේමය කය නිසාද ඔහුට මාරයා ළංවෙයි. මාරයා ඉඩක් ලබන්නේමය. ක්ලෙශ මාරයා කාරණයක් ලබන්නේමය. සිත නිසාද ඔහුට මාරයා ළංවෙයි. මාරයා ඉඩක් ලබන්නේමය. ක්ලෙශ මාරයා කාරණයක් ලබන්නේමය.

10. "ඇවැත්නි, යම්සේ බට සෙවිලිකළ ගෙයක් හෝ තණ සෙවිලිකළ ගෙයක් වියලුනේ දිරාගියේ බොහෝ කල් ඉක්ම ගියේ වේද, ඉදින් පෙරදිගින්ද එයට පුරුෂයෙක් ඇවිල ගත්තාවූ තණ හුලක් ගෙණ එන්නේද, ගින්න ඉඩක් ලබන්නේමය. ගින්න හේතුවක් ලබන්නේය.

ඉදින් අපරදිගින්ද එයට පුරුෂයෙක් ඇවිල ගත්තාවූ තණ හුලක් ගෙණ එන්නේද, ගින්න ඉඩක් ලබන්නේමය. ගින්න හේතුවක් ලබන්නේය.

ඉදින් උතුරු දිගින්ද එයට පුරුෂයෙක් ඇවිල ගත්තාවූ තණ හුලක් ගෙණ එන්නේද, ගින්න ඉඩක් ලබන්නේමය ගින්න හේතුවක් ලබන්නේය.

ඉදින් දකුණු දිගින්ද එයට පුරුෂයෙක් ඇවිල ගත්තාවූ තණ හුලක් ගෙණ එන්නේද, ගින්න ඉඩක් ලබන්නේමය. ගින්න හේතුවක් ලබන්නේය.

ඉදින් යට දිශාවෙන්ද එයට පුරුෂයෙක් ඇවිල ගත්තාවූ තණ හුලක් ගෙණ එන්නේද, ගින්න ඉඩක් ලබන්නේමය. ගින්න හේතුවක් ලබන්නේය.

ඉදින් උඩ දිශාවෙන්ද එයට පුරුෂයෙක් ඇවිල ගත්තාවූ තණ හුලක් ගෙණ එන්නේද, ගින්න ඉඩක් ලබන්නේමය. ගින්න හේතුවක් ලබන්නේය.

ඉදින් යම් කොයි දිශාවකින් හෝ එයට පුරුෂයෙක් ඇවිලගත් තණ හුලක් ගෙණ එන්නේ නම්, ගින්න ඉඩක් ලබන්නේමය. ගින්න හේතුවක් ලබන්නේය.

11. (මෙහි මේ සූත්‍රයේ 9 වෙනි ඡෙදය යෙදිය යුතුයි.)

12. "ඇවැත්නි, මෙසේ වාසය කරන්නාවූ භික්ෂුව රූපයෝ මැඩ පවත්නාහුය. භික්ෂුතෙම රූපයන් මැඩ පවත් වන්නේ නොවෙයි. ශබ්දයෝ භික්ෂුව මැඩ පවත් වන්නාහුය. භික්ෂුතෙම ශබ්දයන් මැඩ පවත් වන්නේ නොවෙයි. ගන්ධයෝ භික්ෂුව මැඩ පවත් වන්නාහුය. භික්ෂුතෙම ගන්ධයන් මැඩපවත් වන්නේ නොවෙයි. රසයෝ භික්ෂුව මැඩ පවත්වන්නාහුය. භික්ෂුතෙම රසයන් මැඩ පවත්වන්නේ නොවෙයි. ස්පර්ශයෝ භික්ෂුව මැඩ පවත්වන්නාහුය. භික්ෂුතෙම ස්පර්ශයන් මැඩ පවත්වන්නේ නොවෙයි. ධර්මයෝ භික්ෂුව මැඩ පවත්වන්නාහුය. භික්ෂුතෙම ධර්මයන් මැඩ පවත්වන්නේ නොවෙයි. ඇවැත්නි, මේ භික්ෂුතෙම රූපයන් විසින් මඩනා ලද්දේ, ශබ්දයන් විසින් මඩනා ලද්දේ, ගන්ධයන් විසින් මඩනා ලද්දේ, රසයන් විසින් මඩනා ලද්දේ, ස්පර්ශයන් විසින් මඩනා ලද්දේ, ධර්මයන් විසින් මඩනා ලද්දේ, යටත් වූයේය. යටත් නොවූයේ නොවේයයි කියනු ලැබේ.

13. "කෙලෙස් සහිතවූ නැවත උත්පත්තිය ඇති කරන්නාවූ කෙලෙස් දාහ සහිතවූ දුක් විපාක ඇත්තාවූ මත්තෙහි ජරාමරණ දෙකට පමුණුවන්නාවූ ලාමකවූ අකුසල ධර්මයෝ ඔහු යටත් කළාහුය. ඇවැත්නි, මෙසේ වනාහි කෙලෙසුන්ගෙන් තෙත්වූ පුද්ගලයෙක් වෙයි.

14. "ඇවැත්නි, කෙසේනම් කෙලෙසුන්ගෙන් තෙත් නොවූ පුද්ගලයෙක් වේද, ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂු තෙම ඇසින් රූපයක් දැක ප්‍රිය ස්වභාව ඇත්තාවූ රූපයෙහි නොඇලේද අප්‍රිය ස්වභාව ඇත්තාවූ රූපයෙහි නොකිපේද ලොකොත්තර සිතිවිලිවලින් යුක්තව කය පිළිබඳ සිහිය ඇතිව වාසය කෙරේද, යම්තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධවෙත්ද, ඒ අර්හත් ඵල සමාධියද අර්හත් ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැනගණීද?

"කණින් ශබ්දයක් අසා ප්‍රිය ස්වභාව ඇත්තාවූ ශබ්දයෙහි නොඇලේද, අප්‍රිය ස්වභාව ඇත්තාවූ ශබ්දයෙහි නොකිපේද ලොකොත්තර සිතිවිලිවලින් යුක්තව කය පිළිබඳ සිහිය ඇතිව වාසය කෙරේද, යම්තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැනගණීද?

"නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට ප්‍රිය ස්වභාව ඇත්තාවූ ගන්ධයෙහි නොඇලේද, අප්‍රිය ස්වභාව ඇත්තාවූ ගන්ධයෙහි නොකිපේද ලොකොත්තර සිතිවිලිවලින් යුක්තව කය පිළිබඳ සිහිය ඇතිව වාසය කෙරේද, යම් තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැනගණීද?

"දිවෙන් රසයක් විඳ ප්‍රිය ස්වභාව ඇත්තාවූ රසයෙහි නොඇලේද, අප්‍රිය ස්වභාව ඇත්තාවූ රසයෙහි නොකිපේද, ලොකොත්තර සිතිවිලිවලින් යුක්තව කය පිළිබඳ සිහිය ඇතිව වාසය කෙරේද, යම්තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැනගණීද?

"කයින් ස්පර්ශයක් ස්පර්ශකොට ප්‍රිය ස්වභාව ඇත්තාවූ ස්පර්ශයෙහි නොඇලේද, අප්‍රිය ස්වභාව ඇත්තාවූ ස්පර්ශයෙහි නොකිපේද, ලොකොත්තර සිතිවිලිවලින් යුක්තව කය පිළිබඳ සිහිය ඇතිව වාසය කෙරේද, යම්තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැනගණීද?

"සිතින් ධර්මයක් දැන ප්‍රිය ස්වභාව ඇත්තාවූ ධර්මයෙහි නොඇලේද, අප්‍රිය ස්වභාව ඇත්තාවූ ධර්මයෙහි නොකිපේද ලොකොත්තර සිතිවිලිවලින් යුක්තව එළඹ සිටි කය පිළිබඳ සිහිය ඇතිව වාසයකෙරේද, යම්තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ

ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැනගණීද?

15. "ඇවැත්නි, මේ භික්ෂුතෙම චක්ඛු විඥ්ඥාණයෙන් දතයුතුවූ රූපයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූයේ යයි කියනු ලැබේ. සෝත විඥ්ඥාණයෙන් දතයුතුවූ ශබ්දයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූයේයයි කියනු ලැබේ. ඝාණ විඥ්ඥාණයෙන් දතයුතුවූ ගන්ධයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූයේයයි කියනු ලැබේ, ජිව්හා විඥ්ඥාණයෙන් දතයුතුවූ රසයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූයේයයි කියනු ලැබේ. කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ ස්පර්ශයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූයේයයි කියනු ලැබේ. මනො විඥ්ඥාණයෙන් දතයුතුවූ ධර්මයන් කෙරෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූයේයයි කියනු ලැබේ.

16. "ඇවැත්නි, මෙසේ වාසය කරන්නාවූ ඒ භික්ෂුවට ඇස නිසාද මාරයා ළංනොවෙයි. මාරයා ඉඩක් නොලබයි. මාරයා හේතුවක් නොලබයි. කණ නිසාද ඔහුට මාරයා ළං නොවෙයි. මාරයා ඉඩක් නොලබයි. මාරයා හේතුවක් නොලබයි. නාසය නිසාද ඔහුට මාරයා ළංනොවෙයි. මාරයා ඉඩක් නොලබයි. මාරයා හේතුවක් නොලබයි. දිව නිසාද ඔහුට මාරයා ළංනොවෙයි. මාරයා ඉඩක් නොලබයි. මාරයා හේතුවක් නොලබයි. කය නිසාද ඔහුට මාරයා ළංනොවෙයි. මාරයා ඉඩක් නොලබයි. මාරයා හේතුවක් නොලබයි. සිත නිසාද ඔහුට මාරයා ළංනොවෙයි. මාරයා අවකාශයක් නොලබයි. මාරයා හේතුවක් නොලබයි.

17. ඇවැත්නි, යම්සේ ඝන මැටි බිත්ති ඇති තෙත්වූ මැටි ආලේප කළ කුළුගෙයක් හෝ කූටගාර ශාලාවක් හෝ ඇත්තීවේද, ඉදින් පෙර දිගින්ද එයට පුරුෂයෙක් ඇවිල ගත්තාවූ තණ හුලක් සහිතව පැමිණෙන්නේද, ගින්න ඉඩක් නොලබයි. ගින්න හේතුවක් නොලබයි.

ඉදින් අපර දිගින්ද, එයට පුරුෂයෙක් ඇවිල ගත්තාවූ තණ හුලක් සහිතව පැමිණෙන්නේද, ගින්න ඉඩක් නොලබයි. ගින්න හේතුවක් නොලබයි.

ඉදින් උතුරු දිගින්ද එයට පුරුෂයෙක් ඇවිල ගත්තාවූ තණ හුලක් සහිතව පැමිණෙන්නේද, ගින්න ඉඩක් නොලබයි. ගින්න හේතුවක් නොලබයි.

ඉදින් දකුණු දිගින්ද එයට පුරුෂයෙක් ඇවිල ගත්තාවූ තණ හුලක් සහිතව පැමිණෙන්නේද, ගින්න ඉඩක් නොලබයි. ගින්න හේතුවක් නොලබයි.

ඉදින් යට දිශාවෙන්ද එයට පුරුෂයෙක් ඇවිල ගත්තාවූ තණ හුලක් සහිතව පැමිණෙන්නේද, ගින්න ඉඩක් නොලබයි. ගින්න හේතුවක් නොලබයි.

ඉදින් උඩ දිශාවෙන්ද එයට පුරුෂයෙක් ඇවිල ගත්තාවූ තණ හුලක් සහිතව පැමිණෙන්නේද, ගින්න ඉඩක් නොලබයි. ගින්න හේතුවක් නොලබයි.

ඉදින් යම්කිසි දිශාවකින් හෝ එයට පුරුෂයෙක් ඇවිල ගත් තණ හුලක් සහිතව පැමිණෙන්නේද, ගින්න ඉඩක් නොලබන්නේය. ගින්න හේතුවක් නොලබන්නේය.

17. (මෙහි මේ සූත්‍රයේ 15 වෙනි ඡේදය යොදාගත යුතුයි.)

18. "ඇවැත්නි, මෙසේ වාසය කරන්නාවූ භික්ෂුතෙම රූපයන් යටපත් කෙළේය. රූපයෝ භික්ෂුව යටපත් නොකළාහුය. භික්ෂුතෙම ශබ්දයන් යටපත් කෙළේය. ශබ්දයෝ භික්ෂුව යටපත් නොකළාහුය. භික්ෂුතෙම ගන්ධයන් යටපත් කෙළේය. ගන්ධයෝ භික්ෂුව යටපත් නොකළාහුය. භික්ෂුතෙම රසයන් යටපත් කෙළේය. රසයෝ භික්ෂුව යටපත් නොකළාහුය, භික්ෂුතෙම ස්පර්ශයන් යටපත් කෙළේය. ස්පර්ශයෝ භික්ෂුව යටපත් නොකළාහුය. භික්ෂුතෙම ධර්මයන් යටපත් කෙළේය. ධර්මයෝ භික්ෂුව යටපත් නොකළාහුය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**19.** "ඇවැත්නි, මේ භික්ෂුතෙම රූපයන් යටපත් කළාවූ ශබ්දයන් යටපත් කළාවූ ගන්ධයන් යටපත් කළාවූ රසයන් යටපත් කළාවූ ස්පර්ශයන් යටපත් කළාවූ ධර්මයන් යටපත් කළාවූ අභිභවනය කළාවූ අභිභවනය නොකරන ලද්දාවූ පුද්ගලයායයි කියනු ලැබේ. කෙලෙස් සහිතවූ නැවත උත්පත්තිය ගෙන දෙන්නාවූ කෙලෙස් දාහ සහිතවූ දුක් විපාක ඇත්තාවූ මත්තෙහි ජාති ජරාමරණ ඇත්තාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයන් මැඩපැවැත්වූයේය. ඇවැත්නි, මෙසේ වනාහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූවෙක් වේයයි වදාළේය.

**20** එකල්හි භාග්‍යවතුන් වහන්සේ නැගිට ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන්ට ආමන්ත්‍රණය කළසේක. 'මොග්ගල්ලානය, යහපත, යහපත, මොග්ගල්ලානය නුඹ භික්ෂූන්ට කෙලෙසුන්ගෙන් තෙත්වන ආකාරයද කෙළෙසුන් ගෙන් තෙත් නොවන ආකාරයද කීයේය ඒ යහපති"

ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම මෙය ප්‍රකාශ කෙළේය. ශාස්තෲන් වහන්සේ අනුමත කළසේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේගේ කීම සතුටින් පිළිගත්තාහුය.

---

## 7 දුක්ඛධම්ම සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

**2.** 'මහණෙනි, යම්හෙයකින් වනාහි භික්ෂුතෙම සියලුම දුක්ඛධර්මයන්ගේ හටගැණීමද, දුරුවීමද තත්වූ පරිද්දෙන් දැනගණීද, යම් ආකාරයකින් කාමයන් දක්නාවූ ඔහුට කාමයන් කෙරෙහි යම් කාම ආශාවක් කාම ස්නේහයක් කාම මූර්ඡාවක් කාමදාහයක් කාමච්ඡන්දයක් වේනම් එය නොපවත්නේද, ඒ ආකාරයෙන් කාමයෝ දක්නා ලද්දාහු වෙත්. යම් ආකාරයකින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හැසිරෙන්නහුට වසන්නහුට විෂම ලෝභ දොම්නස් යන ලාමක අකුසල ධර්මයෝ නැවත නැවත වහනය නොවෙත්ද, ඔහු විසින් ඒ ආකාරයෙන් විසීමද හැසිරීමද අවබෝධ කරණ ලද්දේ වෙයි.

3. මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම සියලුම දුක්ඛ ධර්මයන්ගේ හටගැණීමද විනාශයද තත්වූ පරිද්දෙන් දැන ගණීද, රූපය මෙසේය. රූපයාගේ හටගැණීම මෙසේය. රූපයාගේ විනාශය මෙසේය. වේදනාව මෙසේය වේදනාවගේ හටගැණීම මෙසේය වේදනාවගේ විනාශය මෙසේය. සංඥාව මෙසේය. සංඥාවේ හටගැණීම මෙසේය. සඥාවේ විනාශය මෙසේය. සංස්කාරයෝ මෙසේය සංස්කාරයන්ගේ හටගැණීම මෙසේය. සංස්කාරයාගේ විනාශය මෙසේය. විඤ්ඤාණය මෙසේය. විඤ්ඤාණයාගේ හටගැණීම මෙසේය, විඤ්ඤාණයාගේ විනාශය මෙසේය කියායි, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම සියලුම දුක්ඛධර්මයන්ගේ හටගැණීමද විනාශයද, තත්වූ පරිද්දෙන් දැනගණියි.

4. "මහණෙනි, යම් ආකාරයකින් කාමයන් දක්නාවූ ඔහුට කාමයන්හි යම් කාමආශාවක් කාම ස්නේහයක් කාම මූර්ඡාවක් කාම දාහයක් වේද, එය නැවත නැවත නොපවතියිද මහණෙනි, ඔහු විසින් ඒ ආකාරයෙන් කාමයෝ දක්නා ලද්දාහුද? මහණෙනි, යම්සේ ගිනිදලු නැති දුම් නැති ගිනි අඟුරුවලින් පිරුණාවූ පුරුෂයෙකුගේ උසට වැඩියෙන් ගැඹුරුවූ ගිනි අඟුරු වලක් වේද, ඉක්බිති ජීවත්වනු කැමැත්තාවූ නොමැරෙනු කැමැත්තාවූ සැප කැමැත්තාවූ දුක් පිළිකුල්කරන්නාවූ පුරුෂයෙක් එන්නේද ශක්තිමත්වූ පුරුෂයෝ දෙදෙනෙක් ඔහු වෙන වෙනම අත්වලින් අල්වා ඒ අඟුරු වළට අදින්නාහුද හෙතෙම එසේද මෙසේද ශරීරය නමන්නේය. ඊට හේතු කවරේද, මහණෙනි, ඒ පුරුෂයා විසින් මම මේ අඟුරු වළට වැටෙන්නෙම්ද, ඒ හේතුවෙන් මරණයට හෝ මරණය තරම් දුකට හෝ පැමිණෙමියි, දැනගන්නා ලද්දේ වෙයි.

5. "මහණෙනි, එපරිද්දෙන්ම භික්ෂූහු විසින් අඟුරුවලට උපමා ඇත්තාවූ කාමයෝ දක්නා ලද්දාහු වෙත්. යම්සේ කාමයන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දක්නාවූ ඔහුට කාමයන්හි යම් කාමාශාවක් කාම ස්නෙහයක් කාම මූර්ඡාවක් කාම දාහයක් වේද, එය නැවත නැවත නොපවතියිද එසේ ඒ භික්ෂුව විසින් අඟුරු වළකට උපමා ඇති කාමයෝ දක්නා ලදහ.

**6.** "මහණෙනි, යම්සේ හැසිරෙන්නහුට වාසය කරන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වහනය නොවෙද්ද, ඒ ආකාරයෙන් හැසිරීමද විසීමද කෙසේනම් අවබෝධකරන ලද්දේද? මහණෙනි, යම්සේ පුරුෂයෙක් බොහෝ කටු ඇති වනයකට ප්‍රවිෂ්ට වන්නේද, ඔහුගේ ඉදිරියෙන්ද කටු ඇත්තේ පිටුපසින්ද කටු ඇත්තේ උතුරෙන්ද කටු ඇත්තේ දකුණෙන්ද කටු ඇත්තේ යටදිසාවෙන්ද කටු ඇත්තේ උඩදිශාවෙන්ද කටු ඇත්තේ වේද, හෙතෙම කටු නොඇනේවායි සිහියෙන් යුක්තව ඉදිරියට යන්නේද, සිහියෙන් යුක්තව පස්සට යන්නේද, මහණෙනි, එසේම ලෝකයෙහි යමක් ප්‍රිය ස්වභාව ඇත්තේද, සැප ස්වභාව ඇත්තේද, එය ආර්‍ය්‍යවිනයෙහි කටුයයි කියනු ලැබේ මෙසේ එය කටුයයි දැන සංවරයද අසංවරයද දතයුතුයි.

**7.** "මහණෙනි, කෙසේනම් අසංවරය වේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ඇසින් රූපයක් දැක ප්‍රිය ස්වභාව ඇත්තාවූ රූපයෙහි ඇලේද අප්‍රිය ස්වභාව ඇත්තාවූ රූපයෙහි කිපේද නොඑළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේ කාමාවචර සිතිවිලිවලින් යුත්තව වාසය කෙරේද, යම් තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනැතිව නිරුද්ධ වෙත්ද, ඒ අර්හත් ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැන නොගණීද.

කණින් ශබ්දයක් අසා ප්‍රිය ස්වභාව ඇත්තාවූ ශබ්දයෙහි ඇලේද අප්‍රිය ස්වභාව ඇත්තාවූ ශබ්දයෙහි කිපේද නොඑළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේ කාමාවචර සිතිවිලිවලින් යුක්තව වාසය කෙරේද, යම් තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැන නොගණීද.

නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට ප්‍රිය ස්වභාව ඇත්තාවූ ගන්ධයෙහි ඇලේද අප්‍රිය ස්වභාව ඇත්තාවූ ගන්ධයෙහි කිපේද, නොඑළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේ කාමාවචර සිතිවිලිවලින් යුක්තව වාසය කෙරේද, යම් තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනැතිව නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැන නොගණීද.

දිවෙන් රසයක් විඳ ප්‍රිය ස්වභාව ඇත්තාවූ රසයෙහි ඇලේද අප්‍රිය ස්වභාව ඇත්තාවූ රසයෙහි කිපේද, නොඑළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේ කාමාවචර සිතිවිලිවලින් යුක්තව වාසය කෙරේද, යම් තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනැතිව නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැන නොගණීද.

කයින් ස්පර්ශයක් කොට ප්‍රිය ස්වභාව ඇත්තාවූ ස්පර්ශයෙහි ඇලේද අප්‍රිය ස්වභාව ඇත්තාවූ ස්පර්ශයෙහි කිපේද, නොඑළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේ කාමාවචර සිතිවිලිවලින් යුක්තව වාසය කෙරේද, යම් තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධ වෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැන නොගණීද.

සිතින් ධර්මයක් දැන ප්‍රිය ස්වභාව ඇත්තාවූ ධර්මයෙහි ඇලේද අප්‍රිය ස්වභාව ඇත්තාවූ ධර්මයෙහි කිපෙයිද, නොඑළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේ කාමාවචර සිතුවිලිවලින් යුක්තව වාසය කෙරේද, යම් තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධ වෙත්ද ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැන නොගණියිද මහණෙනි, මෙසේ වනාහි අසංවරය වේ.

8. "මහණෙනි, කෙසේනම් සංවරය වේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ඇසින් රූපයක් දැක, ප්‍රිය ස්වභාව ඇත්තාවූ රූපයෙහි නොඇලෙයිද අප්‍රිය ස්වභාව ඇත්තාවූ රූපයෙහි නොකිපෙයිද එළඹසිටි කය පිළිබඳ සිහි ඇත්තේ ලොකොත්තර සිතිවිලිවලින් යුක්තව වාසය කෙරෙයිද යම්

තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනැතිව නිරුද්ධ වෙත්ද ඒ අර්හත්ඵල සමාධියද අර්හත් ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැන ගණියිද.

කණින් ශබ්දයක් අසා ප්‍රිය ස්වභාව ඇත්තාවූ ශබ්දයෙහි නොඇලෙයිද, අප්‍රිය ස්වභාව ඇත්තාවූ ශබ්දයෙහි නොකිපෙයිද, එළඹසිටි කය පිළිබඳ සිහි ඇත්තේ ලොකොත්තර සිතිවිලිවලින් යුක්තව, වාසය කෙරෙයිද, යම් තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරි නැතිව නිරුද්ධ වෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැනගණියි.

නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට ප්‍රිය ස්වභාව ඇත්තාවූ ගන්ධයෙහි නොඇලෙයිද, අප්‍රිය ස්වභාව ඇත්තාවූ ගන්ධයෙහි නොකිපෙයිද. එළඹසිටි කය පිළිබඳ සිහි ඇත්තේ ලොකොත්තර සිතිවිලිවලින් යුක්තව වාසය කෙරෙයිද, යම් තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනැතිව නිරුද්ධ වෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද, තත්වූ පරිද්දෙන් දැනගණියිද.

දිවෙන් රසයක් විඳ ප්‍රිය ස්වභාව ඇත්තාවූ රසයෙහි නොඇලෙයිද, අප්‍රිය ස්වභාව ඇත්තාවූ රසයෙහි නොකිපෙයි. එළඹසිටි කය පිළිබඳ සිහි ඇත්තේ ලොකොත්තර සිතිවිලිවලින් යුක්තව, වාසය කෙරෙයිද, යම් තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනැතිව නිරුද්ධ වෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද, තත්වූ පරිද්දෙන් දැනගණියිද,

කයින් ස්පර්ශයක් කොට ප්‍රිය ස්වභාව ඇත්තාවූ ස්පර්ශයෙහි නොඇලෙයිද, අප්‍රිය ස්වභාව ඇත්තාවූ ස්පර්ශයෙහි නොකිපෙයිද, එළඹසිටි කය පිළිබඳ සිහි ඇත්තේ ලොකොත්තර සිතිවිලිවලින් යුක්තව වාසය කෙරෙයිද, යම් තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනැතිව නිරුද්ධ වෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැනගණියිද

සිතින් ධර්මයක් දැක ප්‍රිය ස්වභාව ඇත්තාවූ ධර්මයෙහි නො ඇලෙයිද, අප්‍රිය ස්වභාව ඇත්තාවූ ධර්මයෙහි නොකිපෙයිද, එළඹසිටි කය පිළිබඳ සිහි ඇත්තේද ලොකොත්තර සිතිවිලිවලින් යුක්තව වාසය කෙරෙයිද, යම් තැනෙක්හි ඔහුට උපන්නාවූ ඒ ලාමකවූ අකුසල ධර්මයෝ ඉතිරිනැතිව නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද, තත්වූ පරිද්දෙන් දැනගණියද, මහණෙනි, මෙසේ වනාහි සංවරය වේ.

9. "මහණෙනි, ඉදින් මෙසේ හැසිරෙන්නාවූ මෙසේ වාසය කරන්නාවූ ඒ භික්ෂුවහට කිසියම් කලෙක සිහි මුළාවීම හේතුකොටගෙන (මාන) සංයොජන නම් ලාමකවූ අකුසල ධර්මයෝ උපදිත්ද, මහණෙනි, සිහිය ඉපදීම ප්‍රමාදවෙයි (සිහිය ඉපදීමත් සමගම) එකල්හි එය වහාම දුරු කෙරෙයි. ඉවත්කෙරෙයි. කෙළවර කෙරෙයි. විනාශයට පමුණුවයි.

10. "මහණෙනි, යම්සේ පුරුෂයෙක් තෙම දවසක් රත්වූ යකඩ තලියෙහි දෙකක් හෝ තුනක් හෝ දිය බින්දු වැටෙන්නේද, මහණෙනි, දිය බින්දු වැටීම ප්‍රමාදවේ (වැටීමත් සමගම) එකල්හි එය වහාම ක්ෂයවීමට වියලීමට යන්නේය. මහණෙනි එමෙන්ම, ඉදින් මෙසේ හැසිරෙන්නාවූ මෙසේ වාසය කරන්නාවූ ඒ භික්ෂුහට කිසියම් කලෙක සිත මුළාවීම හේතුකොටගෙන (මාන) සංයෝජන නම් ලාමකවූ අකුසල ධර්මයෝ උපදිත්ද, මහණෙනි, සිහිය ඉපදීම ප්‍රමාදය. ඉක්බිති එය වහාම දුරුකරයි. ඉවත් කරයි. කෙළවර කරයි. විනාශයට පමුණුවයි. මහණෙනි, යම්සේ හැසිරෙන්නාවූ වාසය කරන්නාවූ ඔහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුසල ධර්මයෝ නැවත නැවත වහනය නොවෙත්ද, එසේ වනාහි භික්ෂුහුගේ හැසිරීමද වාසය කිරීමද අවබොධ කරණ ලද්දේ වෙයි.

11. "මහණෙනි, ඉදින් මෙසේ හැසිරෙන්නාවූ මෙසේ වාසය කරන්නාවූ ඒ භික්ෂුවට රජවරු හෝ රාජමහාමාත්‍යවරු හෝ මිත්‍රයෝ හෝ ඇමතියෝ හෝ නෑයෝ හෝ සහලේ නෑයෝ හෝ සම්පත්වලින් සතුටු වීමට පවරන්නාහුද, 'පින්වත් පුරුෂය, මෙසේ කුමකට නුඹ විසින් මේ කසා වස්ත්‍ර වැළඳගන්නා ලද්දාහුද

කුමකට හිස මුඩුකොට කබලක් ගෙණ හැසිරෙන්නෙහිද, එව, ගිහිබවට පැමිණ සම්පත්ද අනුභව කරව. පින්ද කරව කියායි. මහණෙනි, මෙසේ හැසිරෙන්නාවූ මෙසේ වාසය කරන්නාවූ ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් ශික්ෂාව අත්හැර ගිහි බවට පෙරලෙන්නේය, යන මේ කාරණයට හේතු නැත.

12. "මහණෙනි, යම්සේ ගංගානම් නදිය නැගෙනහිර දිගට නැමුනී නැගෙනහිර දිගට නැඹුරුව යන්නී නැගෙනහිර දිගට බරවී ඇත්තී වේද, ඉක්බිති මහාජන සමූහයක් උදලු හා කූඩා ගෙණ අපි මේ ගංගානම් ගඟ බස්නාහිර දිගට නැමීම ඇත්තක් බස්නාහිර දිගට නැඹුරුව යන්නක් බස්නාහිර දිගට බරවූවක් කරන්නෙමුයි, එන්නේය. මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද, කිම මහජන සමූහයා ගංගානම් ගඟ බස්නාහිර දිගට නැමීම ඇත්තක් බස්නාහිර දිගට නැඹුරුව බසින්නක්, බස්නාහිර දිගට බරවූවක් කරන්නේද?" "ස්වාමීනි, එය නොවේමැයි."

"ඊට හේතු කවරේද?" "ස්වාමීනි, ගංගානම් ගඟ පෙරදිගට නැමීම ඇත්තී පෙරදිගට නැඹුරුව යන්නී පෙරදිගට බරවීම ඇත්තී වේ. එය අපරදිගට නැමීම ඇත්තක් අපරදිගට නැඹුරුව බසින්නක් අපරදිගට බරවූවක් කරන්නට පහසු නොවේ. ඒ මහජන සමූහයා ක්ලාන්තයට වෙහෙසට පත්වීම පමණක් වන්නේය."

13. "මහණෙනි, එපරිද්දෙන්ම මෙසේ හැසිරෙන්නාවූ මෙසේ වාසය කරන්නාවූ ඒ භික්ෂුවටද රජවරු හෝ රජමහ ඇමතියෝ හෝ මිත්‍රයෝ හෝ අමාත්‍යයෝ හෝ ඥාතීහු හෝ සහලේ නෑයෝ හෝ සම්පත්වලින් සතුටුවන්නට පවරන්නාහුය. 'පින්වත් පුරුෂය, මෙසේ කුමට තොප විසින් මේ කසටවත් වැළඳගන්නා ලද්දහුද කුමකට හිස මුඩුකොට කබලක් ගෙණ හැසිරෙන්නෙහිද, එව ගිහි බවට පෙරලී සම්පත්ද අනුභවකරව පින්ද කරව'යි කියායි. මහණෙනි, ඒ භික්ෂුතෙම වනාහි මෙසේ හැසිරෙන්නේ මෙසේ වාසය කරන්නේ ශික්ෂාව හැරදමා ගිහිබවට පැමිණෙන්නේය යන මේ කාරණයට හේතු නැත්තේය. ඊට හේතු කවරේද, මහණෙනි, යම් ඒ සිතක් බොහෝ කලක් විවේකයට නැමී

විවේකයට හැරී විවේකයට බරව පවත්නේද එසේ ගිහිබවට පෙරලෙන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේයයි" (වදාළේය).

---

## 8. කිංසුක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක.

2. ඉක්බිති එක්තරා භික්ෂුවක්, තවත් එක්තරා භික්ෂුවක් යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ, ඒ භික්ෂුවට, " ඇවැත්නි භික්ෂුවගේ දැකීම කොපමණකින් පිරිසිදු වූවක් වේදැයි" ඇසුවේය.

ඇවැත්නි, යම්තැනක පටන් මහණතෙම ස්පර්ශායතන සයදෙනාගේ පහළවීමද විනාශවීමද තත්වූ පරිද්දෙන් දනීද, ඇවැත්නි, මෙපමණකින් භික්ෂුවගේ දර්ශනය (සොවාන් මාර්ගය) පිරිසිදු වූයේයයි' කීය.

3. ඉක්බිති භික්ෂුතෙම ඒ භික්ෂුවගේ ප්‍රශ්න විසඳීමෙන් අසතුටුවූයේ තවත් භික්ෂුවක් කරා පැමිණියේය. පැමිණ ඒ භික්ෂුවගෙන් "ඇවැත්නි, කොපමණකින් භික්ෂුවගේ දර්ශනය පිරිසිදුවූයේ වේදැයි" ඇසීය.

"ඇවැත්නි, යම් කාලයක පටන් භික්ෂුව උපාදානස්කන්ධ පස්දෙනාගේ පහළවීමද විනාශවීමද තත්වූ පරිද්දෙන් දනීද, ඇවැත්නි, එපමණකින් භික්ෂුවගේ දර්ශනය පිරිසිදු වූයේ වේයයි" කීය.

4. ඉක්බිති ඒ භික්ෂුවගේ ප්‍රශ්න විසඳීමෙන් අසතුටුවූ භික්ෂුතෙම අනෙක් එක්තරා භික්ෂුවක් කරා පැමිණියේය. පැමිණ "ඇවැත්නි, කොපමණකින් භික්ෂුවගේ දර්ශනය පිරිසිදු වේදැ"යි ඒ භික්ෂුවගෙන් ඇසීය.

"ඇවැත්නි, යම් තැනක පටන් භික්ෂුව සතර මහා භූතයන්ගේ පහළවීමද, විනාශවීමද තත්වූ පරිද්දෙන් දනීද ඇවැත්නි, මෙපමණකින් භික්ෂුවගේ දර්ශනය පිරිසිදු වේයයි" කීය.

**5.** ඉක්බිති ඒ මහණතෙම ඒ භික්ෂුවගේ ප්‍රශ්න විසඳීමෙන් නොසතුටුව අනෙක් එක්තරා භික්ෂුවක් යම් තැනකද එතැනට පැමිණියේය, පැමිණ "ඇවැත්නි, භික්ෂුවගේ දර්ශනය කොපමණකින් පිරිසිදුවේදැයි" ඇසීය.

"ඇවැත්නි, භික්ෂුව යම් තැනක පටන් ඉපදීම ස්වභාව කොට ඇති යම් කිසිවක් ඇද්ද, ඒ සියල්ල නැතිවීම ස්වභාව කොට ඇත්තේයයි තත්වූ පරිද්දෙන් දනීනම් ඇවැත්නි, මෙපමණකින් භික්ෂුවගේ දර්ශනය පිරිසිදුවේයයි ඒ භික්ෂුව කීයේය.

**6.** ඉක්බිති ඒ භික්ෂුව ඔහුගේ ප්‍රශ්න විසඳීමෙන් නොසතුටුව බුදුරජාණන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එකත්පසක හුන් ඒ භික්ෂුව බුදුරජාණන්වහන්සේට මෙසේ සැළකෙළේය. "ස්වාමීනි, මම මෙහි එක්තරා භික්ෂුවක් කරා පැමිණියෙමි. පැමිණ, 'ඇවැත්නි, කොපමණකින් භික්ෂුවගේ දර්ශනය පිරිසිදු වේදැ'යි ඒ භික්ෂුවගෙන් ඇසුවෙමි. ස්වාමීනි, මෙසේ කීකල්හි ඒ භික්ෂුතෙම "ඇවැත්නි, යම් තැනක පටන් භික්ෂුතෙම ස්පර්ශායතන සයදෙනාගේ ඇතිවීමත් නැතිවීමත් තත්වූ පරිද්දෙන් දනීද, ඇවැත්නි, මෙපමණකින් භික්ෂුවගේ දර්ශනය පිරිසිදුවේයයි" මට කීයේය.

"ඉක්බිති ස්වාමීනි, මම ඒ භික්ෂුවගේ ප්‍රශ්න විසඳීමෙන් නොසතුටුව නැවත අනෙක් එක්තරා භික්ෂුවක් වෙත ගියෙමි. ගොස් 'ඇවැත්නි, කොපමණකින් භික්ෂුවගේ දර්ශනය පිරිසිදු වේදැයි' ඒ භික්ෂුවගෙන් ඇසුවෙමි. ස්වාමීනි, එසේ කීකල්හි ඒ මහණ, මට 'ඇවැත්නි, යම් තැනක පටන් භික්ෂුව උපාදානස්කන්ධ පස්දෙනාගේ පහළවීමද, නැතිවීමද තත්වූ

පරිද්දෙන් දනීද, එපමණකින් භික්ෂුවගේ දර්ශනය පිරිසිදුවූයේ වේයයි, කීය. ඉපදීම ස්වභාවකොට ඇති යම් කිසිවක් ඇද්ද, ඒ සියල්ල නැතිවීම ස්වභාවකොට ඇත්තේයයි තත්වූ පරිද්දෙන් දනීද ඇවැත්නි, එපමණකින් භික්ෂුවගේ දර්ශනය පිරිසිදු වේයයි' කීයේය. ස්වාමීනි, එකල්හි මම ඒ භික්ෂුවගේ ප්‍රශ්න තේරීමෙන් නොසතුටුව භාග්‍යවතුන් වහන්සේවෙත පැමිණියෙමි. ස්වාමීනි, භික්ෂුවගේ දර්ශනය කොපමණකින් පිරිසිදු වේද?"

7. "මහණ, යම්සේ (එරබදු) කැලමල් නුදුටු පුරුෂයෙක්වේද, ඔහු කැල ගසක් දුටු පුරුෂයෙකු කරා යන්නේය. ගොස්, " පින්වත් පුරුෂය. කැල ගස කෙබඳුදැයි" ඔහුගෙන් අසන්නේය. 'පින්වත් පුරුෂය, කැල ගස දැවුණු කණුවක්සේ කළුයයි' කියන්නේය. මහණ, ඒ පුරුෂයාගේ දැකීම යම් සේද, ඒ කාලයෙහි කැල ගස එබඳුය.

"මහණ, ඉක්බිති ඒ පුරුෂ තෙම ඒ පුරුෂයාගේ පිළිතුරෙන් නොසතුටුව කැලගසක් දුටු අනික් පුරුෂයෙක් යම්තැනකද එතැනට පැමිණෙන්නේය. පැමිණ, ඒ පුරුෂයාගෙන් කැල ගස කෙබඳුදැයි අසන්නේය. හෙතෙම එම්බා පුරුෂය, මස් වැදැල්ලක් යම්සේද කැලගස එසේ ලේපාටයයි කියන්නේය. මහණ, ඒ පුරුෂයාගේ දැකීම යම්සේද එකල්හි කැලගස එබඳුය.

"මහණ, ඉක්බිති ඒ පුරුෂතෙම ඔහුගේ පැණ විසඳීමෙන් නොසතුටුව කැල ගසක් දුටු අනෙක් පුරුෂයෙකු කරා යන්නේය. ගොස්, 'පින්වත් පුරුෂය, කැල ගස කෙබඳුදැයි' අසන්නේය. හෙතෙම 'පින්වත් පුරුෂය, කැල ගස ඉරිතලා ගිය මාරගසක් බඳුයයි' කියන්නේය. මහණ, ඒ අවස්ථාවෙහි ඒ පුරුෂයාගේ දැකීම යම්සේද ඒ කාලයෙහි කැලගස එබඳුය

"මහණ, ඉක්බිති ඒ පුරුෂතෙම ඒ පුරුෂයාගේ ප්‍රශ්න විසඳීමෙන් නොසතුටුව කැල ගස් දුටු අනික් පුරුෂයෙකු කරා යන්නේය. ගොස්, 'පින්වත් පුරුෂය, කැලගස කෙබඳුදැයි' ඒ පුරුෂයාගෙන් අසන්නේය. 'එම්බල පුරුෂය, ඝනව වැඩුනු කොල සහ දළු ඇති සිහිල් සෙවනැති නුග ගසක් යම්සේද කැලගස එවැනියයි' කියන්නේය. 'මහණ, ඒ පුරුෂයාගේ දැකීම යම්සේද

එකල්හි කැලගසත් එබඳුය. මහණ, එසේම යම් යම් අවබොධ කරණලද ඒ පුරුෂයන්ගේ දැකීම පිරිසිදුවූයේ වේද ඒ ඒ ආකාරයෙන් ඒ ඒ සත්පුරුෂයන් විසින් තොපට ප්‍රකාශ කරණ ලදී.

8. "මහණ, දැඩිවූ රැකවල් ඇති ශක්තිමත් ප්‍රාකාර තොරන් ඇති, දොරටු සයක් ඇති, රජුගේ ප්‍රත්‍යන්ත නගරයක් වෙයි. එහි පණ්ඩිතවූ ව්‍යක්තවූ ඤාණවන්තවූ නොහඳුනන්නන් වලක්වන්නාවූ හඳුනන්නන් ඇතුල්කරවන්නාවූ දොරටුපාලයෙක් වේද, ශීඝ්‍රගාමී දූතයන් දෙදෙනෙක් පෙර දිගින් පැමිණ ඒ දොරටුපාලයාට 'එම්බල පුරුෂය, මේ නගරයෙහි ස්වාමිවරයා කොහිදැයි අසන්නේය. 'ස්වාමීනි, හෙතෙම මැද සතරමංහන්දියෙහි හිඳින්නේයයි' කියන්නේය. ඉක්බිති ශීඝ්‍රගාමී දූතයන් දෙදෙන තත්වූ පරිදි වචනය නගර හිමියාට භාරදී පැමිණි මාර්ගයටම බසින්නේය.

"පශ්චිම දිශාවෙන් ශීඝ්‍රගාමී දූතයන් දෙදෙනෙක් පැමිණ මේ දොරටුපාලයාට 'එම්බල පුරුෂය, මේ නගරයෙහි ස්වාමිවරයා කොහිදැයි' අසන්නේය. 'ස්වාමීනි, හෙතෙම මැද සතරමංහන්දියෙහි හිඳින්නේයයි' කියන්නේය. ඉක්බිති ඒ ශීඝ්‍රගාමී දූතයන් දෙදෙන තත්වූ පරිදි වචනය නගර හිමියාට භාරදී පැමිණි මාර්ගයටම බසින්නේය.

"උතුරු දිසාවෙන් ශීඝ්‍රගාමි දූතයන් දෙදෙනෙක් පැමිණ, මේ දොරටුපාලයාට 'එම්බල පුරුෂය, මේ නගරයෙහි ස්වාමිවරයා කොහිදැයි' අසන්නේය. 'ස්වාමීනි, හෙතෙම මැද සතරමංහන්දියෙහි හිඳින්නේයයි' කියන්නේය. ඉක්බිති ඒ ශීඝ්‍රගාමී දූතයන් දෙදෙන තත්වූ පරිදි වචනය නගර හිමියාට භාරදී පැමිණි මාර්ගයටම බසින්නේය.

"දකුණු දිසාවෙන් ශීඝ්‍රගාමී දූතයන් දෙදෙනෙක් පැමිණ 'එම්බා පුරුෂය, මේ නගරයෙහි ස්වාමිවරයා කොහිදැයි' ඒ දොරටු පාලයාගෙන් අසන්නේය. ස්වාමීනි, හෙතෙම නුවර මැද සතරමංසන්දියෙහි හිඳින්නේයයි කියන්නේය. ඉක්බිති ඒ ශීඝ්‍රගාමී

දූතයන් දෙදෙන තත්වූ පරිදි වචනය නගර හිමියාට භාරදී පැමිණි මාර්ගයටම බසින්නේය.

9 "මහණ, මේ මා විසින් අර්ථය අවබොධකරවීම පිණිස උපමාවක් කරණලදී. මේ එහි අදහසයි. මහණ, නගරය යනු මව්පිය ශුක්‍රශ්‍රොණිතයෙන් හටගත් බත් කොමුපිඬු ආදියෙන් වැඩුණු අනිත්‍යවූ නෑම පිරිමැදීම බිඳීම විනාශය ස්වභාවකොට ඇති, සතර මහා භූතයන්ගෙන් හටගත් ශරීරයට නමකි. මහණ, දොරටු සය යනු අධ්‍යාත්මික ආයතන සයදෙනාට නමකි. මහණ, දොරටු පාලයා යනු මේ සිහියට නමකි. ශීඝ්‍රගාමී දූතයන් දෙදෙනා යනු මේ සමථ විදර්ශනා දෙකට නමකි මහණ, නගර ස්වාමියා යනු විඥානයට නමකි. මහණ, නුවර මැද සතරමංසන්දි යනු පඨවි, ආපො, තෙජො, වායො යන සතර මහා භූතයන්ට නමකි. මහණ, තත්වූ පරිදි වචනය, යනු නිර්වාණයට නමකි. පැමිණි මාර්ගය යනු සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය සහ සම්‍යක් සමාධිය යන ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයට නමකි"

---

## 9. වීණා සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, යම්කිසි භික්ෂුවකගේ හෝ භික්ෂුණියකගේ හෝ සිතට ඇසින් දැක්කයුතු රූපයන් කෙරෙහි, ඡන්දයක් හෝ රාගයක් හෝ ද්වෙෂයක් හෝ මොහයක් හෝ සිතේ ගැටීමක් හෝ උපදීද, මේ මාර්ගය කෙලෙස් සොරුන් නිසා භය සහිතය. වධ බන්ධනාදී භය සහිතය. රාගාදී කටු සහිතය. රාගාදීයෙන් ගහණය. සුගති ගමනට නොමගය, අපාය ගමනට මගය, දුක් ඉරියව් ඇත්තේය. මේ මාර්ගය අසත්පුරුෂයන් විසින් සේවනය කරනලදී. මේ මාර්ගය සත්පුරුෂයන් විසින් සේවනය

නොකරනලදී. තොපට නුසුදුසුයයි ඇසින් දතයුතු රූපයන් කෙරෙන් සිත වලක්වන්නේය.

3. "මහණෙනි, යම්කිසි භික්ෂුවකගේ හෝ භික්ෂුණියකගේ හෝ සිතට කණින් ඇසියයුතු ශබ්දයන් කෙරෙහි ඡන්දයක් හෝ රාගයක් හෝ ද්වෙෂයක් හෝ මොහයක් හෝ සිතේ ගැටීමක් හෝ උපදීද, මේ මාර්ගය කෙලෙස් සොරුන් නිසා භය සහිතය. වධබන්ධනාදී භය සහිතය, රාගාදී කටු සහිතය. රාගාදීයෙන් ගහණය, සුගති ගමනට නොමගය, අපාය ගමනට මගය, දුක් ඉරියව් ඇත්තේය. මේ මාර්ගය අසත්පුරුෂයන් විසින් සේවනය කරනලදී. මේ මාර්ගය සත්පුරුෂයන් විසින් සේවනය නොකරනලදී. තොපට නුසුදුසුයයි කණින් ඇසියුතු ශබ්දයන් කෙරෙන් සිත වලක්වන්නේය.

4. "මහණෙනි, යම්කිසි භික්ෂුවකගේ හෝ භික්ෂුණියකගේ හෝ සිතට නාසයෙන් දතයුතු ගන්ධයක් කෙරෙහි, ඡන්දයක් හෝ රාගයක් හෝ ද්වෙෂයක් හෝ මොහයක් හෝ සිතේ ගැටීමක් හෝ උපදීද, මේ මාර්ගය කෙලෙස් සොරුන් නිසා භය සහිතය, වධ බන්ධනාදී භය සහිතය, රාගාදී කටු සහිතය. රාගාදීයෙන් ගහණය. සුගති ගමනට නොමගය, අපාය ගමනට මගය, දුක් ඉරියව් ඇත්තේය. මේ මාර්ගය අසත්පුරුෂයන් විසින් සේවනය කරනලදී. මේ මාර්ගය සත්පුරුෂයන් විසින් සේවනය නොකරනලදී. තොපට නුසුදුසුයයි නාසයෙන් දතයුතු ගන්ධයන් කෙරෙන් සිත වලක්වන්නේය.

5. "මහණෙනි, යම්කිසි භික්ෂුවකගේ හෝ භික්ෂුණියකගේ හෝ සිතට දිවෙන් දැනියයුතු රසයන් කෙරෙහි, ඡන්දයක් හෝ රාගයක් හෝ ද්වෙෂයක් හෝ මොහයක් හෝ සිතේ ගැටීමක් හෝ උපදීද, මේ මාර්ගය කෙලෙස් සොරුන් නිසා භය සහිතය. වධබන්ධනාදී භය සහිතය, රාගාදී කටු සහිතය. රාගාදීයෙන් ගහණය. සුගති ගමනට නොමගය, අපාය ගමනට මගය, දුක් ඉරියව් ඇත්තේය. මේ මාර්ගය අසත්පුරුෂයන් විසින් සේවනය කරනලදී. මේ මාර්ගය සත්පුරුෂයන් විසින් සේවනය

නොකරනලදී. තොපට නුසුදුසුයයි දිවෙන් දතයුතු රසයන් කෙරෙන් සිත වලක්වන්නේය.

6. "මහණෙනි, යම්කිසි භික්ෂුවකගේ හෝ භික්ෂුණියකගේ හෝ සිතට කයෙන් දතයුතු ස්පර්ශයන් කෙරෙහි, ඡන්දයක් හෝ රාගයක් හෝ ද්වෙෂයක් හෝ මොහයක් හෝ සිතේ ගැටීමක් හෝ උපදීද, මේ මාර්ගය කෙලෙස් සොරුන් නිසා භය සහිතය. වධ බන්ධනාදී භය සහිතය, රාගාදී කටු සහිතය, රාගාදීයෙන් ගහණය, සුගති ගමනට නොමගය, අපාය ගමනට මගය, දුක් ඉරියව් ඇත්තේය, මේ මාර්ගය අසත්පුරුෂයන් විසින් සේවනය කරනලදී. මේ මාර්ගය සත්පුරුෂයන් විසින් සේවනය නොකරනලදී. තොපට නුසුදුසුයයි කයෙන් දතයුතු ස්පර්ශයන් කෙරෙන් සිත වලක්වන්නේය.

7. "මහණෙනි, යම්කිසි භික්ෂුවකගේ හෝ භික්ෂුණියකගේ සිතින් දතයුතු ධර්මයන් කෙරෙහි ඡන්දයක් හෝ රාගයක් හෝ ද්වෙෂයක් හෝ මොහයක් හෝ සිතේ ගැටීමක් හෝ සිතට ඒ ද එයින් සිත වලක්වන්නේය. මේ මාර්ගය කෙලෙස් භය සහිතය. වධ බන්ධනාදියෙන් භය සහිතය රාගාදී කටු සහිතය. රාගාදී ගහන සහිතය. සුගතියට මග නොවේ අපායට මගය. නපුරු ඉරියව් ඇත්තේය. මේ මාර්ගය අසත්පුරුෂයන් විසින් සේවනය කරනලදී. මේ මාර්ගය සත්පුරුෂයන් විසින් සේවනය නොකරනලදී. මේ තොපට නුසුදුසුයයි ඒ සිතින් දැනගතයුතු ධර්මයන් කෙරෙන් සිත වළක්වන්නේය.

8. "මහණෙනි, වැවුණ පැල ගොයම් ඇති ගොවිපලක් ඇත්තේය. ගොයම් රකින්නාද ප්‍රමාදවෙයි. ගොයම් කන ගොනෙක්ද වෙයි. ඒ ගොනා කුඹුරට බැස ඇතිතාක් සෑහීමට පැමිණෙන්නේය. මහණෙනි එසේම අශ්‍රැතවත් පෘථග්ජන තෙම සවැදෑරුම් ස්පර්ශායතනයන්හි අසංවරවූයේ පස්කම් ගුණයන්හි ඇතිතාක් සෑහීමට පත්වෙයි. මහණෙනි, පැල ගොයම් කුඹුරක් වෙයි. අප්‍රමාදවූ ගොවියෙක්ද වෙයි. ගොයම් කන ගොනෙක් වෙයි, ගොයම් කන ගොනා ඒ කුඹුරට බසින්නේය, ගොවියා ඒ

ගොනා නාස් ලණුවෙන් දැඩිකොට අල්වා ගන්නේය. අල්වාගෙන නාස් ලණුව අං දෙක අතරට ගෙන තදකරන්නේය. තදකොට දණ්ඩක් ගෙන හොඳින් තළන්නේය. තළා අතහරින්නේය.

දෙවනුවත් මහණෙනි, පැල ගොයම් කුඹුරක් වෙයි. අප්‍රමාදවූ ගොවියෙක්ද වෙයි ගොයම් කන ගොනෙක්ද වෙයි. ගොයම් කන ගොනා ඒ කුඹුරට බසින්නේය, ගොවියා ඒ ගොනා නාස්ලණුවෙන් දැඩිකොට අල්වාගන්නේය. අල්වාගෙන නාස් ලණුව අං දෙක අතරට ගෙන තද කරන්නේය. තදකොට දණ්ඩක් ගෙන හොඳින් තලන්නේය.

මහණෙනි, තුන්වෙනුවත් ගොයම් කන ගොනා මේ කුඹුරට බසින්නේය. කුඹුර රකින්නා නහයෙන් අල්ලා ගන්නේය අල්ලාගෙන අං දෙක අතරෙන් තදකරන්නේය. තදකොට දණ්ඩෙන් තලන්නේය, තලා අතහරින්නේය.

**9.** "මහණෙනි, මේ අන්දමින් ගමට වැදුනාවූ හෝ වනයට වැදුනාවූ හෝ ඒ ගොනා ඉඳීම් සිටීම් බහුලවූ පළමු ගසනලද පොලු පහරවල් සිහිකරමින් ඒ කුඹුරට නැවත නොබසින්නේය. මහණෙනි, එසේම යම් කලෙක පටන් භික්ෂුවගේ සිත ස්පර්ශායතන සයදෙනා කෙරෙහි ඍජු වූයේ වේද මනාව ඍජුවූයේ ඇතුළත සිටියි හිඳියි එක් අරමුණක් ඇතිව සමාධියට පැමිණේ.

10. "මහණෙනි, යම්සේ රජෙකු විසින් හෝ රාජමහාමාත්‍යයෙකු විසින් හෝ වීණාවක ශබ්දය පෙර නොඅසන ලද්දේවේද, හෙතෙම වීණා ශබ්දය අසන්නේය. 'පින්වත මෙසේ සිත ඇදෙන කැමතිවන මත්වන මුසපත්වන බැඳෙන මේ ශබ්දය කවරකුගේද?' ඔහුට මෙසේ කියන්නාහුය. ස්වාමීනි, මේ සිත ඇදෙන කැමතිවන මත්වන මුසපත්වන බැඳෙන ශබ්දය වීණාවකගේය (යනුවෙනි). හෙතෙම 'යව මට ඒ වීණාවක් ගෙනෙවයි කියන්නේය' ඔහුට ඒ වීණාවක් ගෙනෙන්නාහුය. ඔහුට මෙසේ කියන්නාහුය. 'ස්වාමීනි, මෙසේ සිත ඇදෙන කැමතිවන, මත්වන, මුසපත්වන, බැඳෙන ශබ්දය යමකගේද ඒ මේ වීණාවේය.' හෙතෙම 'පින්වත, මේ වීණාවෙන්

මට කම් නැත. ඒ ශබ්දය ගෙනෙවයි' කියන්නේය. 'ස්වාමීනි, මේ වීණාව නම් නොයෙක් උපකරණවලින් යුක්තය, මහා උපකරණවලින් යුක්තය. නොයෙක් උපකරණවලින් කරණ ලද්දේ වෙයි. එනම්, වීණා ඔරුව නිසාද, සම නිසාද, දණ්ඩ නිසාද, උපවීණාව නිසාද, තත් නිසාද, සතරැස් දණ්ඩ නිසාද, පුරුෂයාගේ ඊට සුදුසු උත්සාහය නිසාද යනුවෙනි ස්වාමීනි, මෙසේ වීණාව නොයෙක් උපකරණ ඇත්තීය. බොහෝ උපකරණ ඇත්තීය. නොයෙක් උපකරණ වලින් යුක්තවූකල නාද කෙරේයයි කියන්නාහුය. හෙතෙම (ශබ්දය නිකුත්වන්නේය) ඒ වීණාව දසකඩකොට හෝ සත්කඩකොට හෝ පලන්නේය. දසකඩකොට හෝ සත්කඩකොට පලා කැබලි කරන්නේය. කැබලිකොට ගින්නෙන් දවන්නේය. ගින්නෙන් දවා අළුකරන්නේය. අළුකොට මහා වාතයෙහි පාකර හරින්නේය. සැඩපහරක් ඇති ගඟක හෝ පාකර හරින්නේය. හෙතෙම (ශබ්දය නොදැක) 'පින්වත, වීණාව නම් ලාමකය, යමක් වීණාව නම් ඒ සියල්ලම ලාමකය මෙහි මේ ජනතෙමේ බොහෝ වේලා ප්‍රමාද වූයේ හිස් වූයේය.

11. "මහණෙනි මහණතෙම රූපයාගේ ගති සියල්ල සොයයි.

එසේම වේදනාවගේ ගති සියල්ල සොයයි. සඤ්ඤාවගේ ගති සියල්ල සොයයි.

සංස්කාරයන්ගේ ගති සියල්ල සොයයි. විඤ්ඤාණයාගේ ගති සියල්ල සොයයි.

රූපය මටය කියා හෝ මගේය කියා හෝ මම වෙමි කියා හෝ යම් ගතියක් වේනම් එය ඔහුට නොවේ.

රූපය සොයන්නාවූ ඔහුට රූපය මටය කියා හෝ මගේය කියා හෝ මම වෙමි කියා හෝ යම් ගතියක් වේනම එය ඔහුට නොවේ.

වේදනාව සොයන්නාවූ ඔහුට වේදනාව මටය කියා හෝ මගේය කියා හෝ මම වෙමි කියා හෝ යම් ගතියක් වේනම් එය ඔහුට නොවේ.

"සඤ්ඤාව සොයන ඔහුට සඤ්ඤාව මටය කියා හෝ මගේය කියා හෝ මම වෙමි කියා හෝ යම් ගතියක් වේනම් එය ඔහුට නොවේ.

"සංස්කාර සොයන ඔහුට සංස්කාර මටය කියා හෝ මගේය කියා හෝ මම වෙමි කියා හෝ යම් ගතියක් වේනම් එය ඔහුට නොවේ.

"විඤ්ඤාණය සොයන ඔහුට විඤ්ඤාණය මටය කියා හෝ මගේය කියාහෝ මම වෙමි කියා හෝ යම් ගතියක් වේනම් එයද ඔහුට නොවේයයි" වදාළේය.

---

## 10. ඡප්පාණක සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. 'මහණෙනි, පැසවූ වණයක් ඇති පුරුෂයෙක් තෙම කටු සහිත වනයකට පිවිසෙන්නේය. කුස කටු හෝ ඔහුගේ පාදයන් විඳින්නාහුය. සර පත්‍ර නම් කටු හෝ ඔහුගේ අත්පා කපන්නේය. මහණෙනි, ඒ පුරුෂතෙම ඒ හේතුවෙන් බොහෝ සෙයින් දුකක් දොම්නසක් හෝ විඳින්නේය. මහණෙනි, එසේම මෙහි ආරණ්‍යයට ගියාවූ හෝ ගමට ගියාවූ හෝ ඇතැම් මහණෙක් 'මේ ආයුෂ්මත්තෙම මෙසේ කරන්නෙකි. මෙසේ හැසිරෙන්නෙකි.' අපිරිසිදුවූ නම් කටුවකැයි කියන්නෙකු ලබන්නේය. ඔහු කටුවකැයි දැන සංවරයද අසංවරයද දත යුතුයි.

3. (මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡේද අන්තිම ඇති "මහණෙනි' මෙසේ වනාහි අසංවරවේ" යන්න හැර මෙහි යොදාගත යුතුයි.)

4. "මහණෙනි, පුරුෂයෙක්තෙම නොයෙක් වාසස්ථානය ඇති නොයෙක් ගොචර ඇති සතුන් සයදෙනෙක් අල්ලාගෙන දැඩි රැහැණකින් බඳින්නේය. සර්පයෙකු අල්වා දැඩි රැහැණකින් බඳින්නේය. කිඹුලෙකු අල්ලා දැඩි රැහැණකින් බඳින්නේය.

පක්ෂියෙකු දැඩි රැහැණකින් බඳින්නේය. බල්ලෙකු ගෙන දැඩි රැහැණකින් බඳින්නේය. හිවලෙකු ගෙන දැඩි රැහැණකින් බඳින්නේය. වඳුරෙකු ගෙන දැඩි රැහැණකින් බඳින්නේය. දැඩි රැහැණින් බැඳ එකට ගලපා හරින්නේය. ඉක්බිති මහණෙනි, ඒ නොයෙක් වාසස්ථාන ඇති නොයෙක් ගොචර ඇති සතුන් සයදෙන තමතමන්ගේ වාසස්ථාන (කරා) විශෙෂයෙන් අදින්නේය. සර්පයා තුඹසට ප්‍රවිෂ්ටවෙමියි. (ඒ අතට) අදින්නේය. කිඹුලා ජලයට ප්‍රවිෂ්ටවෙමියි අදින්නේය. පක්ෂියා අහසෙහි පියාසර කරමියි අදින්නේය. බල්ලා ගමට වදින්නෙමියි අදින්නේය. සිවලා සොහොනට යන්නෙමියි අදින්නේය. වඳුරා වනයට වදින්නෙමියි අදින්නේය.

**5.** "මහණෙනි, යම් අවස්ථාවක ඒ සදෙනා ක්ලාන්තවූවාහුද ඉක්බිති ඒ සතුන්ගෙන් යමෙක් බලවත්ද ඔව්හු ඔහුට අනුව යන්නාහුය. වසඟයට යන්නාහුය. මහණෙනි, එසේම යම්කිසි භික්ෂුවක් විසින් කායගතා සතිය නොවඩන ලද්දේද, බහුල වශයෙන් නොකරණ ලද්දේද, ඇස මනාප රූපයන් වෙත ඔහු ගෙනයයි. ඔහුට අමනාප රූපයෝ පිළිකුල් වෙත්. කණ මනාප ශබ්දයන් වෙත ඔහු ගෙනයයි. ඔහුට අමනාප ශබ්දයෝ පිළිකුල් වෙත්. නාසය මනාප ගන්ධයන් වෙත ඔහු ගෙන යයි. ඔහුට අමනාප ගන්ධයෝ පිළිකුල් වෙත්. දිව මනාප රසයන් වෙත ඔහු ගෙනයයි. ඔහුට අමනාප රසයෝ පිළිකුල් වෙත්. කය මනාප ස්පර්ශයන් වෙත ඔහු ගෙනයයි ඔහුට අමනාප ස්පර්ශයෝ පිළිකුල් වෙත් සිත ඔහු මනාප ධර්මයන් කෙරෙහි අදී. ඔහුට අමනාප ධර්මයෝ පිළිකුල් වෙත්. මහණෙනි, මෙසේ වනාහි අසංවරයවේ.

**6.** "මහණෙනි, කෙසේ සංවරය වේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව ඇසින් රූපයක් දැක ප්‍රිය ස්වරූපවූ රූපයෙහි නොඇලෙයිද, අප්‍රිය ස්වරූපවූ රූපයෙහි කිපෙයිද, ලොකොත්තර සිත් ඇත්තේ එළඹ සිටි කය පිළිබඳ සිහිය ඇතිව වාසය කරයිද, උපන් ලාමක අකුශල ධර්මයෝ යම් තැනෙක ඉතිරිනොවී නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දනීද,

"කණින් ශබ්දයක් අසා ප්‍රිය ස්වරූපවූ ශබ්දයෙහි නොඇලෙයිද, අප්‍රිය ස්වරූපවූ ශබ්දයෙහි කිපෙයිද, ලොකොත්තර සිත් ඇත්තේ එළඹ සිටි කය පිළිබඳ සිහිය ඇතිව වාසය කරයිද, උපන් ලාමක අකුසල ධර්මයෝ යම් තැනෙක ඉතිරි නොවී නිරුද්ධවෙත්ද ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දනීද,

"කණින් ශබ්දයක් අසා ප්‍රිය ස්වරූපවූ ශබ්දයෙහි නොඇලෙයිද, අප්‍රිය ස්වරූපවූ ශබ්දයෙහි කිපෙයිද, ලොකොත්තර සිත් ඇත්තේ එළඹ සිටි කය පිළිබඳ සිහිය ඇතිව වාසය කරයිද, උපන් ලාමක අකුසල ධර්මයෝ යම් තැනෙක ඉතිරි නොවී නිරුද්ධවෙත්ද ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දනීද,

"නාසයෙන් ගඳ සුවඳක් ආඝ්‍රාණය කොට ප්‍රිය ස්වරූපවූ ගන්ධයෙහි නොඇලෙයිද, අප්‍රිය ස්වරූපවූ ගන්ධයෙහි කිපෙයිද, ලොකොත්තර සිත් ඇත්තේ එළඹ සිටි කය පිළිබඳ සිහිය ඇතිව වාසය කරයිද, උපන් ලාමක අකුසල ධර්මයෝ යම් තැනෙක ඉතිරි නොවී නිරුද්ධ වෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දනීද,

"දිවෙන් රසයක් විඳ ප්‍රිය ස්වරූපවූ රසයෙහි නොඇලෙයිද, අප්‍රිය ස්වරූපවූ රසයෙහි කිපෙයිද ලොකොත්තර සිත් ඇත්තේ එළඹ සිටි කය පිළිබඳ සිහිය ඇතිව වාසය කරයිද, උපන් ලාමක අකුශල ධර්මයෝ යම්තැනෙක ඉතිරි නොවී නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දනීද,

"ශරීරයෙන් ස්පර්ශයක් ස්පර්ශකොට ප්‍රිය ස්වරූපවූ ස්පර්ශයෙහි නොඇලෙයිද, අප්‍රිය ස්වරූපවූ ස්පර්ශයෙහි කිපෙයිද, ලොකොත්තර සිත් ඇත්තේ එළඹසිටි කය පිළිබඳ සිහිය ඇතිව වාසය කරයිද, උපන් ලාමක අකුශල ධර්මයෝ යම්තැනෙක ඉතිරි නොවී නිරුද්ධවෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දනීද,

"සිතින් ධර්මයක් දැන ප්‍රිය ස්වභාව ඇති ධර්මයෙහි නොඇලෙයිද, අප්‍රිය ස්වරූපවූ ධර්මයෙහි නොකිපෙයිද, ලොකොත්තර සිතිවිලි ඇත්තේ එළඹ සිටි කය පිළිබඳ සිහිය ඇත්තේ වාසය කරයිද, උපන් ලාමක අකුශල ධර්මයෝ යම් තැනෙක ඉතිරි නැතිව ප්‍රහීණ වෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දනියිද,

7. "මහණෙනි, පුරුෂයෙක් තෙම නොයෙක් වාසස්ථාන ඇති නොයෙක් ගොචර ඇති සතුන් සයදෙනෙක් අල්ලාගෙන රැහැණින් දැඩිව බඳින්නේය. සර්පයෙකු අල්වා රැහැණින් දැඩිව බඳින්නේය. කිඹුලෙකු අල්වා රැහැණින් දැඩිව බඳින්නේය. පක්ෂියෙකු ගෙන රැහැණින් දැඩිව බඳින්නේය. බල්ලෙකු අල්වා රැහැණින් දැඩිව බඳින්නේය. හිවලෙකු අල්වා රැහැණින් දැඩිව බඳින්නේය. වඳුරෙකු අල්වා රැහැණින් දැඩිව බඳින්නේය. රැහැණින් දැඩිව බැඳ උලක හෝ කණුවක හෝ බඳින්නේය. මහණෙනි, ඒ නොයෙක් නොයෙක් වාසස්ථාන ඇති නොයෙක් නොයෙක් ගොචර ඇති සතුන් සදෙනා තම තමන්ගේ වාසස්ථාන කරා අදින්නේය. සර්පයා තුඹසට ප්‍රවිෂ්ටවන්නෙමැයි අදින්නේය. කිඹුලා ජලයට පනින්නෙමියි අදින්නේය. පක්ෂියා අහසින් යන්නෙමියි අදින්නේය. බල්ලා ගම් වදින්නෙමියි අදින්නේය. සිවලා සොහොනට යමියි අදින්නේය. වඳුරා වනයට ප්‍රවිෂ්ට වෙමියි වදින්නේය.

8. "මහණෙනි, යම් දවසක ඒ සතුන් සදෙනා ක්ලාන්තවූවාහු වෙහෙසට පත්වූවාහු වෙත්ද, එකල්හි ඒ උල හෝ කණුව හෝ ඇසුරුකොට සිටින්නේය. හිඳින්නේය. නිදන්නේය. ඒ හුලේ හෝ කණුවේ හෝ වසඟයට යන්නේය.

"මහණෙනි, එසේම යම්කිසි භික්ෂුවක් විසින් කායගතාසතිය පුරුදු කරණ ලද්දේද, බහුල වශයෙන් කරණ ලද්දේද, මනාප රූපයන් කෙරෙහි ඒ ඇස නොඅදියි. ඔහුට අමනාප රූපයෝ පිළිකුල් නොවෙත්. මනාප ශබ්දයන් කෙරෙහි ඒ කණ නොඅදියි. ඔහුට අමනාප ශබ්දයෝ පිළිකුල් නොවෙත්. මනාප ගන්ධයන් කෙරෙහි ඒ නාසය නොඅදියි. ඔහුට අමනාප ගන්ධයෝ පිළිකුල්

නොවෙත්. මනාප රසයන් කෙරෙහි ඒ දිව නොඇදියි. ඔහුට අමනාප රසයෝ පිළිකුල් නොවෙත්. මනාප ස්පර්ශයන් කෙරෙහි ඒ කය නොඇදියි. ඔහුට අමනාප ස්පර්ශයෝ පිළිකුල් නොවෙත්. මනාප ධර්මයන් කෙරෙහි ඒ සිත නොඇදියි. ඔහුට අමනාප ධර්මයෝ පිළිකුල් නොවෙත්.

"මහණෙනි, මෙසේ සංවරවේ මහණෙනි, දැඩි හුලක හෝ කණුවක හෝ යනු කායගතා සතියට නමකි. එසේ හෙයින් මහණෙනි, මෙහි මෙසේ හික්මිය යුතුයි. අප විසින් කායගතා සතිය වඩන ලද්දී, බහුල වශයෙන් කරණ ලද්දී යානාවක් මෙන් කරන ලද්දී, ආධාරස්ථානයක් මෙන් කරණ ලද්දී නැවත නැවත සිටිනලද්දී, පුරුදුකරණ ලද්දී, හොඳාකාර පටන් ගන්නා ලද්දී වන්නේයයි මහණෙනි, මෙසේ හික්මිය යුතුයි.

---

## 11. යවකලාප සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, යම්සේ යව මිටියක් සතරමං සන්ධියෙක්හි දමනලද්දේ වේද. කත්ලී ගත් අත් ඇති පුරුෂයන් සය දෙනෙක් එන්නාහුය. ඔව්හු ඒ යව මිටියට කත්ලීයෙන් ගසන්නාහුය. මහණෙනි, මෙසේ ඒ යව මිටිය කත්ලී සයෙන් ගසනු ලැබීමෙන් යව මිටිය මඩිනලද්දේ වෙයි. ඉක්බිති සත්වෙනි පුරුෂයෙක් කත්ලීයක් අතේ ඇතිව එතැනට පැමිණෙන්නේය. ඔහු ඒ යව මිටියටම සත්වෙනි කත්ලීයෙන් ගසන්නේය. මහණෙනි, මෙසේ ඒ යව මිටිය සත්වෙනි කත්ලීයෙන් ගසනු ලැබීමෙන් අතිශයින් මඩින ලද්දේ වෙයි මහණෙනි! අශ්‍රැතවත් පෘථග්ජනතෙම මනාප අමනාප රූපයන්ගෙන් ඇසට අනී. මනාප අමනාප ශබ්දයන්ගෙන් කණට අනී. මනාප අමනාප රසයන්ගෙන් දිවට අනියි. මනාප අමනාප ගන්ධයන්ගෙන් නාසයට අනී. මනාප අමනාප ස්පර්ශයන්ගෙන් කයට අනියි. මනාප අමනාප ධර්මයන්ගෙන් සිතට අනී. මහණෙනි, ඉදින් ඒ අශ්‍රැතවත්

පෘථග්ජනතෙම මතු භවය ගැන සිතයි. මහණෙනි, මෙසේ ඒ පුරුෂයා හිස් පුරුෂයෙක් වෙයි. අතිශයින් පෙළුනෙක් වෙයි. මහණෙනි, ඒ යව මිටිය සත්වෙනි කත්ලීයෙන් මඩිනු ලබන්නී යම්සේද එමෙනි.

3. "මහණෙනි, පෙර වූ දෙයක් කියමි. බොහෝ කලකට පෙර දෙවියන්ගේ හා අසුරයන්ගේ යුද්ධයක් විය. මහණෙනි, ඉක්බිති වේපචිත්ති අසුරෙන්ද්‍රතෙම අසුරයන්ට කථාකොට පින්වත්නි, ඉදින් දිව්‍ය අසුර යුද්ධය පැවති කල්හි අසුරයෝ දිනන්නාහු නම් දෙවියෝ පරදින්නාහු නම් ඒ සක්දෙව්රජ අත් පා සහ බෙල්ල එක්කොට බැඳ අසුර පුරයෙහි මා සමීපයට ගෙන එවයි කීයේය.

සක්දෙව් රජද "ඉදින් පින්වතුනි, දිව්‍ය අසුර යුද්ධය පටන්ගත් කල්හි දෙවියෝ දිනන්නාහු නම් අසුරයෝ පරදින්නාහු නම් ඒ වේපචිත්ති අසුරේන්ද්‍රයා අත් පා සහ බොටුව එක්කොට බැඳ සුධර්මා නම් දිව්‍ය සභාවෙහි මාගේ සමීපයට ගෙන එවයි කීවේය.

4. "මහණෙනි, ඒ යුද්ධයෙන් දෙවියෝ දිනූහ. අසුරයෝ පැරදුනාහ. මහණෙනි, ඉක්බිති තව්තිසා දෙවියෝ වේපචිත්ති අසුරේන්ද්‍රයා අත්පා සහ බොටුව එක්කොට බැඳ සුධර්මා නම් දිව්‍ය සභාවෙහි සක්දෙව්රජු ළඟට ගෙනාවෝය. මහණෙනි, එහිදී වේපචිත්ති අසුරේන්ද්‍රයා අත්පා සහ බොටුව එක්කොට බඳිනලද්දේ වෙයි. මහණෙනි, යම් කලෙක වේපචිත්ති අසුරේන්ද්‍රයාට දෙවියෝ වනාහි ධාර්මිකයහ. අසුරයෝ අධාර්මිකයහ. දැන් මම දෙව්පුරයට යමියි මෙබඳු සිතක් වේද එකල්හි තමා අත්පා සහ බොටුව එක්කර බැඳි බැම්මෙන් මිදුනකු වශයෙන් දකියි. පඤ්චකාම ගුණයෙන් දිව්‍ය පඤ්චකාමයෙන් සමන්විතව දෙව්සැප අනුභව කරන්නේය. මහණෙනි, යම් කලෙක වේපචිත්ති අසුරයාහට අසුරයෝ ධාර්මිකයහ. දෙවියෝ අධාර්මිකයහ. දැන් අසුර පුරයට යමියි සිතේද එකල්හි තමා බන්ධනයෙන් බැඳුනකු වශයෙන් දකියි. දිව්‍ය පඤ්චකාම ගුණයෙන් පිරිහෙයි. "මහණෙනි, වේපචිත්ති බන්ධනය මෙතරම්

සියුම්ය. මාර බන්ධනය ඊටත් වඩා අතිශයින් සියුම්ය. මහණෙනි, තණ්හා මාන දිට්ඨි වශයෙන් හඟින පුද්ගලයා මාරයාට බැඳුනේය. එසේ නොහඟින පුද්ගලයා මාරයාගෙන් මිදුනේය.

5. "මහණෙනි, 'වෙමි' යන මෙය හැඟීමෙකි. 'මේ මම වෙමි' යන මෙය හැඟීමෙකි. 'වන්නෙමි' යන මෙය හැඟීමෙකි 'නොවන්නෙමි, යන මෙය හැඟීමෙකි. 'රූප ඇත්තෙක් වන්නෙමි' යන මෙය හැඟීමෙකි. 'රූප නැත්තෙක් වන්නෙමි' යන මෙය හැඟීමකි. සංස්කාර ඇත්තෙක් වන්නෙමි' යන මෙය හැඟීමෙකි. 'සංඥා ඇත්තෙක් වන්නෙමි' යන මෙය හැඟීමකි. 'සංඥාව ඇතිද නැතිද වූවෙක් වන්නෙමි' යන මෙය හැඟීමෙකි. මහණෙනි, හැඟීම රොගයකි, හැඟීම ගඩකි, හැඟීම හුලකි, මහණෙනි, එහෙයින් නොහඟින්නාවූ සිතින් වාසය කරන්නෙමියි' මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි.

6. "මහණෙනි, 'වෙමි' යන මෙය කම්පා වීමකි. 'මේ මම වෙමි' යන මෙය කම්පා වීමකි. 'වන්නෙමි' යන මෙය කම්පා වීමකි. 'රූප ඇත්තෙක් වන්නෙමි' යන මෙය කම්පා වීමකි. 'රූප නැත්තෙක් වන්නෙමි' යන මෙය කම්පා වීමකි. 'සංඥා ඇත්තෙක් වන්නෙමි' යන මෙය කම්පා වීමෙකි. 'සංඥා නැත්තෙක් වන්නෙමි' යන මෙය කම්පාවීමකි. 'සංඥා ඇතිද නැතිද වූවෙක් වන්නෙමි' යන මෙය කම්පා වීමකි. මහණෙනි, කම්පාවීම රොගයකි. කම්පාවීම ගඩකි. කම්පාවීම හුලකි. මහණෙනි, එසේ හෙයින් මෙහි කම්පා නොවන්නාවූ සිතින් වාසය කරන්නෙමියි. තොප විසින් මෙසේ හික්මිය යුතුයි.

7. "මහණෙනි, 'වෙමි' යන මෙය සෙලවීමකි. 'මේ මම වෙමි' යන මෙය සෙලවීමකි. 'වන්නෙමි' යන මෙය සෙලවීමකි. 'නොවන්නෙමි යන මෙය සෙලවීමකි. 'රූප ඇත්තෙක් වන්නෙමි' යන මෙය සෙලවීමකි. 'රූප නැත්තෙක් වන්නෙමි' යන මෙය සෙලවීමෙකි. 'සංඥා ඇත්තෙක් වන්නෙමි' යන මෙය සෙලවීමකි. 'සංඥා නැත්තෙක් වන්නෙමි' යන මෙය සෙලවීමකි. 'සංඥා ඇතිද නැතිද වූවෙක් වන්නෙමි' යන මෙය සෙලවීමකි. මහණෙනි, සෙලවීම රොගයකි. සෙලවීම ගඩකි.

සෙලවීම හුලකි. මහණෙනි, එසේ හෙයින් 'මෙහි නොසැලෙන සිතින් යුක්තව වාසය කරන්නෙමුයි,' මහණෙනි, මෙසේ හික්මිය යුතුයි.

8. "මහණෙනි, 'වෙමි' යන මෙය ප්‍රමාද වීමකි. 'මේ මම වෙමි' යන මෙය ප්‍රමාදවීමකි. 'වන්නෙමි' යන මෙය ප්‍රමාද වීමකි. 'නොවන්නෙමි' යන මෙය ප්‍රමාදවීමකි. 'රූප ඇත්තෙක් වන්නෙමි' යන මෙය ප්‍රමාදවීමකි. 'රූප නැත්තෙක් වන්නෙමි' යන මෙය ප්‍රමාද වීමකි. 'සංඥා ඇත්තෙක් වන්නෙමි' යන මෙය ප්‍රමාදවීමෙකි. 'සංඥා නැත්තෙක් වන්නෙමි' යන මෙය ප්‍රමාද වීමකි. 'සංඥා ඇත්තෙක්ද නැත්තෙක්ද වන්නෙමි' යන මෙය ප්‍රමාද වීමකි. මහණෙනි, ප්‍රමාදය රොගයකි. ප්‍රමාදය ගඩකි. ප්‍රමාදය හුලකි. එසේ හෙයින් මෙහි මහණෙනි, ප්‍රමාදයෙහි නොඇලෙන සිතින් වාසය කරන්නෙමියි' මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි.

9. "මහණෙනි, 'වෙමි' යන මෙය මානයට පැමිණීමකි, 'මේ මම වෙමි' යන මෙය මානයට පැමිණීමකි. 'වන්නෙමි' යන මෙය මානයට පැමිණීමකි. 'නොවන්නෙමි' යන මෙය මානයට පැමිණීමකි. 'රූප ඇත්තෙක් වන්නෙමි' යන මෙය මානයට පැමිණීමකි. 'රූප නැත්තෙක් වන්නෙමි, යන මෙය මානයට පැමිණීමකි. 'සංඥා ඇත්තෙක් වන්නෙමි' යන මෙය මානයට පැමිණීමකි. සංඥා නැත්තෙක් වන්නෙමි යන මෙය මානයට පැමිණීමකි. සංඥා ඇත්තෙක්ද නැත්තෙක්ද යන මෙය මානයට පැමිණීමකි. මහණෙනි, මේ මානයට පැමිණීම රෝගයකි. මේ මානයට පැමිණීම ගඩකි. මේ මානයට පැමිණීම හුලකි. මහණෙනි, මෙහි නිහතමාන සිතින් වාසය කරන්නෙමි'යි මහණෙනි, මෙසේ තොප විසින් හික්මිය යුතුය."

**සතරවන ආසිවිස වර්ගය නිමි.**

---

# 1. සගාථ වර්ගය.

## 1. සමාධි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, මේ වේදනා තුනකි. ඒ කවර තුනක්ද යත්, සැප වේදනාය, දුක් වේදනාය, සැපද නොවූ දුකද නොවූ වේදනාය. මහණෙනි, මොව්හු ත්‍රිවිධ වේදනාවෝය.

(1) එකඟවූ සිත් ඇති සම්‍යක් ප්‍රඥාවෙන් යුත්, සිහි ඇති බුද්ධ ශ්‍රාවකතෙම වේදනාවද වේදනාවන්ගේ හේතුවද දනියි.

(2) යම් තැනෙක්හි මේ වේදනාවෝ නිරුද්ධවෙත්ද (වේදනාවන්) ක්ෂය කිරීමට පැමිණෙන මාර්ගය දනියිද මහණතෙම වේදනාවන්ගේ ක්ෂයවීමෙන් තෘෂ්ණාව නැතිකොට ක්ලෙශ පරිනිර්වාණයෙන් පිරිනිවෙන්නේය."

---

## 2. සුඛ සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. මහණෙනි, මේ වේදනා තුනකි. ඒ කවර තුනක්ද? සැප වේදනාය, දුක් වේදනාය, සැපත් නොවූ දුකත් නොවූ වේදනාය, මහණෙනි, මේ වනාහි ත්‍රිවිධ වේදනාවෝය.

(1) සැපවූ හෝ ඉදින් දුක්වූ හෝ සැප නොවූ හෝ දුක් නොවූ හෝ තමා තුළද පිටත්හිද යම්කිසි විඳීමක් ඇද්ද,

(2) නැතිවන බිඳෙන ස්වභාව ඇති එය දුකයයි දැක නුවණින් ස්පර්ශකොට බලන්නේ මෙසේ ඒ වේදනාවන්හි නොඇලෙන්නේය.”

---

## 3. පහාන සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. “මහණෙනි, මේ වේදනා තුනකි. ඒ කවර තුනක්ද? සැප වේදනාය, දුක් වේදනාය, සැපත් නොවූ දුකත් නොවූ වේදනාය යන තුනයි. මහණෙනි, සැප වේදනාවෙහි රාගානුසය පහකටයුතුය. දුක්ඛ වේදනාවෙහි පටිඝානුසය පහකටයුතුය. සැපත් නොවූ දුකත් නොවූ වේදනාවෙහි අවිද්‍යානුසය පහකටයුතුය. මහණෙනි, යම්තැනෙක පටන් භික්ෂුවගේ සැප වේදනාවෙහි රාගානුසය ප්‍රහීණවූයේ වේද, දුක් වේදනාවෙහි පටිඝානුසය ප්‍රහීණවූයේ වේද, දුකද නැති සැපද නැති වේදනාවෙහි අවිජ්ජානුසය ප්‍රහීණවූයේ වේද, මහණෙනි, ඒ භික්ෂුව පහකළ රාගානුසය ඇත්තේයයිද, තෘෂ්ණාව සිංදේය. (සංයොජනය ලිහා දැම්මේය.) මනාකොට මානය දැක ප්‍රහීණ කිරීමෙන් දුක් කෙළවර කෙළේයයි කියනු ලැබේ.

1. වේදනාව සම්‍යක් ප්‍රඥාවෙන් නොදන්නාවූ, නිවන නොදක්නා සුළු සැප විඳින්නාහට ඒ රාගානුශයවේ.

2. වේදනාව සම්‍යක් ප්‍රඥාවෙන් නොදන්නාවූ, නිවන නොදක්නා සුළු දුක විඳින්නාහට පටිඝානුසයවේ.

3. මහත් ප්‍රඥා ඇති බුදුරජාණන් වහන්සේ විසින් දෙසන ලද ශාන්තවූ උපෙක්ෂා වේදනාවක් වේද, ඊට හෝ සතුටුවෙත්ද, හෙතෙම දුකින් නොමිදේ.

4. යම් කලක පටන් කෙලෙස් තවන මහණතෙමේ සම්‍යක් ප්‍රඥාව අත් නොහරීද, එතැන් සිට ඒ පණ්ඩිත තෙම සියලු වේදනාවන් මනාසේ දනී.

5. හෙතෙම වේදනාවන් සම්‍යක් ප්‍රඥාවෙන් දැන මෙලොව ආශ්‍රව රහිතවූයේ, ධර්මස්ථවූයේ වේදයන්හි පරතෙරට ගියේ කරජකායයාගේ බිඳීමෙන් රාග ඇත්තෙක, දොෂ ඇත්තෙක, මොහ ඇත්තෙක යන සංඛ්‍යාවට නොපැමිණෙයි.

---

## 4. පාතාල සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී)

2. "මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජන තෙම මහා සමුද්‍රයෙහි පාතාලයක් (පතුලක් නැති තැනක්) ඇතැයි මෙබඳු වචනයක් කියයි. මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනතෙම ඒ නැති අවිද්‍යමාන වූවක් ගැන මහා සමුද්‍රයෙහි පාතාලයක් ඇතැයි මෙබඳු වචනයක් කියයි. මහණෙනි, යම් මේ පාතාල යන වචනයක් වේද, එය ශාරීරික දුක්ඛ වේදනාවන්ට නමකි. මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනතෙම ශාරීරික දුක්ඛ වේදනාවෙන් ස්පර්ශවන ලද්දේ ශොක කරයි. ක්ලාන්ත වෙයි. විලාප කියයි. පපුවට ගසමින් අඬයි. මුළාවට පැමිණෙයි. මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනතෙම පාතාලයෙන් නොනැගිට්ටේය. පිහිටීමකට නොපැමිණියේය.

3. "මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම ශාරීරික දුක්ඛ වේදනාවෙන් ස්පර්ශවූයේ ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි. විලාප නොකියයි. පපුවට ගසමින් නොහඬයි. මුළාවට නොපැමිණෙයි. මහණෙනි, මේ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම පාතාලයෙන් නැගිට්ටේය. පිහිටීමකට පැමිණියේය.

1. යමෙක් තෙම යමකින් ස්පර්ශ කරන ලද්දේ වෙවුලාද, ශාරීරිකවූ, ප්‍රාණය පැහැර ගන්නාවූ, උපන් මේ දුක්ඛ වේදනාවන් නො ඉවසයිද,

2. වීර්‍ය්‍ය මදවූ දුර්වලවූ හෙතෙම හඬයි, විලාප කියයි, හෙතෙම පාතාලයෙන් නොනැගිට්ටේය. තවද පතුලටද නොපැමිණියේය.

3. යමෙක් තෙම යමකින් ස්පර්ශ කරණ ලද්දේ නොවෙවුලාද, ශාරීරිකවූ ප්‍රාණය පැහැර ගන්නාවූ උපන් දුක්ඛ වේදනාවන් ඉවසාද හෙතෙම ඒකාන්තයෙන් පාතාලයෙන් නැගිට්ටේය. පතුලටද පැමිණියේය."

## 5. දට්ඨබ්බ සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2. "මහණෙනි, මේ වේදනා තුනෙකි. කවර තුනක්දයත්, සැප වේදනාවය, දුක් වේදනාවය, දුකද නුවූ සැපද නොවූ වෙදනාවය යන තුනයි. මහණෙනි, සැප වේදනාව දුක් වශයෙන් දතයුතුය. දුක් වේදනාව හුලක් වශයෙන් දතයුතුය. උපෙක්ෂා වේදනාව අනිත්‍ය වශයෙන් දතයුතුයි. මහණෙනි, යම් තැනක පටන් භික්ෂුව විසින් සැප වේදනාව දුක් වශයෙන් දක්නා ලද්දේවේද, දුක් වේදනාව හුලක් වශයෙන් දක්නා ලද්දේ වේද, උපෙක්ෂා වේදනාව අනිත්‍ය වශයෙන් දක්නා ලද්දේ වේද, මහණෙනි, මේ මහණතෙම යහපත් සේ දුටුයේ තෘෂ්ණාව සින්දේය. සංයෝජනය බහා දැම්මේය. මනාකොට මානයාගේ ප්‍රහාණයෙන් දුක් කෙළවර කෙළේය."

1. යමෙක් සැප දුක වශයෙන් දුටුයේද, දුක හුලක් වශයෙන් දුටුයේද, ශාන්තවූ උපෙක්ෂාව අනිත්‍ය වශයෙන් දුටුයේද,

2. ඒකාන්තයෙන් ඒ යහපත් සේ පෙනෙන භික්ෂු තෙම වේදනාවන් පිරිසිඳ දනී. හෙතෙම වෙදනා පිරිසිඳ දැන මේ ආත්මයෙහි ආශ්‍රව රහිතවූයේ ධර්මයෙහි පිහිටියේ නුවණින් කෙළවරට ගියේ ශරීරයාගේ බිඳීමෙන් සත්වයා යන සංඛ්‍යාවට නොපැමිණෙයි.

## 6. සල්ල සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2. "මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනතෙම සැප වේදනාවද විඳී. දුක් වේදනාවද විඳී. උපෙක්ෂා වේදනාවද විඳී. මහණෙනි ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සැප වේදනාවද විඳී. දුක් වේදනාවද විඳී. උපෙක්ෂා වේදනාවද විඳී. මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනයා හා ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ ද ඒ වේදනා විඳීමෙහි විශෙෂය කවරේද, අදහස කවරේද, වෙනස්කම කවරේද?

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින් කියා දෙතොත් හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා මේ කීමේ අදහස දරන්නාහුය.

"මහණෙනි, එසේවී නම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමි"යි වදාළසේක.

"එසේය. ස්වාමීනි," කියා ඒ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ (එවිට) මෙය දෙශනා කළසේක.

3. "මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනතෙම දුක්ඛ වේදනාවක් පැමිණිකල ශොක කරයි. ක්ලාන්ත වෙයි. විලාප කියයි. පපුවේ අත්ගසමින් හඬයි. මුළාවට පැමිණෙයි. හෙතෙම කායික දුකක්ද මානසික දුකක්ද විඳියි. මහණෙනි, යම්සේ හුලකින් අනින ලද පුරුෂයාට දෙවෙනි හුලකිනුත් අනින්නාහුද, මහණෙනි, එසේ පුරුෂතෙම උල් දෙකකින් වෙදනා විඳින්නේය. මහණෙනි, එසේම අශ්‍රැතවත් පෘථග්ජන තෙම දුක්ඛවෙදනාවක් පැමිණිකල ශොක කරයි. ක්ලාන්ත වෙයි. වැළපෙයි, පපුවේ අත් ගසමින් හඬයි මුළාවට පැමිණෙයි. හෙතෙම කායිකවූද මානසිකවූද විඳීම් දෙකක් විඳියි. ඒ දුක් වෙදනාවෙන් මඩනා ලද්දාවූ හෙතෙම

ක්‍රොධ ඇත්තෙක් වෙයි. දුක් වේදනාව කරණකොටගෙන ක්‍රොධ සහිතවූ ඔහුට දුක් වේදනාවෙහි උපදනා ක්‍රොධානුසය නැවත නැවත උපදියි. දුක් වෙදනාවක් ඇතිවූ හෙතෙම කම් සැපට ආශාකරයි. ඊට හේතු කවරේද? මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජන තෙම කම් සැප හැර දුක් වේදනාවෙන් නික්මීමක් නොදනී. කම් සැපයට ආශාකරන්නාවූ ඔහුට සැප වේදනාවෙහි උපදනා යම් රාගානුශයක් වේද, එය නැවත නැවත උපදියි. හෙතෙම ඒ වේදනාවන්ගේ හටගැනීමද නැතිවීමද ආශ්වාදයද ආදීනවයද නික්මීමද තත්වූ පරිද්දෙන් නොදනී. ඒ වේදනාවන්ගේ හටගැන්මද නැතිවීමද ආශ්වාදයද ආදීනවයද නික්මීමද තත්වූ පරිද්දෙන් නොදන්නාවූ ඔහුට උපෙක්ෂා වේදනාවෙහි හටගන්නා යම් අවිද්‍යානුශයක් වේද එය නැවත නැවත උපදියි. හෙතෙම සැප වේදනාවක් විඳීනම් කෙලෙසුන් ගෙන් යුක්තවම එය විඳියි. දුක් වේදනාවක් විඳීනම් කෙලෙසුන්ගෙන් යුක්තවම එය විඳියි. දුක්ද නුවූ, සැපද නුවූ, වේදනාවක් විඳීනම් කෙලෙසුන්ගෙන් යුක්තවම එය විඳියි. මහණෙනි, මේ අශ්‍රැතවත් පෘථග්ජනතෙමේ ජාති ජරා මරණ සොක පරිදෙව කායික දුක් මානසික දැඩිවෙහෙසවීම් වලින් යුක්ත වූයේය. දුකින් යුක්තවූයේයයි කියමි”යි වදාළසේක.

4. මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම දුක් වෙදනාවක් පැමිණිකල සොක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවැළපෙයි. පපුවේ අත් ගසමින් නොහඬයි. මුළාවට නොපැමිණෙයි. හෙතෙම කායිකවූ එක් වේදනාවක් විඳියි. මානසික වේදනාව නොවිඳියි. මහණෙනි, යම් සේ එක් හුලකින් ඇනුම් කෑ පුරුෂයෙකු දෙවෙනි හුලකින් නො අනින්නාහුද, මහණෙනි, එසේ ඒ පුරුෂතෙම එක් හුලකින් වේදනාව විඳින්නේය. මහණෙනි, එසේම ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම දුක් වේදනාවක් පැමිණිකල ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි. විලාප නොකියයි. පපුවේ අත් ගසමින් නොහඬයි. මුළාවට නොපැමිණෙයි. හෙතෙම කායිකවූ එකම වේදනාවක් විඳියි. මානසික වේදනාව නොවිඳියි. ඒ දුක්ඛ වේදනාව කරණකොට ක්‍රොධ ඇත්තේ නොවෙයි. දුක්ඛ වේදනාව නිසා

ක්‍රොධයෙන් තොර ඔහුට දුක් වේදනාවෙහි උපදනා යම් ක්‍රොධානුශයක් වේද ඒ අනුසය නැවත නූපදියි. හෙතෙම දුක්ඛ වේදනාව පැමිණිකල කම් සැප නොකැමැති වෙයි. ඊට හේතු කවරේද, මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම කම් සැපෙන් වෙන්ව දුකින් නික්මීම දනී. කම් සැපට ප්‍රිය නොවන්නාවූ ඔහුට සැප වේදනාවෙහි යම් රාගානුසයක් වේද එය නැවත නැවත නූපදියි. හෙතෙම ඒ වේදනාවන්ගේ පහළවීමද, නැතිවීමද, ආශ්වාදයද, ආදීනවයද, නික්මීමද තත්වූ පරිද්දෙන් දනී. ඒ වේදනාවන්ගේ හටගැනීමද නැතිවීමද, ආශ්වාදයද, ආදීනවයද, නික්මීමද, තත්වූ පරිද්දෙන් දන්නා ඔහුට උපෙක්ෂා වේදනාවෙහි යම් අවිද්‍යානුශයක්වේද, එය නැවත නැවත නූපදියි. හෙතෙම සැප වේදනාවක් විඳීනම් එය කෙලෙසුන්ගෙන් වෙන්වම විඳියි. දුක් වේදනාවක් විඳීනම් එය කෙලෙසුන්ගෙන් වෙන්වම විඳියි. උපෙක්ෂා වේදනාවක් විඳීනම් එය කෙලෙසුන් ගෙන් වෙන්වම විඳියි.

**5.** "මහණෙනි, මේ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකතෙම ජාති, ජරා, මරණ, සොක, පරිදෙව, (කායික) දුක් මානසික දුක් දැඩි වෙහෙසීම්වලින් වෙන්වූයේයයි කියනු ලැබේ. දුකින් මිදුණේයයි කියමි. මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනයා හා ශ්‍රැතවත් ආර්‍ය්‍ය-ශ්‍රාවකයාගේ මේ වෙනසයි. මේ අදහසයි. මේ වෙන් කිරීමයි."

1. බහුශ්‍රැතවූ ඥානවන්තයා සැප වේදනාවද දුක් වේදනාවද නොවිඳියි. පෘථග්ජනයා හා දක්ෂවූ ඥානවන්තයාගේ මේ මහා වෙනස්වෙයි.

2. මෙලොවද, පරලොවද නුවණින් දක්නා තීරණය කරනලද ධර්මය ඇති බහුශ්‍රැතයාගේ සිත ඉෂ්ටාරම්මණයෝ කම්පා නොකරත්. අනිෂ්ටාරම්මණය හේතුකොටගෙන ද්වේෂයටද නොපැමිණෙයි.

3. ඇලීම හේතුකොටගෙන හෝ කිපීම හේතුකොටගෙන හෝ ඔහුගේ අර්ථයෝ විනාශ නොවෙත්

භවයාගේ පරතෙරට ගියාවූ හෙතෙම කෙලෙස් මළ රහිතවූ ශොක නොකරන්නාවූ නිර්වාණ පදය මනාව දන්නේය.

---

## 7. ගිලඤ්ඤ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර මහාවනයෙහිවූ කූටාගාරශාලාවෙහි වාසය කරනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි ඵලසමවතින් නැඟිට ගිලන්හල යම් තැනෙක්හිද එතැන්හි වැඩිසේක. වැඩ, පණවනලද අස්නෙහි වැඩහුන්සේක. වැඩහිඳ, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, මහණතෙම සිහියෙන් යුක්තව යහපත් ප්‍රඥාවෙන් යුක්තව කාලය ගෙවන්නේය. මේ තොපට අපගේ අනුශාසනාවයි.

2. "මහණෙනි, මහණතෙම කෙසේ සිහිඇත්තේ වේද? මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම කයෙහි කය අනුව නුවණින් බලමින් කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව සම්‍යක් ප්‍රඥා ඇතිව සිහියෙන් යුක්තව සත්වලොකයෙහි ලොභ දොස දෙක දුරුකොට වාසය කෙරෙයි. වේදනාවන්හි වේදනාව අනුව නුවණින් බලමින් කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව සම්‍යක් ප්‍රඥා ඇතිව සිහියෙන් යුක්තව සත්වලොකයෙහි ලොභ දොස දෙක දුරුකොට වාසය කෙරෙයි. සිතෙහි සිත අනුව නුවණින් බලමින් කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව සම්‍යක් ප්‍රඥා ඇතිව සිහියෙන් යුක්තව සත්වලොකයෙහි ලොභ දොස දෙක දුරුකොට වාසය කෙරෙයි. ධර්මයන්හි ධර්මයන් අනුව බලමින් කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූ සිහියෙන් යුක්තව සත්වලොකයෙහි ලොභ දොස දෙක දුරුකොට වාසය කෙරෙයි. මහණෙනි, මහණතෙම මෙසේ වනාහි සිහි ඇත්තේ වේ.

3. "මහණෙනි, මහණතෙම කෙසේ වනාහි යහපත් ප්‍රඥා ඇත්තේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඉදිරියට යාමෙහිද ආපසු යාමෙහිද, නුවණින් යුක්තවූයේ වෙයි. ඉදිරිපිට බැලීමෙහිද අවට බැලීමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. අත්පා

හැකිලීමෙහිද දිගුකිරීමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. සඟල සිවුරු පාත්‍ර සිවුරු දැරීමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. කෑමෙහිද බීමෙහිද කඩාකෑමෙහිද රස විඳ ගැනීමෙහිද නුවණින් යුක්ත වූයේ වෙයි. වැසිකිළි කැසිකිළි කර්මයෙහිද නුවණින් යුක්ත වූයේ වෙයි. යාමෙහිද සිටීමෙහිද හිඳීමෙහිද නිදීමෙහිද නිදි දුරුකිරීමෙහිද, කථාවෙහිද තුෂ්ණිම්භාවයෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. මහණෙනි, මහණතෙම මෙසේ වනාහි යහපත් නුවණින් යුක්තවූයේ වෙයි. මහණෙනි, මහණතෙම සිහියෙන් යුක්තව මනා නුවණින් යුක්තව කාලය ගෙවන්නේය. මෙය තොපට අපගේ අනුශාසනාවයි.

4. "මහණෙනි, මෙසේ සිහියෙන් යුක්තව නුවණින් යුක්තව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව නිවන කරා යැවූ සිත් ඇතිව වාසය කරන ඒ මහණහට සැප වේදනාවක් උපදීද, හෙතෙම මට මේ සැප වේදනාවක් උපන්නීය. එය වනාහි හේතුවක් ඇතිවය. හේතුවක් නැතිව නොවේ. කිනම් හේතුවකින් ඇතිවේද? මේ ශරීරය හේතුකොට ගෙන ඇතිවිය. මේ කය වනාහි අනිත්‍යය ප්‍රත්‍යයන් එක්ව කරන ලද්දේය. හේතුවෙන් උපන්නේය. අනිත්‍යවූ, ප්‍රත්‍යයන් එක්ව කරන ලද්දාවූ හේතූන් නිසා උපන්, කය නිසා උපන්, සැප වේදනාව කෙසේ නිත්‍ය වන්නේදැයි සිතයි. හෙතෙම ශරීරයෙහිද සැප වේදනාවෙහිද අනිත්‍යය අනුව බලමින් වාසය කරයි. විනාශය අනුව බලමින් වාසයකරයි. නොඇලීම අනුව බලමින් වාසය කරයි. නිරොධය අනුව බලමින් වාසය කරයි. අත්හැරීම අනුව බලමින් වාසයකරයි. ශරීරයෙහිද සැප වේදනාවෙහිද අනිත්‍යය අනුව බලමින් වාසය කරන්නාවූ, විනාශය අනුව බලමින් වාසය කරන්නාවූ, නොඇලීම අනුව බලමින් වාසය කරන්නාවූ, නිරොධය අනුව බලමින් වාසය කරන්නාවූ, අත්හැරීම අනුව බලමින් වාසය කරන්නාවූ ඔහුට කයෙහිද සැපවේදනාවෙහිද යම් රාගානුසයක් වේද එය ප්‍රහීණ වෙයි.

5. "මහණෙනි, මෙසේ සිහියෙන් යුක්තව නුවණින් යුක්තව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, නිවන්කරා යැවූ සිත්

ඇතිව වාසය කරන්නාවූ ඔහුට දුක් වේදනාවක් උපදියිද, හෙතෙම මට මේ දුක් වේදනාවක් උපන්නීය. ඕ වනාහි හේතුවක් නිසා ඇතිවිය. හේතුවක් නැතිව නොවේ. කිනම් හේතුවක් නිසාද, මේ ශරීරය නිසාම ඇතිවිය. මේ ශරීරය වනාහි අනිත්‍යය, ප්‍රත්‍යයන්ගෙන් කරන ලද්දේය. හේතුවක් නිසා උපන්නේය. අනිත්‍යවූ, සංඛතවූ, හේතුවක් නිසා හටගත් කය නිසා උපන් දුක්ඛ වේදනාවක් වේද, එය කෙසේ නිත්‍ය වන්නේදැයි මෙසේ දනී. හෙතෙම ශරීරයෙහිද දුක්ඛවේදනාවෙහිද අනිත්‍යය අනුව බලමින් වාසය කරයි. විනාශය අනුව බලමින් වාසය කරයි. නොඇලීම අනුව බලමින් වාසය කරයි. නිරොධය අනුව බලමින් වාසය කරයි. අත්හැරීම අනුව බලමින් වාසය කරයි. ශරීරයෙහිද දුක්වේදනාවෙහිද අනිත්‍යය අනුව බලමින් වාසය කරන්නාවූ, විනාශය අනුව බලමින් වාසය කරන්නාවූ, නොඇලීම අනුව බලමින් වාසය කරන්නාවූ, නිරොධය අනුව බලමින් වාසය කරන්නාවූ, අත්හැරීම අනුව බලමින් වාසය කරන්නාවූ ඔහුට ශරීරයෙහිද දුක්ඛ වේදනාවෙහිද යම් පටිඝානුසයක් වේද එය ප්‍රහීණ වෙයි.

**6.** "මහණෙනි, සිහියෙන් යුක්තව නුවණින් යුක්තව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව නිවනට යැවූ සිත් ඇතිව වාසය කරණ ඒ මහණහට උපෙක්ෂා වේදනාවක් උපදීද, හෙතෙම මට මේ උපෙක්ෂා වේදනාව උපන්නීය. ඕ වනාහි යම් හේතුවකින් ඇතිවිය. හේතුවක් නැතිව නොවේ. කුමක් හේතුකොට ගෙනද, මේ ශරීරය හේතුකොටගෙනය. මේ ශරීරය වනාහි අනිත්‍යය. ප්‍රත්‍යයෙන් සකස්කරන ලදී. හේතුන් නිසා උපන්නේය. අනිත්‍යවූ ප්‍රත්‍යයන් විසින් සකස් කරනලද හේතුන්ගෙන් හටගත් ශරීරය නිසා උපන් උපෙක්ෂා වේදනාව කෙසේ නිත්‍ය වන්නේ දැයි මෙසේ දනී. හෙතෙම ශරීරයෙහිද, උපෙක්ෂා වේදනාවෙහිද, අනිත්‍යය අනුව බලමින් වාසය කරයි. විනාශය අනුව බලමින් වාසය කරයි. නොඇලීම අනුව බලමින් වාසය කරයි. නිරොධය අනුව බලමින් වාසය කරයි. අත්හැරීම අනුව බලමින් වාසය කරයි. ශරීරයෙහිද උපෙක්ෂා වේදනාවේද අනිත්‍යය අනුව බලමින් වාසය කරන විනාශය අනුව බලමින්

වාසය කරන නොඇලීම අනුව බලමින් වාසය කරන නිරුද්ධය අනුව බලමින් වාසය කරන අත්හැරීම අනුව බලමින් වාසය කරන ඔහුට ශරීරයේද උපෙක්ෂා වේදනාවෙහිද යම් අවිද්‍යානුසයක් වේද, එය ප්‍රහීණවෙයි. හෙතෙම සැප වේදනාවක් විඳීනම් එය අනිත්‍යයයි දනී. තෘෂ්ණාවෙන් බැස නොගන්නා ලද්දේයයි දනී. ප්‍රිය නොවන ලද්දේයයි දනී. දුක් වේදනාවක් විඳීනම් එය අනිත්‍යයයි දනී. තෘෂ්ණාවෙන් බැස නොගන්නා ලද්දේයයි දනී. ප්‍රිය නොවන ලද්දේයයි දනී. උපෙක්ෂා වේදනාවක් විඳීනම් ඕතොමෝ අනිත්‍යයයි දනී. තෘෂ්ණාවෙන් බැස නොගන්නා ලද්දේයයි දනී. ප්‍රිය නොවන ලද්දේයයි දනී. හෙතෙම සැප වේදනාවක් විඳීද එය කෙලෙසුන්ගෙන් වෙන්ව විඳියි. දුක්ඛ වේදනාවක් විඳීනම් එය කෙලෙසුන්ගෙන් වෙන්ව විඳියි. උපෙක්ෂා වේදනාවක් විඳීනම් එය කෙලෙසුන්ගෙන් වෙන්ව විඳියි. හෙතෙම කය කෙළවරකොට ඇති වේදනාව විඳින්නේ කය කෙළවරකොට ඇති වේදනාව විඳිමියි දනියි. ජීවිතය කෙළවර කොට ඇති වේදනාව විඳින්නේ ජීවිතය කෙළවර කොට ඇති වේදනාව විඳිමියි දනියි. මෙහිම විඳින ප්‍රිය වන සියලු වේදනා කය බිඳීමෙන් ජීවිතය කෙළවර වීමෙන් පසු සංසිඳෙන්නාහුයයි දැනගනීයයි වදාළේය.

7. "මහණෙනි, යම්සේ තෙලද වැටියද නිසා තෙල් පහන දැල්වෙන්නේද, ඒ තෙලෙත් වැටියෙත් කෙළවර වීමෙන් ප්‍රත්‍යය නොලැබීමෙන් නිවෙන්නේද, මහණෙනි, එසේම මහණතෙමේ කය කෙළවරකොට ඇති වේදනාව විඳින්නේ කය කෙළවරකොට ඇති වේදනාව විඳිමියි දනී. ජීවිතය කෙළවර කොට ඇති වේදනාව විඳින්නේ ජීවිතය කෙළවර කොට ඇති වේදනාව විඳිමියි දනී. මෙහිම විඳින ප්‍රියවන වේදනා කය බිඳීමෙන් ජීවිතය කෙළවරවීමෙන් සංසිඳෙන්නාහුයයි දනීයයි වදාළේය.

---

## 8. ගිලඤ්ඤ සූත්‍රය. (2)

1-2-3. (මෙයට මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 1, 2, 3 ඡෙද යෙදිය යුතුයි.)

4. "මහණෙනි, මෙසේ සිහියෙන් යුක්තවූ ප්‍රඥාවෙන් යුක්තවූ, අප්‍රමාදවූ, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්ත නිවනට යොමුකළ සිත් ඇතිව වාසය කරන්නාවූ ඒ භික්ෂුවට සැප වේදනාවක් උපදීද, හෙතෙම මට සැප වේදනාවක් උපන්නීය. එය හේතුවක් නිසා ඇතිවිය. හේතුවක් නැතිව නොවේ. කුමක් නිසාද? මේ ස්පර්ශය නිසාය. මේ ස්පර්ශය අනිත්‍යය, කර්මාදි ප්‍රත්‍යයෙන් උපන්නේය. අනිත්‍යවූ සංඛතවූ හේතුවෙන් උපන්නාවූ ස්පර්ශය නිසා උපන්නාවූ සැප වේදනාව කෙසේ නිත්‍ය වන්නේදැයි දැන ගනියි. හෙතෙම ස්පර්ශයෙහිද සැප වේදනාවෙහිද අනිත්‍යය අනුව බලමින් වාසය කරයි. විනාශය අනුව බලමින් වෙසෙයි. නොඇලීම අනුව බලමින් වෙසෙයි. නිරොධය අනුව බලමින් වෙසෙයි. වෙන්වීම අනුව බලමින් වෙසෙයි. ස්පර්ශයෙහිද සැප වේදනාවෙහිද අනිත්‍යය අනුව බලමින් වාසය කරන්නාවූ, විනාශය අනුව බලමින් වාසය කරන්නාවූ, නොඇලීම අනුව බලමින් වාසය කරන්නාවූ, නිරොධය අනුව බලමින් වාසය කරන්නාවූ වෙන්වීම අනුව බලමින් වාසය කරන්නාවූ ඔහුට ස්පර්ශයෙහිද සැප වේදනාවෙහිද යම් රාගානුශයක් වේද, එය ප්‍රහීණවේ.

5. 'මහණෙනි, මෙසේ සිහියෙන් යුක්තවූ යහපත් නුවණින් යුක්තවූ, අප්‍රමාදවූ, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ නිවනට යොමුකළ සිත් ඇතිව වාසය කරන ඒ මහණට දුක් වේදනාවක් උපදීද, හෙතෙම මට මේ දුක් වේදනාවක් උපන්නීය. ඒ වනාහි හේතුවක් නිසා ඇතිවිය. හේතුවක් නැතිව නොවේ. කුමක් නිසාද? මේ ස්පර්ශය නිසාය. මේ ස්පර්ශය වනාහි අනිත්‍යය. සංඛතය. ප්‍රත්‍යයෙන් උපන්නේය. අනිත්‍යවූ සංඛතවූ ප්‍රත්‍යයෙන් උපන්නාවූ ස්පර්ශය නිසා උපන් දුක් වේදනාව කෙසේ නිත්‍ය වන්නේදැයි දනී. හෙතෙම ස්පර්ශයෙහිද දුක් වේදනාවෙහිද අනිත්‍යය අනුව බලමින් වෙසෙයි. විනාශය අනුව බලන්නේ, නොඇලීම අනුව බලමින්, නිරොධය අනුව බලමින් වෙන්වීම අනුව බලමින් වාසය කරයි. ස්පර්ශයෙහිද දුක් වේදනාවෙහිද අනිත්‍යය අනුව බලමින් වාසය කරන්නාවූ විනාශය අනුව බලමින් වාසය කරන්නාවූ නොඇලීම අනුව බලමින් වාසය

කරන්නාවූ නිරුද්ධවීම අනුව බලමින් වාසය කරන්නාවූ ඔහුට ස්පර්ශයෙහිද, දුක් වේදනාවෙහිද යම් පටිඝානුසයක් වේද එය ප්‍රහීණවෙයි.

**6.** "මහණෙනි, මෙසේ සිහියෙන් යුක්තව නුවණින් යුක්තව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව නිවනට යොමුකළ සිත් ඇතිව වාසය කරන්නාවූ ඒ මහණහට, උපෙක්ෂා වේදනාවක් උපදීද, හෙතෙම මට මේ උපෙක්ෂා වේදනාවක් උපන්නීය. එය හේතුවක් නිසා ඇතිවිය. හේතුවක් නැතිව නොවේ. කුමක් නිසාද? මේ ස්පර්ශයන් නිසාය. මේ ස්පර්ශය අනිත්‍යය. සංඛතය. ප්‍රත්‍යයෙන් හටගත්තේය. අනිත්‍යවූ සංඛතවූ ප්‍රත්‍යයෙන් උපන්නාවූ ස්පර්ශය නිසා උපන් උපෙක්ෂා වේදනාව කෙසේ නිත්‍යවන්නේදැයි දනියි. හෙතෙම ස්පර්ශයෙහිද උපෙක්ෂා වේදනාවෙහිද අනිත්‍යය අනුව බලමින් වෙසෙයි. විනාශය අනුව බලමින් වෙසෙයි. විරාගය අනුව බලමින් වෙසෙයි. වෙන්වීම අනුව බලමින් වෙසෙයි. ස්පර්ශයෙහිද උපෙක්ෂා වේදනාවෙහිද අනිත්‍යය අනුව බලමින් වාසය කරන්නාවූ විනාශය අනුව බලමින් නොඇලීම අනුව බලමින්, නිරොධය අනුව බලමින්, වෙන්වීම අනුව බලමින් වාසය කරන්නාවූ ඔහුට ස්පර්ශයෙහිද, උපෙක්ෂා වේදනාවෙහිද යම් අවිද්‍යානුසයක් වේද, එය ප්‍රහීණ වේ. හෙතෙම සැප වේදනාවක් විඳීද, එය අනිත්‍යයයි දනී. තෘෂ්ණාවෙන් බැස නොගන්නා ලද්දීයයි දනී. සතුටු නොවන ලද්දීයයි දනී. දුක්ඛ වේදනාවක් විඳීද, එය අනිත්‍යයයි දනී. තෘෂ්ණාවෙන් බැස නොගන්නා ලද්දීයයි දනී. සතුටු නොවන ලද්දීයයි දනී. උපෙක්ෂා වේදනාවක් විඳීද, එය අනිත්‍යයයි දනී. තෘෂ්ණාවෙන් බැස නොගන්නා ලද්දීයයි දනී. සතුටු නොවන ලද්දීයයි දනී. හෙතෙම සැප වේදනාවක් විඳීද, කෙලෙසුන්ගෙන් වෙන්වම එය විඳී, දුක් වේදනාවක් විඳීද, කෙලෙසුන්ගෙන් වෙන්වම එය විඳී. උපෙක්ෂා වේදනාවක් විඳීද, කෙලෙසුන්ගෙන් වෙන්වම එය විඳියි. හෙතෙම කය කෙළවර කොට ඇති වේදනාවක් විඳින්නේ, කය කෙළවරකොට ඇති වේදනාවක් විඳිමියි දනී. ජීවිතය කෙළවර කොට ඇති වේදනාවක් විඳින්නේ, ජීවිතය කෙළවරකොට ඇති වේදනාවක් විඳිමියි දනී. මෙහිම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වින්ද යුතුවූ සියලු වේදනා ශරීරය බිඳීමෙන් ජීවිතය කෙළවර වීමෙන් පසු සිහිල් වන්නාහුයයි දැනගනී.

7. (මේ ඡේදය මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡේදය මෙනි.)

---

## 9. අනිච්ච සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, අනිත්‍යවූද ප්‍රත්‍යයන් විසින් එක්වූ සකස් කරන ලද්දාවූද හේතූන් නිසා පහළවූද ක්ෂයවන ස්වභාව ඇත්තාවූද, විනාශවන ස්වභාවය ඇත්තාවූද, නොඇලිය යුතු ස්වභාවය ඇත්තාවූද, නිරුද්ධකළ යුතු ස්වභාවය ඇත්තාවූද, වේදනා තිදෙනෙකි. ඒ කවරහුද? සැප වේදනාව, දුක් වේදනාව, සැපද නොවූ දුක්ද නොවූ වේදනාව යන තුනයි.

"මහණෙනි, මොව්හු අනිත්‍යවූද, ප්‍රත්‍යයන් විසින් සකස් කරන ලද්දාවූද, නොඇලියයුතු ස්වභාවය ඇත්තාවූද හේතූන් නිසා පහළවූද, ක්ෂයවන ස්වභාවය ඇත්තාවූද, විනාශවන ස්වභාවය ඇත්තාවූද නිරුද්ධ කළයුතු ස්වභාවය ඇත්තාවූද වේදනාවෝ වෙත්.

---

## 10. ඵස්සමූල සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, ස්පර්ශයෙන් හටගත්තාවූ, ස්පර්ශය මුල්කොට ඇත්තාවූ, ස්පර්ශය නිදානකොට ඇත්තාවූ, ස්පර්ශය ප්‍රත්‍යයකොට ඇත්තාවූ මේ වේදනාවෝ තිදෙනෙකි. කවර

තිදෙනෙක්ද යත්? සැප වේදනාය, දුක් වේදනාය සැපත් නොවූ දුකත් නොවූ වේදනාය යන මොහුයි.

"මහණෙනි, සැප වේදනාවට හේතුවන ස්පර්ශය නිසා සැප වේදනාව උපදී. ඒ සැප වේදනාවට හේතුවන ස්පර්ශයාගේ නිරුද්ධවීමෙන් ඊට අනුරූපවූ සැප වේදනාවට හේතුවන ස්පර්ශය නිසා උපන් යම් සැප වේදනාවක් වේද එය නිරුද්ධ වෙයි, සන්සිඳෙයි.

"මහණෙනි, දුක් වේදනාවට හේතුවන ස්පර්ශය නිසා දුක් වේදනාව උපදී. ඒ දුක් වේදනාවට හේතුවන ස්පර්ශයාගේ නිරුද්ධවීමෙන් ඊට අනුරූපවූ දුක් වේදනාවට හේතුවන ස්පර්ශය නිසා උපන් යම් දුක් වේදනාවක් වේද, එය නිරුද්ධ වෙයි, සංසිඳෙයි.

"මහණෙනි, උපෙක්ෂා වේදනාවට හේතුවන ස්පර්ශය නිසා උපෙක්ෂා වේදනාව උපදී. ඒ උපෙක්ෂා වේදනාවට හේතුවන ස්පර්ශයාගේ නිරුද්ධවීමෙන් ඊට අනුරූපවූ උපෙක්ෂා වේදනාවට හේතුවන ස්පර්ශය නිසා උපන් යම් උපෙක්ෂා වේදනාවක්වේද, එය නිරුද්ධ වෙයි, සන්සිඳෙයි.

"මහණෙනි, යම්සේ ලී දෙකක් ගැටීම එක්වීම හේතුකොට ගෙන උණුසුම හටගනියිද, ගින්න පහළවෙයිද, ඒ ලී දඬු දෙක වෙන්කිරීම ඈත්කිරීම නිසා එයින් උපන් උණුසුම නිරුද්ධවේද, සන්සිඳේද,

"මහණෙනි, එමෙන් ඒ ත්‍රිවිධ වේදනාවෝ ස්පර්ශයෙන් හටගත්තාහුය. ස්පර්ශය මුල්කොට ඇත්තාහ. ස්පර්ශය නිදානකොට ඇත්තාහ. ස්පර්ශය ප්‍රත්‍යයකොට ඇත්තාහ. ඊට සුදුසු සුදුසුවූ ස්පර්ශය නිසා ඊට සුදුසු සුදුසුවූ වේදනා උපදිත්. ඊට සුදුසු සුදුසුවූ ස්පර්ශයාගේ නිරුද්ධවීම හේතුකොටගෙන සුදුසු සුදුසුවූ වේදනා නිරුද්ධ වෙත්ය"යි වදාළේය.

**(පළමුවෙනි සගාථ වර්ගය නිමි.)**

---

# 2. රහොගත වර්ගය.

## 1. රහොගත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

ඉක්බිති එක්තරා භික්ෂුනමක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන් ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය.

2. "ස්වාමීනි, මෙහි රහසිගතවූ හුදකලාවූ මට මෙසේ සිතට විතර්කයක් පහළවිය. භාග්‍යවතුන් වහන්සේ විසින් සැප වේදනාය දුක් වේදනාය උපෙක්ෂා වේදනායයි වේදනා තුනක් වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ වේදනා තුන වදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් යම් කිසි විඳීමක් ඇද්ද ඒ සියල්ල දුකයයිද වදාරණ ලදී. යම්කිසි විඳීමක් ඇද්ද ඒ සියල්ල දුකයයි මෙය කුමක් සඳහා භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේද?" කියායි.

3. "යහපත යහපත, මහණ, මහණ මා විසින් සැප වේදනාය දුක් වේදනාය උපෙක්ෂා වේදනාය යන මේ වේදනා තුන මා විසින් වදාරණ ලදහ. මහණ, මා විසින් යම්කිසි විඳීමක් ඇද්ද ඒ සියල්ල දුකය යන මෙයද කියනලදී. මහණ මා විසින් සංස්කාරයන්ගේම අනිත්‍යය සඳහා යම්කිසි විඳීමක් ඇද්ද ඒ සියල්ල දුකය යන මෙය කියන ලදී. මහණ, මා විසින් සංස්කාරයන්ගේම ක්ෂයවන ස්වභාවය සඳහා යම් කිසි විඳීමක් ඇද්ද ඒ සියල්ල දුකය, යන මෙය කියනලදී.

4. "මහණ, මා විසින් සංස්කාරයන්ගේම විනාශවන ස්වභාවය සඳහා යම් කිසි විඳීමක් ඇද්ද ඒ සියල්ල දුකය යන මෙය කියන ලදී. මහණ, මා විසින් සංස්කාරයන්ගේම විරාග ස්වභාවය සඳහා යම්කිසි විඳීමක් ඇද්ද ඒ සියල්ල දුකය යන

මෙය කියන ලදී. මහණ, මා විසින් සංස්කාරයන්ගේම නිරොධ ස්වභාවය සඳහා යම්කිසි විඳීමක් ඇද්ද ඒ සියල්ල දුකය යන මෙය කියනලදී. මහණ, මා විසින් සංස්කාරයන්ගේම විපරිණාම ස්වභාවය සඳහා යම් කිසි විඳීමක් ඇද්ද ඒ සියල්ල දුකය යන මෙය කියන ලදී.

**5.** "තවද මහණ, මා විසින් පිළිවෙළින් සංස්කාරයන්ගේ නිරොධයද කියනලදී. ප්‍රථමධ්‍යානයට සමවැදුනහුට වචනය නිරුද්ධවූයේවේ. ද්විතීයධ්‍යානයට සමවැදුනහුට විතර්ක විචාරයෝ නිරුද්ධවෙත්. තෘතියධ්‍යානයට සමවැදුනහුට ප්‍රීතිය නිරුද්ධවූයේ වෙයි. චතුර්ථධ්‍යානයට සමවැදුනහුට ආශ්වාස ප්‍රශ්වාසයෝ නිරුද්ධ වෙත්. ආකාසානඤ්චායතනයට සමවැදුනහුට රූප සංඥාව නිරුද්ධවෙයි. විඤ්ඤාණඤ්චායතනයට සමවැදුනහුට ආකාසානඤ්චායතන සංඥාව නිරුද්ධ වෙයි. ආකිඤ්චඤ්ඤායතනයට සමවැදුනහුට විඤ්ඤාණඤ්චායතන සංඥාව නිරුද්ධ වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවැදුනහුට ආකිඤ්චඤ්ඤායතන සංඥාව නිරුද්ධවෙයි. සංඥාවෙදයිත නිරෝධයට සමවැදුනහුට සංඥාවද වෙදනාවද නිරුද්ධවෙත්. ක්ෂීණාශ්‍රව භික්ෂුවට රාගය නිරුද්ධවූයේ වෙයි. ද්වෙෂය නිරුද්ධ වූයේ වෙයි. මොහය නිරුද්ධවූයේ වෙයි."

**6.** "තවද මහණ, මා විසින් පිළිවෙළින් සංස්කාරයන්ගේ සංසිඳීම කියනලදී. ප්‍රථමධ්‍යානයට සමවන්නාහුට වචනය සන්සිඳුනේ වේ. ද්විතීයධ්‍යානයට සමවන්නහුට විතර්ක විචාරයෝ සංසිඳුනාහු වෙත්. තෘතීයධ්‍යානයට සමවන්නහුට ප්‍රීතිය සංසිඳුනේවෙයි. චතුර්ථධ්‍යානයට සමවන්නහුට ආශ්වාස ප්‍රශ්වාසයෝ සංසිඳුනාහු වෙත්. ආකාසානඤ්චායතනයට සමවැදුනහුට රූප සංඥාව සංසිඳුනේවෙයි. විඤ්ඤාණඤ්චායතනයට සමවැදුනහුට ආකාසානඤ්චායතන සංඥාව සංසිඳුනේ වෙයි. ආකිඤ්චඤ්ඤායතනයට සමවන්නහුට විඤ්ඤාණඤ්චායතන සංඥාව සංසිඳුනේ වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන්නහුට ආකිඤ්චඤ්ඤායතන සංඥාව සංසිඳුනේ වෙයි. සංඥාවෙදයිත

නිරොධයට සමවන්නහුට සංඥාවද වෙදනාවද සංසිඳුනාහු වෙත්. ක්ෂීණාශ්‍රව භික්ෂුවට රාගය සංසිඳුනේ වෙයි. ද්වෙෂය සංසිඳුනේ වෙයි. මොහය සංසිඳුනේ වෙයි.

7. "මහණෙනි, මේ සංසිඳීම් (ශාන්තවීම්) සයකි. ප්‍රථමධ්‍යානයට සමවැදුනහුට වචනය සංසිඳුනේ වෙයි. ද්විතීයධ්‍යානයට සමවැදුනහුට විතර්ක විචාරයෝ සංසිඳුනාහුවෙත්. තෘතීයධ්‍යානයට සමවැදුනහුට ප්‍රීතිය සංසිඳුනේ වෙයි චතුර්ථධ්‍යානයට සමවැදුනහුට ආශ්වාස ප්‍රශ්වාසයෝ සංසිඳුනාහු වෙත්. සංඥා වෙදයිත නිරොධයට සමවැදුනහුට සංඥාවද වෙදනාවද සංසිඳුනාහුවෙත්. ක්ෂීණාශ්‍රව භික්ෂුවට රාගය සංසිඳුනේවෙයි. ද්වෙෂය සංසිඳුනේවෙයි. මොහය සංසිඳුනේවේයයි" වදාළේය.

---

## 2. ආකාස සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරණසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම්සේ අහසෙහි නොයෙක් වාතයෝ හමත්ද, පෙරදිගින්ද වාතයෝ හමත්. අපරදිගින්ද වාතයෝ හමත්. උතුරු දිගින්ද වාතයෝ හමත්. දකුණු දිගින්ද වාතයෝ හමත්. දූවිලි සහිත වාතයෝද හමත්. දූවිලි නැති වාතයෝද හමත්. ශීත වාතයෝද හමත්. උෂ්ණ වාතයෝද හමත්. ස්වල්පවූ වාතයෝද හමත්. මහත්වූ වාතයෝද හමත්. මහණෙනි, එසේම මේ ශරීරයෙහි නොයෙක් වේදනාවෝ උපදිත්. සැප වේදනාවෝද උපදිත්. දුක් වේදනාවෝද උපදිත්, උපෙක්ෂා වේදනාවෝද උපදිත්යයි" වදාළසේක.

3. 1. අහසෙහි යම්සේ නානාප්‍රකාරවූ, බොහෝ වාතයෝ හමත්ද පෙරදිගින්ද, අවරදිගින්ද, උතුරු දිගින්ද නැවත දකුණු දිගින්ද වාතයෝ හමත්.

2. කලෙක ධූලි සහිතවූද, ධූලි රහිතවූද, ශීතවූද, උෂ්ණවූද, මහත්වූද ස්වල්පවූද, බොහෝ වාතයෝ හමත්.

3. එසේම මේ ශරීරයෙහි සැපවූද, දුක්වූද, සැපද නොවූ දුක්ද නොවූ නොයෙක් වෙදනාවෝද උපදිත්.

4. කෙලෙස් තවන වීර්‍ය්‍යඇති, මහණ යම්හෙයකින් සම්‍යක් ප්‍රඥාව අත්නොහරීද, එහෙයින්ම සියලු වේදනා පිරිසිඳ දැනගනියි.

5. හෙතෙම වේදනා පිරිසිඳ දැන මේ ආත්මයෙහිම ආශ්‍රව රහිත වූයේ ධර්මයෙහි පිහිටියේ අර්හත්වයට පැමිණියේ ශරීරයාගේ භේදයෙන් පහත් සත්වයා යන සංඛ්‍යාවට නොපැමිණෙයි.”

---

## 3. ආකාස සූත්‍රය. (2)

1. මේ වර්ගයේ 2 වෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රයද ජේතවනාරාමයේදී දේශනා කරනලදී.

2. (මෙය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡෙදය මෙනි.)

---

## 4. අගාර සූත්‍රය.

(මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් මේ සූත්‍රය ද ජේතවනාරාමයේදී දෙශනා කරන ලදී.)

2. “මහණෙනි, ආගන්තුක ශාලාවක් යම්සේ වේද? එහි පෙරදිගින්ද අවුත් වාසය කරත්. අපර දිගින් ද අවුත් වාසය කරත්. උතුරු දිගින්ද අවුත් වාසය කරත්. දකුණු දිගින්ද අවුත් වාසය කරත්. ක්ෂත්‍රියයෝද පැමිණ වෙසෙත්. බ්‍රාහ්මණයෝද

පැමිණ වෙසෙත්. වෛශ්‍යයෝද පැමිණ වෙසෙත්. ශුද්‍රයෝද පැමිණ වසත්.

3. මහණෙනි, එසේම මේ ශරීරයෙහි නොයෙක් වේදනාවෝ උපදිත්. සැප වේදනාවෝද උපදිත්. දුක් වේදනාවෝද උපදිත්. උපෙක්ෂා වේදනාවෝද උපදිත්. සාමිස සැප වේදනාද උපදිත් නිරාමිස සැප වේදනාද උපදිත්. සාමිස දුක් වේදනාද උපදිත්. නිරාමිස දුක් වේදනාද උපදිත්. සාමිස උපෙක්ෂා වේදනාද උපදිත්. නිරාමිස උපෙක්ෂා වේදනාද උපදිත්යයි" වදාළ සේක.

---

## 5. සන්තක සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනක වැඩසිටිසේක්ද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය.

2. "ස්වාමීනි, වේදනාව කුමක්ද? වේදනාවන්ගේ හේතුව කුමක්ද? වේදනා නිරොධය කුමක්ද? වේදනාවන් නිරෝධයට පැමිණෙන මාර්ගය කුමක්ද? වේදනාවන්ගේ ආශ්වාදය කුමක්ද? වේදනාවන්ගේ ආදීනවය කුමක්ද? නිස්සරණය කුමක්ද?" කියායි.

3. "ආනන්දය, සැප වේදනා, දුක් වේදනා, උපෙක්ෂා වේදනායි වේදනා තුනෙකි. ආනන්දය මොව්හු වේදනායයි කියනු ලැබෙත්. ස්පර්ශය නිසා වේදනාව උපදී. ස්පර්ශය නිරුද්ධවීමෙන් වේදනාව නිරුද්ධවේ. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය වේදනා නිරොධයට පැමිණෙන ප්‍රතිපදාව වෙයි. එනම් සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය' සම්‍යක් සමාධියයි. වේදනාව නිසා යම් සැපක්

සොම්නසක් උපදීද, මේ වේදනාවගේ ආශ්වාදයයි. යම් වේදනාවක් අනිත්‍යයද දුක්ද පෙරළෙන ස්වභාව ඇත්තේද මේ වේදනාවගේ ආදීනවයයි. වේදනාවගේ යම් ඡන්දරාග දුරුකිරීමක් ඡන්දරාග ප්‍රහාණයක් ඇද්ද මේ වේදනාවගේ නිස්සරණයයි.

(මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 5, 6 වෙනි ඡේද 'මහණ' යනු 'ආනන්දය' කියා වෙනස්කොට මෙහි යොදා ගතයුතුයි.)

**6.** "තවද ආනන්දය මා විසින් පිළිවෙළින් සංස්කාරයන්ගේ සංසිඳීම කියනලද්දේය. ප්‍රථමධ්‍යානයට සමවන්නහුට වචන සංසිඳුනේ වෙයි. ද්විතීයද්ධ්‍යානයට සමවන්නහුට විතක්ක විචාරයෝ සංසිඳුනාහු වෙත්. තෘතීයධ්‍යානයට සමවන්නහුට ප්‍රීතිය සංසිඳුනේ වෙයි. චතුර්ථධ්‍යානයට සමවන්නහුට ආශ්වාස ප්‍රශ්වාසයෝ සංසිඳුනාහු වෙත්. ආකාසානඤ්චායතනයට සමවන්නහුට රූප සංඥාව සංසිඳුණේ වෙත්. විඤ්ඤාණඤ්චායතනයට සමවන්නහුට ආකාසානඤ්චායතන සංඥාව සංසිඳුණේ වෙයි. ආකිඤ්චඤ්ඤායතනයට සමවන්නහුට විඤ්ඤාණඤ්චායතන සංඥාව සංසිඳුණේවෙයි. නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන්නහුට ආකිඤ්චඤ්ඤායතන සංඥාව සංසිඳුනේවෙයි. සඤ්ඤාවේදයිත නිරොධයට සමවන්නහුට සංඥාවද වේදනාවද සංසිඳුනේ වෙත්. ක්ෂීණාශ්‍රව භික්ෂුවට රාගය සංසිඳුනේවෙයි. ද්වෙෂය, සංසිඳුනේවෙයි මොහය සංසිඳුනේවේයයි වදාළේය.

---

## 6. සන්තක සූත්‍රය. (2)

**1.** (මේ සූත්‍රයේ 1, 2 ඡේද මේ වර්ගයේ පස්වෙනි සූත්‍රයේ 1, 2 ඡේද මෙනි.)

**2.** "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ නායකකොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේම පිළිසරණකොට ඇත්තාහ. මේ කියන ලද්දෙහි තේරුම භාග්‍යවතුන් වහන්සේ දේශනා

කරනසේක් නම් ඒකාන්තයෙන් යහපති. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහුයයි. කීය. ආනන්දය, එසේනම් අසව. යහපත්සේ මෙනෙහි කරව. කියන්නෙමියි වදාළසේක.

"එසේය. ස්වාමීනි,"යි කියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

(මේ සූත්‍රයේ 3, 4, 5, 6, වෙනි ඡේද මේ වර්ගයේ 5 වෙනි සූත්‍රයේ 3, 4, 5, 6, වෙනි ඡේද මෙනි.)

---

## 7. අට්ඨක සූත්‍රය (1)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයේ වැඩවසන සේක. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කළහ.

2. "ස්වාමීනි, වේදනාව කවරේද? වේදනාවන්ගේ හේතුව කවරේද, වේදනා නිරෝධය කවරේද? වේදනා නිරෝධයට පැමිණෙන මාර්ගය කවරේද? වෙදනාවගේ ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කවරේද කියායි.

(මේ සූත්‍රයේ 3, 4, 5, වෙනි ඡේදවලට මේ වර්ගයේ 5 වෙනි සූත්‍රයේ 3, 4, 5, වෙනි ඡේද 'ආනන්දය' යනු 'මහණෙනි' කියා වෙනස්කොට යොදාගන්න)

6. "මහණෙනි, මේ ඵස්සද්ධි සයකි. ප්‍රථමධ්‍යානයට සමවන්නහුට වචනය සංසිඳුනේ වේ. ද්විතීයධ්‍යානයට

සමවන්නහුට විතර්ක විචාරයෝ සංසිඳුනාහු වෙත්. තෘතියධ්‍යානයට සමවන්නහුට ප්‍රීතිය සංසිඳුණේවෙයි. චතුර්ථධ්‍යානයට සමවන්නහුට ආශ්වාස ප්‍රශ්වාසයෝ සංසිඳුනාහු වෙත්. සංඥාවේදයිත නිරොධයට පැමිණියාහුට සංඥාවද වේදනාවද සංසිඳුනාහු වෙත්. ක්ෂීණාශ්‍රවභික්ෂුවට රාගය සංසිඳුණේ වෙයි. ද්වෙෂය සංසිඳුණේ වෙයි. මොහය සංසිඳුණේයයි" වදාළසේක.

---

## 8. අට්ඨක සූත්‍රය. (2)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, වේදනාව කවරේද? වේදනාවන්ගේ හේතුව කවරේද? වේදනා නිරෝධය කවරේද? වේදනා නිරෝධයට පැමිණෙන පිළිවෙත කවරේද? වේදනාවගේ ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කවරේදැයි ඇසූහ.

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමෙ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් හොඳය. භාග්‍යවතුන්වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහුය.

"මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමි"යි වදාළසේක.

"එසේය. ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළසේක.

(මේ සූත්‍රයේ 3, 4, 5, 6 ඡේද මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 3, 4, 5, 6 ඡේද මෙනි)

---

# 9. පඤ්චංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි පඤ්චංග නම් වඩුවෙක් ආයුෂ්මත් උදායි ස්ථවිරයන් යම් තැනකද එතැනට පැමිණියේය පැමිණ, ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ *පඤ්චංග නම් වඩුතෙම ආයුෂ්මත් උදායි තෙරුන්ට "ස්වාමීනි, උදායි ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් වේදනා කෙතෙක් වදාරණ ලද්දාහුද?

2. "ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් සැප වේදනාය දුක් වේදනාය උපෙක්ෂා වේදනායයි කියා වේදනා තුනක් වදාරණ ලදහ. ගෘහපතිය, මේ වේදනා තුන භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදහයි කීය.

3. "මෙසේ කී කල්හි පඤ්චංගනම් වඩුතෙම ආයුෂ්මත් උදායී ස්ථවිරයන්ට, "ස්වාමීනි උදායි ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වේදනා තුනක් නොවදාරණ ලද්දේයයි" කීයේය. භාග්‍යවතුන් වහන්සේ විසින් සැප වේදනාය දුක් වේදනායයි වේදනා දෙකක් වදාරණ ලදී. ස්වාමීනි, යම් මේ උපෙක්ෂා වේදනාවක් ඇද්ද? එය ශාන්ත ප්‍රණීත සැපයෙහිලා භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

4. දෙවනුවත් ආයුෂ්මත් උදායි ස්ථවිරතෙම පඤ්චංග නම් වඩුවාට, "ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් වේදනා දෙකක් නොවදාරණ ලදී. සැප වේදනාය, දුක් වේදනාය, උපෙක්ෂා වේදනායයි වේදනා තුනක් වදාරණ ලදහ වේදනාවන් තිදෙන භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදහ" දෙවනුවත් පඤ්චංග වඩුතෙම ආයුෂ්මත් උදායි තෙරුන්ට "ස්වාමීනි, උදායි ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් වේදනාවන් තිදෙනෙක් නොවදාරණ ලදහ. භාග්‍යවතුන් වහන්සේ විසින් සැප වේදනාය, දුක් වේදනාය යන මේ වෙදනා දෙකක් වදාරණලදී. ස්වාමීනි, යම් උපෙක්ෂා වෙදනාවක් ඇද්ද, එය

භාග්‍යවතුන් වහන්සේ විසින් ශාන්ත, ප්‍රණීත, සැපයෙහි ලා වදාරණ ලදී.

**5.** තුන්වෙනුවත් ආයුෂ්මත් උදායි තෙරුන්වහන්සේ පඤ්චංග වඩුවාට, "ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් සුඛ වේදනාය දුක්ඛ වේදනාය යන වේදනා දෙකක් නොවදාරණ ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් සුඛවේදනාය, දුක් වේදනාය, උපෙක්ෂා වේදනාය යන වේදනා තුනක් වදාරණ ලදහ. මේ වේදනා තුන භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදැයි" කීය.

තුන්වෙනුවත් පඤ්චංග නම් වඩුතෙම ආයුෂ්මත් උදායි තෙරුන්ට "ස්වාමීනි, උදායි ස්ථවිරයන්වහන්ස, වේදනා තුනක් භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරණ ලදහ. සැප වේදනා දුක් වේදනා යන වේදනා දෙකක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදහ. ස්වාමීනි, යම් මේ උපෙක්ෂා වේදනාවක් ඇද්ද, භාග්‍යවතුන් වහන්සේ විසින් එය ශාන්ත ප්‍රණීත සැපයෙහි වදාරණ ලදැයි" කීය. ආයුෂ්මත් උදායි තෙරුන්ට පඤ්චංග නම් වඩුවාට අවබොධ කරවන්නට නොහැකිවිය. පඤ්චංග නම් වඩුවාද ආයුෂ්මත් උදායී තෙරුන්ට හඟවන්නට නොහැකි විය.

**6.** ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ, ආයුෂ්මත් උදායි ස්ථවිරයන් වහන්සේ හා පඤ්චංග නම් වඩුවා අතර සිදුවූ මේ කතාබහ ඇසූසේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම්තාක් ආයුෂ්මත් උදායි ස්ථවිරයන් හා පඤ්චංග නම් වඩුවා සමගවූ කතාබහක් වේද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළකෙළේය.

**7.** "ආනන්දය පඤ්චංග වඩුතෙම කරුණක් ඇතිවම උදායි භික්ෂුව සමග එකඟ නොවූයේය. ආනන්දය, උදායි භික්ෂුවද කරුණක් ඇතිවම පඤ්චංග වඩුවා සමග එකඟ නොවූයේය. ආනන්දය මා විසින් කාරණා වශයෙන් වෙදනා දෙකක් වදාරණලදී. මා විසින් කාරණා වශයෙන් වෙදනා තුනක්ද

වදාරණලදී. මා විසින් කාරණා වශයෙන් වේදනා පහක්ද වදාරණ ලදී. මා විසින් කාරණා වශයෙන් වේදනා සයක්ද වදාරණලදී. මා විසින් කාරණා වශයෙන් වේදනා දහ අටක්ද වදාරණලදී. මා විසින් කාරණා වශයෙන් වේදනා තිස්හයක්ද වදාරණලදී. මා විසින් කාරණා වශයෙන් වේදනා එක්සිය අටක්ද වදාරණලදී. ආනන්දය මෙසේ ධර්මය මා විසින් කාරණා වශයෙන් වදාරණලදී. ආනන්දය මෙසේ මා විසින් කාරණා වශයෙන් දෙශනාකරණලද ධර්මය ඇති කල්හි යමක් ඔවුනොවුන් මනාකොට කියනලද්ද යහපත්කොට කියන ලද්ද ඔවුනොවුන් එකඟව නොහඟිත්ද, එකඟව නොදැන ගනිත්ද, එකඟව සතුටු නොවෙත්ද, මනාව නොදනිත්ද, මනාව අනුමෝදන් නොවෙත්ද ඔවුන්ට හටගත් කොලාහල ඇත්තාහු කලහ ඇත්තාහු, හටගත් විවාද ඇත්තාහු, ඔවුනොවුන් මුව නමැති අවියෙන් විදිමින් හැසිරෙත් යන මෙය කැමැති වියයුතුයි. ආනන්දය මා විසින් කාරණා වශයෙන් වදාරණලද ධර්මය ඇති කල්හි යම්කෙනෙක් ඔවුනොවුන් විසින් මනාව කියනලද්ද යහපත්කොට කියනලද්ද එකඟව හඟිත්ද, එකඟව දනිත්ද, එකඟව සතුටු වෙත්ද, ඔවුහු සමගිවූවාහු සතුටු වූවාහු විවාද නොකරන්නාහු කිරි හා දිය මෙන්වූවාහු ඔවුනොවුන් ප්‍රිය ඇස්වලින් බලමින් වාසය කෙරෙත් යන මෙය බලාපොරොත්තුවිය යුතුය.

8. "ආනන්දය, මේ කාමගුණයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක්ද යත්, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ ඇලෙන්නාවූ ඇසින් දැක්කයුතු රූපයෝය. ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවය ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ ඇලෙන්නාවූ කණින් දතයුතු ශබ්දයෝය. ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ කාමය පිණිස, පවත්නාවූ ඇලෙන්නාවූ නාසයෙන් දතයුතු ගන්ධයෝය. ඉෂ්ටවූ, කාන්තාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවය ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ ඇලෙන්නාවූ දිවෙන් දතයුතු රසයෝය. ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවය ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ ඇලුම් කරන්නාවූ ස්පර්ශයෝය යන මේ පස පඤ්චකාම ගුණයෝ වෙත්.

**9.** "ආනන්දය, මේ පස්කම් ගුණයන් නිසා යම් සැපක් සොම්නසක් උපදීද, මේ කාම සැපයයි කියනු ලැබේ. ආනන්දය, යම් කෙනෙක් "මේ අතිශයින් ශාන්තවූ සැපවූ සොම්නසක් විඳිත්යයි" මෙසේ කියන්නාහු නම් මම ඔවුන්ගේ කීම අනුමත නොකරමි. ඊට හේතු කවරේද? ආනන්දය, ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනෙක් සැපයක් ඇත්තේය. ආනන්දය, ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, ප්‍රණීතවූද අනෙක් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත, විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේද ආනන්දය, මේ වනාහි මේ සැපයට වඩා අතිශයින් උසස්වූද අතිශයින් ප්‍රණීතවූද අනෙක් සැපය වෙයි.

**10.** "ආනන්දය, යම් කෙනෙක් වනාහි "මේ අතිශයින් ශාන්තවූ සැපවූ සොම්නසක් විඳිත්යයි" කියන්නාහු නම් මම ඔවුන්ගේ කීම අනුමත නොකරමි. ඊට හේතු කවරේද? ආනන්දය, ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනෙක් සැපයක් ඇත්තේය. ආනන්දය, ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනෙක් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිතේ එකඟ බව ඇති විතර්කය නැති විචාරය නැති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසයකරයිද, ආනන්දය, මේ වනාහි ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද ප්‍රණීතවූද අනෙක් සැපය වෙයි.

**11.** "ආනන්දය, යම් කෙනෙක් මේ අතිශයින් ශාන්තවූ සැපක් සොම්නසක් විඳිත්යයි" කියන්නාහු නම් මම ඔවුන්ගේ කීම අනුමත නොකරමි. ඊට හේතු කවරේද, ආනන්දය, ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනෙක් සැපයක් ඇත්තේය. ආනන්දය, ඒ සැපයට වඩා අන්‍යවූ අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනෙක් සැපය කවරේද?

ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම ප්‍රීතිය දුරුකිරීමෙන් උපෙක්ෂාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ කයෙන් සැපයක් විඳීද, යම් ධ්‍යානයක් උපෙක්ෂාවෙන් යුක්තවූයේ සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේයයි ආර්‍ය්‍යයෝ කියත්ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරත්ද, ආනන්දය; මෙය ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, ප්‍රණීතවූද අනෙක් සැපය වෙයි.

12. "ආනන්දය, යම් කෙනෙක් අතිශයින් ශාන්තවූ සැපක් සොම්නසක් විඳිත්යයි මෙසේ කියන්නාහු නම් ඔවුන්ගේ ඒ කීම මම අනුමත නොකරමි. ඊට හේතු කවරේද? ආනන්දය, මේ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනෙක් සැපයක් ඇත්තේය. ආනන්දය, ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂුතෙම සැපය දුරු කිරීමෙන්ද, දුක දුරු කිරීමෙන්ද පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනා පහකිරීමෙන්ද, දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදු බව ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයිද ආනන්දය, මේ වනාහි ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය වෙයි.

13. "ආනන්දය, යම් කෙනෙක් මේ අතිශයින් ශාන්තවූ සැපක් සොම්නසක් විඳිත්යයි කියන්නාහුනම් මම ඔවුන්ගේ ඒ කීම අනුමත නොකරමි. ඊට හේතු කවරේද? ආනන්දය, මේ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනික් සැපයක් ඇත්තේය. ආනන්දය, ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම සර්වප්‍රකාරයෙන් රූප සංඥා ඉක්මවීමෙන් පටිඝ (කොප) සංඥාව දුරුකිරීමෙන් නානත්ත සංඥාව මෙනෙහි නොකිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, ආනන්දය, මේ වනාහි ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය වෙයි.

14. "ආනන්දය, යම් කෙනෙක් මේ අතිශයින් ශාන්ත සැපක් සොම්නසක් විඳිත්යයි කියන්නාහු නම් මම ඔවුන්ගේ ඒ කීම අනුමත නොකරමි. ඊට හේතු කවරේද? ආනන්දය, මේ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනික් සැපතක් ඇත්තේය ආනන්දය, ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්ත යයි විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරත්ද, ආනන්දය, මේ වනාහි ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනෙක් සැපය වෙයි.

15. "ආනන්දය, යම් කෙනෙක් මේ අතිශයින් ශාන්ත සැපක් සොම්නසක් විඳිත්යයි කියන්නාහු නම් මම ඔවුන්ගේ ඒ කීම අනුමත නොකරමි. ඊට හේතු කවරේද? ආනන්දය, මේ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනික් සැපයක් ඇත්තේය. ආනන්දය, ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චා යතනය ඉක්මවා කිසිවෙක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, ආනන්දය, මේ වනාහි ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද අනෙක් සැපය වෙයි.

16. "ආනන්දය, යම් කෙනෙක් මේ අතිශයින් ශාන්ත සැප සොම්නසක් විඳිත්යයි කියන්නාහු නම් මම ඔවුන්ගේ ඒ කීම අනුමත නොකරමි. ඊට හේතු කවරේද? ආනන්දය, මේ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනික් සැපතක් ඇත්තේය. ආනන්දය, ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද, අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤා-යතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, ආනන්දය, මේ වනාහි ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය වෙයි."

17. "ආනන්දය, යම් කෙනෙක් මේ අතිශයින් ශාන්ත සැපක් සොම්නසක් විඳිත්යයි කියන්නාහු නම් මම ඔවුන්ගේ ඒ කීම අනුමත නොකරමි. ඊට හේතු කවරේද? ආනන්දය, මේ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද අනික් සැපතක් ඇත්තේය. ආනන්දය, ඒ සැපයට වඩා අතිශයින් උසස්වූද, අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වාසය කරත්ද, ආනන්දය, මේ සැපයට අතිශයින් උසස්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය වෙයි."

18. "ආනන්දය, අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ, 'ශ්‍රමණ භවත් ගෞතම තෙමේ සඤ්ඤාවෙදයිත නිරෝධය කියන ලදී. එය සැපයෙහි පනවයි එය කුමක් වන්නේද, එය කෙසේ වන්නේදැයි' කියන්නාහුය යන මේ කරුණ විද්‍යමානවේ. ආනන්දය, මෙසේ කියන්නාවූ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ සැප වේදනාව සඳහාම සැපයයි නොපනවත්. ඇවැත්නි, යම් යම් තැනක යම් යම් සැපක් ලැබේද, ඒ ඒ සැපය තථාගතයන් වහන්සේ සැපයෙහි පණවත්යයි' මෙසේ කිව යුත්තාහ."

---

## 10. භික්ඛු සූත්‍රය.

(මේ සූත්‍රයද මේ වර්ගයේ 2 වෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2 'මහණෙනි, මා විසින් කරුණු වශයෙන් වේදනා දෙකක්ද වදාරණ ලදී. මා විසින් කරුණු වශයෙන් වේදනා තුනක්ද වදාරණ ලදී. මා විසින් කරුණු වශයෙන් වේදනා පසක්ද වදාරණ ලදී. මා විසින් කරුණු වශයෙන් වේදනා සයක්ද වදාරණ ලදී. මා විසින් කරුණු වශයෙන් වේදනා දහඅටක්ද වදාරණ ලදී. මා විසින් කරුණු වශයෙන් වේදනා තිස්හයක්ද වදාරණ ලදී මා විසින්

කරුණු වශයෙන් වේදනා එක්සිය අටක්ද වදාරණ ලදී. මහණෙනි, මෙසේ මා විසින් ධර්මය කරුණු වශයෙන් දෙසන ලදී.

3. "මහණෙනි, මා විසින් ධර්මය කරුණු වශයෙන් වදාළ කල්හි යමෙක් ඔවුනොවුන් විසින් යහපත්කොට කියන ලද්ද මනාකොට කියන ලද්ද, අනුමත නොකරද්ද, මනාව නොදනිද්ද සතුටු නොවෙත්ද, ඔවුහු හටගත් ඩබර ඇත්තාහු කලහ ඇත්තාහු විවාදයට පැමිණියාහු ඔවුනොවුන් මුව නැමැති ආයුධවලින් විදිනු ලබන්නාහු වාසය කරන්නාහුය යන මෙය කැමති විය යුත්තේය. මහණෙනි, මෙසේ මා විසින් ධර්මය කාරණානුකූලව වදාරණ ලදී. මෙසේ මා විසින් කාරණානුකූලව වදාළ කල්හි යමෙක් ඔවුනොවුන් විසින් යහපත් කොට කියන ලද්ද, මනාකොට කියන ලද්ද අනුමත කරත්ද, සතුටුවෙත්ද ඔවුන් විසින් සමගිවූවාහු සතුටු වූවාහු විවාද නොකරන්නාහු කිරි හා දිය මෙන් එක්වූවාහු ඔවුනොවුන් ප්‍රිය ඇස්වලින් බලන්නාහු වාසය කෙරෙත් යන මෙය කැමති විය යුතු

4. (මේ සූත්‍රයේ ඉතිරි කොටස මේ වර්ගයේ 9 වෙනි සූත්‍රයේ ඡෙද 8-18 මෙනි. ආමන්ත්‍රණ වචනය 'ආනන්දය' වෙනුවට 'මහණෙනි' යොදාගත යුතුයි.)

(දෙවෙනි රහොගත වර්ගය නිමි.)

---

## අට්ඨසත පරියාය වර්ගය.

### 1. සීවක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වේළුවනයෙහි කලන්දක නිවාප නම් ස්ථානයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි මොළිය සීවක නම් පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් මොළිය සීවක පරිබ්‍රාජකතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

"භවත් ගෞතමයන් වහන්ස, මේ පුරුෂ පුද්ගලතෙම සැපක් හෝ උපෙක්ෂාවක් හෝ විඳීනම් ඒ සියල්ල පෙර කරන ලද හේතු නිසායයි මෙසේ කියන මෙවැනි දෘෂ්ටි ඇති සමහර ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. භවත් ගෞතමතෙම මෙහිදී කුමක් කියන්නේද?"

2. "සීවකය, මේ ලොකයෙහි පිත නිසා හටගන්නාවූද ත්‍රිවිධ වේදනාවෝ උපදිත්. සීවකය, මේ ලොකයෙහි පිත නිසා හටගන්නාවූ ඇතැම් වේදනා උපදිත්යයි තමාහටමද පෙනෙන්නේය. සීවකය, ලෝකයෙහි ඇතැම් වේදනා පිත නිසා උපදිත් යන මෙය ලෝකයෙහිද සත්‍යයයි සම්මතය. සීවකය, මේ පුරුෂ පුද්ගලතෙම සැපක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ විඳීද, ඒ සියල්ල පූර්වයෙහි කරන ලද හේතූන් නිසායයි මෙසේ කියන්නාවූ මෙසේ සිතන්නාවූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වෙත්. ඔව්හු යමක් තමා විසින්ම දන්නා ලද්දේද එයද ඉක්මවා යත්. යමක් ලෝකයෙහි සත්‍යයයි සම්මතද එයද ඉක්මවා යත්. එසේ හෙයින් එය ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ බොරුයයි කියමි.

3. "සීවකය, මේ ලොකයෙහි සෙම නිසා හටගන්නාවූද ත්‍රිවිධ වේදනාවෝ උපදිත්. සීවකය, මේ ලෝකයෙහි සෙම නිසා හටගන්නාවූ ඇතැම් වේදනා උපදින්නේයයි තමාහටමද පෙනෙන්නේය. සීවකය, ලොකයෙහි ඇතැම් වේදනා සෙම නිසා උපදිත් යන මෙය ලෝකයෙහිද සත්‍යයයි සම්මතය. සීවකය, මේ පුරුෂ පුද්ගලතෙම සැපක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ විඳීද, ඒ සියල්ල පූර්වයෙහි කරණලද හේතූන් නිසායයි මෙසේ සිතන්නාවූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වෙත්ද ඔව්හු යමක් තමා විසින්ම දන්නා ලද්දේද, එයද ඉක්මවා යත්. යමක් ලෝකයෙහි සත්‍යයයි සම්මතද, එයද ඉක්මවා යත්. එසේ හෙයින් එය ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ බොරුයයි කියමි.

4. 'සීවකය, මේ ලෝකයෙහි වාතය නිසා හටගන්නාවූද ත්‍රිවිධ වේදනාවෝ උපදිත්. සීවකය, මේ ලෝකයෙහි වාතය

නිසා හටගන්නාවූ ඇතැම් වේදනා උපදිත්යයි තමා හටමද පෙනෙන්නේය. සීවකය, ලෝකයෙහි ඇතැම් වේදනා වාතය නිසා උපදිත් යන මෙය ලෝකයෙහිද සත්‍යයයි සම්මතය. සීවකය, මේ පුරුෂ පුද්ගලතෙම සැපක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ විඳීද, ඒ සියල්ල පූර්වයෙහි කරණලද හේතුන් නිසායයි මෙසේ කියන්නාවූ මෙසේ සිතන්නාවූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වෙත්ද, ඔව්හු යමක් තමා විසින්ම දන්නා ලද්දේද, එයද ඉක්මවා යත්. යමක් ලෝකයෙහි සත්‍යයයි සම්මතද, එයද ඉක්මවා යත්. එසේ හෙයින් එය ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ බොරුයයි කියමි.

**5.** "සීවකය, මේ ලෝකයෙහි තුන් දොස් කිපීම නිසා හටගන්නාවූද ත්‍රිවිධ වේදනාවෝ උපදිත්, සීවකය, මේ ලෝකයෙහි තුන් දොස් කිපීම නිසා හටගන්නාවූ ඇතැම් වේදනා උපදිත්යයි තමාහටමද පෙනෙන්නේය. සීවකය, ලෝකයෙහි ඇතැම් වේදනා තුන්දොස් කිපීම නිසා උපදිත් යන මෙය ලෝකයෙහිද සත්‍යයයි සම්මතය. සීවකය, මේ පුරුෂ පුද්ගලතෙම සැපක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ විඳීද, ඒ සියල්ල පූර්වයෙහි කරන ලද හේතූන් නිසායයි මෙසේ කියන්නාවූ මෙසේ සිතන්නාවූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වෙත්ද, ඔව්හු යමක් තමා විසින්ම දන්නා ලද්දේද, එයද ඉක්මවා යත්. යමක් ලෝකයෙහි සත්‍යයයි සම්මතද එයද ඉක්මවා යත්. එසේ හෙයින් එය ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ බොරුයයි කියමි.

**6.** "සීවකය, මේ ලෝකයෙහි ඍතු විපයර්‍යාස නිසා හටගන්නාවූද, ත්‍රිවිධ වේදනාවෝ උපදිත්. සීවකය, මේ ලෝකයෙහි ඍතු විපායර්‍යාස නිසා හටගන්නාවූ ඇතැම් වේදනා උපදිත්යයි තමාහටමද පෙනෙන්නේය. සීවකය, ලෝකයෙහි ඇතැම් වේදනා ඍතු විපයර්‍යාස නිසා උපදිත් යන මෙය ලෝකයෙහිද සත්‍යයයි සම්මතය. සීවකය, මේ පුරුෂ පුද්ගලතෙම සැපක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ විඳීද, ඒ සියල්ල පූර්වයෙහි කරන ලද හේතූන් නිසායයි මෙසේ කියන්නාවූ මෙසේ

සිතන්නාවූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වෙත්ද, ඔව්හු යමක් තමා විසින්ම දන්නා ලද්දේද, එයද ඉක්මවා යත්. යමක් ලෝකයෙහි සත්‍යයයි සම්මතද එයද ඉක්මවා යත්. එසේ හෙයින් එය ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ බොරුයයි කියමි.

7. "සීවකය, මේ ලෝකයෙහි විෂම හැසිරීම නිසා හටගන්නාවූද, ත්‍රිවිධවේදනාවෝ උපදිත්. සීවකය, මේ ලෝකයෙහි විෂම හැසිරීම නිසා හටගන්නාවූ ඇතැම් වේදනා උපදිත්යයි තමාහටමද පෙනෙන්නේය. සීවකය, ලෝකයෙහි ඇතැම් වේදනා විෂම හැසිරීම නිසා උපදිත් යන මෙය ලෝකයෙහිද සත්‍යයයි සම්මතය. සීවකය, මේ පුරුෂ පුද්ගලතෙම සැපක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ විඳීද, ඒ සියල්ල පූර්වයෙහි කරන ලද හේතූන් නිසායයි මෙසේ කියන්නාවූ මෙසේ සිතන්නාවූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වෙත්ද, ඔව්හු යමක් තමා විසින්ම දන්නා ලද්දේද, එයද ඉක්මවා යත්. යමක් ලෝකයෙහි සත්‍යයයි සම්මතද එයද ඉක්මවා යත්. එසේ හෙයින් එය ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ බොරුයයි කියමි.

8. "සීවකය, මේ ලෝකයෙහි අනුන්ගේ උපක්‍රම නිසා හටගන්නාවූද, ත්‍රිවිධ වේදනාවෝ උපදිත්. සීවකය, මේ ලෝකයෙහි අනුන්ගේ උපක්‍රම නිසා හටගන්නාවූ ඇතැම් වේදනා උපදිත්යයි තමාහටමද පෙනෙන්නේය. සීවකය, ලොකයෙහි ඇතැම් වේදනා අනුන්ගේ උපක්‍රම නිසා උපදිත් යන මෙය ලොකයෙහිද සත්‍යයයි සම්මතය. සීවකය, මේ පුරුෂ පුද්ගලතෙම සැපක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ විඳීද, ඒ සියල්ල පූර්වයෙහි කරනලද හේතූන් නිසායයි මෙසේ කියන්නාවූ මෙසේ සිතන්නාවූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වෙත්ද, ඔව්හු යමක් තමා විසින්ම දන්නා ලද්දේද, එයද ඉක්මවා යත්. යමක් ලොකයෙහි සත්‍යයයි සම්මතද එයද ඉක්මවා යත්. එසේ හෙයින් එය ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ බොරුයයි කියමි.

9. 'සීවකය, කර්ම විපාක නිසාද, මේ ලෝකයෙහි ඇතැම් වේදනාවෝ උපදිත්. සීවකය, කර්ම විපාක නිසාද, මේ

ලෝකයෙහි ඇතැම් වේදනාවෝ උපදින බව තමාහටමද පෙනෙන්නේය. සීවකය, යම්සේ කර්මවිපාක නිසාද මේ ලෝකයෙහි ඇතැම් වේදනාවෝ උපදිත් යන මෙය ලෝකයෙහිද සත්‍යයයි සම්මතය. සීවකය, එහි යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් මේ පුරුෂ පුද්ගලතෙම යම්කිසි සැපක් හෝ දුකක් හෝ උපෙක්ෂාවක් හෝ විඳීද, ඒ සියල්ල පෙරකළ හේතුන් නිසා යයි කියත්නම් ඔව්හු තමා විසින් දන්නා ලද්දද, ඉක්මවත්. යමක් ලෝකයෙහි සත්‍යයයි සම්මතද එයද ඉක්මවත්. එසේ හෙයින් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ කීම බොරුයයි කියමි."

10. "මෙසේ වදාළ කල්හි මොළිය සීවක පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේට, 'භවත් ගෞතමයන් වහන්ස, යහපත භාග්‍යවතුන් වහන්ස ඉතා යහපත, භාග්‍යවතුන් වහන්ස, යම්සේ යටිකුරු කොට තබන ලද්දක් හෝ උඩුකුරු කරන්නේද, වසා තබන ලද්දක් හෝ වැහුම් අරින්නේද, මංමුළාවූවෙකුට හෝ මග කියන්නේද, අන්ධකාරයෙහි හෝ 'ඇස් ඇත්තෝ රූප දකිත්වායි' තෙල් පහනක් දල්වන්නේද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරන ලදී. භවත් ගෞතමයන් වහන්ස, ඒ මම භාග්‍යවතුන් වහන්සේ සරණකොට යමි. ධර්මයද, භික්ෂු සංඝයාද (සරණ කොට යමි) භවත් ගෞතමයන් වහන්ස, මා අද පටන් දිවිහිම්කොට සරණගිය උපාසකයෙකු කොට දරණ සේක්වායි කීයේය.

"පිතද, සෙමද, වාතයද, සන්නිපාතයද, ඍතුවද, විෂම පැවැත්මද, උපක්‍රමයද, කර්ම විපාකයද යන හේතු අටක් වන්නේය.

---

## 2. අට්ඨසත සූත්‍රය.

(මේ සූත්‍රය 2319 වෙනි පිටේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, තොපට කරුණු එකසිය අටක් ඇති ධර්ම ක්‍රමයක් දෙසන්නෙමි. එය අසව්. මහණෙනි, කරුණු එකසිය අටක් ඇති ධර්ම ක්‍රමය කවරේද? මහණෙනි, මා විසින් කරුණු

අනුව වේදනා දෙකක් වදාරණ ලදී. මා විසින් කරුණු අනුව වේදනා තුනක්ද වදාරණ ලදී. මා විසින් කරුණු අනුව වේදනා පසක්ද වදාරණ ලදී. මා විසින් කරුණු අනුව වේදනා සයක්ද වදාරණ ලදී. මා විසින් කරුණු අනුව වේදනා දහඅටක්ද වදාරණ ලදී. මා විසින් කරුණු අනුව වේදනා තිස්හයක්ද වදාරණ ලදී. මා විසින් කරුණු අනුව වේදනා එක්සියඅටක්ද වදාරණ ලදී.

3. "මහණෙනි, වේදනා දෙක කවරේද, කායික වේදනාය, චෛතසික වේදනාය යන දෙකයි. මහණෙනි, මොවුහු දෙවැදෑරුම් වේදනාවෝයයි කියනු ලැබෙත්.

4. "මහණෙනි, ත්‍රිවිධ වේදනාවෝ කවරහුද, සැප වෙදනාය, දුක් වෙදනාය, උපෙක්ෂා වෙදනාය යනුයි. මහණෙනි, මොවුහු ත්‍රිවිධ වේදනාවෝයයි කියනු ලැබෙත්.

5. "මහණෙනි, පඤ්චවිධ වෙදනාවෝ කවරහුද, සැප ඉන්ද්‍රිය, දුක් ඉන්ද්‍රිය, සොම්නස්සින්ද්‍රිය, දොම්නස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය යන මොවුයි මහණෙනි, මොව්හු පඤ්චවිධ වේදනාවෝයයි කියනු ලැබෙත්.

6. "මහණෙනි, සවැදෑරුම් වෙදනාවෝ කවරහුද, චක්ඛු සම්ඵස්සජ වෙදනාය, සොතසම්ඵස්සජ වෙදනාය, ඝාණ සම්ඵස්සජ වෙදනාය, ජිව්හා සම්ඵස්සජ වෙදනාය, කාය සම්ඵස්සජ වෙදනාය, මනොසම්ඵස්සජ වෙදනාය යන මොහුය. මහණෙනි, මොව්හු හය ආකාර වේදනාවෝයයි කියනු ලැබෙත්.

7. "මහණෙනි, අටළොස් වෙදනා කවරහුද, සොම්නස සමඟ හැසිරෙන්නාවූ වෙදනා සයය, දොම්නස සමග හැසිරෙන්නාවූ වේදනා සයය, උපෙක්ෂාව සමඟ හැසිරෙන්නාවූ වෙදනා සයය යන මොවුහුය. මහණෙනි, මොව්හු අටළොස් වේදනායයි කියනු ලැබෙත්.

8. "මහණෙනි, සතිස් වෙදනාවෝ කවරහුද, ගෘහය ඇසුරුකළ සොම්නස් සයය, හික්මීම ඇසුරුකළ සොම්නස් සයය, ගෘහය ඇසුරුකළ දොම්නස් සයය, හික්මීම ඇසුරුකළ

දොම්නස් සයය, ගෘහය ඇසුරුකළ උපෙක්ෂා සයය, හික්මීම ඇසුරුකළ උපෙක්ෂා සයය. මහණෙනි, මොවුහු සතිස් වෙදනාවෝයයි කියනු ලැබෙත්.

9. "මහණෙනි, එක්සිය අටක් වේදනාවෝ කවරහුද? අතීතවූ සතිස් වේදනාය, අනාගතවූ සතිස් වේදනාය, වර්තමානවූ සතිස් වේදනාය යන මොහුය. මහණෙනි, මොව්හු එක්සියඅටක් වේදනාවෝයයි කියනු ලැබෙත්. මහණෙනි, මේ වනාහි එක්සියඅට ආකාරයක් ඇති ධර්ම ක්‍රමයයි කියනු ලැබේ.

---

## 3 භික්ඛු සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය.

2. "ස්වාමීනි, වේදනාව කවරීද? වේදනාවගේ හේතුව කවරේද, වේදනාව පහළවීම පිණිස පවත්නා ප්‍රතිපදාව කවරේද, වේදනාවගේ නිරොධය කවරේද, වේදනා නිරුද්ධයට යන ප්‍රතිපදාව කවරේද, වේදනාවගේ ආශ්වාදය කවරේද, වේදනාවගේ ආදීනවය කවරේද? නිස්සරණය කවරේද?"

3. "මහණෙනි, මේ වේදනා තුනෙකි. සැප වේදනා, දුක් වේදනා, උපෙක්ෂා වේදනා යන මේ තුනය. මහණ, මොව්හු වේදනාවෝයයි කියනු ලැබෙත්. ස්පර්ශයාගේ හටගැනීමෙන් වේදනා පහළවේ. තෘෂ්ණාව, වේදනාව ඉපදීම කරා පැමිණෙන ප්‍රතිපදාවය, ස්පර්ශය නිරුද්ධවීම හේතුකොටගෙන වේදනාවන්ගේ නිරෝධය වෙයි. මේ සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක්

ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේ ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය වේදනා නිරොධයට යන ප්‍රතිපදාවයි. වෙදනාව නිසා යම් සැපක් සොම්නසක් උපදීද, මේ වේදනාවගේ ආශ්වාදයයි. යම් වේදනාවක් අනිත්‍යද දුක්ද පෙරලෙන ස්වභාව ඇත්තේද මේ වේදනාවගේ ආදීනවයයි. වේදනාවගේ යම් ආශාව දුරුකිරීමක් වේද යම් ආශාව පහකිරීමක්වේද මේ වේදනාවගේ නිස්සරණයයි."

---

## 4. පුබ්බ සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2. "මහණෙනි, මට බුදුවීමට පෙර චතුස්සත්‍ය අවබොධ කිරීමට පළමු බොධිසත්ව කාලයේම වේදනාවෝ කවරහුද? වේදනාවට හේතුකවරේද, වේදනා පහළවීම කරා පැමිණෙන ප්‍රතිපදාව කවරේද, වේදනා නිරෝධය කවරේද? වේදනා නිරුද්ධයට පැමිණෙන ප්‍රතිපදාව කවරේද, වේදනාවගේ ආශ්වාදය කවරේද, ආදීනවය කවරේද, නිස්සරණය කවරේද යන මේ අදහස පහළවිය.

"මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය.

3. (මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

---

## 5. ඥාණ සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දෙශනා කරනලදී.)

2. "මහණෙනි, මට මේ වේදනාවෝයයි පෙර නොඇසූවිරූ ධර්මයෙහි ප්‍රඥාචක්ෂුස උපන්නේය. ඥාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලොකය පහළවිය. මහණෙනි,

මට මේ වෙදනා හේතුවයයි පෙර නොඇසූවිරූ ධර්මයෙහි ප්‍රඥාචක්ෂුස උපන්නේය. ඥාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලොකය පහළවිය.

"මහණෙනි, මට මේ වෙදනා පහළවීම කරා පැමිණෙන ප්‍රතිපදාවයයි පෙර නොඇසූවිරූ ධර්මයෙහි ප්‍රඥාචක්ෂුස උපන්නේය. ඥාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළ විය. ආලොකය පහළවිය.

"මහණෙනි, මට මේ වේදනා නිරොධයයි පෙර නොඇසූ විරූ ධර්මයෙහි ප්‍රඥා චක්ෂුස උපන්නේය. ඥාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලොකය පහළවිය.

"මහණෙනි, මට මේ වේදනා නිරොධයට යන ප්‍රතිපදාවයයි පෙර නොඇසූවිරූ ධර්මයෙහි ප්‍රඥා චක්ෂුස උපන්නේය. ඥාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලොකය පහළවිය.

"මහණෙනි, මට මේ වේදනාවගේ ආශ්වාදයයි. මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයෙහි ප්‍රඥා චක්ෂුස උපන්නේය. ඥාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලොකය පහළවිය.

"මහණෙනි, මට මේ වේදනාවන්ගේ ආදීනවයයි, පෙර නොඇසූවිරූ ධර්මයෙහි ප්‍රඥා චක්ෂුස උපන්නේය. ඥාණය පහළවිය ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලොකය පහළවිය.

"මහණෙනි, මට මේ වේදනාවගේ නිස්සරණයයි පෙර නොඇසූවිරූ ධර්මයෙහි ප්‍රඥාචක්ෂුස උපන්නේය. ඥාණය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය.

---

## 6. භික්ඛු සූත්‍රය. (2)

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

එකල්හි වනාහි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, වේදනාවෝ කවරහුද වේදනාවන්ගේ හේතුව කෙසේද, වේදනාවන්ගේ හටගැනීම කරා පැමිණෙන ප්‍රතිපදාව කවරේද, වේදනා නිරොධය කවරේද, වෙදනා නිරොධයට පැමිණෙන ප්‍රතිපදාව කවරේද, වේදනාවගේ ආශ්වාදය කවරේද, ආදීනවය කවරේද, නිස්සරණය කවරේදැයි? විචාළහ.

2. "මහණෙනි, මේ වේදනා තුනෙකි. සැප වේදනාය දුක් වේදනාය, උපෙක්ෂා වේදනාය යන තුනයි. මහණෙනි, මොව්හු වේදනාවෝයයි කියනුලැබෙත්. ස්පර්ශයාගේ පහළ වීමෙන් වේදනාවගේ පහළවීම වේ. තෘෂ්ණාව වෙදනා හටගැනීමට පැමිණෙන පටිපදාවයි. ස්පර්ශයාගේ නිරොධය හේතුකොටගෙන වේදනාවන්ගේ නිරොධය වේ. මේ සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාවය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය වේදනා නිරෝධයට යන ප්‍රතිපදාවයි. වේදනාව නිසා යම් සැපක් සොම්නසක් උපදීද. මේ වේදනාවගේ ආශ්වාදයයි. යම් වේදනාවක් අනිත්‍යද, දුක්ද, පෙරලෙන ස්වභාව ඇත්තේද, මේ වේදනාවගේ ආදීනවයයි. වේදනාවන්ගේ යම් ආශාව දුරුකිරීමක් වේද, යම් ආශාව පහකිරීමක් වේද මේ වේදනාවන්ගේ නිශ්ශරණයයි.

---

## 7. ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය. (1)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරනලදී.)

2. "මහණෙනි, මේ වෙදනා තිදෙනෙකි. කවර තිදෙනෙක්දයත්, සැප වේදනාවය. දුක් වේදනාවය, උපෙක්ෂා වේදනාවය යන තිදෙනය. මහණෙනි, යම් ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ වෙදනා තුන්දෙනාගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් නොදනිත්ද,

'මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද; නොවෙත්. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ භාවයේ අර්ථය හෝ බ්‍රාහ්මණ භාවයේ අර්ථය හෝ මේ ආත්මයෙහිදීම තෙමේ දැන, ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකෙරෙත්.

"මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ ත්‍රිවිධ වේදනාවන්ගේ පහළවීමද, විනාශවීමද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් දනීද,

"මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණභාවයේ අර්ථය හෝ බ්‍රාහ්මණභාවයේ අර්ථය හෝ මේ ආත්මයෙහිදීම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙරෙත්යයි" වදාළසේක.

---

## 8. ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය. (2)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, මේ වේදනාවෝ තුනෙකි. කවර තුනක්ද යත් සැප වේදනාය, දුක් වේදනාය, උපෙක්ෂා වේදනාය යන

තිදෙනාය. මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ ත්‍රිවිධ වේදනාවන්ගේ පහළවීමද විනාශවීමද ආශ්වාදයද ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් නොදනිත්ද,

"මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද නොවෙත්. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ භාවයේ අර්ථය හෝ බ්‍රාහ්මණ භාවයේ හෝ මේ ආත්මයෙහිදීම තෙමේ විශිෂ්ට (ඥානයෙන්) දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකෙරෙත්.

"මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ ත්‍රිවිධ වේදනාවන්ගේ පහළවීමද, විනාශවීමද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් දනිත්ද,

"මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත් ඒ ආයුෂ්මත්හු ශ්‍රමණ භාවයේ අර්ථය හෝ බ්‍රාහ්මණ භාවයේ අර්ථය හෝ මේ ආත්මයෙහිදීම තෙමේ (විශිෂ්ට ඥානයෙන්) දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙරෙත්යයි" වදාළසේක.

---

## 9. ශ්‍රමණ බ්‍රාහ්මණ සූත්‍රය. (3)

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ වේදනාව නොදනිත්ද, වේදනාවන්ගේ හටගැනීම නොදනිත්ද, වේදනා නිරෝධය නොදනිත්ද, වේදනා නිරුද්ධයට පැමිණෙන ප්‍රතිපදාව නොදනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද නොවෙත්. ඒ

ආයුෂ්මත්හු ශ්‍රමණ භාවයේ අර්ථය හෝ බ්‍රාහ්මණ භාවයේ අර්ථය හෝ මේ ආත්මයෙහිදීම තෙමේ දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකෙරෙත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ වේදනාව දනිත්ද, වේදනාවන්ගේ හටගැනීම දනිත්ද, වේදනා නිරෝධය දනිත්ද, වේදනා නිරොධයට පැමිණෙන ප්‍රතිපදාව දනිත්ද. මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මතද වෙත්. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණභාවයේ අර්ථය හෝ බ්‍රාහ්මණභාවයේ අර්ථය හෝ මේ ආත්මයෙහිදීම තෙමේ (විශිෂ්ට ඥානයෙන්) දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වෙසෙත්.

---

## 10. සුද්ධික සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරණ ලදී.)

2. "මහණෙනි, මේ වේදනා තුනෙකි. කවර තුනෙක්ද යත්, සැපවේදනාය, දුක් වේදනාය, දුක්ද නොවූ සැපද නොවූ වේදනාය යන තුනයි. මහණෙනි, මොවුහු ත්‍රිවිධ වේදනාවෝ වෙත්.

---

## 11. නිරාමිස සූත්‍රය.

1. (මේ සූත්‍රයද මේ වර්ගයේ දෙවෙනි සූත්‍රය මෙන් ජේතවනාරාමයේදී දේශනා කරන ලදී.)

2. "මහණෙනි, සාමිස (කෙලෙස් සහිතවූ) ප්‍රීතියක් ඇත. නිරාමිස (කෙලෙස් රහිතවූ) ප්‍රීතියක් ඇත. නිරාමිසයෙනුත් අතිශයින් නිරාමිස ප්‍රීතියක් ඇත්තේය. සාමිස සැපයක් ඇත්තේය' නිරාමිස සැපයක් ඇත්තේය, නිරාමිස සැපයෙනුත් අතිශයින් නිරාමිස සැපයක් ඇත්තේය. සාමිස උපෙක්ෂාවක් ඇත්තේය, නිරාමිස උපෙක්ෂාවක් ඇත්තේය. නිරාමිස උපෙක්ෂාවෙනුත්

අතිශයින් නිරාමිස උපෙක්ෂාවක් ඇත්තේය. සාමිස විමොක්ෂයක් ඇත්තේය, නිරාමිස විමොක්ෂයක් ඇත්තේය, නිරාමිස විමොක්ෂයෙනුත් අතිශයින් නිරාමිස විමොක්ෂයක් ඇත්තේය.

3. "මහණෙනි, සාමිස ප්‍රීතිය කවරේද? මහණෙනි, මේ කාම බන්ධන පසෙකි. කවර පසක්දයත්? ඇසින් දැක්කයුතුවූ, ඉෂ්ටවූ, කැමතිවූ, මනවඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම් කටයුතුවූ රූපයෝ වෙත්. කණින් ඇසියයුතුවූ, ඉෂ්ටවූ, කැමතිවූ, මනවඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම් කටයුතුවූ ශබ්දයෝ වෙත්. නාසයෙන් ආඝ්‍රාණය කළයුතුවූ, ඉෂ්ටවූ, කැමතිවූ, මනවඩන්නාවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ ඇලුම් කටයුතුවූ, ගන්ධයෝ වෙත්. දිවෙන් රස විඳිය යුතුවූ, ඉෂ්ටවූ, කැමතිවූ, මනවඩන්නාවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම්කටයුතුවූ, රසයෝ වෙත්. කයින් දතයුතුවූ, ඉෂ්ටවූ, කැමතිවූ මනවඩන්නාවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ ඇලුම්කටයුතුවූ ස්පර්ශයෝ වෙත්. මහණෙනි, මේ පස්කම් සැපයෝයි. මහණෙනි, මේ පස්කම් ගුණ නිසා යම් ප්‍රීතියක් උපදීද මේ සාමිස ප්‍රීතියයි.

4. "මහණෙනි, නිරාමිස ප්‍රීතිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව, විතර්කය සහිත විචාරය සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයිද, විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිතේ එකඟබව ඇතිකරන විතර්ක රහිතවූ, විචාර රහිතවූ, සමාධියෙන් උපන්, ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහණෙනි, මේ නිරාමිස ප්‍රීතියයි.

5. "මහණෙනි, නිරාමිස ප්‍රීතියෙනුත් අතිශයින් නිරාමිස ප්‍රීතිය කවරේද? මහණෙනි, ක්ෂීණාශ්‍රව භික්ෂුවහට රාගයෙන් මිදුන සිත ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි ද්වේෂයෙන් මිදුන සිත

ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි මෝහයෙන් මිදුන සිත ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි යම් ප්‍රීතියක් උපදීද මහණෙනි, මේ නිරාමිස ප්‍රීතියෙනුත් අතිශයින් නිරාමිස ප්‍රීතියයි.

**6.** "මහණෙනි, සාමිස සැපය කවරේද? මහණෙනි, මේ පස්කම් ගුණයෝ පස් දෙනෙකි. ඇසින් දැක්කයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රිය ස්වරූපවූ කාමය පිණිස පවත්නාවූ ඇලුම්කටයුතු රූපයෝ ඇත්තාහ. කණින් ඇසිය යුතුවූ, ඉෂ්ටවූ, කැමතිවූ, මනවඩන්නාවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම්කටයුතුවූ, ශබ්දයෝ ඇත්තාහ. නාසයෙන් ආඝ්‍රාණය කළයුතුවූ, ඉෂ්ටවූ, කැමතිවූ, මනවඩන්නාවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම්කටයුතුවූ, ගන්ධයෝ ඇත්තාහ. දිවෙන් විඳියයුතුවූ, ඉෂ්ටවූ, කැමතිවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම්කටයුතුවූ, රසයෝ ඇත්තාහ. කයින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රිය ස්වරූප ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ ඇලුම්කටයුතුවූ ස්පර්ශයෝ ඇත්තාහ. මහණෙනි, මේ පස්කම් ගුණයෝ වෙත්. මහණෙනි, මේ පස්කම් ගුණ නිසා යම් සැපක් සොම්නසක් උපදීද මහණෙනි, මේ සාමිස සැපයයි කියනු ලැබේ.

**7.** "මහණෙනි, නිරාමිස සැපය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයිද, විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිතේ එකඟබව ඇති විතර්කය නැති විචාරය නැති සමාධියෙන් උපන් ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරයිද, ප්‍රීතියෙන් වෙන්ව උපෙක්ෂා සහිතව වාසය කරයිද, සිහි ඇත්තේ නුවණ ඇත්තේ සැපයක් කයින් විඳියිද, උපෙක්ෂාවෙන් යුක්තව සිහියෙන් යුක්තව සැපවිහරණ ඇත්තෙකැයි යම් ධ්‍යානයක් පිළිබඳ ආර්‍ය්‍යයෝ කියත් නම් ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහණෙනි, මේ නිරාමිස සැපයයි කියන ලදී.

8. "මහණෙනි, නිරාමිස සැපයෙනුත් අතිශයින් නිරාමිස සැපය කවරේද? මහණෙනි, රාගයෙන් මිදුන සිත ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ, ද්වෙෂයෙන් මිදුණ සිත ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ, මොහයෙන් මිදුන සිත ප්‍රත්‍යවේක්ෂා කරන්නාවූ, ක්ෂීණාශ්‍රව භික්ෂුවට යම් සැපක් සොම්නසක් උපදීද, මහණෙනි, මේ නිරාමිස සැපයෙනුත් අතිශයින් නිරාමිස සැපයයි කියනු ලැබේ.

9. "මහණෙනි, සාමිස උපෙක්ෂාව කවරේද? මහණෙනි, මේ පස්කම් ගුණයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක්ද යත් ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම්කටයුතුවූ, ඇසින් දැක්ක යුතුවූ රූපයෝ වෙත්. කණින් ඇසිය යුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම්කටයුතුවූ ශබ්දයෝ වෙත්. නාසයෙන් ආඝ්‍රාණය කළයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම් කටයුතුවූ, ගන්ධයෝ වෙත්. දිවෙන් රසවිඳියයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ, ඇලුම් කටයුතුවූ, රසයෝ වෙත්. ඉෂ්ටවූ, කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇලුම්කටයුතුවූ, කයින් දතයුතුවූ, ස්පර්ශයෝ වෙත්. මහණෙනි, මේ පස්කම් ගුණයෝයි. මහණෙනි, මේ පස්කම් ගුණ නිසා යම් උපෙක්ෂාවක් උපදීද, මහණෙනි, මේ සාමිස උපෙක්ෂාවයි කියනලදී.

10. "මහණෙනි, නිරාමිස උපෙක්ෂාව කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සැපයාගේ ප්‍රහාණයෙන්ද, දුක්ඛයාගේ ප්‍රහාණයෙන්ද, පළමුව සොම්නස් දොම්නස් දෙදෙනා දුරුකිරීමෙන් සැපද නොවූ, දුක්ද නොවූ උපෙක්ෂාවගේ සහ ස්මෘතියගේ පිරිසිදු බව ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහණෙනි, මේ නිරාමිස උපෙක්ෂාවයයි කියනු ලැබේ.

11. "මහණෙනි, නිරාමිස උපෙක්ෂාවෙනුත් අතිශයින් නිරාමිස උපෙක්ෂාව කවරේද? මහණෙනි, රාගයෙන් මිදුණ සිත ප්‍රත්‍යවේක්ෂා කරන්නාවූ, ද්වෙෂයෙන් මිදුණසිත

ප්‍රත්‍යවේක්ෂා කරන්නාවූ, මොහයෙන් මිදුණු සිත ප්‍රත්‍යවේක්ෂා කරන්නාවූ, ක්ෂීණාශ්‍රව භික්ෂුවට යම් උපෙක්ෂාවක් උපදීද, මහණෙනි, මේ නිරාමිස උපෙක්ෂාවෙනුත් අතිශයින් නිරාමිස උපෙක්ෂාවයයි කියනු ලැබේ.

12. "මහණෙනි, සාමිස විමොක්ෂය කවරේද? රූපයෙන් යුක්තවූ විමොක්ෂය සාමිස විමොක්ෂයයි. අරූපයෙන් යුක්තවූ විමොක්ෂය නිරාමිස විමොක්ෂයයි.

13. "මහණෙනි, නිරාමිස විමොක්ෂයෙනුත් අතිශයින් නිරාමිස විමොක්ෂය කවරේද? මහණෙනි, රාගයෙන් මිදුණු සිත ප්‍රත්‍යවේක්ෂා කරන්නාවූ, ද්වෙෂයෙන් මිදුණු සිත ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ, මොහයෙන් මිදුණු සිත ප්‍රත්‍යවේක්ෂා කරන්නාවූ, ක්ෂීණාශ්‍රව භික්ෂුවට යම් විමොක්ෂයක් උපදීද, මහණෙනි, මේ නිරාමිසයෙනුත් අතිශයින් නිරාමිසවූ විමොක්ෂයයි කියනු ලැබේ.

**තුන්වෙනි අට්ඨසත පරියාය වර්ගයයි.**

**වේදනා සංයුත්තය නිමි.**